# බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 15

සූත්‍රාන්ත පිටකයෙහි

09 වන ග්‍රන්ථය

# සංයුත්තනිකාය

(තෘතීය භාගය)

## ඛන්ධක වර්ගය

ත්‍රිපිටක පරිවර්තන කාරක සභායෙහි
සංයුත්තනිකාය ශෝධක මණ්ඩලය විසින්
සිංහල භාෂාවට නඟන ලදු වැ

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය විසින් පාඨශෝධන පූර්වක වැ
සංස්කරණය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින්
ප්‍රකාශිත යි.

ශ්‍රී බු. ව. 2550
ව්‍යවහාර ව. 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 15

The Ninth Book in the
**Suttanta-Pitaka**

**9**

# SAMYUTTANIKĀYA (III)

## KHANDHAKA VAGGA

With the Sinhala translation by

**The Samyuttanikāya Editorial Board**
**of**
**Tripitaka Translation Committee**

Revised and Edited by
**The Tripitaka Editorial Board**

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

## බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ මහා ධර්ම දානමය පුණ්‍යකර්මය

**"අපාරුතා තේසං අමතස්ස ද්වාරා**
**යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"**

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද
පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2009.06.28

සුත්තන්ත පිටකෙ

# සංයුත්තනිකායො

තතියො භාගො

## ඛන්ධක වග්ගො

සූත්‍රාන්ත පිටකයෙහි

# සංයුත්තනිකාය

තෘතීය භාගය

## ඛන්ධක වර්ගය

" තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො. "

" මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි. "

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 14 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:14 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන
# CONTENTS


| | |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... ... | ix |
| ත්‍රිපිටක මණ්ඩලය ... ... ... ... | xi |
| සංක්ෂිප්ත නිරූපණය - ABBREVIATIONS ... ... ... | xiii |
| පාළි හෝඩිය - PALI ALPHABET ... ... ... | xiv |
| ඛන්ධකවග්ග විසය සූචි ... ... ... ... | xv |
| පෙළ හා පරිවර්තනය ... ... ... ... ... | 2 – 573 |
| ගාථාදිපාද - සූචි ... ... ... ... | 577 |
| සඤ්ඤානාමානුක්කමණිකා ... ... ... ... | 579 – 580 |
| විසෙසපදානුක්කමණිකා ... ... ... | 581 – 585 |
| ශෝධ්‍යස්ථාන දර්ශනය ... ... ... | 587 – 589 |




Free Distribution www.aathaapi.org

# සංස්කාරක නිවේදනය

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි පසළොස් (15) වැනි ග්‍රන්ථය වශයෙන් ද, සූත්‍රාන්ත පිටකයෙහි නවවැනි ග්‍රන්ථය වශයෙන් ද පළකරවීමට ත්‍රිපිටක මණ්ඩලය විසින් සම්මත කළ සංයුක්ත නිකායෙහි තුන්වැනි ඛන්ධකවග්ගය ශ්‍රී ලංකා බෞද්ධ මණ්ඩලය විසින් සිංහල භාෂාවට පරිවර්තන කිරීම සඳහා ගාල්ලේ පරමානන්ද විහාරාධිපති රාජකීය පණ්ඩිත වතුගෙදර අමරසීහ ස්ථවිරයන් වහන්සේට පවරන ලද්දේය. උන් වහන්සේ විසින් යථාකාලයෙහි නිමහම් කරන ලද එම සිංහල පරිවර්තනය උන් වහන්සේ ද ඇතුළත් වූ සංයුක්තනිකාය ශෝධක මණ්ඩලයෙහි පණ්ඩිත හැගොඩ ධම්මින්ද, පණ්ඩිත ගලගම සරණංකර යන තෙර වරුන් විසින් පාළියෙහි ලිපිදෝෂාදිය බැහැර කොට පාඨාන්තර ද දක්වමින් සිංහල පරිවර්තනය සකස් කරන ලද්දේය.

එසේ මැ ත්‍රිපිටක සංස්කාරක මණ්ඩලයෙහි ප්‍රධාන සම්පාදක ධුරය දැරූ දර්ශන විශාරද පරවාහැර සිරි වජිරඤාණාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මාර්ගෝපදේශ පරිදි පෙය්‍යාලමුඛ සූත්‍ර නාම සූත්‍ර සංඛ්‍යා ආදිය ද යථෝක්ත ශෝධක මණ්ඩලය මගින් මැ සකස් කරන ලද විය.

මුද්‍රණ අවස්ථාවට පැමිණි වර්තමාන ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ මහතෙරවරුන්ගේ සහාය ඇති වැ මහාවිහාරාන්වයෙහි ආගත වාචනාමාර්ගය නො නැසිය දී ආරක්ෂා කර ගැනීමට වෑයම් කළම්හ. ඒ සඳහා දීඝ–මජ්ඣිමාදි වෙනත් නිකාය ග්‍රන්ථ හා අර්ථකථා ද සංසන්දනය කොට විමසන ලද්දේය. එසේ මැ පරිවර්තනය සකස් කිරීමේ දී සියබසෙහි චිරාගත ශිෂ්ට සම්ප්‍රදාය සුරක්ෂිත කිරීම ද ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ අභිප්‍රේතය විය.

බුද්ධ පරිනිර්වාණයෙන්, හවුරුදු දෙදහස් පන්සියයක් පිරීම නිමිත්ත කොටගෙන පැවැත්වූ බුද්ධජයන්ති උත්සවය අනුස්මරණය කිරීම සඳහා ලංකා බෞද්ධ මණ්ඩලය මගින් ආරම්භ කරන ලද විශිෂ්ටතම වූ ත්‍රිපිටක ග්‍රන්ථ සංශෝධන හා පරිවර්තන කොට යුහුසුලුව මුද්‍රණය කරවාලීම සඳහා ශ්‍රී ලංකාද්වීපයෙහි අතිගරු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන උතුමාණන්ගේ කාරුණික අනුග්‍රහය ද ගරු සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තැන්පත් ඊ. ඇල්. බී. හුරුල්ලේ මැතිතුමාණන්ගේ මෙහෙයැවීම ද සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සෝමපාල ජයවර්ධන මහතාණන්ගේ බුද්ධිපූර්වක උද්‍යෝගය ද නිසා ත්‍රිපිටක මුද්‍රණය අවසාන වෙමින් පවත්නා අතර මෙම සංයුක්ත-ඛන්ධක වර්ගය මුද්‍රණය වීමෙන් දීඝාගමාදි මහානිකාය ග්‍රන්ථ සතරෙහි මුද්‍රණය ද අවසාන වූ බව මෙහිලා පවසම්හ.

තවද ලංකා බෞද්ධ මණ්ඩලයෙහි පරලෝ සැපත්වූ ද ජීවමාන වූ ද හැම සාධූන් හා මේ සත්කාර්‍යයෙහි සහාය වූ ද සතුටුවූ වන්නාවූ හැම පිනැතියන් හා රජයේ මුද්‍රණාලයාධිකාරී **නෙවිල් නානායක්කාර** මහතාණන් ප්‍රමුඛ ත්‍රිපිටක මුද්‍රණාංශයෙහි නියුක්ත වූවාහු ද ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයට සියලු පහසුකම් සලසා දෙන මහානායක වාරිකාරාමයෙහි නියුක්ත ආර්. ඒ. ඇම්. සමරසිංහ මහතා ද ශ්‍රී සද්ධර්ම ප්‍රවර්තක කුශල හේතුයෙන් සුවභාගී වෙත්වා යි මෛත්‍රී පූර්වක වැ ආශංසනය කරම්හ.

මේ වගට, ශාසනෝදයකාරී,

**ලබුගම ලංකානන්ද,**
මහානායකස්ථවිර වම්හ.
ත්‍රිපිටක මණ්ඩලයේ ප්‍රධානසම්පාදක

$\frac{2526}{1983}$ නොවැම්බර් මස 05 වැනි දින,
ත්‍රිපිටක කාර්‍යාලයේ දීයැ.
115, විජේරාම මාවත,
කොළඹ 7.



Free Distribution www.aathaapi.org

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක :**

අග්ගමහාපණ්ඩිත, බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිර පාදයන් වහන්සේ

**සභාපති :**

අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝදාගොඩ ශ්‍රී ඤාණාලෝක දක්ෂිණලංකායෙහි ප්‍රධාන සංඝනායක ස්ථවිරයන් වහන්සේ

**ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පරිවෙණාධිපති ශ්‍රී මහාවිහාරවංශාලංකාර විමල කීර්ති ශ්‍රී ත්‍රිපිටකවාගීශ්වර, රාජකීය පණ්ඩිත ලබුගම ශ්‍රී ලංකානන්ද—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසංඝසභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ

**සම්පාදක :**

කිරුළපන පූර්වාරාමයෙහි හා නාරාහේන්පිට අභයාරාමයෙහි අධිපති අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසංඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසංඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ

හිඟුලේ, මාකඩවර විහාරාධිපති, ශ්‍රී රේවත පරිවෙණාධිපති, රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, කරදන ශ්‍රී ප්‍රඥාලංකාර නායක ස්ථවිරයන් වහන්සේ

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි ත්‍රිපිටක අංශයෙහි මහාචාර්ය, ශාස්ත්‍රාචාර්ය, රාජකීය පණ්ඩිත ත්‍රිපිටකාචාර්ය, උඩුවේ ජනානන්ද ස්ථවිරයන් වහන්සේ

**ලේකම් :**

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල—කොළඹදිශායෙහි ප්‍රධාන සංඝනායක ස්ථවිරයන් වහන්සේ



Free Distribution www.aathaapi.org

# සඞ්කේත නිරූපණය

## ABBREVIATIONS

සීමු — සීහළක්ඛර මුද්දිත, නැදුන්විහාරතිපිටකගන්ථමාලා – මජ්ඣිමනිකායො 1959.

සයා — සයාමක්ඛර මුද්දිත පොත්ථකං.

මජසං — මරම්මඡට්ඨසඞ්ගීති පොත්ථකං.

PTS — PALI TEXT SOCIETY SANYUTTANIKAYA.



Free Distribution www.aathaapi.org

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ a | ආ ā | ඉ i | ඊ ī | උ u | ඌ ū | එ e | ඔ o |

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

### Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ඤ්හ ñha | ද්ද dda | ම්බ, ඹ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ඦ ñja | ද්ව, ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ vha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ඬ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ණ්හ ṇha | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ත tta | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ථ ttha | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | ත්ව tva | ම්ප mpa | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ා ā | ි i | ී ī | ු ු u | ූ ූ ū | ෙ e | ො ō |



Free Distribution www.aathaapi.org

# සංයුත්තනිකායෙ

## තතියො භාගො

## ඛන්ධකවග්ග — විසයසූචි

## 1. ඛන්ධසංයුත්තං 2-573

### I. නකුලපිතුවග්ගො 2 - 37


| | | | |
|---|---|---|---|
| 1. | නකුලපිතු | සුත්තං | 2 - 9 |
| 2. | දේවදහ | ,, | 8 - 15 |
| 3. | හාලිද්දිකානි | ,, | 14 - 21 |
| 4. | දුතිය හාලිද්දිකානි | ,, | 20 - 23 |
| 5 | සමාධිභාවනා | ,, | 22 - 25 |
| 6. | පටිසල්ලාන | ,, | 26 - 29 |
| 7. | පඨමඋපාදාපරිතස්සනා | ,, | 28 - 33 |
| 8. | දුතියඋපාදාපරිතස්සනා | ,, | 32 - 33 |
| 9. | පඨමඅතීතානාගත | ,, | 34 - 35 |
| 10. | දුතියඅතීතානාගත | ,, | 34 - 35 |
| 11. | තතිය අතීතානාගත | ,, | 34 - 37 |


### 2. අනිච්චවග්ගො 38 - 45


| | | | |
|---|---|---|---|
| 1. | අනිච්ච | සුත්තං | 38 - 39 |
| 2. | දුක්ඛ | ,, | 38 - 39 |
| 3. | අනත්ත | ,, | 38 - 39 |
| 4. | යදනිච්ච | ,, | 38 - 41 |
| 5. | යංදුක්ඛ | ,, | 40 - 41 |
| 6. | යදනත්ත | ,, | 40 - 41 |
| 7. | පඨමහේතු | ,, | 40 - 41 |
| 8. | දුතියහේතු | ,, | 42 - 43 |
| 9. | තතිය හේතු | ,, | 42 - 43 |
| 10. | ආනන්ද | ,, | 42 - 45 |


### 8. භාරවග්ගො 46 - 59


| | | | |
|---|---|---|---|
| 1. | භාර | සුත්තං | 46 - 47 |
| 2. | පරිඤ්ඤා | ,, | 46 - 49 |
| 3. | අභිජාන | ,, | 48 - 49 |
| 4 | ඡන්දරාග | ,, | 48 - 49 |




Free Distribution www.aathaapi.org

| | | | |
|---|---|---|---|
| 5. | පඨමඅස්සාද | සුත්තං | 50 - 51 |
| 6. | දුතිය අස්සාද | ,, | 52 - 53 |
| 7. | තතිය අස්සාද | ,, | 52 - 55 |
| 8. | අභිනන්දන | ,, | 54 - 57 |
| 9. | උප්පාද | ,, | 56 - 57 |
| 10. | අඝමූල | ,, | 56 - 57 |
| 11. | පභඞ්ගු | ,, | 58 - 59 |

## 4. නතුම්හාක වග්ගො 60 - 75

| | | | |
|---|---|---|---|
| 1. | පඨම නතුම්හාක | සුත්තං | 60 - 61 |
| 2. | දුතිය නතුම්හාක | ,, | 60 - 63 |
| 3. | පඨම භික්ඛු | ,, | 62 - 65 |
| 4. | දුතිය භික්ඛු | ,, | 64 - 67 |
| 5. | පඨම ආනන්ද | ,, | 66 - 69 |
| 6. | දුතිය ආනන්ද | , | 68 - 71 |
| 7. | පඨම අනුධම්ම | ,, | 70 - 73 |
| 8. | දුතිය අනුධම්ම | ,, | 72 - 73 |
| 9. | තතිය අනුධම්ම | ,, | 72 - 73 |
| 10. | චතුත්ථ අනුධම්ම | ,, | 74 - 75 |

## 5. අත්තදීප වග්ගො 76 - 93

| | | | |
|---|---|---|---|
| 1. | අත්තදීප | සුත්තං | 76 - 79 |
| 2. | පටිපදා | ,, | 78 - 81 |
| 3. | පඨමඅනිච්චතා | ,, | 80 - 81 |
| 4. | දුතිය අනිච්චතා | ,, | 82 - 83 |
| 5. | සමනුපස්සනා | ,, | 82 - 85 |
| 6. | ඛන්ධ | ,, | 84 - 87 |
| 7. | පඨමසොණ | ,, | 86 - 89 |
| 8 | දුතියසොණ | ,, | 90 - 91 |
| 9 | පඨමනන්දික්ඛය | ,, | 90 - 91 |
| 10 | දුතියනන්දික්ඛය | ,, | 92 - 93 |

# මජ්ඣිම පණ්ණාසක

## 1. උපයවග්ගො 94 - 125

| | | | |
|---|---|---|---|
| 1. | උපය | සුත්තං | 4 - 95 |
| 2. | බීජ | ,, | 4 - 97 |
| 3. | උදාන | ,, | 8 - 103 |

| | | | |
|---|---|---|---|
| 4. | උපාදාන පරිවත්ත | සුත්තං | 102 - 109 |
| 5. | සත්තට්ඨාන | ,, | 108 - 113 |
| 6. | සම්බුද්ධ | ,, | 114 - 115 |
| 7. | පඤ්චවග්ගිය | ,, | 114 - 119 |
| 8. | මහාලි | ,, | 118 - 121 |
| 9. | ආදිත්ත | ,, | 120 - 123 |
| 10. | නිරුත්තිපථ | ,, | 122 - 125 |

## 2. අරහන්ත වග්ගො 126 - 141

| | | | |
|---|---|---|---|
| 1. | උපාදිය | සුත්තං | 126 - 129 |
| 2. | මඤ්ඤමාන | ,, | 128 - 129 |
| 3. | අභිනන්දන | ,, | 130 - 131 |
| 4. | අනිච්ච | ,, | 130 - 133 |
| 5. | දුක්ඛ | ,, | 132 - 135 |
| 6. | අනත්ත | ,, | 134 - 135 |
| 7. | අනත්තනිය | ,, | 136 - 137 |
| 8. | රජනීය | ,, | 136 - 139 |
| 9. | රාධ | ,, | 138 - 141 |
| 10. | සුරාධ | ,, | 140 - 141 |

## 3. ඛජ්ජනීය වග්ගො 142 - 179

| | | | |
|---|---|---|---|
| 1. | අස්සාද | සුත්තං | 142 - 143 |
| 2. | පඨම සමුදය | ,, | 142 - 143 |
| 3. | දුතිය සමුදය | ,, | 142 - 143 |
| 4. | පඨම අරහන්ත | ,, | 144 - 145 |
| 5. | දුතිය අරහන්ත | ,, | 146 - 147 |
| 6. | සීහොපම | ,, | 146 - 149 |
| 7. | ඛජ්ජනීය | ,, | 148 - 155 |
| 8. | පිණ්ඩොල්‍ය | ,, | 156 - 161 |
| 9. | පාරිලෙය්‍යක | ,, | 160 - 171 |
| 10. | පුණ්ණමා | ,, | 170 - 179 |

## 4. ථෙර වග්ගො 180 - 235

| | | | |
|---|---|---|---|
| 1. | ආනන්ද | සුත්තං | 180 - 183 |
| 2. | තිස්ස | ,, | 182 - 189 |
| 3. | යමක | ,, | 188 - 201 |
| 4. | අනුරාධ | ,, | 200 - 207 |
| 5. | වක්කලි | ,, | 206 - 215 |




2—ඒ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

| | | | |
|---|---|---|---|
| 6. | අස්සජි | ,, | 214 – 219 |
| 7. | ඛේමක | ,, | 218 – 227 |
| 8. | ඡන්න | ,, | 226 – 233 |
| 9. | පඨම රාහුල | ,, | 232 – 235 |
| 10. | දුතිය රාහුල | ,, | 234 – 235 |

5. පුප්ඵ වග්ගෝ 236 – 271

| | | | |
|---|---|---|---|
| 1. | නදී | සුත්තං | 236 – 239 |
| 2. | පුප්ඵ | ,, | 238 – 241 |
| 3. | ඵේණපිණ්ඩූපම | ,, | 240 – 247 |
| 4. | ගෝමයපිණ්ඩූපම | ,, | 246 – 253 |
| 5. | නඛසිඛෝපම | ,, | 252 – 255 |
| 6. | සුද්ධික | ,, | 254 – 255 |
| 7. | ගද්දුලබද්ධ | ,, | 256 – 259 |
| 8. | දුතිය ගද්දුලබද්ධ | ,, | 258 – 261 |
| 9. | වාසිජටෝපම | ,, | 262 – 267 |
| 10. | අනිච්ච සඤ්ඤා | ,, | 266 – 271 |


## උපරිපණ්ණාසක


1. අන්තවග්ගෝ 272 – 283

| | | | |
|---|---|---|---|
| 1. | අන්ත | සුත්තං | 272 – 273 |
| 2. | දුක්ඛ | ,, | 274 – 275 |
| 3. | සක්කාය | ,, | 274 – 277 |
| 4. | පරිඤ්ඤෙය්‍ය | ,, | 276 – 277 |
| 5. | සමණ | ,, | 278 – 279 |
| 6. | දුතියසමණ | ,, | 278 – 279 |
| 7. | සෝතාපන්න | ,, | 278 – 279 |
| 8. | අරහන්ත | ,, | 280 – 281 |
| 9. | පඨමඡන්දරාග | ,, | 280 – 281 |
| 10. | දුතියඡන්දරාග | ,, | 280 – 283 |

2. ධම්මකථිකවග්ගෝ 284 – 301

| | | | |
|---|---|---|---|
| 1. | අවිජ්ජා | සුත්තං | 284 – 285 |
| 2. | විජ්ජා | ,, | 284 – 285 |
| 3. | පඨමධම්මකථික | ,, | 284 – 287 |
| 4. | දුතියධම්මකථික | ,, | 286 – 287 |
| 5. | බන්ධන | ,, | 288 – 291 |




Free Distribution www.aathaapi.org

| | | | |
|---|---|---|---|
| 6. | පඨමපරිපුච්ඡිත | ,, | 290 – 291 |
| 7. | දුතියපරිපුච්ඡිත | ,, | 290 – 293 |
| 8. | සඤ්ඤොජනිය | ,, | 292 – 293 |
| 9. | උපාදානිය | ,, | 292 – 293 |
| 10. | සීල | ,, | 294 – 297 |
| 11. | සුතවන්ත | ,, | 296 – 299 |
| 12. | පඨමකප්ප | ,, | 298 – 299 |
| 13. | දුතියකප්ප | ,, | 298 – 301 |


## 3. අවිජ්ජාවග්ගො 302 – 313


| | | | |
|---|---|---|---|
| 1 | පඨම සමුදයධම්ම | සුත්තං | 302 – 303 |
| 2. | දුතිය සමුදයධම්ම | ,, | 304 – 305 |
| 3. | තතිය සමුදයධම්ම | ,, | 304 – 305 |
| 4. | පඨම අස්සාද | ,, | 306 – 307 |
| 5. | දුතිය අස්සාද | ,, | 306 – 307 |
| 6. | පඨම සමුදය | ,, | 306 – 307 |
| 7. | දුතිය සමුදය | ,, | 308 – 309 |
| 8. | කොට්ඨිත | ,, | 308 – 309 |
| 9. | දුතිය කොට්ඨිත | ,, | 310 – 311 |
| 10. | තතිය කොට්ඨිත | ,, | 310 – 313 |


## 4. කුක්කුළවග්ගො 314 – 323


| | | | |
|---|---|---|---|
| 1. | කුක්කුළ | සුත්තං | 314 – 315 |
| 2. | පඨම අනිච්ච | ,, | 314 – 315 |
| 3. | දුතිය අනිච්ච | ,, | 314 – 315 |
| 4. | තතිය අනිච්ච | ,, | 316 – 317 |
| 5. | පඨම දුක්ඛ | ,, | 316 – 317 |
| 6. | දුතිය දුක්ඛ | ,, | 316 – 317 |
| 7. | තතිය දුක්ඛ | ,, | 316 – 317 |
| 8. | අනත්ත | ,, | 318 – 319 |
| 9. | දුතිය අනත්ත | ,, | 318 – 319 |
| 10. | තතිය අනත්ත | ,, | 318 – 319 |
| 11. | නිබ්බිදාබහුල | ,, | 320 – 321 |
| 12. | අනිච්චානුපස්සනා | ,, | 320 – 321 |
| 13. | දුක්ඛානුපස්සී | ,, | 320 – 323 |
| 14. | අනත්තානුපස්සනා | ,, | 322 – 323 |




Free Distribution www.aathaapi.org

## 5. දිට්ඨිවග්ගො 324 - 339


| | | | |
|---|---|---|---|
| 1. | අජ්ඣත්ත | සුත්තං | 324 - 325 |
| 2. | එතං මම | ,, | 324 - 327 |
| 3. | සො අත්තා | ,, | 326 - 329 |
| 4. | නො ච මෙ සියා | ,, | 328 - 329 |
| 5. | මිච්ඡාදිට්ඨි | ,, | 330 - 331 |
| 6. | සක්කායදිට්ඨි | ,, | 330 - 333 |
| 7. | අත්තානුදිට්ඨි | ,, | 332 - 333 |
| 8. | පඨම අභිනිවෙස | ,, | 334 - 335 |
| 9. | දුතිය අභිනිවෙස | ,, | 334 - 337 |
| 10. | ආනන්ද | ,, | 336 - 339 |


# 2. රාධ සංයුත්තං 340 - 377

## 1. පඨම මාරවග්ගො 340 - 351


| | | | |
|---|---|---|---|
| 1. | මාර | සුත්තං | 340 - 343 |
| 2. | සත්ත | ,, | 342 - 343 |
| 3. | භවනෙත්ති | ,, | 344 - 345 |
| 4. | පරිඤ්ඤෙය්‍ය | ,, | 344 - 345 |
| 5. | සමණ | ,, | 346 - 347 |
| 6. | දුතිය සමණ | ,, | 346 - 347 |
| 7. | සොතාපන්න | ,, | 346 - 347 |
| 8. | අරහන්ත | ,, | 348 - 349 |
| 9. | ඡන්දරාග | ,, | 348 - 349 |
| 10. | දුතිය ඡන්දරාග | ,, | 348 - 351 |


## 2. දුතිය මාරවග්ගො 352 - 359


| | | | |
|---|---|---|---|
| 1. | මාර | සුත්තං | 352 - 353 |
| 2 | මාරධම්ම | ,, | 352 - 353 |
| 3. | අනිච්ච | ,, | 352 - 353 |
| 4 | අනිච්චධම්ම | ,, | 354 - 355 |
| 5. | දුක්ඛ | ,, | 354 - 355 |
| 6. | දුක්ඛධම්ම | ,, | 354 - 355 |
| 7. | අනත්ත | ,, | 356 - 357 |
| 8. | අනත්තධම්ම | ,, | 356 - 357 |
| 9. | ඛයධම්ම | ,, | 356 - 357 |
| 10. | වයධම්ම | ,, | 358 - 359 |
| 11. | සමුදයධම්ම | ,, | 358 - 359 |
| 12. | නිරොධ ධම්ම | ,, | 358 - 359 |

### 3. ආයාචනවග්ගො 360 - 371


| | | | |
|---|---|---|---|
| 1. | මාර | සුත්තං | 360 - 361 |
| 2. | මාරධම්ම | ,, | 360 - 361 |
| 3. | අනිච්ච | ,, | 362 - 363 |
| 4. | අනිච්චධම්ම | ,, | 362 - 363 |
| 5. | දුක්ඛ | ,, | 362 - 365 |
| 6. | දුක්ඛධම්ම | ,, | 364 - 365 |
| 7. | අනත්ත | ,, | 364 - 365 |
| 8. | අනත්තධම්ම | ,, | 366 - 367 |
| 9. | ඛයධම්ම | ,, | 366 - 367 |
| 10. | වයධම්ම | ,, | 366 - 369 |
| 11. | සමුදයධම්ම | ,, | 368 - 369 |
| 12. | නිරොධ ධම්ම | ,, | 368 - 371 |


### 4. උපනිසින්නවග්ගො 372 - 377


| | | | |
|---|---|---|---|
| 1. | මාර | සුත්තං | 372 - 373 |
| 2. | මාරධම්ම | ,, | 372 - 373 |
| 3. | අනිච්ච | ,, | 372 - 373 |
| 4. | අනිච්ච ධම්ම | ,, | 374 - 375 |
| 5. | දුක්ඛ | ,, | 374 - 375 |
| 6. | දුක්ඛ ධම්ම | ,, | 374 - 375 |
| 7. | අනත්ත | ,, | 374 - 375 |
| 8. | අනත්තධම්ම | ,, | 374 - 375 |
| 9. | ඛයධම්ම | ,, | 374 - 375 |
| 10. | වයධම්ම | ,, | 376 - 377 |
| 11. | සමුදයධම්ම | ,, | 376 - 377 |
| 12. | නිරොධ ධම්ම | ,, | 376 - 377 |


## 3. දිට්ඨි සංයුත්තං 378-441

### 1. සොතාපත්තිවග්ගො 378 - 417


| | | | |
|---|---|---|---|
| 1. | වාත | සුත්තං | 378 - 381 |
| 2. | එතංමම | ,, | 380 - 383 |
| 3. | සො අත්තා | ,, | 382 - 387 |
| 4. | නො ච මෙ සියා | ,, | 386 - 389 |
| 5. | නත්ථිදින්න | ,, | 388 - 391 |
| 6. | කරතො | ,, | 392 - 395 |
| 7. | හෙතු | ,, | 394 - 397 |




Free Distribution www.aathaapi.org

| | | | |
|---|---|---|---|
| 8. | මහාදිට්ඨි | සුත්තං | 396 - 403 |
| 9. | සස්සතලොක | ,, | 402 - 405 |
| 10. | අසස්සතලොක | ,, | 404 - 407 |
| 11. | අන්තවා | ,, | 406 - 407 |
| 12. | අනන්තවා | ,, | 408 - 409 |
| 13. | තං ජීවං තං සරීර | ,, | 408 - 411 |
| 14. | අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර | ,, | 410 - 411 |
| 15. | හොති තථාගත | ,, | 412 - 413 |
| 16. | න හොති තථාගත | ,, | 412 - 415 |
| 17. | හොති ච න ච හොති තථාගත | ,, | 414 - 415 |
| 18. | නෙව හොති න නහොති තථාගත | ,, | 416 - 417 |


## 2. ගමනවග්ගො 418 - 431


| | | | |
|---|---|---|---|
| 1. | වාත | සුත්තං | 418 - 419 |
| 2 - 6. | එතං මම - සො අත්තා - නො ච මෙ සියා - නත්ථිදින්න - කරතො | ,, | 420 - 421 |
| 7-12. | නත්ථිහෙතු - මහාදිට්ඨි - සස්සත ලොක - අසස්සත - අන්තවා - අනන්තවාලොක | ,, | 422 - 423 |
| 13-18. | තංජීවතංසරීර - අඤ්ඤංජීවඅඤ්ඤං සරීර - හොතිතථාගත - නහොතිතථාගත - හොතිච නචහොති තථාගත - නෙව හොති න න හොති තථාගත | ,, | 424 - 427 |
| 19. | රූපී අත්තා | ,, | 426 - 427 |
| 20. | අරූපී අත්තා | ,, | 426 - 427 |
| 21. | රූපී ච අරූපී ච අත්තා | ,, | 428 - 429 |
| 22. | නෙව රූපී නාරූපී අත්තා | ,, | 428 - 429 |
| 23. | එකන්ත සුඛී අත්තා | ,, | 428 - 429 |
| 24. | එකන්ත දුක්ඛී අත්තා | ,, | 428 - 429 |
| 25. | සුඛදුක්ඛී අත්තා | ,, | 428 - 429 |
| 26. | අදුක්ඛමසුඛී අත්තා | ,, | 428 - 431 |


## 3. තතියගමනවග්ගො 432 - 435


| | | | |
|---|---|---|---|
| 1-25. | වාත | සුත්තං | 432 - 433 |
| 26. | අදුක්ඛමසුඛීඅත්තා | ,, | 432 - 435 |


## 4. චතුත්ථගමනවග්ගො 436 - 441


| | | | |
|---|---|---|---|
| 1-25. | වාත | සුත්තං | 436 - 437 |
| 26. | අදුක්ඛමසුඛීඅත්තා | ,, | 438 - 439 |




Free Distribution www.aathaapi.org

## 4. ඔක්කන්ති සංයුත්තං 442 - 449

### 1. ඔක්කන්තිසංයුත්තං 442 - 449


| | | | |
|---|---|---|---|
| 1. | චක්ඛු | සුත්තං | 442 - 443 |
| 2. | රූප | ,, | 442 - 445 |
| 3. | විඤ්ඤාණ | ,, | 444 - 445 |
| 4. | ඵස්ස | ,, | 444 - 445 |
| 5. | වේදනා | ,, | 444 - 445 |
| 6. | සඤ්ඤා | ,, | 446 - 447 |
| 7. | චේතනා | ,, | 446 - 447 |
| 8. | තණ්හා | ,, | 446 - 447 |
| 9. | ධාතු | ,, | 446 - 447 |
| 10. | ඛන්ධ | ,, | 448 - 449 |


## 5. උප්පාද සංයුත්තං 450 - 457


| | | | |
|---|---|---|---|
| 1. | චක්ඛු | සුත්තං | 450 - 451 |
| 2. | රූප | ,, | 450 - 451 |
| 3. | විඤ්ඤාණ | ,, | 452 - 453 |
| 4. | ඵස්ස | ,, | 452 - 453 |
| 5. | වේදනා | ,, | 452 - 453 |
| 6. | සඤ්ඤා | ,, | 452 - 453 |
| 7. | චේතනා | ,, | 454 - 455 |
| 8. | තණ්හා | ,, | 454 - 455 |
| 9. | ධාතු | ,, | 454 - 455 |
| 10. | ඛන්ධ | ,, | 454 - 457 |


## 6. කිලෙස සංයුත්තං 458 - 459


| | | | |
|---|---|---|---|
| 1. | චක්ඛු | සුත්තං | 458 - 459 |
| 2. | රූප | ,, | 458 - 459 |
| 3. | විඤ්ඤාණ | ,, | 458 - 461 |
| 4. | ඵස්ස | ,, | 460 - 461 |
| 5. | වේදනා | ,, | 460 - 461 |
| 6. | සඤ්ඤා | ,, | 460 - 461 |
| 7. | චේතනා | ,, | 462 - 463 |
| 8. | තණ්හා | ,, | 462 - 463 |
| 9. | ධාතු | ,, | 462 - 465 |
| 10. | ඛන්ධ | ,, | 464 - 465 |




Free Distribution www.aathaapi.org

## 7. සාරිපුත්ත සංයුත්තං 466 - 477


| | | | |
|---|---|---|---|
| 1. | විවෙකජ | සුත්තං | 466 - 467 |
| 2. | අවිතක්ක | ,, | 468 - 469 |
| 3. | පීති | ,, | 468 - 469 |
| 4. | උපෙක්ඛා | ,, | 468 - 471 |
| 5. | අකාසානඤ්චායතන | ,, | 470 - 471 |
| 6. | විඤ්ඤාණඤ්චායතන | ,, | 470 - 471 |
| 7. | ආකිඤ්චඤ්ඤායතන | ,, | 470 - 471 |
| 8. | නෙවසඤ්ඤානාසඤ්ඤායතන | ,, | 470 - 471 |
| 9. | නිරොධසමාපත්ති | ,, | 472 - 473 |
| 10. | සූචිමුඛී | ,, | 472 - 477 |


## 8. නාග සංයුත්තං 478 - 493


| | | | |
|---|---|---|---|
| 1. | සුද්ධික | සුත්තං | 478 - 479 |
| 2 | පණීතතර | ,, | 478 - 479 |
| 3. | උපොසථ | ,, | 478 - 481 |
| 4. | දුතිය උපොසථ | ,, | 480 - 481 |
| 5. | තතිය උපොසථ | ,, | 480 - 481 |
| 6. | චතුත්ථ උපොසථ | ,, | 480 - 483 |
| 7. | සුත | ,, | 482 - 483 |
| 8. | දුතිය සුත | ,, | 482 - 483 |
| 9. | තතිය සුත | ,, | 484 - 485 |
| 10. | චතුත්ථ සුත | ,, | 484 - 486 |
| 11. | අන්නදායක අණ්ඩජ | ,, | 484 - 485 |
| 12-19. | පාන - වත්ථ - යාන - මාලා - ගන්ධ - විලෙපන - සෙය්‍ය - ආවසථදායක අණ්ඩජ | සුත්තං | 486 - 487 |
| 20. | පදීපෙය්‍යදායක අණ්ඩජ | සුත්තං | 488 - 489 |
| 21-40. | අන්නදායකාදි ජලාබුජ සංසෙදජ සුත්තානි | | 488 - 489 |
| 41-44. | අන්නදායක ඔපපාතික - පාන - වත්ථ - යානදායක ඔපපාතික සුත්තං | | 488 - 489 |
| 45-50. | මාලා - ගන්ධ - විලෙපන - සෙය්‍ය - ආවසථ - පදීපෙය්‍යදායක ඔපපාතික | සුත්තං | 490 - 491 |





Free Distribution www.aathaapi.org

## 9. සුපණ්ණ සංයුත්තං 494 - 505

### 1. සුපණ්ණවග්ගො 494 - 503


| | | | |
|---|---|---|---|
| 1. | සුද්ධික | සුත්තං | 494 - 495 |
| 2. | හරන්ති | ,, | 494 - 495 |
| 3. | ද්වයකාරී | ,, | 494 - 497 |
| 4 - 6. | දුතිය - තතිය - චතුත්ථ - ද්වයකාරී සුත්තානි | | 496 - 497 |
| 7. | අන්නදායක අණ්ඩජ | සුත්තං | 496 - 497 |
| 8-15. | පානදායක - වත්ථ - යාන - මාලා - ගන්ධ - විලෙපන - සෙය්‍ය - ආවසථ දායක අණ්ඩජ | සුත්තං | 498 - 499 |
| 16. | පදීපෙය්‍යදායක අණ්ඩජ | සුත්තං | 500 - 501 |
| 17-36. | අන්නදායකාදි ජලාබුජ සංසෙදජ සුත්තානි | | 500 - 501 |
| 37-40. | අන්නදායක - පාන - වත්ථ - යාන - දායක ඔපපාතික | සුත්තං | 500 - 501 |
| 41-46. | මාලාදායක - ගන්ධ - විලෙපන - සෙය්‍ය - ආවසථ - පදීපෙය්‍ය - දායක ඔපපාතික | සුත්තං | 502 - 503 |


## 10. ගන්ධබ්බ සංයුත්තං 504 - 511

### 1. ගන්ධබ්බවග්ගො 504 - 511


| | | | |
|---|---|---|---|
| 1. | සුද්ධික | සුත්තං | 504 - 505 |
| 2. | සුචරිත | ,, | 504 - 505 |
| 3. | මූලගන්ධ | ,, | 506 - 507 |
| 4-12. | සාරගන්ධාදි | සුත්තානි | 506 - 507 |
| 13-22. | අන්නදානාදි - මූලගන්ධාදි | ,, | 508 - 509 |
| 23-112. | අන්නදානාදි - සාරගන්ධාදි | ,, | 508 - 511 |


## 11. වලාහක සංයුත්තං 512 - 519

### 1. වලාහකවග්ගො 512 - 519


| | | | |
|---|---|---|---|
| 1. | සුද්ධික | සුත්තං | 512 - 513 |
| 2. | සුචරිත | ,, | 512 - 513 |
| 3-12. | අන්නදායකාදි සීතවලාහක සුත්තානි | | 514 - 515 |
| 13-52. | අන්නදායකාදි උණ්හවලාහකාදි සුත්තානි | | 514 - 517 |





2A—ජ 50066 (80/06)



Free Distribution www.aathaapi.org

| | | | |
|---|---|---|---|
| 53. | සීතවලාහක | සුත්තං | 516 - 517 |
| 54. | උණ්හවලාහක | ,, | 516 - 517 |
| 55. | අබ්භවලාහක | ,, | 516 - 617 |
| 56. | වාතවලාහක | ,, | 518 - 519 |
| 57. | වස්සවලාහක | ,, | 518 - 519 |


## 12. වච්ඡගොත්ත සංයුත්තං 520 - 537

### 1. වච්ඡගොත්තවග්ගො 520 - 537


| | | | |
|---|---|---|---|
| 1. | රූප අඤ්ඤාණ | සුත්තං | 520 - 521 |
| 2. | වේදනා අඤ්ඤාණ | ,, | 520 - 523 |
| 3. | සඤ්ඤා අඤ්ඤාණ | ,, | 522 - 523 |
| 4 | සඞ්ඛාර අඤ්ඤාණ | ,, | 522 - 525 |
| 5. | විඤ්ඤාණ අඤ්ඤාණ | ,, | 524 - 525 |
| 6. | රූප අදස්සන | ,, | 524 - 525 |
| 7. | වේදනා අදස්සන | ,, | 524 - 525 |
| 8. | සඤ්ඤා අදස්සන | ,, | 526 - 527 |
| 9. | සඞ්ඛාර අදස්සන | ,, | 526 - 527 |
| 10. | විඤ්ඤාණ අදස්සන | ,, | 526 - 527 |
| 11. | රූප අනභිසමය | ,, | 526 - 527 |
| 12. | වේදනා අනභිසමය | ,, | 526 - 527 |
| 13. | සඤ්ඤා අනභිසමය | ,, | 528 - 529 |
| 14. | සඞ්ඛාර අනභිසමය | ,, | 528 - 529 |
| 15. | විඤ්ඤාණ අනභිසමය | ,, | 528 - 529 |
| 16 | රූප අනනුබෝධ | ,, | 528 - 529 |
| 17. | වේදනා අනනුබෝධ | ,, | 528 - 529 |
| 18. | සඤ්ඤා අනනුබෝධ | ,, | 528 - 529 |
| 19. | සඞ්ඛාර අනනුබෝධ | ,, | 530 - 531 |
| 20. | විඤ්ඤාණ අනනුබෝධ | ,, | 530 - 531 |
| 21-25. | රූප - වේදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණ - අප්පටිවේධ | ,, | 530 - 531 |
| 26-29. | රූපාදි අසල්ලක්ඛණ | | |
| 30. | විඤ්ඤාණ අසල්ලක්ඛණ | ,, | 532 - 533 |
| 31-34. | රූපාදි අනුපලක්ඛණ - | | |
| 35. | විඤ්ඤාණ අනුපලක්ඛණ | ,, | 532 - 533 |
| 36-40. | රූපාදි අපච්චුපලක්ඛණ | ,, | 532 - 533 |
| 41-45. | රූපාදි අසමපෙක්ඛණ | ,, | 532 - 533 |




Free Distribution www.aathaapi.org

46-50. රූපාදි අපච්චුපෙක්ඛණ සුත්තං 532 – 533
51-54. රූප – වේදනා – සඤ්ඤා – සඞ්ඛාර අපච්චක්ඛකම්ම ,, 534 – 535
55 විඤ්ඤාණ අපච්චක්ඛකම්ම ,, 534 – 537

## 13. ඣාන සංයුත්තං 538 - 573

### I. ඣානවග්ගො 538 – 573

1. සමාපත්තිකුසල සුත්තං 538 – 539
2. ඨිතිකුසල ,, 538 - 541
3 වුට්ඨාන කුසල ,, 540 – 541
4. කල්ලිත කුසල ,, 540 - 543
5. ආරම්මණ කුසලතා ,, 542 – 543
6. ගොචර කුසලතා ,, 542 - 545
7. අභිනීහාර කුසලතා ,, 544 - 545
8. සක්කච්චකාරී ,, 544 – 547
9. සාතච්චකාරී ,, 546 – 547
10 සප්පායකාරී ,, 546 – 549
11. සමාපත්ති ඨිතිකුසල ,, 548 – 549
12. සමාපත්තිවුට්ඨානකුසල ,, 548 - 551
13. සමාපත්තිකල්ලිතකුසල ,, 550 - 551
14. සමාපත්තිආරම්මණකුසල ,, 550 - 553
15-18. සමාපත්ති ඨිති-ගොචරකුසල ඨිතිඅභිනීහාර – සක්කච්චකාරී ඨිති – සාතච්චකාරී ,, 552 – 553
19-21. සමාපත්තිසප්පායකාරී – ඨිති වුට්ඨාන – ඨිතිකල්ලිත ,, 554 - 555
22-27. ඨිතිආරම්මණ - ගොචර - අභිනීහාර – සක්කච්චකාරී – සාතච්චකාරී – සප්පායකාරී 556 - 557
28 29. වුට්ඨානකල්ලිත – වුට්ඨාන ආරම්මණ ,, 558 559
30 34 වුට්ඨානගොචර – අභිනීහාර – සක්කච්චකාරී – සාතච්චකාරී – සප්පායකාරී ,, 560 - 561
35 38. කල්ලිතආරම්මණ – ගොචර – අභිනීහාර – සක්කච්චකාරී ,, 562 – 563
39 42. කල්ලිතසාතච්චකාරී – සප්පායකාරී – ආරම්මණගොචර – අභිනීහාර ,, 564 - 565



Free Distribution www.aathaapi.org

| | | | |
|---|---|---|---|
| 43-47. | ආරම්මණසක්කච්චකාරී - සුත්තං<br>සාතච්චකාරී - සප්පායකාරී -<br>ගොචර සක්කච්චකාරී -<br>සාතච්චකාරී | ,, | 566 - 567 |
| 48-52. | ගොචරසාතච්චකාරී -<br>සප්පායකාරී - අභිනීහාර<br>සක්කච්චකාරී - සාතච්චකාරී -<br>සප්පායකාරී | ,, | 568 - 569 |
| 53. | සක්කච්චසාතච්චකාරී | ,, | 270 - 571 |
| 54. | ආරම්මණසප්පායකාරී | ,, | 570 - 571 |
| 55. | සක්කච්චසාතච්චකාරී | ,, | 570 - 575 |

සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

තතියො භාගො

## ඛන්ධකවග්ගො

සූත්‍රාන්තපිටකයෙහි

# සංයුත්තනිකාය

තෘතීය භාගය

## ඛන්ධකවර්ගය

Free Distribution www.aathaapi.org

# සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

තතියො භාගො

## ඛන්ධකවග්ගො

## 1. ඛන්ධසංයුත්තං

### 1. මූලපණ්ණාසකො

### 1. නකුලපිතුවග්ගො

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

### 1. 1. 1. 1.

### නකුලපිතු සුත්තං

1. ඒවං මෙ සුතං: එකං සමයං භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ[1] භෙසකලාවනෙ මිගදායෙ.

අථ ඛො නකුලපිතා ගහපති යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො නකුලපිතා ගහපති භගවන්තං එතදවොච. "අහමස්මි භන්තෙ, ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො ආතුරකායො අභිණ්හාතඞ්කො.[2] අනිච්චදස්සාවී ඛො පනාහං භන්තෙ, භගවතො මනොභාවනීයානඤ්ච භික්ඛූනං. ඔවදතු මං භන්තෙ භගවා, අනුසාසතු මං භන්තෙ භගවා, යං මමස්ස දීඝරත්තං හිතාය සුඛායා"ති.

"එවමෙතං ගහපති, එවමෙතං ගහපති, ආතුරො හ'යං[3] ගහපති, කායො අණ්ඩභූතො[4] පරියොනද්ධො. යො හි ගහපති. ඉමං කායං පරිහරන්තො මුහුත්තම්පි ආරොග්‍යං පටිජානෙය්‍ය, කිමඤ්ඤත්‍ර බාල්‍යා. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: ආතුරකායස්ස මෙ සතො චිත්තං අනාතුරං භවිස්සතීති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බන්ති."

---

1. සුසුමාරගිරෙ – මජසං.
2. අභික්ඛණාතඞ්කො – මජසං, සහ්‍යා, සී, 1 අභිණ්හායාතඞ්කො – සී, 2
3. ආතුරොහායං – මජසං, සහ්‍යා, ආතුරො තෙ – සී 1, 2, PTS
4. අද්ධභූතො – PTS.



Free Distribution www.aathaapi.org

## සූත්‍රාන්තපිටකයෙහි

# සංයුත්තනිකාය

තෘතීය භාගය

## ඛන්‍ධකවර්‍ගය

## 1. ඛන්‍ධසංයුත්තය

### 1. මූලපණ්ණාසකය

### 1. නකුලපිතු වර්‍ගය

ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා

### 1. 1. 1. 1.
### නකුලපිතු සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ භග්ග දනව්වෙහි සුංසුමාරගිර නුවර සමීපයෙහි භේසකලා මුවළැව්හි වැඩ වසන සේක.

එකල්හි නකුලපිතු ගැහැවි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ යැ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳ. එකත්පසෙක හුන් නකුලපිතුගැහැවි භාග්‍යවතුන් වහන්සේට " වහන්ස, මම ජරායෙන් ජීර්ණයෙමි. (වයසින්) වැඩුණෙමි මහලුවෙමි, වයස්ගතයෙමි, පැසුළුවියට පැමිණියෙමි. ගිලන්කය ඇත්තෙමි. නිරතුරු රෝග ඇත්තෙමි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක වූ මනෝභාවනීය භික්ෂූන් නිතර නො දක්නාසුලු වෙමි වහන්ස, යම්සේ මට දිගුකලක් හිත සුව පිණිස පවතී නම්, භාග්‍යවතුන් වහන්සේ එසේ මට අවවාද කරන සේක්වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට අනුශාසනා කරන සේක්ව " යි තෙල සැලකෙළේ යැ.

" ගැහැවි, තෙල එසේ මැයැ, ගැහැවි, තෙල එසේ මැයැ, ගැහැවි, මේ කය රෝග ඇත්තෙක් මැයැ (දුබල බැවින්) බිජුවටක් වැන්න, සියුම් සිවියෙන් වැසුණේ යැ. ගැහැවි, යමෙක් මේ කය පරිහරණය කරමින් මොහොතකුදු නීරෝගබවක් පිළින කරන්නේ නම් ඒ බාලබව හැර අන් කිමෙක් ද ? ගැහැවි, එහෙයින් තොප විසින් මෙහිලා මෙසේ හික්මිය යුතු : " ගිලන් කය ඇති මාගේ සිත නො ගිලන් වෙති " යි. ගැහැවි, තොප විසින් මෙසේ මැ හික්මිය යුතු යි වදළහ.



Free Distribution www.aathaapi.org

අථ ඛො නකුලපිතා ගහපති භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො නකුලපිතරං ගහපතිං ආයස්මා සාරිපුත්තො එතදවොච : "විප්පසන්නානි ඛො තෙ ගහපති, ඉන්ද්‍රියානි, පරිසුද්ධො මුඛවණ්ණො පරියොදාතො, අලත්ථ නො අජ්ජ භගවතො සම්මුඛා ධම්මිං කථං සවණායා"ති. කිං හි[1] නො සියා භන්තෙ, ඉදානාහං භන්තෙ, භගවතා ධම්මියා කථාය අමතෙන අභිසිත්තොති. "යථාකථං පන ත්වං ගහපති, භගවතා ධම්මියා කථාය අමතෙන අභිසිත්තො"ති?

"ඉධාහං භන්තෙ, යෙන භගවා තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිං. එකමන්තං නිසින්නො ඛො'හං භන්තෙ, භගවන්තං එතදවොචං : අහමස්මි භන්තෙ, ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයොඅනුප්පත්තො ආතුරකායො අභිණ්හාතඞ්කො අනිච්චදස්සාවී ඛො පනාහං භන්තෙ, භගවතො මනොභාවනීයානඤ්ච භික්ඛූනං. ඔවදතු මං භන්තෙ භගවා, අනුසාසතු මං භන්තෙ භගවා, යං මමස්ස දීඝරත්තං හිතාය සුඛායාති.

එවං වුත්තෙ මං භන්තෙ භගවා එතදවොච : "එවමෙතං ගහපති, එවමෙතං ගහපති, ආතුරො හ'යං ගහපති, කායො අණ්ඩභූතො පරියොනද්ධො. යො හි ගහපති, ඉමං කායං පරිහරන්තො මුහුත්තම්පි ආරොග්‍යං පටිජානෙය්‍ය, කිමඤ්ඤත්‍ර බාල්‍යා. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං : ආතුරකායස්ස මෙ සතො චිත්තං අනාතුරං භවිස්සතීති. එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බන්ති. එවං ඛොහං භන්තෙ, භගවතා ධම්මියා කථාය අමතෙන අභිසිත්තො"ති.

"න හි පන තං[2] ගහපති, පටිභාසි තං භගවන්තං උත්තරිං පටිපුච්ඡිතුං : කිත්තාවතා නු ඛො භන්තෙ, ආතුරකායො චෙව හොති ආතුරචිත්තො ච ? කිත්තාවතා ච පන ආතුරකායො හි[3] ඛො හොති, නො ච ආතුරචිත්තොති?" දූරතොපි ඛො මයං භන්තෙ, ආගච්ඡෙය්‍යාම ආයස්මතො සාරිපුත්තස්ස සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථමඤ්ඤාතුං. සාධු වතායස්මන්තං යෙව සාරිපුත්තං පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථොති.

"තෙන හි ගහපති, සුණාහි සාධුකං මනසි කරොහි, භාසිස්සාමීති" 'එවම්භන්තෙති' ඛො නකුලපිතා ගහපති ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසි. ආයස්මා සාරිපුත්තො එතදවොච :

කථඤ්ච ගහපති, ආතුරකායො චෙව හොති ආතුරචිත්තො ච :

ඉධ ගහපති, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො, සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති,

1. කථං හි - මජසං.
2. න හි පන ත්වං - ස්‍යා.
3. ආතුරකායොපි - ස්‍යා.

Free Distribution www.aathaapi.org

එකල්හි නකුලපිතු ගැහැවි භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගෙන සතුටු වැ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳැ පැදකුණු කොට ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර යන් වහන්සේ වෙත එළඹියේ යැ, එළඹැ ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වැඳ එකත්පසෙක හිඳ. එකත්පසෙක හුන් නකුලපිතු ගැහැවිහට ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළ සේක. '' ගැහැවි, තොපගේ ඉඳුරෝ වෙසෙසින් පහන්හ, මුඛවර්ණය පිරිසිදු යැ, පැහැපත් යැ. අද භාග්‍යවතුන් වහන්සේ වෙතින් දහැමි කථාවක් අසන්නට ලැබී දැ '' යි වහන්ස, කිම නො වේ ද, වහන්ස, මම දැන් භාග්‍යවතුන් වහන්සේ විසින් දහැමි කථා නමැති අමාවෙන් අබිසෙස් කරන ලද්දෙම් වෙමියි. '' ගැහැවි, තෙපි කෙසේ නම් භාග්‍යවතුන් වහන්සේ විසින් දහැමි කථා නමැති අමාවෙන් අබිසෙස් කරන ලද්දහු දැ '' යි.

'' වහන්ස, මෙහි ලා මම භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියෙමි. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳැ එකත්පසෙකැ හුන්නෙමි. වහන්ස, එකත්පසෙක හුන් මම භාග්‍යවතුන් වහන්සේට මෙල ඇල කෙළෙමි. 'වහන්ස, මම දිරුණෙමි. (වයසින්) වැඩුණෙමි. මහල්ලෙමි. වයස්ගත්යෙමි. පැසුළුවියට පැමිණියෙමි. ගිලන්කය ඇත්තෙමි නිරතුරු රෝග ඇත්තෙමි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ (ශ්‍රාවක වූ) මන වඩන භික්ෂූන් නිතර නො දක්නාසුලු වෙමි. වහන්ස, යමක් මට දිගුකලක් හිතයට සුවයට වැවෙ නම්, භාග්‍යවතුන් වහන්සේ එසේ මට අවවාද කරනසේක්වා. වහන්ස, භාග්‍ය වතුන් වහන්සේ මට අනුශාසනා කරනසේක්වායි.

වහන්ස, මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ 'ගැහැවි, මෙල එසේය. ගැහැවි මෙල එසේය. ගැහැවි, මේ කය රෝග ඇත්තේ ම යැ බිජුවටක් වැන්නැ. සියුම් සිවියෙන් වළදනා ලද්දේ යැ. ගැහැවි, යමෙක් මේ කය පරිහරණය කරමින් මොහොතකුදු නීරෝගබව පිළින කරන්නේ නම් ඒ බාලබව හැර අන් කිමෙක් ද ? එහෙයින් ගැහැවි, මෙහි තොප විසින් මෙසේ හික්මියැ යුතු; ගිලන් කය ඇත්තාවූ මාගේ සිත නො ගිලන් වෙති යි. ගැහැවි, තොප විසින් මෙසේ හික්මිය යුතු මැයැ'යි මෙය වදාළ සේක. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ විසින් දහැමි කථා නමැති අමාවෙන් මෙසේ අබිසෙස් කරන ලද්දෙම් වෙමි.''

'' ගැහැවි, 'වහන්ස, කොපමණෙකින් ගිලන්කය ඇත්තේත් ගිලන් සිත ඇත්තේත් වේ ද ? කොපමණෙකින් ගිලන්කය ඇත්තේ නො ගිලන් සිත ඇත්තේ වේ දැ'යි ඒ භාග්‍යවතුන් වහන්සේ අතින් මතුයෙහි විචාරන්නට තොපට නො මැ වැටැහිණි දැ'යි. වහන්ස, ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වහන්සේ සමීපයෙහි මේ භාෂිතයේ අරුත දැන ගැනීම පිණිස අපි දුර සිට වුවත් එමු. මේ භාෂිතයේ අර්ථය ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේට මැ වැටහේ නම්, මනා මැ යැ.

ගැහැවි, එසේ නම් අසව. මැනැවින් මෙනෙහි කරව. කියමි'යි. වහන්ස, එසේ යැ යි නකුලපිතු ගැහැවි ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේට පිළිවදන් ඇස්වී ය. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙල වදළහ.

ගැහැවි, කෙසේ නම් ගිලන්කය ඇත්තේත් ගිලන් සිත ඇත්තේත් වේ ද :

ගැහැවි,. ආර්‍යයන් (නුවණැසින්) නො දක්නාසුලු ආර්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍ය ධර්මයෙහි නො හික්මුණු, සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි නො හික්මුණු අශ්‍රුතවත් පෘථග්ජන තෙමේ රූපය ආත්ම යැ යි

රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. 'අහං රූපං මම රූප'න්ති පරියුට්ඨට්ඨායී හොති. තස්ස 'අහං රූපං, මම රූප'න්ති පරියුට්ඨට්ඨායිනො තං රූපං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස රූපවිපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසා.

වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං. 'අහං වෙදනා, මම වෙදනා'ති පරියුට්ඨට්ඨායී හොති. තස්ස 'අහං වෙදනා, මම වෙදනා'ති පරියුට්ඨට්ඨායිනො සා වෙදනා විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස වෙදනාවිපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසා.

සඤ්ඤං අත්තතො සමනුපස්සති, සඤ්ඤාවන්තං වා අත්තානං, අත්තනි වා සඤ්ඤං, සඤ්ඤාය වා අත්තානං. 'අහං සඤ්ඤා, මම සඤ්ඤා'ති පරියුට්ඨට්ඨායී හොති. තස්ස 'අහං සඤ්ඤා, මම සඤ්ඤා'ති පරියුට්ඨ-ට්ඨායිනො සා සඤ්ඤා විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස සඤ්ඤාවිපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සු-පායාසා.

සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, සඞ්ඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සඞ්ඛාරෙ, සඞ්ඛාරෙසු වා අත්තානං. 'අහං සඞ්ඛාරා, මම සඞ්ඛාරා,ති පරියුට්ඨට්ඨායී හොති. තස්ස 'අහං සඞ්ඛාරා, මම සඞ්ඛාරා'ති පරියුට්ඨට්ඨායිනො තෙ සඞ්ඛාරා විපරිණමන්ති, අඤ්ඤථා හොන්ති. තස්ස සඞ්ඛාරවිපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසා.

විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. 'අහං විඤ්ඤාණං, මම විඤ්ඤාණ'න්ති පරියුට්ඨට්ඨායී හොති. තස්ස 'අහං විඤ්ඤාණං, මම විඤ්ඤාණ'න්ති පරියුට්ඨට්ඨායිනො තං විඤ්ඤාණං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස විඤ්ඤාණවිපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොක-පරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

එවං ඛො ගහපති, ආතුරකායො චෙව හොති ආතුරචිත්තො ච.

කථඤ්ච ගහපති, ආතුරකායො හි[1] ඛො හොති, නො ච ආතුර-චිත්තො.

ඉධ ගහපති, සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං. 'අහං රූපං, මම රූප'න්ති න පරියුට්ඨට්ඨායී හොති. තස්ස 'අහං රූපං, මම රූප'න්ති අපරියුට්ඨට්ඨායිනො තං රූපං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස රූපවිපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

---

1. ආතුරකායො'පි - සීමු.

හෝ, ආත්මය රූප ඇත්තෙකැ යි හෝ, ආත්මයෙහි රූපය පවතී යැ යි හෝ, රූපයෙහි ආත්මය පවතී යැ යි හෝ දකී. 'රූපය මම ය, මාගේ රූපයැ'යි පර්යුත්ථාන වශයෙන් ගිලගෙන සිටුනේ වෙයි. 'මම රූපයැ, මාගේ රූපයැ'යි වැළඳගෙන සිටින ඔහුගේ ඒ රූපය ජරාමරණ විසින් පෙරළෙයි. අන්‍යස්වභාවයට පැමිණෙයි. රූපයාගේ විපරිණාම යෙන් හා අන්‍යථාභාවයෙන් ඔහුට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ උපදිති.

වේදනාව ආත්මයැ යි හෝ, ආත්මය වේදනා ඇත්තෙකැ යි හෝ, ආත්මයෙහි වේදනාව පවතී යැ යි හෝ, වේදනාවෙහි ආත්මය පවතී යැ යි හෝ දකී. 'වේදනාව මම යැ මාගේ වේදනාව' යැ යි වැළඳගෙන සිටිනසුලු වෙයි. 'මම වේදනා යෙමි. මාගේ යැ වේදනා යැයි' වැළඳගෙන සිටින ඔහුගේ ඒ වේදනාව විපරිණාම වෙයි. අන්‍යථාභාවයට පැමිණෙයි. වේදනායෙහි විපරිණාම අන්‍යථාභාවයෙන් ඔහුට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ උපදිති.

සංඥව ආත්මයැ යි හෝ, ආත්මය සංඥ ඇත්තෙකැ යි හෝ, ආත්මයෙහි සංඥව පවතී යැ යි හෝ, සංඥවෙහි ආත්මය පවතී යැ යි හෝ දකී. 'සංඥව මම ය, මාගේ යැ සංඥ' යැ යි වැළඳගෙන සිටිනසුලු වෙයි. 'සංඥව මම ය, මාගේ යැ සංඥ' යැ යි පරියුට්ඨිත ව සිටින ඔහුගේ ඒ සංඥව විපරිණාම වෙයි. අන්‍යප්‍රකාර වෙයි. සංඥවෙහි විපරිණාමාන්‍යථාභාවයෙන් ඔහුට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායසයෝ උපදිති.

සංස්කාර ආත්මයැ යි හෝ, ආත්මය සංස්කාර ඇත්තෙකැ යි හෝ, ආත්මයෙහි සංස්කාර පවතී යැ යි හෝ, සංස්කාරයන්හි ආත්මය පවතී යැ යි හෝ දකී. 'සංස්කාර මම ය, මාගේ සංස්කාර'යැ යි පරියුට්ඨිත ව සිටිනසුලු වෙයි. 'සංස්කාර මම ය, මාගේ සංස්කාර' යැ යි වැළඳගෙන සිටිනසුලු වූ ඔහුගේ ඒ සංස්කාර විපරිණාම වෙයි. අන්‍යප්‍රකාර වෙයි. සංස්කාරවිපරිණාමාන්‍යථාභාවයෙන් ඔහුට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායසයෝ උපදිති.

විඥනය ආත්මයැ යි හෝ, ආත්මය විඥන ඇත්තෙකැ යි හෝ, ආත්මයෙහි විඥනය පවතී යැ යි හෝ, විඥනයෙහි ආත්මය පවතී යැ යි හෝ දකී. 'විඥනය මම යැ මාගේ යැ විඥන' යැ යි වැළඳගෙන සිටිනසුලු වෙයි. 'විඥනය මම යැ, මාගේ විඥන' යැ යි වැළඳගෙන සිටින ඔහුගේ ඒ විඥනය පෙරළෙයි. අන්සැහැවි වෙයි. විඥනය පෙරළීමෙන් අන්සේ වීමෙන් ඔහුට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ උපදිත්.

ගැහැවි, මෙසේ ගිලන්කය ඇත්තේත් ගිලන්සිත් ඇත්තේත් වෙයි.

ගැහැවි, කෙසේ නම් ගිලන්කය ඇත්තේ ම ගිලන්සිත් ඇත්තේ නොවේ යැ යත් :

ගැහැවි, ආර්‍ය්‍යයන් දක්නාසුලු ආර්‍ය්‍යධර්මයෙහි දක්ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි හික්මුණු සත්පුරුෂයන් දක්නාසුලු සත්පුරුෂධර්මයෙහි දක්ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි හික්මුණු ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපය ආත්මය යි නො දකියි, ආත්මය රූප ඇත්තෙකැයි හෝ නො දකියි, ආත්මයෙහි රූපය පවතී ය යි හෝ නො දකියි, රූපයෙහි ආත්මය පවතී ය යි හෝ නො දකී. 'රූපය මම යැ, මාගේ යැ රූප' යැයි තෘෂ්ණාදෘෂ්ටි විසින් නො ගැනීමෙන් මැඩලන අයුරෙන් නො සිටිනසුලු වෙයි. 'රූපය මම ය, මාගේ රූප'ය යි තෘෂ්ණා දෘෂ්ටීන් විසින් වැළඳ නො ගන්නා ඔහුගේ ඒ රූපය ජරාමරණ විසින් පෙරළෙයි අන් සැහැවි වෙයි. රූපයාගේ විපරිණාම අන්‍යථාභාවයෙන් ඔහුට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදිති.

න වේදනං අත්තතො සමනුපස්සති, න වේදනාවන්තං වා අත්තානං, න අත්තනි වා වේදනං, න වේදනාය වා අත්තානං. 'අහං වේදනා, මම වේදනා'ති න පරියුට්ඨට්ඨායී හොති. තස්ස 'අහං වේදනා, මම වේදනා'ති අපරියුට්ඨට්ඨායිනො සා වේදනා විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස වේදනාවිපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජන්ති සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසා.

න සඤ්ඤං අත්තතො සමනුපස්සති, න සඤ්ඤාවන්තං වා අත්තානං, න අත්තනි වා සඤ්ඤං, න සඤ්ඤාය වා අත්තානං. 'අහං සඤ්ඤා, මම සඤ්ඤා'ති න පරියුට්ඨට්ඨායී හොති. තස්ස 'අහං සඤ්ඤා, මම සඤ්ඤා'ති අපරියුට්ඨට්ඨායිනො සා සඤ්ඤා විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස සඤ්ඤාවිපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසා.

න සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, න සඞ්ඛාරවන්තං වා අත්තානං, න අත්තනි වා සඞ්ඛාරෙ, න සඞ්ඛාරෙසු වා අත්තානං. 'අහං සඞ්ඛාරා, මම සඞ්ඛාරා'ති න පරියුට්ඨට්ඨායී හොති, තස්ස 'අහං සඞ්ඛාරා, මම සඞ්ඛාරා'ති අපරියුට්ඨට්ඨායිනො තෙ සඞ්ඛාරා විපරිණමන්ති, අඤ්ඤථා හොන්ති. තස්ස සඞ්ඛාරවිපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං, 'අහං විඤ්ඤාණං, මම විඤ්ඤාණ'න්ති න පරියුට්ඨට්ඨායී හොති. තස්ස 'අහං විඤ්ඤාණං, මම විඤ්ඤාණ'න්ති අපරියුට්ඨට්ඨායිනො තං විඤ්ඤාණං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස විඤ්ඤාණවිපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

එවං ඛො ගහපති, ආතුරකායො හොති, නො ච ආතුරචිත්තොති.

ඉදමවොච ආයස්මා සාරිපුත්තො. අත්තමනො නකුලපිතා ගහපති ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දී'ති.

## 1. 1. 1. 2.

### දෙවදහ සුත්තං

2. එවං මෙ සුතං: එකං සමයං භගවා සක්කෙසු[1] විහරති දෙවදහං නාම සක්‍යානං නිගමො.

අථ ඛො සම්බහුලා පච්ඡාභූමගමිකා[2] භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉච්ඡාම මයං භන්තෙ, පච්ඡාභූමං ජනපදං ගන්තුං. පච්ඡාභූමෙ ජනපදෙ නිවාසං කප්පෙතුන්ති.

1. සක්‍යෙසු - ස්‍යා.
2. පච්ඡාභූමම්ගමිකා - අට්ඨකථා.

වේදනාව ආත්මයැ යි නො දකියි, ආත්මය වේදනා ඇත්තෙකැ යි හෝ නො දකියි, ආත්මයෙහි වේදනාව පවතී යයි හෝ නො දකියි, වේදනාවෙහි ආත්මය පවතී ය යි හෝ නො දකී. 'වේදනාව මම ය, මාගේ වේදනාව'ය යි වැළඳ නො සිටිනසුලු වෙයි. . 'වේදනාව මම ය, මාගේ වෙදනාව'ය යි වැළඳ ගෙන නො සිටින ඔහුගේ ඒ වේදනාව පෙරැළෙයි. අන්‍යථාභාවයට යෙයි වැළඳ නො සිටිනසුලු වෙයි. 'වේදනාව මම ය, මාගේ වේදනාව'ය යි වැළඳගෙන නො සිටින ඔහුගේ ඒ වේදනාව පෙරැළෙ යි. අන්‍යථාභාවයට යයි. වෙදනාවගේ විපරිණාම අන්‍යථාභාවයෙන් ඔහුට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදිති.

සංඥව ආත්මය යි නො දකියි, ආත්මය සංඥ ඇත්තෙකැ යි හෝ නො දකියි, ආත්මයෙහි සංඥව පවතී ය යි හෝ නො දකියි, සංඥවෙහි ආත්මය පවතී ය යි හෝ නො දකී. 'සංඥව මම ය, මාගේ සංඥව' යයි වැළඳගෙන නො සිටිනසුලු වෙයි. 'සංඥව මම ය, මාගේ සංඥව ය'යි වැළඳගෙන නො සිටින ඔහුගේ ඒ සංඥව විපරිණාම වෙයි. අන්‍යාකාර වෙයි. සංඥයෙහි විපරණාමාන්‍යථාභාවයෙන් ඔහුට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදිති.

සංස්කාර ආත්මය යි නො දකියි, ආත්මය සංස්කාර ඇත්තෙකැ යි හෝ නො දකියි, ආත්මයෙහි සංස්කාර පවතී ය යි හෝ නො දකියි, සංස්කාරයන්හි ආත්මය පවතී යයි හෝ නො දකී. 'සංස්කාර මම ය, මාගේ සංස්කාර' ය යි වැළඳගෙන නො සිටිනසුලු වෙයි. 'මම සංස්කාරය, මාගේ සංස්කාර යයි වැළඳගෙන නො සිටින ඔහුගේ ඒ සංස් කාරයෝ විපරිණාම වෙත්. අන්සැහැවි වෙත්. සංස්කාර විපරිණාමාන්‍යථාභාවයෙන් ඔහුට සෝකපරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදිති.

විඥනය ආත්මය යි නො දකියි, ආත්මය විඥන ඇත්තෙකැ යි හෝ නො දකියි, ආත්ම යෙහි විඥනය පවතී ය යි හෝ නො දකියි, විඥනයෙහි ආත්මය පවතී ය යි හෝ නො දකී. විඥන මම ය, මාගේ විඥන ය'යි වැළඳගෙන නො සිටිනසුලු වෙයි. 'විඥන මම ය, මාගේ විඥන' යයි වැළඳගෙන නො සිටින ඔහුගේ ඒ විඥනය විපරිණාම වෙයි. අන්‍යථා භාව වෙයි. විඥනයාගේ විපරිණාමාන්‍යථාභාවයෙන් ඔහුට සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදිත්.

ගැහැවි, මෙසේ ගිලන්කය ඇත්තේ ගිලන්සිත් නැත්තේ වේය යි.

ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙය වදළහ. සතුටු සිත් ඇති නකුලපිතු ගැහැවි ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ දේශනාව පිළිගත්තේ යි.

## 1. 1. 1. 2.

## දේවදහ සූත්‍රය

2. මා විසින් මෙසේ අසන ලදි. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වෙහි ශාක්‍යයන්ගේ දේවදහ නම් නියම්ගම්හි වැඩවසන සේක.

එ කල්හි අපරදිග දනව්වට යනු කැමති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ : ''වහන්ස, අපි අපරදිග දනව්වට යන්නටත්, අපරදිගදනව්වෙහි වාසකරන්නටත් කැමැත්තෙමු''යි.

අපලොකිතො පන වො භික්ඛවෙ, සාරිපුත්තොති? 'න ඛො නො භන්තෙ, අපලොකිතො ආයස්මා සාරිපුත්තො'ති අපලොකෙථ භික්ඛවෙ, සාරිපුත්තං. පණ්ඩිතො භික්ඛූ අනුග්ගාහකො සබ්‍රහ්මචාරීනන්ති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං.

තෙන ඛො පන සමයෙන ආයස්මා සාරිපුත්තො භගවතො අවිදූරෙ අඤ්ඤතරස්මිං එළගලගුම්බෙ* නිසින්නො හොති. අථ ඛො තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං සාරිපුත්තං එතදවොචුං: "ඉච්ඡාම මයං ආවුසො සාරිපුත්ත, පච්ඡාභූමං ජනපදං ගන්තුං, පච්ඡාභූමෙ ජනපදෙ නිවාසං කප්පෙතුන්ති. අපලොකිතො නො සත්ථා"ති.

සන්ති හාවුසො, නානාවෙරජ්ජගතං භික්ඛුං පඤ්හං පුච්ඡිතාරො ඛත්තියපණ්ඩිතාපි බ්‍රාහ්මණපණ්ඩිතාපි, ගහපතිපණ්ඩිතාපි, සමණපණ්ඩිතාපි. පණ්ඩිතා හාවුසො, මනුස්සා වීමංසකා: 'කිංවාදී පනායස්මන්තානං[1] සත්ථා කිමක්ඛායීති? කච්චි වො ආයස්මන්තානං ධම්මා සුස්සුතා සුග්ගහිතා සුමනසිකතා සූපධාරිතා සුප්පටිවිද්ධා පඤ්ඤාය, යථා බ්‍යාකරමානා-යස්මන්තො වුත්තවාදිනො චෙව භගවතො අස්සථ න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛෙය්‍යාථ, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරෙය්‍යාථ. න ච කොචි සහධම්මිකො වාදනුවාදො[2] ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍යාති?.

"දූරතොපි ඛො මයං, ආවුසො, ආගච්ඡෙය්‍යාම ආයස්මතො සාරිපුත්තස්ස සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථමඤ්ඤාතුං, සාධු වතා-යස්මන්තං යෙව සාරිපුත්තං පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො"ති

තෙන හාවුසො, සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං, ආයස්මා සාරිපුත්තො එතදවොච:

සන්ති හාවුසො, නානාවෙරජ්ජගතං භික්ඛුං පඤ්හං පුච්ඡිතාරො ඛත්තියපණ්ඩිතාපි බ්‍රාහ්මණපණ්ඩිතාපි ගහපතිපණ්ඩිතාපි සමණපණ්ඩිතාපි පණ්ඩිතා හාවුසො, මනුස්සා වීමංසකා: "කිංවාදී පනායස්මන්තානං සත්ථා කිමක්ඛායී"ති.

එවං පුට්ඨා තුම්හෙ ආවුසො, එවං බ්‍යාකරෙය්‍යාථ: 'ඡන්දරාග-විනයක්ඛායී ඛො නො ආවුසො, සත්ථා'ති.

එවං බ්‍යාකතෙපි ඛො ආවුසො, අස්සුයෙව[3] උත්තරිං පඤ්හං පුච්ඡිතාරො ඛත්තියපණ්ඩිතාපි බ්‍රාහ්මණපණ්ඩිතාපි ගහපතිපණ්ඩිතාපි සමණපණ්ඩිතාපි පණ්ඩිතා හාවුසො, මනුස්සා වීමංසකා; "කිස්මිං පනායස්මන්තානං ඡන්දරාගවිනයක්ඛායී සත්ථා" ති.

---

1. කිංවාදයස්මන්තානං - ස්‍යා.
2. වාදනුපාතො ස්‍යා, සී 1, 2.
3. අස්සුසෙදෙව - සීමු, සී 1, 2.

* එළගලාගුම්බෙ - බහුසු

මහණෙනි, තොප විසින් සැරියුත් පුළුවුස්නා ලද්දේ ද යි. වහන්ස, අප විසින් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ නො පුළුවුස්නා ලදහ යි. මහණෙනි, සැරියුත් පුළුවුසිවු. මහණෙනි, සැරියුත් පණ්ඩිතයෙක, සබ්‍රම්සරුන්ට අනුග්‍රහ කරන්නේ වෙයි. වහන්ස, එසේ ය යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ.

එ සමයෙහි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි එක්තුවර ලැහැබෙක වැඩහුන්නාහු වෙති. එ කල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගේ වචනය පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට ''ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, අපි පැසුළුදිග දනව්වට යන්නටත්, පැසුළුදිග දනව්වෙහි වසන්නටත් කැමැත්තෙමු. අප විසින් ශාස්තෲන් වහන්සේ පුළුවුස්නා ලදහ''යි තෙල කීහ.

ඇවැත්නි, අන්රජයකට ගිය මහණහු පැන පුළුවුස්නා කැත් පඩුවෝ ද බමුණු පඩුවෝ ද ගැහැවි පඩුවෝ ද මහණ පඩුවෝ ද ඇත්තාහු ම ය. ඇවැත්නි, පණ්ඩිත මිනිස්සු 'ආයුෂ්මතුන්ගේ ශාස්තෘ තෙමේ කුමන ලබ්ධි ඇත්තේ ද, කුමක් (අවවාද විසින්) කියන්නේ ද යි, විමසන්නෝ ය. යම් සේ ප්‍රකාශ කරන්නා වූ ආයුෂ්මත්හු භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දක් කියන්නෝත් වන්නාහු නම්, භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් නො ද නින්ද කරන්නාහු නම්, දහමට ද අනුදහමක් පවසන්නාහු නම්, කරුණු සහිත වූ කිසියම් වාදනුවාදයෙක් ගැරහිය යුතු තැනට නො ද පැමිණෙන්නේ නම් - කිම, ආයුෂ්මත් තොප විසින් (එසේ) දහම් මැනැවින් අසන ලද ද, සකසා උගන්නා ලද ද, මනා කොට මෙනෙහි කරන ලද ද, මැනැවින් සලකා බලන ලද ද, නුවණින් මනා කොට අවබෝධ කරන ලද දූ යි.

''ඇවැත්නි, අපි ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ සමීපයෙහි තෙල භාෂිතයෙහි අරුත් දැන ගන්නට දුර සිට වුවත් එන්නෙමු. මැනැවි. ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේට ම තෙල වචනයෙහි අරුත වැටහේවා''යි.

ඇවැත්නි, එසේ නම් අසවු. මැනැවින් මෙනෙහි කරවු. කියන්නෙමි යි. 'ඇවැත්නි, එසේ ය' යි ඒ භික්ෂූහු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙය වදළහ :

ඇවැත්නි, අන්‍යදේශගත මහණහුගෙන් පැන පුළුස්වුනා කැත් පඩුවෝ ද බමුණු පඩුවෝ ද ගැහැවි පඩුවෝ ද මහණ පඩුවෝ ද ඇත් මැ යැ. ඇවැත්නි, පණ්ඩිත මිනිස්සු ''ආයුෂ්මතුන් ගේ ශාස්තෘ තෙමේ කිනම් වාද ඇත්තේ ද ? කුමක් (අවවාද වශයෙන්) කියන්නේ දූ''යි විමසන්නෝ මැයි.

ඇවැත්නි, මෙසේ පුළුවුස්නා ලද තෙපි ''ඇවැත්නි, අපගේ ශාස්තෲන් වහන්සේ ඡන්දරාගය නැසීම පවසන සේකැ''යි මෙසේ ප්‍රකාශ කරවු.

ඇවැත්නි, මෙසේ පැවසූ කල්හි ද මතුයෙහි දු පැන පුළුස්නා කැත් පඩුවෝ ද බමුණු පඩුවෝ ද ගැහැවි අඩුවෝ ද මහණ පඩුවෝ ද වෙත් මැ යැ. ඇවැත්නි, පණ්ඩිත මිනිස්සු ''ආයුෂ්මතුන්ගේ ශාස්තෘ තෙමෙ කිමෙක්හි ඡන්දරාග නැසීම පවසන්නේ දූ''යි විමසන්නෝ මැ යි.

එවං පුට්ඨා තුම්හෙ ආවුසො, එවං බ්‍යාකරෙය්‍යාථ: "රූපෙ ඛො ආවුසො, ඡන්දරාගවිනයක්ඛායී සත්ථා, වෙදනාය ඡන්දරාගවිනයක්ඛායී සත්ථා, සඤ්ඤාය ඡන්දරාගවිනයක්ඛායී සත්ථා, සඞ්ඛාරෙසු ඡන්දරාගවිනයක්ඛායී සත්ථා, විඤ්ඤාණෙ ඡන්දරාගවිනයක්ඛායී සත්ථා"ති.

එවං බ්‍යාකතෙපි ඛො ආවුසො, අස්සුයෙව[1] උත්තරිං පඤ්හං පුච්ඡිතාරො ඛත්තියපණ්ඩිතාපි බ්‍රාහ්මණපණ්ඩිතාපි ගහපතිපණ්ඩිතාපි සමණපණ්ඩිතාපි. පණ්ඩිතා හාවුසො, මනුස්සා වීමංසකා: කිං "පනායස්මන්තානං ආදීනවං දිස්වා රූපෙ ඡන්දරාගවිනයක්ඛායී සත්ථා, වෙදනාය ඡන්දරාගවිනයක්ඛායී සත්ථා, සඤ්ඤාය ඡන්දරාගවිනයක්ඛායී සත්ථා, සඞ්ඛාරෙසු ඡන්දරාගවිනයක්ඛායී සත්ථා, විඤ්ඤාණෙ ඡන්දරාගවිනයක්ඛායී සත්ථාති".

එවං පුට්ඨා තුම්හෙ ආවුසො, එවං බ්‍යාකරෙය්‍යාථ: "රූපෙ ඛො ආවුසො, අවිගතරාගස්ස[2] අවිගතඡන්දස්ස අවිගතපෙමස්ස අවිගතපිපාසස්ස අවිගතතණ්හස්ස තස්ස රූපස්ස විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු අවිගතරාගස්ස අවිගතඡන්දස්ස අවිගතපෙමස්ස අවිගතපිපාසස්ස අවිගතපරිළාහස්ස තෙසං සඞ්ඛාරානං විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. විඤ්ඤාණෙ අවිගතරාගස්ස අවිගතඡන්දස්ස අවිගතපෙමස්ස අවිගතපිපාසස්ස අවිගතපරිළාහස්ස අවිගතතණ්හස්ස තස්ස විඤ්ඤාණස්ස විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. ඉදං ඛො නො ආවුසො, ආදීනවං දිස්වා රූපෙ ඡන්දරාගවිනයක්ඛායී සත්ථා. වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ ඡන්දරාගවිනයක්ඛායී සත්ථා"ති.

එවං බ්‍යාකතෙපි ඛො ආවුසො, අස්සුයෙව[1] උත්තරිං පඤ්හං පුච්ඡිතාරො ඛත්තියපණ්ඩිතාපි බ්‍රාහ්මණපණ්ඩිතාපි ගහපතිපණ්ඩිතාපි සමණපණ්ඩිතාපි. පණ්ඩිතා හාවුසො, මනුස්සා වීමංසකා: "කිම්පනායස්මන්තානං ආනිසංසං දිස්වා රූපෙ ඡන්දරාගවිනයක්ඛායී සත්ථා, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ ඡන්දරාගවිනයක්ඛායී සත්ථා"ති.

එවං පුට්ඨා තුම්හෙ ආවුසො, එවං බ්‍යාකරෙය්‍යාථ: රූපෙ ඛො ආවුසො, විගතරාගස්ස විගතඡන්දස්ස විගතපෙමස්ස විගතපිපාසස්ස විගතපරිළාහස්ස විගතතණ්හස්ස තස්ස රූපස්ස විපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. වෙදනාය විගතරාගස්ස විගතඡන්දස්ස විගතපෙමස්ස විගතපිපාසස්ස විගතපරිළාහස්ස විගතතණ්හස්ස තස්සා වෙදනාය විපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු විගතරාගස්ස විගතඡන්දස්ස විගතපෙමස්ස විගතපිපාසස්ස විගතපරිළාහස්ස විගතතණ්හස්ස තෙසං සඞ්ඛාරානං විපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. විඤ්ඤාණෙ විගතරාගස්ස විගතඡන්දස්ස විගතපෙමස්ස විගතපිපාසස්ස විගතපරිළාහස්ස විගතතණ්හස්ස තස්ස විඤ්ඤාණස්ස විපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජන්ති

1. අස්සුතෙඤ්ඤෙව - සීමු, සී 1, 2.
2. අවීතරාගස්ස - ස්‍යා.

ඇවැත්නි, මෙසේ පුළුස්නා ලද තෙපි ''ඇවැත්නි, (අපගේ) ශාස්තෲන් වහන්සේ රූපයෙහි ඡන්දරාගය නැසීම පවසන සේක. ශාස්තෲන් වහන්සේ වේදනාවෙහි ඡන්ද රාගය නැසීම පවසන සේක. ශාස්තෲන් වහන්සේ සංඥාවෙහි ඡන්දරාගය නැසීම පවසන සේක. ශාස්තෲන් වහන්සේ සංස්කාරයන්හි ඡන්දරාගය නැසීම පවසන සේක. ශාස්තෲන් වහන්සේ විඥානයෙහි ඡන්දරාගය නැසීම පවසන සේකැ''යි මෙසේ ප්‍රකාශ කරවු.

ඇවැත්නි, මෙසේ පැවසූ කල්හි ද මතු පැන පුළුවුස්නා කැත් පඬුවෝ ද බමුණු පඬුවෝ ද ගැහැවි පඬුවෝ ද මහණ පඬුවෝ ද වෙත් මැ යැ. ඇවැත්නි, පණ්ඩිත මිනිස්සු ''ආයුෂ්මතුන්ගේ ශාස්තෘ තෙමේ කිනම් දෙෂයක් දක රූපයෙහි ඡන්දරාගය නැසීම පවසන්නේ ද ? ශාස්තෘ තෙමේ වේදනාවෙහි ඡන්දරාගය නැසීම පවසන්නේ ද ? ශාස්තෘ තෙමේ සංඥාවෙහි ඡන්දරාගය නැසීම පවසන්නේ ද ? ශාස්තෘ තෙමේ සංස්කරකාරයන්හි ඡන්දරාගය නැසීම පවසන්නේ ද ? ශාස්තෘ තෙමේ විඥානයෙහි ඡන්දරාගය නැසීම පවසන්නේ දැ''යි, විමසන්නෝ මැ යි.

ඇවැත්නි, මෙසේ පුළුවුස්නා ලද තෙපි මෙසේ ප්‍රකාශ කරවු : ඇවැත්නි, රූපයෙහි නො පහ වූ රාග ඇති නො පහ වූ ඡන්ද ඇති නො පහ වූ ප්‍රේම ඇති නො පහ වූ පිපාසා ඇති නො පහ වූ පරිදහ ඇති නො පහ වූ තෘෂ්ණා ඇති ඔහුට ඒ රූපය පෙරළීමෙන් අන් සැහැවි වීමෙන් සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ උපදිත්. වේදනාවෙහි සංඥාවෙහි ... සංස්කාරයන්හි නො පැහූ වූ රාග ඇති නො පැහූ ඡන්ද ඇති නො පැහූ ප්‍රෙම ඇති නො පැහූ පිපාසා ඇති නො පැහූ පරිදහ ඇති නො පැහූ වූ තෘෂ්ණා ඇති ඔහුට ඒ සංස්කාරයන්ගේ වෙනස් වීමෙන් අන්සැහැවි වීමෙන් සෝක පරිදේව දුක්ඛදෙමනස්ස උපායාසයෝ උපදිත්. විඥානයෙහි නො පැහූ රාග ඇති නො පැහූ ඡන්ද ඇති නො පැහූ ප්‍රේම ඇති නො පැහූ පවස් ඇති නො පැහූ පරිදහ ඇති නො පැහූ තෘෂ්ණා ඇති පුද්ගලයාහට ඒ විඥානයේ වෙනස් වීමෙන් අන්යැහැවි වීමෙන් යෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපා උපායාසයෝ උපදිත්. ඇවැත්නි, අපගේ ශාස්තෲන් වහන්සේ මේ දෙෂය දක රූපයෙහි ඡන්දරාගය නැසීම පවයන සේක. වේදනාවෙහි ... සංඥවෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ඡන්දරාගය නැසීම පවයන සේකැ''යි.

ඇවැත්නි, මෙසේ පැවසූ කල්හි ද මතු පැන පුළුවුස්නා කැත් පඬුවෝ ද බමුණු පඬුවෝ ද ගැහැවි පඬුවෝ ද මහණ පඬුවෝ ද ඇත් මැයැ. ඇවැත්නි, පණ්ඩිත මිනිස්සු ''ආයුෂ්මතුන්ගේ ශාස්තෘ තෙමේ කිනම් අනුසසක් දක රූපයෙහි ඡන්දරාගය නැසීම පවසන්නේ ද වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... ශාස්තෘ තෙමේ විඥානයෙහි ඡන්ද රාගය නැසීම පවසන්නේ දැ''යි විමසන්නෝ මැයි.

ඇවැත්නි, මෙසේ පුළුවුස්නා ලද තෙපි මෙසේ පවසවු : ''ඇවැත්නි, රූපයෙහි පහ වූ රාග ඇති පහ වූ ඡන්ද ඇති පහ වූ ප්‍රේම ඇති පහ වූ පිපාසා ඇති පහ වූ පරිදහ ඇති පහ වූ තෘෂ්ණා ඇති පුද්ගලයාහට ඒ රූපයෙහි පරිණාමයෙන් අන්‍යථාභාවයෙන් සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදිති. වේදනාවෙහි පහ වූ රාග ඇති පහ වූ ඡන්ද ඇති පහ වූ ප්‍රේම ඇති පහ වූ පිපාසා ඇති පහ වූ පරිදහ ඇති පහ වූ තෘෂ්ණා ඇති පුද්ගලයාහට ඒ වේදනායෙහි පරිණාමයෙන් අන්‍යථාභාවයෙන් සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායායයෝ නූපදිති. සංඥයෙහි ... සංස්කාරයන්හි පහ වූ රාගඇති පහ වූ ඡන්ද ඇති පහ වූ ප්‍රේම ඇති පහ වූ පිපාසා ඇති පහ වූ පරිදහ ඇති පහ වූ තෘෂ්ණා ඇති පුද්ගලයාහට ඒ සංස්කාරයන්ගේ පරිණාමාන්‍යථාභාවයෙන් සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායායයෝ නූපදිති. විඥානයෙහි පහ වූ රාග ඇති පහ වූ ඡන්ද ඇති පහ වූ ප්‍රේම ඇති පහ වූ පිපාසා ඇති පහ වූ පරිදහ ඇති පහ වූ තෘෂ්ණා ඇති පුද්ගලයාහට ඒ විඥානයාගේ විපරිණාමාන්‍යථාභාවයෙන් සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නූපදිත්.

සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. ඉදං ඛො තෙ ආවුසො ආනිසංසං දිස්වා රූපෙ ඡන්දරාගවිනයක්ඛායී සත්ථා, වෙදනාය ඡන්දරාගවිනයක්ඛායී සත්ථා, සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ ඡන්දරාගවිනයක්ඛායී සත්ථා''ති.

අකුසලෙ චාවුසො, ධම්මෙ උපසම්පජ්ජ විහරතො දිට්ඨෙ චෙව ධම්මෙ සුඛො විහාරො අභවිස්ස අවිඝාතො අනුපායාසො අපරිළාහො කායස්ස ච භෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛා, නයිදං භගවා අකුසලානං ධම්මානං පහානං වණ්ණෙය්‍ය. යස්මා ච ඛො ආවුසො. අකුසලෙ ධම්මෙ උපසම්පජ්ජ විහරතො දිට්ඨෙව ධම්මෙ දුක්ඛො විහාරො සවිඝාතො සඋපායාසො සපරිළාහො, කායස්ස ච භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා, තස්මා භගවා අකුසලානං ධම්මානං පහානං වණ්ණෙති.

කුසලෙ චාවුසො, ධම්මෙ උපසම්පජ්ජ විහරතො දිට්ඨෙ චෙව ධම්මෙ දුක්ඛො විහාරො අභවිස්ස සවිඝාතො සඋපායාසො සපරිළාහො කායස්ස ච භෙදා පරම්මරණා දුග්ගති පාටිකඞ්ඛා, නයිදං[1] භගවා කුසලානං ධම්මානං උපසම්පදං වණ්ණෙය්‍ය, යස්මා ච ඛො ආවුසො, කුසලෙ ධම්මෙ උපසම්පජ්ජ විහරතො දිට්ඨෙ චෙව ධම්මෙ සුඛො විහාරො අවිඝාතො අනුපායාසො අපරිළාහො, කායස්ස ච භෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛා, තස්මා භගවා කුසලානං ධම්මානං උපසම්පදං වණ්ණෙතීති.

ඉදමවොචායස්මා සාරිපුත්තො. අත්තමනා තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දුන්ති.

## 1. 1. 1. 3.

## හාලිද්දිකානි සුත්තං

3. එවං මෙ සුතං: එකං සමයං ආයස්මා මහාකච්චානො අවන්තීසු විහරති කුරරඝරෙ[2] පපාතෙ[3] පබ්බතෙ. අථ ඛො හාලිද්දිකානි[4] ගහපති යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො හාලිද්දිකානි ගහපති ආයස්මන්තං මහාකච්චානං එතදවොච වුත්තමිදං භන්තෙ, භගවතා අට්ඨකවග්ගියෙ[5] මාගන්දිය[6] පඤ්හෙ–

"ඔකං පහාය අනිකෙතසාරී
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි,
කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො[7]
කථං න විග්ගය්හ ජනෙන කයිරා''ති.

1. න ඛො - සීමු.
2. කුලඝරෙ - මජ්සං.
3. පවත්තෙ - සීමු.
4. හලිද්දිකානි - සියා.
5. අට්ඨකවග්ගිකෙ - සී 1, 2. PTS
6. මාගණ්ඩිය - සියා, මජ්සං
7. අපුරක්ඛරානො - මජ්සං, සියා, PTS, සී 1, 2.

Free Distribution www.aathaapi.org

ඇවැත්නි, අපගේ ශාස්තෘන් වහන්සේ මේ අනුසස් දක රූපයෙහි ඡන්දරාගය නැසීම පවසන සේක. ශාස්තෘන් වහන්සේ වේදනායෙහි ඡන්දරාගය නැසීම පවසන සේක. සංඥායෙහි ... සංස්කාරයන්හි ... ශාස්තෘන් වහන්සේ විඥානයෙහි ඡන්දරාගය නැසීම පවසන සේකැ යි.

ඇවැත්නි, අකුසල් දහම් රැස් කොට වසන්නහුට මේ අත්බැව්හිත් නිදුක් වූ තැවිලි නැති දැවිලි නැති සුඛවිහරණයෙක් වන්නේ නම්, කාබුත් මරණින් මතුත් සුගතිය කැමති විය යුතු නම්, භාග්‍යවතුන් වහන්සේ මේ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය නො පසස්නා සේක. ඇවැත්නි යම් හෙයෙකින් අකුසල් දහම් රැස් කොට වසන්නහුට මේ අත්බැව්හිත් දුක් සහිත තැවිලි සහිත දැවිලි සහිත දුක්ඛවිහරණයෙක් වේ ද, කාබුත් මරණින් මතුත් දුගතිය කැමති විය යුතු ද, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ අකුශල ධර්මයන්ගේ ප්‍රහාණය පසස්නා සේක.

ඇවැත්නි, කුසල් දහම් රැස් කොට වසන්නහුට මේ අත්බැව්හිත් දුක් සහිත තැවිලි සහිත දැවිලි සහිත දුක්ඛවිහරණයෙක් වන්නේ නම්, කාබුත් මරණින් මතුත් දුගතිය කැමති විය යුතු නම්, භාග්‍යවතුන් වහන්සේ කුසල් දහම් රැස් කිරීම නො පසස්නා සේක. ඇවැත්නි, යම් හෙයෙකින් කුසල් දහම් රැස් කොට වසන්නහුට මේ අත්බැව්හිත් නිදුක් වූ තැවිලි නැති දැවිලි නැති සුඛවිහරණයෙක් වේ ද, කාබුත් මරණින් මතුත් සුගතිය කැමති විය යුතු ද, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ කුසල් දහම් රැස් කිරීම පසස්නා සේකැ යි.

ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙය වදාළහ. සතුටුසිත් ඇති ඒ භික්ෂූහු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ දේශනාව පිළිගත්හ.

## 1. 1. 1. 3.
## හාලිද්දිකානි සූත්‍රය

3. මා විසින් මෙසේ අසන ලදි : එක්කලෙක ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවෝ අවන්ති දනව්වෙහි කුරරඝර නුවර සමීපයෙහි ප්‍රපාත පව්වෙහි වැඩවෙසෙති. එකල්හි හාලිද්දිකානි ගැහැවි ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන් වෙත එළඹියේ යැ. එළඹ ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන් වැඳ එකත්පසෙකැ හිඳ. එකත්පසෙක හුන් හාලිද්දිකානි ගැහැවි ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන්ට මෙය සැලකෙළේ යැ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අෂ්ටකවර්ගයට අයත් මාගන්දිය ප්‍රශ්නයෙහි දී මෙය වදාළ සේකැ :

"විඤ්ඤාණගොචර සංඛ්‍යාත ඔකය හැරපියා අනිකෙතසාරී (රූපාදී නිමිත්තෙහි නො හැසිරෙන්නා) වූ ගම්හි සංසර්ගයන් නො කරන්නා වූ කාමයන්ගෙන් වෙන් වූ සසරවට පෙරටු නො කරන්නා වූ ක්ෂීණාශ්‍රව මුනි තෙමේ ජනයා සමග විරුද්ධකථා නො කරන්නේ යැ" යි.

ඉමස්ස නු ඛො භන්තෙ, භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස කථං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති?

රූපධාතු ඛො ගහපති, විඤ්ඤාණස්ස ඔකො. රූපධාතුරාගවිනිබන්ධඤ්ච[1] පන විඤ්ඤාණං ඔකසාරීති වුච්චති. වෙදනාධාතු ඛො ගහපති විඤ්ඤාණස්ස ඔකො, වෙදනාධාතුරාගවිනිබන්ධඤ්ච පන විඤ්ඤාණං ඔකසාරීති වුච්චති. සඤ්ඤාධාතු ඛො ගහපති, විඤ්ඤාණස්ස ඔකො, සඤ්ඤාධාතුරාගවිනිබන්ධඤ්ච පන විඤ්ඤාණං ඔකසාරී'ති වුච්චති. සඞ්ඛාරධාතු ඛො ගහපති, විඤ්ඤාණස්ස ඔකො. සඞ්ඛාරධාතුරාගවිනිබන්ධඤ්ච පන විඤ්ඤාණං ඔකසාරීති වුච්චති. එවං ඛො ගහපති, ඔකසාරී හොති.

කථඤ්ච ගහපති, අනොකසාරී හොති: රූපධාතුයා ඛො ගහපති, යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයූපාදානා[2] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා තථාගතො අනොකසාරීති වුච්චති. වෙදනාධාතුයා ඛො ගහපති -පෙ- සඤ්ඤාධාතුයා ඛො ගහපති -පෙ- සඞ්ඛාරධාතුයා ඛො ගහපති, යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයූපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා තථාගතො අනොකසාරීති වුච්චති. විඤ්ඤාණධාතුයා ඛො ගහපති, යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයූපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා තස්මා තථාගතො අනොකසාරීති වුච්චති. එවං ඛො ගහපති, අනොකසාරී හොති.

කථඤ්ච ගහපති, නිකෙතසාරී හොති: රූපනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා[4] ඛො ගහපති, නිකෙතසාරීති වුච්චති. සද්දනිමිත්ත -පෙ- ගන්ධනිමිත්ත -පෙ- රසනිමිත්ත -පෙ- ඵොට්ඨබ්බනිමිත්ත -පෙ- ධම්මනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා ඛො ගහපති, නිකෙතසාරීති වුච්චති. එවං ඛො ගහපති, නිකෙතසාරී හොති.

කථඤ්ච ගහපති, අනිකෙතසාරී හොති: රූපනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා[4] ඛො ගහපති, තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා තථාගතො අනිකෙතසාරීති වුච්චති. සද්දනිමිත්ත -පෙ- ගන්ධනිමිත්ත -පෙ- රසනිමිත්ත -පෙ- ඵොට්ඨබ්බනිමිත්ත -පෙ- ධම්මනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා ඛො ගහපති, තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. තස්මා තථාගතො අනිකෙතසාරීති වුච්චති. එවං ඛො ගහපති, අනිකෙතසාරී හොති.

1. විනිබන්ධඤ්ච - ස්‍යා, මජ්සං
2. උපාදානානුපාදානා - සිමු.
3. අනභාවං කතා - මජ්සං, ස්‍යා PTT.
4. - විනිබද්ධා කත්ථචි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදරන ලද මේ දේශනාවෙහි අර්ථය විස්තර වශයෙන් කෙසේ දත යුතු දැ?යි.

ගැහැවිය, රූපස්කන්ධය කර්මවිඥානයාගේ ප්‍රත්‍යය සංඛ්‍යාත ඕකය යි. රූපස්කන්ධයෙහි ඇල්මෙන් බැඳුණු විඥානය ඔකසාරී (ගෘහාලයයෙහි හැසිරෙන්නා) ය යි කියනු ලැබේ. ගැහැවිය, වේදනාස්කන්ධය විඥානයාගේ ගෘහය යි. වේදනාස්කන්ධයෙහි ඇල්මෙන් බැඳුණු විඥානය ගෙහි හැසිරෙන්නා යයි කියනු ලැබේ. ගැහැවිය, සංඥාස්කන්ධය, විඥානයාගේ ගෘහය යි. සංඥාස්කන්ධයෙහි ඇල්මෙන් බැඳුණු විඥානය ගෙහි හැසිරෙන්නා යයි කියනු ලැබේ. ගැහැවිය, සංස්කාරස්කන්ධය විඥානයාගේ ගෘහ යයි. සංස්කාර ස්කන්ධයෙහි ඇල්මෙන් බැඳුණු විඥානය ගෙහි හැසිරෙන්නා යයි කියනු ලැබේ. ගැහැවිය, මෙසේ ඕකසාරී වේ.

ගැහැවිය, කෙසේ නම් අනොකසාරී වේ ද ? ගැහැවිය, රූපස්කන්ධයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් සතුටු වීමෙක් යම් තෘෂ්ණාවක්, යම් (තෘෂ්ණා දෘෂ්ටි) උපය කෙනෙක්, (කාමුපාදනාදී සිවු) උපාදන කෙනෙක් අකුසල් සිත්හි අධිෂ්ඨාන අභිනිවෙස අනුසය වූවාහු වෙද්ද, ඔහු තථාගතයන් වහන්සේ විසින් ප්‍රහීණ කරන ලදහ. උසුන් මුල් කරන ලදහ. මුදුන්සුන් තල් ගසක් මෙන් කරන ලදහ. අත්‍යන්තයෙන් අභාවයට පමුණුවන ලදහ. මතු නූපදනා ස්වභාව ඇත්තාහ. එහෙයින් තථාගතයන් වහන්සේ අනොකසාරී (ගෙහි නො හැසිරෙනු) ය යි කියනු ලැබෙත්. ගැහැවිය, වේදනාස්කන්ධයෙහි ... ගැහැවිය, සංඥාස්කන්ධයෙහි ... ගැහැවිය, සංස්කාරස්කන්ධයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් සතුටු වීමෙක් යම් තෘෂ්ණාවක්, යම් උපය උපාදන කෙනෙක් අකුසල් සිත්හි අධිෂ්ඨාන අභිනිවෙස අනුසය වෙද්ද, ඔහු තථාගතයන් වහන්සේ විසින් ප්‍රහීණ කරන ලදහ. උසුන් මුල් කරන ලදහ. හිස් සුන් තලක් මෙන් කරන ලදහ. අනුඅභාව කරන ලදහ. මතු නූපදනා ස්වභාව ඇත්තාහ. එහෙයින් තථාගතයන් වහන්සේ අනොකසාරී ය යි කියනු ලැබෙත්. ගැහැවිය, විඥානස්කන්ධයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් සතුටු වීමෙක් යම් තෘෂ්ණාවක්, යම් උපය උපාදන කෙනෙක් අකුසල් සිත්හි අධිෂ්ඨාන අභිනිවෙස අනුසය වෙද්ද, ඔහු තථාගතයන් වහන්සේ විසින් ප්‍රහීණ කරන ලදහ. උසුන්මුල් කරන ලදහ. මුදුන්සුන් තලක් මෙන් කරන ලදහ. අනුඅභාව කරන ලදහ. මතු නූපදනා ස්වභාව ඇත්තාහ. එහෙයින් තථාගතයන් වහන්සේ අනොකසාරී ය යි කියනු ලැබෙත්. ගැහැවිය, මෙසේ අනොකසාරී වේ.

ගැහැවිය, කෙසේ නම් නිකේතසාරී (නිවෙස්හි හැසිරෙන්නේ) වේ ද යත් : ගැහැවිය, රූපාලම්බන නමැති නිවෙස්හි උපන් කෙලෙසුන්ගේ විසාර—පැතිරීම හා විනිබන්ධ—බැඳීම හේතුකොටගෙන නිකේතසාරී යයි කියනු ලැබේ. ශබ්දලම්බන ... ගන්ධා ලම්බන ... රසාලම්බන ... ස්ප්‍රෂ්ටව්‍යාලම්බන ... ගැහැවිය, ධර්මාලම්බන නැමැති නිවෙස්හි හටගත් කෙලෙසුන්ගේ පැතිරීමෙන් හා බැඳීමෙන් නිකේතසාරී යයි කියනු ලැබේ. ගැහැවිය, මෙසේ නිකේතසාරී වේ.

ගැහැවි, කෙසේ නම් අනිකේතසාරී (නිවෙස්හි නොහැසිරෙන්නේ) වේ ද යත් : ගැහැවිය, රූපාලම්බන නමැති නිවාසයෙහි (හටගත් කෙලෙසුන්ගේ) විසාරවිනිබන්ධයෝ තථාගතයන් වහන්සේ විසින් ප්‍රහීණ කරන ලදහ. තාලාවස්තුක කරන ලදහ. අනාභාව කරන ලදහ. මතු නූපදනා ස්වභාව ඇත්තාහ. එහෙයින් තථාගතයන් වහන්සේ අනිකේතසාරී යයි කියනු ලැබෙත්. ශබ්දලම්බන ... ගන්ධාලම්බන ... රසාලම්බන ස්ප්‍රෂ්ටව්‍යාලම්බන ... ගැහැවිය, ධර්මාලම්බන නමැති නිවෙස්හි හටගත් කෙලෙසුන්ගේ විසාරවිනිබන්ධයෝ තථාගතයන් වහන්සේ විසින් ප්‍රහීණ කරන ලදහ. උසුන් මුල්කරන ලදහ. තාලාවස්තුක කරන ලදහ. අනභාව කරන ලදහ. මතු නූපදනා ස්වභාවය ඇත්තාහ. එහෙයින් තථාගතයන් වහන්සේ අනිකේතසාරී ය යි කියනු ලැබෙත්. ගැහැවිය, මෙසේ අනිකේතසාරී වේ.

4—ඒ 50066 2,013 (80/06)

කථඤ්ච ගහපති, ගාමෙ සන්ථවජාතො හොති: ඉධ ගහපති, එකච්චො ගිහීහි සංසට්ඨො[1] විහරති සහනන්දී සහසොකී සුඛිතෙසු සුඛිතො දුක්ඛිතෙසු දුක්ඛිතො. උප්පන්නෙසු කිච්චකරණීයෙසු අත්තනා වොයොගං ආපජ්ජති. එවං ඛො ගහපති ගාමෙ සන්ථවජාතො හොති.

කථඤ්ච ගහපති, ගාමෙ න සන්ථවජාතො හොති: ඉධ ගහපති එකච්චො ගිහීහි අසංසට්ඨො[2] විහරති න සහනන්දී න සහසොකී න සුඛිතෙසු සුඛිතො න දුක්ඛිතෙසු දුක්ඛිතො. උප්පන්නෙසු කිච්චකරණීයෙසු න අත්තනා වොයොගං[3], ආපජ්ජති. එවං ඛො ගහපති, ගාමෙ න සන්ථවජාතො හොති.

කථඤ්ච ගහපති, කාමෙහි අරිත්තො හොති: ඉධ ගහපති, එකච්චො කාමෙසු අවිගතරාගො හොති අවිගතච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො. එවං ඛො ගහපති, කාමෙහි අරිත්තො හොති.

කථඤ්ච ගහපති, කාමෙහි රිත්තො හොති: ඉධ ගහපති, එකච්චො කාමෙසු විගතරාගො හොති විගතච්ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො. එවං ඛො ගහපති කාමෙහි රිත්තො හොති.

කථඤ්ච ගහපති පුරෙක්ඛරානො හොති: ඉධ ගහපති, එකච්චස්ස එවං හොති: එවංරූපො සියං අනාගතමද්ධානං, එවංවෙදනො සියං අනාගතමද්ධානං, එවංසඤ්ඤො[4] සියං අනාගතමද්ධානං, එවංසඞ්ඛාරො සියං අනාගතමද්ධානං, එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධානන්ති. එවං ඛො ගහපති, පුරෙක්ඛරානො හොති

කථඤ්ච ගහපති, අපුරෙක්ඛරානො හොති: ඉධ ගහපති, එකච්චස්ස එවං න හොති: එවංරූපො සියං අනාගතමද්ධානං, එවංවෙදනො සියං අනාගතමද්ධානං, එවංසඤ්ඤී සියං අනාගතමද්ධානං, එවං සඞ්ඛාරො සියං අනාගතමද්ධානං, එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධානං, එවං ඛො ගහපති, අපුරෙක්ඛරානො හොති.

කථඤ්ච ගහපති, කථං විග්ගය්හ ජනෙන කත්තා හොති: ඉධ ගහපති, එකච්චො එවරූපං කථං කත්තා හොති: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි, කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි අහමස්මි සම්මාපටිපන්නො. පුරෙ වචනීයං පච්ඡා අවච, පච්ඡා වචනීයං පුරෙ අවච. සහිතං මෙ අසහිතං තෙ. ආචිණ්ණං[5] තෙ විපරාවත්තං. ආරොපිතො තෙ වාදො. චර වාදප්පමොක්ඛාය නිග්ගහිතොසි. නිබ්බෙඨෙහි[6] වා සචෙ පහොසී''ති, එවං ඛො ගහපති, කථං විග්ගය්හ ජනෙන කත්තා හොති.

1. ගිහිසංසට්ඨො - මජසං.
2. ගිහිඅසංසට්ඨො - මජසං.
3. තෙසු යොගං - මජසං. ස්‍යා. PTS.
4. එවං සසඤ්ඤී - සී.
5. අධිචිණ්ණන්තෙ - මජසං ස්‍යා. PTS. සී. 1, 2. සී සිමු.
6. නිබ්බෙධෙහි ස්‍යා. සී. 1, 2.

ගැහැවිය, කෙසේ නම් ගම්හි හටගත් සන්ථව ඇත්තේ වේ ද යත් : ගැහැවිය, මෙසස්නෙහි ඇතැම් මහණෙක් ගිහියන් හා සංසෘෂ්ට (මුසු) වූයේ සමඟ සතුටු වන්නේ සමග ශෝක කරන්නේ (දයකයන්) සුඛිත කල්හි සුඛිත වන්නේ දුඃඛිත කල්හි දුඃඛිත වන්නේ වෙයෙයි. උපන් කටයුතු ඇතිකල්හි තමා උපයෝගයට (එහි යෙදීමට) පැමිණෙයි. ගැහැවිය, මෙසේ ගම්හි හටගත් සන්ථව ඇත්තේ වේ.

ගැහැවිය, කෙසේ නම් ගම්හි හටගත් සන්ථව නැත්තේ වේ ද : ගැහැවි, මෙසස්නෙහි ඇතැම් මහණෙක් ගිහියන් හා මුසු නො වූයේ සමග සතුටු නො වන්නේ සමග ශෝක නො කරන්නේ (දයකයන්) සුඛිත කල්හි සුඛිත නො වන්නේ දුඃඛිත කල්හි දුඃඛිත නො වන්නේ වෙයෙයි. උපන් කටයුතු ඇති කල්හි තමා යෙදීමට නො පැමිණෙයි. ගැහැවි, මෙසේ ගම්හි හටගත් සංසර්ග නැත්තේ වේ.

ගැහැවි, කෙසේ නම් කාමයන්ගෙන් නො සිස් වූයේ වේ ද : ගැහැවිය, මෙසස්නෙහි ඇතැම් මහණෙක් වස්තු කාමයන්හි නො පහ වූ රාග ඇත්තේ නො පහ වූ ඡන්ද ඇත්තේ නො පහ වූ ප්‍රේම ඇත්තේ නො පහ වූ පවස් ඇත්තේ නො පහ වූ පරිදහ ඇත්තේ නො පහ වූ තෘෂ්ණා ඇත්තේ වෙයි. ගැහැවි, මෙසේ ක්ලේශකාමයන්ගෙන් නො සිස් වූයේ වේ.

ගැහැවි, කෙසේ නම් කාමයන්ගෙන් සිස් වූයේ වේ ද : ගැහැවිය, මෙසස්නෙහි ඇතැම් මහණෙක් කාමයන්හි පහ වූ රාග ඇත්තේ පහ වූ ඡන්ද ඇත්තේ පහ වූ ප්‍රේම ඇත්තේ පහ වූ පවස් ඇත්තේ පහ වූ පරිදහ ඇත්තේ පහ වූ තෘෂ්ණා ඇත්තේ වෙයි. ගැහැවි, මෙසේ කාමයන් ගෙන් සිස් වූයේ වේ.

ගැහැවිය, කෙසේ නම් සසරවට පෙරටු කරන්නේ වේ ද : ගැහැවි, මෙසස්නෙහි ඇතැම් මහණක්හට '' මතුකල මෙබඳු රූ ඇත්තෙම් වෙමි. මතුකල මෙබඳු වේදනා ඇත්තෙම් වෙමි. මතුකල මෙබඳු සංඥ ඇත්තෙම් වෙමි. මතුකල මෙබඳු සංස්කාර ඇත්තෙම් වෙමි. මතුකල මෙබඳු විඥන ඇත්තෙම් වෙමි. මෙසේ අදහස් වෙයි. ගැහැවිය, මෙසේ සසරවට පෙරටු කරන්නේ වේ.

ගැහැවි, කෙසේ නම් සසරවට පෙරටු නො කරන්නේ වේ ද : ගැහැවි, මෙසස්නෙහි ඇතැම් මහණක්හට '' මතුකල මෙබඳු රූ ඇත්තෙම් වෙමි. මතු කල මෙබඳු වේදනා ඇත්තෙම් වෙමි. මතුකල මෙබඳු සංඥ ඇත්තෙම් වෙමි. මතුකල මෙබඳු සංස්කාර ඇත්තෙම් වෙමි. මතු කල මෙබඳු විඥන ඇත්තෙම් වෙමි '' යි මෙසේ අදහස් නො වෙයි. ගැහැවිය, මෙසේ සසරවට පෙරටු නො කරන්නේ වේ.

ගැහැවිය, කෙසේ නම් ජනයා සමඟ විග්‍රාහික කථා කරන්නේ වේ ද යත් : ගැහැවිය, මෙසස්නෙහි ඇතැම් කෙනෙක් මෙබඳු කථා කරන්නේ වෙයි : '' තෝ මේ ශාසනය නො දනිහි. මම මේ ශාසනය දනිමි. කිම, තෝ මේ ශාසනය දනිහි ද ? තෝ වරදවා පිළිපන්නෙහි මම මැනවින් පිළිපන්නෙම් වෙමි. පළමු වැ කිය යුත්ත පසු වැ කීයෙහි පසු වැ කිය යුක්ත පළමු වැ කීයෙහි. මාගේ වචනය සිලිටි යැ. තාගේ වචනය නො සිලිටි යැ තා විසින් (කලක් ම) පුරුදු කරන ලද වාදය (මාගේ වාදයෙන්) පෙරළී ගියේ යැ. තට වාද නගන ලදී. වාදයෙන් මිදීම පිණිස (හැසිරෙව. ක්‍රියා කර ව.) නිග්‍රහ කරන ලද වෙහි. ඉදින් පොහොසත්හි නම් මුදව (මෙහි දී ම මිදෙව.)'' යි. ගැහැවිය, මෙසේ ජනයා සමඟ විග්‍රාහික කථා කරන්නේ වේ.

කථඤ්ච ගහපති, කථං න විග්ගය්හ ජනෙන කත්තා හොති: ඉධ ගහපති, එකච්චො න එවරූපිං කථං කත්තා හොති: "න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡා පටිපන්නො ත්වමසි අහමස්මි සම්මා පටිපන්නො. පුරෙ වචනීයං පච්ඡා අවච, පච්ඡා වචනීයං පුරෙ අවච, සහිතං මෙ, අසහිතං තෙ, අචිණ්ණං තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො, චර වාදප්පමොක්ඛාය නිග්ගහිතොසි නිබ්බෙඨෙහි වා සචෙ පහොසී''ති. එවං ඛො ගහපති, කථං න විග්ගය්හ ජනෙන කත්තා හොති.

ඉති ගහපති, යං තං වුත්තං භගවතා අට්ඨකවග්ගියෙ මාගන්දියපඤ්හෙ

"ඔකං පහාය අනිකෙතසාරී
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි
කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො
කථං න විග්ගය්හ ජනෙන කයිරා.''

ඉමස්ස ඛො ගහපති, භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති.

## 1. 1. 1. 4.

## දුතිය හාලිද්දිකානි සුත්තං

4 එවං මෙ සුතං: එකං සමයං ආයස්මා මහාකච්චානො අවන්තීසු විහරති කුරරඝරෙ පපාතෙ පබ්බතෙ. අථ ඛො හාලිද්දිකානි ගහපති යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො හාලිද්දිකානි ගහපති ආයස්මන්තං මහාකච්චානං එතදවොච:

වුත්තමිදං භන්තෙ, භගවතා සක්කපඤ්හෙ "යෙ තෙ සමණබ්‍රාහ්මණා තණ්හාසඞ්ඛයවිමුත්තා, තෙ අච්චන්තනිට්ඨා අච්චන්තයොගක්ඛෙමිනො අච්චන්තබ්‍රහ්මචාරිනො අච්චන්තපරියොසානා සෙට්ඨා දෙවමනුස්සානන්''ති. ඉමස්ස නු ඛො භන්තෙ, භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස කථං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො?ති.

රූපධාතුයා ඛො ගහපති, යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයුපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙසං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා චිත්තං සුවිමුත්තන්ති වුච්චති. වෙදනාධාතුයා ඛො ගහපති -පෙ- සඤ්ඤාධාතුයා ඛො ගහපති -පෙ- සඞ්ඛාරධාතුයා ඛො ගහපති -පෙ- විඤ්ඤාණධාතුයා ඛො ගහපති, යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයුපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙසං ඛයා විරාගා නිරොධා චාගා පටිනිස්සග්ගා චිත්තං සුවිමුත්තන්ති වුච්චති.

ගැහැවිය, කෙසේ නම් ජනයා සමග විග්‍රාහික කථා නො කරන්නේ වේ ද යත් : ගැහැවි, මෙසස්නෙහි ඇතැම් මහණෙක් මෙබඳු කථා නො කරන්නේ වෙයි : " තෝ මේ ශාසනය නො දනිහි, මම මේ ශාසනය දනිමි. කිම, තෝ මේ ශාසනය දන්නෙහි ද ? තෝ වරදවා පිළිපන්නෙහි, මම මැනවින් පිළිපන්නෙම් වෙමි. පළමු කිය යුත්ත පසු වැ කීයෙහි. පසු වැ කියයුත්ත පළමු කීයෙහි. මාගේ වචනය සිලිටි යැ, තාගේ වචනය නො සිලිටි යැ. තාගේ පුරුදු වචනය පෙරළි ගියේ යැ, තට වාද නගන ලදී. වාදයෙන් මිදීමට ක්‍රියා කරව. නිග්‍රහ කරන ලද්දෙහි. ඉදින් පොහොනෙහි නම් මුදව " යි ගැහැවිය, මෙසේ ජනයා සමග විග්‍රාහික කථා නො කරන්නේ වේ.

ගැහැවි, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් - අෂ්ටකවර්ගයට අයත් මාගන්දිය ප්‍රශ්නයෙහි—

" ගෘහය හැර ගෙහි නො හැසිරෙනසුලු ගම්හි සයග නො කරන කාමයන්ගෙන් හිස් වූ සසරවට පෙරටු නො කරන මුනි තෙමේ ජනයා සමග විග්‍රාහික කථා නො කරන් නේ ය" යි ඒ යමක් වදරන ලද නම්—

ගැහැවිය, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදරන ලද මෙ දේශනාවෙහි අර්ථය විස්තර විසින් මෙසේ දත යුත්තේ යි.

## 1. 1. 1. 4.

## දෙවන හාලිද්දිකානි සූත්‍රය

4. මා විසින් මෙසේ අසන ලදී : එක් කලෙක මහාකච්චාන තෙරණුවෝ අවන්ති දනව්වෙහි කුරරඝර නුවර සමීපයෙහි ප්‍රපාත පර්වතයෙහි වැඩ වෙසෙති. එකල හාලිද්දිකානි ගැහැවි ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන් වෙත එළඹියේ යැ. එළඹ ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන් වැඳ එකත්පසෙක හින. එකත්පසෙක හුන් හාලිද්දිකානි ගැහැවි ආයුෂ්මත් මහාකච්චාන තෙරණුවන්ට තෙල සැලකෙළේ ය.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් ශක්‍රප්‍රශ්නයෙහි " යම් ඒ මහණ බමුණු කෙනෙක් තෘෂ්ණාක්ෂය සඞ්ඛ්‍යාත නිවනෙහි (එ අරමුණු කොට ඇති ඵලවිමුක්තියෙන්) මිදුණාහු වෙද්ද, ඔහු අත්‍යන්ත නිෂ්ඨා ඇත්තෝ යැ. අත්‍යන්ත යෝගක්ෂෙම ඇත්තෝ යැ. අත්‍යන්ත බ්‍රහ්මචාරීහු යැ, අත්‍යන්ත අවසාන ඇත්තෝ යැ. දෙවිමිනිසුන්ට ශ්‍රෙෂ්ඨයහ "යි මෙය වදරන ලද්දේ යැ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදරන ලද මේ භාෂිතයාගේ - දේශනායෙහි අර්ථය විස්තර විසින් කෙසේ දතයුතු ද යි.

ගැහැවිය, රූපස්කන්ධයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් සතුටෙක් යම් තෘෂ්ණාවක් යම් උපය උපාදාන කෙනෙක් අකුශල චිත්තයෙහි අධිට්ඨාන අභිනිවෙස අනුසය වෙත් නම් ඔවුන්ගේ ක්ෂය වීමෙන් විරාගයෙන් නිරෝධයෙන් දුරළීමෙන් බැහැර කිරීමෙන් සිත මැනවින් මිදුණේය යි කියනු ලැබේ. ගැහැවිය, වෙදනාස්කන්ධයෙහි ... ගැහැවිය, සංඥාස්කන්ධයෙහි ... ගැහැවිය, සංස්කාර ස්කන්ධයෙහි ... ගැහැවිය, විඥානස්කන්ධයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් සතුටෙක් යම් තෘෂ්ණාවක් යම් උපය උපාදාන කෙනෙක් අකුශල චිත්තයාගේ අධිට්ඨාන අභිනිවෙස අනුසය වෙත් නම් ඔවුන්ගේ ක්ෂයවීමෙන් විරාගයෙන් නිරෝධයෙන් දුරළීමෙන් බැහැර කිරීමෙන් සිත මැනවින් මිදුණේය යි කියනු ලැබේ.

ඉති ඛො ගහපති, යන්තං වුත්තං භගවතා සක්කපඤ්හෙ: "යෙ තෙ සමණබ්‍රාහ්මණා තණ්හාසඞ්ඛයවිමුත්තා, තෙ අච්චන්තනිට්ඨා අච්චන්තයොගක්ඛෙමිනො අච්චන්තබ්‍රහ්මචාරිනො අච්චන්තපරියොසානා සෙට්ඨා දෙවමනුස්සාන"න්ති ඉමස්ස ඛො ගහපති, භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති.

## 1. 1. 1. 5.

## සමාධි භාවනා සුත්තං

5. එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

සමාධිං භික්ඛවෙ, භාවෙථ. සමාහිතො භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති. කිඤ්ච යථාභූතං පජානාති? රූපස්ස සමුදයඤ්ච අත්ථගමඤ්ච, වෙදනාය සමුදයඤ්ච අත්ථගමඤ්ච, සඤ්ඤාය සමුදයඤ්ච අත්ථගමඤ්ච, සඞ්ඛාරානං සමුදයඤ්ච අත්ථගමඤ්ච, විඤ්ඤාණස්ස සමුදයඤ්ච අත්ථගමඤ්ච.

කො ච භික්ඛවෙ, රූපස්ස සමුදයො, කො වෙදනාය සමුදයො, කො සඤ්ඤාය සමුදයො, කො සඞ්ඛාරානං සමුදයො, කො විඤ්ඤාණස්ස සමුදයො:

ඉධ භික්ඛවෙ, භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. කිඤ්ච අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති: රූපං අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, තස්ස රූපං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි. යා රූපෙ නන්දි තදුපාදානං තස්සුපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

වෙදනං අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති තස්ස වෙදනං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි. යා වෙදනාය නන්දි තදුපාදානං, තස්සුපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

සඤ්ඤං අභිනන්දති -පෙ- සඞ්ඛාරෙ අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. තස්ස සඞ්ඛාරෙ අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි. යා සඞ්ඛාරෙසු නන්දි තදුපාදානං, තස්සුපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

Free Distribution www.aathaapi.org

ගැහැවිය, මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ශක්‍රප්‍රශ්නයෙහි '' යම් ඒ මහණබමුණු කෙනෙක් තෘෂ්ණාක්ෂය සඞ්ඛ්‍යාත නිවන අරමුණු කොට මිදුණාහු නම් ඔහු අත්‍යන්ත නිෂ්ඨා ඇත්තෝ යැ, අත්‍යන්තයෝගක්ෂේම ඇත්තෝ යැ, අත්‍යන්ත බ්‍රහ්මචාරීහු යැ, අත්‍යන්ත පර්‍ය්‍යවසාන ඇත්තෝ යැ, දෙව්මිනිසුන්ට ශ්‍රේෂ්ඨයහ '' යි ඒ යමක් වදළ සේක් නම් ගැහැවිය, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදරන ලද මේ දේශනායෙහි අර්ථය විස්තර විසින් මෙසේ දත යුතු යි.

## 1. 1. 1. 5.

## සමාධිභාවනා සූත්‍රය

5. මා විසින් මෙසේ අසන ලද : එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමැතූ සේක. 'වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ සේක.

මහණෙනි, සමාධිය වඩවු මහණෙනි, සමාධිගත මහණ යථාභූතව - ඇති සැටි දනී. කුමක් යථාවයෙන් දනී ද යත් : රූපයාගේ සමුදය ද අස්තගමය ද, වේදනාවේ සමුදය ද, අස්තගමය ද සංඥාවේ සමුදය ද අස්තගමය ද, සංස්කාරයන්ගේ සමුදය ද අස්තගමය ද, විඥානයාගේ සමුදය ද අස්තගමය ද දනී.

මහණෙනි, රූපයාගේ සමුදය (හටගැන්ම) කවරේ ද, වෙදනාවේ සමුදය කවරේ ද, සංඥාවේ සමුදය කවරේ ද, සංස්කාරයන්ගේ සමුදය කවරේ ද, විඥානයාගේ සමුදය කවරේ ද :

මහණෙනි. මෙ සස්නෙහි මහණ පතයි. මැනවැ යි ලෝභවසයෙන් කියයි. බැසැගෙන සිටී, කුමක් පතා ද : මැනැවැ යි කියා ද : බැසැගෙන සිටී ද : රූපය පතයි. මැනවැ යි කියයි. එහි බැසගෙන සිටී. රූපය පතන මැනවැයි කියන එහි බැසගෙන සිටින ඔහුට තෘෂ්ණාව උපදී. රූපයෙහි යම් තෘෂ්ණාවක් වේ නම් ඒ උපාදන යි. උපාදනප්‍රත්‍යයෙන් ඔහුට භවය වෙයි. භවප්‍රත්‍යයයෙන් ජාතිය වෙයි. ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ සෝක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ හට ගනිත්. මෙසේ මෙ හුදු දුක් රැසෙහි සමුදය වේ.

වේදනාව පතයි, මැනවැයි කියයි, බැස ගෙන සිටී. වේදනාව පතන මැනවැයි කියන ගිලගෙන සිටින ඔහුට තෘෂ්ණාව උපදී. වේදනාවෙහි යම් තෘෂ්ණාවක් වේ නම් ඒ උපාදනය යි. උපාදනප්‍රත්‍යයයෙන් ඔහුට භවය වේ. භවප්‍රත්‍යයයෙන් ජාතිය වේ. ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණ සෝකපරිදේව දුක්ඛදෙමනස්සඋපායාසයෝ හටගනිත්. මෙසේ මේ හුදු දුක් රැසෙහි සමුදය වේ.

සංඥාව පතයි, සංස්කාරයන් පතයි, මැනවැයි කියයි, ගිලගෙන සිටී. සංස්කාරයන් පතන මැනවැයි කියන ගිලගෙන සිටින ඔහුට තෘෂ්ණාව උපදී. සංස්කාරයන්හි යම් තෘෂ්ණාවක් වේ නම් ඒ උපාදන යි. උපාදන ප්‍රත්‍යයයෙන් ඔහුට භවය වෙයි. භව ප්‍රත්‍යයයෙන් ජාතිය වෙයි. ජාතිප්‍රත්‍යයයෙන් ජරාමරණසෝකපරිදේවදුක්ඛදෙමනස්ස උපායාසයෝ හටගනිත්. මෙස් මේ හුදු දුක් රැසේ සමුදය වේ.

විඤ්ඤාණං අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. තස්ස විඤ්ඤාණං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි. යා විඤ්ඤාණෙ නන්දි තදුපාදානං, තස්සුපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

අයං භික්ඛවෙ, රූපස්ස සමුදයො, අයං වෙදනාය සමුදයො, අයං සඤ්ඤාය සමුදයො, අයං සඞ්ඛාරානං සමුදයො. අයං විඤ්ඤාණස්ස සමුදයො.

කො ච භික්ඛවෙ, රූපස්ස අත්ථගමො, කො වෙදනාය අත්ථගමො, කො සඤ්ඤාය අත්ථගමො, කො සඞ්ඛාරානං අත්ථගමො, කො විඤ්ඤාණස්ස අත්ථගමො :

ඉධ භික්ඛවෙ භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. කිඤ්ච නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති : රූපං නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, තස්ස රූපං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො යා රූපෙ නන්දි සා නිරුජ්ඣති, තස්ස නන්දිනිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙව-දුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛ-ක්ඛන්ධස්ස නිරොධො හොති.

වෙදනං නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. තස්ස වෙදනං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො යා වෙදනාය නන්දි සා නිරුජ්ඣති. තස්ස නන්දිනිරොධා උපාදානනිරොධො උපාදානනිරොධා භවනිරොධො. භවනිරොධා -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

සඤ්ඤං නාභිනන්දති -පෙ- සඞ්ඛාරෙ නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, තස්ස සඞ්ඛාරෙ අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො යා සඞ්ඛාරෙසු නන්දි සා නිරුජ්ඣති. තස්ස නන්දිනිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

විඤ්ඤාණං නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, තස්ස විඤ්ඤාණං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො යා විඤ්ඤාණෙ නන්දි සා නිරුජ්ඣති. තස්ස නන්දිනිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාති-නිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

අයං භික්ඛවෙ, රූපස්ස අත්ථගමො, අයං වෙදනාය අත්ථගමො, අයං සඤ්ඤාය අත්ථගමො, අයං සඞ්ඛාරානං අත්ථගමො, අයං විඤ්ඤාණස්ස අත්ථගමොති.

විඥානය පතයි, මැනවැ යි කියයි. ගිලගෙන සිටී. විඥානය පතන මැනවැ යි කියන ගිලගෙන සිටින ඔහුට තෘෂ්ණාව උපදී. විඥානයෙහි යම් තෘෂ්ණාවක් වේ නම් ඒ උපාදාන යි උපාදාන ප්‍රත්‍යයෙන් ඔහුට භවය වෙයි. භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි. ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණසෝකපරිදේවදුක්ඛදෝමනස්සඋපායාසයෝ හටගනිත්. මෙසේ මේ හුදු දුක් රැසෙහි සමුදය වේ.

මහණෙනි, මේ රූපයාගේ සමුදය යි. මේ වේදනාවෙහි සමුදය යි. මේ සංඥයෙහි සමුදය යි, මේ සංස්කාරයන්ගේ සමුදය යි. මේ විඥානයෙහි සමුදය යි.

මහණෙනි, රූපයාගේ නිරෝධය කවරේ ද: වේදනායෙහි නිරෝධය කවරේ ද: සංඥයෙහි නිරෝධය කවරේ ද: සංස්කාරයන්ගේ නිරෝධය කවරේ ද: විඥානයෙහි නිරෝධය කවරේ ද:

මහණෙනි, මෙසස්නෙහි මහණ නො පතයි. මැනවැයි නො කියයි. බැසැ ගෙන නො සිටී. කුමක් නො පතා ද, මැනවයි නො කියා ද, බැසැ ගෙන නො සිටී ද: රූපය නො පතයි. මැනවැ යි නො කියයි. බැස ගෙන නො සිටී. රූපය නො පතන මැනවැයි නො කියන බැස ගෙන නො සිටින ඔහුගේ රූපයෙහි යම් තෘෂ්ණාවක් වේ නම් එය නිරුද්ධ වෙයි, ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වීමෙන් උපාදාන නිරෝධය වෙයි. උපාදාන නිරෝධයෙන් භවනිරෝධය වෙයි. භවනිරෝධයෙන් ජාතිනිරෝධය වෙයි. ජාතිනිරෝධයෙන් ජරාමරණසෝකපරිදේවදුක්ඛදෝමනස්සඋපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක්රැසෙහි නිරෝධය වේ.

වේදනාව නො පතයි. මැනවැයි නො කියයි. බැසැ ගෙන නො සිටියි. වේදනාව නො පතන මැනවැයි නො කියන බැසැ ගෙන නො සිටින ඔහුගේ වේදනාවෙහි යම් තෘෂ්ණාවක් වේ නම් එය නිරුද්ධ වෙයි. ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වීමෙන් උපාදාන නිරෝධය වෙයි. උපාදාන නිරෝධයෙන් භවනිරෝධය වෙයි. භවනිරෝධයෙන් ... මෙසේ මේ හුදු දුක් රැසේ නිරෝධය වේ.

සංඥව නොපතයි ... සංස්කාරයන් නො පතයි. මැනවැයි නො කියයි. බැසැ ගෙන නො සිටී. සංස්කාරයන් නො පතන මැනවැයි නො කියන බැසැ ගෙන නො සිටින ඔහුගේ සංස්කාරයන්හි යම් තෘෂ්ණාවක් වේ නම් එය නිරුද්ධ වෙයි. ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වීමෙන් උපාදාන නිරෝධය වෙයි. උපාදාන නිරෝධයෙන් ... මෙසේ මේ හුදු දුක් රැසේ නිරෝධය වේ.

විඥානය නො පතයි. මැනවැයි නො කියයි. බැසැ ගෙන නො සිටියි. විඥානය නො පතන මැනවැයි නො කියන බැසැ ගෙන නො සිටින ඔහුගේ විඥානයෙහි යම් තෘෂ්ණාවක් වේ නම් එය නිරුද්ධ වෙයි. ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වීමෙන් උපාදාන නිරෝධය වෙයි. උපාදාන නිරෝධයෙන් භව නිරෝධය වෙයි. භව නිරෝධයෙන් ජාති නිරෝධය වෙයි. ජාතිනිරෝධයෙන් ජරාමරණ සෝක පරිදේව දුක්ඛදෝමනස්ස උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක්රැසේ නිරෝධය වේ.

මහණෙනි, මේ රූපයෙහි නිරෝධය යි. මේ වේදනායෙහි නිරෝධය යි. මේ සංඥයෙහි නිරෝධය යි. මේ සංස්කාරයන්ගේ නිරෝධය යි. මේ විඥානයාගේ නිරෝධය යි.

## 1. 1. 1. 6.

## පටිසල්ලාන සුත්තං

6. සාවත්ථියං :

පටිසල්ලානෙ භික්ඛවෙ, යොගමාපජ්ජථ. පටිසල්ලීනො භික්ඛවෙ, භික්ඛු යථාභූතං පජානාති. කිඤ්ච යථාභූතං පජානාති : රූපස්ස සමුදයඤ්ච අත්ථගමඤ්ච, වෙදනාය සමුදයඤ්ච අත්ථගමඤ්ච, සඤ්ඤාය සමුදයඤ්ච අත්ථගමඤ්ච, සඞ්ඛාරානං සමුදයඤ්ච අත්ථගමඤ්ච, විඤ්ඤාණස්ස සමුදයඤ්ච අත්ථගමඤ්ච.

කො ච භික්ඛවෙ, රූපස්ස සමුදයො, කො වෙදනාය සමුදයො, කො සඤ්ඤාය සමුදයො, කො සඞ්ඛාරානං සමුදයො, කො විඤ්ඤාණස්ස සමුදයො :

ඉධ භික්ඛවෙ, භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. කිඤ්ච අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති, රූපං අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. තස්ස රූපං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි. යා රූපෙ නන්දි තදුපාදානං. තස්සුපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

වෙදනං අභිනන්දති -පෙ- සඤ්ඤං අභිනන්දති -පෙ- සඞ්ඛාරෙ අභිනන්දති -පෙ- විඤ්ඤාණං අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. තස්ස විඤ්ඤාණං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි, යා විඤ්ඤාණෙ නන්දි තදුපාදානං. තස්සුපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

අයං භික්ඛවෙ, රූපස්ස සමුදයො, අයං වෙදනාය සමුදයො, අයං සඤ්ඤාය සමුදයො, අයං සඞ්ඛාරානං සමුදයො, අයං විඤ්ඤාණස්ස සමුදයො.

කො ච භික්ඛවෙ, රූපස්ස අත්ථගමො, කො වෙදනාය අත්ථගමො, කො සඤ්ඤාය අත්ථගමො, කො සඞ්ඛාරානං අත්ථගමො, කො විඤ්ඤාණස්ස අත්ථගමො :

ඉධ භික්ඛවෙ, භික්ඛු නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. කිඤ්ච නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති, රූපං නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. තස්ස රූපං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො යා රූපෙ නන්දි, සා නිරුජ්ඣති. තස්ස නන්දිනිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො. භවනිරොධා ජාතිනිරොධො. ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

## 1. 1. 1. 6.

## පටිසල්ලාන සූත්‍රය

**6. සැවැත්නුවර :**

මහණෙනි, පිළිසලනෙහි (කායවිවේකයෙහි) යෙදෙවු. මහණෙනි, පිළිසලනෙහි යෙදුණු මහණ යථාවයෙන් (තතු සේ) දනී. කුමක් තතු සේ දනී ද යත් : රූපයෙහි සමුදය ද අස්තගමය ද වේදනායෙහි සමුදය ද අස්තගමය ද සංඥයෙහි සමුදය ද අස්තගමය ද සංස්කාරයන්ගේ සමුදය ද අස්තගමය ද විඥනයෙහි සමුදය ද අස්තගමය ද දනී.

මහණෙනි, රූපයෙහි සමුදය කවරේ ද, වේදනායෙහි සමුදය කවරේ ද, සංඥයෙහි සමුදය කවරේ ද, සංස්කාරයන්ගේ සමුදය කවරේ ද, විඥනයෙහි සමුදය කවරේ ද :

මහණෙනි, මෙසස්නෙහි මහණ පතයි, මැනවැ යි කියයි, බැසැ ගෙන සිටී. කුමක් පතා ද මැනවැ යි කියා ද බැසැ ගෙන සිටී ද : රූපය පතයි. මැනවැ යි කියයි. බැසැ ගෙන සිටී. රූපය පතන මැනැවැයි කියන බැස ගෙන සිටින ඔහුට නන්දිසංඛ්‍යාත තෘෂ්ණාව උපදී. රූපයෙහි යම් තෘෂ්ණාවක් වේ නම් එය උපාදන යි. උපාදන ප්‍රත්‍යයෙන් ඔහුට භවය වෙයි. භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි. ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණශෝකපරිදේව දුක්ඛදෙමනස්සඋපායාසයෝ හටගනිත්. මෙසේ මේ හුදු දුක් රැසේ සමුදය වේ.

වේදනාව පතයි. ... සංඥව පතයි. ... සංස්කාරයන් පතයි. ... විඥනය පතයි. මැනැවැයි කියයි. බැසැ ගෙන සිටී. විඥනය පතන මැනැවැ යි කියන බැසැ ගෙන සිටින ඔහුට තෘෂ්ණාව උපදී. විඥනයෙහි යම් තෘෂ්ණාවක් වේ නම් එය උපාදන යි. උපාදන ප්‍රත්‍යයෙන් ඔහුට භවය වෙයි. භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි. ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණශෝකපරිදේවදුක්ඛදෙමනස්ස උපායාසයෝ හටගනිත්. මෙසේ මේ හුදු දුක්රැසේ සමුදය වේ.

මහණෙනි, මේ රූපයෙහි සමුදය යි. මේ වේදනායෙහි සමුදය යි. මේ සංඥයෙහි සමුදය යි. මේ සංස්කාරයන්ගේ සමුදය යි. මේ විඥනයෙහි සමුදය යි.

මහණෙනි, රූපයෙහි නිරෝධය කවරේ ද, වේදනායෙහි නිරෝධය කවරේ ද, සංඥයෙහි නිරෝධය කවරේ ද, සංස්කාරයන්ගේ නිරෝධය කවරේ ද, විඥනයෙහි නිරෝධය කවරේ ද :

මහණෙනි, මෙහි මහණ නො පතයි. මැනැවැ යි නො කියයි. බැසැ ගෙන නො සිටී. කුමක් නො පතා ද, මැනවැ යි නො කියා ද, බැසැ ගෙන නො සිටී ද : රූපය නො පතයි. මැනැවැ යි නො කියයි. බැසැ ගෙන නො සිටී. රූපය නො පතන මැනැවැයි නො කියන බැසැ ගෙන නො සිටින ඔහුගේ රූපයෙහි යම් තෘෂ්ණාවක් වේ නම් එය නිරුද්ධ වෙයි. ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වීමෙන් උපාදන නිරෝධය වෙයි. උපාදන නිරෝධයෙන් භවනිරෝධය වෙයි. භවනිරෝධයෙන් ජාතිනිරෝධය වෙයි. ජාතිනිරෝධයෙන් ජරාමරණ ශොක පරිදේව දුක්ඛ දෙමනස්ස උපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක් රැසේ නිරෝධය වේ.

වෙදනං නාභිනන්දති -පෙ- සඤ්ඤං නාභිනන්දති -පෙ- සඞ්ඛාරෙ නාභිනන්දති, -පෙ- විඤ්ඤාණං නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිට්ඨති. තස්ස විඤ්ඤාණං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිට්ඨතො යා විඤ්ඤාණෙ නන්දි සා නිරුජ්ඣති. තස්ස නන්දිනිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො. භවනිරොධා ජාතිනිරොධො. ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

අයං භික්ඛවෙ, රූපස්ස අත්ථගමො. අයං වෙදනාය අත්ථගමො. අයං සඤ්ඤාය අත්ථගමො. අයං සඞ්ඛාරානං අත්ථගමො. අයං විඤ්ඤාණස්ස අත්ථගමො'ති.

## 1. 1. 1. 7.

### පඨම උපාදපරිතස්සනා සුත්තං

7. සාවත්ථියං-

උපාදා[1]පරිතස්සනඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි අනුපාදා[2]අපරිතස්සනඤ්ච. තං සුණාථ, සාධුකං මනසිකරොථ භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච:

කථඤ්ච භික්ඛවෙ, උපාදාපරිතස්සනා හොති:

ඉධ භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො. රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. තස්ස තං රූපං විපරිණමති අඤ්ඤථා හොති. තස්ස රූපවිපරිණාමඤ්ඤථාභාවා රූපවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස රූපවිපරිණාමානුපරිවත්තිජා[3] පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා උත්තාසවා ච හොති විඝාතවා ච අපෙක්ඛවා ච. උපාදාය ච පරිතස්සති.

වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං. තස්ස සා වෙදනා විපරිණමති, අඤ්ඤථා හොති, තස්ස වෙදනාවිපරිණාමඤ්ඤථාභාවා, වෙදනාවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති තස්ස වෙදනාවිපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා උත්තාසවා ච හොති විඝාතවා ච අපෙක්ඛවා ච. උපාදාය ච පරිතස්සති.

---

1. උපාදාන - ස්‍යා - සී 1, 2.
2. අනුපාදාන - ස්‍යා - සී 1, 2.
3. පරිවත්තජා - සීමු. PTS.

වේදනාව නො පතයි ... සංඥව නො පතයි ... සංස්කාරයන් නො පතයි ... විඥනය නො පතයි. මැනවැයි නො කියයි. බැසැ ගෙන නො සිටී. විඥනය නො පතන මැනවැයි නො කියන බැසැ ගෙන නො සිටින ඔහුගේ විඥනයෙහි යම් තෘෂ්ණාවක් වේ නම් එය නිරුද්ධ වෙයි, ඔහුගේ තෘෂ්ණාව නිරුද්ධ වීමෙන් උපාදනනිරොධය වෙයි. උපාදනනිරොධයෙන් භවනිරොධය වෙයි. භවනිරොධයෙන් ජාතිනිරොධය වෙයි. ජාති නිරොධයෙන් ජරාමරණ සොක පරිදෙවදුක්ඛදෙමනස්සඋපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ හුදු දුක් රැසේ නිරොධය වේ.

මහණෙනි, මේ රූපයෙහි නිරොධය යි, මේ වේදනායෙහි නිරොධය යි. මේ සංඥයෙහි නිරොධය යි. මේ සංස්කාරයන්ගේ නිරොධය යි මේ විඥනයෙහි නිරොධය යි.

## 1. 1. 1. 7.

## පළමුවැනි උපාදපරිතස්සනා සූත්‍රය

**7. සැවැත්නුවර :**

මහණෙනි, තොපට උපාදනයෙන් උපන් පරිතස්සනාව ද අනුපාදනයෙන් වන අපරිතස්සනාව ද දේශනා කරන්නෙමි. එය අසවු. මැනවින් මෙනෙහි කරවු. කියමි යි. වහන්ස, එසේ යයි ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙල වදළ සේක :

මහණෙනි, උපාදනයෙන් වන පරිතස්සනාව කෙසේ වේ ද යත් :

මහණෙනි, ආය්‍ර්‍යයන් නො දක්නා ආය්‍ර්‍යධර්මයෙහි අදක්ෂ ආය්‍ර්‍යධර්මයෙහි නො හික්මුණු, සත්පුරුෂයන් නො දක්නා සත්පුරුෂධර්මයෙහි අදක්ෂ සත්පුරුෂධර්මයෙහි නො හික්මුණු තුගත් පුහුදුන් තෙමේ රූපය ආත්මය යි හෝ, ආත්මය රූප ඇත්තෙකැයි හෝ, ආත්මයෙහි රූපය පවතී ය යි හෝ, රූපයෙහි ආත්මය පවතී ය යි හෝ දකී. ඔහුගේ ඒ රූපය පෙරළෙයි. අන්‍යාකාර වෙයි. ඔහුගේ ඒ රූපය පෙරළීමෙන් අන්‍යාකාර වීමෙන් කර්මවිඥනය රූපයේ පෙරළීම අනුව පෙරළෙනසුලු වෙයි. රූපයේ පෙරළීම අනු ව පෙරළුණු සිතින් උපන් තණ්හාපරිතස්සනා ද අකුශලධර්ම සමුත්පාදයෝ ද ඔහුගේ කුසල් සිත ක්ෂය කොට ගෙන සිටිත්. චිත්තපරියාදනයෙන් තැති ගැනුම් ඇත්තේ ද දුක් ඇත්තේ ද අපේක්ෂා (ආලය) ඇත්තේ ද වෙයි. දැඩි කොට ගෙන ද පෙළෙයි.

වේදනාව ආත්මය යි හෝ, ආත්මය වේදනා ඇත්තෙකැයි හෝ, ආත්මයෙහි වේදනාව පවතී ය යි හෝ, වේදනාවෙහි ආත්මය පවතී ය යි හෝ දකී. ඔහුගේ ඒ වේදනාව වෙනස් වෙයි. අන් සැහැවි වෙයි. ඔහුගේ වේදනාව වෙනස් වීමෙන් අන් සැහැවි වීමෙන් කර්ම විඥනය වේදනායෙහි වෙනස් වීම් අනුව පෙරළෙනසුලු වෙයි. වේදනාවේ වෙනස් වීම අනු ව පෙරළුණු සිතින් හටගත් තණ්හාපරිතස්සනා ද අකුශලධර්මසමුත්පාදයෝ ද ඔහුගේ සිත ක්ෂය කොට ගෙන සිටිත්. චිත්තපරියාදනයෙන් තැති ගැනුම් ඇත්තේ ද දුක් ඇත්තේ ද ආලය ඇත්තේ ද වෙයි. දැඩි කොට ගෙන ද පෙළෙයි.

සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, සඞ්ඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සඞ්ඛාරෙ, සඞ්ඛාරෙසු වා අත්තානං. තස්ස තෙ සඞ්ඛාරා විපරිණමන්ති, අඤ්ඤථා හොන්ති. තස්ස සඞ්ඛාරානං විපරිණාමඤ්ඤථාභාවා, සඞ්ඛාරවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස සඞ්ඛාරවිපරිණාමානුපරිවත්තජා පරිතස්සනා ධම්මසමුප්පාද චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා උත්තාසවා ච හොති විඝාතවා ච අපෙක්ඛවා ච උපාදාය ච පරිතස්සති.

විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. තස්ස තං විඤ්ඤාණං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස විඤ්ඤාණවිපරිණාමඤ්ඤථාභාවා විඤ්ඤාණවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස[1] විඤ්ඤාණවිපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාද චිත්තං පරියාදාය තිට්ඨන්ති. චෙතසො පරියාදානා උත්තාසවා ච හොති, විඝාතවා ච, අපෙක්ඛවා ච. උපාදාය ච පරිතස්සති.

එවං ඛො භික්ඛවෙ, උපාදාපරිතස්සනා හොති.

කථඤ්ච භික්ඛවෙ, අනුපාදා අපරිතස්සනා හොති:

ඉධ භික්ඛවෙ, සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං. තස්ස තං රූපං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස රූපවිපරිණාමඤ්ඤථාභාවා න රූපවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස රූපවිපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාද චිත්තං න පරියාදාය තිට්ඨන්ති. චෙතසො අපරියාදානා න චෙව උත්තාසවා[2] හොති න විඝාතවා න අපෙක්ඛවා. අනුපාදාය ච න පරිතස්සති.

න වෙදනං අත්තතො සමනුපස්සති, න වෙදනාවන්තං වා අත්තානං, න අත්තනි වා වෙදනං, න වෙදනාය වා අත්තානං. තස්ස සා වෙදනා විපරිණමති අඤ්ඤථා හොති. තස්ස වෙදනාවිපරිණාමඤ්ඤථාභාවා න වෙදනාවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස වෙදනාවිපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාද චිත්තං න පරියාදාය තිට්ඨන්ති. චෙතසො අපරියාදානා න චෙව උත්තාසවා හොති න විඝාතවා න අපෙක්ඛවා. අනුපාදාය ච න පරිතස්සති. චෙතසො අපරියාදානා න චෙව උත්තාසවා හොති. න විඝාතවා, න අපෙක්ඛවා, අනුපාදාය ච න පරිතස්සති.

න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, න සඞ්ඛාරවන්තං අත්තානං, න අත්තනි වා සඞ්ඛාරෙ න සඞ්ඛාරෙසු වා අත්තානං, තස්ස තෙ සඞ්ඛාරා විපරිණමන්ති, අඤ්ඤථා හොන්ති

1. තස්මිං - සී. 1, 2.
2. න චෙවුත්තාසවා - සීමු. න ච උත්තාසවා - සී. 1, 2.

සංඥව ... සංස්කාර ... ආත්ම විසින් දකියි, සංස්කාරවත් ආත්මය හෝ, ආත්මයෙහි සංස්කාර හෝ සංස්කාරයන්හි ආත්මය හෝ දකියි. ඔහුගේ එ සංස්කාර පෙරළෙයි, අන් අයුරු වෙයි. සංස්කාරයන්ගේ විපරිණාම අන්‍යථාභාව හේතුයෙන් ඔහුගේ කර්ම විඥනය සංස්කාර විපරිණාම අනුව පෙරළෙනසුලු වෙයි, සංස්කාර විපරිණාම අනුව පෙරළෙන සුලු සිතින් උපන් තෘෂ්ණා පරිතස්සනා ද අකුශලධර්ම සමුත්පාදයෝ ද ඔහුගේ කුසල් සිත අල්වා ගෙන සිටිත්. චිත්තපරියාදනයෙන් තැති ගැනුම් ඇත්තේ ද දුක් ඇත්තේ ද අපේක්ෂා ඇත්තේ ද වෙයි, දැඩි කොට ගෙන පෙළෙන්නේ ද වේ.

විඥනය ආත්ම විසින් දකියි, විඥනවත් ආත්මය හෝ, ආත්මයෙහි විඥනය හෝ, විඥනයෙහි ආත්මය හෝ, දකියි. ඔහුගේ එ විඥනය පෙරළෙයි, අන් අයුරු වෙයි. විඥනයාගේ විපරිණාම අන්‍යථාභාව හේතුයෙන් ඔහුගේ කර්මවිඥනය විඥන විපරිණාමය අනුව පෙරළෙනසුලු වෙයි. විඥන විපරිණාමය අනුව පෙරළෙන සිතින් උපන් තෘෂ්ණා පරිතස්සනා ද අකුශලධර්ම සමුත්පාදයෝ ද ඔහුගේ කුසල් සිත අල්වා ගෙන සිටිත්. චිත්තපරියාදන හේතුයෙන් තැති ගැනුම් ඇත්තේ ද දුක් ඇත්තේ ද ආලය ඇත්තේ ද වෙයි, දැඩි වැ ගෙන පෙළෙන්නේ ද වේ.

මෙසේ වනාහි මහණෙනි, උපාද පරිතස්සනා වේ.

මහණෙනි, අනුපාද අපරිතස්සනා කි සෙයින් වේ යැ යත් :

මහණෙනි, මේ, ලෝකයෙහි ආර්යයන් දක්නා ආර්ය ධර්මයෙහි දක්ෂ ආර්යධර්මයෙහි මොනොවට හික්මුණු, සත්පුරුෂයන් දක්නා සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ සත්පුරුෂ ධර්මයෙහි මොනොවට හික්මුණු ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපය ආත්ම විසින් නො දකියි, රූපවත් ආත්මය හෝ නො දකියි, ආත්මයෙහි රූපය ඇතැයි හෝ නො දකියි, රූපයෙහි ආත්මය ඇතැයි හෝ නො දකියි, ඔහුගේ ඒ රූපය පෙරළෙයි, අන්අයුරු වෙයි. රූප විපරිණාම අන්‍යථාභාව හේතුයෙන් ඔහුගේ කර්මවිඥනය රූපයාගේ විපරිණාමය අනුව පෙරළෙන සුලු වෙයි, රූපයාගේ විපරිණාමය අනුව පෙරළෙන සිතින් උපන්, තෘෂ්ණා පරිතස්සනා ද අකුශලධර්ම සමුත්පාදයෝ ද ඔහුගේ සිත දැඩි වැ ගෙන නො සිටිත්. චිත්තයාගේ අපරියාදන (දැඩි කොට නො ගැනීම්) හේතුයෙන් තැතිගැනුම් ඇත්තේ නො ද වෙයි, දුක් සහිත නො වෙයි ආලය සහිත නො වෙයි, දැඩි කොට නො ගෙන නො ද පෙළෙන්නේ වේ.

වේදනාව ආත්ම විසින් නො දකියි, වේදනාවත් ආත්මය හෝ නො දකියි, ආත්මයෙහි වේදනාව හෝ නො දකියි, වේදනායෙහි ආත්මය හෝ නො දකියි. ඔහුගේ ඒ වේදනාව පෙරළෙ යි, අන් අයුරු වෙයි, වේදනාවගේ පෙරළීම් අන් අයුරුවීම් හේතුයෙන් ඔහුගේ කර්මවිඥනය වේදනා විපරිණාමය අනුව පෙරළෙන සුලු වෙයි. වේදනා විපරිණාමය අනුව පෙරළෙන සිතින් උපන් තණ්හාපරිතස්සනා ද අකුශලධර්ම සමුත්පාදයෝ ද ඔහුගේ සිත දැඩි කොට ගෙන නො සිටිත්. චිත්තයාගේ අපරියාදන හේතුයෙන් නො ද තැතිගැනුම් ඇත්තේ වෙයි, දුක් ඇත්තේ නො වෙයි, ආලය ඇත්තේ නො වෙයි, දැඩි කොට ගෙන නො ද පෙළෙන්නේ වේ.

සංඥව ආත්ම විසින් නො දකියි ... සංස්කාර ආත්ම විසින් නො දකියි, සංස්කාරවත් ආත්මය හෝ නො දකියි, ආත්මයෙහි සංස්කාර හෝ නො දකියි, සංස්කාරයන්හි ආත්මය හෝ නො දකියි. ඔහුගේ ඒ සංස්කාරයෝ පෙරළෙති, අන් අයුරු වෙත්. සංස්කාරයන්ගේ

තස්ස සඞ්ඛාරවිපරිණාමඤ්ඤථාභාවා න සඞ්ඛාරවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති. තස්ස සඞ්ඛාර විපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං න පරියාදාය තිට්ඨන්ති, චෙතසො අපරියාදානා න චෙව උත්තාසවා හොති න විඝාතවා න අපෙක්ඛවා, අනුපාදාය ච න පරිතස්සති.

න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති. න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං, තස්ස තං විඤ්ඤාණං විපරිණමති, අඤ්ඤථා හොති තස්ස විඤ්ඤාණ විපරිණාමඤ්ඤථාභාවා න විඤ්ඤාණවිපරිණාමානුපරිවත්ති විඤ්ඤාණං හොති, තස්ස විඤ්ඤාණවිපරිණාමානුපරිවත්තිජා පරිතස්සනා ධම්මසමුප්පාදා චිත්තං න පරියාදාය තිට්ඨන්ති, චෙතසො අපරියාදානා න චෙව උත්තාසවා හොති න විඝාතවා න අපෙක්ඛවා අනුපාදාය ච න පරිතස්සති.

එවං ඛො භික්ඛවෙ, අනුපාදා අපරිතස්සනා හොතීති.

## 1. 1. 1. 8.

### දුතිය උපාදාපරිතස්සනා සුත්තං

8. සාවත්ථියං-

උපාදාපරිතස්සනඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි, අනුපාදා අපරිතස්සනඤ්ච. තං සුණාථ -පෙ-

කථඤ්ච භික්ඛවෙ, උපාදාපරිතස්සනා හොති :

ඉධ භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො රූපං "එතං මම, එසො'හමස්මි එසො මෙ අත්තා"ති සමනුපස්සති. තස්ස තං රූපං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස රූපවිපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං "එතං මම, එසො'හමස්මි එසො මෙ අත්තා"ති සමනුපස්සති, තස්ස තං විඤ්ඤාණං විපරිණමති, අඤ්ඤථා හොති, තස්ස විඤ්ඤාණවිපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

එවං ඛො භික්ඛවෙ, උපාදාපරිතස්සනා හොති.

කථඤ්ච භික්ඛවෙ, අනුපාදාඅපරිතස්සනා හොති :

ඉධ භික්ඛවෙ සුතවා අරියසාවකො රූපං "නෙතං මම, නෙසො 'හමස්මි, න මෙසො අත්තා"ති සමනුපස්සති තස්ස තං රූපං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස රූපවිපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං "නෙතං මම, නෙසො'හමස්මි න මෙසො අත්තා"ති සමනුපස්සති. තස්ස විඤ්ඤාණවිපරිණාමඤ්ඤථාභාවා නුප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

එවං ඛො භික්ඛවෙ, අනුපාදාඅපරිතස්සනා හොතීති.

විපරිණාම අන්‍යථාභාව හේතුයෙන් ඔහුගේ කර්මවිඥානය සංස්කාර විපරිණාමය අනුව පෙරළෙනසුලු වෙයි, සංස්කාර විපරිණාම අනුව පෙරළෙන සුලු සිතින් උපන් තණ්හා පරිතස්සනා ද අකුශලධර්ම සමුත්පාදයෝ ද ඔහුගේ කුසල් සිත, ක්ෂය කොට ගෙන නො සිටිත්. චිත්තයාගේ අපරියාදාන හේතුයෙන් නො ද තැතිගැනුම් ඇති වෙයි, දුක් ඇති නො වෙයි, ආලය ඇති නො වෙයි, නො ද දැඩි කොට ගෙන පෙළෙන්නේ වේ.

විඥානය ආත්ම විසින් නො දකියි, ආත්මය විඥානවත් යි හෝ නො දකියි, විඥානය ආත්මයෙහි ඇතැයි හෝ නො දකියි, ආත්මය විඥානයෙහි ඇතැයි හෝ නො දකියි. ඔහුගේ ඒ විඥානය පෙරළෙයි, අන් අයුරු වෙයි. විඥානයාගේ වෙනස්වීම් පෙරළීම් හේතුයෙන් ඔහුගේ කර්මවිඥානය විඥානවිපරිණාමය අනුව පෙරළෙන සුලු වෙයි. විඥාන විපරිණාමය අනුව පෙරළෙනසුලු සිතින් උපන් තෘෂ්ණා පරිතස්සනා ද අකුශල ධර්මසමුත්පාදයෝ ද ඔහුගේ කුසල් සිත ක්ෂය කොට ගෙන සිටිත්. චිත්තයාගේ දැඩි කොට නො ගැනීම් හේතුයෙන් තැතිගැනුම් නො ද ඇති වෙයි, දුක් ඇති නො වෙයි, ආලය ඇති නො වෙයි, දැඩි කොට ගෙන පෙළෙන්නේ ද නො වේ.

මෙසෙයින් මහණෙනි, අනුපාද අපරිතස්සනා වේ යැ යි (වදළසේක).

## 1. 1. 1. 8.

## දෙවැනි උපාදපරිතස්සනා සූත්‍රය

**8. සැවැත්නුවර :**

මහණෙනි, තොපට උපාදපරිතස්සනාව ද, අනුපාදඅපරිතස්සනාව ද දේශනා කරන් නෙමි. එය අසවු ... මහණෙනි, උපාදපරිතස්සනා කිසෙයින් වේය යත් :

මහණෙනි, මෙලොවැ අශ්‍රැතවත් පෘථග්ජන රූපය '' තෙල මගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම '' යි දකියි. ඔහුගේ ඒ රූපය පෙරළෙයි, අන් අයුරු වෙයි. රූපයාගේ විපරිණාම අන්‍යථාභාවයෙන් ඔහුට සෝක – පරිදේව – දුක්ඛ –දෝමනස්ස– උපායාසයෝ උපදිති. වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය '' තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්මයයි දකියි. ඔහුගේ ඒ විඥානය පෙරළෙයි, අන් අයුරු වෙයි. ඔහුට විඥානයාගේ විපරිණාම – අන්‍යථාභාවයෙන් සෝක – පරිදේව – දුක්ඛ – දෙමනස්ස – උපායාසයෝ උපදිත්.

මහණෙනි, මෙසෙයින් (තණ්හා මාන – දිට්ඨි – විසින්) උපදපරිතස්සන වෙයි.

මහණෙනි, කිසෙයින් අනුපාද අපරිතස්සනා වේ යත් :

මහණෙනි, මෙලොව ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපය '' තෙල මාගේ නො වේ යැ, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වෙයි '' (විදසුන් නුවණින්) දකියි. ඔහුගේ ඒ රූපය පෙරළෙයි. අන් අයුරු වෙයි. ඔහුට රූපයාගේ විපරිණාම – අන්‍යථාභාව හේතුයෙන් සෝක – පරිදේව - දුක්ඛ – දෙමනස්ස – උපායාසයෝ නූපදිති. වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය '' තෙල මාගේ නො වේ යැ. තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වෙයි '' (විදසුන් නුවණින්) දකි යි. ඔහුට විඥානයාගේ විපරිණාම – අන්‍යථාභාවයෙන් සෝකපරිදේව – දුක්ඛ දෙමනස්ස – උපායාසයෝ උපදිත්.

මහණෙනි, මෙසෙයින් (තණ්හා – මාන – දිට්ඨි විසින් නො ගත්, හෙයින්) අනුපාද අපරිතස්සනා වේ යයි.

## 1. 1. 1. 9.

### පඨම අතීතානාගත සුත්තං

**9. සාවත්ථියං-**

රූපං භික්ඛවෙ, අනිච්චං අතීතානාගතං, කො පන වාදො පච්චුප්පන්නස්ස. එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො අතීතස්මිං රූපස්මිං අනපෙක්ඛො හොති, අනාගතං රූපං නාභිනන්දති, පච්චුප්පන්නස්ස රූපස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. වෙදනා අනිච්චා -පෙ- සඤ්ඤා අනිච්චා -පෙ- සඞ්ඛාරා අනිච්චා -පෙ- විඤ්ඤාණං අනිච්චං අතීතානාගතං, කො පන වාදො පච්චුප්පන්නස්ස. එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො අතීතස්මිං විඤ්ඤාණස්මිං අනපෙක්ඛො හොති, අනාගතං විඤ්ඤාණං නාභිනන්දති, පච්චුප්පන්නස්ස විඤ්ඤාණස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොතීති.

## 1. 1. 1. 10.

### දුතිය අතීතානාගත සුත්තං

**10. සාවත්ථියං-**

රූපං භික්ඛවෙ, දුක්ඛං අතීතානාගතං, කො පන වාදො පච්චුප්පන්නස්ස. එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො අතීතස්මිං රූපස්මිං අනපෙක්ඛො හොති, අනාගතං රූපං නාභිනන්දති, පච්චුප්පන්නස්ස රූපස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. වෙදනා දුක්ඛා -පෙ- සඤ්ඤා දුක්ඛා -පෙ- සඞ්ඛාරා දුක්ඛා -පෙ- විඤ්ඤාණං දුක්ඛං අතීතානාගතං, කො පන වාදො පච්චුප්පන්නස්ස. එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො අතීතස්මිං විඤ්ඤාණස්මිං අනපෙක්ඛො හොති, අනාගතං විඤ්ඤාණං නාභිනන්දති, පච්චුප්පන්නස්ස විඤ්ඤාණස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොතීති.

## 1. 1. 1. 11.

### තතිය අතීතානාගත සුත්තං

**11. සාවත්ථියං-**

රූපං භික්ඛවෙ, අනත්තා අතීතානාගතං, කො පන වාදො පච්චුප්පන්නස්ස, එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො අතීතස්මිං රූපස්මිං අනපෙක්ඛො හොති, අනාගතං රූපං නාභිනන්දති, පච්චුප්පන්නස්ස රූපස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති. වෙදනා අනත්තා -පෙ- සඤ්ඤා අනත්තා -පෙ-

Free Distribution www.aathaapi.org

## 1. 1. 1. 9. ]

## පළමුවැනි අතීතානාගත සූත්‍රය

**9. සැවැත්නුවර :**

මහණෙනි අතීත – අනාගත රූපය අනිත්‍ය යැ, පච්චුප්පන්න (–පවත්නා) රූපයාගේ (අනිත්‍යතා පිළිබඳ) කවර කථා යැ. (අනිත්‍යමැයි) මහණෙනි, මෙසෙයින් දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක අතීත රූපයෙහි අපේක්ෂා රහිත වෙයි. අනාගත රූපය නො පතයි, ප්‍රත්‍යුත්පන්න රූපයාගේ නිර්වේදය පිණිස, විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. වේදනාව අනිත්‍ය යැ ... සංඥාව අනිත්‍ය යැ ... සංස්කාර අනිත්‍ය යැ ... අතීතානාගත විඥානය අනිත්‍ය යැ, පච්චුප්පන්න විඥාන පිළිබඳ කවර කථා යැ. (අනිත්‍ය මැ යි) මහණෙනි, මෙසේ (විදසුන් නුවණින්) දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක අතීත විඥානයෙහි අපේක්ෂා රහිත වෙයි, අනාගත විඥානය නො පතයි, ප්‍රත්‍යුත්පන්න විඥානයාගේ නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ ය යි.

## 1. 1. 1. 10.

## දෙවැනි අතීතානාගත සූත්‍රය

**10. සැවැත්නුවර :**

මහණෙනි, අතීතානාගත රූපය දුක් යැ, පවත්නා රූපය පිළිබඳ කවර කථා යැ (දුක් මැයි). මහණෙනි, මෙසේ (විවසුන් නුවණින්) දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක අතීත රූපයෙහි අනපේක්ෂක වෙයි, අනාගත රූපය නො පතයි, පවත්නා රූපායාගේ නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. වේදනාව දුක් යැ, ... සංඥාව දුක් යැ, ... සංස්කාර දුක් යැ, ... අතීතානාගත විඥානය දුක් යැ, පවත්නා විඥානය පිළිබඳ කවර කථා යැ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක අතීත රූපයෙහි අනපේක්ෂක වෙයි, අනාගත රූපය ප්‍රාර්ථනා නො කෙරෙයි, ප්‍රත්‍යුත්පන්න රූපයාගේ නිර්වෙදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස පිළිපන්නේ වේ ය යි.

## 1. 1. 1. 11.

## තෙවැනි අතීතානාගත සූත්‍රය

**11. සැවැත්නුවර :**

මහණෙනි, අතීතානාගත රූපය අනාත්ම ය, වර්තමාන රූපය පිළිබඳ කවර කථා යැ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආයර්‍ශ්‍රාවක ඉකුත් රූපයෙහි අපේක්ෂා රහිත වෙයි, මතු රූපය නො පතයි, පවත්නා රූපයාගේ කලකිරීම පිණිස, නො ඇල්ම පිණිස, නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි. වේදනාව අනාත්ම යි ... සංඥාව අනාත්ම යි ...

සඞ්ඛාරා අනත්තා -පෙ- විඤ්ඤාණං අනත්තං අතීතානාගතං, කො පන වාදො පච්චුප්පන්නස්ස. එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො අතීතස්මිං විඤ්ඤාණස්මිං අනපෙක්ඛො හොති, අනාගතං විඤ්ඤාණං නාභිනන්දති, පච්චුප්පන්නස්ස විඤ්ඤාණස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොතීති.

නකුලපිතුවග්ගො පඨමො.

තස්සුද්දානං :

නකුලපිතා දෙවදහා ද්වෙපි හාලිද්දිකානි ච
සමාධි පටිසල්ලානං උපාදාපරිතස්සනා දුවෙ
අතීතානාගතා තීණි වග්ගො තෙන පවුච්චති.

සංස්කාර අනාත්ම යි ... අතීතානාගත විඥානය අනාත්ම යි, වර්තමාන විඥානය පිළිබඳ කවර කථා යැ. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක අතීත විඥානයෙහි අපේක්ෂා රහිත වෙයි, අනාගත විඥානය නො පතයි, ප්‍රත්‍යුත්පන්න විඥානයාගේ නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ යයි.

**පළමුවැනි නකුලපිතු වර්ග යි.**

**එහි උද්දානය :**

නකුලපිතු සූත්‍රය, දේවදහ සූත්‍රය, හාලිද්දක සූත්‍ර දෙක ය, සමාධි සූත්‍රය, පටිසල්ලාන සූත්‍රය, උපාදපරිතස්සනා සූත්‍ර දෙකය, අතීතානාගත සූත්‍ර තුන දැයි සූත්‍ර එකොළොසකින් නකුලපිතු වර්ගය යුක්ත යයි කියනු ලැබේ.

## 2. අනිච්චවග්ගො

### 1. 1. 2. 1.

### අනිච්ච සුත්තං

**12. සාවත්ථියං-**

රූපං භික්ඛවෙ අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සඞ්ඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චං. එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති: ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 1. 1. 2. 2.

### දුක්ඛ සුත්තං

**13. සාවත්ථියං-**

රූපං භික්ඛවෙ දුක්ඛං, වෙදනා දුක්ඛා, සඤ්ඤා දුක්ඛා සඞ්ඛාරා දුක්ඛා, විඤ්ඤාණං දුක්ඛං. එවං පස්සං භික්ඛවෙ, -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 1. 1. 2. 3.

### අනත්ත සුත්තං

**14. සාවත්ථියං-**

රූපං භික්ඛවෙ අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා. එවං පස්සං භික්ඛවෙ -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 1. 1. 2. 4.

### යදනිච්ච සුත්තං

**15. සාවත්ථියං-**

රූපං භික්ඛවෙ අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං "නෙතං මම නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

## 2. අනිත්‍ය වර්ගය

### 1. 1. 2. 1.

### අනිත්‍ය සූත්‍රය

**12. සැවැත්නුවර :**

මහණෙනි, රූපය අනිත්‍ය යැ, වේදනාව අනිත්‍ය යැ, සංඥව අනිත්‍ය යැ, සංස්කාර අනිත්‍ය යැ, විඥනය අනිත්‍ය යි. මෙසෙයින් (විදසුන් නුවණින්) දක්නා ශ්‍රැතවත් ආය්‍ය්‍යශ්‍රාවක රූපයෙහිදු කලකිරෙයි, වේදනායෙහිදු කලකිරෙයි, සංඥයෙහිදු කලකිරෙයි, සංස්කාරයන්හිදු කලකිරෙයි, විඥනයෙහිදු කලකිරෙයි. කලකිරෙනුයේ නො ඇලෙයි, නො ඇලීම් හේතුයෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදෙයි, මිදුණු කල්හි, මිදිණැයි (ප්‍රත්‍ය වෙක්ෂා) ඥනය වෙයි : ''ජාතිය ගෙවිණ, මහබඹසර වැස නිමවතලදී. සිවුමඟ කරණී කරන ලද, මේ රහත්බව සඳහා අන් කිසෙක් නැතැ''යි දනී යයි.

### 1. 1. 2. 2.

### දුක්ඛ සූත්‍රය

**13. සැවැත්නුවර :**

මහණෙනි, රූපය දුක් යැ, වේදනාව දුක් යැ, සංඥව දුක් යැ, සංස්කාර දුක් යැ, විඥනය දුක යි. මහණෙනි මෙසේ (විදසුන් නුවණින්) දක්නා ... මේ රහත් බව සඳහා අන් කිසෙක් නැතැයි දනී යයි.

### 1. 1. 2. 3.

### අනත්ත සූත්‍රය

**14. සැවැත්නුවර :**

මහණෙනි, රූපය අනාත්ම යැ, වේදනාව අනාත්ම යැ, සංඥව අනාත්ම යැ, සංස්කාර අනාත්ම යැ, විඥනය අනාත්ම යි. මහණෙනි, මෙසේ දක්නා ... මේ රහත්බව සඳහා අන් කිසෙක් නැතැයි දනී යයි.

### 1. 1. 2. 4.

### යදනිච්ච සූත්‍රය

**15. සැවැත්නුවර :**

මහණෙනි, රූපය අනිත්‍ය යැ. යමක් අනිත්‍ය නම් එය දුක් යැ, යමක් දුක් නම් එය අනාත්ම යැ, යමක් අනාත්ම නම් එය ''තෙල මා අයත් නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වෙයි.'' මෙසෙයින් තෙල යථාභූත කොට මනා නුවණින් දක්කයුතු.

වේදනා අනිච්චා-පෙ-සඤ්ඤා අනිච්චා-පෙ-සඞ්ඛාරා අනිච්චා-පෙ-විඤ්ඤාණං අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං "නෙතං මම, නෙසො 'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 1. 2. 5.

### යංදුක්ඛ සුත්තං

16. සාවත්ථියං-

රූපං භික්ඛවෙ දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං 'නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. වේදනා දුක්ඛා -පෙ- සඤ්ඤා දුක්ඛා -පෙ- සඞ්ඛාරා දුක්ඛා -පෙ- විඤ්ඤාණං දුක්ඛං. යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 1. 2. 6.

### යදනත්ත සුත්තං

17. සාවත්ථියං-

රූපං භික්ඛවෙ අනත්තා යදනත්තා තං "නෙතං මම නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. වේදනා අනත්තා -පෙ- සඤ්ඤා අනත්තා -පෙ- සඞ්ඛාරා අනත්තා -පෙ- විඤ්ඤාණං අනත්තා, යදනත්තා තං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙ සො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ, -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාති

## 1. 1. 2. 7.

### පඨම හෙතු සුත්තං

18. සාවත්ථියං-

රූපං භික්ඛවෙ අනිච්චං. යොපි හෙතු යොපි පච්චයො රූපස්ස උප්පාදාය, සොපි අනිච්චො. අනිච්චසම්භූතං භික්ඛවෙ, රූපං කුතො නිච්චං භවිස්සති වේදනා අනිච්චා. -පෙ- සඤ්ඤා අනිච්චා -පෙ- සඞ්ඛාරා අනිච්චා -පෙ- විඤ්ඤාණං අනිච්චං, යොපි හෙතු යොපි පච්චයො විඤ්ඤාණස්ස උප්පාදාය, සොපි අනිච්චො. අනිච්චසම්භූතං භික්ඛවෙ, විඤ්ඤාණං කුතො නිච්චං භවිස්සති.

එවං පස්සං භික්ඛවෙ -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

වේදනාව අනිත්‍ය යැ ... සංඥාව අනිත්‍ය යැ ... සංස්කාර අනිත්‍ය යැ ... විඥානය අනිත්‍ය යැ. යමක් අනිත්‍ය නම් එය දුක් යැ, යමක් දුක් නම් එය අනාත්ම යැ. යමක් අනාත්ම නම් එය ''තෙල මා අයත් නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වෙයි.'' මෙසෙයින් තෙල යථාභූත කොට සම්‍යක්ප්‍රඥයෙන් දක්ක යුතු.

මහණෙනි, මෙසෙයින් දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපයෙහිදු කලකිරෙයි ... මේ රහත්බව සඳහා අන් කිසෙක් නැතැයි දනී යයි.

## 1. 1. 2. 5.

## යංදුක්ඛ සූත්‍රය

**16. සැවැත්නුවර :**

මහණෙනි, රූපය දුක් යැ, යමක් දුක් නම් එය අනාත්ම යැ. යමක් අනාත්ම නම් ''තෙල මා අයත් නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වෙයි'' මෙසේ තෙල ඇති සැටියෙන් සම්‍යක්ප්‍රඥයෙන් දක්ක යුතු. වේදනාව දුක් යැ ... සංඥාව දුක් යැ ... සංස්කාර දුක් යැ ... විඥානය දුක යි. යමක් දුක් නම් එය අනාත්ම යි. යමක් අනාත්ම නම් එය ''තෙල මා අයත් නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වෙයි'' මෙසේ තෙල ඇතිසැටියෙන් සම්‍යක්ප්‍රඥයෙන් දක්ක යුතු.

මහණෙනි, මෙසේ දක්නා ... මේ රහත් බව සඳහා අන්කිසෙක් නැතැයි දනී, යයි.

## 1. 1. 2. 6.

## යදනත්ත සූත්‍රය

**17. සැවැත්නුවර :**

මහණෙනි, රූපය අනාත්ම යි. යමක් අනාත්ම නම් එය ''තෙල මා අයත් නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වෙයි. මෙසේ තෙල යථාභූත කොට සම්‍යක් ප්‍රඥයෙන් දක්කයුතු, වේදනාව අනාත්ම යැ ... සංඥාව අනාත්ම යැ ... සංස්කාර අනාත්ම යැ ... විඥානය අනාත්ම යි. යමක් අනාත්ම නම් එය ''තෙල මා අයත් නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වෙයි'' මෙසේ තෙල යථාභූත කොට සම්‍යක් ප්‍රඥයෙන් දක්කයුතු.

මහණෙනි, මෙසෙයින් දක්නා ... මේ රහත් බව සඳහා අන්කිසෙක් නැතැයි දනී යයි.

## 1. 1. 2. 7.

## පඨම හේතු සූත්‍රය

**18. සැවැත්නුවර :**

මහණෙනි, රූපය අනිත්‍ය යැ රූපයාගේ ඉපැත්මට යමක් හේතු වේ නම් ප්‍රත්‍යය වේ නම්, හෙ ද අනිත්‍ය යි. මහණෙනි, රූපය අනිත්‍ය සම්භූත යි. කොයින් නිත්‍ය වන්නේ ද, වේදනාව අනිත්‍ය යැ ... සංඥාව අනිත්‍ය යැ. ... සංස්කාර අනිත්‍ය යැ ... විඥානය අනිත්‍ය යැ, විඥානයාගේ ඉපැත්මට යමක් හේතු වේ ද, යමක් ප්‍රත්‍යය වේ ද, හෙ ද අනිත්‍ය යැ. කොයින් නිත්‍ය වන්නේ ද.

මහණෙනි, මෙසේ දක්නා ... මේ රහත් බව පිණිස අන් කිසෙක් නැතැයි දනී යයි.

## 1. 1. 2. 8.

### දුතිය හෙතු සුත්තං

**19. සාවත්ථියං-**

රූපං භික්ඛවෙ, දුක්ඛං. යොපි හෙතු යොපි පච්චයො රූපස්ස උප්පාදාය සොපි දුක්ඛො. දුක්ඛසම්භූතං භික්ඛවෙ, රූපං, කුතො සුඛං භවිස්සති. වෙදනා දුක්ඛා -පෙ- සඤ්ඤා දුක්ඛා -පෙ- සඞ්ඛාරා දුක්ඛා -පෙ- විඤ්ඤාණං දුක්ඛං. යොපි හෙතු යොපි පච්චයො විඤ්ඤාණස්ස උප්පාදාය සොපි දුක්ඛො දුක්ඛසම්භූතං භික්ඛවෙ, විඤ්ඤාණං. කුතො සුඛං භවිස්සති.

එවං පස්සං භික්ඛවෙ -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 1. 2. 9.

### තතිය හෙතු සුත්තං

**20. සාවත්ථියං-**

රූපං භික්ඛවෙ, අනත්තා. යොපි හෙතු යොපි පච්චයො රූපස්ස උප්පාදාය සොපි අනත්තා. අනත්තසම්භූතං භික්ඛවෙ රූපං, කුතො අත්තා භවිස්සති. වෙදනා අනත්තා -පෙ- සඤ්ඤා අනත්තා -පෙ- සඞ්ඛාරා -පෙ- අනත්තා -පෙ- විඤ්ඤාණං අනත්තා. යොපි හෙතු යොපි පච්චයො විඤ්ඤාණස්ස උප්පාදාය සොපි අනත්තා. අනත්තසම්භූතං භික්ඛවෙ විඤ්ඤාණං. කුතො අත්තා භවිස්සති.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 1. 2. 10.

### ආනන්ද සුත්තං

**21. සාවත්ථියං-**

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච :

නිරොධො නිරොධොති භන්තෙ වුච්චති, කතමෙසානං ඛො භන්තෙ ධම්මානං නිරොධො නිරොධොති වුච්චතීති ?

## 1. 1. 2. 8.
## දෙවැනි හේතු සූත්‍රය

**19. සැවැත්නුවර :**

මහණෙනි, රූපය දුක් යෑ. රූපයාගේ උප්පාදය පිණිස යම් හේතුයෙක් යම් ප්‍රත්‍යයෙක් ඇත් ද, හෙ ද දුකැ. මහණෙනි, රූපය දුක්ඛසම්භූත යි. කොයින් සුඛයෙක් වේ ද. වේදනා දුක් යෑ ... සංඥා දුක් යෑ ... සංස්කාරයෝ දුක්ඛ ... විඥනය දුක් යෑ, විඥනයාගේ උත්පාදය සඳහා යම් හේතුවක් හා ප්‍රත්‍යයක් හා ඇත් ද, එ ද දුකැ. මහණෙනි, විඥනය දුඃඛ සම්භූත යි. කොයින් සුඛ වේ ද.

මහණෙනි, මෙසේ දක්නා ආර්යශ්‍රාවක ... එ අර්හත්වය පිණිස අන් කිසෙක් නැතී යි නුවණින් දනී.

## 1. 1. 2. 9.
## තෙවැනි හේතු සූත්‍රය

**20. සැවැත්නුවර :**

මහණෙනි, රූපය අනාත්ම යෑ, රූපයාගේ උත්පාදය සඳහා යම් මැ හේතුයෙක් යම් මැ ප්‍රත්‍යයෙක් ඇත් ද, හෙ ද අනාත්ම යෑ. මහණෙනි, රූපය අනාත්ම සම්භූත යි කොයින් ආත්මයෙක් වේ ද. වේදනාව අනාත්ම යෑ ... සංඥව අනාත්ම යෑ ... සංස්කාරයෝ අනාත්මයහ ... විඥනය අනාත්ම යෑ විඥනයාගේ උත්පාදය පිණිස යම් හේතුයෙක් ඇත් ද, යම් ප්‍රත්‍යයෙක් ඇත් ද, හෙ ද අනාත්ම යෑ. මහණෙනි, විඥනය අනාත්ම සම්භූත යි. කොයින් ආත්මයෙක් වේ ද.

මහණෙනි මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපයෙහිදු නිර්වේද කරයි, වේදනා යෙහිදු නිර්වේද කරයි, සංඥයෙහිදු නිර්වේද කරයි, සංස්කාරයන්හිදු නිර්වේද කරයි, විඥනයෙහිදු නිර්වේද කරයි. නිර්වේද කරනුයේ විරාග කරයි, විරාග හේතුයෙන් මිදෙයි, මිදුණු කල " විමුක්තයෙමි " යි ඥනය පහළ වෙයි. ජාතිය ක්ෂීණ වූ, බඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, එ අර්හත්වය පිණිස අන් කිසෙක් නැතියි නුවණින් දනී.

## 1. 1. 2. 10.
## ආනන්ද සූත්‍රය

**21. සැවැත්නුවර :**

ඉක්බිති ආයුෂ්මත් අනද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹැ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙකැ හුන්හ. එකත්පසෙකැ හුන් ආයුෂ්මත් අනද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කළහ. :

වහන්ස, නිරෝධ යෑ, නිරෝධ යෑ යි කියනු ලැබෙයි. වහන්ස, කවර ධර්ම කෙනෙකුන්ගේ නිරෝධයෙන් 'නිරෝධය යි' කියනු ලැබේ ද ?

රූපං ඛො ආනන්ද, අනිච්චං, සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං. තස්ස නිරොධා නිරොධොති වුච්චති, වේදනා අනිච්චා -පෙ- තස්සා නිරොධා නිරොධොති වුච්චති. සඤ්ඤා අනිච්චා -පෙ- තස්සා නිරොධා නිරොධොති වුච්චති සඞ්ඛාරා අනිච්චා -පෙ- තෙසං නිරොධා නිරොධොති වුච්චති, විඤ්ඤාණං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධ-ධම්මං, තස්ස නිරොධා නිරොධොති වුච්චතීති.

ඉමෙසං ඛො ආනන්ද ධම්මානං නිරොධා නිරොධොති වුච්චතීති

අනිච්චවග්ගො දුතියො.

තස්සුද්දානං :

අනිච්චං දුක්ඛං අනත්තා යදනිච්චාපරෙ තයො
හෙතුනාපි තයො වුත්තා ආනන්දෙන පූරිතො වග්ගො.

ආනන්දය, රූපය අනිත්‍ය යැ, ප්‍රත්‍යයන් විසින් කරන ලද. ප්‍රතීත්‍යසමුත්පන්න යැ, කියවන සැහැවි ඇතැ, වියවන සැහැවි ඇතැ, විරාගස්වභාව ඇතැ, නිරොධ ස්වභාව ඇති. ඒ රූපයාගේ නිරොධ හෙතුයෙන් '' නිරොධය '' යි කියනු ලැබෙයි. වෙදනා අනිත්‍ය යැ ... සංඥා අනිත්‍ය යැ ... සංස්කාරයෝ අනිත්‍යහ ... විඥානය අනිත්‍ය යැ, ප්‍රත්‍යයන් විසින් කරන ලද, ප්‍රත්‍යයෙන් සමුත්පන්නයැ, ක්ෂයස්වභාව ව්‍යයස්වභාව විරාගස්වභාව නිරොධස්වභාව ඇති. ඒ විඥානයගේ නිරොධයෙන් '' නිරොධය '' යි කියනු ලැබෙයි.

ආනන්ද මේ ධර්මයන්ගේ නිරොධයෙන් '' නිරොධය '' යි කියනු ලැබේ.

**දෙවැනි අනිත්‍ය වර්ග යි.**

**එහි උද්දානය :**

**අනිච්ච සූත්‍රය, දුක්ඛ සූත්‍රය, අනත්ත සූත්‍රය, යදනිච්චාදි අන්‍ය තුන් සූත්‍රයෝ යැ, හේතු වශයෙන් සූත්‍රයෝ තුන් දෙනෙකැ ආනන්ද සූත්‍රයෙන් මෙසේ වර්ගය පිරිණි.**

## 3. භාරවග්ගො

### 1. 1. 3. 1.

### භාර සුත්තං

සාවත්ථියං-

භාරඤ්ච වො භික්ඛවෙ දෙසිස්සාමි භාරහාරඤ්ච, භාරාදානඤ්ච, භාරනික්ඛෙපනඤ්ච. තං සුණාථ -පෙ- එතදවොච :

කතමො ච භික්ඛවෙ භාරො : පඤ්චුපාදානක්ඛන්ධාතිස්ස වචනීයං. කතමෙ පඤ්ච : රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො. අයං වුච්චති භික්ඛවෙ භාරො.

කතමො ච භික්ඛවෙ භාරහාරො : පුග්ගලොතිස්ස වචනීයං, යො'යං ආයස්මා එවංනාමො එවංගොත්තො, අයං වුච්චති භික්ඛවෙ, භාරහාරො.

කතමඤ්ච භික්ඛවෙ, භාරාදානං : යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී සෙය්‍යථීදං : කාමතණ්හා, භවතණ්හා විභවතණ්හා. ඉදං වුච්චති භික්ඛවෙ භාරාදානං.

කතමඤ්ච භික්ඛවෙ භාරනික්ඛෙපනං : යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො. ඉදං වුච්චති භික්ඛවෙ භාරනික්ඛෙපනන්ති.

ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා :

1. භාරා හවෙ පඤ්චක්ඛන්ධා භාරහාරො ච පුග්ගලො,
   භාරාදානං දුඛං[1] ලොකෙ භාරනික්ඛෙපනං සුඛං.

2. නික්ඛිපිත්වා ගරුං භාරං අඤ්ඤං භාරං අනාදිය,
   සමූලං තණ්හං අබ්බුය්හ නිච්ඡාතො පරිනිබ්බුතො.

### 1. 1. 3. 2.

### පරිඤ්ඤ සුත්තං

23. සාවත්ථියං-

පරිඤ්ඤෙය්‍යෙ ච භික්ඛවෙ ධම්මෙ දෙසිස්සාමි පරිඤ්ඤඤ්ච, තං සුණාථ -පෙ-

---

1. දුක්ඛං - සීමු. මජසං,



Free Distribution www.aathaapi.org

## 3. භාර වර්ගය

### 1. 1. 3. 1.

### භාර සූත්‍රය

**22. සැවැත්නුවර :**

මහණෙනි, තොපට භාරය ද දෙසමි, භාරහාරය හා භාරාදනය හා භාරනික්ෂේපය හා දෙසමි. එය අසව ... තෙල වදළහ :

මහණෙනි, '' භාර '' නම් කවරෙ යත් : පඤ්ච උපාදාන ස්කන්ධහ'යි කියයුතු වෙයි.

කවර පසෙක : එ මෙසේ යැ : රූපොපාදානස්කන්ධ යැ, වෙදනොපාදනස්කන්ධ යැ, සංඥෙපාදානස්කන්ධ යැ, සංස්කාරොපාදානස්කන්ධ යැ, විඥානොපාදානස්කන්ධ යි. මහණෙනි, මෙ භාරයැ යි කියනු ලැබෙයි.

මහණෙනි, '' භාරහාර '' නම් කවරෙ යත් : පුද්ගල යයි කිය යුතු වෙයි. මෙබඳු නම් ඇති මෙබඳු ගොත්‍ර ඇති, යම් ආයුෂ්මත් කෙනෙක් ඇත් ද, මහණෙනි මෙ '' භාරහාර '' යයි කියනු ලැබෙයි.

මහණෙනි, '' භාරාදන '' නම් කවරෙ යත් : පුනර්භවය පිණිස පවත්නා නන්දිරාග සහගත වූ රූපාදි ඒ ඒ අරමුණෙහි අභිනන්දන ස්වභාව ඇති යම් මෙ තෘෂ්ණායෙක් ඇත් ද, එ කෙසේ ද යත් : කාමතෘෂ්ණා යැ, භවතෘෂ්ණා යැ, විභවතෘෂ්ණා යි. මහණෙනි, මෙ'' භාරාදන '' යි කියනු ලැබෙයි.

මහණෙනි, '' භාරනික්ඛෙප '' නම් කවරෙ යත් : ඒ තෘෂ්ණාවගේ මැ යම් අශෙෂ විරාගනිරොධයෙක්, පරිත්‍යාගයෙක්, හැරැපීමෙක්, බිඳීමෙක්, නො ඇල්මෙක් ඇත් ද, මහණෙනි, මෙ '' භාරනික්ඛෙප '' යි කියනු ලැබෙ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළහ. සුගතයන් වහන්සේ මෙය වදරා ශාස්තෘ වූ බුදුහු යළිදු අන්‍ය වූ තෙල ගාථා ද වදළ සේක්.

1. පඤ්චස්කන්ධයෝ එකැතින් භාරයහ, වැළි පුද්ගල භාරහාර වෙයි, ලොකයෙහි භාරාදනය (භාරග්‍රහණය) දුක්වෙයි, භාරනික්ඛෙපය සුව වෙයි.

2. ගුරුබර බහා තබා අන්බරක් නො ගෙන අවිද්‍යා මූල සහිත තෘෂ්ණාව උදුරා නිස්තෘෂ්ණ වූයේ පිරිනිවියේ නම් වේ.

### 1. 1. 3. 2.

### පරිඥේය සූත්‍රය

**12. සැවැත්නුවර :**

මහණෙනි, පරිඥෙය ධර්මයනුදු දෙසමි, පරිඥා ද දෙසමි, එ අසව ...



Free Distribution www.aathaapi.org

කතමෙ ච භික්ඛවෙ පරිඤ්ඤෙය්‍යා ධම්මා:

රූපං භික්ඛවෙ, පරිඤ්ඤෙය්‍යො ධම්මො, වෙදනා පරිඤ්ඤෙය්‍යො ධම්මො, සඤ්ඤා පරිඤ්ඤෙය්‍යො ධම්මො, සඞ්ඛාරා පරිඤ්ඤෙය්‍යො ධම්මො, විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යො ධම්මො. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, පරිඤ්ඤෙය්‍යා ධම්මා.

කතමා ච භික්ඛවෙ, පරිඤ්ඤා:

යො භික්ඛවෙ රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො. අයං වුච්චති භික්ඛවෙ පරිඤ්ඤාති

## 1. 1. 3. 3.

## අභිජාන සුත්තං

24. සාවත්ථියං-

රූපං භික්ඛවෙ, අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය. වෙදනං අනභිජානං -පෙ- සඤ්ඤං අනභිජානං -පෙ- සඞ්ඛාරෙ අනභිජානං -පෙ- විඤ්ඤාණං අනභිජානං අපරිජානං අවිරාජයං අප්පජහං අභබ්බො දුක්ඛක්ඛයාය.

රූපඤ්ච ඛො භික්ඛවෙ, අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාය. වෙදනං අභිජානං -පෙ- සඤ්ඤං අභිජානං -පෙ- සඞ්ඛාරෙ අභිජානං -පෙ- විඤ්ඤාණං අභිජානං පරිජානං විරාජයං පජහං භබ්බො දුක්ඛක්ඛයාති.

## 1. 1. 3. 4.

## ඡන්දරාග සුත්තං

25. සාවත්ථියං-

යො භික්ඛවෙ, රූපස්මිං ඡන්දරාගො, තං පජහථ, එවං තං රූපං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං.

යො වෙදනාය ඡන්දරාගො තං පජහථ, එවං සා වෙදනා පහීනා භවිස්සති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාද-ධම්මා.

යො සඤ්ඤාය ඡන්දරාගො තං පජහථ -පෙ- යො සඞ්ඛාරෙසු ඡන්දරාගො තං පජහථ, එවං තෙ සඞ්ඛාරා පහීනා භවිස්සන්ති උච්ඡින්නමූලා තාලවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා.

යො විඤ්ඤාණස්මිං ඡන්දරාගො තං පජහථ, එවං තං විඤ්ඤාණං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මන්ති.

Free Distribution www.aathaapi.org

මහණෙනි, පරිඥෙය ධර්මයෝ කවරහ යත් :

මහණෙනි, රූපය පරිඥෙය (සමතික්‍රම කළයුතු) ධර්ම යැ වේදනා පරිඥෙය ධර්ම යැ සංඥ පරිඥෙය ධර්ම යැ සංස්කාර පරිඥෙය ධර්ම යැ විඥන පරිඥෙය ධර්ම යි. මහණෙනි, මොහු පරිඥෙය ධර්මහ යි කියනු ලබෙත්.

මහණෙනි, පරිඥ කවර යත් :

මහණෙනි, යම් රාගක්‍ෂයෙක් දෙසක්‍ෂයෙක් මෝහක්‍ෂයෙක් ඇත් ද, මහණෙනි, මේ පරිඥ යි කියනු ලබෙ.

## 1. 1. 3. 3.

## අභිජාන සූත්‍රය

**24. සැවැත්නුවර :**

මහණෙනි, රූපය ඥතපරිඥ වශයෙන් නො දන්නේ තීරණ පරිඥ වශයෙන් නො දන්නේ ප්‍රහාණපරිඥ වශයෙන් නො ඉක්මවනුයේ නො හරනේ දුඃඛක්‍ෂය පිණිස අභව්‍ය යැ, වේදනා ඥතපරිඥවශයෙන් නො දන්නේ ... සංඥ ඥතපරිඥ වශයෙන් නො දන්නේ ... සංස්කාර ඥතපරිඥවශයෙන් නො දන්නේ ... විඥන ඥතපරිඥ වශයෙන් නො දන්නේ තීරණ පරිඥවශයෙන් නො දන්නේ ප්‍රහාණ පරිඥවශයෙන් නො ඉක්ම වනුයේ නො හරනේ දුඃඛක්‍ෂය පිණිස අභව්‍ය යි.

මහණෙනි, රූපය ඥතපරිඥවශයෙන් දන්නේ තීරණපරිඥවශයෙන් දන්නේ ප්‍රහාණ පරිඥවශයෙන් ඉක්මවනුයේ දුරලනුයේ දුඃඛක්‍ෂය පිණිස භව්‍ය වෙයි. වේදනා ඥතපරිඥවශයෙන් දන්නේ ... සංඥ ඥතපරිඥවශයෙන් දන්නේ ... සංස්කාර ඥපපරිඥ වශයෙන් දන්නේ ... විඥන ඥතපරිඥවශයෙන් දන්නේ තීරණ පරිඥවශයෙන් දන්නේ ප්‍රහාණපරිඥවශයෙන් ඉක්මවනුයේ දුරලනුයේ දුඃඛක්‍ෂය පිණිස භව්‍ය වෙ.

## 1. 1. 3. 4.

## ඡන්දරාග සූත්‍රය

**25. සැවැත්නුවර :**

මහණෙනි, රූපයෙහි යම් ඡන්දරාගයෙක් ඇත් ද, එය දුරුකරව. මෙසේ ඒ රූපය, ප්‍රහීණ වූයේ උසුන්මුල් ඇත්තේ, මුදුන් සුන් තලක් සෙයින් අවස්තුක වූයේ අනභාව කරන ලදුයේ මතුයෙහි නූපදනා සැහැවි ඇත්තේ වෙයි.

වේදනායෙහි යම් ඡන්දරාගයෙක් ඇත් ද, එය දුරු කරව. මෙසේ ඒ වේදනාව, ප්‍රහීණ වෙයි. උසුන් මුල් ඇති වෙයි. මුදුන් සුන් තලක් සෙයින් කරන ලද අවස්තුකභාව ඇති වෙයි. අනභාව කරන ලද වෙයි. මතුයෙහි නූපදනා සැහැවි ඇති වේ.

සංඥයෙහි යම් ඡන්දරාගයෙක් ඇත් ද, එය හැරපියව ... සංස්කාරයන්හි යම් ඡන්ද රාගයෙක් ඇත් ද, එය දුරුකරව, මෙසේ ඒ සංස්කාරයෝ ප්‍රහීණ වූවාහු උසුන් මුල් ඇත්තාහු තාලාවස්තුකෘත වූවාහු අනභාවකෘත වූවාහු මත්තෙහි නූපදනා සැහැවි ඇත්තාහු වෙත්.

විඥනයෙහි යම් ඡන්දරාගයෙක් ඇත් ද එය නෙරව. මෙසේ ඒ විඥනය ප්‍රහීණ වූයේ උසුන්මුල් ඇත්තේ, මුදුන් සුන් තලක් සෙයින් අවස්තුක වූයේ අනභාව කරන ලදුයේ මතුයෙහි නූපදනා සැහැවි ඇත්තේ වේ.


Free Distribution www.aathaapi.org

## 1. 1. 3. 5.

### පඨම අස්සාද සුත්තං

26. සාවත්ථියං-

පුබ්බෙව මෙ භික්ඛවේ, සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි :

කො නු ඛො රූපස්ස අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං : කො වේදනාය -පෙ- කො සඤ්ඤාය -පෙ- කො සඞ්ඛාරානං -පෙ- කො විඤ්ඤාණස්ස අස්සාදො, කො ආදීනවො කිං නිස්සරණන්ති :

තස්ස මය්හං භික්ඛවේ එතදහොසි : යං ඛො රූපං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං රූපස්ස අස්සාදො. යං රූපං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං, අයං රූපස්ස ආදීනවො, යො රූපස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං රූපස්ස නිස්සරණං.

යං වේදනං පටිච්ච -පෙ- යං සඤ්ඤං පටිච්ච -පෙ- යං සඞ්ඛාරෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං සඞ්ඛාරානං අස්සාදො, යෙ සඞ්ඛාරා අනිච්චා දුක්ඛා විපරිනාමධම්මා, අයං සඞ්ඛාරානං ආදීනවො, යො සඞ්ඛාරෙසු ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං සඞ්ඛාරානං නිස්සරණං.

යං විඤ්ඤාණං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං විඤ්ඤාණස්ස අස්සාදෙ. යං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං, අයං විඤ්ඤාණස්ස ආදීනවො. යො විඤ්ඤාණස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං විඤ්ඤාණස්ස නිස්සරණං.

යාවකීවඤ්චාහං භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං එවං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං න අබ්භඤ්ඤාසිං, නෙව තාවාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති[1] පච්චඤ්ඤාසිං.

යතො ච ඛො'හං භික්ඛවෙ, ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං එවං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤාසිං, අථාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති[1] පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවොති.

1. අභිසම්බුද්ධො - සීමු.

## 1. 1. 3. 5.

## පළමුවැනි අස්සාද සූත්‍රය

**26. සැවැත්නුවර :**

මහණෙනි, සම්බෝධියෙන් පළමු මැ අභිසම්බෝධියට නො පත් බෝසත්වූ මැ මට මේ සිත පහළ වීය :

රූපයාගේ ආස්වාදය කවරේ යැ, ආදීනව කවරේ යැ, නිස්සරණය කිමෙක : වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්ගේ ... විඥනයෙහි ආස්වාදය කවරේ යැ, ආදීනව කවර යැ, නිස්සරණය කිමෙකැයි.

මහණෙනි, ඒ මාහට මෙසේ සිත විය : රූපය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මෙ රූපයාගේ ආස්වාද යි. යම් රූපයක් අනිත්‍ය ද දුක් ද විපරිණාම සැහැවි ද, මේ රූපයාගේ ආදීනව යි. රූපයෙහි යම් ඡන්දරාග විනයෙක් ඡන්දරාග ප්‍රහාණයෙක් ඇත් ද, මෙ රූපයාගේ නිස්සරණ යි.

වේදනාව නිසා ... සංඥව නිසා ... සංස්කාර නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මේ සංස්කාරයන්ගේ ආස්වාද යි. යම් සංස්කාර කෙනෙක් අනිත්‍ය ද දුක් ද පෙරළෙන සැහැවි ඇත් ද, මෙසංස්කාරයන්ගේ ආදීනව යි. සංස්කාරයන්ගේ යම් ඡන්දරාගවිනයෙක් ඡන්දරාගප්‍රහාණයෙක් ඇත් ද, මෙ සංස්කාරයන්ගේ නිස්සරණ යි.

විඥනය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මෙ විඥනයාගේ අස්සාද යි. යම් විඥනයෙක් අනිත්‍ය ද දුක් ද පෙරළෙන සැහැවි ඇත් ද, මෙ විඥනයාගේ ආදීනව යි. විඥනයෙහි යම් ඡන්දරාග විනයෙක් ඡන්දරාගප්‍රහාණයෙක් ඇත් ද මෙ විඥනයාගේ නිස්සරණ යි.

මහණෙනි, යම්තාක් මම් මෙ පඤ්චෝපාදනස්කන්ධයන්ගේ ආස්වාදය ආස්වාද වශයෙන් ද ආදීනව ආදීනව වශයෙන් ද නිශ්ශරණය නිශ්ශරණ වශයෙන් ද මෙ සෙයින් ඇතිසැටි අවබෝධ නො කෙළෙම් ද, මහණෙනි, ඒතාක් මම් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වප්‍රජාව කෙරෙහි අනුත්තර වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කෙළෙමැයි නො ම ප්‍රතිඥ කෙළෙම්.

මහණෙනි, යම් කලෙක පටන් මම මේ පඤ්චෝපාදනස්කන්ධයන් ගේ ආස්වාදය ආස්වාද විසින් ද ආදීනව ආදීනව විසින් ද නිශ්ශරණය නිශ්ශරණ විසින් ද මෙ සෙයින් යථාභූත කොට අවබෝධ කෙළෙම් ද, මහණෙනි, එකල්හි මම් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත සත්ත්වප්‍රජාව කෙරෙහි අනුත්තර වූ සම්‍යක්සම්බෝධිය අවබෝධ කෙළෙමැයි ප්‍රතිඥ කෙළෙම්. මට ඥනදර්ශනය ද උපන, මාගේ චෙතොවිමුක්තිය (ඵලසමාධිය) අකෝප්‍ය යැ, මෙ අන්තිම ජාතිය යි, දැන් පුනර්භවයෙක් නැති යි.

## 1. 1. 3. 6.

### දුතිය අස්සාද සුත්තං

**27. සාවත්ථියං-**

රූපස්සාහං භික්ඛවෙ, අස්සාදපරියෙසනං අචරිං, යො රූපස්ස අස්සාදො තදජ්ඣගමං, යාවතා රූපස්ස අස්සාදො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. රූපස්සාහං භික්ඛවෙ, ආදීනවපරියෙසනං අචරිං, යො රූපස්ස ආදීනවො තදජ්ඣගමං, යාවතා රූපස්ස ආදීනවො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො, රූපස්සාහං භික්ඛවෙ, නිස්සරණපරියෙසනං අචරිං. යං රූපස්ස නිස්සරණං තදජ්ඣගමං, යාවතා රූපස්ස නිස්සරණං පඤ්ඤාය මෙ තං සුදිට්ඨං.

වෙදනායාහං භික්ඛවෙ, අස්සාදපරියෙසනං අචරිං. -පෙ- සඤ්ඤායාහං භික්ඛවෙ, අස්සාදපරියෙසනං අචරිං -පෙ- සඞ්ඛාරානාහං භික්ඛවෙ, අස්සාදපරියෙසනං අචරිං -පෙ- විඤ්ඤාණස්සාහං භික්ඛවෙ, අස්සාද-පරියෙසනං අචරිං, යො විඤ්ඤාණස්ස අස්සාදො තදජ්ඣගමං, යාවතා විඤ්ඤාණස්ස අස්සාදො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො, විඤ්ඤාණස්සාහං භික්ඛවෙ, ආදීනවපරියෙසනං අචරිං, යො විඤ්ඤාණස්ස ආදීනවො තදජ්ඣගමං යාවතා විඤ්ඤාණස්ස ආදීනවො පඤ්ඤාය මෙ සො සුදිට්ඨො. විඤ්ඤාණස්සාහං භික්ඛවෙ, නිස්සරණපරියෙසනං අචරිං. යං විඤ්ඤාණස්ස නිස්සරණං තදජ්ඣගමං, යාවතා විඤ්ඤාණස්ස නිස්සරණං පඤ්ඤාය මෙ තං සුදිට්ඨං.

යාවකීවඤ්චාහං භික්ඛවෙ, ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤාසිං. නෙව තාවාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙව-මනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති පච්චඤ්ඤාසිං.

යතො ච ඛො'හං භික්ඛවෙ, ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං එවං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤාසිං. අථාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතොවිමුත්ති අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවොති.

## 1. 1. 3. 7.

### තතිය අස්සාද සුත්තං

**සාවත්ථියං-**

නො චෙදං භික්ඛවෙ, රූපස්ස අස්සාදො අභවිස්ස, නයිදං සත්තා රූපස්මිං සාරජ්ජෙය්‍යුං, යස්මා ච ඛො භික්ඛවෙ, අත්ථි රූපස්ස අස්සාදො, තස්මා සත්තා රූපස්මිං සාරජ්ජන්ති.

## 1. 1. 3. 6.

## දෙවැනි අස්සාද සූත්‍රය

27. සැවැත්නුවර :

මහණෙනි, මම රූපයාගේ ආස්වාද පයෙෂීෂණය කෙළෙමි. රූපයාගේ යම් ආස්වාදයෙක් ඇත් ද, එය අවබෝධ කෙළෙමි, රූපයාගේ යම් පමණ ආස්වාදයෙක් ඇත් ද, ඒ මා විසින් ප්‍රඥයෙන් මොනාවට දක්නා ලදි. මහණෙනි, මම රූපයාගේ ආදීනව පයෙෂීෂණය කෙළෙමි. රූපයාගේ යම් ආදීනවයෙක් ඇත් ද එ ද අවබෝධ කෙළෙමි. රූපයාගේ යම් පමණ ආදීනවයෙක් ඇත් ද, එය මා විසින් ප්‍රඥයෙන් මොනොවට දක්නා ලදි. මහණෙනි, මම රූපයාගේ නිශ්ශරණ පයෙෂීෂණය කෙළෙමි. රූපයාගේ යම් නිශ්ශරණයෙක් ඇත් ද, එය අවබෝධ කෙළෙමි. රූපයාගේ යම් පමණ නිශ්ශරණයෙක් ඇත් ද එය මා විසින් ප්‍රඥයෙන් මොනොවට දක්නා ලදි.

මහණෙනි, මම වේදනාව පිළිබඳ ආස්වාද පයෙෂීෂණය කෙළෙමි. ... මහණෙනි, මම සංඥව පිළිබඳ ආස්වාද පයෙෂීෂණය කෙළෙමි. ... මහණෙනි, මම සංස්කාර පිළිබඳ ආස්වාද පයෙෂීෂණය කෙළෙමි. ... මහණෙනි මම විඥනය පිළිබඳ ආස්වාද පයෙෂීෂණය කෙළෙමි. විඥනයාගේ යම් ආස්වාදයෙක් ඇත් ද, එය අවබෝධ කෙළෙමි. විඥනයාගේ යම් පමණ ආස්වාදයෙක් ඇත් ද, එය මා විසින් ප්‍රඥයෙන් මොනොවට දක්නා ලදි. මහණෙනි, මම විඥනය පිළිබඳ ආදීනව පයෙෂීෂණ කෙළෙමි. විඥනයාගේ යම් ආදීනවයෙක් ඇත් ද එය අවබෝධ කෙළෙමි. විඥනයාගේ යම් පමණ ආදීනවයෙක් ඇත් ද, එය මා විසින් ප්‍රඥයෙන් මොනොවට දක්නා ලදී. මහණෙනි, මම විඥනයාගේ නිශ්ශරණපයෙෂීෂණය කෙළෙමි. විඥනයාගේ යම් නිශ්ශරණයෙක් ඇත් ද, එය අවබෝධ කෙළෙමි. විඥනයාගේ යම් පමණ නිශ්ශරණයෙක් ඇත් ද එය මා විසින් ප්‍රඥයෙන් දක්නා ලදි.

මහණෙනි, මම යම්තාක් මේ පඤ්චෝපාදනස්කන්ධයන්ගේ ආස්වාදය ආස්වාද විසිනුදු ආදීනවය ආදීනව විසිනුදු නිශ්ශරණය නිශ්ශරණ විසිනුදු ඇති තතු නුවණින් අවබෝධ නො කෙළෙම් වේද, මහණෙනි මම ඒතාක් මරුන් සහිත බඹුන් සහිත දෙවියන් සහිත ලෝකයෙහි දෙව්මිනිසුන් සහිත මහණ බමුණන් සහිත සත්ත්වාවාය ප්‍රජායෙහි අනුත්තර සම්‍යක් සම්බෝධිය මොනොවට අවබෝධ කෙළෙමි යි පිළින නො කෙළෙමි.

මහණෙනි, මම යම් කලෙක මේ පඤ්චෝපාදනස්කන්ධයන්ගේ මෙසේ ආස්වාදය ආස්වාද විසිනුදු ආදීනවය ආදීනව විසිනුදු නිශ්ශරණය නිශ්ශරණ විසිනුදු ඇති තතු මොනොවට අවබෝධ කෙළෙම් වේ ද, මහණෙනි එසඳ මම දෙවියන් සහිත මරුන් සහිත බ්‍රහ්මයන් සහිත ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත අවශේෂ දේවමනුෂ්‍යයන් සහිත සත්ත්වාවාය ප්‍රජායෙහි ලා අනුත්තර සම්‍යක් සම්බොධිය අවබෝධ කෙළෙමි යී ප්‍රතිඥ කෙළෙමි. මාගේ චෙතො විමුක්තිය අකොප්‍ය යැ, මේ අන්තිම ජාති වෙයි, දුන් පුනර්භවයෙක් නැති යි මට ඥනදර්ශනය ද උද විය.

## 1. 1. 3. 7.

## තෙවැනි අස්සාද සූත්‍රය

28. සැවැත්නුවර :

මහණෙනි රූපයාගේ ආස්වාදයෙක් නැත් නම් සත්ත්වයෝ රූපයෙහි නො ඇලෙති. මහණෙනි, යම් හෙයකින් රූපයාගේ ආස්වාදයෙක් ඇත් ද, එහෙයින් සත්ත්වයෝ රූපයෙහි ඇලෙති.

නො චෙදං භික්ඛවෙ, රූපස්ස ආදීනවො අභවිස්ස, නයිදං සත්තා රූපස්මිං නිබ්බින්දෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ, අත්ථි රූපස්ස ආදීනවො, තස්මා සත්තා රූපස්මිං නිබ්බින්දන්ති.

නො චෙදං භික්ඛවෙ, රූපස්ස නිස්සරණං අභවිස්ස, නයිදං සත්තා රූපස්මා නිස්සරෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ, අත්ථි රූපස්ස නිස්සරණං, තස්මා සත්තා රූපස්මා නිස්සරන්ති.

නො චෙදං භික්ඛවෙ, වෙදනාය අස්සාදො අභවිස්ස -පෙ- නො චෙදං භික්ඛවෙ, සඤ්ඤාය අස්සාදො අභවිස්ස -පෙ- නො චෙදං භික්ඛවෙ, සඞ්ඛාරානං අස්සාදො අභවිස්ස -පෙ- නො චෙදං භික්ඛවෙ, විඤ්ඤාණස්ස අස්සාදො අභවිස්ස, නයිදං සත්තා විඤ්ඤාණස්මිං සාරජ්ජෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ, අත්ථි විඤ්ඤාණස්ස අස්සාදො, තස්මා සත්තා විඤ්ඤාණස්මිං සාරජ්ජන්ති.

නො චෙදං භික්ඛවෙ, විඤ්ඤාණස්ස ආදීනවො අභවිස්ස, නයිදං සත්තා විඤ්ඤාණස්මිං නිබ්බින්දෙය්‍යුං. යස්මා ච ඛො භික්ඛවෙ, අත්ථි විඤ්ඤාණස්ස ආදීනවො, තස්මා සත්තා විඤ්ඤාණස්මිං නිබ්බින්දන්ති.

නො චෙදං භික්ඛවෙ, විඤ්ඤාණස්ස නිස්සරණං අභවිස්ස, නයිදං සත්තා විඤ්ඤාණස්මා නිස්සරෙය්‍යුං, යස්මා ච ඛො භික්ඛවෙ, අත්ථි විඤ්ඤාණස්ස නිස්සරණං, තස්මා සත්තා විඤ්ඤාණස්මා නිස්සරන්ති.

යාවකීවඤ්ච භික්ඛවෙ, සත්තා ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤංසු, නෙව තාව භික්ඛවෙ, සත්තා සදෙවකා ලොකා සමාරකා සබ්‍රහ්මකා සස්සමණබ්‍රාහ්මණියා පජා, සදෙවමනුස්සා නිස්සටා විසඤ්ඤුත්තා විප්පමුත්තා විමරියාදිකතෙන චෙතසා විහරිංසු.

යතො ච ඛො භික්ඛවෙ, සත්තා ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤංසු, අථ ඛො භික්ඛවෙ, සත්තා සදෙවකා ලොකා සමාරකා සබ්‍රහ්මකා සස්සමණබ්‍රාහ්මණියා පජා සදෙවමනුස්සා නිස්සටා විසඤ්ඤුත්තා විප්පමුත්තා විමරියාදිකතෙන චෙතසා විහරන්තීති.

## 1. 1. 3. 8.

## අභිනන්දනං සුත්තං

29. සාවත්ථියං-

යො භික්ඛවෙ, රූපං අභිනන්දති, දුක්ඛං සො අභිනන්දති, යො දුක්ඛං අභිනන්දති අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො වෙදනං අභිනන්දති -පෙ- යො සඤ්ඤං අභිනන්දති -පෙ- යො සඞ්ඛාරෙ අභිනන්දති -පෙ- යො විඤ්ඤාණං අභිනන්දති සො, දුක්ඛං අභිනන්දති, යො දුක්ඛං අභිනන්දති අපරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි.

මහණෙනි, රූපයාගේ ආදීනවයෙක් නො වී නම් සත්ත්වයෝ රූපයෙහි නො කල කිරෙති. මහණෙනි, යම්හෙයෙකින් රූපයාගේ ආදීනවයෙක් ඇත් ද, එහෙයින් සත්ත්වයෝ රූපයෙහි නිර්වෙද කෙරෙත්.

මහණෙනි, රූපයාගේ නිශ්ශරණයෙක් නො වී නම්, සත්ත්වයෝ රූපයෙන් නිශ්ශෘත නො වෙති. මහණෙනි, යම් හෙයෙකින් රූපයාගේ නිශ්ශරණ ඇත් ද, එහෙයින් සත්ත්වයෝ රූපය කෙරෙන් නිශ්ශරණ කෙරෙත්.

මහණෙනි, වේදනායෙහි ආස්වාදයෙක් නො වී නම් ... මහණෙනි, සංඥයෙහි ආස්වාදයෙක් නො වී නම් ... මහණෙනි, සංස්කාරයන්ගේ ආස්වාදයෙක් නො වී නම් ... මහණෙනි, විඥනයාගේ ආස්වාදයෙක් නො වී නම් සත්ත්වයෝ, විඥනයෙහි නො ඇලෙති. මහණෙනි, යම් හෙයෙකින් විඥනයාගේ ආස්වාදයෙක් ඇත් ද, එහෙයින් සත්ත්වයෝ විඥනයෙහි ඇලෙත්.

මහණෙනි, විඥනයාගේ ආදීනවයෙක් නො වී නම් සත්ත්වයෝ විඥනයෙහි නිර්වේද නො කෙරෙති. මහණෙනි, යම් හෙයෙකින් විඥනයාගේ ආදීනව ඇත් ද එහෙයින් සත්ත්වයෝ විඥනයෙහි කලකිරෙත්.

මහණෙනි, යම්හෙයෙකින් විඥනයාගේ නිශ්ශරණ නො වී නම සත්ත්වයෝ විඥනයා කෙරෙන් නිශ්ශරණ නො කෙරෙති. මහණෙනි, යම්හෙයෙකින් විඥනයාගේ නිශ්ශරණ ඇත් ද එහෙයින් සත්ත්වයෝ විඥනයා කෙරෙන් නික්මයෙත්.

මහණෙනි, යම්තාක්කල් සත්ත්වයෝ මේ පඤ්චොපාදනස්කන්ධයන්ගේ ආස්වාදය ආස්වාද විසිනිදු ආදීනවය ආදීනව විසිනුදු නිශ්ශරණය නිශ්ශරණ විසිනුදු ඇතිතතු අවබෝධ නො කළාහු ද, මහණෙනි, ඒතාක් මරුන් සහිත බඹුන් සහිත දෙවියන් සහිත ලෝවැසි සත්ත්වයෝ දෙව් මිනිසුන් සහිත මහණ බමුණන් සහිත සත්ත්වප්‍රජාව නිශ්ශෘත වූවාහු විසංයුක්ත වූවාහු විප්‍රමුත්ත වූවාහු සීමා කොට නොගත් සිතින් යුතුව වාස නො කළාහු ම ය.

මහණෙනි, යම්කලෙක පටන් සත්ත්වයෝ මේ පඤ්චෝපාදන ස්කන්ධයන්ගේ ආස්වාදය ආස්වාද විසිනුදු ආදීනවය ආදීනව විසිනුදු නිශ්ශරණය නිශ්ශරණ විසිනුදු ඇතිතතු දත්තාහු ද, මහණෙනි, එසඳ සත්ත්වයෝ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝවැස්සෙන් මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත සත්ත්ව ප්‍රජාව (මේ පස් කඳින්) නික්මුණාහුය, විසංයුක්ත වූහුය, වෙසෙසින් මිදුණාහුය, සීමා කොට නො ගත් සිතින් යුතුව වාස කෙරෙත් යි.

## 1. 1. 3. 8.

## අභිනන්දන සූත්‍රය

**29. සැවැත්නුවර :**

මහණෙනි, යමෙක් රූපය අභිනන්දනා කෙරෙයි (සතුටින් පිළිගනියි) ද හේ දුක් අභිනන්දනා කෙරෙයි. යමෙක් දුක් අභිනන්දනා කෙරෙයි ද හේ දුකින් නො මිදුණේ යයි කියමි. යමෙක් වේදනාව අභිනන්දනා කෙරෙයි ද ... යමෙක් සංඥව අභිනන්දනා කෙරෙයි ද ... යමෙක් සංස්කාර අභිනන්දනා කෙරෙයි ද ... යමෙක් විඥනය අභිනන්දනා කෙරෙයි ද හේ දුක් අභිනන්දනා කෙරෙයි. යමෙක් දුක් අභිනන්දනා කෙරෙයි ද හේ දුකින් නො මිදුණේ යයි කියමි.

යො ච ඛො භික්ඛවෙ, රූපං නාභිනන්දති, දුක්ඛං සො නාභිනන්දති, යො දුක්ඛං නාභිනන්දති පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි. යො වෙදනං නාභිනන්දති -පෙ- යො සඤ්ඤං නාභිනන්දති -පෙ- යො සඞ්ඛාරෙ නාභිනන්දති, -පෙ- යො විඤ්ඤාණං නාභිනන්දති දුක්ඛං සො නාභිනන්දති, යො දුක්ඛං නාභිනන්දති පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමීති.

## 1. 1. 3. 9.

## උප්පාද සුත්තං

**30. සාවත්ථියං-**

යො භික්ඛවෙ, රූපස්ස උප්පාදො ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො රොගානං ඨිති ජරාමරණස්ස පාතුභාවො. යො වෙදනාය උප්පාදො -පෙ- යො සඤ්ඤාය උප්පාදො -පෙ- යො සඞ්ඛාරානං උප්පාදො -පෙ- යො විඤ්ඤාණස්ස උප්පාදො ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො රොගානං ඨිති ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ, රූපස්ස නිරොධො වූපසමො අත්ථඞ්ගමො, දුක්ඛස්සෙසො නිරොධො රොගානං වූපසමො ජරාමරණස්ස අත්ථඞ්ගමො. යො වෙදනාය නිරොධො -පෙ- යො සඤ්ඤාය නිරොධො -පෙ- යො සඞ්ඛාරානං නිරොධො -පෙ- යො විඤ්ඤාණස්ස නිරොධො වූපසමො අත්ථඞ්ගමො, දුක්ඛස්සෙසො නිරොධො රොගානං වූපසමො ජරාමරණස්ස අත්ථඞ්ගමොති.

## 1. 1. 3. 10.

## අඝමූල සුත්තං

**31. සාවත්ථියං-**

අඝඤ්ච ඛො භික්ඛවෙ, දෙසිස්සාමි, අඝමූලඤ්ච. තං සුණාථ -පෙ-

කතමඤ්ච භික්ඛවෙ අඝං:

රූපං භික්ඛවෙ, අඝං, වෙදනා අඝං, සඤ්ඤා අඝං, සඞ්ඛාරා අඝං, විඤ්ඤාණං අඝං. ඉදං වුච්චති භික්ඛවෙ, අඝං.

කතමඤ්ච භික්ඛවෙ, අඝමූලං:

යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සෙය්‍යථිදං: කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා. ඉදං වුච්චති භික්ඛවෙ, අඝමූලන්ති.

---

1. අත්ථංගමො - සිමු. මජසං

මහණෙනි, යමෙකුත් රූපය අභිනන්දනා නො කෙරෙයි ද හේ දුක් අභිනන්දනා නො කෙරෙයි, යමෙක් දුක් අභිනන්දනා නො කෙරෙයි ද හේ දුකින් මිදුණේ යයි කියමි. යමෙක් වේදනාව අභිනන්දනා නො කෙරෙයි ද ... යමෙක් සංඥාව අභිනන්දනා නො කෙරෙයි ද ... යමෙක් සංස්කාර අභිනන්දනා නො කෙරෙයි ද ... යමෙක් විඥානය අභිනන්දනා නො කෙරෙයි ද හේ දුක් අභිනන්දනා නො කෙරෙයි, යමෙක් දුක් අභිනන්දනා නො කෙරෙයි ද හේ දුකින් මිදුණේ යයි කියමි යි.

## 1. 1. 3. 9.

## උප්පාද සූත්‍රය

**30. සැවැත්නුවර :**

මහණෙනි, රූපයාගේ යම් ඉපදීමෙක් ස්ථිතියක් අභිනිර්වෘතියක් පහළවීමෙක් ඇත් ද, තෙල දුඃඛයාගේ උත්පාද යයි, රෝගයන්ගේ ස්ථිතිය යි, ජරාමරණයාගේ පහළවීම යි. වේදනාවගේ යම් ඉපදීමෙක් ... සංඥාවගේ යම් ඉපදීමෙක් ... සංස්කාරයන්ගේ යම් ඉපදීමෙක් ... විඥානයාගේ යම් උත්පාදයෙක් ස්ථිතියක් අභිනිර්වෘතියක් ප්‍රාදුර්භාවයෙක් ඇත් ද, තෙල දුඃඛයාගේ උත්පාදය යි. රෝගයන්ගේ ස්ථිතිය යි ජරාමරණයන්ගේ පහළවීම යි.

මහණෙනි, රූපයාගේ යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් (සන්හිඳීමෙක්) අස්තයට යෑමෙක් ඇත් ද, තෙල දුඃඛයාගේ නිරෝධ යයි, ව්‍යුපශම යයි, අස්තඞ්ගම යයි. වේදනායෙහි යම් නිරෝධයෙක් ... සංඥායෙහි යම් නිරෝධයෙක් සංස්කාරයන්ගේ යම් නිරෝධයෙක් ... විඥානයාගේ යම් නිරෝධයෙක් සන්හිඳීමෙක් අස්තයට යෑමෙක් ඇත් ද, තෙල දුඃඛයාගේ නිරෝධ ය, සන්හිඳීම අස්තයට යෑම් වේ යයි.

## 1. 1. 3. 10.

## අඝමූල සූත්‍රය

**31. සැවැත්නුවර :**

මහණෙනි, තොපට දුඃඛය ද, දුඃඛ මූලය ද දේශනා කරමි. එය අසව :

මහණෙනි, දුඃඛය කවරෙ යත් :

මහණෙනි, රූපය දුක් යෑ, වේදනාව දුක් යෑ, සංඥාව දුක් යෑ, සංස්කාර දුක් යෑ, විඥානය දුක් යෑ, මහණෙනි, මේ දුකැයි කියනු ලැබෙ.

මහණෙනි, දුඃඛමූලය කවරෙ යත් :

පුනර්භවය, ඇතිකරන නන්දිරාගසහගත වූ ඒ ඒ භවයෙහි අභිනන්දනා කරන යම් තෘෂ්ණාවක් ඇත් ද, එ කවර යෑ : කාමතෘෂ්ණා යෑ, භවතෘෂ්ණා යෑ, විභවතෘෂ්ණා යි. මහණෙනි, මෙ දුඃඛමූල යයි කියනු ලැබෙ.

## 1. 1. 3. 11.

### පභඞ්ගු සුත්තං

32. සාවත්ථියං -

පභඞ්ගුඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි අප්පභඞ්ගුඤ්ච. තං සුණාථ.
-පෙ-

කිඤ්ච භික්ඛවෙ, පභඞ්ගු, කිං අප්පභඞ්ගු :

රූපං භික්ඛවෙ, පභඞ්ගු, යො තස්ස නිරොධො වූපසමො අත්ථඞ්ගමො. ඉදං අප්පභඞ්ගු. වෙදනා පභඞ්ගු, යො තස්සා නිරොධො වූපසමො අත්ථඞ්ගමො ඉදං අප්පභඞ්ගු. සඤ්ඤා පභඞ්ගු, යො තස්සා නිරොධො වූපසමො අත්ථඞ්ගමො, ඉදං අප්පභඞ්ගු, සඞ්ඛාරා පභඞ්ගු, යො තෙසං නිරොධො වූපසමො අත්ථඞ්ගමො ඉදං අප්පභඞ්ගු. විඤ්ඤාණං පභඞ්ගු, යො තස්ස නිරොධො වූපසමො අත්ථඞ්ගමො ඉදං අප්පභඞ්ගූති.

භාරවග්ගො තතියො.

තස්සුද්දානං :

භාරං පරිඤ්ඤං අභිජානං ඡන්දරාගෙන තයො ච අස්සාද
අභිනන්දනා ච උප්පාදෙ අඝමූලං පභඞ්ගු චාති.

Free Distribution www.aathaapi.org

## 1. 1. 3. 11.

## පභඞ්ගු සූත්‍රය

**32. සැවැත්නුවර :**

මහණෙනි, තොපට බිඳෙනසුලු දෑය ද දෙසමි, නො බිඳෙන සුලු දෑය ද දෙසමි. එය අසව.

මහණෙනි, කුමක් නම් බිඳෙනසුලු වේ ද, කුමක් නම් නො බිඳෙනසුලු වේ ද :

මහණෙනි, රූපය බිඳෙනසුලු වෙයි. ඒ රූපයාගේ යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් අස්තංගමයෙක් ඇත් ද, තෙල නො බිඳෙන සුලු වෙයි. වේදනාව බිඳෙන සුලු යැ, ඒ වෙදනාව පිළිබඳ යම් නිරොධයෙක් ව්‍යුපශමයෙක් අස්තංගමයෙක් ඇත් ද, තෙල නො බිඳෙනසුලු වෙයි. සංඥාව බිඳෙන සුලු වෙයි. ඒ සංඥාව පිළිබඳ යම් නිරොධයෙක් ව්‍යුපශමයෙක් **අස්තංගමයෙක්** ඇත් ද තෙල නො බිඳෙන සුලු වෙයි. සංස්කාර බිඳෙන සුලු වෙයි. ඒ සංස්කාර පිළිබඳ යම් නිරොධයෙක් ව්‍යුපශමයෙක් අස්තංගමයෙක් ඇත් ද, තෙල නො බිඳෙන සුලු වෙයි. විඥානය බිඳෙනසුලු වෙයි. ඒ විඥානය පිළිබඳ යම් නිරෝධයෙක් ව්‍යුපශයමකේ අස්තංගමයෙක් ඇත් ද තෙල නො බිඳෙනසුලු වේ.

තෙවැනි භාරවර්ග යි

**එහි උද්දානය :**

භාරසූත්‍රය, පරිඤ්ඤා සූත්‍රය, අභිජානසූත්‍රය, ඡන්දරාග සූත්‍රය හා අස්සාද සූත්‍ර තුනය, අභිනන්දන සූත්‍රය, උප්පාද සූත්‍රය, අඝමූලසූත්‍රය, පභංගු සූත්‍රය යන එකොළොස යි,

## 4. නතුම්හාක වග්ගො

### 1. 1. 4. 1.

### පඨම නතුම්හාක සුත්තං

**33. සාවත්ථියං -**

තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති, 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

යං භික්ඛවෙ, න තුම්හාකං තං පජහථ, තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති.

කිඤ්ච භික්ඛවෙ, න තුම්හාකං :

රූපං භික්ඛවෙ, න තුම්හාකං තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සතීති.

සෙය්‍යථාපි භික්ඛවෙ යං ඉමස්මිං ජෙතවනෙ තිණකට්ඨසාඛාපලාසං තං ජනො හරෙය්‍ය වා ඩහෙය්‍ය වා යථාපච්චයං වා කරෙය්‍ය, අපිනු තුම්හාකං එවමස්ස : "අම්හෙ ජනො හරති වා ඩහති වා යථාපච්චයං වා කරොතී"ති.

නො හෙතං භන්තෙ.

තං කිස්ස හෙතු?

න හි නො එතං භන්තෙ, අත්තා වා අත්තනියං වාති.

එවමෙව ඛො භික්ඛවෙ, රූපං න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති. වෙදනා න තුම්හාකං -පෙ- සඤ්ඤා න තුම්හාකං -පෙ- සඞ්ඛාරා න තුම්හාකං -පෙ- විඤ්ඤාණං න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං හිතාය සුඛාය භවිස්සතීති.

### 1. 1. 4. 2.

### දුතිය නතුම්හාක සුත්තං

**34. සාවත්ථියං -**

යං භික්ඛවෙ, න තුම්හාකං තං පජහථ, තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති.



Free Distribution www.aathaapi.org

# 4. නකුම්හාක වර්ගය

## 1. 1. 4. 1.

## පළමුවැනි නතුම්හාක සූත්‍රය

**33. සැවැත්නුවර :**

එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. ඒ මහණහු ද 'වහන්සැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන්වහන්සේ මෙල වදාළසේක :

මහණෙනි ,යමක් තොපගේ නො වේ නම් එය (ඡන්දරාගප්‍රහාණ විසින්) දුරුකරව. එය ප්‍රහීණ වූයේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ යැ.

මහණෙනි, කවරක් තොපගේ නො වේය යත් :

මහණෙනි, රූපය තොපගේ නො වෙයි, එය දුරුකරව. එය ප්‍රහීණ වූයේ හිත පිණිස සුව පිණිස වෙයි. වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය තොපගේ නො වෙයි, එය දුරුකරව. එය ප්‍රහීණ වූයේ තොපට හිත පිණිස සුව පිණිස වේ.

මහණෙනි, යම්සේ මේ දෙව්රමෙහි තණ – දව – අතු – කොළ ඇත් ද ජනයා එය රැගෙන යන්නේ හෝ දවන්නේ හෝ කැමැති පරිදි කරන්නේ හෝ වේද, (එකල්හි) මහණෙනි තොපට මේ සිත වන්නේ ද : ''ජනයා අප හැරගෙන යෙයි හෝ දවයි හෝ කැමැති පරිදි කෙරෙයි හෝ''යි ?

වහන්ස, මෙල නො වේ මැයි.

ඒ කවර හෙයිනැ ?.

වහන්ස, මෙල අපගේ ආත්ම හෝ ආත්ම පිළිබඳ හෝ නො ම වෙයි.

මහණෙනි, එපරිදි ම රූපය තොපගේ නො වෙයි, එය දුරු කරව. එය ප්‍රහීණ වූයේ තොපට හිත පිණිස සුව පිණිස වෙයි. වේදනාව තොපගේ නො වෙයි ... සංඥව තොපගේ නො වෙයි ... සංස්කාර තොපගේ නො වෙයි ... විඥනය තොපගේ නො වෙයි. එය දුරුකරව, එය ප්‍රහීණ වූයේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ යි.

## 1. 1. 4. 2.

## දෙවැනි නතුම්හාක සූත්‍රය

**34. සැවැත්නුවර :**

මහණෙනි, යමක් තොපගේ නො වේ නම් එය දුරලවූ. එය ප්‍රහීණ වූයේ තොපට හිත පිණිස සුව පිණිස වන්නේ ය.



Free Distribution www.aathaapi.org

කිඤ්ච භික්ඛවෙ, න තුම්හාකං :

රූපං භික්ඛවෙ, න තුම්හාකං තං පජහථ, තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති, වෙදනා න තුම්හාකං -පෙ- සඤ්ඤා න තුම්හාකං -පෙ- සඞ්ඛාරා න තුම්හාකං -පෙ- විඤ්ඤාණං න තුම්හාකං තං පජහථ තං වො පහීනං හිතාය සුඛාය භවිස්සති.

යං භික්ඛවෙ, න තුම්හාකං තං පජහථ, තං වො පහීනං හිතාය සුඛාය භවිස්සතීති.

## 1. 1. 4. 3.

## පඨම භික්ඛු සුත්තං

35 සාවත්ථියං-

අථ ඛො අඤ්ඤතරෙ භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච :

සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු, යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

යං ඛො භික්ඛු, අනුසෙති තෙන සඞ්ඛං ගච්ඡති, යං නානුසෙති න තෙන සඞ්ඛං ගච්ඡතීති.

අඤ්ඤාතං භගවා, අඤ්ඤාතං සුගතාති.

යථාකථං පන ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසීති?

රූපං චෙ භන්තෙ, අනුසෙති තෙන සඞ්ඛං ගච්ඡති, වෙදනං චෙ අනුසෙති තෙන සඞ්ඛං ගච්ඡති, සඤ්ඤං චෙ අනුසෙති තෙන සඞ්ඛං ගච්ඡති සඞ්ඛාරෙ චෙ අනුසෙති තෙන සඞ්ඛං ගච්ඡති, විඤ්ඤාණං චෙ අනුසෙති තෙන සඞ්ඛං ගච්ඡති.

රූපං චෙ භන්තෙ, නානුසෙති න තෙන සඞ්ඛං ගච්ඡති, වෙදනං චෙ නානුසෙති න තෙන සඞ්ඛං ගච්ඡති සඤ්ඤං චෙ නානුසෙති න තෙන සඞ්ඛං ගච්ඡති,සඞ්ඛාරෙ චෙ නානුසෙති න තෙන සඞ්ඛං ගච්ඡති, විඤ්ඤාණං චෙ නානුසෙති න තෙන සඞ්ඛං ගච්ඡති, ඉමස්ස ඛොහං භන්තෙ, භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමීති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසි, රූපං චෙ භික්ඛු, අනුසෙති තෙන සඞ්ඛං ගච්ඡති, වෙදනං චෙ -පෙ- සඤ්ඤං චෙ -පෙ- සඞ්ඛාරෙ චෙ -පෙ- විඤ්ඤාණං චෙ අනුසෙති තෙන සඞ්ඛං ගච්ඡති.

මහණෙනි, කුමක් තොපගේ නො වේය යත් :

මහණෙනි, රූපය තොපගේ නො වෙයි, එය දුරලවු, එය ප්‍රහීණ වූයේ තොපට හිත පිණිස සුව පිණිස වෙයි. වේදනාව තොපගේ නො වෙයි. ... සංඥාව තොපගේ නො වෙයි ... සංස්කාර තොපගේ නො වෙයි, ... විඥානය තොපගේ නො වෙයි, එය දුරුකරවු. එය ප්‍රහීණ වූයේ තොපට හිත පිණිස සුව පිණිස වෙයි.

මහණෙනි, යමක් තොපගේ නො වේ නම් එය දුරු කරවු. එය ප්‍රහීණ වූයේ හිත පිණිස සුව පිණිස වන්නේ යි.

## 1. 1. 4. 3.

## පළමුවැනි භික්ඛු සූත්‍රය

**35. සැවැත්නුවර :**

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන්වහන්සේ වැඩහුන් තැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත් පසෙක හුන්නේ යැ, එකත්පස් වැ හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේය :

වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ වෙතින් යම් ධර්මයක් අසා එකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ නො පමා වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවන් කරා මෙහෙය වූ සිත් ඇති වැ වාස කෙරෙම් නම් භාග්‍යවතුන් වහන්සේ මට එබඳු ධර්මයක් දේශනා කරන සේක්වයි.

මහණ යමක්, අනුශය කෙරේ ද, ඒ අනුශය ධර්මය කරණ කොට (පුද්ගල රක්තයැ, දුෂ්ට යැ, මූඪ යයි) සංඛ්‍යාවට යෙයි. යමක් අනුශය නො කෙරේ ද, ඒ කරණ කොට සංඛ්‍යාවට නො යෙයි.

භාග්‍යවතුන් වහන්ස, දන්නාලද යැ, සුගතයන්වහන්ස, දන්නාලදැයි.

මහණ, මා විසින් සැකෙවින් කියනලද ධර්මයාගේ අර්ථය තෙපි විස්තර විසින් කිසෙයින් දන්නහු ද ?

වහන්ස, ඉදින් රූපය අනුශය කෙරේ නම් ඒ අනුශය හේතු කොට ගෙන (පුහුල් රක්තාදි) ප්‍රඥප්තියට යෙයි, ඉදින් වේදනාව අනුශය කෙරේනම් එයින් ප්‍රඥප්තියට යෙයි, ඉදින් සංඥාව අනුශය කෙරේ නම් එයින් ප්‍රඥප්තියට යෙයි, ඉදින් සංස්කාර අනුශය කෙරේ නම් එයින් ප්‍රඥප්තියට යෙයි, ඉදින් විඥානය අනුශය කෙරේ නම් එයින් ප්‍රඥප්තියට යෙයි.

වහන්ස, ඉදින් රූපය අනුශය නො කෙරේ නම් එයින් ප්‍රඥප්තියට නො යෙයි, ඉදින් වේදනාව අනුශය නො කෙරේ නම ප්‍රඥප්තියට නො යෙයි, ඉදින් සංස්කාර අනුශය නො තෙරේ නම් ප්‍රඥප්තියට නො යෙයි, ඉදින් විඥානය අනුශය නො කෙරේ නම්, ප්‍රඥප්තියට නො යෙයි. වහන්ස, භාග්‍යවතුන්වහන්සේ විසින් සැකෙවින් දේශිත මේ ධර්මයාගේ අර්ථය මම විස්තර විසින් මෙසෙයින් දනිමියි.

මැනැවි මැනවි මහණ. මහණ, මා විසින් සැකෙවින් දේශිත ධර්මයාගේ අර්ථය තෙපි විස්තර විසින් දන්නහු, එ මැනැවි. මහණ, ඉදින් රූපය අනුශය කෙරේ නම් එයින් ප්‍රඥප්තියට යෙයි, ඉදින් වේදනාව ... ඉදින් සංඥාව ... ඉදින් සංස්කාර ... ඉදින් විඥානය අනුශය කෙරේ නම්. එයින් ප්‍රඥප්තියට නො යෙයි.

රූපං චෙ භික්ඛු, නානුසෙති න තෙන සඞ්ඛං ගච්ඡති, වෙදනං චෙ -පෙ- සඤ්ඤං චෙ -පෙ- සඞ්ඛාරෙ චෙ -පෙ- විඤ්ඤාණං චෙ නානුසෙති න තෙන සඞ්ඛං ගච්ඡති. ඉමස්ස ඛො භික්ඛු, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති.

අථ ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො සො භික්ඛු එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි, අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

## 1. 1. 4. 4.

### දුතිය භික්ඛු සුත්තං

36. සාවත්ථියං:

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

'සාධු මෙ භන්තෙ භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු, යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

යං ඛො භික්ඛු, අනුසෙති තං අනුමීයති, යං අනුමීයති තෙන සඞ්ඛං ගච්ඡති. යං නානුසෙති න තං අනුමීයති, යං නානුමීයති න තෙන සඞ්ඛං ගච්ඡතීති.

අඤ්ඤාතං භගවා, අඤ්ඤාතං සුගතාති.

යථා කථං පන ත්වං භික්ඛු මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසීති?

රූපං චෙ භන්තෙ අනුසෙති තං අනුමීයති, යං අනුමීයති තෙන සඞ්ඛං ගච්ඡති වෙදනං චෙ අනුසෙති -පෙ- සඤ්ඤං චෙ අනුසෙති -පෙ- සඞ්ඛාරෙ චෙ අනුසෙති -පෙ- විඤ්ඤාණං චෙ අනුසෙති තං අනුමීයති, යං අනුමීයති තෙන සඞ්ඛං ගච්ඡති.

මහණ, ඉදින් රූපය අනුශය නො කෙරේ නම් එයින් රක්තාදි ප්‍රඥප්තියට නො යෙයි, ඉදින් වේදනාව ... ඉදින් සංඥාව ... ඉදින් සංස්කාර ... ඉදින් විඥානය අනුශය නො කෙරේ නම් එයින් ප්‍රඥප්තියට නො යෙයි. මහණ, මා විසින් සැකෙවින් දේශිත මේ ධර්මයාගේ අර්ථය විස්තර විසින් මෙසේ දත යුත්තේ ය.

ඉක්බිති ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙන අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට ඉවත් වැගියේය. අනතුරු වැ ඒ මහණ, එකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ නො පමා වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවන් කරා යොමු කළ සිත් ඇති වැ වෙසෙනුයේ නොබෝ කලකින් මැ යමක් සඳහා කුලපුත්හු මැනැවින් මැ ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වෙත් ද, මහ බඹසර අවසන්හි වූ ඒ උත්තමාර්ථය (රහත් බව) මෙ අත්බවහි තෙමේ මැ දැන පසක් කොට එයට එළැඹැ වාස කෙළේය. " ජාතිය ක්ෂය වූවාය, මහ බඹසර වැස නිමවන ලද, සිවුමඟ කිස කරන ලද, මේ රහත් බව සඳහා අන් කිසෙක් නැතැ " යි (පස් විකුම් නැණින්) දන්නා ලදි. ඒ මහණ රහතුන් වහන්සේ අතුරෙ අන්‍යතරයෙක් වී.

## 1. 1. 4. 4.

## දෙවැනි භික්ඛු සූත්‍රය

36. සැවැත්නුවර :

ඉක්බිති එක්තරා මහණෙක් භාග්‍යවතුන්වහන්සේ වැඩහුන් තැනට එළඹියේ ය ... එකත් පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන්වහන්සේට මෙල සැල කෙළේය.

වහන්ස මම භාග්‍යවතුන්වහන්සේ වෙතින් යම් දහමක් අසා එකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ නො පමා වැ කෙලෙස් තවන වැර ඇති වැ වාස කෙරෙම් නම් මට එබඳු දහමක් දෙසනසේක්ව " යි.

මහණ යමක් අරමුණු කොට (කාමරාගාදිය) උපදී ද, ඒ (අනුසයිත වූ) රූපාදිය (නැසෙන) අනුසය සමඟ) නැසෙයි, යමක් (අනුසය සමඟ) නැසේ ද, ඒ (අනුසය) කරණ කොටගෙන (රක්ත යැ දුෂ්ට යැ මූඪ යැයි) ගිණීමට යෙයි. යමක් (අනුසය සමඟ) නූපදී ද, එය, (නැසෙන අනුසය සමඟ) නො නැසෙයි. යමක් (අනුසය සමඟ) නො නැසේ ද, ඒ අනුසය කරණ කොට ගෙන (රක්තාදි) සංඛ්‍යාවට නොයේ යයි.

භාග්‍යවතුන් වහන්ස, (මා විසින්) දන්නා ලද, සුගතයන් වහන්ස, දන්නා ලදැයි.

මහණ තෙපි මා විසින් සැකෙවින් (පැවැසූ) භාෂිතයාගේ අර්ථය විස්තර විසින් කිසෙයින් දැනගත්තවු යැයි.

වහන්ස, ඉදින් රූපය (අරමුණු කොට කාමරාගාදි අනුසය) පවතී ද ඒ (අනුසයිත රූපය නැසෙන අනුසය සමඟ) නැසෙයි. යම් රූපයක් (නැසෙන අනුසය සමඟ) නැසේ ද, ඒ අනුසය කරණ කොටගෙන (රක්ත යැ දුෂ්ට යැ මූඪ යැයි) සංඛ්‍යාවට යෙයි, ඉදින් වේදනාව (අරමුණු කොට අනුසය) උපදී ද, ... ඉදින් සංඥාව (අරමුණු කොට අනුසය) උපදී ද, ... ඉදින් සංස්කාරයන් (අරමුණු කොට අනුසය) උපදී ද, ඒ (අනුසයිත සංස්කාරය නැසෙන අනුසය සමඟ) නැසෙයි. යම් සංස්කාරයක් (නැසෙන අනුසය සමඟ) නැසේ ද, ඒ (අනුසය කරණ කොටගෙන (රක්ත යැ ආදි) සංඛ්‍යාවට යෙයි. ඉදින් විඥානය (අරමුණු කොට අනුසය) උපදී ද, ඒ (අනුසයිත විඥානය නැසෙන අනුසය සමඟ) නැසෙයි. යම් විඥානයක් (නැසෙන අනුසය සමඟ) නැසේ ද, ඒ (අනුසය) කරණ කොට ගෙන (රක්තයැ දුෂ්ට යැ මූඪ යැයි) ගිණීමට යේ.

රූපං චෙ භන්තෙ, නානුසෙති න තං අනුමීයති, යං නානුමීයති න තෙන සඞ්ඛං ගච්ඡති, වේදනං චෙ නානුසෙති -පෙ- සඤ්ඤං චෙ නානුසෙති -පෙ- සඞ්ඛාරෙ චෙ නානුසෙති -පෙ- විඤ්ඤාණං චෙ නානුසෙති න තං අනුමීයති, යං නානුමීයති න තෙන සඞ්ඛං ගච්ඡති. ඉමස්ස ඛො'හං භන්තෙ, භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමීති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසි: රූපඤ්චෙ භික්ඛු, අනුසෙති තං අනුමීයති, යං අනුමීයති තෙන සඞ්ඛං ගච්ඡති. වේදනඤ්චෙ -පෙ- සඤ්ඤඤ්චෙ -පෙ- සඞ්ඛාරෙ චෙ -පෙ- විඤ්ඤාණඤ්චෙ අනුසෙති, තං අනුමීයති. යං අනුමීයති, තෙන සඞ්ඛං ගච්ඡති.

රූපඤ්චෙ භික්ඛු, නානුසෙති, න තං අනුමීයති. යං නානුමීයති, න තෙන සඞ්ඛං ගච්ඡති, වේදනඤ්චෙ -පෙ- සඤ්ඤඤ්චෙ -පෙ- සඞ්ඛාරෙ චෙ -පෙ- විඤ්ඤාණඤ්චෙ නානුසෙති, න තං අනුමීයති. යං නානුමීයති, න තෙන සඞ්ඛං ගච්ඡති, ඉමස්ස ඛො භික්ඛු, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති.

අථ ඛො සො භික්ඛු, භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො සො භික්ඛු එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො -පෙ- අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

## 1. 1. 4. 5.

## පඨම ආනන්ද සුත්තං

87. සාවත්ථියං-

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

සචෙ තං ආනන්ද, එවං පුච්ඡෙය්‍යුං: කතමෙසං ආවුසො ආනන්ද, ධම්මානං උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායතී ති. එවං පුට්ඨො ත්වං ආනන්ද, කින්ති බ්‍යාකරෙය්‍යාසීති?

වහන්ස ඉදින් රූපය (අරමුණු කොට අනුසය) නූපදී ද ඒ (නානුසයිත රූපය නැසෙන අනුසය සමග නො නැසෙයි, යම් රූපයක් (නැසෙන අනුසය සමග) නො නැසේ ද, ඒ, (අනුසය) කරණ කොට ගෙන (රක්ත යැ දුෂ්ට යැ මූඪ යැයි) සංඛ්‍යාවට නො යෙයි. ඉදින් වේදනාව අරමුණු කොට (අනුසය) නූපදී ද ඒ (නො අනුසයිත වේදනාව නැසෙන අනුසය සමග) නො නැසෙයි'' යම් වේදනාවක් නැසෙන අනුසය සමග නො නැසේ ද ඒ) අනුසය කරණකොට ගෙන (රක්තයැ යනාදි) සංඛ්‍යාවට නො යෙයි. ඉදින් සංඥව ... ඉදින් සංස්කාරයන් (අරමුණු කොට අනුසය) නූපදීද ඒ (නානුසයිත සංස්කාරය නැසෙන අනුසය සමග) නො නැසෙයි, යම් සංස්කාරයක් අනුසය සමග නො නැසේ ද ඒ කරණ කොට ගෙන, (රක්ත යැ යනාදීන්) ගිණීමට නොයෙයි. ඉදින් විඥනය (අරමුණු කොට අනුසය) නූපදී ද, ඒ (විඥනය නැසෙන අනුසය සමග) නො නැසෙයි. යම් විඥනයක් (අනුසය සමග නො නැසේ ද, ඒ) අනුසය කරණ කොට ගෙන (රක්තයැ, දුෂ්ටය, මූඪ යැයි) ගිණීමට නොයේ. වහන්ස මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් ංවදළ මේ භාෂිතයාගේ මෙසේ විස්තර විසින් අර්ථය දැන ගනිමි යි.

මහණ මැනවැ මැනවැ, මහණ මනා මැ ය තෙපි මා විසින් සැකෙවින් පවසන ලද භාෂිතයාගේ විස්තරයෙන් අර්ථය දන්නවුය. මහණ ඉදින් රූපය (අරමුණු කොට අනුසය) උපදී ද ඒ (අනුසයිත රූපය අනුසය සමග) නැසෙයි. යම් රූපයක් (අනුසය සමග) නැසේ ද ඒ කරණ කොට ගෙන (රක්තයැ දුෂ්ටයැ මූඪයැ යි) ගිණීමට යෙයි. ඉදින් වේදනාව ... ඉදින් සංඥව ... ඉදින් සංස්කාරයන් ... ඉදින් විඥනය (අරමුණු කොට අනුසය) පවතී ද ඒ (අනුසයිත විඥනය අනුසය සමග) නැසෙයි, යම් විඥනයක් (අනුසය සමග) නැසේ ද ඒ අනුසය කරණ කොට ගෙන (රක්තයැ යනාදීන්) ගිණීමට යෙයි.

මහණ, ඉදින් රූපය (අරමුණු කොට අනුසය) නූපදී ද ඒ (විඥනය අනුසය සමග) නො නැසෙයි, යම් රූපයක් (අනුසය සමග) නො නැසේ ද ඒ (අනුසයිත රූපය) අනුසය සමග නො නැසෙයි, යම් රූපයක් (අනුසය සමග) නො නැසේ ද, ඒ කරණ කොට ගෙන, (රක්තයැ යනාදීන්) ගිණීමටනොයෙයිඉදින් වේදනාව ... ඉදින් සංඥව ... ඉදින් සංස්කාර යන් ... ඉදින් විඥනය (අනුසය සමග) නූපදී ද ඒ (අනනුසයිත විඥනය අනුසය සමග) නො නැසෙයි, යම් විඥනයක් (අනුසය සමග) නො නැසේ ද ඒ විඥනය කරණ කොට ගෙන (රක්තයැ, දුෂ්ටයැ, මූඪ යැයි) සංඛ්‍යාවට නොයේ. මහණ, මා විසින් සැකෙවින් පවසන ලද මේ භාෂිතයාගේ මෙසේ විස්තර විසින් අර්ථය ගතයුත්තේ යි.

ඉක්බිති ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය අභිනන්දන කොට අනුමෝදන්ව හුනස්නෙන් නැගී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියේය. ඉක්බිති ඒ මහණ එකලා වූයේ කාය විවේක ඇතියේ නො පමාවූයේ කෙලෙස් තවන වැර ඇතියේ නිවනට මෙහෙයූ සිත් ඇතිව වාස කරනුයේ ... තවද ඒ මහණ රහතුන් අතුරෙන් අන්‍යතර යෙක් වූයේ යි.

## 1. 1. 4. 5.

## පළමුවැනි ආනන්ද සූත්‍රය

37. සැවැත්නුවර :

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැනට එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හුන්නේය. එකත්පස් වැ හුන් ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙල වදළ සේක :

ඉදින් ආනන්ද, තොප මෙසේ පුළුවුස්නාහු නම් '' ඇවැත්නි ආනන්දයෙනි, කවර ධර්ම කෙනකුන්ගේ උත්පාදය පැණේ ද, ව්‍යය පැණේ ද, සිටියහුගේ අන්‍යථාත්වය (ජරාව) පැණේ ද '' යි. ආනන්ද, මෙසේ පුළුවුස්නා ලද තෙපි කිමැ යි ප්‍රකාශ කරන්නාහු ද ?

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං: කතමෙසං ආවුසො ආනන්ද, ධම්මානං උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායතීති එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යං: රූපස්ස ඛො ආවුසො, උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති, වෙදනාය උප්පාදො -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති, ඉමෙසං ඛො ආවුසො, ධම්මානං උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායතීති, එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යන්ති.

සාධු සාධු ආනන්ද, රූපස්ස ඛො ආනන්ද, උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. වෙදනාය -පෙ- සඤ්ඤාය-පෙ-සඞ්ඛාරානං-පෙ- විඤ්ඤාණස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති, ඉමෙසං ඛො ආනන්ද, ධම්මානං උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායතීති. එවං පුට්ඨො ත්වං ආනන්ද, එවං බ්‍යාකරෙය්‍යාසීති.

## 1. 1. 4. 6.

## දුතිය ආනන්ද සුත්තං

38. සාවත්ථියං:

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. -පෙ- එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ආනන්දං භගවා එතදවොච:

සචෙ තං ආනන්ද, එවං පුච්ඡෙය්‍යුං: "කතමෙසං ආවුසො ආනන්ද, ධම්මානං උප්පාදො පඤ්ඤායිත්ථ, වයො පඤ්ඤායිත්ථ, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිත්ථ, කතමෙසං ධම්මානං උප්පාදො පඤ්ඤායිස්සති, වයො පඤ්ඤායිස්සති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිස්සති, කතමෙසං ධම්මානං උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. එවං පුට්ඨො ත්වං ආනන්ද, කින්ති බ්‍යාකරෙය්‍යාසීති?

සචෙ මං භන්තෙ, එවං පුච්ඡෙය්‍යුං: කතමෙසං ආවුසො ආනන්ද, ධම්මානං උප්පාදො පඤ්ඤායිත්ථ, වයො පඤ්ඤායිත්ථ, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිත්ථ, කතමෙසං ධම්මානං උප්පාදො පඤ්ඤායිස්සති, වයො පඤ්ඤායිස්සති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිස්සති, කතමෙසං ආවුසො ආනන්ද, ධම්මානං උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායතීති එවං පුට්ඨොහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යං: යං ඛො ආවුසො, රූපං අතීතං නිරුද්ධං විපරිණතං, තස්ස උප්පාදො පඤ්ඤායිත්ථ, වයො පඤ්ඤායිත්ථ, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිත්ථ, යා වෙදනා අතීතා නිරුද්ධා විපරිණතා, තස්සා උප්පාදො පඤ්ඤායිත්ථ, වයො පඤ්ඤායිත්ථ, ඨිතාය අඤ්ඤථත්තං පඤ්ඤායිත්ථ, යා සඤ්ඤා-පෙ-යෙ සඞ්ඛාරා අතීතා නිරුද්ධා විපරිණතා, තෙසං උප්පාදො පඤ්ඤායිත්ථ, වයො පඤ්ඤායිත්ථ, ඨිතානං අඤ්ඤථත්තං පඤ්ඤායිත්ථ, යං විඤ්ඤාණං අතීතං නිරුද්ධං විපරිණතං, තස්ස උප්පාදො පඤ්ඤායිත්ථ, වයො පඤ්ඤායිත්ථ, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිත්ථ, ඉමෙසං ඛො ආවුසො, ධම්මානං උප්පාදො පඤ්ඤාසිත්ථ, වයො පඤ්ඤාසිත්ථ, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤාසිත්ථ.

වහන්ස, ඉදින් මා මෙසේ පුළුවුස්නාහු නම් "ආනන්ද කවර ධර්ම කෙනකුන්ගේ ඉපැත්ම පැනේ ද, විනාශය පැනේ ද, සිටියහුගේ වෙනස (ජරාව) පැනේ දැ" යි. වහන්ස, මෙසේ පුළුවුස්නා ලද මම මෙ පරිදි ප්‍රකාශ කරන්නෙමි : ඇවැත්නි, රූපයාගේ උත්පාදය පැනෙ යි, ව්‍යය පැනෙයි, සිටියහුගේ අන්‍යථාත්වය පැනෙයි, වේදනාවගේ උත්පාදය ... සංඥවගේ ... සංස්කාරයන්ගේ ... විඥනයාගේ උත්පාදය පැනෙයි, ව්‍යය පැනෙයි, සිටියහුගේ අන්‍යථාත්වය පැනේ. ඇවැත්නි, මේ ධර්මයන්ගේ උත්පාදය පැනෙයි, ව්‍යය පැනෙයි සිටියහුගේ අන්‍යථාත්වය පැනෙයි. වහන්ස, මෙසේ පුළුවුස්නා ලද මම මෙලෙසින් ප්‍රකාශ කරන් නෙමි යි.

මැනවි, මැනවි, ආනන්ද. ආනන්ද, රූපයාගේ ඉපැත්ම පැනෙයි, විනාශය පැනෙයි, සිටියහුගේ වෙනස්වීම් සඞ්ඛ්‍යාත ජරාව පැනෙයි. වෙදනාවෙ ... සංඥවෙ ... සංස්කාර යන්ගේ ... විඥනයාගේ උත්පාදය පැනෙයි, ව්‍යය පැනෙයි, සිටියහුගේ අන්‍යථාත්වය පැනේ. ආනන්ද, මේ ධර්මයන්ගේ උත්පාදය පැනෙයි, ව්‍යය පැනෙයි, සිටියහුගේ අන්‍යථාත්වය පැනේ. ආනන්ද, මෙසේ පුළුවුස්නා ලද තෙපි මෙලෙසින් ප්‍රකාශ කරන්නහුයි.

## 1. 1. 4. 6.

## දෙවැනි ආනන්ද සූත්‍රය

**38. සැවැත්නුවර :**

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැනට එළඹියහ. ... එකත්පසෙකැ හුන් ආයුෂ්මත් ආනන්ද තෙරුන්හට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක :

ඉදින් ආනන්ද, තොප මෙසේ පුළුවුස්නාහු නම් : "ඇවැත්නි, කවර ධර්මකෙන කුන්ගේ උත්පාදය පැනුණේ ද, ව්‍යය පැනුණේ ද, සිටියහුගේ අන්‍යථාත්වය පැනුණේ ද, කවර ධර්ම කෙනකුන්ගේ උත්පාදය පැනෙන්නේ ද, ව්‍යය පැනෙන්නේ ද, සිටියහුගේ අන්‍යථාත්වය පැනෙන්නේ ද, කවර ධර්මකෙනකුන්ගේ උත්පාදය පැනේ ද, ව්‍යය පැනේ ද, සිටියහුගේ අන්‍යථාත්වය පැනේ දැ" යි. ආනන්ද, මෙසේ පුළුවුස්නා ලද තෙපි කිමැයි ප්‍රකාශකරන්නහු දැ යි ?

වහන්ස, ඉදින් මා මෙසේ විචාරන්නාහු නම් : "ඇවැත්නි, කවර ධර්මකෙනකුන්ගේ උත්පත්තිය පැනුණේ ද, විනාශය පැනුණේ ද, සිටියහුගේ වෙනස පැනුණේ ද, කවර ධර්මකෙනකුන් ගේ උත්පත්තිය පැනෙන්නේ ද, විනාශය පැනෙන්නේ ද සිටියහුගේ වෙනස පැනෙන්නේ ද, කවර ධර්ම කෙනකුන්ගේ උත්පත්තිය පැනේ ද, විනාශය පැනේ ද, සිටියහුගේ වෙනස පැනේ" දැ යි. වහන්ස,මෙසේ විචාරනලදමමමෙලෙසින් ප්‍රකාශ කරන්නෙමි : "ඇවැත්නි, අතීත වූ නිරුද්ධ වූ විපරිණත වූ යම් රූපයෙක් ඇත් ද, ඒ රූපයාගේ උත්පාදය පැනුණේ යැ, ව්‍යය පැනුණේ යැ, සිටියහුගේ අන්‍යථාත්වය පැනුණේ යැ. අතීත වූ නිරුද්ධ වූ විපරිණත වූ යම් වේදනාවක් ඇද්ද, ඒ වේදනාවගේ උත්පාදය පැනුණේ යැ, ව්‍යය පැනුණේ යැ, සිටි වේදනාවගේ අන්‍යථාත්වය පැනුණේ යැ. යම් සංඥවක් ... අතීත වූ නිරුද්ධ වූ විපරිණත වූ යම් සංස්කාර කෙනෙක් ඇද්ද, ඒ සංස්කාරයන්ගේ උත්පාදය පැනුණේ යැ, ව්‍යය පැනුණේ යැ, සිටියවුන්ගේ අන්‍යථාත්වය පැනුණේ යැ. අතීත වූ නිරුද්ධ වූ විපරිණත වූ යම් විඥනයෙක් ඇද්ද, ඒ විඥනයාගේ උත්පාදය පැනුණේ යැ, ව්‍යය පැනුණේ යැ, සිටියහුගේ අන්‍යථාත්වය පැනුණේ යැ.

Free Distribution www.aathaapi.org

යං ඛො ආවුසො, රූපං අජාතං අපාතුභූතං තස්ස උප්පාදො පඤ්ඤායිස්සති, වයො පඤ්ඤායිස්සති ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිස්සති. යා වෙදනා -පෙ- යා සඤ්ඤා -පෙ- යෙ සඞ්ඛාරා -පෙ- යං විඤ්ඤාණං අජාතං අපාතුභූතං, තස්ස උප්පාදො පඤ්ඤායිස්සති, වයො පඤ්ඤායිස්සති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිස්සති, ඉමෙසං ඛො ආවුසො ධම්මානං උප්පාදො පඤ්ඤායිස්සති වයො පඤ්ඤායිස්සති ඨිතානං අඤ්ඤථත්තං පඤ්ඤායිස්සති.

යං ඛො ආවුසො, රූපං ජාතං පාතුභූතං, තස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. යා වෙදනා -පෙ- යා සඤ්ඤා -පෙ- යෙ සඞ්ඛාරා -පෙ- යං විඤ්ඤාණං ජාතං පාතුභූතං, තස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති. ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායතීති. එවං පුට්ඨාහං භන්තෙ, එවං බ්‍යාකරෙය්‍යන්ති.

සාධු සාධු ආනන්ද, රූපං අතීතං නිරුද්ධං විපරිණතං, තස්ස උප්පාදො පඤ්ඤායිත්ථ, වයො පඤ්ඤායිත්ථ, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිත්ථ, යා වෙදනා -පෙ- යා සඤ්ඤා -පෙ- යෙ සඞ්ඛාරා -පෙ- යං විඤ්ඤාණං අතීතං නිරුද්ධං විපරිණතං, තස්ස උප්පාදො පඤ්ඤායිත්ථ, වයො පඤ්ඤායිත්ථ, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිත්ථ, ඉමෙසං ඛො ආනන්ද, ධම්මානං උප්පාදො පඤ්ඤායිත්ථ, වයො පඤ්ඤායිත්ථ, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිත්ථ.

යං ඛො ආනන්ද, රූපං අජාතං අපාතුභූතං, තස්ස උප්පාදො පඤ්ඤායිස්සති, වයො පඤ්ඤායිස්සති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිස්සති, යා වෙදනා -පෙ- යා සඤ්ඤා -පෙ- යෙ සඞ්ඛාරා -පෙ- යං විඤ්ඤාණං අජාතං අපාතුභූතං, තස්ස උප්පාදො පඤ්ඤායිස්සති, වයො පඤ්ඤායිස්සති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිස්සති. ඉමෙසං ඛො ආනන්ද, ධම්මානං උප්පාදො පඤ්ඤායිස්සති, වයො පඤ්ඤායිස්සති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායිස්සති.

යං ඛො ආනන්ද, රූපං ජාතං පාතුභූතං, තස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. යා වෙදනා -පෙ- යා සඤ්ඤා -පෙ- යෙ සඞ්ඛාරා -පෙ- යං විඤ්ඤාණං ජාතං පාතුභූතං, තස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. ඉමෙසං ඛො ආනන්ද, ධම්මානං උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතානං අඤ්ඤථත්තං පඤ්ඤායතීති. එවං පුට්ඨො ත්වං ආනන්ද, එවං බ්‍යාකරෙය්‍යාසීති.

## 1. 1. 4. 7.

## පඨම අනුධම්ම සුත්තං

89. සාවත්ථියං:

ධම්මානුධම්මපටිපන්නස්ස භික්ඛවෙ, භික්ඛුනො අයමනුධම්මො හොති.

යං රූපෙ නිබ්බිදාබහුලො විහරෙය්‍ය, වෙදනාය නිබ්බිදාබහුලො විහරෙය්‍ය, සඤ්ඤාය නිබ්බිදාබහුලො විහරෙය්‍ය, සඞ්ඛාරෙසු නිබ්බිදාබහුලො විහරෙය්‍ය, විඤ්ඤාණෙ නිබ්බිදාබහුලො විහරෙය්‍ය,

ඇවැත්නි, නූපන් නො පහළ වූ යම් රූපයෙක් ඇත් ද, ඒ රූපයාගේ උත්පාදය පැනෙන්නේ යැ, ව්‍යය පැනෙන්නේ යැ, සිටියහුගේ අන්‍යථාත්වය පැනෙන්නේ යැ. යම් වේදනාවක් ... යම් සංඥවක් ... යම් සංස්කාර කෙනෙක් ... නූපන් නො පහළ වූ යම් විඥනයෙක් ඇත් ද, ඒ විඥනයාගේ උත්පාදය පැනෙන්නේ යැ, ව්‍යය පැනෙන්නේ යැ, සිටියහුගේ අන්‍යථාත්වය පැනෙන්නේ යැ.

ඇවැත්නි, උපන් පහළ වූ යම් රූපයෙක් ඇත් ද, ඒ රූපයාගේ උත්පාදය පැනෙයි, ව්‍යය පැනෙයි, සිටියහුගේ අන්‍යථාත්වය පැනෙයි, යම් වේදනාවක් ... යම් සංඥවක් ... යම් සංස්කාර කෙනෙක් ... උපන් පහළ වූ යම් විඥනයෙක් ඇත් ද, ඒ විඥනයාගේ උත්පාදය පැනෙයි ව්‍යය පැනෙයි සිටියහුගේ අන්‍යථාත්වය පැනේ යයි. " වහන්ස මෙසේ පුළුවුස්නා ලද මම මෙසේ විසඳා කියන්නෙමි යි.

මැනවි මැනැවි ආනන්ද, අතීත වූ නිරුද්ධ වූ විපරිණත වූ රූපයෙක් ඇත් ද, ඒ රූපයාගේ ඉපදීම පැනුණේ ය, විනාශය පැනුණේ ය, සිටියහුගේ වෙනස පැනුණේ ය. යම් වේදනාවක් ... යම් සංඥවක් ... යම් සංස්කාර කෙනෙක් ... අතීත වූ නිරුද්ධ වූ විපරිණත වූ යම් විඥනයෙක් ඇත් ද, ඒ විඥනයාගේ ඉපදීම පැනුණේ ය, විනාශය පැනුණේය, සිටියහු ගේ වෙනස පෙනුණේ යි. ආනන්ද, මේ ධර්මයන්ගේ ඉපදීම පැනුණේ ය, විනාශය පැනුණේ ය, සිටියහුගේ වෙනස පෙනුණේ යි.

ආනන්ද, නූපන් නො පහළ වූ යම් රූපයෙක් ඇත් ද, ඒ රූපයාගේ ඉපදීම පැනෙන්නේ යැ, විනාශය පැනෙන්නේ යැ, සිටියහුගේ වෙනස පැනෙන්නේ යැ යම් වේදනාවක් ... යම් සංඥවක් ... යම් සංස්කාර කෙනෙක් ... නූපන් නො පහළ වූ යම් විඥනයක් ඇත් ද, ඒ විඥනයාගේ ඉපදීම පැනෙන්නේ යැ, විනාශය පැනෙන්නේ යැ, සිටියහුගේ වෙනස පෙනෙන්නේ යැ. ආනන්ද, මේ ධර්මයන්ගේ ඉපදීම පැනෙන්නේ යැ, විනාශය, පැනෙන්නේ යැ, සිටියහුගේ වෙනස පැනෙන්නේ යි.

ආනන්ද, උපන් පහළ වූ යම් රූපයෙක් ඇත් ද, ඒ රූපයාගේ උත්පාදය පැනෙයි, ව්‍යය පැනෙයි, සිටියහුගේ අන්‍යථාත්වය පැනෙයි, යම් වේදනාවක් ... යම් සංඥවක් ... යම් සංස්කාර කෙනෙක් ... උපන් පහළ වූ යම් විඥනයෙක් ඇත් ද, ඒ විඥනයාගේ උත්පාදය පැනෙයි, ව්‍යය පැනෙයි, සිටියහුගේ අන්‍යථාත්වය පැනෙයි. ආනන්ද, මේ ධර්මයන්ගේ උත්පාදය පැනෙයි, ව්‍යය පැනෙයි, සිටියහුගේ අන්‍යථාත්වය පැනෙයි. ආනන්දය මෙසේ පුළුවුස්නා ලද තෙපි මෙසේ විසඳා ප්‍රකාශකරන්නාහු යි.

## 1. 1. 4. 7.

## පළමුවැනි අනුධම්ම සූත්‍රය

**39. සැවැත්නුවර :**

මහණෙනි, ධර්මානුධර්මප්‍රතිපන්න (නවලෝකෝත්තරධර්මයනට අනුලොම් වූ පූර්වභාගප්‍රතිපදවට පිළිපන්) මහණහට මේ අනුලෝමධර්ම වෙයි.

යම් හෙයෙකින් රූපයෙහි නිර්වෙද (උකටලී) බහුල වැ වාස කෙරේ ද, වේදනායෙහි නිර්වෙද බහුල වැ වාස කෙරේ ද, සංඥයෙහි නිර්වෙද බහුල වැ වාස කෙරේ ද, සංස්කාර යන්හි නිර්වෙද බහුල වැ වසි කෙරේ ද, විඥනයෙහි නිර්වෙද බහුල වැ වාස කෙරේ ද,

සො රූපෙ නිබ්බිදබහුලො විහරන්තො වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ නිබ්බිදබහුලො විහරන්තො රූපං පරිජානාති, වෙදනං පරිජානාති, සඤ්ඤං පරිජානාති, සඞ්ඛාරෙ පරිජානාති, විඤ්ඤාණං පරිජානාති. සො රූපං පරිජානං වෙදනං පරිජානං සඤ්ඤං පරිජානං සඞ්ඛාරෙ පරිජානං විඤ්ඤාණං පරිජානං, පරිමුච්චති රූපම්හා, පරිමුච්චති වෙදනාය, පරිමුච්චති සඤ්ඤාය, පරිමුච්චති සඞ්ඛාරෙහි, පරිමුච්චති විඤ්ඤාණම්හා, පරිමුච්චති ජාතියා ජරමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චති දුක්ඛස්මාති වදාමී'ති.

## 1. 1. 4. 8.

## දුතිය අනුධම්ම සුත්තං

**40. සාවත්ථියං :**

ධම්මානුධම්මපටිපන්නස්ස භික්ඛවෙ, භික්ඛුනො අයමනුධම්මො හොති :

යං රූපෙ අනිච්චානුපස්සී විහරෙය්‍ය, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ අනිච්චානුපස්සී විහරෙය්‍ය, සො රූපෙ අනිච්චානුපස්සී විහරන්තො වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ අනිච්චානුපස්සී විහරන්තො රූපං පරිජානාති, වෙදනං-පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං පරිජානාති. සො රූපං පරිජානං වෙදනං-පෙ-සඤ්ඤං-ප-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං පරිජානං පරිමුච්චති රූපම්හා, පරිමුච්චති වෙදනාය, පරිමුච්චති සඤ්ඤාය, පරිමුච්චති සඞ්ඛාරෙහි. පරිමුච්චති විඤ්ඤාණම්හා, පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, පරිමුච්චති දුක්ඛස්මාති වදාමීති.

## 1. 1. 4. 9.

## තතිය අනුධම්ම සුත්තං

**41. සාවත්ථියං :**

ධම්මානුධම්මපටිපන්නස්ස භික්ඛවෙ, භික්ඛුනො අයමනුධම්මො හොති :

යං රූපෙ දුක්ඛානුපස්සී විහරෙය්‍ය, වෙදනාය-පෙ-සඤ්ඤාය-පෙ-සඞ්ඛාරෙසු-පෙ-විඤ්ඤාණෙ දුක්ඛානුපස්සී විහරෙය්‍ය, සො රූපෙ දුක්ඛානුපස්සී විහරන්තො වෙදනාය-පෙ-සඤ්ඤාය-පෙ-සඞ්ඛාරෙසු-පෙ-විඤ්ඤාණෙ දුක්ඛානුපස්සී විහරන්තො රූපං පරිජානාති වෙදනං-පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-ප-විඤ්ඤාණං පරිජානාති. සො රූපං පරිජානං වෙදනං-ප-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං පරිජානං, පරිමුච්චති රූපම්හා, පරිමුච්චති වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙහි -පෙ- පරිමුච්චති විඤ්ඤාණම්හා, පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, පරිමුච්චති දුක්ඛස්මාති වදාමීති.

හෙ රූපයෙහි නිර්වෙද බහුල වැ වාස කරනුයේ වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... විඥනයෙහි නිර්වෙද බහුල වැ වාස කරනුයේ රූපය (ත්‍රිවිධ පරිඥයෙන්) පිරිසිඳ දනියි, වේදනාව පිරිසිඳ දනියි, සංඥව පිරිසිඳ දනියි, සංස්කාර පිරිසිඳ දනියි, විඥනය පිරිසිඳ දනියි. හෙ රූපය පිරිසිඳ දන්නේ වේදනාව පිරිසිඳ දන්නේ සංඥව පිරිසිඳ දන්නේ සංස්කාර පිරිසිඳ දන්නේ විඥනය පිරිසිඳ දන්නේ රූපයෙන් (ප්‍රහාණපරිඥ විසින්) මිදෙයි, වේදනායෙන් මිදෙයි, සංඥයෙන් මිදෙයි, සංස්කාරයන්ගෙන් මිදෙයි, විඥනයෙන් මිදෙයි. ජාතියෙන් ජරාවෙන් හා මරණයෙන් ශෝකයෙන් වැලපීමෙන් (කායික) දුකින් (මානසික) දෙම්නසින් දැඩි ආයාසයෙන් මිදෙයි. වෘත්තදුඃඛයෙන් මිදේ යයි කියමි යි.

## 1. 1. 4. 8.

## දෙවැනි අනුධම්ම සූත්‍රය

**40.** සැවැත්නුවර :

මහණෙනි, ධර්මානුධර්මප්‍රතිපන්න මහණහට මෙ අනුලෝමධර්ම වෙයි :

යම් හෙයෙකින් රූපයෙහි අනිත්‍යානුදර්ශී වැ (අනිත්‍යය නුවණින්, දකිමින්) වාස කෙරේ ද, වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... විඥනයෙහි අනිත්‍යානුදර්ශී වැ වාස කෙරේ ද, හේ රූපයෙහි අනිත්‍යානුදර්ශී වැ වාස කරනුයේ වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... විඥනයෙහි අනිත්‍යානුදර්ශී වැ වාස කරනුයේ රූපය පිරිසිඳ දනියි. වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය පිරිසිඳ දනියි. හේ රූපය පිරිසිඳ දන්නේ වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය පිරිසිඳ දන්නේ රූපයෙන් මිදෙයි, වේදනායෙන් මිදෙයි, සංඥයෙන් මිදෙයි, සංස්කාරයන්ගෙන් මිදෙයි, විඥනයෙන් මිදෙයි. ජාතියෙන් - ජරාමරණයෙන් - ශෝකයෙන් - පරිදේවයෙන් - දුකින් - දෙම්නසින් - උපායාසයෙන් මිදෙයි. පස්කඳ දුකින් මිදේ යයි කියමි යි.

## 1. 1. 4. 9.

## තෙවැනි අනුධම්ම සූත්‍රය

**41.** සැවැත්නුවර :

මහණෙනි, ධර්මානුධර්මප්‍රතිපන්න මහණහට මේ අනුලෝම ධර්ම වෙයි :

යම් හෙයෙකින් රූපයෙහි දුඃඛානුදර්ශී වැ වෙසේ ද, වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... විඥනයෙහි දුඃඛානුදර්ශී වැ වෙසේ ද, හේ රූපයෙහි දුඃඛානුදර්ශී වැ වාස කරනුයේ වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... විඥනයෙහි දුඃඛානුදර්ශී වැ වාස කරනුයේ රූපය පිරිසිඳ දනියි, වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය පිරිසිඳ දනියි. හේ රූපය පිරිසිඳ දන්නේ වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය පිරිසිඳ දන්නේ රූපයෙන් මිදෙයි, වේදනායෙන් ... සංඥයෙන් ... සංස්කාරයන්ගෙන් ... විඥනයෙන් මිදෙයි. ජාතියෙන් - ජරා මරණයෙන් - ශෝකයෙන් - පරිදේවයෙන් - දුකින් - දෙම්නසින් - උපායාසයෙන් මිදෙයි. පස්කඳ දුකින් මිදේ යයි කියමි යි.

## 1. 1. 4. 10.

## චතුත්ථ අනුධම්ම සුත්තං

42. සාවත්ථියං :

ධම්මානුධම්මපටිපන්නස්ස භික්ඛවෙ, භික්ඛුනො අයමනුධම්මො හොති :

යං රූපෙ අනත්තානුපස්සී විහරෙය්‍ය, වෙදනාය-පෙ-සඤ්ඤාය-පෙ-සඞ්ඛාරෙසු-පෙ-විඤ්ඤාණෙ අනත්තානුපස්සී විහරෙය්‍ය, සො රූපෙ අනත්තානුපස්සී විහරන්තො වෙදනාය-පෙ-සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ-විඤ්ඤාණෙ අනත්තානුපස්සී විහරන්තො, රූපං පරිජානාති, වෙදනං -පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං පරිජානාති. සො රූපං පරිජානං වෙදනං-පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං පරිජානං පරිමුච්චති රූපම්හා, වෙදනාය-පෙ-සඤ්ඤාය-පෙ-සඞ්ඛාරෙහි-පෙ-පරිමුච්චති විඤ්ඤාණම්හා. පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

නතුම්හාකවග්ගො චතුත්ථො.

තස්සුද්දානං :

න තුම්හාකෙන ද්වෙ වුත්තා භික්ඛූහි අපරෙ දුවෙ
ආනන්දෙන දුවෙ වුත්තා අනුධම්මෙහි ද්වෙ දුකාති.

## 1. 1. 4. 10.

## සිව්වැනි අනුධම්ම සූත්‍රය

45. සැවැත්නුවර :

මහණෙනි, ධර්මානුධර්මප්‍රතිපන්න මහණහට මෙ අනුලෝම ධර්ම වෙයි :

යම් හෙයෙකින් රූපයෙහි අනාත්මානුදර්ශී වැ වෙසේ ද වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... විඥනයෙහි අනාත්මානුදර්ශී වැ වෙසේ ද, හේ රූපයෙහි අනාත්මානු දර්ශී වැ වාස කරනුයේ වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... විඥනයෙහි අනාත්මානුදර්ශී වැ වාස කරනුයේ රූපය පිරිසිඳ දනියි, වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය පිරිසිඳ දනියි. හේ රූපය පිරිසිඳ දන්නේ වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය පිරිසිඳ දන්නේ රූපයෙන් මිදෙයි, වේදනායෙන් ... සංඥයෙන් ... සංස්කාරයන්ගෙන් ... විඥනයෙන් මිදෙයි. ජාතියෙන් - ජරාවෙන් හා මරණයෙන් - ශෝකයෙන් - වැලපීමෙන් - දුකින් - දොම්නසින් - උපායාසයෙන් (දුඃඛයෙහෙයින්) මිදෙයි. පස්කඳ දුකින් මිදේ යයි කියම් යි.

**සතරවැනි නතුම්හාක වර්ග යි.**

**එහි උද්දනය :**

නතුම්හාක නමින් සූත්‍ර දෙකක් දේශිත යැ, භික්ඛු නමින් අන්‍ය සූත්‍ර දෙකක් ද, ආනන්ද නමින් සූත්‍ර දෙකක් ද දේශිත යැ, අනුධම්ම නමින් ද්වික දෙකක් (සතරක්) දේශිත යි. (මෙසේ නතුම්හාක වර්ගයෙහි සූත්‍ර දශයෙකි).

## 5. අත්තදීපවග්ගො

### 1. 1. 5. 1.

### අත්තදීප සුත්තං

**43. සාවත්ථියං :**

අත්තදීපා භික්ඛවෙ, විහරථ අත්තසරණා අනඤ්ඤසරණා. ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා.

අත්තදීපානං භික්ඛවෙ, විහරතං අත්තසරණානං අනඤ්ඤසරණානං ධම්මදීපානං ධම්මසරණානං අනඤ්ඤසරණානං, යොනියෙව උපපරික්ඛිතබ්බා[1], "කිංජාතිකා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා, කිංපහොතිකා"ති.

කිංජාතිකා ච භික්ඛවෙ, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා : කිංපහොතිකා :

ඉධ භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. තස්ස තං රූපං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස රූපවිපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං. තස්ස සා වෙදනා විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස වෙදනාවිපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, සඞ්ඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සඞ්ඛාරෙ, සඞ්ඛාරෙසු වා අත්තානං. තස්ස තෙ සඞ්ඛාරා විපරිණමන්ති, අඤ්ඤථා හොන්ති. තස්ස සඞ්ඛාරවිපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. තස්ස තං විඤ්ඤාණං විපරිණමති, අඤ්ඤථා හොති. තස්ස විඤ්ඤාණවිපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා.

---

1. උපපරික්ඛිතබ්බො - සීමු.



Free Distribution www.aathaapi.org

# 5. අත්තදීප වර්ගය

## 1. 1. 5. 1.

## අත්තදීප සූත්‍රය

**43. සැවැත්නුවර :**

මහණෙනි, තමා පිහිට කොට තමා සරණ කොට වාස කරවු. මෙරමා පිහිට කොට වාස නො කරවු. (ලොවී ලොවුතුරා) දහම් පිහිට කොට දහම් සරණ කොට වාස කරවු, මෙරමා පිහිට කොට වාස නො කරවු.

මහණෙනි, තමා පිහිට කොට තමා සරණ කොට, මෙරමා පිහිට නො කොට ධර්මය පිහිට කොට, ධර්මය සරණ කොට මෙරමා සරණ නො කොට වසන තොප විසින් සෝක-පරිදේව-දුක්ඛ-දොමනස්ස-උපායාසයෝ කුමක් ජාති කොට ඇත් ද, කුමක් ප්‍රභව කොට ඇත් දැ '' යි කාරණය ම විමසිය යුතු ය.

මහණෙනි, සෝකපරිදේව-දුක්ඛ-දොමනස්ස-උපායාසයෝ කුමක් ජාති කොට ඇත් ද, කුමක් ප්‍රභව කොට ඇත් ද යත් :

මහණෙනි, මේ ලෝකයෙහි ආර්යයන් නො දක්නා ආර්යධර්මයෙහි අදක්ෂ ආර්ය ධර්මයෙහි නො හික්මුණු, සත්පුරුෂයන් නො දක්නා සත්පුරුෂධර්මයෙහි අදක්ෂ සත් පුරුෂ ධර්මයෙහි නො හික්මුණු අශ්‍රැතවත් පෘථග්ජන රූපය ආත්ම විසින් දකියි, ආත්මය රූප ඇත්තක් කොට හෝ දකියි, ආත්මයෙහි රූපය ඇතැයි හෝ දකියි, රූපයෙහි ආත්මය ඇතැයි හෝ දකී. ඔහුගේ ඒ රූපය විපරිණාමයට යෙයි, අන්පරිදි හෝ වෙයි. රූපයාගේ විපරිණාම-අන්‍යථාභාව හේතුයෙන් ඔහුට සෝක-පරිදේව-දුක්ඛ-දොමනස්ස-උපායාසයෝ උපදිති.

වෙදනාව ආත්ම වශයෙන් දකියි, ආත්මය වෙදනා ඇත්තෙකැයි හෝ දකියි, ආත්මයෙහි වෙදනාව ඇතැයි හෝ දකියි, වෙදනායෙහි ආත්මය ඇතැයි හෝ දකී. ඔහුගේ ඒ වෙදනාව විපරිණාමයට යෙයි, අන් අයුරු වෙයි. ඔහට වෙදනාවගේ විපරිණාම-අන්‍යථාභාව හෙතුයෙන් සොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස-උපායාසයෝ උපදිති. සංඥාව ... සංස්කාර ආත්ම වශයෙන් දකියි, සංස්කාරවත් ආත්මය හෝ දකියි, ආත්මයෙහි සංස්කාර ඇතැයි හෝ දකියි, සංස්කාරයන්හි ආත්මය ඇතැයි හෝ දකී. ඔහුගේ ඒ සංස්කාර විපරිණාමයට යෙයි, අන්පරිදි වෙයි. සංස්කාරයන්ගේ විපරිණාම - අන්‍යථාභාව හෙතුයෙන් ඔහට සොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස-උපායාසයෝ උපදිති.

විඥානය ආත්ම විසින් දකියි. විඥානවත් ආත්මය හෝ දකියි, ආත්මයෙහි විඥානය ඇතැයි හෝ දකියි, විඥානයෙහි ආත්මය ඇතැයි හෝ දකී. ඔහුගේ ඒ විඥානය විපරි ණාමයට යෙයි. අන්පරිදි වෙයි. විඥානයාගේ විපරිණාම - අන්‍යථාභාව හෙතුයෙන් ඔහට සොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස-උපායාසයෝ උපදිත්.

රූපස්ස ත්වෙව භික්ඛවෙ, අනිච්චතං විදිත්වා විපරිණාමවිරාගනිරොධං පුබ්බෙ චෙව රූපං එතරහි ච සබ්බං රූපං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මන්ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යෙ සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා තෙ පහීයන්ති, තෙසං පහානා න පරිතස්සති, අපරිතස්සං සුඛං විහරති. සුඛං විහරං භික්ඛු 'තදඞ්ගනිබ්බුතො'ති වුච්චති.

වෙදනාය ත්වෙව භික්ඛවෙ, අනිච්චතං විදිත්වා විපරිණාමවිරාගනිරොධං පුබ්බෙ චෙව වෙදනා එතරහි ච සබ්බා වෙදනා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යෙ සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා තෙ පහීයන්ති. තෙසං පහානා න පරිතස්සති, අපරිතස්සං සුඛං විහරති. සුඛං විහරං භික්ඛු 'තදඞ්ගනිබ්බුතො'ති වුච්චති.

සඤ්ඤාය ත්වෙව භික්ඛවෙ, -පෙ- සඞ්ඛාරානං ත්වෙව භික්ඛවෙ, අනිච්චතං විදිත්වා විපරිණාමවිරාගනිරොධං පුබ්බෙ චෙව සඞ්ඛාරා එතරහි ච සබ්බෙ සඞ්ඛාරා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යෙ සොකපරිදෙවදුක්ඛදොමනස්සු-පායාසා තෙ පහීයන්ති, තෙසං පහානා න පරිතස්සති, අපරිතස්සං සුඛං විහරති, සුඛං විහරං භික්ඛු 'තදඞ්ගනිබ්බුතො'ති වුච්චති.

විඤ්ඤාණස්ස ත්වෙව භික්ඛවෙ, අනිච්චතං විදිත්වා විපරිණාම-විරාගනිරොධං පුබ්බෙ චෙව විඤ්ඤාණං එතරහි ච සබ්බං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මන්ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යෙ සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා තෙ පහීයන්ති. තෙසං පහානා න පරිතස්සති, අපරිතස්සං සුඛං විහරති, සුඛං විහරං භික්ඛු "තදඞ්ගනිබ්බුතො"ති වුච්චතීති.

## 1. 1. 5. 2.

## පටිපද සුත්තං

**44.** සාවත්ථියං:

සක්කායසමුදයගාමිනිඤ්ච වො භික්ඛවෙ, පටිපදං දෙසිස්සාමි, සක්කායනිරොධගාමිනිඤ්ච පටිපදං, තං සුණාථ -පෙ-

කතමා ච භික්ඛවෙ, සක්කායසමුදයගාමිනී පටිපදා:

ඉධ භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරිය-ධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං, වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං,

තවද මහණෙනි, රූපයාගේ ම අනිත්‍යතා දැන විපරිණාම විරාග නිරෝධය දැන අතීත යෙහි වූ රූපය හා වර්තමානයෙහි වූ රූපය දැයි හැම රූ අනිත්‍යය, දුඃඛය, පෙරළෙන සැහැවි ඇතියි තෙල මෙසේ ඇතිසැටිය සම්‍යක් ප්‍රඥයෙන් දක්නාහට යම් ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාස කෙනෙක් ඇත් ද ඔහු ප්‍රහීණ වෙත්. ඔවුන්ගේ ප්‍රහාණ හේතු යෙන් ත්‍රස්ත නො වේ, ත්‍රස්ත නො වනුයේ සුවසේ විහරණ කෙරෙයි සුවසේ විහරණ කරන මහණ (විදර්ශනාඞ්ගයෙන් ශෝක නිවුණු හෙයින්) '' තදඞ්ග වශයෙන් නිවුණෙකි '' යි කියනු ලැබේ.

තවද මහණෙනි, වේදනාව පිළිබඳ අනිත්‍යතා දැන විපරිණාම විරාග නිරෝධය දැන පෙර වූ ද වේදනා හා වර්තමානයෙහි වූ ද සියලු වේදනාවෝ අනිත්‍යයහ, දුඃඛයහ, පෙරළෙන සැහැවි ඇතියහ යි මෙසේ තෙල ඇතිසැටිය සම්‍යක් ප්‍රඥයෙන් දක්නාහට යම් ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාස කෙනෙක් ඇත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔවුන්ගේ ප්‍රහාණ හේතුයෙන් ත්‍රස්ත නො වෙයි, ත්‍රස්ත නො වනුයේ සැපසේ විහරණ කෙරෙයි, සැපසේ විහරණ කරන මහණ '' තදඞ්ග වශයෙන්, නිවුණෙකි '' යි කියනු ලැබේ.

තවද මහණෙනි, සංඥව පිළිබඳ වූ ම ... මහණෙනි, සංස්කාරයන් පිළිබඳ වූ ම අනිත්‍ය තාව දැන විපරිණාම විරාගනිරෝධය දැන අතීතයෙහි වූ සංස්කාර හා වර්තමානයෙහි වූ සියලු සංස්කාරයෝ අනිත්‍යයහ, දුඃඛයහ, පෙරළෙන සැහැවි ඇතියහයි මෙසේ තෙල ඇති සැටිය සම්‍යක් ප්‍රඥයෙන් දක්නාහට යම් ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාස කෙනෙක් ඇත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔවුන්ගේ ප්‍රහාණ හේතුයෙන් ත්‍රස්ත නො වෙයි, ත්‍රස්ත නො වනුයේ සැපසේ විහරණ කෙරෙයි, සැපසේ විහරණ කරන මහණ '' තදඞ්ග වශයෙන් නිවුණෙකි'' යි කියනු ලැබේ.

තවද මහණෙනි, විඥනය පිළිබඳ වූ ම අනිත්‍යතා දැන විපරිණාම විරාග නිරෝධය දැන අතීතයෙහි වූ ම විඥනය හා වර්තමානයෙහි ද සියලු විඥනය අනිත්‍ය ය දුඃඛ ය පෙර ළෙන සැහැවි ඇතියෙකියි මෙසේ තෙල ඇතිසැටිය සම්‍යක්ප්‍රඥයෙන් දක්නහුට යම් ශෝක-පරිදේව-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාස කෙනෙක් ඇත් ද, ඔහු ප්‍රහීණ වෙත්. ඔවුන්ගේ ප්‍රහාණ හේතුයෙන් ත්‍රස්ත නො වෙයි, ත්‍රස්ත නො වනුයේ සැපසේ විහරණ කෙරෙයි, සැපසේ විහරණ කරන මහණ '' තදඞ්ග වශයෙන් නිවුණෙකි '' යි කියනු ලැබේ.

## 1. 1. 5. 2.

## පටිපද සූත්‍රය

**44. සැවැත්නුවර :**

මහණෙනි, තොපට සත්කාය සමුදය ගාමිනී වූ ද ප්‍රතිපත් දෙසමි, සත්කාය නිරොධ ගාමිනී වූ ද ප්‍රතිපත් දෙසමි. එ අසව.

මහණෙනි, සත්කාය සමුදය ගාමිනී ප්‍රතිපත් කවර :

මහණෙනි, මෙලොව බුද්ධාදි ආර්යයන් නො දක්නා සුලු, ආර්යධර්මය පිළිබඳ අදක්ෂ, ආර්යධර්මයෙහි අවිනීත, බුද්ධාදි සත්පුරුෂයන් නො දක්නාසුලු, සත්පුරුෂධර්මය පිළිබඳ අදක්ෂ, සත්පුරුෂධර්මයෙහි අවිනීත, අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ රූපය ආත්ම වශයෙන් දකියි, ආත්මය රූපවත් කොට හෝ දකියි, ආත්මයෙහි ලා හෝ රූපය දකියි, රූපයෙහි ලා හෝ ආත්මය දකියි. වේදනාව ආත්ම වශයෙන් දකියි, ආත්මය වේදනාවත් කොට හෝ දකියි, ආත්මයෙහි ලා හෝ වේදනාව දකියි, වේදනායෙහි ලා හෝ ආත්මය දකී.

සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති විඤ්ඤාණවන්තං වා අත්තානං අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං, අයං වුච්චති භික්ඛවෙ, සක්කායසමුදයගාමිනීපටිපදාති. ඉතිහිදං භික්ඛවෙ, වුච්චති දුක්ඛසමුදයගාමිනී සමනුපස්සනාති. අයමෙවෙත්ථ අත්ථො.

කතමා ච භික්ඛවෙ, සක්කායනිරොධගාමිනී පටිපදා :

ඉධ භික්ඛවෙ, සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී, සප්පුරිසධම්මස්ස කොවිදො, සප්පුරිසධම්මෙ සුවිනීතො, න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං. න වෙදනං අත්තතො සමනුපස්සති -පෙ- න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං. අයං වුච්චති භික්ඛවෙ, සක්කායනිරොධගාමිනීපටිපදා, සක්කායනිරොධගාමිනී පටිපදාති ඉතිහිදං භික්ඛවෙ, වුච්චති දුක්ඛනිරොධගාමිනී සමනුපස්සනාති. අයමෙවෙත්ථ අත්ථොති.

## 1. 1. 5. 3.

## පඨම අනිච්චතා සුත්තං

**45.** සාවත්ථියං :

රූපං භික්ඛවෙ අනිච්චං යදනිච්චං තං දුක්ඛං යං දුක්ඛං තදනත්තා යදනත්තා තං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො චිත්තං විරජ්ජති, විමුච්චති අනුපාදාය ආසවෙහි. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා, යදනත්තා තං "නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො චිත්තං විරජ්ජති, විමුච්චති අනුපාදාය ආසවෙහි.

රූපධාතුයා චෙ භික්ඛවෙ භික්ඛුනො චිත්තං විරත්තං විමුත්තං හොති අනුපාදාය ආසවෙහි, වෙදනාධාතුයා -පෙ- සඤ්ඤාධාතුයා -පෙ- සඞ්ඛාරධාතුයා -පෙ- විඤ්ඤාණධාතුයා චෙ භික්ඛවෙ භික්ඛුනො චිත්තං විරත්තං විමුත්තං හොති අනුපාදාය ආසවෙහි, විමුත්තත්තා ඨිතං, ඨිතත්තා සන්තුසිතං, සන්තුසිතත්තා න පරිතස්සති, අපරිතස්සං පච්චත්තං යෙව පරිනිබ්බායති, "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා"ති පජානාතීති.

සංඥව ... සංස්කාර ... විඥනය ආත්ම වශයෙන් දකියි, ආත්මය විඥනවත් කොට හෝ දකියි, විඥනය ආත්මයෙහි ලා හෝ දකියි, ආත්මය විඥනයෙහි ලා හෝ දකියි. මහණෙනි, මේ සත්කායසමුදයගාමිනීප්‍රතිපද ය යි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මෙය දුඃඛසමුදයගාමිනිසමනුදර්ශනා ය යි කියනු ලැබේ. මෙය ම මෙහි අර්ථ යි.

මහණෙනි, සත්කාය නිරෝධගාමිනී ප්‍රතිපත් කවර :

මහණෙනි, මෙලොව බුද්ධාදි ආර්‍ය්‍යයන් දක්නා සුලු, ආර්‍ය්‍යධර්මය පිළිබඳ දක්ෂ, ආර්‍ය්‍ය ධර්මයෙහි මොනොවට හික්මුණු, බුද්ධාදි සත්පුරුෂයන් දක්නා සුලු, සත්පුරුෂ ධර්මය පිළිබඳ දක්ෂ, සත්පුරුෂ ධර්මයෙහි මොනොවට හික්මුණු, ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපය ආත්ම වශයෙන් නො දකියි, ආත්මය රූපවත් කොට හෝ නො දකියි, ආත්මයෙහි හෝ රූපය නො දකියි, රූපයෙහි හෝ ආත්මය නො දකියි. වේදනාව ආත්ම වශයෙන් නො දකියි, ... සංඥව ආත්ම වශයෙන් නො දකියි, ... සංස්කාර ආත්ම වශයෙන් නො දකියි ... විඥනය ආත්ම වශයෙන් නො දකියි, ආත්මය විඥනවත් කොට හෝ නො දකියි, විඥනය ආත්මයෙහි ලා හෝ නො දකියි, ආත්මය විඥනයෙහි ලා හෝ නො දකී. මහණෙනි, මෙ සත්කායනිරොධගාමිනීප්‍රතිපත් යයි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මෙය දුඃඛනිරොධගාමිනී සමනුදර්ශනා යයි කියනු ලැබේ. මෙය ම මෙහි අර්ථ යි.

## 1. 1. 5. 3.

## පළමුවැනි අනිච්චතා සූත්‍රය

**45. සැවැත්නුවර :**

මහණෙනි, රූපය අනිත්‍ය යි, යමක් අනිත්‍ය වේ ද එය දුක් වෙයි. යමක් දුක් වේ ද, එය අනාත්ම වෙයි. යමක් අනාත්ම වේ ද, එය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි. තෙල මාගේ ආත්ම නො වේ''යි මෙසේ තෙල ඇතිසැටිය සම්‍යක් ප්‍රඥයෙන් දතයුතු ය. මෙසේ තෙල ඇති සැටිය සම්‍යක් ප්‍රඥයෙන් දක්නහුගේ සිත (මාර්ගක්ෂණයෙහි දී) නො ඇලෙයි, (ඵලක්ෂණයෙහි දී) උපාදන වශයෙන් නො ගෙන ආස්‍රවයන් කෙරෙන් මිදෙයි. වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය අනිත්‍ය යි. යමක් අනිත්‍ය වේ ද එය දුක් වෙයි. යමක් දුක් වේ ද එය අනාත්ම වෙයි. යමක් අනාත්ම වේ ද එය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ''යි මෙසේ තෙල ඇතිසැටිය සම්‍යක්ප්‍රඥයෙන් දතයුතු ය. මෙසේ තෙල ඇතිසැටිය සම්‍යක් ප්‍රඥයෙන් දක්නහුගේ සිත නො ඇලෙයි උපාදන වශයෙන් නො ගෙන ආස්‍රවයන් ගෙන් මිදෙයි.

මහණෙනි, ඉදින් මහණහුගේ සිත රූපධාතුයෙහි නො ඇලුණේ උපාදන වශයෙන් නො ගෙන ආස්‍රවයන් කෙරෙන් මිදුණේ වේද. වේදනා ධාතුයෙහි ... සංඥධාතුයෙහි ... සංස්කාර ධාතුයෙහි ... මහණෙනි, ඉදින් මහණහුගේ සිත විඥනධාතුයෙහි නො ඇලුණේ වේ ද, උපාදන වශයෙන් නො ගෙන ආස්‍රවයන් ගෙන් මිදුණේ වෙයි. විමුක්ත බැවින් මතුයෙහි (කළයුතු, කිස නැති හෙයින්) ස්ථිත වෙයි, ස්ථිත බැවින් (ලැබියයුතු දැ ලැබීමෙන්) සන්තුෂ්ට වෙයි, සන්තුෂ්ට බැවින් ත්‍රස්ත නො වෙයි, ත්‍රස්ත නො වනුයේ තමා කෙරෙහි ම (තමා විසින් ම) පිරිනිවෙයි. ''ජාතිය, ක්ෂීණ විය. බඹසර වැස නිමැවිණ, කරණී කරන ලද, මේ අර්හත්වය පිණිස අන් කිසෙක් නැති''යි, දැන ගනී යි.

## 1. 1. 5. 4.

### දුතිය අනිච්චතා සුත්තං

**46. සාවත්ථියං:**

රූපං භික්ඛවෙ අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තදනත්තා යදනත්තා තං "නෙතං මම නෙසො 'හමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං, වෙදනා අනිච්චා -ප- සඤ්ඤා අනිච්චා -පෙ- සඞ්ඛාරා අනිච්චා -පෙ- විඤ්ඤාණං අනිච්චං යදනිච්චං තං දුක්ඛං යං දුක්ඛං තදනත්තා යදනත්තා තං "නෙතං මම නෙසො 'හමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො පුබ්බන්තානුදිට්ඨියො න හොන්ති, පුබ්බන්තානුදිට්ඨීනං අසති අපරන්තානුදිට්ඨියො න හොන්ති, අපරන්තානුදිට්ඨීනං අසති ථාමසො පරාමාසො න හොති, ථාමසෝ පරාමාසෙ අසති රූපස්මිං වෙදනාය සඤ්ඤාය සඞ්ඛාරෙසු විඤ්ඤාණස්මිං චිත්තං විරජ්ජති, විමුච්චති අනුපාදාය ආසවෙහි, විමුත්තත්තා ඨිතං, ඨිතත්තා සන්තුසිතං, සන්තුසිතත්තා න පරිතස්සති, අපරිතස්සං පච්චත්තංයෙව පරිනිබ්බායති. "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා"ති පජානාතීති.

## 1. 1. 5. 5.

### සමනුපස්සනා සුත්තං

**47. සාවත්ථියං:**

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා අනෙකවිහිතං අත්තානං සමනුපස්සමානා සමනුපස්සන්ති, සබ්බෙ තෙ පඤ්චුපාදානක්ඛන්ධෙ සමනුපස්සන්ති, එතෙසං වා අඤ්ඤතරං.

කතමෙ පඤ්ච:

ඉධ භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං, වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං අත්තනි වා, විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං.

Free Distribution www.aathaapi.org

## 1. 1. 5. 4.

## දෙවැනි අනිච්චතා සූත්‍රය

**46. සැවැත්නුවර :**

මහණෙනි, රූපය අනිත්‍ය යි, යමක් අනිත්‍ය වේ ද එය දුක් වෙයි, යමක් දුක් වේ ද එය අනාත්ම වෙයි, යමක් අනාත්ම වේ ද එය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ''යි මෙසේ තෙල ඇති සැටිය සම්‍යක් ප්‍රඥයෙන් දතයුතු. වේදනාව අනිත්‍ය යැ ... සංඥව අනිත්‍ය යැ ... සංස්කාර අනිත්‍ය යැ ... විඥනය අනිත්‍ය ය, යමක් අනිත්‍ය වේ ද එය දුක් වෙයි, යමක් දුක් වේ ද එය අනාත්ම වෙයි, යමක් අනාත්ම වේ ද එය ''තෙල මාගේ නො වෙයි, තෙල මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ''යි මෙසේ තෙල ඇත්තිසැටිය සම්‍යක්ප්‍රඥයෙන් දතයුතු. මෙසේ තෙල ඇති සැටිය සම්‍යක්ප්‍රඥයෙන් දක්නාහට පූර්වාන්තය අනුවගිය (අටළොස්) දෘෂ්ටීහු නො වෙත්. පූර්වාන්තානුදෘෂ්ටි නැති කල්හි අපරාන්තය, අනුව ගිය (සුසාළිස්) දෘෂ්ටීහු නො වෙත්. අපරාන්තානුදෘෂ්ටි නැති කල්හි දෘෂ්ටිශක්ති විසින් (දෘෂ්ටි) පරාමර්ශයෙක් නො වෙයි, දෘෂ්ටිශක්ති විසින් පරාමර්ශයක් නැති කල්හි රූපයෙහි වේදනායෙහි සංඥයෙහි සංස්කාර යන්හි විඥනයෙහි සිත නො ඇලෙයි, උපාදන වශයෙන් නො ගෙන ආස්‍රවයන්ගෙන් සිත මිදෙයි, මිදුණු හෙයින් ස්ථිත වෙයි, ස්ථිත හෙයින් සන්තුෂ්ට වෙයි, සන්තුෂ්ට හෙයින් ත්‍රස්ත නො වෙයි, ත්‍රස්ත නො වනුයේ තෙමේ ම පිරිනිවෙයි. ''ජාතිය ගෙවිණ, බඹසර වැස නිමැවිණ, කරණී කරන ලද, මේ රහත් බව පිණිස අන්කිසෙක් නැති''යි දැනගනී යි.

## 1. 1. 5. 5.

## සමනුපස්සනා සූත්‍රය

**47. සැවැත්නුවර :**

මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් වෙත්වයි බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි දෘෂ්ටි වශයෙන් දක්නාහු අනෙක්ප්‍රකාර ආත්මය දකිත්. ඒ සියල්ලෝ පඤ්චෝපාදන ස්කන්ධ යන් දෘෂ්ටිවශයෙන් දකිති. ඒ පඤ්චෝපාදනස්කන්ධ අතුරෙන් අන්‍යතරයක් හෝ දකිත්.

කවර පසෙක යත් :

මහණෙනි, මෙලොව, බුද්ධාදි ආර්‍ය්‍යයන් නොදක්නා ආර්‍ය්‍යධර්ම පිළිබඳ අදක්ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත වූ, බුද්ධාදි සත්පුරුෂයන් නො දක්නා සත්පුරුෂධර්ම පිළිබඳ අදක්ෂ වූ සත්පුරුෂ ධර්මයෙහි අවිනීත වූ, අශ්‍රුතවත් පෘථග්ජන තෙමේ රූපය ආත්ම විසින් දකියි. ආත්මය රූපවත් කොට හෝ දකියි, ආත්මයෙහි ලා හෝ රූපය දකියි, රූපයෙහි ලා හෝ ආත්මය දකියි. වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය ආත්ම විසින් දකියි, ආත්මය විඥනවත් කොට හෝ දකියි, ආත්මයෙහි ලා හෝ විඥනය දකියි, විඥනයෙහි ලා හෝ ආත්මය දකියි.

ඉති අයඤ්චෙව සමනුපස්සනා අස්මීති චස්ස අවිගතං හොති. අස්මීති ඛො පන භික්ඛවෙ අවිගතෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං අවක්කන්ති හොති: චක්ඛුන්ද්‍රියස්ස සොතින්ද්‍රියස්ස ඝානින්ද්‍රියස්ස ජිව්හින්ද්‍රියස්ස කායින්ද්‍රියස්ස. අත්ථි භික්ඛවෙ මනො, අත්ථි ධම්මා, අත්ථි අවිජ්ජාධාතු අවිජ්ජාසම්ඵස්සජෙන භික්ඛවෙ, වෙදයිතෙන ඵුට්ඨස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස අස්මීතිපි'ස්ස හොති, අයමහමස්මීති'පිස්ස හොති භවිස්සන්ති පි'ස්ස හොති, රූපී භවිස්සන්ති'පිස්ස හොති, අරූපී භවිස්සන්ති'පිස්ස හොති. සඤ්ඤී භවිස්සන්ති'පිස්ස හොති, අසඤ්ඤී භවිස්සන්ති'පිස්ස හොති. නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති'පිස්ස හොති.

තිට්ඨන්ති ඛො පන භික්ඛවෙ, තත්ථෙව පඤ්චින්ද්‍රියානි, අථෙත්ථ සුතවතො අරියසාවකස්ස අවිජ්ජා පහීයති, විජ්ජා උප්පජ්ජති, තස්ස අවිජ්ජාවිරාගා විජ්ජුප්පාදා අස්මීති'පිස්ස න හොති. අයමහමස්මීති'පිස්ස න හොති, භවිස්සන්ති'පිස්ස න හොති, න භවිස්සන්ති'පිස්ස න හොති, රූපී භවිස්සන්ති'පිස්ස න හොති, අරූපී භවිස්සන්ති'පිස්ස න හොති, සඤ්ඤී භවිස්සන්ති'පිස්ස න හොති, අසඤ්ඤී භවිස්සන්ති'පිස්ස න හොති, නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති' පිස්ස න හොතීති.

## 1. 1. 5. 6.

## ඛන්ධ සුත්තං

**48.** සාවත්ථියං:

පඤ්ච ච භික්ඛවෙ, ඛන්ධෙ දෙසිස්සාමි, පඤ්චුපාදානක්ඛන්ධෙ ච: තං සුණාථ -පෙ-

කතමෙ ච භික්ඛවෙ, පඤ්චක්ඛන්ධා: යං කිඤ්චි භික්ඛවෙ, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා, බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, අයං වුච්චති රූපක්ඛන්ධො.

යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං, අජ්ඣත්තං වා බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, අයං වුච්චති විඤ්ඤාණක්ඛන්ධො. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, පඤ්චක්ඛන්ධා.

කතමෙ ච භික්ඛවෙ, පඤ්චුපාදානක්ඛන්ධා: යං කිඤ්චි භික්ඛවෙ, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා, බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා සාසවං උපාදානියං, අයං වුච්චති රූපූපාදානක්ඛන්ධො.

මෙසේ මේ දිට්ඨිසමනුපස්සනා (යමකුට) ඇත් ද, (එකල්හි) ඔහුට 'මම වෙමි' යන ප්‍රපඤ්චය අවිගත (අප්‍රහීණ) වෙයි. මහණෙනි, 'මම වෙමි' යන ප්‍රපඤ්චය අවිගත කල්හි චක්ඛුරින්ද්‍රිය – ශ්‍රෝත ඉන්ද්‍රිය – ඝ්‍රාණෙන්ද්‍රිය – ජිහ්වේන්ද්‍රිය – කායේන්ද්‍රිය යන පඤ්චේන්ද්‍රියයන්ගේ අවක්‍රාන්තිය (ඉපැද්ම) වෙයි. මහණෙනි, මනස (-කර්මචිත්තය) ඇත, ආරම්මණ ධර්ම ඇත, (ජවනක්ෂණයෙහි) අවිද්‍යාව ඇති. මහණෙනි, අවිද්‍යාසම්ප්‍රයුක්ත ස්පර්ශයෙන් හටගත් වේදනායෙන් පහස්නා ලද ඒ අශ්‍රැතවත් පෘථග්ජනහට (තණ්හාදි වශයෙන්) ''මම වෙමි'' යන මඤ්ඤනා ද වෙයි, (රූපාදි කිසිවක් ආත්ම දෘෂ්ටි වශයෙන් ගෙන ඔහුට මෙ ''මම වෙමි'යි මඤ්ඤනා ද වෙයි, ඔහුට 'මතු වෙමි' යි ද වෙයි, ඔහුට 'මතු නො වෙමි'යි ද වෙයි, 'මතු රූපී වෙමි'යි ද ඔහුට වෙයි, 'මතු අරූපී වෙමි'යි ද ඔහුට වෙයි, 'මතු සංඥ ඇති (සංඥී) වෙමි' යිද ඔහුට වෙයි, 'මතු සංඥ නැති (අසංඥී) වෙමි'යි ද ඔහුට වෙයි, 'මතු නේවසංඥීනාසංඥී වෙමි'යි ද ඔහුට වේ.

තවද, මහණෙනි, ඒ පඤ්චස්කන්ධයෙහි මැ පඤ්චෙන්ද්‍රියයෝ ඇත්තාහුය, එහෙයින් තෙල ඉන්ද්‍රියයන්හි ශ්‍රුතවත් ආර්යශ්‍රාවක හට අවිද්‍යාව ප්‍රහීණ වෙයි, අර්හත්මාර්ගඥාන විද්‍යාව උපදී. ඔහුට අවිද්‍යාවිරාගයෙන් විද්‍යාව ඉපැදීමෙන් 'මම වෙමි' ඔහුට තණ්හා මාන දිට්ඨි නො වෙයි, රූපාදිය 'මේ මම වෙමි' ආත්මදෘෂ්ටිය නො වෙයි, (ශාශ්වත විසින්) මතු වෙමි ද නො වෙයි, (උච්ඡෙද විසින්) මතු නො වෙමි ද නො වෙයි, මතු රූපී වෙමි ද නො වෙයි, අරූපී වෙමි ද නො වෙයි, මතු සංඥී වෙමි ද නො වෙයි, මතු අසංඥී වෙමි ද නො වෙයි, මතු නේවසඤ්ඤීනාසඤ්ඤී වෙමි ද ඔහුට දෘෂ්ටිය නො වෙයි.

## 1. 1. 5. 6.

## ඛන්ධ සූත්‍රය

**48. සැවැත්නුවර :**

මහණෙනි, පඤ්චස්කන්ධ ද, පඤ්චෝපාදනස්කන්ධ ද දෙසමි. එය අසව ...

මහණෙනි, පඤ්චස්කන්ධ කවරහ යත් : මහණෙනි, අතීත – අනාගත – වර්තමාන වූ, ආධ්‍යාත්ම, වේවයි, බාහිර වේවයි, ඖදරික වේවයි, සූක්ෂ්ම වේවයි, හීන වේවයි, ප්‍රණීත වේවයි යම්කිසි රූපයෙක් ඇත් ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් රූපයෙක් ඇත් ද මේ රූපස්කන්ධ යි කියනු ලැබේ.

යම්කිසි වේදනාවක් ... යම්කිසි සංඥවක් ... යම්කිසි සංස්කාර ... අතීත – අනාගත – ප්‍රත්‍යුත්පන්න වූ ආධ්‍යාත්ම වේවයි, බාහිර වේවයි, ඖදරික වේවයි, සූක්ෂ්ම වේවයි, හීන වේවයි, ප්‍රණීත වේවයි යම්කිසි විඥනයෙක් ඇත් ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් විඥනයෙක් ඇත් ද මේ විඥන ස්කන්ධ'යි කියනු ලබේ. මහණෙනි, මොහු පඤ්චස්කන්ධ යි කියනු ලැබෙත් :

මහණෙනි, පඤ්චෝපාදනස්කන්ධ කවරහ යත් : මහණෙනි, ආශ්‍රව සහිත වූ උපාදන යනට ප්‍රත්‍යය වූ අතීත – අනාගත – ප්‍රත්‍යුත්පන්න වූ අධ්‍යාත්ම වේවයි, බාහිර වේවයි, ඖදරික වේවයි, සූක්ෂ්ම වේවයි, හීන වේවයි, ප්‍රණීත වේවයි යම් රූපයෙක් ඇත් ද, ළඟ වූ හෝ දුර වූ හෝ යම් රූපයෙක් ඇත් ද, 'මෙ රූපොපාදනස්කන්ධ' යි කියනු ලබේ.

යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා සාසවං උපාදානියං, අයං වුච්චති විඤ්ඤාණුපාදානක්ඛන්ධො.

ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, පඤ්චුපාදානක්ඛන්ධාති.

## 1. 1. 5. 7.

## පඨමසොණසුත්තං

49.

එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො සොණො ගහපතිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සොණං ගහපතිපුත්තං භගවා එතදවොච :

යෙ හි කෙචි සොණ, සමණා වා බ්‍රාහ්මණා වා අනිච්චෙන රූපෙන දුක්ඛෙන විපරිණාමධම්මෙන සෙය්‍යොහමස්මීති වා සමනුපස්සන්ති, සදිසොහමස්මීති වා සමනුපස්සන්ති, හීනොහමස්මීති වා සමනුපස්සන්ති, කිමඤ්ඤත්‍ර යථාභූතස්ස අදස්සනා. අනිච්චාය වෙදනාය දුක්ඛාය විපරිණාමධම්මාය සෙය්‍යොහමස්මීති වා සමනුපස්සන්ති, සදිසො'හමස්මීති වා සමනුපස්සන්ති, හීනො'හමස්මීති වා සමනුපස්සන්ති. කිමඤ්ඤත්‍ර යථාභූතස්ස අදස්සනා. අනිච්චාය සඤ්ඤාය දුක්ඛාය විපරිණාමධම්මාය -පෙ- අනිච්චෙහි සඞ්ඛාරෙහි දුක්ඛෙහි විපරිණාමධම්මෙහි -පෙ- අනිච්චෙන විඤ්ඤාණෙන දුක්ඛෙන විපරිණාමධම්මෙන සෙය්‍යො'හමස්මීති වා සමනුපස්සන්ති, සදිසො'හමස්මීති වා සමනුපස්සන්ති, හීනො'හමස්මීති වා සමනුපස්සන්ති, කිමඤ්ඤත්‍ර යථාභූතස්ස අදස්සනා.

යෙ ච ඛො කෙචි සොණ, සමණා වා බ්‍රාහ්මණා වා අනිච්චෙන රූපෙන දුක්ඛෙන විපරිණාමධම්මෙන සෙය්‍යො'හමස්මීති'පි න සමනුපස්සන්ති, සදිසො'හමස්මීති'පි න සමනුපස්සන්ති, හීනො'හමස්මීති'පි න සමනුපස්සන්ති, කිමඤ්ඤත්‍ර යථාභූතස්ස දස්සනා, අනිච්චාය වෙදනාය දුක්ඛාය විපරිණාමධම්මාය -පෙ- අනිච්චාය සඤ්ඤාය -පෙ- අනිච්චෙහි සඞ්ඛාරෙහි -පෙ- අනිච්චෙන විඤ්ඤාණෙන දුක්ඛෙන විපරිණාමධම්මෙන සෙය්‍යො'හමස්මීති'පි න සමනුපස්සන්ති, සදිසො'හමස්මීති'පි න සමනුපස්සන්ති, හීනො'හමස්මීති'පි න සමනුපස්සන්ති, කිමඤ්ඤත්‍ර යථාභූතස්ස දස්සනා.

තං කිම්මඤ්ඤසි සොණ, රූපං නිච්චං වා අනිච්චං වාති ?

අනිච්චං භන්තෙ,

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති ?

දුක්ඛං භන්තෙ,

Free Distribution www.aathaapi.org

යම් කිසි වේදනාවක් ... යම් කිසි සංඥවක් ... යම් කිසි සංස්කාර ... ආශ්‍රව සහිත වූ උපාදානයනට ප්‍රත්‍යය වූ අතීත අනාගත - ප්‍රත්‍යුත්පන්න වූ අධ්‍යාත්ම වේවයි, බාහිර වේවයි, ඖදරික වේවයි, සූක්ෂම වේවයි, හීන වේවයි, ප්‍රණීත වේවයි, යම් කිසි විඥනයෙක් ඇත් ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් විඥනයෙක් ඇත් ද, මෙ විඥනෝපාදනස්කන්ධ යි කියනු ලැබේ.

මහණෙනි, මොහු පඤ්චෝපාදනස්කන්ධ යි කියනු ලැබෙත්.

## 1. 1. 5. 7.

## පළමුවැනි සෝණ සූත්‍රය

49. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම් වූ වේළුවනයෙහි වැඩ වසනසේක. එකල්හි සෝණ නම් ගෘහපති පුත්‍ර භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එ තන්හි එළැඹියේ යැ. එළැඹැ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් වැ හුන්නේ යැ. එකත් පසෙකැ හුන් සෝණ ගැහැවි පුත්හට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක :

සෝණය, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ දුක් වූ පෙරළෙන සැහැවි ඇති අනිත්‍ය රූපයෙන් '' මම උත්තමයෙමි '' යි හෝ දකිත් ද, '' මම සදෘශ යෙමි '' යි හෝ දකිත් ද, '' මම හීනයෙමි '' යි හෝ දකිත් ද යථාභූතාර්ථයාගේ අදර්ශනය මිස අන් කිමෙක ? දුක් වූ පෙරළෙන සැහැවි ඇති අනිත්‍ය වේදනායෙන් '' මම උත්තම යෙමි '' යි හෝ දකිත් ද, '' මම සදෘශයෙමි '' යි හෝ දකිත් ද, '' මම හීනයෙමි '' යි හෝ දකිත් ද, යථාභූතාර්ථයාගේ අදර්ශනය මිස එ අන් කිම ? දුක් වූ විපරිණාම ස්වභාව ඇති අනිත්‍ය සංඥයෙන් ... දුක් වූ පෙරළෙන ගති ඇති අනිත්‍ය සංස්කාරයෙන් ... දුක් වූ පෙරළෙන දහම් ඇති අනිත්‍ය විඥනයෙන් '' මම විශිෂ්ටයෙමි '' යි හෝ දකිත් ද, '' මම සමාන යෙමි '' යි හෝ දකිත් ද, '' මම හීනයෙමි '' යි හෝ දකිත් ද, යථාභූතාර්ථයාගේ අදර්ශනය හැර අන් කිමෙක ?

සෝණය, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ දුඃඛ වූ විපරිණාම ධර්ම වූ අනිත්‍ය රූපය හේතු කොට '' මම විශිෂ්ට යෙමි '' යි හෝ නො දකිත් ද, '' මම තුල්‍යයෙමි '' යි හෝ නො දකිත් ද, '' මම හීනයෙමි '' යි හෝ නො දකිත් ද, යථාභූතදර්ශනය හැර අන් කිමෙක ? දුඃඛ වූ විපරිණාම ධර්ම වූ අනිත්‍ය වූ වේදනාව නිසා ... අනිත්‍ය වූ සංඥව නිසා ... අනිත්‍ය වූ සංස්කාර නිසා ... දුඃඛ වූ විපරිණාම ධර්ම වූ අනිත්‍ය විඥනය හේතු කොට '' මම උත්තමයෙමි '' යි කියාත් නො දකිත් ද, '' මම සදෘශයෙමි '' යි කියාත් නො දකිත් ද, '' මම හීනයෙමි '' යි කියාත් නො දකිත් ද, යථාභූතාර්ථයාගේ දර්ශනය හැර අන් කිම ?

සෝණය, එ කිසේ හඟිහි : රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ දැයි ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය වේ නම් එ දුඃඛ හෝ සුඛ හෝ වේ ද යි ?

වහන්ස, දුක් යැ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති?

නො හෙතං භන්තෙ,

වේදනා නිච්චා වා අනිච්චා වා'ති?

අනිච්චා භන්තෙ,

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති?

නො හෙතං භන්තෙ.

සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා'ති?

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති?

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං, එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති?

නො හෙතං භන්තෙ.

තස්මාතිහ සොණ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

යා කාචි වේදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං "නෙතං මම නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං සොණ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වේදනාය'පි නිබ්බින්දති, සඤ්ඤාය'පි නිබ්බින්දති, සඞ්ඛාරෙසු'පි නිබ්බින්දති විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා"ති පජානාතීති.

යමෙක් අනිත්‍ය වේ නම් දුක් වේ නම් පෙරළෙන සැහැවි වේ නම් එය '' තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම ය යි නුවණින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නිසි නො වෙයි.

වේදනා නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ දැයි ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය වේ නම් එය දුඃඛ හෝ සුඛ හෝ වේ ද යි ?

වහන්ස, දුක් යැ.

යමෙක් වනාහි අනිත්‍ය දුඃඛ විපරිණාම ධර්ම වේ නම් එය '' තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල, මාගේ ආත්ම '' යයි නුවණින් දක්නට යෝග්‍ය වේ ද ?

වහන්ස, තෙල යෝග්‍ය නො වේ මැ යැ.

සංඥ ... සංස්කාරයෝ ... විඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ දැයි ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය වේ නම් එය දුක් හෝ හෝ සුව හෝ වේ දැයි ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමධර්ම වේ නම් එය ''තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම''ය යි නුවණින් දක්නට නිසි වේ ද ?

වහන්ස, තෙල නිසි නො වේ මැ යැ.

සෝණය, ඒ හේතුවින් ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඔලාරික වූ හෝ සියුම් වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යම් රූපයෙක් ඇත් ද, දුරෙහි වූ හෝ ඟමියෙහි වූ හෝ යම් රූපයෙක් ඇත් ද ඒ හැම රූපය ''තෙල මා අයත් නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මා අයත් ආත්මයක් නො වේය''යි මෙසේ මෙ කරුණ ඇති සැටිය සම්‍යක්ප්‍රඥයෙන් දක්ක යුතු.

යම් කිසි වේදනාවක් ... යම්කිසි සංඥවක් ... යම්කිසි සංස්කාර කෙනෙක් ... ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යම් විඥනයෙක් ඇත් ද, දුරෙහි වූ හෝ සමීපයෙහි වූ හෝ යම් විඥනයෙක් ඇත් ද, ඒ හැම විඥනය ''තෙල මා අයත් නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ'' යයි මෙසේ මෙ කරුණ ඇතිසැටිය සම්‍යක් ප්‍රඥයෙන් දක්කයුතු.

සෝණය, මෙසේ දක්නේ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපයෙහි ද නිර්වෙද කෙරෙයි, වේදනායෙහි ද නිර්වෙද කෙරෙයි, සංඥයෙහි ද නිර්වෙද කෙරෙයි, සංස්කාරයෙහි ද නිර්වෙද කෙරෙයි, විඥනයෙහිදු නිර්වෙද කෙරෙ යි. නිර්වෙද කරනුයේ විරක්ත වෙයි, විරාග හේතුයෙන් මිදෙයි. මිදුණු කල ''විමුක්ත'' යයි ඥනය පහළ වෙයි, ''ජාති ක්ෂීණ වූ. බඹසර වැස නිමවිණැ, කරණී කරන ලද. මෙ අනුපාදාපරිනිර්වාණය පිණිස කළ යුතු අන් කිසෙක් නැති''යි නුවණින් දනීයයි වදළහ.

## 1. 1. 5. 8.

### දුතිය සොණ සුත්තං

**50.**

එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො සොණො ගහපතිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො සොණං ගහපතිපුත්තං භගවා එතදවොච:

යෙ කෙචි සොණ, සමණා වා බ්‍රාහ්මණා වා රූපං නප්පජානන්ති රූපසමුදයං නප්පජානන්ති රූපනිරොධං නප්පජානන්ති රූපනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති, වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං නප්පජානන්ති, විඤ්ඤාණසමුදයං නප්පජානන්ති, විඤ්ඤාණනිරොධං නප්පජානන්ති, විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං නප්පජානන්ති, න මෙතෙ සොණ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා, න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ ච ඛො කෙචි සොණ, සමණා වා බ්‍රාහ්මණා වා රූපං පජානන්ති, රූපසමුදයං පජානන්ති, රූපනිරොධං පජානන්ති, රූපනිරොධගාමිනිං පටිපදං පජානන්ති. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං පජානන්ති විඤ්ඤාණසමුදයං පජානන්ති විඤ්ඤාණනිරොධං පජානන්ති විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං පජානන්ති, තෙ ඛො මෙ සොණ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව සමණසම්මතා බ්‍රාහ්මණෙසු චෙව බ්‍රාහ්මණසම්මතා, තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්චෙව බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 1. 1. 5. 9.

### පඨම නන්දික්ඛය සුත්තං

**51.** සාවත්ථියං:

අනිච්චඤ්ඤෙව භික්ඛවෙ, භික්ඛු රූපං අනිච්චන්ති පස්සති. සාස්ස හොති සම්මාදිට්ඨි, සම්මාපස්සං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො. නන්දිරාගක්ඛයා චිත්තං විමුත්තං සුවිමුත්තන්ති වුච්චති.

අනිච්චඤ්ඤෙව භික්ඛවෙ, භික්ඛු වෙදනං අනිච්චාති පස්සති, -පෙ- අනිච්චඤ්ඤෙව භික්ඛවෙ, භික්ඛු සඤ්ඤං අනිච්චාති පස්සති, -පෙ- අනිච්චෙයෙව භික්ඛවෙ, භික්ඛු සඞ්ඛාරෙ අනිච්චාති පස්සති -පෙ- අනිච්චඤ්ඤෙව භික්ඛවෙ, භික්ඛු විඤ්ඤාණං අනිච්චන්ති පස්සති. සාස්ස හොති සම්මාදිට්ඨි, සම්මා පස්සං නිබ්බින්දති, නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො, නන්දිරාගක්ඛයා චිත්තං විමුත්තං සුවිමුත්තන්ති වුච්චතීති.

Free Distribution www.aathaapi.org

## 1. 1. 5. 8.

## දෙවැනි සෝණ සූත්‍රය

50.

මා විසින් මෙසේ අසන ලදී : එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම් වූ වේළුවනයෙහි වැඩ වාසය කරන සේක. එකල්හි සෝණ ගෘහපතිපුත්‍ර භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එතන්හි එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙකැ හුන්නේ යැ. එකත් පසෙකැ හුන් සෝණ ගෘහපති පුත්‍රහට භාග්‍යවතුන් වහන්සේ මෙල වදළසේක :

සෝණය, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ රූපය නො දනිත් ද, රූප සමුදය නො දනිත් ද, රූපනිරෝධය නො දනිත් ද, රූපනිරෝධගාමිනී පටිපදව නො දනිත් ද, වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය නො දනිත් ද, විඥනසමුදය නො දනිත් ද විඥන නිරෝධය නො දනිත් ද, විඥන නිරෝධගාමිනී ප්‍රතිපදව නො දනිත් ද, සෝණය, තෙල ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත නො වෙති, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත නො වෙත්. ඒ ආයුෂ්මත්හු ශ්‍රාමණ්‍යාර්ථය හෝ ව යි බ්‍රාහ්මණ්‍යාර්ථය වේවයි දිටුදමියෙහි මැ තමන් විසින් විශිෂ්ට ඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට එළැඹැ නො ද විහරණ කෙරෙත්.

සෝණය, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ රූපය දනිත් ද, රූප සමුදය දනිත් ද, රූපනිරෝධය දනිත් ද, රූපනිරොධගාමිනීපටිපදව දනිත් ද, වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය දනිත් ද, විඥන සමුදය දනිත් ද, විඥන නිරෝධය දනිත් ද, විඥනනිරෝධගාමිනී ප්‍රතිපදව දනිත් ද, සෝණය, තෙල ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ සම්මත ද වෙති. බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණ සම්මත ද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රාමණ්‍යාර්ථය ද බ්‍රාහ්මණ්‍යාර්ථය ද දිටුදමියෙහි මැ තමන් විසින් විශිෂ්ටඥනයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට එයට එළැඹ විහරණ කෙරෙත් යි වදළහ.

## 1. 1. 5. 9.

## පළමුවැනි නන්දික්ඛය සූත්‍රය

51. සැවැත්නුවර :

මහණෙනි, මහණ අනිත්‍ය වූ ම රූපය අනිත්‍යය යි දකියි, එය ඔහුගේ සම්‍යග්දෘෂ්ටිය වෙයි, සම්‍යග්ඥනයෙන් දක්නේ කලකිරෙයි. නන්දි සංඛ්‍යාත තෘෂ්ණාක්ෂය හේතුයෙන් රාගක්ෂය වෙයි, රාගක්ෂය හේතුයෙන් තෘෂ්ණාක්ෂය වෙයි, නන්දිරාගක්ෂය හේතුයෙන් සිත මිදුණේ මොනොවට මිදුණේ යි කියනු ලැබෙයි.

මහණෙනි, මහණ අනිත්‍ය වූ ම වේදනාව අනිත්‍ය යි දකියි ... මහණෙනි, මහණ අනිත්‍ය වූ ම සංඥව අනිත්‍ය'යි දකියි ... මහණෙනි, මහණ අනිත්‍ය වූ ම සංස්කාර 'අනිත්‍ය' යි දකියි .... මහණෙනි, මහණ අනිත්‍ය වූ ම විඥනය 'අනිත්‍ය'යි දකියි, එය ඔහුගේ සම්‍යග් දෘෂ්ටිය වෙයි, සම්‍යග්ඥනයෙන් දක්නේ කලකිරෙයි. තෘෂ්ණාක්ෂයයෙන් රාගක්ෂය වෙයි, රාගක්ෂයයෙන් තෘෂ්ණාක්ෂය වෙයි. නන්දිරාගක්ෂයයෙන් සිත මිදුණේ මොනොවට මිදුණේ යි කියනු ලැබේ යයි.

## 1. 1. 5. 10.

## දුතිය නන්දික්ඛය සුත්තං

52. සාවත්ථියං :

රූපං භික්ඛවෙ, යොනිසො මනසි කරොථ, රූපානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සථ, රූපං භික්ඛවෙ, භික්ඛු යොනිසො මනසිකරොන්තො රූපානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සන්තො රූපස්මිං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො, නන්දිරාගක්ඛයා චිත්තං විමුත්තං සුවිමුත්තන්ති වුච්චති.

වෙදනං භික්ඛවෙ, -පෙ- සඤ්ඤං භික්ඛවෙ, -පෙ- සඞ්ඛාරෙ භික්ඛවෙ, -පෙ- විඤ්ඤාණං භික්ඛවෙ, යොනිසො මනසිකරොථ, විඤ්ඤාණානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සථ. විඤ්ඤාණං භික්ඛවෙ භික්ඛු. යොනිසො මනසිකරොන්තො විඤ්ඤාණානිච්චතඤ්ච යථාභූතං සමනුපස්සන්තො විඤ්ඤාණස්මිං නිබ්බින්දති. නන්දික්ඛයා රාගක්ඛයො, රාගක්ඛයා නන්දික්ඛයො, නන්දිරාගක්ඛයා චිත්තං විමුත්තං සුවිමුත්තන්ති වුච්චතීති.

අත්තදීපවග්ගො පඨමො

තස්සුද්දානං :

අත්තදීපා පටිපදා - ද්වෙ ච හොන්ති අනිච්චතා
සමනුපස්සනා ඛන්ධා ද්වෙ - සොණා ද්වෙ නන්දික්ඛයෙන චාති.

මූලපණ්ණාසකං සමත්තං

තස්ස මූලපණ්ණාසකස්ස වග්ගුද්දානං :

නකුලපිතා අනිච්චො ච - භාරො න තුම්හාකෙන ච
අත්තදීපෙන පඤ්ඤත්තං - පඨමං තෙන වුච්චතීති.

Free Distribution www.aathaapi.org

## 1. 1. 5. 10.

## දෙවැනි නන්දික්ඛය සූත්‍රය

52. සැවැත්නුවර :

මහණෙනි, රූපය නුවණින් මෙනෙහි කරව, රූපයාගේ අනිත්‍යතාව ද යථාභූත කොට බලව, මහණෙනි, මහණ, රූපය නුවණින් මෙනෙහි කරනුයේ රූපයාගේ අනිත්‍යතාව ද ඇතිසැටි දක්නේ රූපයෙහි කලකිරෙයි, නන්දිසංඛ්‍යාත තෘෂ්ණාක්ෂයයෙන් රාගක්ෂය වෙයි, රාගක්ෂයයෙන් තෘෂ්ණාක්ෂය වෙයි, නන්දි රාගක්ෂයයෙන් සිත (කෙලෙසුන් කෙරෙන්) මිදුණේ වෙසෙසින් මිදුණේ යි කියනු ලැබෙයි.

මහණෙනි, වේදනාව ... මහණෙනි, සංඥාව ... මහණෙනි, සංස්කාර ... මහණෙනි, විඥානය නුවණින් මෙනෙහි කරව, විඥානයාගේ අනිත්‍යතා ද යථාභූත කොට බලව, මහණෙනි, මහණ විඥානය නුවණින් මෙනෙහි කරන්නේ විඥානයාගේ අනිත්‍යතා ද යථාභූත කොට දක්නේ විඥානයෙහි කලකිරෙයි, නන්දිසංඛ්‍යාත තෘෂ්ණාක්ෂය හේතුයෙන් රාගක්ෂය වෙයි, රාගක්ෂය හේතුයෙන් තෘෂ්ණාක්ෂය වෙයි, නන්දිරාගක්ෂය හේතුයෙන් සිත කෙලෙසුන් කෙරෙන් මිදුණේ වෙසෙසින් මිදුණේ යි කියනු ලැබේ යයි වදළසේක.

පස්වැනි අත්තදීපවර්ග යි

එහි උද්දානය :

අත්තදීප සූත්‍ර ය, පටිපද සූත්‍ර ය, අනිච්චතා සූත්‍ර දෙක ය, සමනුපස්සනා සූත්‍ර ය, ඛන්ධ සූත්‍ර සෝණ සූත්‍ර දෙක ය, නන්දික්ඛය සූත්‍ර දෙක දැයි අත්තදීපවර්ගයෙහි සූත්‍ර දශයකි.

මූලපණ්ණසකය සමාප්ත යි

ඒ මූලපණ්ණසකයේ වර්ගොද්දානය :

නකුලපිතු වර්ග ය, අනිච්ච වර්ග ය හා භාරවර්ග ය නකුම්භාක වර්ගයෙන් ද, අත්තදීප වර්ගයෙන් ද පඨම පණ්ණාසකය කියනු ලැබේ.

## 2. මජ්ඣිමපණ්ණාසකො

## 1. උපයවග්ගො

### 1. 2. 1. 1.

### උපය සුත්තං

**53. සාවත්ථියං:**

උපයො භික්ඛවෙ, අවිමුත්තො, අනුපයො විමුත්තො, රූපූපයං වා භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය, රූපාරම්මණං රූපපතිට්ඨං නන්දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍ය, වෙදනූපයං වා භික්ඛවෙ -පෙ- සඤ්ඤූපයං වා භික්ඛවෙ -පෙ- සඞ්ඛාරූපයං වා භික්ඛවෙ විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය සඞ්ඛාරාරම්මණං සඞ්ඛාරපතිට්ඨං නන්දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍ය.

යො භික්ඛවෙ එවං වදෙය්‍ය: අහමඤ්ඤත්‍ර රූපා අඤ්ඤත්‍ර වෙදනාය අඤ්ඤත්‍ර සඤ්ඤාය අඤ්ඤත්‍ර සඞ්ඛාරෙහි විඤ්ඤාණස්ස ආගතිං වා ගතිං වා චුතිං වා උපපත්තිං වා වුද්ධිං වා විරූළ්හිං වා වෙපුල්ලං වා පඤ්ඤාපෙස්සාමීති නෙතං ඨානං විජ්ජති.

රූපධාතුයා චෙ භික්ඛවෙ, භික්ඛුනො රාගො පහීනො හොති, රාගස්ස පහානා වොච්ඡිජ්ජතාරම්මණං, පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති, වෙදනාධාතුයා චෙ භික්ඛවෙ, භික්ඛුනො -පෙ- සඤ්ඤාධාතුයා චෙ භික්ඛවෙ, භික්ඛුනො -පෙ- සඞ්ඛාරධාතුයා චෙ භික්ඛවෙ, භික්ඛුනො රාගො පහීනො හොති. රාගස්ස පහානා වොච්ඡිජ්ජතාරම්මණං පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති. විඤ්ඤාණධාතුයා චෙ භික්ඛවෙ, භික්ඛුනො රාගො පහීනො හොති, රාගස්ස පහානා වොච්ඡිජ්ජතාරම්මණං පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති. තදප්පතිට්ඨිතං විඤ්ඤාණං අවිරූළ්හං අනභිසඞ්ඛච්ච විමුත්තං, විමුත්තත්තා ඨිතං, ඨිතත්තා සන්තුසිතං, සන්තුසිතත්තා න පරිතස්සති අපරිතස්සං පච්චත්තංයෙව පරිනිබ්බායති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාතීති.

### 1. 2. 1. 2.

### බීජ සුත්තං

**54. සාවත්ථියං:**

පඤ්චිමානි භික්ඛවෙ බීජජාතානි, කතමානි පඤ්ච: මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං අග්ගබීජං බීජබීජඤ්ඤෙව පඤ්චමං. ඉමානි චස්සු භික්ඛවෙ පඤ්ච බීජජාතානි අඛණ්ඩානි අපූතිකානි අවාතාතපහතානි සාරාදායීනි සුඛසයිතානි පථවී ච නාස්ස ආපො ච නාස්ස අපි නු ඉමානි භික්ඛවෙ පඤ්ච බීජජාතානි වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යුන්ති.



Free Distribution www.aathaapi.org

## 2. මජ්ඣිමපණ්ණාසකය

## 1. උපය වර්ගය

### 1. 2. 1. 1.
### උපය සූත්‍රය

**53. සැවැත්නුවර :**

මහණෙනි, උපය (තෘෂ්ණා – දෘෂ්ටි – මාන) සහිත වූයේ, සසරින් නො මිදුණේ වෙයි, උපය රහිත වූයේ මිදුණේ වෙයි. (තෘෂ්ණා – දෘෂ්ටි – මාන විසින්) රූපයට හෝ එළැඹ සිටුනා කර්මවිඥනය රූපය අරමුණු කොට රූපය පිහිට කොට සිටුනේ යැ, නන්දි සංඛ්‍යාත තෘෂ්ණායෙන් තෙත් වූයේ වෘද්ධියට විරූඪියට විපුලත්වයට පැමිණෙයි. මහණෙනි, වේදනොපය හෝ ... සංඥොපය හෝ ... මහණෙනි, සංස්කාරොපය හෝ එළඹ සිටුනා කර්මවිඥනය සංස්කාර අරමුණු කොට සංස්කාර පිහිට කොට සිටුනේ යැ, නන්දි සංඛ්‍යාත තෘෂ්ණායෙන් තෙත් වූයේ වෘද්ධියට විරූඪියට විපුලත්වයට පැමිණෙයි.

මහණෙනි, යමෙක් මෙසේ කියා නම් (කියේ යැ :) " මම රූපය තබා වේදනා තබා සංඥව තබා සංස්කාර තබා විඥනයාගේ ආගතිය හෝ ගතිය හෝ ච්‍යුතිය හෝ උත්පත්තිය හෝ වෘද්ධිය හෝ විරූඪිය හෝ විපුලත්වය හෝ පනවමි " යි (කියායි). තෙල කරුණ විද්‍යාමාන නො වෙයි.

මහණෙනි, ඉදින් රූපධාතුව පිළිබඳ වූ, මහණහුගේ රාගය ප්‍රහීණ වේ ද, රාගයාගේ ප්‍රහාණයෙන් අරමුණ සිඳෙයි, කර්මවිඥනයාගේ පිහිටීමෙක් නො වෙයි. මහණෙනි, ඉදින් වේදනාධාතුව පිළිබඳ වූ, මහණහුගේ ... මහණෙනි, ඉදින් සංඥධාතුව පිළිබඳ වූ, මහණහුගේ ... මහණෙනි, ඉදින් සංස්කාර ධාතුව පිළිබඳ වූ, මහණහුගේ රාගය ප්‍රහීණ වේ ද, රාගයාගේ ප්‍රහාණයෙන් අරමුණ සිඳෙයි, කර්මවිඥනයාගේ ප්‍රතිෂ්ඨායෙක් නො වෙයි. මහණෙනි, ඉදින් විඥනධාතුව පිළිබඳ වූ, මහණහුගේ රාගය ප්‍රහීණ වේ ද, රාගයාගේ ප්‍රහාණයෙන් අරමුණ සිඳෙයි, විඥනයාගේ ප්‍රතිෂ්ඨායෙක් නො වෙයි. නො පිහිටි ඒ විඥනය විරූඪියට නො පැමිණියේ ප්‍රතිසන්ධිය අභිසංස්කරණය නො කොට මිදුණේ වෙයි. විමුක්ත හෙයින් ස්ථිත වෙයි, ස්ථිත හෙයින් සන්තුෂ්ට වෙයි, සන්තුෂ්ට හෙයින් ත්‍රස්ත නො වෙයි, ත්‍රස්ත නො වන්නේ තමා කෙරෙහි ම නිවෙයි. ජාතිය ක්ෂය වියැ, බඹසර වැස නිමවනලද, කරණී කරන ලදී, තෙල අනුපාද පරිනිර් වාණය පිණිස කළ යුතු අන් කිසෙක් නැති යි නුවණින් දනී යි.

### 1. 2. 1. 2.
### බීජ සූත්‍රය

**54. සැවැත්නුවර :**

මහණෙනි, මේ බීජයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත් : මූලබීජ යැ, ස්කන්ධ බීජ යැ, ඵලු (පුරුක්) බීජ යැ, අග්‍රබීජ යැ, පස්වැනි වූ බීජබීජ ය දැයි. මහණෙනි, මේ පඤ්ච බීජයෝ නො කැඩුණා හු, කුණු නො වූවාහු, අවු–පුළඟින් නො පහළාහු, පිහිටි සාරය ඇත්තාහු සුඛසයිත වූවාහු වෙත් ද, පිහිටන පොළොව ද නො වේ නම්, තෙත් කරන ජලය ද නො වේ නම් මහණෙනි, මේ පඤ්චබීජයෝ වෘද්ධියට විරූඪියට විපුලත්වයට පැමිණෙත් ද ?

නො හෙතං භන්තෙ.

ඉමානි චස්සු භික්ඛවෙ පඤ්ච බීජජාතානි ඛණ්ඩානි පූතිකානි වාතාතපහතානි අසාරාදයීනි න සුඛසයිතානි පඨවී ච අස්ස, ආපො ච අස්ස, අපි නු ඉමානි භික්ඛවෙ පඤ්ච බීජජාතානි වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යුන්ති ?

නො හෙතං භන්තෙ,

ඉමානි චස්සු භික්ඛවෙ පඤ්ච බීජජාතානි අඛණ්ඩානි අපූතිකානි සාරාදයීනි සුඛසයිතානි පඨවී ච අස්ස ආපො ච අස්ස, අපි නු ඉමානි පඤ්ච බීජජාතානි වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍යුන්ති.

එවං භන්තෙ,

සෙය්‍යථාපි භික්ඛවෙ පඨවීධාතු එවං චතස්සො විඤ්ඤාණට්ඨිතියො දට්ඨබ්බා, සෙය්‍යථාපි භික්ඛවෙ ආපොධාතු එවං නන්දිරාගො දට්ඨබ්බො. සෙය්‍යථාපි භික්ඛවෙ පඤ්ච බීජජාතානි එවං විඤ්ඤාණං සාහාරං දට්ඨබ්බං.

රූපූපයං භික්ඛවෙ විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය. රූපාරම්මණං රූපප්පතිට්ඨං නන්දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍ය, වෙදනූපයං වා භික්ඛවෙ විඤ්ඤාණං -පෙ- සඤ්ඤූපයං වා භික්ඛවෙ -පෙ- සඞ්ඛාරූපයං වා භික්ඛවෙ විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය සඞ්ඛාරාරම්මණං සඞ්ඛාරප්පතිට්ඨං නන්දූපසෙචනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍ය.

යො භික්ඛවෙ එවං වදෙය්‍ය අහමඤ්ඤත්‍ර රූපා අඤ්ඤත්‍ර වෙදනාය අඤ්ඤත්‍ර සඤ්ඤාය අඤ්ඤත්‍ර සඞ්ඛාරෙහි විඤ්ඤාණස්ස ආගතිං වා ගතිං වා චුතිං වා උප්පත්තිං වා වුද්ධිං වා විරූළ්හිං වා වෙපුල්ලං වා පඤ්ඤපෙස්සාමීති නෙතං ඨානං විජ්ජති.

රූපධාතුයා චෙ භික්ඛවෙ භික්ඛුනො රාගො පහීනො හොති, රාගස්ස පහානා වොච්ඡිජ්ජතාරම්මණං පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති. වෙදනාධාතුයා චෙ භික්ඛවෙ භික්ඛුනො -පෙ- සඤ්ඤාධාතුයා චෙ භික්ඛවෙ භික්ඛුනො -පෙ- සඞ්ඛාරධාතුයා චෙ භික්ඛවෙ භික්ඛුනො -පෙ- විඤ්ඤාණධාතුයා චෙ භික්ඛවෙ භික්ඛුනො රාගො පහීනො හොති රාගස්ස පහානා වොච්ඡිජ්ජතාරම්මණං පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති. තදප්පතිට්ඨිතං විඤ්ඤාණං අවිරූළ්හං අනභිසඞ්ඛච්ච විමුත්තං විමුත්තත්තා ඨිතං, ඨිතත්තා සන්තුසිතං, සන්තුසිතත්තා න පරිතස්සති, අපරිතස්සං පච්චත්තංයෙව පරිනිබ්බායති, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

වහන්ස, තෙල නො වේ මැයි.

මහණෙනි, මේ පඤ්චබීජයෝ කැඩී ගියාහු, කුණු වූවාහු, අව්-සුළඟින් පහළාහු, සාරාදයී නො වූවාහු, සුඛසයින නො වූවාහු වෙත් ද, පොළොව ද ඇත්නම් ජලය ද ඇත්නම් මහණෙනි, මේ පඤ්චබීජයෝ වෘද්ධියට විරූඪියට විපුලත්වයට පැමිණෙත් ද ?

වහන්ස, තෙල නො වේ ම යැ.

මහණෙනි, මේ පඤ්චබීජයෝ නො කැඩුණාහු, කුණු නො වූවාහු, සාරය ගෙන දෙන්නාහු, සුඛසයිත වූවාහු වෙත් ද, පොළොව ද, ජලය ද ඇත් ද, (එසද) මේ පඤ්චබීජයෝ වැඩීමට වෙසෙසින් නැඟීමට විපුලභාවයට පැමිණෙත් ද ?

වහන්ස, එසේ යැ.

මහණෙනි, පෘථිවිධාතුව යම්සේ ද, එසෙයින් චතුර් විඥාන ස්ථිතීහු දතයුත්තාහ. මහණෙනි, අපොධාතුව යම්සේ ද, එසෙයින් නන්දිරාගය දතයුතුය. මහණෙනි, පඤ්චබීජයෝ යම්සේ ද, එසෙයින් ප්‍රත්‍යය සහිත කර්මවිඥානය දත යුතු යි.

මහණෙනි, රූපයට පැමිණ සිටුනා කර්මවිඥානය රූපය අරමුණු කොට රූපය පිහිට කොට සිටුනේ ද, නන්දි සඞ්ඛ්‍යාත තෘෂ්ණායෙන් තෙත් වූයේ වෘද්ධියට විරූඪියට විපුලත්වයට පැමිණෙයි. මහණෙනි, වේදනාවට හෝ පැමිණි ... මහණෙනි, සංඥවට හෝ පැමිණි ... මහණෙනි සංස්කාරයනට හෝ පැමිණි සිටුනා කර්මවිඥානය සංස්කාර අරමුණු කොට සංස්කාර පිහිට කොට සිටුනේ ද, තෘෂ්ණායෙන් තෙත්වූයේ වෘද්ධියට විරූඪියට විපුලත්වයට පැමිණෙයි.

මහණෙනි, යමෙක් " මම රූපය හැර, වේදනාව හැර, සංඥව හැර සංස්කාරයන් හැර කර්මවිඥණයාගේ ඊම හෝ යෑම හෝ චුතිය හෝ උත්පත්තිය හෝ වැඩීම හෝ නැඟීම හෝ පැතිරීම හෝ පනවන්නෙමි " යි කියා නම් තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

මහණෙනි, ඉදින් රූපධාතුව පිළිබඳ රාගය මහණහට ප්‍රහීණ වේ ද, රාගයාගේ ප්‍රහාණයෙන් අරමුණ සිඳෙයි, කර්මවිඥානයාගේ පිහිටීමෙක් නො වෙයි. මහණෙනි, ඉදින් මහණහට වේදනා ධාතුව පිළිබඳ ... මහණෙනි, ඉදින් මහණහට සංඥධාතුව පිළිබඳ ... මහණෙනි, ඉදින් මහණහට සංස්කාර ධාතුව පිළිබඳ ... මහණෙනි, ඉදින් මහණහට විඥනධාතුව පිළිබඳ රාගය ප්‍රහීණ වේ ද, රාගයාගේ ප්‍රහාණයෙන් අරමුණ සිඳෙයි. කර්ම විඥනයාගේ පිහිටීමෙක් නො වෙයි. නො පිහිටි එ විඥනය විරූඪියට නො පැමිණියේ ප්‍රතිසන්ධිය අභිසංස්කරණය නො කොට මිදුණේ වෙයි, විමුක්ත හෙයින් ස්ථිත වෙයි, ස්ථිත හෙයින් සන්තුෂ්ට වෙයි, සන්තුෂ්ට හෙයින් ත්‍රස්ත නො වෙයි, ත්‍රස්ත නො වන්නේ තමා කෙරෙහි ම පිරිනිවේ යි. ජාතිය ක්ෂය වී යැ, බඹසර වැස නිමවිණැ, කරණී කරන ලද, තෙල අනුපාදපරිනිර්වාණය පිණිස කළ යුතු අන්කිසෙක් නැතැ යි නුවණින් දනී යි.

9-ජ 50066 (80/06)

## 1. 2. 1. 3.

## උදාන සුත්තං

**55. සාවත්ථියං :**

තත්‍ර ඛො භගවා උදානං උදානෙසි "නො චස්සං, නො ච මෙ සියා, න භවිස්සති, න මෙ භවිස්සතීති එවං විමුච්චමානො භික්ඛු ඡින්දෙය්‍යොරම්භාගියානි සංයොජනානී"ති.

එවං වුත්තෙ අඤ්ඤතරෙ භික්ඛු භගවන්තං එතදවොච : "යථාකථං පන භන්තෙ, නො චස්සං, නො ච මෙ සියා, න භවිස්සති, න මෙ භවිස්සතීති, එවං විමුච්චමානො භික්ඛු ඡින්දෙය්‍යොරම්භාගියානි සංයොජනානී"ති ?

ඉධ භික්ඛු, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං. සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති, සඞ්ඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සඞ්ඛාරෙ, සඞ්ඛාරෙසු වා අත්තානං. විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං.

සො අනිච්චං රූපං, 'අනිච්චං රූප'න්ති යථාභූතං නප්පජානාති අනිච්චං වෙදනං 'අනිච්චා වෙදනා'ති යථාභූතං නප්පජානාති. අනිච්චං සඤ්ඤං -පෙ- අනිච්චෙ සඞ්ඛාරෙ 'අනිච්චා සඞ්ඛාරා'ති යථාභූතං නප්පජානාති. අනිච්චං විඤ්ඤාණං 'අනිච්චං විඤ්ඤාණ'න්ති යථාභූතං නප්පජානාති.

දුක්ඛං රූපං 'දුක්ඛං රූප'න්ති යථාභූතං නප්පජානාති. දුක්ඛං වෙදනං 'දුක්ඛා වෙදනා'ති යථාභූතං නප්පජානාති. දුක්ඛං සඤ්ඤං -පෙ- දුක්ඛෙ සඞ්ඛාරෙ 'දුක්ඛා සඞ්ඛාරා'ති යථාභූතං නප්පජානාති. දුක්ඛං විඤ්ඤාණං 'දුක්ඛං විඤ්ඤාණන්ති' යථාභූතං නප්පජානාති.

අනත්තං රූපං 'අනත්තං රූප'න්ති යථාභූතං නප්පජානාති. අනත්තං වෙදනං 'අනත්තා වෙදනා'ති යථාභූතං නප්පජානාති. අනත්තං සඤ්ඤං -පෙ- අනත්තෙ සඞ්ඛාරෙ 'අනත්තා සඞ්ඛාරා'ති යථාභූතං නප්පජානාති. අනත්තං විඤ්ඤාණං 'අනත්තං විඤ්ඤාණ'න්ති යථාභූතං නප්පජානාති.

සඞ්ඛතං රූපං 'සඞ්ඛතං රූප'න්ති යථාභූතං නප්පජානාති. සඞ්ඛතං වෙදනං 'සඞ්ඛතා වෙදනා'ති යථාභූතං නප්පජානාති. සඞ්ඛතං සඤ්ඤං -පෙ- සඞ්ඛතෙ සඞ්ඛාරෙ 'සඞ්ඛතා සඞ්ඛාරා'ති යථාභූතං නප්පජානාති. සඞ්ඛතං විඤ්ඤාණං 'සඞ්ඛතං විඤ්ඤාණ'න්ති යථාභූතං නප්පජානාති.

## 1. 2. 1. 3.

## උදාන සූත්‍රය

55. සැවැත්නුවර :

එසඳ භාග්‍යවතුන්වහන්සේ (මෙ) ප්‍රීතිවාක්‍යය පහළ කළසේක : ''ඉදින් මම නො වූයෙම් නම්, මට අතීත කර්මාභිසංස්කාරයෙක් නො ද වී නම්, මතු ස්කන්ධ පහළ කරන කර්මසංස්කාරයෙක් නො වන්නේ යැ, (එය නැති කල්හි) මට (මතු ප්‍රතිසන්ධියක් නම්) නො වන්නේ යි. මෙසේ නිශ්චයට පැමිණෙන මහණ ඔරම්භාගිය සංයෝජන සිඳියි.''

මෙසේ වදළ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය : ''වහන්ස, කෙසේ නම් 'ඉදින් මම නො වූයෙම් නම්, මට අතීත කර්මාභිසංස්කාරයෙක් නො ද වී නම්, මතු ස්කන්ධ පහළ කරන කර්ම සංස්කාරයෙක් නො වන්නේ යැ, (එය නැති කල්හි) මට (මතු ප්‍රතිසන්ධියක් නම්) නො වන්නේ'යි මෙසේ හඳහන මහණ ඔරම්භාගිය සංයොජන සිඳුනේ දැයි ?

මහණ, බුද්ධාදි ආර්‍ය්‍යයන් නො දක්නා ආර්‍ය්‍යධර්මයෙහි අදක්ෂ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත, ... බුද්ධාදි සත්පුරුෂයන් නො දක්නා සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ සත්පුරුෂ ධර්මයෙහි අවිනීත අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ රූපය ආත්ම වශයෙන් දකියි. ආත්මය රූපවත් කොට හෝ ආත්මයෙහි රූපය ඇතැයි හෝ රූපයෙහි ආත්මය ඇතැයි හෝ දකියි. වේදනාව ආත්ම විසින් දකියි. ආත්මය වෙදනාවත් කොට හෝ ආත්මයෙහි වේදනාව ඇතැයි හෝ වේදනායෙහි ආත්මය ඇතැයි හෝ දකියි. සංඥාව ... සංස්කාර ආත්ම විසින් දකියි. ආත්මය සංස්කාර වත් කොට හෝ ආත්මයෙහි සංස්කාර ඇතැයි හෝ සංස්කාරයෙහි ආත්මය ඇතැයි හෝ දකියි. විඥානය ආත්ම විසින් දකියි, ආත්මය විඥානවත් කොට හෝ ආත්මයෙහි විඥානය හෝ, විඥානයෙහි ආත්මය හෝ දකියි.

හේ අනිත්‍ය වූ රූපය 'රූපය අනිත්‍ය' යි ඇති සැටි නො දනියි, අනිත්‍ය වූ වේදනාව 'වෙදනාව අනිත්‍ය'යි ඇති සැටි නො දනියි, අනිත්‍ය වූ සංඥාව ... අනිත්‍ය වූ සංස්කාර 'සංස්කාර අනිත්‍ය'යි ඇති සැටි නො දනියි, අනිත්‍ය වූ විඥාන ය 'විඥානය අනිත්‍ය'යි ඇති සැටි නො දනියි.

දුක් වූ, රූපය 'රූපය දුකැ'යි තත් වූ පරිදි නො දනියි, දුක් වූ වේදනාව 'වේදනාව දුකැ'යි තත් වූ පරිදි නො දනියි. දුක් වූ සංඥාව ... දුක් වූ සංස්කාර 'සංස්කාර දුකැ'යි තත් වූ පරිදි නො දනියි, දුක් වූ විඥානය 'විඥානය දුකැ'යි තත් වූ පරිදි නො දනියි.

අනාත්ම වූ රූපය 'රූපය අනාත්ම'යි යථාභූත කොට නො දනියි, අනාත්ම වූ වේදනාව 'වේදනාව අනාත්ම'යි යථාභූත කොට නො දනියි, අනාත්ම වූ සංඥාව ... අනාත්ම වූ සංස්කාර 'සංස්කාර අනාත්ම'යි යථාභූත කොට නො දනියි.

සංඛත වූ ප්‍රත්‍යයෝත්පන්න රූපය 'රූපය සංඛත' යයි තත්ත්වාකාරයෙන් නො දනියි. සංඛත වූ වේදනාව 'වේදනාව සංඛත ය'යි තත්ත්වාකාරයෙන් නො දනියි, සංඛත වූ සංඥාව ... සංඛත වූ සංස්කාර 'සංස්කාර සංඛතහ'යි තත්ත්වාකාරයෙන් නො දනියි, සංඛත වූ විඥානය 'විඥානය සංඛත'යයි තත්ත්වාකාරයෙන් නො දනියි.

රූපං විභවිස්සතීති යථාභූතං නප්පජානාති. වෙදනා-පෙ-සඤ්ඤා -පෙ- සඞ්ඛාරා විභවිස්සන්තීති යථාභූතං නප්පජානාති. විඤ්ඤාණං විභවිස්සතීති යථාභූතං නප්පජානාති.

සුතවා ච ඛො භික්ඛු[1], අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති. න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං, න වෙදනං අත්තතො සමනුපස්සති, න වෙදනාවන්තං වා අත්තානං, න අත්තනි වා වෙදනං, න වෙදනාය වා අත්තානං, න සඤ්ඤං -පෙ-න සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති. න සඞ්ඛාරවන්තං වා අත්තානං, න අත්තනි වා සඞ්ඛාරෙ, න සඞ්ඛාරෙසු වා අත්තානං. න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං.

සො අනිච්චං රූපං 'අනිච්චං රූපන්ති' යථාභූතං පජානාති. අනිච්චං වෙදනං 'අනිච්චා වෙදනා'ති -පෙ- අනිච්චං සඤ්ඤං -පෙ- අනිච්චෙ සඞ්ඛාරෙ 'අනිච්චා සඞ්ඛාරා'ති -පෙ- අනිච්චං විඤ්ඤාණං 'අනිච්චං විඤ්ඤාණන්ති යථාභූතං පජානාති.

දුක්ඛං රූපං 'දුක්ඛං රූපන්ති' යථාභූතං පජානාති දුක්ඛං වෙදනං -පෙ- දුක්ඛං සඤ්ඤං -පෙ- දුක්ඛෙ සඞ්ඛාරෙ -පෙ- දුක්ඛං විඤ්ඤාණං 'දුක්ඛං විඤ්ඤාණන්ති' යථාභූතං පජානාති.

අනත්තං රූපං 'අනත්තං රූපන්ති' යථාභූතං පජානාති. අනත්තං වෙදනං -පෙ- අනත්තං සඤ්ඤං -පෙ- අනත්තෙ සඞ්ඛාරෙ -පෙ- අනත්තං විඤ්ඤාණං 'අනත්තං විඤ්ඤාණන්ති' යථාභූතං පජානාති.

සඞ්ඛතං රූපං 'සඞ්ඛතං රූපන්ති' යථාභූතං පජානාති. සඞ්ඛතං වෙදනං -පෙ- සඞ්ඛතං සඤ්ඤං -පෙ- සඞ්ඛතෙ සඞ්ඛාරෙ -පෙ- සඞ්ඛතං විඤ්ඤාණං 'සඞ්ඛතං විඤ්ඤාණන්ති' යථාභූතං පජානාති.

රූපං විභවිස්සතීති යථාභූතං පජානාති, වෙදනා විභවිස්සතීති -පෙ- සඤ්ඤා විභවිස්සතීති -පෙ- සඞ්ඛාරා විභවිස්සන්තීති -පෙ- විඤ්ඤාණං විභවිස්සතීති යථාභූතං පජානාති.

සො රූපස්ස විභවා, වෙදනාය විභවා, සඤ්ඤාය විභවා, සඞ්ඛාරානං විභවා, විඤ්ඤාණස්ස විභවා එවං ඛො භික්ඛු ''නො චස්සං, නො ච මෙ සියා, න භවිස්සති, න මෙ භවිස්සති''ති, එවං විමුච්චමානො භික්ඛු ඡින්දෙය්‍යොරම්භාගියානි සංයොජනානීති ?

එවං විමුච්චමානො භන්තෙ, භික්ඛු ඡින්දෙය්‍යොරම්භාගියානි සංයොජනානීති.

---

1. භික්ඛවෙ - සිමු.

රූපය බිඳේ යයි ඇති සැටි නො දනියි, වේදනාව ... සංඥාව ... සංස්කාර බිඳේ යයි ඇති සැටි නො දනියි, විඥානය බිඳේ යයි ඇතිසැටි නො දනී.

මහණෙ, ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙමේ (බුද්ධාදී) ආර්‍යයන් දක්නේ ආර්‍ය ධර්මයෙහි දක්ෂ වූයේ ආර්‍යධර්මයෙහි මොනොවට විනීත වූයේ, (බුද්ධාදී) සත්පුරුෂයන් දක්නේ සත්පුරුෂධර්මයෙහි දක්ෂ වූයේ සත්පුරුෂධර්මයෙහි මොනොවට විනීත වූයේ රූපය ආත්ම විසින් නො දකියි, ආත්මය රූපවත් කොට හෝ නො දකියි, ආත්මයෙහි රූපය ඇතැයි හෝ නො දකියි, රූපයෙහි ආත්මය ඇතැයි හෝ නො දකියි. වෙදනාව ආත්ම විසින් නො දකියි, ආත්මය වෙදනාවත් කොට හෝ නො දකියි, ආත්මයෙහි වෙදනාව ඇතැයි හෝ නො දකියි, වෙදනායෙහි ආත්මය ඇතැයි හෝ නො දකියි. සංඥාව ආත්ම විසින් නො දකියි ... සංස්කාර ආත්ම විසින් නො දකියි, ආත්මය සංස්කාරවත් කොට හෝ නො දකියි, ආත්මයෙහි සංස්කාර ඇතැයි හෝ නො දකියි, සංස්කාරයෙහි ආත්මය ඇතැයි හෝ නො දකියි, විඥානය ආත්ම විසින් නො දකියි, ආත්මය විඥානවත් කොට හෝ නො දකියි, ආත්මයෙහි විඥානය ඇතැයි හෝ නො දකියි, විඥානයෙහි ආත්මය ඇතැයි හෝ නො දකියි.

හේ අනිත්‍ය වූ රූපය 'රූපය අනිත්‍ය'යි තත් වූ පරිදි දනියි, අනිත්‍ය වූ වේදනාව 'වේදනාව අනිත්‍ය'යි ... අනිත්‍ය වූ සංඥාව ... අනිත්‍ය වූ සංස්කාර 'සංස්කාර අනිත්‍යහ'යි ... අනිත්‍ය වූ විඥානය 'විඥානය අනිත්‍ය'යි තත්වූ පරිදි දනී.

දුක් වූ රූපය 'රූපය දුකැයි ඇති සැටි දනියි, දුක් වූ වේදනාව ... දුක් වූ සංඥාව ... දුක් වූ සංස්කාර ... දුක් වූ විඥානය 'විඥානය දුකැයි ඇති සැටි දනියි.

අනාත්ම වූ රූපය 'රූපය අනාත්ම' යයි ඇතිසැටි දනියි, අනාත්ම වූ වේදනාව ... අනාත්ම වූ සංඥාව ... අනාත්ම වූ සංස්කාර ... අනාත්ම වූ විඥානය 'විඥානය අනාත්ම' යයි ඇති සැටි දනියි.

සංඛත වූ රූපය 'රූපය සංඛත'යයි යථාභූතකොට දනියි, සංඛත වූ වේදනාව ... සංඛත වූ සංඥාව ... සංඛත වූ සංස්කාර ... සංඛත වූ විඥානය 'විඥානය සංඛත'යයි යථාභූත කොට දනී.

රූපය බිඳේ යයි තත්ත්වාකාරයෙන් දනියි, වේදනාව බිඳේයයි ... සංඥාව බිඳේයයි ... සංස්කාර බිඳේයයි ... විඥානය බිඳේ යයි තත්ත්වකාරයෙන් දනී.

මහණෙ, මෙසේ හෙ රූපයාගේ විභව දර්ශනයෙන්, වේදනාවගේ විභවදර්ශනයෙන්, සංඥාවගේ විභවදර්ශනයෙන්, සංස්කාරයන්ගේ විභවදර්ශනයෙන්, විඥානයාගේ විභව දර්ශනයෙන් ''ඉදින් මම නො වූයෙම් නම්, අතීත කර්මාභිසංස්කාරයෙක් නො වී නම්, මට මතු ස්කන්ධ පහළකරන කර්මසංස්කාරයෙක් නො වන්නේය. (එය නැති කල්හි) මට (මතු ප්‍රතිසන්ධියක්) නො වන්නේ'යි මෙසේ හදහන මහණ ඔරම්භාගිය සංයෝජන සිඳුනේ දැයි ?

වහන්ස, මෙසේ හදහන මහණ ඕරම්භාගිය සංයෝජන සිඳින්නේ මැයි.

''කථං පන භන්තෙ, ජානතො කථං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොතී''ති?

ඉධ භික්ඛු, අස්සුතවා පුථුජ්ජනො අතසිතායෙ ඨානෙ තාසං ආපජ්ජති, තාසො හෙසො භික්ඛු, අස්සුතවතො පුථුජ්ජනස්ස ''නො චස්සං, නො ච මෙ සියා, න භවිස්සති, න මෙ භවිස්සතී'ති.

සුතවා ච ඛො භික්ඛු, අරියසාවකො අතසිතායෙ ඨානෙ න තාසං ආපජ්ජති. න හෙසො භික්ඛු, තාසො සුතවතො අරියසාවකස්ස නො චස්සං, නො ච මෙ සියා, න භවිස්සති. න මෙ භවිස්සතීති.

රූපූපයං වා භික්ඛු, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය, රූපාරම්මණං රූපප්පතිට්ඨං, නන්දූපසෙවනං, වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍ය. වෙදනූපයං වා භික්ඛු, -පෙ- සඤ්ඤූපයං වා භික්ඛු, -පෙ- සඞ්ඛාරූපයං වා භික්ඛු, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨෙය්‍ය, සඞ්ඛාරාරම්මණං සඞ්ඛාරප්පතිට්ඨං නන්දූපසෙවනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජෙය්‍ය.

යො භික්ඛු,[1] එවං වදෙය්‍ය: අහමඤ්ඤත්‍ර රූපා, අඤ්ඤත්‍ර වෙදනාය, අඤ්ඤත්‍ර සඤ්ඤාය, අඤ්ඤත්‍ර සඞ්ඛාරෙහි විඤ්ඤාණස්ස ආගතිං වා ගතිං වා චුතිං වා උපපත්තිං වා වුද්ධිං වා විරූළ්හිං වා වෙපුල්ලං වා පඤ්ඤාපෙස්සාමීති නෙතං ඨානං විජ්ජති.

රූපධාතුයා චෙ භික්ඛු, භික්ඛුනො රාගො පහීනො හොති, රාගස්ස පහානා වොච්ඡිජ්ජතාරම්මණං පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති, වෙදනාධාතුයා චෙ භික්ඛු, භික්ඛුනො -පෙ- සඤ්ඤාධාතුයා චෙ භික්ඛු, භික්ඛුනො -පෙ- සඞ්ඛාරධාතුයා චෙ භික්ඛු, භික්ඛුනො -පෙ- විඤ්ඤාණධාතුයා චෙ භික්ඛු, භික්ඛුනො රාගො පහීනො හොති. රාගස්ස පහානා වොච්ඡිජ්ජතාරම්මණං පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති. තදප්පතිට්ඨිතං විඤ්ඤාණං අවිරූළ්හං අනභිසඞ්ඛච්ච විමුත්තං. විමුත්තත්තා ඨිතං. ඨිතත්තා සන්තුසිතං. සන්තුසිතත්තා න පරිතස්සති. අපරිතස්සං පච්චත්තං යෙව පරිනිබ්බායති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති. එවං ඛො භික්ඛු, ජානතො එවං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොතීති.

## 1. 2. 1. 4.

## උපාදන පරිවත්ත සුත්තං

56. සාවත්ථියං:

පඤ්චිමෙ භික්ඛවෙ, උපාදානක්ඛන්ධා, කතමෙ පඤ්ච: සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො, වෙදනූපාදානක්ඛන්ධො, සඤ්ඤූපාදානක්ඛන්ධො, සඞ්ඛාරූපාදානක්ඛන්ධො, විඤ්ඤාණූපාදානක්ඛන්ධො, යාවකීවඤ්චාහං භික්ඛවෙ, ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ චතුපරිවත්තං[2] යථාභූතං නාබ්භඤ්ඤාසිං, නෙව තාවාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං

1. සො භික්ඛු - සීමු.
2. චතුපරිවට්ටං - මජසං.

වහන්ස, කෙසේ දන්නාහට කෙසේ දක්නාහට විදර්ශනාවට අනතුරු ව, ආශ්‍රවක්ෂය සංඛ්‍යාත අර්හත්ඵලය වේ ද ?

මහණ, මේ ලෝකයෙහි අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ ත්‍රස්ත (භය) නො වියයුතු කරුණෙහි ත්‍රාසයට පැමිණෙයි. මහණ, ''ඉදින්, මම නො වූයෙම් නම්, මට, අතීත කර්මාභිසංස්කාරයෙක් නො වී නම්, මතු ස්කන්ධ පහළකරන කර්මසංස්කාරයෙක් නො වන්නේ යැ, (එය නැති කල්හි) මට මතු ප්‍රතිසන්ධියක් නො වන්නේ යැ'' යන තෙලෙ, අශ්‍රැතවත් පෘථග්ජනහට ත්‍රාසයෙකි.

මහණ, ශ්‍රැතවත් ආර්යශ්‍රාවක තෙමේ ත්‍රාය නො කළ යුතු කරුණෙහි ත්‍රාසයට නො පැමිණෙයි, මහණ, ශ්‍රැතවත් ආර්යශ්‍රාවක හට '' ඉදින් මම නො වී නම්, මට අතීත කර්මාභිසංස්කාරයෙක් නො වී නම් මතු ස්කන්ධ පහළකරන කර්මසංස්කාරයෙක් නො වන්නේ යැ, (එය නැතිකල්හි) මට ප්‍රතිසන්ධියක් නො වන්නේ යැ '' යන තෙලෙ ත්‍රාසයෙක් නො වෙයි.

මහණ, රූපයට පැමිණි සිටුනා කර්මවිඥානය රූපය අරමුණු කොට රූපය පිහිට කොට සිටුනේ යැ, තෘෂ්ණායෙන් තෙත් වූයේ වෘද්ධියට විරූඪියට විපුලත්වයට පැමිණෙයි. මහණ, වෙදනාවට හෝ පැමිණි ... මහණ, සංඥාවට හෝ පැමිණි, මහණ, සංස්කාරයනට හෝ පැමිණි සිටුනා කර්මවිඥානය සංස්කාර අරමුණු කොට සංස්කාර පිහිට කොට සිටුනේ යැ. තෘෂ්ණායෙන් තෙත්වූයේ වෘද්ධියට විරූඪියට විපුලත්වයට පැමිණෙයි.

මහණ යමෙක් මෙසේ කියා නම් : (කිසේ යැ)'' මම රූපය තබා, වෙදනාව තබා, සංඥාව තබා, සංස්කාර තබා, විඥානයාගේ ඊම හෝ යෑම හෝ චුතිය හෝ උත්පත්තිය හෝ වෘද්ධිය හෝ විරූඪිය හෝ විපුලත්වය හෝ පනවමි '' යි තෙල කරුණ විද්‍යමාන නො වේ.

මහණ, ඉදින් රූපධාතුව පිළිබඳ භික්ෂුහට රාගය ප්‍රහීණ වේ ද, රාගප්‍රහාණයෙන් අරමුණ සිඳෙයි, විඥානයට ප්‍රතිෂ්ඨා නො වෙයි, මහණ, ඉදින් මහණහට වේදනා ධාතුව පිළිබඳ ... මහණ, ඉදින් මහණහට සංඥාධාතුව පිළිබඳ ... මහණ, ඉදින් මහණහට සංස්කාර ධාතුව පිළිබඳ ... මහණ, ඉදින් මහණහට විඥානධාතුව පිළිබඳ රාගය ප්‍රහීණ වේ ද, රාගප්‍රහාණයෙන් අරමුණ සිඳෙයි, විඥානයට ප්‍රතිෂ්ඨා නො වෙයි. ප්‍රතිෂ්ඨා රහිත ඒ විඥානය අනභිවෘද්ධියට අවිරූඪියට අවිපුලත්වයට පැමිණියේ ප්‍රතිසන්ධිය සකස් නො කොට (සසරින්) මිදුණේ වෙයි. මිදුණු හෙයින් ස්ථිත වෙයි, ස්ථිත හෙයින් සන්තුෂ්ට වෙයි, සන්තුෂ්ට හෙයින් ත්‍රාසයට නො පැමිණෙයි, ත්‍රාසයට නො පැමිණෙනුයේ තෙමේ ම පිරිනිවෙයි. ජාතිය ක්ෂය වියැ, මග බඹසර වැස නිමවන ලදි. කරණී කරන ලද, මෙ අර්හත්වය පිණිස අන්කිසෙක් නැතැයි දන ගනියි. මහණ, මෙසේ දන්නාහට මෙසේ දක්නාහට විදර්ශනාවට අනතුරු ව, ආශ්‍රවක්ෂය (අර්හත්වය) වේ යයි (වදළ සේක්).

## 1. 2. 1. 4.

## උපාදාන පරිවත්ත සූත්‍රය

**56.** සැවැත්නුවර :

මහණෙනි, මේ උපාදානස්කන්ධ පසෙකි. කවර පසෙක යත් : ඒ මෙසේ යැ : රූපෝපාදානස්කන්ධය, වේදනොපාදානස්කන්ධය, සංඥොපාදානස්කන්ධය, සංස්කාරෝපාදානස්කන්ධය, විඥානොපාදානස්කන්ධ යි. මහණෙනි, යම්තාක් මම මේ පඤ්චෝපාදානස්කන්ධයන් චතුෂ්පරිවර්ත වශයෙන් ඇතිසැටි අවබෝධ නො කෙළෙම් ද මහණෙනි, ඒ තාක් මම අභිසම්බුද්ධයෙමි යි දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වප්‍රජාව අතර අනුත්තර වූ

Free Distribution www.aathaapi.org

සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති පච්චඤ්ඤාසිං, යතො ච ඛොහං භික්ඛවෙ, ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ චතුපරිවට්ටං යථාභූතං අබ්භඤ්ඤාසිං, අථාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති පච්චඤ්ඤාසිං.

කථං චතුපරිවට්ටං[1] :

රූපං අබ්භඤ්ඤාසිං, රූපසමුදයං අබ්භඤ්ඤාසිං, රූපනිරොධං අබ්භඤ්ඤාසිං, රූපනිරොධගාමිනිං පටිපදං අබ්භඤ්ඤාසිං, වෙදනං අබ්භඤ්ඤාසිං, -පෙ- සඤ්ඤං අබ්භඤ්ඤාසිං, -පෙ- සඞ්ඛාරෙ අබ්භඤ්ඤාසිං, -පෙ- විඤ්ඤාණං අබ්භඤ්ඤාසිං, විඤ්ඤාණසමුදයං අබ්භඤ්ඤාසිං, විඤ්ඤාණනිරොධං අබ්භඤ්ඤාසිං, විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං අබ්භඤ්ඤාසිං.

කතමඤ්ච භික්ඛවෙ, රූපං :

චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං. ඉදං වුච්චති භික්ඛවෙ, රූපං. ආහාරසමුදයා රූපසමුදයො, ආහාරනිරොධා රූපනිරොධො, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො රූපනිරොධගාමිනී පටිපදා, සෙය්‍යථීදං : සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි.

යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං රූපං අභිඤ්ඤාය එවං රූපසමුදයං අභිඤ්ඤාය එවං රූපනිරොධං අභිඤ්ඤාය එවං රූපනිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය රූපස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නා, තෙ සුපටිපන්නා[2], යෙ සුපටිපන්නා, තෙ ඉමස්මිං ධම්මවිනයෙ ගාධන්ති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං රූපං අභිඤ්ඤාය එවං රූපසමුදයං අභිඤ්ඤාය එවං රූපනිරොධං අභිඤ්ඤාය එවං රූපනිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය, රූපස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තා, තෙ සුවිමුත්තා, යෙ සුවිමුත්තා, තෙ කෙවලිනො, යෙ කෙවලිනො, වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය.

කතමා ච භික්ඛවෙ, වෙදනා :

ඡයිමෙ භික්ඛවෙ, වෙදනාකායා : චක්ඛුසම්ඵස්සජා වෙදනා, සොතසම්ඵස්සජා වෙදනා, ඝානසම්ඵස්සජා වෙදනා, ජිව්හාසම්ඵස්සජා වෙදනා, කායසම්ඵස්සජා වෙදනා, මනොසම්ඵස්සජාවෙදනා, අයං වුච්චති භික්ඛවෙ, වෙදනා. ඵස්සසමුදයා වෙදනාසමුදයො, ඵස්සනිරොධා වෙදනානිරොධො, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො වෙදනානිරොධගාමිනී පටිපදා, සෙය්‍යථීදං : සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

1. චතුපරිවට්ටං - මජසං.
2. සුප්පටිපන්නා - සීමු, මජසං.

සම්‍යක්සම්බොධිය අභිසම්බුද්ධයෙමි ප්‍රතිඥා නො කෙළෙමි. මහණෙනි මම යම් කලෙක පටන් මේ පඤ්චෝපාදනස්කන්ධයන් චතුෂ්පරිවර්ත වශයෙන් ඇතිසැටි අවබෝධ කෙළෙම් ද, මහණෙනි, එකල්හි මම සම්බුද්ධයෙමි යි දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත සත්ත්වප්‍රජාව අතර අනුත්තර සම්‍යක් සම්බෝධිය අභිසම්බුද්ධයෙමි ප්‍රතිඥා කෙළෙමි.

චතුෂ්පරිවර්තය කෙසේ යැ :

රූපය අවබෝධ කෙළෙමි, රූපසමුදය අවබෝධ කෙළෙමි, රූපනිරෝධය අවබෝධ කෙළෙමි, රූපනිරෝධගාමිනීපටිපදාව අවබෝධ කෙළෙමි. වේදනාව අවබෝධ කෙළෙමි ... සංඥාව අවබෝධ කෙළෙමි ... සංස්කාර අවබෝධ කෙළෙමි ... විඥානය අවබෝධ කෙළෙමි, විඥානසමුදය අවබෝධ කෙළෙමි, විඥානනිරොධය අවබෝධ කෙළෙමි, විඥානනිරොධගාමිනී ප්‍රතිපදාව අවබෝධ කෙළෙමි.

මහණෙනි, රූපය කවරෙ යැ :

සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූප ද මහණෙනි, මෙ 'රූප' යි කියනු ලැබේ. ආහාර සමුදයයෙන් රූපසමුදය වෙයි. ආහාරනිරෝධයෙන් රූප නිරෝධය වෙයි. මේ අරිඅටඟි මග ම රූපනිරොධගාමිනීපටිපදා යි. එ මෙසේ යැ : සම්‍යග්දෘෂ්ටි ය, සම්‍යක්සඞ්කල්ප ය, සම්‍යග්වචන ය, සම්‍යක්කර්මාන්ත ය, සම්‍යගාජීව ය, සම්‍යග්ව්‍යායාම ය, සම්‍යක්ස්මෘති ය, සම්‍යක්සමාධි යි.

මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් වෙත් වයි බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි මෙසේ රූපය දැන, මෙසේ රූපසමුදය දැන, මෙසේ රූපනිරොධය දැන, මෙසේ රූපනිරොධ ගාමිනීපටිපදාව දැන රූපයාගේ නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නාහු වෙත් ද, ඔහු තුමූ සුපිළිපන්හ, යම් කෙනෙක් සුපිළිපන් වෙත් ද, උහු මේ ශාසනයෙහි පිහිටා සිටිත්.

මහණෙනි යම් කිසි මහණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මෙසේ රූපය දැන, රූපසමුදය දැන, රූපනිරෝධය දැන, රූපනිරෝධගාමිනීපටිපදාව දැන රූපයාගේ නිර්වේදයෙන් විරාගයෙන් නිරෝධයෙන් උපාදානය නො කොට (තණ්හාදි වශයෙන් අල්වා නො ගෙන) මිදුණාහු වෙත් ද, ඔහු සුවිමුක්තයහ. යම් කෙනෙක් සුවිමුක්ත ද, ඔහු කේවලීහ (කළ සියලුකිස ඇතියහ). යම් කෙනෙක් කේවලී ද, ඔවුනට පැනවීමට වර්තයෙක් (කරුණක්) නැත.

මහණෙනි, වේදනාව කවර යැ :

මහණෙනි, මේ වේදනා සමූහ සයෙකි : චක්ෂුෂ් ස්පර්ශයෙන් උපන් වේදනා යැ, ශ්‍රෝතස්පර්ශයෙන් උපන් වේදනා යැ, ඝ්‍රාණස්පර්ශයෙන් උපන් වේදනා යැ, ජිහ්වා ස්පර්ශයෙන් උපන් වේදනා යැ, කායස්පර්ශයෙන් උපන් වේදනා යැ, මනස්ස්පර්ශයෙන් උපන් වේදනා යි. මහණෙනි, මේ වේදනා යි කියනු ලැබේ. ස්පර්ශ සමුදයයෙන් වේදනාසමුදය වෙයි. ස්පර්ශනිරෝධයෙන් වේදනානිරෝධය වෙයි. මේ ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය ම වේදනානිරෝධගාමිනී ප්‍රතිපද ය. එ මෙසේ යැ : සම්‍යග්දෘෂ්ටි ය ... සම්‍යක් සමාධි යි.

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං වෙදනං අභිඤ්ඤාය එවං වෙදනාසමුදයං අභිඤ්ඤාය එවං වෙදනානිරොධං අභිඤ්ඤාය එවං වෙදනානිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය වෙදනාය නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නා, තෙ සුපටිපන්නා. යෙ සුපටිපන්නා, තෙ ඉමස්මිං ධම්මවිනයෙ ගාධන්ති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං වෙදනං අභිඤ්ඤාය එවං වෙදනාසමුදයං අභිඤ්ඤාය එවං වෙදනානිරොධං අභිඤ්ඤාය එවං වෙදනානිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය වෙදනාය නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තා, තෙ සුවිමුත්තා, යෙ සුවිමුත්තා, තෙ කෙවලිනො, යෙ කෙවලිනො, වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය.

කතමා ච භික්ඛවෙ, සඤ්ඤා :

ඡයිමෙ භික්ඛවෙ, සඤ්ඤාකායා : රූපසඤ්ඤා සද්දසඤ්ඤා ගන්ධසඤ්ඤා රසසඤ්ඤා ඵොට්ඨබ්බසඤ්ඤා ධම්මසඤ්ඤා, අයං වුච්චති භික්ඛවෙ, සඤ්ඤා. ඵස්සසමුදයා සඤ්ඤාසමුදයො, ඵස්සනිරොධා සඤ්ඤානිරොධො, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඤ්ඤානිරොධගාමිනීපටිපදා : සෙය්‍යථිදං : සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං සඤ්ඤං අභිඤ්ඤාය -පෙ- වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය.

කතමෙ ච භික්ඛවෙ, සඞ්ඛාරා :

ඡයිමෙ භික්ඛවෙ, චෙතනාකායා : රූපසඤ්චෙතනා සද්දසඤ්චෙතනා ගන්ධසඤ්චෙතනා රසසඤ්චෙතනා ඵොට්ඨබ්බසඤ්චෙතනා ධම්මසඤ්චෙතනා, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, සඞ්ඛාරා. ඵස්සසමුදයා සඞ්ඛාරසමුදයො, ඵස්සනිරොධා සඞ්ඛාරනිරොධො, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ඛාරනිරොධගාමිනී පටිපදා : සෙය්‍යථිදං : සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං සඞ්ඛාරෙ අභිඤ්ඤාය -පෙ- වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය.

කතමඤ්ච භික්ඛවෙ, විඤ්ඤාණං :

ඡයිමෙ භික්ඛවෙ, විඤ්ඤාණකායා: චක්ඛුවිඤ්ඤාණං, සොතවිඤ්ඤාණං, ඝානවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, කායවිඤ්ඤාණං, මනොවිඤ්ඤාණං, ඉදං වුච්චති භික්ඛවෙ, විඤ්ඤාණං. නාමරූපසමුදයා විඤ්ඤාණසමුදයො, නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො විඤ්ඤාණනිරොධගාමිනී පටිපදා : සෙය්‍යථිදං : සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං විඤ්ඤාණං අභිඤ්ඤාය, එවං විඤ්ඤාණසමුදයං අභිඤ්ඤාය එවං විඤ්ඤාණනිරොධං අභිඤ්ඤාය එවං විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය විඤ්ඤාණස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නා, තෙ සුපටිපන්නා, යෙ සුපටිපන්නා තෙ ඉමස්මිං ධම්මවිනයෙ ගාධන්ති.

මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මෙසේ වේදනාව දැන, මෙසේ වේදනාසමුදය දැන, මෙසේ වේදනානිරෝධය දැන, මෙසේ වේදනානිරෝධ ගාමිනීපටිපදාව දැන වේදනාවගේ නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නාහු ද, ඔහු සුප්‍රතිපන්නයහ. යම් කෙනෙක් සුප්‍රතිපන්න ද, ඔහු මේ ශාසනයෙහි පිහිටා සිටිත්.

මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මෙසේ වේදනාව දැන, වේදනාසමුදය දැන, වේදනානිරෝධය දැන, වේදනානිරෝධගාමිනීපටිපදාව දැන වේදනාව පිළිබඳ නිර්වේදයෙන් විරාගයෙන් නිරෝධයෙන් උපාදාන විසින් ග්‍රහණය නො කොට විමුක්ත වූවාහු ද, ඔහු සුවිමුක්ත වෙති. යම් කෙනෙක් සුවිමුක්ත ද, ඔහු කේවලී වෙති. යම් කෙනෙක් කේවලී වෙත් ද, ඔවුනට පැනවීමට වර්තයෙක් නැත.

මහණෙනි, සංඥා කවර යැ :

මහණෙනි, මේ සංඥා සමූහ සයෙකි : රූපසංඥා යැ, ශබ්ද සංඥා යැ, ගන්ධ සංඥා යැ, රසසංඥා යැ, ස්ප්‍රෂ්ටව්‍ය සංඥා යැ, ධර්මසංඥා යි. මහණෙනි, මේ 'සංඥා'යි කියනු ලැබේ: ස්පර්ශසමුදයයෙන් සංඥාසමුදය වෙයි. ස්පර්ශනිරෝධයෙන් සංඥානිරෝධය වෙයි. මේ ආර්ය අෂ්ටාඞ්ගිකමාර්ගය ම සංඥා නිරෝධගාමිනී ප්‍රතිපදාව වෙයි. එ මෙසේ යැ . සම්‍යග්දෘෂ්ටිය ... සම්‍යක්සමාධි යි.

මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මෙසේ සංඥාව දැන ... ඔවුනට පැනවීමට වර්තයෙක් නැත.

මහණෙනි, සංස්කාර කවරහු යැ :

මහණෙනි, මේ චේතනාරාශි සයෙකි : රූපසඤ්චේතනා යැ, ශබ්දසඤ්චේතනා යැ, ගන්ධසඤ්චේතනා යැ, රසසඤ්චේතනා යැ ස්ප්‍රෂ්ටව්‍ය සඤ්චේතනා යැ, ධර්මසඤ්චේතනා යි. මහණෙනි, මොහු සංස්කාර යි කියනු ලැබෙත්. ස්පර්ශ සමුදයයෙන් සංස්කාරසමුදය වෙයි. ස්පර්ශනිරෝධයෙන් සංස්කාරනිරෝධය වෙයි. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය ම සංස්කාරනිරෝධගාමිනී ප්‍රතිපද යි. එ මෙසේ යැ: සම්‍යග්දෘෂ්ටිය ... සම්‍යක්සමාධි යි.

මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් වෙත්වයි බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි මෙසේ සංස්කාර දැන ... ඔවුනට පැනවීමට වර්තයෙක් නැත.

මහණෙනි, විඥානය කවර යැ :

මහණෙනි, මේ විඥාන රාශි සයෙකි : (එනම්) චක්ෂුර්විඥාන යැ, ශ්‍රෝත්‍රවිඥාන යැ, ඝ්‍රාණවිඥාන යැ, ජිහ්වාවිඥාන යැ, කායවිඥාන යැ, මනෝවිඥාන යි. මහණෙනි, මෙ විඥාන යි කියනු ලැබේ. නාමරූප සමුදයෙන් විඥානසමුදය වෙයි. නාමරූපනිරෝධයෙන් විඥානනිරෝධය වෙයි. මේ ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය ම විඥානනිරෝධගාමිනී ප්‍රතිපද යි. එ මෙසේ යැ : සම්‍යග්දෘෂ්ටිය ... සම්‍යක් සමාධි යි.

මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් වෙත්වයි බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි මෙසේ විඥානය දැන, මෙසේ විඥානසමුදය දැන, මෙසේ විඥානනිරෝධය දැන, මෙසේ විඥාන නිරෝධගාමිනී ප්‍රතිපදාව දැන විඥානයාගේ නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස පිළිපන්නාහු වෙත් ද, ඔහු තුමූ මොනොවට පිළිපන්නාහු වෙති. යම් කෙනෙක් සුපිළිපන් වෙත් ද, ඔහු මේ ධර්මවිනයෙහි පිහිටා සිටිත්.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා එවං විඤ්ඤාණං අභිඤ්ඤාය එවං විඤ්ඤාණ සමුදයං අභිඤ්ඤාය. එවං විඤ්ඤාණනිරොධං අභිඤ්ඤාය, එවං විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය විඤ්ඤාණස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තා, තෙ සුවිමුත්තා, යෙ සුවිමුත්තා තෙ කෙවලිනො, යෙ කෙවලිනො වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනායාති.

## 1. 2. 1. 5.

### සත්තට්ඨාන සුත්තං

**57. සාවත්ථියං :**

සත්තට්ඨානකුසලො භික්ඛවෙ, භික්ඛු තිවිධූපපරික්ඛී ඉමස්මිං ධම්මවිනයෙ කෙවලී වුසිතවා උත්තමපුරිසොති.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සත්තට්ඨානකුසලො හොති :

ඉධ භික්ඛවෙ, භික්ඛු රූපං පජානාති, රූපසමුදයං පජානාති, රූපනිරොධං පජානාති, රූපනිරොධගාමිනිං පටිපදං පජානාති, රූපස්ස අස්සාදං පජානාති, රූපස්ස ආදීනවං පජානාති, රූපස්ස නිස්සරණං පජානාති.

වෙදනං පජානාති, වෙදනාසමුදයං පජානාති, වෙදනානිරොධං පජානාති, වෙදනානිරොධගාමිනිං පටිපදං පජානාති, වෙදනාය අස්සාදං පජානාති, වෙදනාය ආදීනවං පජානාති, වෙදනාය නිස්සරණං පජානාති.

සඤ්ඤං පජානාති -පෙ- සඞ්ඛාරෙ පජානාති, සඞ්ඛාරසමුදයං පජානාති, සඞ්ඛාරනිරොධං පජානාති, සඞ්ඛාරනිරොධගාමිනිං පටිපදං පජානාති, සඞ්ඛාරානං අස්සාදං පජානාති, සඞ්ඛාරානං ආදීනවං පජානාති, සඞ්ඛාරානං නිස්සරණං පජානාති.

විඤ්ඤාණං පජානාති, විඤ්ඤාණසමුදයං පජානාති, විඤ්ඤාණනිරොධං පජානාති, විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං පජානාති, විඤ්ඤාණස්ස අස්සාදං පජානාති විඤ්ඤාණස්ස ආදීනවං පජානාති, විඤ්ඤාණස්ස නිස්සරණං පජානාති.

කතමඤ්ච භික්ඛවෙ, රූපං :

චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං. ඉදං වුච්චති භික්ඛවෙ, රූපං. ආහාරසමුදයා රූපසමුදයො, ආහාරනිරොධා රූපනිරොධො, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො රූපනිරොධගාමිනී පටිපදා, සෙය්‍යථීදං : සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. යං රූපං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං රූපස්ස අස්සාදො. යං රූපං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං, අයං රූපස්ස ආදීනවො. යො රූපස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං රූපස්ස නිස්සරණං.

මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මෙසේ විඥනය දැන, මෙසේ විඥනසමුදය දැන, මෙසේ විඥනනිරෝධය දැන, මෙසේ විඥනනිරෝධ ගාමිනී ප්‍රතිපදව දැන විඥනයාගේ නිර්වේදයෙන් විරාගයෙන් නිරෝධයෙන් උපාදාන විසින් අල්වා නො ගෙන මිදුණාහු ද, ඔහු මොනොවට මිදුණාහු වෙති. යම් කෙනෙක් සුමුත්ත ද ඔහු කේවලීහ. යම් කෙනෙක් කේවලි වෙත් ද, ඔවුනට පැනවීමට වර්තයෙක් නැති යි වදළසේක.

## 1. 2. 1. 5.

## සත්තට්ඨාන සූත්‍රය

57. සැවැත්නුවර :

මහණෙනි, සත් තැනෙක දක්ෂ ත්‍රිවිධ උපපරීක්ෂා ඇති මහණ මෙ ධර්මවිනයෙහි කළ සැම කිස ඇති, වුසූ බඹසර ඇති උත්තමපුරුෂ යි කියනු ලැබේ.

මහණෙනි, මහණ කිසෙයින් සත්තට්ඨාන කුසල වේ ය යත් :

මහණෙනි, මෙ සස්නෙහි මහණ රූපය දනියි, රූප සමුදය දනියි, රූපනිරොධය දනියි, රූපනිරොධගාමිනීපටිපදව දනියි, රූපයාගේ ආස්වාදය දනියි, රූපයාගේ ආදීනව දනියි, රූපයාගේ නිශ්ශරණය දනී.

වේදනාව දනියි, වේදනා සමුදය දනියි, වේදනා නිරොධය දනියි, වේදනානිරොධගාමිනී පටිපදව දනියි, වේදනායෙහි ආස්වාදය දනියි, වේදනායෙහි ආදීනව දනියි, වේදනායෙහි නිශ්ශරණය දනී.

සංඥව දනියි ... සංස්කාර දනියි, සංස්කාරසමුදය දනියි, සංස්කාරනිරොධය දනියි, සංස්කාරනිරොධගාමිනීපටිපදව දනියි, සංස්කාරයන්ගේ ආස්වාදය දනියි, සංස්කාර යන්ගේ ආදීනව දනියි, සංස්කාරයන්ගේ නිශ්ශරණය දනී.

විඥනය දනියි, විඥනසමුදය දනියි, විඥනනිරොධය දනියි, විඥනනිරොධගාමිනී පටිපදව දනියි, විඥනයාගේ ආස්වාදය දනියි, විඥනයාගේ ආදීනව දනියි, විඥනයාගේ නිශ්ශරණය දනී.

මහණෙනි, රූපය කවරේ යැ :

සතර මහාභූතයෝ ද, සතරමහාභූතයන් නිසා පවත්නා රූප ද මහණෙනි, මෙ ''රූප'' යි කියනු ලැබේ. ආහාර සමුදයයෙන් රූපසමුදය වෙයි. ආහාරනිරෝධයෙන් රූපනිරොධය වෙයි. මෙ ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය ම රූපනිරෝධගාමිනීප්‍රතිපද යි. එ මෙසේ යැ : සම්‍යග්දෘෂ්ටිය ... සම්‍යක් සමාධි යි. රූපය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මෙ රූපයාගේ ආස්වාද යි. යම් රූපයක් අනිත්‍ය ද දුක් ද පෙරළෙන සැහැවි ඇත් ද මෙ රූපයාගේ ආදීනව යි. රූප විෂයෙහි යම් ඡන්ද රාගවිනයයෙක් ඡන්දරාගප්‍රහාණයෙක් ඇත් ද මෙ රූපයාගේ නිශ්ශරණ යි.

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං රූපං අභිඤ්ඤාය එවං රූපසමුදයං අභිඤ්ඤාය එවං රූපනිරොධං අභිඤ්ඤාය එවං රූපනිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය එවං රූපස්ස අස්සාදං අභිඤ්ඤාය එවං රූපස්ස ආදීනවං අභිඤ්ඤාය එවං රූපස්ස නිස්සරණං අභිඤ්ඤාය රූපස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නා, තෙ සුපටිපන්නා, යෙ සුපටිපන්නා තෙ ඉමස්මිං ධම්මවිනයෙ ගාධන්ති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං රූපං අභිඤ්ඤාය එවං රූපසමුදයං අභිඤ්ඤාය එවං රූපනිරොධං අභිඤ්ඤාය එවං රූපනිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය එවං රූපස්ස අස්සාදං අභිඤ්ඤාය එවං රූපස්ස ආදීනවං අභිඤ්ඤාය එවං රූපස්ස නිස්සරණං අභිඤ්ඤාය රූපස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තා, තෙ සුවිමුත්තා. යෙ සුවිමුත්තා තෙ කෙවලිනො, යෙ කෙවලිනො වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය.

කතමා ච භික්ඛවෙ, වෙදනා:

ඡයිමෙ භික්ඛවෙ, වෙදනාකායා: චක්ඛුසම්ඵස්සජා වෙදනා, සොතසම්ඵස්සජා වෙදනා, ඝානසම්ඵස්සජා වෙදනා ජිව්හාසම්ඵස්සජා වෙදනා කායසම්ඵස්සජා වෙදනා, මනොසම්ඵස්සජා වෙදනා අයං වුච්චති භික්ඛවෙ, වෙදනා. ඵස්සසමුදයා වෙදනාසමුදයො, ඵස්සනිරොධා වෙදනානිරොධො, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො වෙදනානිරොධගාමිනී පටිපදා, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. යං වෙදනං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං වෙදනාය අස්සාදො, යා වෙදනා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා, අයං වෙදනාය ආදීනවො, යො වෙදනාය ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං වෙදනාය නිස්සරණං.

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං වෙදනං අභිඤ්ඤාය එවං වෙදනාසමුදයං අභිඤ්ඤාය එවං වෙදනානිරොධං අභිඤ්ඤාය එවං වෙදනානිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය එවං වෙදනාය අස්සාදං අභිඤ්ඤාය, එවං වෙදනාය ආදීනවං අභිඤ්ඤාය, එවං වෙදනාය නිස්සරණං අභිඤ්ඤාය වෙදනාය නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නා. තෙ සුපටිපන්නා, යෙ සුපටිපන්නා තෙ ඉමස්මිං ධම්මවිනයෙ ගාධන්ති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං වෙදනං අභිඤ්ඤාය එවං වෙදනාසමුදයං අභිඤ්ඤාය එවං වෙදනා නිරොධං අභිඤ්ඤාය එවං වෙදනානිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය එවං වෙදනාය අස්සාදං අභිඤ්ඤාය එවං වෙදනාය ආදීනවං අභිඤ්ඤාය එවං වෙදනාය නිස්සරණං අභිඤ්ඤාය වෙදනාය නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තා, තෙ සුවිමුත්තා. යෙ සුවිමුත්තා තෙ කෙවලිනො. යෙ කෙවලිනො වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය.

Free Distribution www.aathaapi.org

මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මෙසේ රූපය දැන, මෙසේ රූපසමුදය දැන, මෙසේ රූපනිරෝධය දැන, මෙසේ රූපනිරෝධගාමිනී ප්‍රතිපදව දැන, මෙසේ රූපයේ ආස්වාද ය දැන මෙසේ රූපයාගේ ආදීනව දැන, මෙසේ රූපයාගේ නිශ්ශරණය දැන රූපයාගේ නිර්වේදය පිණිස විරාගය පිණිස, නිරෝධය පිණිස පිළිපන්නාහු වෙත් ද, ඔහු සුප්‍රතිපන්නයහ. යම් කෙනෙක් සුප්‍රතිපන්න ද ඔහු මේ ශාසනයෙහි පිහිටා සිටිත්.

මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මෙසේ රූපය දැන මෙසේ රූපසමුදය දැන, මෙසේ රූපනිරෝධය දැන, මෙසේ රූප නිරෝධගාමිනී පටිපදව දැන මෙසේ රූපයාගේ ආස්වාදය දැන, මෙසේ රූපයාගේ ආදීනව දැන, මෙසේ රූපයාගේ නිශ්ශරණය දැන, රූපයාගේ නිර්වේදයෙන් විරාගයෙන් නිරෝධයෙන් තෘෂ්ණාදි උපාදාන විසින් ග්‍රහණය නො කොට මිදුණාහු ද, ඔහු මොනොවට මිදුණාහු වෙති. යම් කෙනෙක් සුවිමුක්ත ද, ඔහු කේවලී වෙති. යම් කෙනෙක් කේවලී වෙත් ද, ඔවුනට පනවනු සඳහා වර්තයෙක් නැත.

මහණෙනි, වෙදනා කවර යැ :

මහණෙනි, වේදනා සමූහ සයෙකි. චක්ඛුසම්ඵස්සයෙන් උපන් වේදනා යැ, සෝත සම්ඵස්සයෙන් උපන් වෙදනා යැ, ඝානසම්ඵස්සයෙන් උපන් වේදනා යැ, ජිව්හාසම්ඵස්ස යෙන් උපන් වේදනා යැ, කායසම්ඵස්සයෙන් උපන් වේදනා යැ, මනොසම්ඵස්සයෙන් උපන් වේදනා යි. මහණෙනි, මෙ වේදනා යි කියනු ලැබෙ. ස්පර්ශසමුදයයෙන් වේදනාසමුදය වෙයි. ස්පර්ශනිරෝධයෙන් වේදනානිරෝධය වෙයි. මෙ අරිඅටඟි මග ම වෙදනානිරෝධගාමිනී පටිපද යි. එ මෙසේ යැ : සම්‍යග්දෘෂ්ටි ය ... සම්‍යක් සමාධි යි. වේදනාව නිසා යම් සුඛයෙක් සෞම්නසෙක් උපදනේ ද, මෙ වේදනාව පිළිබඳ ආස්වාද යි. යම් වේදනාවක් අනිත්‍ය ද, දුක් ද, පෙරළෙන සැහැවි ඇත් ද, මෙ වේදනාව පිළිබඳ ආදීනව යි. වේදනා පිළිබඳ යම් ඡන්දරාග විනයෙක් ඡන්දරාග ප්‍රහාණයෙක් ඇත් ද, මෙ වේදනාව පිළිබඳ නිශ්ශරණ යි.

මහණෙනි, යම්කිසි ශ්‍රමණකෙනෙක් වෙත්වයි, බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි මෙසේ වේදනාව දැන, මෙසේ වේදනාසමුදය දැන, මෙසේ වේදනානිරෝධය දැන, මෙසේ වේදනා නිරොධගාමිනීපටිපදව දැන, මෙසේ වෙදනායෙහි ආස්වාදය දැන, මෙසේ වේදනායෙහි ආදීනව දැන, මෙසේ වේදනායෙහි නිශ්ශරණය දැන, වේදනාවගේ නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස පිළිපන්නාහු වෙත් ද, ඔහු සුප්‍රතිපන්න වෙති. යම් කෙනෙක් සුප්‍රතිපන්න ද, ඔහු මේ ශාසනයෙහි පිහිටා සිටිත්.

මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මෙසේ වේදනාව දැන, මෙසේ වේදනාසමුදය දැන, මෙසේ වේදනානිරෝධය දැන, මෙසේ වේදනානිරොධ ගාමිනීපටිපදාව දැන, මෙසේ වෙදනාව පිළිබඳ ආස්වාදය දැන, මෙසේ වේදනාව පිළිබඳ ආදීනව දැන, මෙසේ වේදනා පිළිබඳ නිශ්ශරණය දැන, වේදනාවගේ නිර්වේදයෙන්, විරාගයෙන්, නිරොධයෙන් උපාදාන විසින් ග්‍රහණය නො කොට විමුක්ත වෙත් ද, ඔහු සුවිමුක්ත වෙති. යම් කෙනෙක් සුවිමුක්ත ද, ඔහු කේවලී වෙති. යම් කෙනෙක් කේවලී වෙත් ද, ඔවුනට පැනවීමට වර්තයෙක් නැත.

කතමා ච භික්ඛවෙ සඤ්ඤා:

ඡයිමෙ භික්ඛවෙ සඤ්ඤා: රූපසඤ්ඤා සද්දසඤ්ඤා ගන්ධසඤ්ඤා රසසඤ්ඤා ඵොට්ඨබ්බසඤ්ඤා ධම්මසඤ්ඤා. අයං වුච්චති භික්ඛවෙ, සඤ්ඤා -පෙ- වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය.

කතමෙ ච භික්ඛවෙ, සඞ්ඛාරා:

ඡයිමෙ භික්ඛවෙ චෙතනාකායා: රූපසඤ්චෙතනා සද්දසඤ්චෙතනා ගන්ධසඤ්චෙතනා රසසඤ්චෙතනා ඵොට්ඨබ්බසඤ්චෙතනා ධම්මසඤ්චෙතනා. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ සඞ්ඛාරා -පෙ- වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය.

කතමඤ්ච භික්ඛවෙ, විඤ්ඤාණං:

ඡයිමෙ භික්ඛවෙ, විඤ්ඤාණකායා: චක්ඛුවිඤ්ඤාණං -පෙ- මනොවිඤ්ඤාණං, ඉදං වුච්චති භික්ඛවෙ, විඤ්ඤාණං. නාමරූපසමුදයා විඤ්ඤාණසමුදයො, නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො විඤ්ඤාණනිරොධගාමිනීපටිපදා, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. යං විඤ්ඤාණං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං විඤ්ඤාණස්ස අස්සාදො, යං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං, අයං විඤ්ඤාණස්ස ආදීනවො. යො විඤ්ඤාණස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං විඤ්ඤාණස්ස නිස්සරණං.

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං විඤ්ඤාණං අභිඤ්ඤාය එවං විඤ්ඤාණසමුදයං අභිඤ්ඤාය එවං විඤ්ඤාණනිරොධං අභිඤ්ඤාය එවං විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය එවං විඤ්ඤාණස්ස අස්සාදං අභිඤ්ඤාය එවං විඤ්ඤාණස්ස ආදීනවං අභිඤ්ඤාය එවං විඤ්ඤාණස්ස නිස්සරණං අභිඤ්ඤාය විඤ්ඤාණස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නා, තෙ සුපටිපන්නා. යෙ සුපටිපන්නා, තෙ ඉමස්මිං ධම්මවිනයෙ ගාධන්ති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා එවං විඤ්ඤාණං අභිඤ්ඤාය එවං විඤ්ඤාණසමුදයං අභිඤ්ඤාය එවං විඤ්ඤාණනිරොධං අභිඤ්ඤාය එවං විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං අභිඤ්ඤාය, එවං විඤ්ඤාණස්ස අස්සාදං අභිඤ්ඤාය එවං විඤ්ඤාණස්ස ආදීනවං අභිඤ්ඤාය, එවං විඤ්ඤාණස්ස නිස්සරණං අභිඤ්ඤාය විඤ්ඤාණස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තා, තෙ සුවිමුත්තා. යෙ සුවිමුත්තා තෙ කෙවලිනො, යෙ කෙවලිනො වට්ටං තෙසං නත්ථි පඤ්ඤාපනාය. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සත්තට්ඨානකුසලො හොති.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු තිවිධූපපරික්ඛී හොති:

ඉධ භික්ඛවෙ, භික්ඛු ධාතුසො උපපරික්ඛති. ආයතනසො උපපරික්ඛති. පටිච්චසමුප්පාදසො උපපරික්ඛති, එවං ඛො භික්ඛවෙ, භික්ඛු තිවිධූපපරික්ඛී හොති.

සත්තට්ඨානකුසලො භික්ඛවෙ, භික්ඛු තිවිධූපපරික්ඛී ඉමස්මිං ධම්මවිනයෙ කෙවලී වුසිතවා උත්තමපුරිසොති වුච්චතීති.

මහණෙනි, සංඥා කවර යැ :

මහණෙනි, මේ සංඥාසමූහ සයෙකි : රූපසංඥා යැ, ශබ්දසංඥා යැ, ගන්ධසංඥා යැ, රසසංඥා යැ, ස්ප්‍රෂ්ටව්‍ය සංඥා යැ, ධර්මසංඥා යි. මහණෙනි, මෙ 'සංඥා'යි කියනු ලැබේ... ඔවුනට පැනවීමට වර්තයෙක් නැත.

මහණෙනි, සංස්කාර කවර යැ :

මහණෙනි, මේ චේතනාසමූහ සයෙකි : රූපසඤ්චේතනා යැ, ශබ්දසඤ්චේතනා යැ, ගන්ධසඤ්චේතනා යැ, රසසඤ්චේතනා යැ, ස්ප්‍රෂ්ටව්‍යසඤ්චේතනා යැ, ධර්මසඤ්චේතනා යි. මහණෙනි, මොහු 'සංස්කාර'යි කියනු ලැබෙත්. ... ඔවුනට පැනවීමට වර්තයෙක් නැත.

මහණෙනි, විඥානය කවර යැ :

මහණෙනි, මේ විඥානසමූහ සයෙකි : චක්ඛු විඤ්ඤාණ යැ ... මනොවිඤ්ඤාණ යි. මහණෙනි, මෙ විඥාන'යි කියනු ලැබේ. නාමරූප සමුදයයෙන් විඥාන සමුදය වෙයි. නාමරූපනිරොධයෙන් විඥාන නිරොධය වෙයි. මේ අරිඅටඟිමග ම විඥාන නිරොධ ගාමිනී ප්‍රතිපදාව යි : එ මෙසේ යැ : සම්‍යග් දෘෂ්ටිය ... සම්‍යක් සමාධි යි. විඥානය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මෙ විඥානයාගේ ආස්වාද යි. යම් විඥානයක් අනිත්‍ය ද, දුක් ද, පෙරළෙන සැහැවි ඇත් ද, මෙ විඥානයාගේ ආදීනව යි. විඥාන විෂයෙහි යම් ඡන්දරාග විනයයෙක් ඡන්දරාග ප්‍රහාණයෙක් ඇත් ද, මෙ විඥානයාගේ නිශ්ශරණ යි.

මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් වෙත්වයි බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි මෙසේ විඥානය දැන, මෙසේ විඥාන සමුදය දැන, මෙසේ විඥාන නිරෝධය දැන, මෙසේ විඥාන නිරොධගාමිනීප්‍රතිපදාව දැන, මෙසේ විඥානයාගේ ආස්වාදය දැන, මෙසේ විඥානයාගේ ආදීනව දැන, මෙසේ විඥානයාගේ නිශ්ශරණය දැන, විඥානයාගේ නිර්වෙදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස පිළිපන්නාහු වෙත් ද, ඔහු තුමූ සුප්‍රතිපන්නයහ. යම් කෙනෙක් සුප්‍රතිපන්න ද, ඔහු මේ ශාසනයෙහි පිහිටා සිටිත්.

මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් වෙත්වයි, බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි මෙසෙයින් විඥානය දැන, මෙසෙයින් විඥාන සමුදය දැන, මෙසෙයින් විඥානනිරොධය දැන, මෙසෙයින් විඥාන නිරොධගාමිනී ප්‍රතිපදාව දැන, මෙසෙයින් විඥානයාගේ ආස්වාදය දැන, මෙසෙයින් විඥානයාගේ ආදීනව දැන, මෙසෙයින් විඥානයාගේ නිශ්ශරණය දැන, විඥාන පිළිබඳ නිර්වෙදයෙන් විරාගයෙන් නිරොධයෙන් තෘෂ්ණාදි උපාදාන විසින් දැඩිව නො ගෙන මිදුණාහු ද, ඔහුතුමූ මොනොවට මිදුණාහු වෙති. යම් කෙනෙක් මොනොවට මිදුණාහු ද, ඔහු කේවලීහ. යම් කෙනෙක් කේවලී වෙත් ද, ඔවුනට පනවනු සඳහා වර්තයෙක් නැති. මහණෙනි, මෙසෙයින් වනාහි මහණ සත්තැනෙක දක්ෂ වූයේ වෙයි.

මහණෙනි, කිසෙයින් මහණ ත්‍රිවිධ උපපරීක්ෂා ඇති වේය යත් :

මහණෙනි, මෙ සස්නෙහි මහණ ධාතු වශයෙන් විමසා බලයි, ආයතන වශයෙන් විමසා බලයි, පටිච්චසමුප්පාද වශයෙන් විමසා බලයි. මහණෙනි මෙසෙයින් වනාහි මහණ ත්‍රිවිධ උපපරීක්ෂා ඇති වෙයි.

මහණෙනි, සත්තැනෙක දක්ෂ වූ ත්‍රිවිධ උපපරීක්ෂා ඇති මහණ මේ ශාසනයෙහි (කළ සියලු කිස ඇති හෙයින්) කෙවලී යැ, (විසූ මග බඹසර ඇති හෙයින්) උෂිතවත් යැ, උත්තම පුරුෂ යි කියනු ලැබෙයි' වදළසේක.

10—ඡ 50066 (80/06)

## 1. 2. 1. 6.

## සම්බුද්ධ සුත්තං

**58. සාවත්ථියං :**

තථාගතො භික්ඛවෙ, අරහං සම්මාසම්බුද්ධො රූපස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදාවිමුත්තො සම්මාසම්බුද්ධො'ති වුච්චති, භික්ඛුපි භික්ඛවෙ, පඤ්ඤාවිමුත්තො රූපස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො 'පඤ්ඤාවිමුත්තො'ති වුච්චති.

තථාගතො භික්ඛවෙ, අරහං සම්මාසම්බුද්ධො වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදාවිමුත්තො 'සම්මාසම්බුද්ධො'ති වුච්චති. භික්ඛුපි භික්ඛවෙ, පඤ්ඤාවිමුත්තො විඤ්ඤාණස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදාවිමුත්තො 'පඤ්ඤාවිමුත්තො'ති වුච්චති.

තත්‍ර භික්ඛවෙ, කො විසෙසො කො අධිප්පායො කිං නානාකරණං තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පඤ්ඤාවිමුත්තෙන භික්ඛුනා'ති?

භගවංමූලකා නො භන්තෙ, ධම්මා භගවංනෙත්තිකා භගවංපටිසරණා, සාධු වත භන්තෙ, භගවන්තඤ්ඤෙව පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො, භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

තෙන හි භික්ඛවෙ, සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවං භන්තෙ'ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච :

තථාගතො භික්ඛවෙ, අරහං සම්මාසම්බුද්ධො අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා. අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා. අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා. මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො, මග්ගානුගා ච භික්ඛවෙ, එතරහි සාවකා විහරන්ති, පච්ඡා සමන්නාගතා.

අයං ඛො භික්ඛවෙ, විසෙසො අයං අධිප්පායො, ඉදං නානාකරණං තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පඤ්ඤාවිමුත්තෙන භික්ඛුනාති.

## 1. 2. 1. 7.

## පඤ්චවග්ගිය සුත්තං

59. එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ. තත්‍ර ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි, "භික්ඛවො"ති. 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච :

## 1. 2. 1. 6.

## සම්බුද්ධ සූත්‍රය

58. සැවැත්නුවර :

මහණෙනි, තථාගත වූ අර්හත් සම්‍යක්සම්බුද්ධ තෙමේ රූපය පිළිබඳ නිර්වේදයෙන් විරාගයෙන් නිරෝධයෙන් තෘෂ්ණාදි විසින් ග්‍රහණ නො කොට මිදුණේ 'සම්මා සම්බුද්ධ'යි කියනු ලැබෙයි. මහණෙනි, ප්‍රඥාවිමුක්ත මහණ ද රූපය පිළිබඳ නිර්වේදයෙන් විරාග යෙන් නිරෝධයෙන් තෘෂ්ණාදි විසින් ග්‍රහණ නො කොට මිදුණේ 'පඤ්ඤා විමුත්ත' යි කියනු ලැබේ.

මහණෙනි, තථාගත වූ අර්හත් සම්‍යක් සම්බුද්ධ තෙමේ වේදනාව පිළිබඳ ... සංඥාව පිළිබඳ ... සංස්කාර පිළිබඳ ... විඥානය පිළිබඳ නිර්වේදයෙන් විරාගයෙන් නිරෝධයෙන් උපාදාන විසින් ග්‍රහණ නො කොට මිදුණේ, 'සම්මා සම්බුද්ධ'යි කියනු ලැබෙයි. මහණෙනි, ප්‍රඥාවිමුක්ත මහණ ද විඥානය පිළිබඳ නිර්වේදයෙන් විරාගයෙන් නිරෝධයෙන් උපාදාන විසින් ග්‍රහණ නො කොට මිදුණේ 'පඤ්ඤාවිමුත්ත'යි කියනු ලැබේ.

මහණෙනි, එහි ලා ප්‍රඥාවිමුක්ත භික්ෂු හා තථාගත වූ අර්හත් සම්‍යක් සම්බුද්ධයන්ගේ විශේෂය කවරේ යැ, අධ්‍යාශය කවරේ යැ, නානාකරණය කිමැ ?

වහන්ස, ධර්මයෝ අපහට භගවත්හු මුල් කොට ඇත්තාහ, භගවත්හු නේතෘ කොට ඇත්තාහ, භගවත්හු පිළිසරණ කොට ඇත්තාහ. වහන්ස, එකැකින් මැනවි, තෙල භාෂිත යාගේ අර්ථය භාග්‍යවතුන් වහන්සේට ම වැටහේවා. භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා භික්ෂූහු ධරන්නාහ යි.

මහණෙනි, එසේ වී නම් අසවු, මොනොවට මෙනෙහි කරවු කියන්නෙමි යි. වහන්ස, එසේ යයි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළහ :

මහණෙනි, තථාගත වූ අර්හත් සම්‍යක් සම්බුද්ධයෝ නූපන් මාර්ගය උපදවන්නාහ, අසඤ්ජාතමාර්ගය සංජනනය කරන්නාහ, අනෙකකු විසින් ප්‍රකාශ නො කළ මාර්ගය ප්‍රකාශ කරන්නාහ. (දත් හෙයින්) මාර්ගඥයහ, (ප්‍රකටකළ හෙයින්) මාර්ගවිද්හ, (මග–නො මග දත් හෙයින්) මාර්ග නිපුණහ. මහණෙනි, මෙකල ශ්‍රාවකයෝ මාර්ගය අනුව යන්නාහු පසුව යෙදුණාහු වාස කෙරෙත්.

මහණෙනි, පඤ්ඤාවිමුත්ත මහණ හා තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන්ගේ මේ විශේෂ යි, මේ අධ්‍යාශය යි. මේ නානාකරණ යි.

## 1. 2. 1. 7.

## පඤ්චවග්ගිය සූත්‍රය

59. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස ඉසිපතන මිගදායෙහි වැඩ වාසය කරනසේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි පඤ්චවග්ගිය භික්ෂූන් ඇමතූ සේක. 'වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක :

රූපං භික්ඛවෙ, අනත්තා, රූපඤ්ච හිදං භික්ඛවෙ, අත්තා අභවිස්ස, නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍ය, ලබ්භෙථ ච රූපෙ එවං මෙ රූපං හොතු, එවං මෙ රූපං මා අහොසී'ති. යස්මා ච ඛො භික්ඛවෙ, රූපං අනත්තා, තස්මා රූපං ආබාධාය සංවත්තති. න ච ලබ්භති රූපෙ "එවං මෙ රූපං හොතු, එවං මෙ රූපං මා අහොසී"ති.

වෙදනා භික්ඛවෙ අනත්තා, -පෙ- සඤ්ඤා භික්ඛවෙ අනත්තා -පෙ-, සඞ්ඛාරා භික්ඛවෙ අනත්තා, -පෙ- විඤ්ඤාණං භික්ඛවෙ අනත්තා. විඤ්ඤාණඤ්ච හිදං භික්ඛවෙ, අත්තා අභවිස්ස, නයිදං විඤ්ඤාණං ආබාධාය සංවත්තෙය්‍ය, ලබ්භෙථ ච විඤ්ඤාණෙ, "එවං මෙ විඤ්ඤාණං හොතු, එවමෙම විඤ්ඤාණං මා අහොසී"ති. යස්මා ච ඛො භික්ඛවෙ, විඤ්ඤාණං අනත්තා, තස්මා විඤ්ඤාණං ආබාධාය සංවත්තති. න ච ලබ්භති විඤ්ඤාණෙ. "එවමෙම විඤ්ඤාණං හොතු එවමෙම විඤ්ඤාණං මා අහොසී"ති.

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වා'ති? අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති? දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති? නො හෙතං භන්තෙ.

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා ති? අනිච්චං භන්තෙ.

යං පනානිච්චං, දුක්ඛං වා තං සුඛං වා'ති? දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං, 'එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා'ති? නො හෙතං භන්තෙ.

තස්මා තිහ භික්ඛවෙ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං, අජ්ඣත්තං වා බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං, නෙතං මම, නෙසොහමස්මි. න මෙසො අත්තා'ති, එවමේතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං, අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං 'නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

මහණෙනි, රූපය අනාත්ම යෑ, මහණෙනි, මේ රූපය ආත්ම වී නම් මේ රූපය ආබාධ පිණිස නො වැටෙන්නේ යෑ. රූපයෙහි ලා "මාගේ රූපය මෙසේ වේවා, මාගේ රූපය මෙසේ නො වේව යි ලැබෙන්නේ ද වෙයි. මහණෙනි, යම් හෙයෙකින් රූපය අනාත්ම ද, එහෙයින් රූපය ආබාධ පිණිස වැටෙයි. රූපයෙහි ලා "මාගේ රූපය මෙසේ වේවා, මාගේ රූපය මෙසේ නො වේව"යි ලැබෙන්නේ ද නො වෙයි.

මහණෙනි, වෙදනාව අනාත්ම යෑ, ... සංඥව අනාත්ම යෑ ... සංස්කාර අනාත්ම යෑ ... විඥනය අනාත්ම යෑ, මහණෙනි, මේ විඥනය ආත්ම වූයේ නම් මේ විඥනය ආබාධ පිණිස නො වැටෙන්නේ යෑ, විඥනයෙහි ලා "මාගේ විඥනය මෙසේ වේවා, මාගේ විඥනය මෙසේ නො වේව"යි ලැබෙන්නේ ද වෙයි. මහණෙනි, යම් හෙයෙකින් විඥනය අනාත්ම ද, එහෙයින් විඥනය ආබාධ පිණිස වැටෙයි, විඥනයෙහි ලා "මාගේ විඥනය මෙසේ වේවා, මාගේ විඥනය මෙසේ නො වේව"යි නො ද ලැබෙන්නේ වෙයි.

මහණෙනි, එ කිමැයි හඟිවු ද "රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ"යි. වහන්ස, අනිත්‍ය යෑ.

යමක් වූකලී අනිත්‍ය නම් එ දුක් හෝ සුව හෝ වේ ද ? වහන්ස, දුක් යෑ.

යමක් වනාහි අනිත්‍ය ද, දුක් ද, පෙරළෙන සැහැවි ඇත් ද, "තෙලෙ මාගේ යෑ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම" යි දක්නට සුදුසු ද ? වහන්ස, තෙලෙ නො වේ මැ යි.

වෙදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ යි. වහන්ස, අනිත්‍ය යෑ.

යමක් වනාහි අනිත්‍ය ද, එය දුක් හෝ සුව හෝ යි. වහන්ස, දුක් යෑ.

යමක් වූකලී අනිත්‍ය ද, දුක් ද, පෙරළෙන සැහැවි ඇත් ද, "තෙලෙ මාගේ යෑ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්ම" යි එය දක්නට සුදුසු ද ? වහන්ස, තෙලෙ නො වේ මැ යි.

මහණෙනි, එහෙයින් මෙහි ලා අතීතානාගත ප්‍රත්‍යුත්පන්න වූ, අධ්‍යාත්ම වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම්කිසි රූපයක් ඇත් ද, දුර හෝ ළඟ හෝ යම් රූපයකුත් ඇත් ද, එ සියලු රූපය "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේ" යි මෙසේ තෙල තතු සේ සම්‍යක් ප්‍රඥයෙන් (විදර්ශනාඥනයෙන්) දැක්ක යුතු යි.

යම්කිසි වෙදනාවක් ... යම්කිසි සංඥවක් ... යම්කිසි සංස්කාර ... අතීතානාගත ප්‍රත්‍යුත් පන්න වූ අධ්‍යාත්ම වේවයි බාහිර වේවයි ඔළාරික වේවයි සුහුම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම්කිසි විඥනයෙක් ඇත් ද, දුර හෝ ළඟ හෝ යම් විඥනයෙකුත් ඇත් ද, එ සියලු විඥනය "තෙලෙ මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වෙයි" මෙසේ තෙල තතු සේ සම්‍යක්ප්‍රඥයෙන් දැක්කයුතු.

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති. වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤාය'පි නිබ්බින්දති, සඞ්ඛාරෙසු'පි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති; 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතී'ති.

ඉදමවොච භගවා, අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුං. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ පඤ්චවග්ගියානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසූති.

## 1. 2. 1. 8.

### මහාලි සුත්තං

60. එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං, අථ ඛො මහාලි ලිච්ඡවි යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො මහාලි ලිච්ඡවි භගවන්තං එතදවොච:

පූරණො භන්තෙ, කස්සපො එවමාහ: "නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය. අහෙතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති. නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං විසුද්ධියා අහෙතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්තී"ති. ඉධ භගවා කිමාහාති.

අත්ථි මහාලි, හෙතු අත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය, සහෙතු සප්පච්චයා සත්තා සංකිලිස්සන්ති, අත්ථි මහාලි, හෙතු අත්ථි පච්චයො සත්තානං විසුද්ධියා, සහෙතු සප්පච්චයා සත්තා විසුජ්ඣන්තීති.

කතමො පන භන්තෙ, හෙතු කතමො පච්චයො සත්තානං සංකිලෙසාය, කථං සහෙතු සප්පච්චයා සත්තා සංකිලිස්සන්තීති?

රූපඤ්ච හිදං මහාලි, එකන්තදුක්ඛං අභවිස්ස දුක්ඛානුපතිතං දුක්ඛාවක්කන්තං, අනවක්කන්තං සුඛෙන, නයිදං සත්තා රූපස්මිං සාරජ්ජෙය්‍යුං, යස්මා ච ඛො මහාලි, රූපං සුඛං සුඛානුපතිතං සුඛාවක්කන්තං අනවක්කන්තං දුක්ඛෙන[1] තස්මා සත්තා රූපස්මිං සාරජ්ජන්ති, සාරාගා සංයුජ්ජන්ති, සංයොගා සංකිලිස්සන්ති. අයම්පි ඛො, මහාලි, හෙතු අයං පච්චයො, සත්තානං සංකිලෙසාය, එවං සහෙතු සප්පච්චයා සත්තා සංකිලිස්සන්ති.

වෙදනා ච හිදං මහාලි එකන්තදුක්ඛා අභවිස්ස, දුක්ඛානුපතිතා දුක්ඛාවක්කන්තා, අනවක්කන්තා සුඛෙන, නයිදං සත්තා වෙදනාය සාරජ්ජෙය්‍යුං, යස්මා ච ඛො මහාලි, වෙදනා සුඛා සුඛානුපතිතා, අනවක්කන්තා දුක්ඛෙන තස්මා සත්තා වෙදනාය සාරජ්ජන්ති. සාරාගා සංයුජ්ජන්ති. සංයොගා සංකිලිස්සන්ති, අයම්පි ඛො මහාලි, හෙතු අයං පච්චයො සත්තානං සංකිලෙසාය. එවම්පි සහෙතු සප්පච්චයා සත්තා සංකිලිස්සන්ති.

---

1. අවක්කන්තං දුක්ඛෙන - සීමු.

මහණෙනි, මෙසේ විවසුන් නැණින් දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක තෙමේ රූපයෙහි කලකිරෙයි, වේදනායෙහි ... සංඥයෙහි ... සංස්කාරයන්හි ... විඥනයෙහි කලකිරෙයි, කලකිරෙනුයේ නො ඇලෙයි, නො ඇලීම් හේතුයෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදෙයි, මිදුණු කල්හි මිදුණේ ය යන ඥනය වෙයි. '' ජාතිය ක්ෂය වී යැ, මහබඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, මෙ රහත්බව සඳහා කළයුතු අන්කිසෙක් නැතැ '' යි දැන ගනියි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු වූ පස්වග මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගත්හ. මෙ වෙය්‍යාකරණය වදරත් මැ පස්වග මහණුන්ගේ සිත් උපාදන විසින් නො ගෙන මිදුණේ යි.

## 1. 2. 1. 8.

## මහාලි සූත්‍රය

60. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර මහවනයෙහි වූ කූටාගාර ශාලාවෙහි වැඩ වාසය කෙරෙති. එ කල්හි මහාලි ලිච්ඡවී භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැනට එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පස් ව හුන්නේ යැ, එකත් පස්ව හුන් මහාලි ලිච්ඡවී භාග්‍යවතුන් වහන්සේට මෙතෙල සැල කෙළේය :

වහන්ස, පූරණකාශ්‍යප මෙසේ කියයි : '' සත්වයන්ගේ කෙලෙසීමට හේතුවක් නැත, ප්‍රත්‍යයක් නැත. හේතු රහිත වැ ප්‍රත්‍යය රහිත වැ සත්වයෝ කෙලෙසෙති. සත්ව යන්ගේ විශුද්ධියට හේතුවක් නැත, ප්‍රත්‍යයක් නැත. හේතු රහිත වැ ප්‍රත්‍යය රහිත වැ සත්වයෝ විශුද්ධ වෙත් යි. මෙ කරුණෙහි ලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදරන සේක් ද ?

මහාලි, සත්වයන්ගේ කෙලෙසීමට හේතු ඇත, ප්‍රත්‍යය ඇත. හේතු සහිත වැ ප්‍රත්‍යය සහිත වැ සත්වයෝ කෙලෙසෙති. මහාලි, සත්වයන්ගේ විශුද්ධියට හේතු ඇත. ප්‍රත්‍යය ඇත. හේතු සහිත වැ ප්‍රත්‍යය සහිත වැ සත්වයෝ විශුද්ධ වෙත් යි.

වහන්ස, සත්වයන්ගේ කෙලෙසීමට හේතු කවරැ, ප්‍රත්‍යය කවර යැ, කිසෙයින් සත්වයෝ සහේතුක වැ සප්‍රත්‍යය වැ කෙලෙසෙත් ද යි.

මහාලි, රූපය ද ඒකාන්තයෙන් දුක් වූවක් දුකෙහි පතිත වූවක් දුකෙහි වැදගත්තක් සුවයෙහි නො වැදගත්තක් වී නම් සත්ත්වයෝ රූපයෙහි නො ඇලෙන්නාහුය. මහාලි, යම් හෙයෙකින් රූපය සුඛ ද, සුඛානුපතිත ද, සුඛාවතීර්ණ ද, දුඃඛාවතීර්ණ නො වේ ද, එහෙයින් සත්වයෝ රූපයෙහි ඇලෙති, ඇලීමෙන් (සංයොජන වශයෙන්) බැඳෙති, බැඳීමෙන් කෙලෙසෙත්. මහාලි, සත්වයන්ගේ කෙලෙසීම පිණිස මෙ ද හේතුයෙකි, මෙ ප්‍රත්‍යයෙකි. මෙසෙයින් සත්වයෝ හේතුසහිත වැ ප්‍රත්‍යය සහිත වැ කෙලෙසෙත්.

මහාලි, වේදනාව ද ඒකාන්තයෙන් දුක් වූවක් දුකෙහි පතිත වූවක් දුකෙහි වැදගත්තක් සුවයෙහි නො වැදගත්තක් වී නම් සත්වයෝ වේදනායෙහි නො ඇලෙන්නාහුය. මහාලි, යම්හෙයෙකින් වේදනාව සුඛ ද, සුඛානුපතිත ද, සුඛාවතීර්ණ ද, දුඃඛාවතීර්ණ නො වේ ද, එහෙයින් සත්වයෝ වේදනායෙහි ඇලෙති. ඇලීම් හේතුයෙන් බැඳෙති බැඳීමෙන් කෙලෙසෙත්. මහාලි, මෙ ද හේතුවකි, මෙ ප්‍රත්‍යයකි. මෙසෙයින් සත්වයෝ හේතුසහිත වැ ප්‍රත්‍යය සහිත වැ කෙලෙසෙත්.

සඤ්ඤා ච -පෙ- සඞ්ඛාරා ච හිදං මහාලි, එකන්තදුක්ඛා අභවිස්සංසු, දුක්ඛානුපතිතා දුක්ඛාවක්කන්තා අනවක්කන්තා සුඛෙන, නයිදං සත්තා සඞ්ඛාරෙසු සාරජ්ජෙය්‍යුං, යස්මා ච ඛො මහාලි, සඞ්ඛාරා සුඛා සුඛානුපතිතා සුඛාවක්කන්තා අනවක්කන්තා දුක්ඛෙන, තස්මා සත්තා සඞ්ඛාරෙසු සාරජ්ජන්ති, සාරාගා සංයුජ්ජන්ති, සංයොගා සංකිලිස්සන්ති. අයම්පි ඛො මහාලි, හෙතු අයං පච්චයො සත්තානං සංකිලෙසාය, එවම්පි ඛො සහෙතු සප්පච්චයා සත්තා සංකිලිස්සන්ති.

විඤ්ඤාණඤ්ච හිදං මහාලි, එකන්තදුක්ඛං අභවිස්ස, දුක්ඛානුපතිතං දුක්ඛාවක්කන්තං අනවක්කන්තං සුඛෙන, නයිදං සත්තා විඤ්ඤාණස්මිං සාරජ්ජෙය්‍යුං, යස්මා ච ඛො මහාලි, විඤ්ඤාණං සුඛං සුඛානුපතිතං සුඛාවක්කන්තං අනවක්කන්තං දුක්ඛෙන, තස්මා සත්තා විඤ්ඤාණස්මිං සාරජ්ජන්ති, සාරාගා සංයුජ්ජන්ති, සංයොගා සංකිලිස්සන්ති. අයම්පි ඛො මහාලි, හෙතු අයං පච්චයො සත්තානං සංකිලෙසාය. එවං සහෙතු සප්පච්චයා සත්තා සංකිලිස්සන්තීති.

කතමො පන භන්තෙ, හෙතු කතමො, පච්චයො සත්තානං විසුද්ධියා, කථං සහෙතු සප්පච්චයා සත්තා විසුජ්ඣන්තීති?

රූපඤ්ච හිදං මහාලි, එකන්තසුඛං අභවිස්ස, සුඛානුපතිතං සුඛාවක්කන්තං අනවක්කන්තං දුක්ඛෙන, නයිදං සත්තා රූපස්මිං නිබ්බින්දෙය්‍යුං, යස්මා ච ඛො මහාලි, රූපං දුක්ඛං. දුක්ඛානුපතිතං, දුක්ඛාවක්කන්තං අනවක්කන්තං සුඛෙන, තස්මා සත්තා රූපස්මිං නිබ්බින්දන්ති, නිබ්බින්දං විරජ්ජන්ති, විරාගා විසුජ්ඣන්ති. අයම්පි ඛො මහාලි, හෙතු අයං පච්චයො සත්තානං විසුද්ධියා. එවම්පි සහෙතු සප්පච්චයා සත්තා විසුජ්ඣන්ති.

වෙදනා ච හිදං මහාලි, එකන්තසුඛා අභවිස්ස -පෙ- සඤ්ඤා ච හිදං මහාලි -පෙ- සඞ්ඛාරා ච හිදං මහාලි, එකන්තසුඛා අභවිස්සංසු -පෙ- විඤ්ඤාණඤ්ච හිදං මහාලි, එකන්තසුඛං අභවිස්ස, සුඛානුපතිතං, සුඛාවක්කන්තං, අනවක්කන්තං දුක්ඛෙන, නයිදං සත්තා විඤ්ඤාණස්මිං නිබ්බින්දෙය්‍යුං, යස්මා ච ඛො මහාලි, විඤ්ඤාණං දුක්ඛං දුක්ඛානුපතිතං දුක්ඛාවක්කන්තං අනවක්කන්තං සුඛෙන, තස්මා සත්තා විඤ්ඤාණස්මිං නිබ්බින්දන්ති, නිබ්බින්දං විරජ්ජන්ති. විරාගා විසුජ්ඣන්ති. අයං ඛො මහාලි, හෙතු අයං පච්චයො සත්තානං විසුද්ධියා. එවං සහෙතු සප්පච්චයා සත්තා විසුජ්ඣන්තීති.

## 1. 2. 1. 9.

### ආදිත්ත සුත්තං

61. සාවත්ථියං :

රූපං භික්ඛවෙ, ආදිත්තං වෙදනා ආදිත්තා, සඤ්ඤා ආදිත්තා, සඞ්ඛාරා ආදිත්තා, විඤ්ඤාණං ආදිත්තං.

සංඥව ද ... මහණෙනි, සංස්කාර ද ඒකාන්ත දුක් වූවාහු දුකෙහි පතිත වූවාහු දුකෙහි වැදගත්තාහු සුවයෙහි නො වැදගත්තාහු වූවාහු නම් සත්වයෝ සංස්කාර යන්හි නැලෙන්නාහුය. යම්හෙයෙකින් මහාලි, සංස්කාර සුඛ ද, සුඛානුපතිත ද, සුඛාවතීර්ණ ද, දුක්ඛයෙන් අවක්‍රාන්ත නො වෙත් ද, එහෙයින් සත්වයෝ සංස්කාරයන්හි ඇලෙති, ඇලීම නිසා බැඳෙති, බැඳීම නිසා කෙලෙසෙත්. මහාලි, සත්වයන්ගේ කෙලෙයීමට මෙ ද හේතුවෙකි, මෙ ද ප්‍රත්‍යයෙකි. මෙසෙයින් සහේතුක වැ සප්‍රත්‍යය වැ සත්වයෝ කෙලෙසෙත්.

මහාලි, විඥනය ද ඒකාන්ත දුක් වූවක් දුයෙහි පතිත වූවක් දුකෙහි අවතීර්ණ වූවක් සුවයෙහි අවතීර්ණ නො වූවක් වී නම් සත්වයෝ විඥනයෙහි නො ඇලෙන්නාහුය. යම් හෙයෙකින් මහාලි, විඥනය සුඛ ද, සුඛානුපතිත ද, සුඛාවතීර්ණ ද, දුඃඛාවතීර්ණ නො වේ ද, එහෙයින් සත්වයෝ විඥනයෙහි ඇලෙති, ඇලීම නිසා බැඳෙති, බැඳීම නිසා කෙලෙසෙත්. මහාලි, මෙ ද සත්වයන්ගේ කෙලෙසීමට හේතුවෙකි. මෙ ප්‍රත්‍යයෙකි, මෙසෙයින් සත්වයෝ සහේතුක වැ සප්‍රත්‍යය වැ කෙලෙසෙත්.

වහන්ස, සත්වයන්ගේ විශුද්ධිය පිණිස හේතු කවරැ ප්‍රත්‍යය කවර යැ කිසෙයින් සහෙතුක වැ සප්‍රත්‍යය වැ සත්වයෝ විශුද්ධ වෙත් දැයි.

මහාලි, රූපය ද ඒකාන්තයෙන් සුව වූවක් සුවයෙහි පතිත වූවක් සුවයෙහි පිවිසගත්තක් දුකෙහි නො පිවිස ගත්තක් වී නම්, සත්වයෝ රූපයෙහි නො කලකිරෙන්නාහ. යම් හෙයෙකින් මහාලි, රූපය දුක් ද, දුකෙහි පතිත ද, දුකෙහි පිවිස ගත්තේ ද, සුවයෙහි නො පිවිස ගත්තේ ද, එහෙයින් සත්වයෝ රූපයෙහි කලකිරෙති, කලකිරෙන්නාහු නො ඇලෙති, නො ඇලීමෙන් පිරිසිදු වෙත්. මහාලි, සත්වයන්ගේ, විසුද්ධිය පිණිස මෙ ද හේතු යි, මෙ ප්‍රත්‍යය යි. මෙසේ සහේතුක වැ සප්‍රත්‍යය වැ සත්වයෝ විශුද්ධියට යෙත්.

මහාලි, වේදනාව ද ඒකාන්ත සුඛ වී නම් ... මහාලි, සංඥව ද ... මහාලි, සංස්කාර ද ඒකාන්ත සුඛ වූවාහු නම් ... මහාලි, විඥනය ද ඒකාන්තයෙන් සුවවූවක් සුවයෙහි පතිත වූවක් සුවයෙහි පිවිසගත්තක් දුකෙහි නො පිවිස ගත්තක් වී නම් සත්වයෝ විඥනයෙහි නො කලකිරෙන්නාහ. යම්හෙයෙකින් මහාලි, විඥනය දුක් ද, දුකෙහි පතිත ද, දුකෙහි පිවිසගත්තේ ද සුවයෙහි නො පිවිසගත්තේ ද, එහෙයින් සත්වයෝ විඥනයෙහි කලකිරෙති, කලකිරෙන්නාහු නො ඇලෙති, නො ඇලීමෙන් විශුද්ධ වෙත්. මහාලි, සත්වයන්ගේ විශුද්ධියට මෙ ද හේතුවකි, මෙ ප්‍රත්‍යයෙකි. මෙසෙයින් සත්වයෝ සහේතුක වැ සප්‍රත්‍යය වැ විශුද්ධ වෙති යි.

## 1. 2. 1. 9.

## ආදිත්ත සූත්‍රය

**61. සැවැත්නුවර :**

මහණෙනි, රූපය ආදීප්ත යැ (හාත්පසින් ඇවිළගත්තේ වෙයි), වේදනාව ආදීප්ත යැ, සංඥව ආදීප්ත යැ, සංස්කාර ආදීප්ත යැ, විඥනය ආදීප්ත යි.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති. වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතී'ති.

## 1. 2. 1. 10.

## නිරුත්තිපථ සුත්තං

**62.** සාවත්ථියං :

තයො මෙ භික්ඛවෙ, නිරුත්තිපථා අධිවචනපථා පඤ්ඤත්තිපථා අසඞ්කිණ්ණා අසඞ්කිණ්ණපුබ්බා න සඞ්කීයන්ති, න සඞ්කීයිස්සන්ති අප්පටිකුට්ඨා සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

කතමෙ තයො :

යං භික්ඛවෙ, රූපං අතීතං නිරුද්ධං විපරිණතං, 'අහොසී'ති තස්ස සඞ්ඛා, 'අහොසී'ති තස්ස සමඤ්ඤා, 'අහොසී'ති තස්ස පඤ්ඤත්ති, න තස්ස සඞ්ඛා 'අත්ථී'ති. න තස්ස සඞ්ඛා 'භවිස්සතී'ති.

යා වෙදනා අතීතා නිරුද්ධා විපරිණතා, 'අහොසී'ති තස්සා සඞ්ඛා, 'අහොසී'ති තස්සා සමඤ්ඤා, 'අහොසී'ති තස්සා පඤ්ඤත්ති, න තස්සා සඞ්ඛා 'අත්ථී'ති. න තස්සා සඞ්ඛා 'භවිස්සතී'ති.

යා සඤ්ඤා - පෙ - යෙ සඞ්ඛාරා අතීතා, නිරුද්ධා, විපරිණතා, 'අහෙසු'න්ති තෙසං සඞ්ඛා, 'අහෙසු'න්ති තෙසං සමඤ්ඤා 'අහෙසු'න්ති තෙසං පඤ්ඤත්ති. න තෙසං සඞ්ඛා 'අත්ථී'ති. න තෙසං සඞ්ඛා 'භවිස්සන්තී'ති.

යං විඤ්ඤාණං අතීතං නිරුද්ධං විපරිණතං, 'අහොසී'ති තස්ස සඞ්ඛා, 'අහොසී'ති තස්ස සමඤ්ඤා, 'අහොසී'ති තස්ස පඤ්ඤත්ති. න තස්ස සඞ්ඛා 'අත්ථී'ති. න තස්ස සඞ්ඛා 'භවිස්සතී'ති.

යං භික්ඛවෙ, රූපං අජාතං අපාතුභූතං 'භවිස්සතී'ති තස්ස සඞ්ඛා, 'භවිස්සතී'ති තස්ස සමඤ්ඤා, 'භවිස්සතී'ති තස්ස පඤ්ඤත්ති, න තස්ස සඞ්ඛා 'අත්ථී'ති. න තස්ස සඞ්ඛා 'අහොසී'ති. යා වෙදනා - පෙ - යා සඤ්ඤා - පෙ - යෙ සඞ්ඛාරා - පෙ - යං විඤ්ඤාණං අජාතං අපාතුභූතං 'භවිස්සතී'ති තස්ස සඞ්ඛා, 'භවිස්සතී'ති තස්ස සමඤ්ඤා, 'භවිස්සතී'ති තස්ස පඤ්ඤත්ති. න තස්ස සඞ්ඛා 'අත්ථී'ති. න තස්ස සඞ්ඛා 'අහොසී'ති.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපයෙහි ද කලකිරෙයි, වේදනායෙහි ද කලකිරෙයි, සංඥායෙහිද කලකිරෙයි, සංස්කාරයන්හිද කලකිරෙයි, විඥානයෙහි ද කලකිරෙයි. කලකිරෙනුයේ නො ඇලෙයි. නො ඇලීමෙන් මිදෙයි, මිදුණු කල්හි මිදුණැයි දැනීම වෙයි. ''ජාතිය ක්ෂය විය, බඹසර වැස නිමවන ලද, සිවුමඟ කිස කරන ලද, මේ බව සඳහා අන් කිසෙක් නැතැයි දැනගනී යි.

## 1. 2. 1. 10.
## නිරුක්තිපථ සූත්‍රය

62. සැවැත්නුවර :

යම් නිරුක්තිපථ කෙනෙක් බැහැර නො කරන ලද ද, බැහැර නො කළ විරූ ද, දැනුදු බැහැර නො කරනු ලැබෙත් ද, මතුදු බැහැර නො කරනු ලැබෙත් ද, නුවණැති මහණ බමුණන් විසින් පිළිකෙව් නො කරන ලද ද මේ නිරුක්තිපථ–අධිවචනපථ–ප්‍රඥප්තිපථ තිදෙනෙක් වෙත්.

කවර තිදෙනෙකැ යත් :

මහණෙනි, යම් රූපයක් අතීත ද, නිරුද්ධ ද, විපරිණත ද 'වූයේ ය' යනු ඒ රූපයාගේ සංඛ්‍යාව යි, 'වූයේය' යනු ඒ රූපයාගේ නම යි. 'වූයේය' යනු ඒ රූපයාගේ ප්‍රඥප්ති යි. 'ඇත' යනු ඒ රූපයාගේ සංඛ්‍යාව නො වෙයි, 'වන්නේය' යනු ඒ රූපයාගේ සංඛ්‍යාව (ගිණීම) නො වේ.

යම් වේදනාවක් අතීත ද, නිරුද්ධ ද, විපරිණත ද, 'වූයේය' යනු ඒ වේදනාවගේ සංඛ්‍යාව (ගිණීම) වෙයි. 'වූයේය' යනු ඒ වේදනාවගේ නම වෙයි, 'වූයේය' යනු ඒ වේදනාවගේ ප්‍රඥප්තිය වෙයි. 'ඇත' යනු ඒ වේදනාවගේ සංඛ්‍යාව නො වෙයි, 'මතු වන්නේය' යනු ඒ වේදනාවගේ සංඛ්‍යාව නො වෙයි.

යම් සංඥාවක් ... යම් සංස්කාර කෙනෙක් අතීත ද, නිරුද්ධ ද, විපරිණත ද, 'වූහු' යනු ඔවුනට සංඛ්‍යා යි, 'වූහු' යනු ඔවුනට නම යි 'වූහු' යනු ඔවුනට ප්‍රඥප්ති යි. 'ඇත' යනු ඔවුනට සංඛ්‍යා නො වෙයි, ''මතු වන්නාහ 'යනු ඔවුනට සංඛ්‍යා නො වෙයි.

යම් විඥානයක් අතීත ද, නිරුද්ධ ද, විපරිණත ද, 'වූයේය' යනු එයට සංඛ්‍යා යි, 'වූයේය' යනු එයට නම යි, 'වූයේය' යනු එයට ප්‍රඥප්ති යි. 'ඇත' යනු එයට සංඛ්‍යා නො වෙයි, 'මතු වන්නේය' යනු එයට සංඛ්‍යා නො වෙයි.

මහණෙනි, යම් රූපයක් අජාත ද අපාතුභූත (පහළ නො වී) ද, 'වන්නේය' යනු එයට සංඛ්‍යා යි, 'වන්නේය' යනු එයට නම යි, 'වන්නේය' යනු එයට ප්‍රඥප්ති යි. 'ඇත' යනු එයට සංඛ්‍යා නො වෙයි, 'වූයේය, යනු එයට සංඛ්‍යා නො වෙයි. යම් වේදනාවක් ... යම් සංඥාවක් ... යම් සංස්කාර කෙනෙක් ... යම් විඥානයක් අජාත ද, අපාතුභූත ද, 'වන්නේය', යනු එයට සංඛ්‍යා වෙයි, 'වන්නේය' යනු එයට නාම වෙයි, 'වන්නේය', යනු එයට ප්‍රඥප්ති වෙයි. 'ඇත' යනු එයට සංඛ්‍යා නො වෙයි, 'වූයේය' යනු එයට සංඛ්‍යා නො වේ යයි.

යං භික්ඛවෙ රූපං ජාතං පාතුභූතං, 'අත්ථී'ති තස්ස සඞ්ඛා, 'අත්ථී'ති තස්ස සමඤ්ඤා, 'අත්ථී'ති තස්ස පඤ්ඤත්ති, න තස්ස සඞ්ඛා 'අහොසී'ති. න තස්ස සඞ්ඛා 'භවිස්සතී'ති. යා වෙදනා - පෙ - යා සඤ්ඤා-පෙ-යෙ සඞ්ඛාරා-පෙ-යං විඤ්ඤාණං ජාතං පාතුභූතං, 'අත්ථී'ති තස්ස සඞ්ඛා. 'අත්ථී'ති තස්ස සමඤ්ඤා. 'අත්ථී'ති තස්ස පඤ්ඤත්ති. න තස්ස සඞ්ඛා 'අහොසී'ති න තස්ස සඞ්ඛා 'භවිස්සතී'ති.

ඉමෙ ඛො භික්ඛවෙ, තයො නිරුත්තිපථා, අධිවචනපථා, පඤ්ඤත්තිපථා, අසඞ්කිණ්ණා අසඞ්කිණ්ණපුබ්බා, න සඞ්කීයන්ති, න සඞ්කීයිස්සන්ති අප්පටිකුට්ඨා, සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

යෙපි තෙ භික්ඛවෙ, අහෙසුං උක්කලා වස්සභඤ්ඤා, අහෙතුකවාද අකිරියවාද නත්ථිකවාද, තෙපිමෙ තයො නිරුත්තිපථෙ අධිවචනපථෙ පඤ්ඤත්තිපථෙ න ගරහිතබ්බං න පටික්කොසිතබ්බං මඤ්ඤිංසු. තං කිස්ස හෙතු: නින්දාබ්‍යාරොසඋපාරම්භභයා'ති.

උපයවග්ගො පඨමො

තස්සුද්දානං :

උපයො බීජං උදානං උපාදානපරිවට්ටඤ්ච සත්තට්ඨානං
බුද්ධො පඤ්චවග්ගි මහාලි ආදිත්තො නිරුත්තිපථෙනචාති.

Free Distribution www.aathaapi.org

මහණෙනි, යම් රූපයක් ජාත ද, පාතුභූත ද 'ඇත' යනු එයට සංඛ්‍යා යි. 'ඇත' යනු එයට නම යි, 'ඇත' යනු එයට ප්‍රඥප්ති යි. 'වූයේය' යනු එයට සංඛ්‍යා නො වෙයි, 'වන්නේය' යනු එයට සංඛ්‍යා නො වෙයි. යම් වේදනාවක් ... යම් සංඥාවක් ... යම් සංස්කාර කෙනෙක් ... යම් විඥානයක් ජාත ද, පාතුභූත ද 'ඇත' යනු එයට සංඛ්‍යා වෙයි, 'ඇත' යනු එයට නම් වෙයි, 'ඇත' යනු එයට ප්‍රඥප්ති වේ යයි.

මහණෙනි, යම් නිරුක්ති මාර්ග කෙනෙක් බැහැර නො කරන ලද ද, බැහැර නො කළ විරූ ද, දැනුදු බැහැර නො කරනු ලැබෙත් ද, මතුදු නො ද බැහැර කෙරෙත් ද, නුවණැති මහණ බමුණන් විසින් පිළිකෙව් නො කරන ලද මේ නිරුක්තිපථ අධිවචනපථ-ප්‍රඥප්තිපථ තිදෙන වෙතැයි.

මහණෙනි, උක්කල දනවු වැසි අහේතුකවාදී අක්‍රියවාදී නාස්තිකවාදී වස්ස භඤ්ඤ නම් යම් දෘෂ්ටිගතිකයෝ වූවාහු ද, උහුදු මේ නිරුක්ති මාර්ග අධිවචන මාර්ග ප්‍රඥප්ති මාර්ගයෝ තිදෙන ගැරහියයුතු කොට, පිළිකෙව් කොට නො සිතූහ. එ කවර හෙයින යත් : නින්ද - ඝට්ටන - දෙෂා රෝපණ - අපවාද බියෙන් ය යි.

**පළමුවැනි උපයවර්ග යි**

**එහි උද්දානය :**

**උපය සූත්‍රය, බීජ සූත්‍රය, උදාන සූත්‍රය, උපාදාන පරිවට්ට සූත්‍රය, සත්තට්ඨාන සූත්‍රය, බුද්ධ සූත්‍රය, පඤ්චවග්ගිය සූත්‍රය, මහාලි සූත්‍රය, ආදිත්ත සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සමග උපය වර්ගයෙහි සූත්‍ර දශයකි.**

## 2. අරහන්තවග්ගො

### 1. 2. 2. 1.

### උපාදිය සුත්තං

**63. සාවත්ථියං:**

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

සාධු මෙ භන්තෙ භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු, යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

උපාදියමානො ඛො භික්ඛු, බද්ධො[1] මාරස්ස, අනුපාදියමානො මුත්තො පාපිමතො'ති.

අඤ්ඤාතං භගවා අඤ්ඤාතං සුගතා'ති.

යථාකථං පන ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසීති?

රූපං ඛො භන්තෙ, උපාදියමානො බද්ධො[1] මාරස්ස, අනුපාදියමානො මුත්තො පාපිමතො. වෙදනං උපාදියමානො බද්ධො මාරස්ස, අනුපාදියමානො මුත්තො පාපිමතො. සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ උපාදියමානො බද්ධො මාරස්ස, අනුපාදියමානො මුත්තො පාපිමතො. විඤ්ඤාණං උපාදියමානො බද්ධො මාරස්ස, අනුපාදියමානො මුත්තො පාපිමතො. ඉමස්ස ඛ්වාහං භන්තෙ, භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමීති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසි. රූපං ඛො භික්ඛු, උපාදියමානො බද්ධො මාරස්ස, අනුපාදියමානො මුත්තො පාපිමතො. වෙදනං - පෙ - සඤ්ඤං - පෙ - සඞ්ඛාරෙ - පෙ - විඤ්ඤාණං උපාදියමානො බද්ධො මාරස්ස, අනුපාදියමානො මුත්තො පාපිමතො. ඉමස්ස ඛො භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො'ති.

අථ ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො සො භික්ඛු එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො

1. බන්ධො - සිමු.



Free Distribution www.aathaapi.org

# 2. අරහත්ත වර්ගය

## 1. 2. 2. 1.

## උපාදිය සූත්‍රය

**63. සැවැත්නුවර :**

එ සමයෙහි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැනට එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙක හුන්නේ යැ. එකත් පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේය :

" වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ වෙතින් යම් ධර්මයක් අසා එකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවන් කරා යොමු කළ සිත් ඇති වැ වාස කෙරෙම් ද, මට එබඳු ධර්මයක් භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් දෙසනසේක් නම් මැනැවි " යි.

" මහණ, තෘෂ්ණා – දෘෂ්ටි – මාන විසින් දැඩි වැ ගන්නේ මාරපාශයෙන් බැඳුණේ වෙ යි, දැඩි වැ නො ගන්නේ මිදුණේ වේ " යයි.

" භාග්‍යවතුන් වහන්ස, දන්නා ලද යැ, සුගතයන් වහන්ස, දන්නා ලදැ " යි.

" මහණ, මා විසින් සැකෙවින් දෙශිත ධර්මයාගේ අර්ථය කිසෙයින් තෙපි විස්තර විසින් දනිවු ද " යි.

වහන්ස, රූපය (තණ්හා – මාන – දිට්ඨි විසින්) දැඩි වැ ගන්නේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, දැඩි වැ නො ගන්නේ මාරපාශයෙන් මිදුණේ වෙයි, වේදනාව උපාදන විසින් ගන්නේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, උපාදන විසින් නො ගන්නේ මාරපාශ යෙන් මිදුණේ වෙයි, සංඥාව ... සංස්කාර උපාදන විසින් ගන්නේ බැඳුණේ වෙයි, නො ගන්නේ මිදුණේ වෙයි. විඥානය උපාදන විසින් ගන්නේ මෘත්‍යුපාශයෙන් බැඳුණේ වෙයි, නො ගන්නේ මෘත්‍යුපාශයෙන් මිදුණේ වෙයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් භාෂිත මේ ධර්මයාගේ අර්ථය විස්තර වශයෙන් මම මෙසේ දනිමි යි.

මහණ, මැනැවි, මැනැවි. මහණ, මා විසින් සැකෙවින් දේශිත ධර්මයාගේ අර්ථය තෙපි විස්තර විසින් දනිවු. මහණ, රූපය තණ්හාදි විසින් ගන්නේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, තණ්හාදි විසින් නො ගන්නේ මාරපාශයෙන් මිදුණේ වෙයි. වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය තණ්හාදි විසින් ගන්නේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, නො ගන්නේ මාරපාශයෙන් මිදුණේ වේ. මහණ, මා විසින් සැකෙවින් භාෂිත මේ ධර්මයාගේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දතයුතු.

එකල්හි එ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්මැ ගියේ යැ. ඉක්බිති ඒ මහණ එකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ නො පමා වැ කෙලෙස් තවන

විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව-ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ‘ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා’ති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

## 1. 2. 2. 2.

## මඤ්ඤමාන සුත්තං

**64.** සාවත්ථියං :

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි-පෙ-භගවන්තං එතදවොච :

සාධු මෙ භන්තෙ භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු - පෙ - පහිතත්තො විහරෙය්‍යන්ති.

මඤ්ඤමානො ඛො භික්ඛු, බද්ධො මාරස්ස, අමඤ්ඤමානො මුත්තො පාපිමතො’ති.

අඤ්ඤාතං භගවා, අඤ්ඤාතං සුගතා’ති.

යථාකථං පන ත්වං භික්ඛු, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසීති ?

රූපං ඛො භන්තෙ, මඤ්ඤමානො බද්ධො මාරස්ස, අමඤ්ඤමානො මුත්තො පාපිමතො. වෙදනං - පෙ - සඤ්ඤං - පෙ - සඞ්ඛාරෙ - පෙ - විඤ්ඤාණං මඤ්ඤමානො බද්ධො මාරස්ස, අමඤ්ඤමානො මුත්තො පාපිමතො. ඉමස්ස ඛ්වාහං භන්තෙ, භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමීති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසි. රූපං ඛො භික්ඛු, මඤ්ඤමානො බද්ධො මාරස්ස, අමඤ්ඤමානො මුත්තො පාපිමතො. වෙදනං-පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං මඤ්ඤමානො බද්ධො මාරස්ස, අමඤ්ඤමානො මුත්තො පාපිමතො. ඉමස්ස ඛො භික්ඛු, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො’ති.

අථ ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා-පෙ-භගවන්තං පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො සො භික්ඛු එකො වූපකට්ඨො -පෙ- අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

වැර ඇති වැ නිවන් කරා යොමු කළ සිත් ඇති වැ වාස කරනුයේ නො බෝ කලකින් මැ යමක් සඳහා කුලපුත්හු මොනොවට ගිහිගෙන් නික් මැ බුදුසසුන්හි පැවිදි වෙත් ද, මගබඹසර අවසනැ වූ ඒ උතුම් අර්හත්වය මෙ අත්බව්හි මැ තමන් මැ මගනුවණින් දැන පසක් කොට එයට එළැඹැ වාස කෙළේ ය. '' ජාතිය ක්ෂය විය, මගබඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, මේ රහත්බව පිණිස අන්කිසෙක් නැතැ '' යි දත්තේය. ඒ මහණ රහතුන් වහන්සේ අතර අන්‍යතරයෙක් වූයේ යි.

## 1. 2. 2. 2.

## මඤ්ඤමාන සූත්‍රය

**64. සැවැත්නුවර :**

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැනට එළැඹියේ යැ ... භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය :

'' වහන්ස, ... (මම) නිවන් කරා යොමු කළ සිතැති වැ වාස කෙරෙම් ද, භාග්‍ය වතුන් වහන්සේ මට එබඳු දහමක් සැකෙවින් දෙසන සේක් නම් මැනවි යි.

මහණ, තෘෂ්ණා – මාන – දෘෂ්ටි මඤ්ඤනා විසින් හඟනේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, මඤ්ඤනා විසින් නො හඟනේ මාරපාශයෙන් මිදුණේ වේ.

භාග්‍යවතුන් වහන්ස, දන්නා ලද යැ, සුගතයන් වහන්ස, දන්නා ලදු යි.

මහණ, මා විසින් සැකෙවින් දේශිත ධර්මයාගේ අර්ථය තෙපි කීසෙයින් විස්තර විසින් දනිවු දැ යි ?

වහන්ස, රූපය මඤ්ඤනා විසින් හඟනේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, මඤ්ඤනා විසින් නො හඟනේ මාරපාශයෙන් මිදුණේ වෙයි. වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය මඤ්ඤනා විසින් හඟනේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, නො හඟනේ මිදුණේ වෙයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දේශිත මෙ භාෂිතයාගේ අර්ථ මෙසෙයින් මම විස්තර වශයෙන් දනිමි යි.

මහණ, මැනවි මැනවි. මහණ, මා විසින් සැකෙවින් දේශනා කළ භාෂිතයාගේ අර්ථ මෙසෙයින් තෙපි විස්තර විසින් දනිවු නම් ඒ මනා යි. මහණ, රූපය තෘෂ්ණාදි මඤ්ඤනා විසින් හඟනේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, නො හඟනේ මාරපාශයෙන් මිදුණේ වෙයි. වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය මඤ්ඤනා විසින් හඟනේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, නො හඟනේ මාරපාශයෙන් මිදුණේ වෙයි. මහණ මා විසින් සැකෙවින් දේශිත ධර්මයාගේ අර්ථ මෙසෙයින් විස්තර වශයෙන් දතයුතු.

එකල්හි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන භාග්‍යවතුන් වහන්සේ පැදකුණු කොට නික්මැ ගියේ යැ. ඉක්බිති ඒ මහණ එකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ ... එ මහණ රහතුන් වහන්සේ අතර අන්‍යතරයෙක් වූයේ යි.

11—ඒ 50066 (80/06)

## 1. 2. 2. 3.

## අභිනන්දන සුත්තං

**65. සාවත්ථියං :**

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච :

සාධු මෙ භන්තෙ භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු, -පෙ- පහිතත්තො විහරෙය්‍යන්ති.

අභිනන්දමානො ඛො භික්ඛු, බද්ධො මාරස්ස, අනභිනන්දමානො මුත්තො පාපිමතො'ති.

අඤ්ඤාතං භගවා, අඤ්ඤාතං සුගතා'ති.

යථා කථං පන ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසී'ති ?

රූපං ඛො භන්තෙ, අභිනන්දමානො බද්ධො මාරස්ස, අනභිනන්දමානො මුත්තො පාපිමතො. වෙදනං - පෙ - සඤ්ඤං - පෙ - සඞ්ඛාරෙ-පෙ- විඤ්ඤාණං අභිනන්දමානො බද්ධො මාරස්ස, අනභිනන්දමානො මුත්තො පාපිමතො. ඉමස්ස ඛ්වා'හං භන්තෙ, භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමී'ති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාසි.

රූපං ඛො භික්ඛු, අභිනන්දමානො බද්ධො මාරස්ස, අනභිනන්දමානො මුත්තො පාපිමතො. වෙදනං - පෙ - සඤ්ඤං - පෙ - සඞ්ඛාරෙ - පෙ - විඤ්ඤාණං අභිනන්දමානො බද්ධො මාරස්ස, අනභිනන්දමානො මුත්තො පාපිමතො. ඉමස්ස ඛො භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො'ති.

අථ ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා,-පෙ-භගවන්තං පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො සො භික්ඛු එකො වූපකට්ඨො -පෙ- අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

## 1. 2. 2. 4.

## අනිච්ච සුත්තං

**66. සාවත්ථියං :**

අථ ඛො අඤ්ඤතරො භික්ඛු-පෙ-භගවන්තං එතදවොච :

සාධු මෙ භන්තෙ භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු, යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති

## 1. 2. 2. 3.

## අභිනන්දන සූත්‍රය

**65.** සැවැත්නුවර :

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැනට එළැඹියේ යැ, එළැඹ ... එකත්පසෙකැ හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ ය :

"වහන්ස, ... (මම) නිවන් කරා යොමු කළ සිතැති වැ වාස කෙරෙම් ද, මට එබඳු දහමක් සැකෙවින් දේශනා කරන සේක් නම් මැනැවි"යි.

"මහණ, තෘෂ්ණාදි විසින් අභිනන්දන කරනුයේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, අභිනන්දන නො කරනුයේ පාපිමත්හුගේ (මරහුගේ) පාශයෙන් මිදුණේ වෙයි."

"භාග්‍යවතුන් වහන්ස, දන්නා ලද යැ, සුගතයන් වහන්ස දන්නා ලදැ"යි.

"මහණ, මා විසින් සැකෙවින් දේශිත ධර්මයාගේ අර්ථ කෙසේ නම් තෙපි විස්තර විසින් දනිවු ද ?"

වහන්ස, රූපය, අභිනන්දන කරනුයේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, අභිනන්දන නො කරනුයේ මාරපාශයෙන් මිදුණේ වෙයි. වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය අභිනන්දන කරනුයේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, අභිනන්දන නො කරනුයේ මාරපාශයෙන් මිදුණේ වෙයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දේශිත ධර්මයාගේ අර්ථ මෙසෙයින් මම විස්තර වශයෙන් දනිමි යි.

මහණ, මනා යැ මනා යැ, මහණ, මා විසින් සැකෙවින් දේශිතධර්මයාගේ අර්ථ මෙසෙයින් තෙපි විස්තර ලෙය දනිවු.

මහණ, රූපය අභිනන්දන කරනුයේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, අභිනන්දන නො කරනුයේ මාරපාශයෙන් මිදුණේ වෙයි. වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය අභිනන්දන කරනුයේ මාරපාශයෙන් බැඳුණේ වෙයි, අභිනන්දන නො කරනුයේ මාරපාශයෙන් මිදුණේ වෙයි. මහණ, මා විසින් සැකෙවින් දේශිත මේ ධර්මයාගේ අර්ථ මෙසෙයින් විස්තර ලෙස දතයුතු යි.

එකල්හි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන ... භාග්‍යවතුන් වහන්සේ පැදකුණු කොට නික්ම ගියේ යැ. ඉක්බිති ඒ මහණ එකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ ... ඒ මහණ රහතුන් වහන්සේ අතර අන්‍යතරයෙක් වූයේ යි.

## 1. 2. 2. 4.

## අනිච්ච සූත්‍රය

**66.** සැවැත්නුවර :

එකල්හි එක්තරා මහණෙක් ... භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ ය.

"වහන්ස, මම යම් දහමක් භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා එකලා වූයෙම් ගණයා කෙරෙන් වෙන්වූයෙම් නො පමාවූයෙම් කෙලෙස් තවන වැර ඇතියෙම්, නිවන් කරා යොමු කළ සිත් ඇතියෙම්, වාස කෙරෙම් නම්, භාග්‍යවතුන් වහන්සේ මට එබඳු දහමක් දෙසනසේක් නම් මැනැවි"යි.

යං ඛො භික්ඛු, අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො'ති.

අඤ්ඤාතං භගවා අඤ්ඤාතං සුගතා'ති.

යථාකථං පන ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසී'ති.

රූපං ඛො භන්තෙ, අනිච්චං, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො, වෙදනා අනිච්චා - පෙ - සඤ්ඤා අනිච්චා - පෙ - සඞ්ඛාරා අනිච්චා - පෙ - විඤ්ඤාණං අනිච්චං, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො, ඉමස්ස ඛ්වා'හං භන්තෙ, භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමී'ති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසි, රූපං ඛො භික්ඛු, අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. ඉමස්ස ඛො භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො'ති.

අථ ඛො සො භික්ඛු, භගවතො භාසිතං අභිනන්දිත්වා - පෙ - අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

## 1. 2. 2. 5.

## දුක්ඛ සුත්තං

67. සාවත්ථියං :

අථ ඛො අඤ්ඤතරො භික්ඛු-පෙ-එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච :

සාධු මෙ භන්තෙ භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු - පෙ - පහිතත්තො විහරෙය්‍යන්ති.

යං ඛො භික්ඛු, දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො'ති.

අඤ්ඤාතං භගවා' අඤ්ඤාතං සුගතා'ති.

යථාකථං පන ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසී'ති ?

රූපං ඛො භන්තෙ, දුක්ඛං, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො, වෙදනා දුක්ඛා - පෙ - සඤ්ඤා දුක්ඛා - පෙ - සඞ්ඛාරා දුක්ඛා - පෙ - විඤ්ඤාණං දුක්ඛං, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො. ඉමස්ස ඛ්වා'හං භන්තෙ, භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමී'ති

Free Distribution www.aathaapi.org

මහණ, යමක් අනිත්‍ය ද, එහි තොපගේ තෘෂ්ණා ඡන්දය දුරලියයුතු යි.

භාග්‍යවතුන් වහන්ස, දන්නාලද යෑ, සුගතයන් වහන්ස, දන්නා ලද යි.

මහණ, මා විසින් සැකෙවින් දේශිත ධර්මයාගේ අර්ථ කිසෙයින් තෙපි විස්තර විසින් දනිවු ද ?

වහන්ස, රූපය අනිත්‍ය යෑ, එහි ලා මාගේ තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණය කළයුතු වෙයි. වේදනාව අනිත්‍ය යෑ, ... සංඥව අනිත්‍ය යෑ, ... සංස්කාර අනිත්‍ය යෑ, ... විඥනය අනිත්‍ය යෑ, එහි ලා මාගේ තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණය කළයුතු වේ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දේශිත මේ ධර්මයාගේ අර්ථ මම් විස්තර වශයෙන් මෙසේ දනිමි යි.

මැනවි මැනවි මහණ. මහණ මා විසින් සැකෙවින් දේශිත ධර්මයාගේ අර්ථ මෙසේ විස්තර වශයෙන් දනිවූ, මහණ, රූපය අනිත්‍ය යෑ, එහි ලා තොපගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු යි. වෙදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය අනිත්‍ය යෑ, එහි ලා තොපගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු යි. මහණ මා විසින් සැකෙවින් භාෂිත මේ ධර්මයාගේ අර්ථ මෙසේ දතයුත්තේ යි.

එකල්හි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන ... ඒ මහණ රහතුන් අතර අන්‍යතරයෙක් වූයේ යි.

## 1. 2. 2. 5.

## දුක්ඛ සූත්‍රය

67. සැවැත්නුවර :

එකල්හි එක්තරා මහණෙක් ... එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකෙළේ ය :

වහන්ස, මම් ... නිවන් කරා යොමුකළ සිතැති වැ වාස කෙරෙම් නම් භාග්‍යවතුන් වහන්සේ මට එබඳු දහමක් සැකෙවින් දෙසනසේක් නම් මැනැවි යි.

මහණ, යමක් දුක් ද එහි ලා තොපගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු යි.

භාග්‍යවතුන් වහන්ස, දන්නා ලද යෑ, සුගතයන් වහන්ස, දන්නා ලද යි.

මහණ, මා විසින් සැකෙවින් දේශිත වචනයාගේ අර්ථ කවර අයුරකින් තෙපි විස්තර වශයෙන් දනිවු ද යි.

වහන්ස, රූපය දුක් යෑ, එහි ලා මාගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු වෙයි, වේදනාව දුක් යෑ, ... සංඥව දුක් යෑ ... සංස්කාර දුක් යෑ ... විඥනය දුක් යෑ, එහි ලා මාගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු වෙයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දේශිත මේ ධර්මයාගේ අර්ථ මම් විස්තර වශයෙන් මෙසේ දනිමි යි.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසි. රූපං ඛො භික්ඛු, දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. වෙදනා දුක්ඛා-පෙ-සඤ්ඤා දුක්ඛා-පෙ-සඞ්ඛාරා දුක්ඛා - පෙ - විඤ්ඤාණං දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. ඉමස්ස ඛො භික්ඛු, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො'ති.

අථ ඛො සො භික්ඛු, භගවතො භාසිතං අභිනන්දිත්වා - පෙ - අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසී'ති.

## 1. 2. 2. 6.

### අනත්ත සුත්තං

69. සාවත්ථියං :

අථ ඛො අඤ්ඤතරො භික්ඛු-පෙ-එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච :

සාධු මෙ භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු - පෙ - පහිතත්තො විහරෙය්‍යන්ති.

යො ඛො භික්ඛු, අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො'ති.

අඤ්ඤාතං භගවා, අඤ්ඤාතං සුගතාති.

යථාකථං පන ත්වං භික්ඛු, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසී'ති?

රූපං ඛො භන්තෙ, අනත්තා, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො. වෙදනා අනත්තා -පෙ- සඤ්ඤා අනත්තා -පෙ- සඞ්ඛාරා අනත්තා-පෙ- විඤ්ඤාණං අනත්තා, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො. ඉමස්ස ඛො'හං භන්තෙ, භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමී'ති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාසි. රූපං ඛො භික්ඛු, අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. වෙදනා - පෙ - සඤ්ඤා - පෙ - සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. ඉමස්ස ඛො භික්ඛු, මයා සඞ්ඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො'ති.

අථ ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා - පෙ - අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසී'ති.

මැනැවි මැනැවි මහණ. මහණ, මා විසින් සැකෙවින් කියන ලද වචනයාගේ අර්ථ තෙපි විස්තර වශයෙන් දනිවු, මහණ, රූපය දුක් යැ, එහි ලා තොපගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු ය. වේදනාව දුක් යැ ... සංඥව දුක් යැ ... සංස්කාර දුක් යැ ... විඥනය දුක් යැ. එහි ලා තොපගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු යි. මහණ, මා විසින් සැකෙවින් දේශිත මේ වචනයාගේ අර්ථ විස්තර වශයෙන් මෙසේ දතයුත්තේ යි.

එ කල්හි, එ මහණ, භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන ... ඒ මහණ රහතුන් අතර අන්‍යතරයෙක් වූයේ යි.

## 1. 2. 2. 6.

## අනත්ත සූත්‍රය

68. සැවැත්නුවර :

එකල්හි එක්තරා මහණෙක් ... එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ යැ :

වහන්ස, මම ... නිවන් කරා යොමු කළ සිතැති වැ වාස කෙරෙම් ද භාග්‍යවතුන් වහන්සේ මට එබඳු දහමක් සැකෙවින් දෙසනසේක් නම් මනා යි.

මහණ, යමක් අනාත්ම ද එහි ලා තොපගේ තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණ කළයුතු.

භාග්‍යවතුන් වහන්ස දන්නා ලද යැ, සුගතයන් වහන්ස දන්නා ලද යි.

මහණ, මා විසින් සැකෙවින් පවයන ලද වචනයාගේ අරුත් තෙපි කිසෙයින් විතර විසින් දනිවු දැ යි ?

වහන්ස, රූපය අනාත්ම යි, එහි ලා මාගේ තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණ කළයුතු වෙයි. වේදනාව අනාත්ම යි ... සංඥව අනාත්ම යි ... සංස්කාර අනාත්ම යි ... විඥනය අනාත්ම යි, එහි ලා මාගේ තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණ කළයුතු වේ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත ධර්මයාගේ අර්ථ මම මෙසේ විස්තර වශයෙන් දනිමි යි.

මහණ, මැනැවි මැනැවි. මහණ, මා විසින් සැකෙවින් පවසන ලද වචනයාගේ අරුත් තෙපි විතර විසින් මෙසේ දනිවු, ඒ මැනැවි. මහණ, රූපය අනාත්ම යි, එහි ලා තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණ කටයුතු යි, වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය අනාත්ම යි, එහි ලා තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණ කටයුතු. මහණ, මා විසින් සැකෙවින් පැවැසූ වචනයාගේ අරුත් විතර විසින් මෙසේ දතයුත්තේ යි.

එකල්හි එ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන ... එ මහණ රහතුන් අතර අන්‍යතරයෙක් වූයේ යි.

## 1. 2. 2. 7.

### අනත්තනිය සුත්තං

**69. සාවත්ථියං:**

අථ ඛො අඤ්ඤතරො භික්ඛු-පෙ-එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු-පෙ-පහිතත්තො විහරෙය්‍යන්ති.

යං ඛො භික්ඛු අනත්තනියං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බොති.

අඤ්ඤාතං භගවා අඤ්ඤාතං සුගතා'ති.

යථාකථං පන ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසී'ති?

රූපං ඛො භන්තෙ, අනත්තනියං, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො, වෙදනා අනත්තනියා, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො, සඤ්ඤා-පෙ-සංඛාරා අනත්තනියා, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො. විඤ්ඤාණං අනත්තනියං, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො, ඉමස්ස ඛො'හං භන්තෙ භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමීති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසි, රූපං ඛො භික්ඛු, අනත්තනියං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. වෙදනා අනත්තනියා-පෙ-සඤ්ඤා අනත්තනියා-පෙ-සංඛාරා අනත්තනියා-පෙ-විඤ්ඤාණං අනත්තනියං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. ඉමස්ස ඛො භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති.

අථ ඛො සො භික්ඛු, භගවතො භාසිතං අභිනන්දිත්වා-පෙ-අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

## 1. 2. 2. 8.

### රජනීය සුත්තං

**70. සාවත්ථියං:**

අථ ඛො අඤ්ඤතරො භික්ඛු-පෙ-එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

යං ඛො භික්ඛු, රජනීයසණ්ඨිතං තත්‍ර තෙ ඡන්දො පහාතබ්බොති.

අඤ්ඤාතං භගවා, අඤ්ඤාතං සුගතාති.

## 1. 2. 2. 7.

## අනත්තනිය සූත්‍රය

**69. සැවැත්නුවර :**

එකල්හි එක්තරා මහණෙක් ... එකත් පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ ය :

වහන්ස, මම් ... නිවන කරා යොමු කළ සිතැති වැ වාස කෙරෙම් ද, භාග්‍යවතුන් වහන්සේ මට එබඳු දහමක් සැකෙවින් දේශනා කරන සේක් නම් මනා යි.

මහණ, යමක් තමා අයත් ද, එහි තෘෂ්ණාච්ඡන්දය හළයුතු යි.

භාග්‍යවතුන් වහන්ස, දන්නා ලද යැ, සුගතයන් වහන්ස, දන්නා ලද යි.

මහණ, මා විසින් සැකෙවින් දේශිත මේ වචනයාගේ අර්ථ කිසෙයින් තෙපි විස්තර වශයෙන් දනිවූ ද යි ?

වහන්ස, රූපය තමා අයත් නො වෙයි, එහි ලා මාගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු වේ. වේදනාව තමා අයත් නො වෙයි, එහි ලා මාගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු වේ. සංඥාව ... සංස්කාර තමා අයත් නො වෙයි, එහි ලා මාගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු වේ. විඥානය තමා අයත් නො වෙයි, එහි ලා මාගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු වේ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දේශිත මේ ධර්මයාගේ අර්ථ මම් මෙසේ විස්තර වශයෙන් දනිමි යි.

මහණ, මැනැවි, මැනැවි. මහණ මාවිසින් සැකෙවින් පැවැසූ වචනයේ අරුත් මෙසේ තෙපි විතර විසින් දනිවු. මහණ, රූපය තමා සතු නොවෙ යි, එහි ලා තොපගේ තෘෂ්ණාච්ඡන්දය හළයුතු ය. වේදනාව තමාසතු නො වෙයි, ... සංඥාව තමා සතු නො වෙයි ... සංස්කාර තමා සතු නො වෙයි ... විඥානය තමා සතු නො වෙයි. එහි ලා තොපගේ, තෘෂ්ණාච්ඡන්දය හළයුතු. මහණ මා විසින් සැකෙවින් පැවැසූ මේ වචනයේ අරුත් මෙසේ විස්තර වශයෙන් දතයුත්තේ යි.

එකල්හි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන ... ඒ මහණ රහතුන් අතර අන්‍යතරයෙක් ද වූයේ යි.

## 1. 2. 2. 8.

## රජනීය සූත්‍රය

**70. සැවැත්නුවර :**

එකල්හි එක්තරා මහණෙක් ... එකත්පස් වැ හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ යැ : වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ වෙතින් යම් දහමක් අසා එකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ නො පමා වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවන කරා යොමු කළ සිතැති වැ වාස කෙරෙම් ද, භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් මට දේශනා කරනසේක් නම් මැනැවැ යි.

මහණ, රඤ්ජනාදව්‍යාකාරයෙන් සිටි යමක් ඇත් ද, එහි තාගේ තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණ කටයුතු යි.

භාග්‍යවතුන් වහන්ස, දන්නා ලද යැ, සුගතයන් වහන්ස, දන්නා ලද යි.

යථාකථං පන ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසි?

රූපං ඛො භන්තෙ, රජනීයසණ්ඨිතං, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො, වෙදනා රජනීයසණ්ඨිතා, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො, සඤ්ඤා-පෙ-සඞ්ඛාරා-පෙ-විඤ්ඤාණං රජනීයසණ්ඨිතං, තත්‍ර මෙ ඡන්දො පහාතබ්බො, ඉමස්ස ඛො'හං භන්තෙ භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථං ආජානාමී'ති.

සාධු සාධු භික්ඛු, සාධු ඛො ත්වං භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථං ආජානාසි, රූපං ඛො භික්ඛු, රජනීය සණ්ඨිතං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා-පෙ-විඤ්ඤාණං රජනීයසණ්ඨිතං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. ඉමස්ස ඛො භික්ඛු, මයා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බොති.

අථ ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො සො භික්ඛු එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

## 1. 2. 2. 9.

## රාධ සුත්තං

71\. සාවත්ථියං :

අථ ඛො ආයස්මා රාධො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච :

''කථන්නු ඛො භන්තෙ, ජානතො කථං පස්සතො ඉමස්මිං ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහංකාරමමංකාර මානානුසයා න හොන්තී''ති?

යං කිඤ්චි රාධ, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා, බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං ''නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා''ති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා-පෙ-යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං

මහණ, මා විසින් සැකෙවින් දේශිත වචනයේ අර්ථ කිසෙයින් තෙපි විස්තර විසින් දනිවු දූ යි ?

වහන්ස, රූපය රඤ්ජනද්‍රව්‍යාකාරයෙන් සිටියේ ය, එහිලා මාගේ තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණ කටයුතු වෙයි. වේදනාව රඤ්ජනද්‍රව්‍යාකාරයෙන් සිටියා යැ, එහි ලා මාගේ තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණ කටයුතු වෙයි. සංඥව ... සංස්කාර ... විඥනය රඤ්ජන ද්‍රව්‍යාකාරයෙන් සිටියේ යැ, එහිලා මාගේ තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණ කටයුතු වේ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් දේශිත මේ ධර්මයාගේ අර්ථ මම මෙසේ විස්තර වශයෙන් දනිමි යි.

මහණ, මැනැවි මැනැවි. මහණ මා විසින් සැකෙවින් දේශිත වචනයාගේ අර්ථ තෙපි විස්තර විසින් දනිවු. ඒ මැනැවි. මහණ රූපය රඤ්ජන ද්‍රව්‍යාකාරයෙන් සිටියේ වෙයි. එහිලා තොපගේ තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණ කළයුතු යැ, වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය රඤ්ජන ද්‍රව්‍යාකාරයෙන් සිටියේ වෙයි, එහිලා තොපගේ තෘෂ්ණාච්ඡන්දය ප්‍රහාණ කළයුතු.

එකල්හි ඒ මහණ භාග්‍යවතුන්වහන්සේගේ භාෂිතය පිළිගෙන අනුමෝදන් වැ හුනස්නෙන් නැඟී සිට භාග්‍යවතුන් වහන්සේ අභිවාදනා කොට නික්මැ ගියේ යැ. ඉක්බිති ඒ මහණ එකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ නො පමා වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවන කරා යොමු කළ සිතැති වැ වාස කරනුයේ නොබෝ කලකින් මැ යමක් සඳහා කුලපුත්හු මොනොවට ගිහිගෙන් නික්මැ සසුන්හි පැවිදි වෙත් ද, බඹසර කෙළවර කොට ඇති ඒ උතුම් අර්හත්වය තමා මැ දූන පසක් කොට එයට එළැඹැ වාස කෙළේ යි. ''ජාතිය ක්ෂය වියැ, බඹසර වැස නිමවන ලදී. කරණී කරන ලද, මෙ රහත් බව සඳහා කළමනා අන් කියෙක් නැතැ''යි වෙසෙසින් දත්තේ යැ. ඒ මහණ රහතුන් අතුරෙහි අන්‍යතරයෙක් ද වූයේ යි.

## 1. 2. 2. 9.

## රාධ සූත්‍රය

**71. සැවැත්නුවර :**

එකල්හි ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැනට එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙකැ හුන්හ. එකත් පසෙකැ හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ :

වහන්ස, කිසෙයින් දන්නා කිසෙයින් දක්නා පුහුල්හට සවිඥනක මේ ශරීරයෙහිත් බාහිර රූපාදි සර්වනිමිත්තයන්හිත් අහංකාර දෘෂ්ටිය – මමීකාර තෘෂ්ණාව – මාන යන අනුශයධර්මයෝ නො වෙත් දූ යි ?

රාධය, අතීත – අනාගත ප්‍රත්‍යුත්පන්න යම් රූපයෙක් ඇත් ද, අධ්‍යාත්ම හෝ බාහිර හෝ ඖදරික හෝ සූක්ෂ්ම හෝ හීන හෝ ප්‍රණීත හෝ දුර හෝ ළඟ හෝ යම් කිසි රූපයෙක් ඇත් ද, ඒ සියලු රූපය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වෙයි'' මෙසේ තෙල යථාභූත කොට සම්‍යක් ප්‍රඥවෙන් දකියි. යම් කිසි වේදනාවක් ... යම්කිසි සංඥවක් ... යම් කිසි සංස්කාර ... අතීත – අනාගත – ප්‍රත්‍යුත්පන්න යම් විඥනයෙක් ඇත් ද, අධ්‍යාත්ම වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි දුර වේවයි ළඟ වේවයි යම් කිසි විඥනයෙක්

විඤ්ඤාණං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. එවං ඛො, රාධ, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහඞ්කාරමමඞ්කාරමානානුසයා න හොන්තීති. -පෙ- අඤ්ඤතරො ච පනායස්මා රාධො අරහතං අහොසීති.

## 1. 2. 2. 10.

## සුරාධ සුත්තං

**72.** සාවත්ථියං :

අථ ඛො ආයස්මා සුරාධො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සුරාධො භගවන්තං එතදවොච :

කථං නු ඛො භන්තෙ, ජානතො කථං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහඞ්කාරමමඞ්කාරමානාපගතං මානසං හොති, විධා සමතික්කන්තං සන්තං සුවිමුත්තන්ති ?

යං කිඤ්චි සුරාධ, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුපාදා විමුත්තො හොති.

යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තාති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුපාදා විමුත්තො හොති.

එවං ඛො සුරාධ, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහඞ්කාරමමඞ්කාරමානාපගතං මානසං හොති. විධා සමතික්කන්තං සන්තං සුවිමුත්තන්ති. -පෙ- අඤ්ඤතරො ච පනායස්මා සුරාධො අරහතං අහොසී'ති.

අරහන්තවග්ගො දුතියො

තස්සුද්දානං :

උපාදිය මඤ්ඤමානො අථොපි අභිනන්දනා
අනිච්චං දුක්ඛං අනත්තා ච අනත්තනියං රජනීයසණ්ඨිතං
රාධ සුරාධෙන වෙව දුතියො පූරිතො වග්ගො.

ඇත් ද ඒ සියලු විඥානය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වෙයි'' මෙසේ තෙල ඇති සැටි සම්‍යක්ප්‍රඥයෙන් දකියි. රාධය මෙසේ දන්නා මෙසේ දක්නා පුඟුල්හට සවිඥානක මේ ශරීරයෙහිත් බාහිර රූපාදි සර්ව නිමිත්ත විෂයෙහිත් අහංකාර දෘෂ්ටිය – මමීකාර තෘෂ්ණාව – මාන යන අනුශයයෝ නො වෙත් යි … ආයුෂ්මත් රාධ තෙරණුවෝ රහතුන් අතුරෙහි අන්‍යතර වූහ යි.

## 1. 2. 2. 10.

## සුරාධ සූත්‍රය

**72. සැවැත්නුවර :**

එකල්හි ආයුෂ්මත් සුරාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වැඩහුන් තැනට එළැඹියහ. භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙකැ හුන්හ. එකත්පසෙකැ හුන් ආයුෂ්මත් සුරාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ :

වහන්ස, කිසෙයින් දන්නහුගේ කිසෙයින් දක්නහුගේ සිත සවිඥානක වූ මේ කයෙහිත් බැහැර රූපාදි සියලු නිමිති විෂයෙහිත් අහිඞ්කාර (–දිට්ඨි) මමිඞ්කාර (–තණ්හා) මාන පහවූයේ වේ ද, මාන කොටස් මැනැවින් ඉක්මැ වූයේ ක්ලෙශව්‍යපශමයෙන් ශාන්ත වූයේ කෙලෙසුන් කෙරෙන් මිදුණේ වේ ද යි ?

සුරාධ, අධ්‍යාත්ම වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි අතීත – අනාගත – ප්‍රත්‍යුත්පන්න යම්කිසි රූපයෙක් ඇත් ද දුර හෝ ළඟ හෝ යම් රූපයෙක් ඇත් ද ඒ සියලු රූපය '' තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේ ය '' යි මෙසේ තෙල ඇති සැටි සම්‍යක් ප්‍රඥයෙන් දැන උපාදාන විසින් නො ගෙන කෙලෙසුන් කෙරෙන් මිදුණේ වෙයි.

යම්කිසි වේදනාවක් … යම්කිසි සංඥවක් … යම්කිසි සංස්කාර … අතීත - අනාගත - ප්‍රත්‍යුත්පන්න වූ අධ්‍යාත්ම වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම්කිසි විඥානයෙක් ඇත් ද, දුර හෝ ළඟ හෝ යම් විඥානයෙක් ඇත් ද, ඒ සියලු විඥානය '' තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේ ය '' යි මෙසේ තෙල ඇති සැටි සම්‍යක්ප්‍රඥයෙන් දැන උපාදාන විසින් නො ගෙන කෙලෙසුන් කෙරෙන් මිදුණේ වෙයි.

සුරාධ, මෙසේ දන්නහුගේ මෙසේ දක්නහුගේ සිත මේ විඥාන සහිත කයෙහි ද, බාහිර සියලු නිමිත්තයන්හි ද දිට්ඨි – තණ්හා – මානයෙන් පහවූයේ වෙයි, මාන කොටස් මොනොවට ඉක්මැවූයේ ශාන්ත වූයේ මොනොවට මිදුණේ වෙයි. … ආයුෂ්මත් සුරාධ තෙරණුවෝ රහතුන් අතුරෙහි අන්‍යතර කෙනෙක් වූහ යි.

දෙවැනි අරහත්තවර්ග යි

**එහි උද්දානය :**

උපාදිය, මඤ්ඤමාන, යළි අභිනන්දනා අනිච්ච, දුක්ඛ, අනත්ත, අත්තනිය, රජනිය, රාධ, සුරාධ ද යි සූත්‍ර දශයකින් දෙවැනි වර්ගය පිරුණේ වෙයි.

## 3. ඛජ්ජනීයවග්ගො

### 1. 2. 3. 1.

### අස්සාද සුත්තං

**73. සාවත්ථියං :**

අස්සුතවා, භික්ඛවෙ, පුථුජ්ජනො රූපස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. වෙදනාය අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. සඤ්ඤාය-පෙ-සඞ්ඛාරානං-පෙ-විඤ්ඤාණස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති.

සුතවා ච ඛො භික්ඛවෙ අරියසාවකො රූපස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති, වෙදනාය-පෙ-සඤ්ඤාය -පෙ-සඞ්ඛාරානං-පෙ-විඤ්ඤාණස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාතීති.

### 1. 2. 3. 2.

### පඨම සමුදය සුත්තං

**74. සාවත්ථියං :**

අස්සුතවා භික්ඛවෙ, පුථුජ්ජනො රූපස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. වෙදනාය - පෙ - සඤ්ඤාය - පෙ - සඞ්ඛාරානං - පෙ - විඤ්ඤාණස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති.

සුතවා ච ඛො භික්ඛවෙ, අරියසාවකො රූපස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං-පෙ-විඤ්ඤාණස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාතීති.

### 1. 2. 3. 3.

### දුතිය සමුදය සුත්තං

**75. සාවත්ථියං :**

සුතවා, භික්ඛවෙ, අරියසාවකො රූපස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. වෙදනාය -පෙ-සඤ්ඤාය-පෙ-සඞ්ඛාරානං-පෙ-විඤ්ඤාණස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාතීති.

## 3. ඛජ්ජනීය වර්ගය

### 1. 2. 3. 1.

### අස්සාද සූත්‍රය

**73. සැවැත්නුවර :**

මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජන රූපයාගේ ආශ්වාද ද, ආදීනව ද, නිශ්ශරණ ද ඇති සැටි නො දනියි. වේදනාවගේ ... සංඥාවගේ ... සංස්කාරයන්ගේ ... විඥානයාගේ ආස්වාද ද, ආදීනව ද, නිශ්ශරණ ද ඇති සැටි නො දනියි.

මහණෙනි, ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපයාගේ ආස්වාදත් ආදීනවත් නිශ්ශරණත් ඇති සැටි දනියි. වේදනාවගේ ... සංඥාවගේ ... සංස්කාරයන්ගේ ... විඥානයාගේ ආස්වාදත් ආදීනවත් නිශ්ශරණත් ඇති සැටි දනී යි.

### 1. 2. 3. 2.

### පළමුවැනි සමුදය සූත්‍රය

**74. සැවැත්නුවර :**

මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජන රූපයාගේ සමුදය ද, අස්තඞ්ගමය ද, ආස්වාදය ද, ආදීනව ද, නිශ්ශරණය ද ඇති සැටි නො දනියි. වේදනාවගේ ... සංඥාවගේ ... සංස්කාර යන්ගේ ... විඥානයාගේ සමුදය ද, අස්තඞ්ගමය ද, ආස්වාදය ද, ආදීනව ද, නිශ්ශරණ ද ඇති සැටි නො දනියි.

මහණෙනි, ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපයාගේ සමුදයත් අස්තඞ්ගමයත්, ආස්වාදයත්, ආදීනවත්, නිශ්ශරණත් ඇති සැටි දනියි. වේදනාවගේ ... සංඥාවගේ ... සංස්කාර යන්ගේ ... විඥානයාගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවත් නිශ්ශරණයත් ඇතිසැටි දනී යි.

### 1. 2. 3. 3.

### දෙවැනි සමුදය සූත්‍රය

**75. සැවැත්නුවර :**

මහණෙනි, ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපයාගේ සමුදය ද, අස්තඞ්ගමය ද, ආස්වාදය ද, ආදීනව ද, නිශ්ශරණය ද ඇති සැටි දනියි. වේදනාවගේ ... සංඥාවගේ ... සංස්කාරයන් ගේ ... විඥානයාගේ සමුදය ද, අස්තඞ්ගමය ද, ආස්වාදය ද, ආදීනව ද, නිශ්ශරණය ද ඇති සැටි දනී යි,

## 1. 2. 3. 4.

## පඨම අරහන්ත සුත්තං

**76.** සාවත්ථියං :

රූපං භික්ඛවෙ, අනිච්චං. යදනිච්චං තං දුක්ඛං. යං දුක්ඛං තදනත්තා. යදනත්තා තං “නෙතං මම, නෙසො’හමස්මි, න මෙසො අත්තා’’ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. වෙදනා-පෙ-සඤ්ඤා-පෙ-සඞ්ඛාරා-පෙ-විඤ්ඤාණං අනිච්චං. යදනිච්චං තං දුක්ඛං. යං දුක්ඛං තදනත්තා. යදනත්තා තං “නෙතං මම, නෙසො’හමස්මි න මෙසො අත්තා’’ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

යාවතා භික්ඛවෙ, සත්තාවාසා, යාවතා භවග්ගං, එතෙ අග්ගා එතෙ සෙට්ඨා ලොකස්මිං යදිදං අරහන්තො’ති. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා :

1. සුඛිනො වත අරහන්තො - තණ්හා තෙසං න විජ්ජති
අස්මිමානො සමුච්ඡින්නො - මොහජාලං පදාලිතං.

2. අනෙජං තෙ අනුප්පත්තා - චිත්තං තෙසං අනාවිලං
ලොකෙ අනුපලිත්තා තෙ - බ්‍රහ්මභූතා අනාසවා.

3 පඤ්චක්ඛන්ධෙ පරිඤ්ඤාය - සත්තසද්ධම්මගොචරා
පාසංසියා සප්පුරිසා - පුත්තා බුද්ධස්ස ඔරසා.

4. සත්තරතනසම්පන්නා - තීසු සික්ඛාසු සික්ඛිතා
අනුවිචරන්ති මහාවීරා - පහීනභයභෙරවා.

5. දසහඞ්ගෙහි සම්පන්නා - මහානාගා සමාහිතා
එතෙ ඛො සෙට්ඨා ලොකස්මිං - තණ්හා තෙසං න විජ්ජති.

6 අසෙඛඤාණං උප්පන්නං - අන්තිමොයං සමුස්සයො
යො සාරො බ්‍රහ්මචරියස්ස - තස්මිං අපරපච්චයා.

විධාසු න විකම්පන්ති - විප්පමුත්තා පුනබ්භවා
දන්තභූමිං අනුප්පත්තා - තෙ ලොකෙ විජිතාවිනො.

8. උද්ධං තිරියං අපාචීනං - නන්දී තෙසං න විජ්ජති
නදන්ති තෙ සීහනාදං - බුද්ධා ලොකෙ අනුත්තරා’ති.

Free Distribution www.aathaapi.org

## 1. 2. 3. 4.

## පළමුවැනි අරහන්ත සූත්‍රය

**76.** සැවැත්නුවර:

මහණෙනි, රූපය අනිත්‍ය යි, යමක් අනිත්‍ය ද, එය දුක යි. යමක් දුක් ද, එය අනාත්ම යි. යමක් අනාත්ම ද එය " තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ " යයි මෙසේ තෙල ඇති සැටි සම්‍යක්ප්‍රඥයෙන් දක්කයුතු යැ. වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය අනිත්‍ය යි. යමක් අනිත්‍ය ද, එය දුක යි. යමක් දුක් ද, එය අනාත්ම යි. යමක් අනාත්ම ද, එය " තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ." යයි මෙසේ තෙල ඇති සැටි සම්‍යක් ප්‍රඥයෙන් දක්කයුතු.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපයෙහි දු කලකිරෙයි, වේදනායෙහි දු කලකිරෙයි, සංඥයෙහි දු කලකිරෙයි සංස්කාරයෙහි දු කල කිරෙයි විඥනයෙහි දු කලකිරෙයි. කලකිරෙනුයේ නො ඇලෙයි. නො ඇලීමෙන් මිදෙයි. මිදුණු කල්හි විමුක්තය යන ඥනය වෙයි. 'ජාතිය ක්ෂය විය, බඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, මේ අර්හත්ත්වය පිණිස අන් කිසෙක් නැතැ'යි දනියි.

මහණෙනි, සත්ත්වාවාස යම්තාක් ද, භවාග්‍රය යම්තාක් ද ඒතාක් ලෝකයෙහි මොහු අග්‍රයහ, මොහු ශ්‍රේෂ්ඨයහ. ඔහු කවරහ : රහත්හු යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදරා යළි මතුදු තෙල වදළ සේක :

1. රහත්හු ඒකාන්තයෙන් (ධ්‍යාන – මාර්ග – ඵල සුඛයෙන්) සුඛිතයහ, ඔවුනට තෘෂ්ණායෙක් නැත. නවවිධ අස්මිමානය රහත් මඟ නුවණින් සිඳින ලදී, මෝහ නැමැති දල පළන ලදී.

2. ඔහු, අර්හත්ත්වයට පැමිණියහ, ඔවුන්ගේ සිත කැළඹීම් රහිත ය, ඔහු ලෝකයෙහි තෘෂ්ණා දෘෂ්ටි විසින් නො ඇලුණාහ, ශ්‍රේෂ්ඨහ, ආස්‍රව රහිතයහ.

3. පස්කඳ ත්‍රිවිධ පරිඥයෙන් පිරිසිඳ දන සිටි ඔහු (සද්ධා – හිරි ආදි) සප්ත සද්ධර්ම ගෝචර කොට ඇතියහ, (නුවණැත්තන් විසින්) පැසසිය යුත්තාහ, සත්පුරුෂහ, බුදුරජාණන් වහන්සේගේ ඖරස පුත්‍රයහ.

4. සප්ත බෝධ්‍යංගරත්නයෙන් යුක්තයහ, ත්‍රිවිධ ශික්ෂායෙහි ශික්ෂිතයහ, මහාවීර වූ ඔහු ප්‍රහීණ භය භෛරව ඇත්තාහු (නිසැක වැ) හැසිරෙති.

5. (අසෙඛසීලක්ඛන්ධාදි) දශ අංගයෙකින් යුක්තයහ, මහා නාගයහ, (උපචාර – අර්පණා ධ්‍යානයෙන්) සමාහිතයහ, මොහු වනාහි ශ්‍රේෂ්ඨ වෙති, ඔවුනට තෘෂ්ණා නැති.

6. රහත්පල නුවණ උපන, මේ අන්තිම ආත්මභවය යි. බ්‍රහ්මචර්‍ය්‍යාගේ යම් සාරයෙක් ඇත් ද, සාර සංඛ්‍යාත ඒ අර්හත් ඵලයෙහි පරප්‍රත්‍යය රහිතයහ. (අන්‍ය උපකාර විරහිත වැ ප්‍රත්‍යක්ෂ විසින් මැ පිළිවිද සිටියහ.)

7. ත්‍රිවිධ මාන කොටස්හි නො සැලෙති, පුනර්භවයෙන් මිදුණාහ, අර්හත්ත්වයට, අනුප්‍රාප්තයහ, ඔහු ලෝකයෙහි (රාගාදිය) දිනා සිටියාහු යි.

8. උඩ – සරස – යට (පස්කඳෙහි හෝ කාලත්‍රයෙහි හෝ භවත්‍රයයෙහි හෝ) ඔවුනට තෘෂ්ණායෙක් නැති. අනුත්තර වූ චතුස්සත්‍ය බුද්ධ වූ ඒ රහත්හු ලෝකයෙහි අභීතනාද කරන්නාහ යි.

12 ඒ—50066 (80/06)

## 1. 2. 3. 5.

### දුතිය අරහන්ත සුත්තං

**77. සාවත්ථියං :**

රූපං භික්ඛවෙ, අනිච්චං. යදනිච්චං තං දුක්ඛං. යං දුක්ඛං තදනත්තා. යදනත්තා තං "නෙතං මම", "නෙසො'හමස්මි", "න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. වෙදනා අනිච්චා -පෙ- සඤ්ඤා අනිච්චා -පෙ- සඞ්ඛාරා අනිච්චා -පෙ විඤ්ඤාණං අනිච්චං යදනිච්චං තං දුක්ඛං. යං දුක්ඛං තදනත්තා. යදනත්තා තං, "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

යාවතා භික්ඛවෙ, සත්තාවාසා, යාවතා, භවග්ගං, එතෙ අග්ගා එතෙ සෙට්ඨා ලොකස්මිං යදිදං අරහන්තො'ති.

## 1. 2. 3. 6.

### සීහොපම සුත්තං

**78. සාවත්ථියං :**

සීහො භික්ඛවෙ, මිගරාජා සායන්හසමයං ආසයා නික්ඛමති, ආසයා නික්ඛමිත්වා විජම්භති, විජම්භිත්වා සමන්තා චතුද්දිසා අනුවිලොකෙති, සමන්තා චතුද්දිසා අනුවිලොකෙත්වා තික්ඛත්තුං සීහනාදං නදති, තික්ඛත්තුං සීහනාදං නදිත්වා ගොචරාය පක්කමති.

යෙ කෙචි භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා සීහස්ස මිගරඤ්ඤො නදතො සද්දං සුණන්ති, යෙභුය්යෙන භයං සන්තාසං සංවෙගං ආපජ්ජන්ති, බිලං බිලාසයා පවිසන්ති, දකං දකාසයා පවිසන්ති, වනං වනාසයා පවිසන්ති, ආකාසං පක්ඛිනො භජන්ති. යෙපි තෙ භික්ඛවෙ, රඤ්ඤො නාගා ගාමනිගමරාජධානීසු දළ්හෙහි වරත්තෙහි බද්ධා, තෙපි තානි බන්ධනානි සඤ්ඡින්දිත්වා සම්පදාලෙත්වා භීතා මුත්තකරීසං චජමානා යෙන වා තෙන වා පලායන්ති. එවං මහිද්ධිකො ඛො භික්ඛවෙ, සීහො මිගරාජා තිරච්ඡානගතානං පාණානං එවං මහෙසක්ඛො එවං මහානුභාවො.

එවමෙව ඛො භික්ඛවෙ, යදා තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා, සො ධම්මං දෙසෙති : ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො. ඉති වෙදනා -පෙ- ඉති සඤ්ඤා -පෙ- ඉති සඞ්ඛාරා -පෙ- ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමො.

## 1. 2. 3. 5.

## දෙවැනි අරහන්ත සූත්‍රය

77. සැවැත්නුවර :

මහණෙනි, රූපය අනිත්‍ය යි. යමෙක් අනිත්‍ය ද, එය දුක යි. යමෙක් දුක් ද, එය අනාත්ම යි. යමක් අනාත්ම ද, එය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නොවේ''යයි මෙසේ තෙල තතුයේ සම්‍යක් ප්‍රඥයෙන් දතයුතු ය. වේදනාව අනිත්‍ය ය ... සංඥව අනිත්‍ය ය ... සංස්කාර අනිත්‍ය ය ... විඥනය අනිත්‍ය යි. යමෙක් අනිත්‍ය ද, එය දුක යි. යමෙක් දුක් ද, එය අනාත්ම යි. යමෙක් අනාත්ම ද, එය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ''යයි මෙසේ තෙල තතුසේ සම්‍යක් ප්‍රඥයෙන් දක්කයුතු.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක රූපයෙහි දු කලකිරෙයි, වේදනාහි දු කලකිරෙයි, සංඥයෙහි දු කලකිරෙයි, සංස්කාරයෙහි දු කලකිරෙයි, විඥනයෙහි දු කල කිරෙයි. කලකිරෙනුයේ නො ඇලෙයි. නො ඇලෙනුයේ මිදෙයි. මිදුණු කල්හි මිදුණේ ය යන ඥනය වෙයි. ජාතිය ක්ෂය විය, බඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, මේ රහත්බව පිණිස කටයුතු අන් කිසෙක් නැති යි දනියි.

මහණෙනි, සත්ත්වාවාස යම්තාක් ද, භවාග්‍රය යම්තාක් ද, ඒතාක් ලෝකයෙහි මොහු අග්‍රයහ, මොහු ශ්‍රේෂ්ඨයහ. ඔහු කවරහ : රහත්හු යි වදළසේක.

## 1. 2. 3. 6.

## සීහොපම සූත්‍රය

78. සැවැත්නුවර :

මහණෙනි, මෘගරාජන් වූ සිංහ සවස් වේලෙහි වාසස්ථානයෙන් නික්මෙයි. වාසයෙන් නික්මැ වජඹෙයි.වැජැඹැ හාත්පසැ සතරදික් පරීක්ෂා කොට බලයි. හාත්පසැ සතරදික් බලා තෙවටක් සිහනද කෙරෙයි. තෙවටක් සිහනද කොට ගොදුරු පිණිස යයි.

මහණෙනි, යම්කිසි තිරිසන්ගිය ප්‍රාණී කෙනෙක් නාදකරන සිංහමෘගරාජයාගේ ශබ්දය අසද්ද, ඔහු බෙහෙවින් භයට සන්ත්‍රාසයට සංවේගයට පැමිණෙත්. බිලයෙහි වසන සත්හු බිලයට වදිති, දියෙහි වසන සත්හු දියට වදිති, වනය වාස කොට ඇති සත්හු වනයට වදිති, පක්ෂීහු අහස භජනය කෙරෙත්. මහණෙනි, ගම් නියම්ගම් රජදහන්හි දෘඪවරපටින් බැඳුණු රජුට අයත් යම් මැ හස්තිහු ඇද්ද ඔහු දු ඒ බන්ධනයන් සිඳැ ගෙන බිඳැ ගෙන බියපත් වූවාහු මලමූ හෙළමින් යම් ඒ තැනෙකැ පලා යෙත්. මහණෙනි, මෘගරාජන් වූ සිංහ තිරිසන් ගිය සතුන් අතුරින් මෙබඳු මහත් සෘද්ධි ඇතියෙකැ, මෙබඳු මහේශාක්‍යයෙකැ, මෙබඳු මහත් අනුභාව ඇතියෙකි.

මහණෙනි, එ පරිදි මැ යම් කලෙක අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ විද්‍යාචරණ සම්පන්න වූ සුගත වූ ලොකවිද් වූ අනුත්තර පුරුෂදම්‍යසාරථී වූ දෙව්මිනිස්නට ශාස්තෘ වූ බුද්ධ වූ භගවත් වූ තථාගතයන් වහන්සේ ලොවැ උපදනාසේක් ද, ඔබ දහම් දෙසත් : ''රූපය මෙතෙකැ, රූපසමුදය මෙතෙකැ, රූපයාගේ අත්ථඞ්ගමය මෙතෙකි. වේදනාව මෙතෙකැ ... සංඥව මෙතෙකැ ... සංස්කාර මෙතෙකැ ... විඥන මෙතෙකැ, විඥන සමුදය, මෙතෙකැ, විඥන අත්ථඞ්ගමය මෙතෙකි,, (මෙසේ දෙසත්).

යෙපි තෙ භික්ඛවෙ, දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා උච්චෙසු විමානෙසු චිරට්ඨිතිකා, තෙපි තථාගතස්ස ධම්මදෙසනං සුත්වා යෙභුය්‍යෙන භයං සන්තාසං සංවෙගං ආපජ්ජන්ති. අනිච්චාව කිර භො මයං සමානා නිච්චම්හාති අමඤ්ඤිම්හ, අද්ධුවාව කිර භො මයං සමානා ධුවම්හාති අමඤ්ඤිම්හ. අසස්සතාව කිර භො මයං සමානා සස්සතම්හාති අමඤ්ඤිම්හ. මයං'පි කිර භො අනිච්චා අද්ධුවා අසස්සතා සක්කායපරියාපන්නාති.

එවං මහිද්ධිකො ඛො භික්ඛවෙ, තථාගතො සදෙවකස්ස ලොකස්ස එවං මහෙසක්ඛො එවං මහානුභාවොති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

යදා බුද්ධො අභිඤ්ඤාය ධම්මචක්කං පවත්තයි
සදෙවකස්ස ලොකස්ස සත්ථා අප්පටිපුග්ගලො,

සක්කායඤ්ච නිරොධඤ්ච සක්කායස්ස ච සම්භවං
අරියං චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං,

යෙපි දීඝායුකා දෙවා වණ්ණවන්තො යසස්සිනො
භීතා සන්තාසමාපාදුං සීහස්සෙවිතරෙ මිගා.

අවීතිවත්තා සක්කායං අනිච්චා කිර භො මයං
සුත්වා අරහතො වාක්‍යං විප්පමුත්තස්ස තාදිනොති.

## 1. 2. 3. 7.

## ඛජ්ජනීය සුත්තං

69. සාවත්ථියං:

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරමානා අනුස්සරන්ති, සබ්බෙ තෙ පඤ්චුපාදානක්ඛන්ධෙ අනුස්සරන්ති, එතෙසං වා අඤ්ඤතරං.

"එවංරූපො අහොසිං අතීතමද්ධානන්ති" ඉති වා හි භික්ඛවෙ, අනුස්සරමානො රූපඤ්ඤෙව අනුස්සරති. "එවංවෙදනො අහොසිං අතීතමද්ධානන්ති" ඉති වා භික්ඛවෙ, අනුස්සරමානො වෙදනඤ්ඤෙව අනුස්සරති. එවංසඤ්ඤී[1] අහොසිං අතීතමද්ධානන්ති ඉති වා භික්ඛවෙ අනුස්සරමානො සඤ්ඤං යෙව අනුස්සරති. එවංසඞ්ඛාරො අහොසිං අතීතමද්ධානන්ති ඉති වා හි, භික්ඛවෙ, අනුස්සරමානො සඞ්ඛාරෙයෙව අනුස්සරති. එවංවිඤ්ඤාණො අහොසිං අතීතමද්ධානන්ති ඉති වා හි භික්ඛවෙ, අනුස්සරමානො විඤ්ඤාණමෙව අනුස්සරති.

කිඤ්ච භික්ඛවෙ, රූපං වදෙථ: රුප්පතීති ඛො භික්ඛවෙ, තස්මා රූපන්ති වුච්චති. කෙන රුප්පති: සීතෙන'පි රුප්පති උණ්හෙන'පි රුප්පති ජිඝච්ඡාය'පි රුප්පති පිපාසාය'පි රුප්පති ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන'පි රුප්පති. රුප්පතීති ඛො භික්ඛවෙ, තස්මා රූපන්ති වුච්චති.

1. එවං සඤ්ඤො - මජ්ඣං, සයා.

මහණෙනි, දීර්ඝායුෂ්ක වූ වර්ණවත් වූ සුඛබහුල වූ උස්විමන්හි චිරස්ථායී වැ සිටුනා යම් දෙවිකෙනෙක් ඇද්ද, උහුද තථාගතයන්ගේ දම්දෙසුම් අසා බොහෙවින් බියව සන්ත්‍රාස යට සංවේගයට පැමිණෙති : ''භවත්නි, අපි අනිත්‍ය වුවමෝ නිත්‍යයම්හ යි සිතුම්හ. භවත්නි, අපි අධ්‍රැව වුවමෝ ධ්‍රැවයම්හ යි සිතුම්හ. භවත්නි, අපි අශාශ්වත වුවමෝ ශාශ්වතයම්හ යි සිතුම්හ. භවත්නි, අපි වනාහි අනිත්‍යයම්හ, අධ්‍රැවයම්හ. අශාස්වත යම්හ, සත්කාය පරියාපන්නයම්හ''යි (සංවේගදනවත්).

මහණෙනි, තථාගතයෝ සදේවක ලෝකයාට මෙසේ මහත් සෘද්ධි ඇතියහ, මෙසේ මහේශාක්‍යයහ, මෙසේ මහානුභාවයහ යි භගවත්හු තෙල වදළහ. සුගතයන් වහන්සේ මෙය වදරා වැලිත් ශාස්තෘන් වහන්සේ තදනන්‍ය වූ තෙල ගාපෙළ ද වදළහ :

1. දෙවියන් සහිත ලෝකයාට ශාස්තෘ වූ අප්‍රතිපුද්ගල වූ සර්වඥයන් වහන්සේ යම් කලෙක විශිෂ්ටඥානයෙන් දැන ධර්මචක්‍රය පවත්වාලූ සේක් ද,

2. සත්කාය (පඤ්චස්කන්ධය) හා නිරෝධය හා සත්කාය සම්භවය හා දුක් සන්හිඳුවන අරිඅටඟිමඟ හා (දෙසත් ද),

3. වර්ණවත් යශස්වි වූ දීර්ඝායුෂ්ක වූ යම් දෙවිකෙනෙක් ඇද්ද, (ඔහු හැම) සිංහයාගේ නාද අසා ඉතර මෘගයන් බියපත්වන්නාක් සෙයින් භීත වැ (මෙසේ) සන්ත්‍රාසයට පැමිණියහ,

4. භවත්නි, අපි සත්කායය පැන නො ගියම්හ, අනිත්‍යයම්හ යි විප්‍රමුක්ත වූ තාදී ගුණ ඇති අර්හත් වූ බුදුන්ගේ වාක්‍යය අසා දතුම්හ යි.

## 1. 2. 3. 7.

## ඛජ්ජනීය සූත්‍රය

**79. සැවැත්නුවර :**

මහණෙනි, අනේකප්‍රකාර පූර්වනිවාසය නුවණින් මෙනෙහි කරන යම් මැ ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ අනුස්මරණය කෙරෙත් ද, එ හැම පඤ්චොපාදන ස්කන්ධයන් අනුස්මරණ කෙරෙති, තුලුන් අතුරෙන් අන්‍යතරයක් හෝ අනුස්මරණ කෙරෙත්.

මහණෙනි, ''අතීත කාලයෙහි මෙබඳු රූප ඇතියෙම් වීමි''යි හෝ සිහි කරන්නේ රූපස්කන්ධය මැ සිහි කෙරෙයි. මහණෙනි, ''අතීතකාලයෙහි මෙබඳු වේදනා ඇතියෙම් වීමි''යි හෝ සිහිකරන්නේ වේදනාස්කන්ධයමැ සිහි කෙරෙයි. මහණෙනි,''අතීතකාලයෙහි මෙබඳු සංඥා ඇතියෙම් වීමි''යි හෝ සිහිකරන්නේ සංඥාස්කන්ධය මැ සිහි කෙරෙයි. මහණෙනි, 'අතීතකාලයෙහි මෙබඳු සංස්කාර ඇතියෙම් වීමි''යි හෝ සිහිකරන්නේ සංස්කාරයන් මැ සිහි කෙරෙයි. මහණෙනි, ''අතීතකාලයෙහි මෙබඳු විඥාන ඇතියෙම් වීමි''යි හෝ සිහි කරන්නේ විඥානස්කන්ධය මැ සිහි කෙරෙයි.

මහණෙනි, කවර කරුණකින් රූපය කියන්නේ ය යත් : මහණෙනි, ''බිඳේ''නුයි එයින් රූපයයි කියනු ලැබෙයි, කුමකින් බිඳේ ය යත් : ශීතයෙනුදු බිඳෙයි, උෂ්ණයෙනුදු බිඳෙයි, බඩසයියිනුදු බිඳෙයි, පවසිනුදු බිඳෙයි. ඩැහැ ලේ බොන මැසි ය - විද ලේ බොන මදුරු ය – වාත ය – ආතප ය – දීර්ඝජාති ය යන මොවුන්ගේ සංස්පර්ශ යෙනුදු බිඳේ. මහණෙනි, ''බිඳේනු''යි එයින් රූප යි කියනු ලැබේ.

කිඤ්ච භික්ඛවෙ, වේදනං වදෙථ: වේදියතීති[1] ඛො භික්ඛවෙ, තස්මා වේදනාති වුච්චති. කිඤ්ච වේදියති[1] සුඛම්පි වේදියති දුක්ඛම්පි වේදියති අදුක්ඛමසුඛම්පි වේදියති. වේදියතීති ඛො භික්ඛවෙ, තස්මා වේදනාති වුච්චති.

කිඤ්ච භික්ඛවෙ, සඤ්ඤං වදෙථ: සඤ්ජානාතීති ඛො භික්ඛවෙ, තස්මා සඤ්ඤාති වුච්චති. කිඤ්ච සඤ්ජානාති: නීලම්පි සඤ්ජානාති; පීතකම්පි සඤ්ජානාති; ලොහිතකම්පි සඤ්ජානාති; ඔදාතම්පි සඤ්ජානාති. සඤ්ජානාතීති ඛො භික්ඛවෙ, තස්මා සඤ්ඤාති වුච්චති.

කිඤ්ච භික්ඛවෙ, සඞ්ඛාරෙ වදෙථ: සඞ්ඛතං අභිසඞ්ඛරොන්තීති භික්ඛවෙ, තස්මා සඞ්ඛාරාති වුච්චන්ති. කිඤ්ච සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති: රූපං රූපත්තාය[2] සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති. වේදනං වේදනත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති. සඤ්ඤං සඤ්ඤත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති. සඞ්ඛාරෙ සඞ්ඛාරත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති. විඤ්ඤාණං විඤ්ඤාණත්තාය සඞ්ඛතං අභිසඞ්ඛරොන්ති. සඞ්ඛතං අභිසඞ්ඛරොන්තීති ඛො භික්ඛවෙ, තස්මා සඞ්ඛාරාති වුච්චන්ති.

කිඤ්ච භික්ඛවෙ, විඤ්ඤාණං වදෙථ: විජානාතීති ඛො භික්ඛවෙ, තස්මා විඤ්ඤාණන්ති වුච්චති. කිඤ්ච විජානාති: අම්බිලම්පි විජානාති, තිත්තකම්පි විජානාති, කටුකම්පි විජානාති, මධුරකම්පි[3] විජානාති, ඛාරිකම්පි විජානාති, අඛාරිකම්පි විජානාති, ලොණිකම්පි විජානාති, අලොණිකම්පි විජානාති. විජානාතීති ඛො භික්ඛවෙ, තස්මා විඤ්ඤාණන්ති වුච්චති.

තත්‍ර භික්ඛවෙ, සුතවා අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: අහං ඛො එතරහි රූපෙන ඛජ්ජාමි, අතීතම්පහං අද්ධානං එවමෙව රූපෙන ඛජ්ජිං, සෙය්‍යථාපි එතරහි පච්චුප්පන්නෙන රූපෙන ඛජ්ජාමි. අහං චෙව ඛො පන අනාගතං රූපං අභිනන්දෙය්‍යං, අනාගතම්පහං අද්ධානං එවමෙව රූපෙන ඛජ්ජෙය්‍යං, සෙය්‍යථාපි එතරහි පච්චුප්පන්නෙන රූපෙන ඛජ්ජාමීති. සො ඉති පටිසඞ්ඛාය අතීතස්මිං රූපස්මිං අනපෙක්ඛො හොති අනාගතං රූපං නාභිනන්දති පච්චුප්පන්නස්ස රූපස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති.

අහං ඛො එතරහි වේදනාය ඛජ්ජාමි, අතීතම්පහං අද්ධානං එවමෙව වේදනාය ඛජ්ජිං සෙය්‍යථාපි එතරහි පච්චුප්පන්නාය වේදනාය ඛජ්ජාමි. අහං චෙව ඛො පන අනාගතං වේදනං අභිනන්දෙය්‍යං අනාගතම්පහං අද්ධානං එවමෙව වේදනාය ඛජ්ජෙය්‍යං, සෙය්‍යථාපි එතරහි පච්චුප්පන්නාය වේදනාය ඛජ්ජාමීති. සො ඉති පටිසඞ්ඛාය අතීතාය වේදනාය අනපෙක්ඛො හොති, අනාගතං වේදනං නාභිනන්දති පච්චුප්පන්නාය වේදනාය නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති.

---

1. වේදයතීති - මජ්ඣං, සභ්‍යා
2. රූපත්තාය - අට්ඨකථා.
3. මධුරම්පි - මජ්ඣං, සභ්‍යා.

Free Distribution www.aathaapi.org

මහණෙනි, කවර කරුණකින් වේදනා කියන්නේ ය යත්: මහණෙනි, ''වළඳ කෙරේ'' නුයි එයින් වේදනා යි කියනු ලැබෙයි. කුමක් වළඳ කෙරෙයි යත් : සුඛය ද වළඳ කෙරෙයි. දුඃඛය ද වළඳ කෙරෙයි, උපේක්ෂාව ද වළඳ කෙරේ. මහණෙනි, මෙසේ වළඳ කෙරේ නු යි එයින් වේදනා යි කියනු ලැබේ.

මහණෙනි, කවර කරුණකින් සංඥා කියන්නේ ය යත් : මහණෙනි, ''හඳුනාගනී'' නුයි එයින් සංඥා යි කියනු ලැබෙයි. කවර කරුණකින් හඳුනයි යත් : නිල ද හඳුනයි, කහවන ද හඳුනයි, ලෙහෙවන ද හඳුනයි, සුදද හඳුනයි. මහණෙනි, මෙසේ ''හඳුනා'' නුයි එයින් සංඥා යි කියනු ලැබේ.

මහණෙනි, කවර කරුණකින් සංස්කාර කියන්නේ ය යත්: මහණෙනි, ''සඞ්ඛත කොට අභිසංස්කරණ කෙරෙත්'' නුයි එයින් සංස්කාරහ යි කියනු ලැබෙත්. කවර කරුණකින් සඞ්ඛතය අභිසංස්කරණ කෙරෙති යත් : රූපය රූපය පිණිස සඞ්ඛත කොට අභිසංස් කරණය කෙරෙති, වේදනාව වේදනා පිණිස සඞ්ඛත කොට අභිසංස්කරණය කෙරෙති. සංඥාව සංඥා පිණිස සඞ්ඛත කොට අභිසංස්කරණය කෙරෙති, සංස්කාර සංස්කාර පිණිස සඞ්ඛත කොට අභිසංස්කරණය කෙරෙති, විඥානය විඥානය පිණිස සඞ්ඛත කොට අභිසංසකරණය කෙරෙත්. ''මහණෙනි, සඞ්ඛත කොට අභිසංස්කරණ කෙරෙත්'' නුයි එයින් සංස්කාරහ යි කියනු ලැබෙත්.

මහණෙනි, කවර කරුණකින් විඥානය කියන්නේ ය යත් : මහණෙනි, ''විජානන කෙරේ'' නුයි එයින් විඥාන යයි කියනු ලැබෙයි. කවර කරුණකින් විජානන කෙරේ ය යත් : ඇඹුල ද විජානන කෙරෙයි, තිත්ත ද විජානන කෙරෙයි, කටුකරස ද විජානන කෙරෙයි, මධුරරස ද විජානන කෙරෙයි, කරරස ද විජානන කෙරෙයි. නොකරරස ද විජානන කෙරයි, ලුණුරස ද විජානන කෙරෙයි, නොලුණුරස ද විජානන කෙරේ. මහණෙනි, මෙසේ ''විජානන කෙරේ'' නුයි එයින් විඥාන යි කියනු ලැබේ.

මහණෙනි, එහි ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක මෙසේ නුවණින් සලකා බලයි : ''මම වූකලී දැන් රූපය විසින් කනු ලබමි. යම්සේ දැන් පච්චුප්පන්න රූපය විසින් කනු ලබම් ද, එසෙයින් ම ඉකුත් කල්හි ද රූපය විසින් කනු ලැබීමි. මම අනාගතරූපය පතම් නම් යම් පරිදි දැන් ප්‍රත්‍යුත්පන්න රූපය විසින් කනු ලබම් ද, එපරිදි මම අනාගතකාලයෙහි ද රූපය විසින් කනු ලබමි''යි හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කොට අතීතරූපයෙහි නිරපෙක්ෂ වෙයි, අනාගතරූපය නො පතයි, ප්‍රත්‍යුත්පන්න රූපය පිළිබඳ වැ නිර්වේදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ.

''මම වර්තමානයෙහි වේදනාව විසින් කනු ලබමි. මම යම් පරිදි දැන් ප්‍රත්‍යුත්පන්න වේදනාව විසින් කනු ලබම් ද, අතීත කාලයෙහි ද එපරිදි ම වේදනාව විසින් කනු ලැබීමි. මම වනාහි අනාගතවේදනාව පතම් නම් යම් පරිදි දැන් ප්‍රත්‍යුත්පන්න වෙදනාව විසින් කනු ලබම් ද, එපරිදි ම අනාගතකාලයෙහි ද වේදනාව විසින් කනු ලබමි''යි හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කොට අතීතවේදනාව පිළිබද වැ නිරපේක්ෂ වෙයි, අනාගතවේදනාව නො පතයි. ප්‍රත්‍යුත්පන්නවේදනාව පිළිබඳ කොට නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ.

අහං ඛො එතරහි සඤ්ඤාය ඛජ්ජාමි - පෙ - අහං ඛො එතරහි සඞ්ඛාරෙහි ඛජ්ජාමි. අතීතම්පහං අද්ධානං එවමෙව සඞ්ඛාරෙහි ඛජ්ජිං, සෙය්‍යථාපි එතරහි පච්චුප්පන්නෙහි සඞ්ඛාරෙහි ඛජ්ජාමි, අහං චෙව ඛො පන අනාගතෙ සඞ්ඛාරෙ අභිනන්දෙය්‍යං, අනාගතම්පහං අද්ධානං එවමෙව සඞ්ඛාරෙහි ඛජ්ජෙය්‍යං, සෙය්‍යථාපි එතරහි පච්චුප්පන්නෙහි සඞ්ඛාරෙහි ඛජ්ජාමීති. සො ඉති පටිසඞ්ඛාය අතීතෙසු සඞ්ඛාරෙසු අනපෙක්ඛො හොති; අනාගතෙ සඞ්ඛාරෙ නාභිනන්දති, පච්චුප්පන්නානං සඞ්ඛාරානං නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති.

අහං ඛො එතරහි විඤ්ඤාණෙන ඛජ්ජාමි. අතීතම්පාහං අද්ධානං එවමෙව විඤ්ඤාණෙන ඛජ්ජිං, සෙය්‍යථාපි එතරහි පච්චුප්පන්නෙන විඤ්ඤාණෙන ඛජ්ජාමි. අහං චෙව ඛො පන අනාගතං විඤ්ඤාණං අභිනන්දෙය්‍යං, අනාගතම්පහං අද්ධානං එවමෙව විඤ්ඤාණෙන ඛජ්ජෙය්‍යං සෙය්‍යථාපි එතරහි පච්චුප්පන්නෙන විඤ්ඤාණෙන ඛජ්ජාමි. සො ඉති පටිසඞ්ඛාය අතීතස්මිං විඤ්ඤාණස්මිං අනපෙක්ඛො හොති අනාගතං විඤ්ඤාණං නාභිනන්දති පච්චුප්පන්නස්ස විඤ්ඤාණස්ස නිබ්බිදාය විරාගාය නිරොධාය පටිපන්නො හොති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති? "අනිච්චං භන්තෙ". 'යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? "දුක්ඛං භන්තෙ." යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං: "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති? "නො හෙතං භන්තෙ," වෙදනා - පෙ - සඤ්ඤා - පෙ - සඞ්ඛාරා - පෙ - විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? "අනිච්චං භන්තෙ," යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති?" "දුක්ඛං භන්තෙ," යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං: "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති? "නො හෙතං භන්තෙ".

තස්මාතිහ භික්ඛවෙ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙ සො අත්තා"ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යා කාචි වෙදනා - පෙ - යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා-පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො අපචිනාති, නො ආචිනාති; පජහති, න උපාදියති, විසිනෙති, නො උස්සිනෙති[1] විධූපෙති, න සන්ධූපෙති.

1. විසෙනෙති, නො උස්සෙනෙති. - සිමු

"මම දැන් සංඥාව විසින් කනු ලබමි ... මම වනාහි දැන් සංස්කාර විසින් කනු ලබමි. මම යම් පරිදි දැන් ප්‍රත්‍යුත්පන්න සංස්කාර විසින් කනු ලබම් ද එපරිදිම අතීතකාලයෙහි ද සංස්කාර විසින් කනු ලැබීමි. මම වනාහි අනාගතසංස්කාර පතම් නම් යම් පරිදි දැන් ප්‍රත්‍යුත්පන්නසංස්කාර විසින් කනු ලබම් ද, එ පරිදි මැ අනාගතකාලයෙහි ද සංස්කාර විසින් කනු ලබමි"යි හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කොට අතීතසංස්කාර කෙරෙහි නිරපේක්ෂ වෙයි. අනාගතසංස්කාර නො පතයි, ප්‍රත්‍යුත්පන්නසංස්කාර පිළිබඳ කොට නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ.

"මම දැන් විඥානය විසින් කනු ලබමි. මම යම් පරිදි දැන් ප්‍රත්‍යුත්පන්න විඥානය විසින් කනු ලබම්ද, අතීතකාලයෙහි ද එපරිදි ම විඥානය විසින් කනු ලැබීමි. මම වනාහි අනාගතවිඥානය පතම් නම් මම් යම් පරිදි දැන් ප්‍රත්‍යුත්පන්න විඥානය විසින් කනු ලබම් ද, එපරිදි ම අනාගතකාලයෙහි ද විඥානය විසින් කනු ලබමි" යි හේ මෙසේ ප්‍රත්‍යවේක්ෂා කොට අතීතවිඥානය කෙරෙහි නිරපේක්ෂ වෙයි, අනාගතවිඥානය නො පතයි, ප්‍රත්‍යුත්පන්න විඥානය පිළිබඳ කොට නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ.

මහණෙනි, කෙසේ හඟිවු ද, රූපය නිත්‍ය හෝ අනිත්‍ය වේ ද යි ? වහන්ස, අනිත්‍ය යැ. යමෙක් අනිත්‍ය වේ නම් හේ දුඃඛ හෝ සුඛ වේ ද යි ? වහන්ස, දුක් යැ. යමෙක් අනිත්‍ය වේ නම් දුක් වේ නම් පෙරළෙන සැහැවි ඇත් නම් "තෙල මාගේ යැ. මම් තෙල වෙමි, තෙලෙ මාගේ ආත්ම යයි" එය නුවණින් දක්නට කලා වේ ද යි ? වහන්ස, තෙල කරුණ එසේ නො වේ ම යැ.

මහණෙනි, ඒ කරුණින් ම ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖළාරික වේවයි සියුම් වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි දුරෙහි වේවයි හම්යෙහි වේවයි අතීතානාගත ප්‍රත්‍යුත්පන්න යම් මැ රූපයෙක් ඇත් නම් එ හැම රූපය "තෙල මාගේ නො වෙයි, මම තෙල නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේ" යයි මෙසේ තෙල කරුණ ඇති සැටි සම්‍යක් ප්‍රඥයෙන් දතයුතු ය. යම් මැ වේදනායෙක් ඇත් ද ... යම් මැ සංඥයෙක් ඇත් ද ... යම් මැ සංස්කාරයෝ ඇත් ද ... අධ්‍යාත්ම වේවයි බාහිර වේවයි ඖළාරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි දුරෙහි වේවයි සම්පයෙහි වේවයි අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න වූ යම් මැ විඥනයෙක් ඇත් ද, "තෙලෙ මාගේ නො වෙයි, තෙල මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේ"යි තෙල කරුණ මෙසේ ඇති සැටියෙන් සම්‍යක්ප්‍රඥයෙන් දතයුතු යි.

මහණෙනි, මේ ආර්‍යශ්‍රාවක (සයුරුවට) ඉවත් කෙරෙයි. නො රැස් කෙරෙයි, දුරලයි, නො ගනියි, විසුරුවයි, නො සැටි කෙරෙයි, නිවයි, නො දල්වා යි කියනු ලැබේ.

භික්ඛු අපචිනාති, නො ආචිනාති: රූපං අපචිනාති, නො ආචිනාති. වෙදනං අපචිනාති, නො ආචිනාති. සඤ්ඤං අපචිනාති, නො ආචිනාති. සඞ්ඛාරෙ අපචිනාති, නො ආචිනාති. විඤ්ඤාණං අපචිනාති, නො ආචිනාති.

භික්ඛු පජහති, න උපාදියති: රූපං පජහති න උපාදියති. වෙදනං පජහති න උපාදියති. සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ පජහති, න උපාදියති. විඤ්ඤාණං පජහති, න උපාදියති.

භික්ඛු විසිනෙති, න උස්සිනෙති: රූපං විසිනෙති න උස්සිනෙති. වෙදනං විසිනෙති න උස්සිනෙති. සඤ්ඤං - පෙ - සඞ්ඛාරෙ - පෙ - විඤ්ඤාණං විසිනෙති න උස්සිනෙති.

භික්ඛු විධූපෙති, න සන්ධූපෙති: රූපං විධූපෙති, න සන්ධූපෙති. වෙදනං විධූපෙති, න සන්ධූපෙති. සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ විධූපෙති, න සන්ධූපෙති. විඤ්ඤාණං විධූපෙති, න සන්ධූපෙති.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති වෙදනාය'පි නිබ්බින්දති සඤ්ඤාය'පි-පෙ-සඞ්ඛාරෙසුපි-පෙ-විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු නෙවාචිනාති න අපචිනාති. අපචිනිත්වා ඨිතො. නෙව පජහති, න උපාදියති, පජහිත්වා ඨිතො. නෙව විසිනෙති න උස්සිනෙති. විසිනෙත්වා ඨිතො. නෙව විධූපෙති න සන්ධූපෙති විධූපෙත්වා ඨිතො

භික්ඛු නෙවාචිනාති න අපචිනාති අපචිනිත්වා ඨිතො; රූපං නෙවාචිනාති, න අපචිනාති, අපචිනිත්වා ඨිතො. වෙදනං-පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං නෙවාචිනාති, න අපචිනාති, අපචිනිත්වා ඨිතො.

භික්ඛු නෙව පජහති න උපාදියති පජහිත්වා ඨිතො: රූපං නෙව පජහති න උපාදියති පජහිත්වා ඨිතො. වෙදනං නෙව පජහති න උපාදියති. පජහිත්වා ඨිතො. සඤ්ඤං පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං නෙව පජහති න උපාදියති. පජහිත්වා ඨිතො.

භික්ඛු නෙව විසිනෙති, න උස්සිනෙති, විසිනෙත්වා ඨිතො: රූපං නෙව විසිනෙති න උස්සිනෙති විසිනෙත්වා ඨිතො. වෙදනං නෙව විසිනෙති න උස්සිනෙති විසිනෙත්වා ඨිතො. සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං නෙව විසිනෙති, න උස්සිනෙති, විසිනෙත්වා ඨිතො.

භික්ඛු නෙව විධූපෙති න සන්ධූපෙති විධූපෙත්වා ඨිතො: රූපං නෙව විධූපෙති න සන්ධූපෙති, විධූපෙත්වා ඨිතො. වෙදනං-පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං නෙව විධූපෙති න සන්ධූපෙති විධූපෙත්වා ඨිතො.

එවං විමුත්තචිත්තං ඛො, භික්ඛවෙ, භික්ඛුං සඉන්දා දෙවා සබ්‍රහ්මකා සපජාපතිකා ආරකාව නමස්සන්ති:

‘‘නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
යස්ස තෙ නාභිජානාම යම්පි නිස්සාය ඣායසීති.’’

කුමක් වනසා ද, නො රැස් කෙරේ ද යත් : රූපය වනසයි, නො රැස් කෙරෙයි. වේදනාව වනසයි, නො රැස් කෙරෙයි. සංඥාව වනසයි, නො රැස් කෙරෙයි. සංස්කාර වනසයි, නො රැස් කෙරෙයි. විඥානය වනසයි. නො රැස් කෙරෙයි.

කුමක් දුරලා ද, නො ගනී ද යත් : රූපය දුරලයි, නො ගනියි. වේදනාව දුරලයි, නො ගනියි. සංඥාව ... සංස්කාර දුරලයි, නො ගනියි. විඥානය දුරලයි, නො ගනියි.

කුමක් විසුරුවා ද, රැස් නො කෙරේ ද යත් : රූපය විසුරුවයි, රැස් නො කෙරෙයි. වෙදනාව විසුරුවයි, රැස් නො කෙරෙයි. සංඥාව ... සංස්කාර ... විඥානය විසුරුවයි, රැස් නො කෙරෙයි.

කුමක් නිවා ද, නො දල්වා ද යත් : රූපය නිවයි, නො දල්වයි. වේදනාව නිවයි, නො දල්වයි. සංඥාව ... සංස්කාර නිවයි, නො දල්වයි. විඥානය නිවයි, නො දල්වයි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක රූපයෙහි ද කලකිරෙයි, වේදනායෙහි ද කලකිරෙයි. සංඥාවෙහි ද ... සංස්කාරයන් කෙරෙහි ද ... විඥානයෙහි ද කලකිරෙයි, කල කිරෙන්නේ විරක්ත වෙයි. විරාග හේතුයෙන් විමුක්ත වෙයි, විමුක්ත වත් ම ''විමුක්ත යෙමි''යි ඥානය වෙයි : ''ජාතිය ක්ෂීණ විය, බඹසර වැස නිමවන ලදී. කරණී කරන ලද, මේ රහත් බව පිණිස අන් කිසෙක් නැති''යි නුවණින් දනී. මහණෙනි, මේ මහණ රැස් නො කෙරෙයි, නො වනසයි, වනසා සිටියේ වෙයි. නො ම හැරපියයි, නො ගනියි, හැර පියා සිටියේ වෙයි, නො ම විසුරුවයි, රැස් නො කෙරෙයි, විසුරුවා සිටියේ වෙයි. නො ම නිවයි, නො ම දල්වයි. නිවා සිටියේ යයි කියනු ලැබේ.

කුමක් නො ම රැස් කෙරේ ද නො ම වනසා ද, වනසා සිටියේ වේ ද යත් : රූපය නො මැ රැස් කෙරෙයි, නො මැ වනසයි, වනසා සිටියේ වෙයි. වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය නො ම රැස් කෙරෙයි, නො ම වනසයි, වනසා සිටියේ යැ.

කුමක් නො ම හරනේ ද, නො ගනී ද, හැර පියා සිටියේ වේ ද යත් : රූපය නො ම හරියි, නො ගනියි, හැර පියා සිටියේ යැ. වේදනාව නො ම හරියි, නො ගනියි, හැරපියා සිටියේ යැ සංඥාව ... සංස්කාර ... විඥානය නො ම හරියි, නො ගනියි, හැරපියා සිටියේ යැ.

කුමක් නො ම විසුරුවයි ද, රැස් නො කරයි ද, විසුරුවා සිටියේ වේ ද යත් : රූපය නො ම විසුරුවයි, නො ම රැස් කෙරෙයි, විසුරුවා සිටියේ යැ. වේදනාව නො ම විසුරුවයි, රැස් නො කෙරෙයි, විසුරුවා සිටියේ යැ. සංඥාව ... සංස්කාර ... විඥානය නො ම විසුරුවයි, නො ම රැස් කෙරෙයි, විසුරුවා සිටියේ යැ.

නො

කුමක් නිවාපියා ද නොදල්වාද නොනිවාසියාද සිටියේවේ ද යත් : රූපය නො ම නිවයි, නො ම දල්වයි, නිවාපියා සිටියේ යැ. වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය නො ම නිවයි, නො ම දල්වයි, නිවාපියා සිටියේ යි.

මහණෙනි, මෙසේ විමුක්ත සිත් ඇති මහණහට ඉන්ද්‍රයා සහිත බ්‍රහ්මයා සහිත ප්‍රජාපති සහිත දෙවියෝ දුරින් ම නමස්කාර කෙරෙත්. (කෙසේ යැ :)

''යමක් ඇසිරි කොට ධ්‍යාන කරවු ද, යම් ඒ තොපගේ සිතැඟි නො දනුම්හ, පුරුෂ ශ්‍රේෂ්ඨයාණනි, තොපට නමස්කාර වේවා, පුරුෂෝත්තමයාණනි, තොපට නමස්කාර වේවා''යි (කියා යි).

## 1. 2. 3. 8.

## පිණ්ඩොල්‍ය සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. අථ ඛො භගවා කිස්මිඤ්චිදෙව පකරණෙ භික්ඛුසඞ්ඝං පණාමෙත්වා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය කපිලවත්ථුං[1] පිණ්ඩාය පාවිසි. කපිලවත්ථුස්මිං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන මහාවනං තෙනුපසඞ්කමි දිවාවිහාරාය, මහාවනං අජ්ඣොගාහෙත්වා බෙලුවලට්ඨිකාය මූලෙ දිවාවිහාරං නිසීදි.

අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'මයා ඛො භික්ඛුසඞ්ඝො පවාළ්හො.[2] සන්තෙත්ථ භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙසං මමං අපස්සන්තානං සියා අඤ්ඤථත්තං සියා විපරිණාමො. සෙය්‍යථාපි නාම වච්ඡස්ස තරුණස්ස මාතරං අපස්සන්තස්ස සියා අඤ්ඤථත්තං සියා විපරිණාමො. එවමෙවං සන්තෙත්ථ භික්ඛූ නවා, අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං තෙසං මමං අපස්සන්තානං සියා අඤ්ඤථත්තං සියා විපරිණාමො, සෙය්‍යථාපි නාම බීජානං තරුණානං උදකං අලභන්තානං සියා අඤ්ඤථත්තං, සියා විපරිණාමො. එවමෙවං සන්තෙත්ථ භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙසං මමං අලභන්තානං දස්සනාය සියා අඤ්ඤථත්තං සියා විපරිණාමො. යන්නූනාහං යථෙව මයා පුබ්බෙ භික්ඛුසඞ්ඝො අනුග්ගහිතො, එවමෙවං එතරහි අනුග්ගණ්හෙය්‍යං භික්ඛුසඞ්ඝන්ති.

අථ ඛො බ්‍රහ්මා සහම්පති භගවතො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං බ්‍රහ්මලොකෙ අන්තරහිතො භගවතො පුරතො පාතුරහොසි.

අථ ඛො බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිම්පණාමෙත්වා භගවන්තං එතදවොච: "එවමෙතං භගවා, එවමෙතං සුගත, භගවතා භන්තෙ, භික්ඛුසඞ්ඝො පවාළ්හො. සන්තෙත්ථ භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙසං භගවන්තං අපස්සන්තානං සියා අඤ්ඤථත්තං සියා විපරිණාමො. සෙය්‍යථාපි නාම වච්ඡස්ස තරුණස්ස මාතරං අපස්සන්තස්ස සියා අඤ්ඤථත්තං සියා විපරිණාමො. එවමෙව සන්තෙත්ථ භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙසං භගවන්තං අපස්සන්තානං සියා අඤ්ඤථත්තං සියා විපරිණාමො. සෙය්‍යථාපි නාම බීජානං තරුණානං උදකං අලභන්තානං සියා අඤ්ඤථත්තං සියා විපරිණාමො, එවමෙව සන්තෙත්ථ භික්ඛූ නවා අචිරපබ්බජිතා, අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙසං භගවන්තං අලභන්තානං දස්සනාය සියා අඤ්ඤථත්තං සියා විපරිණාමො.

අභිනන්දතු භන්තෙ, භගවා භික්ඛුසඞ්ඝං අභිවදතු භන්තෙ, භගවා භික්ඛුසඞ්ඝං. යථෙව භන්තෙ, භගවතා පුබ්බෙ භික්ඛුසඞ්ඝො අනුග්ගහිතො, එවමෙවං එතරහි අනුග්ගණ්හාතු භික්ඛුසඞ්ඝන්ති.

1. කපිලවත්ථුස්මිං - සී. 1, 2, ස්‍යා
2. පබාළ්හො - ස්‍යා, මජ්ඣං.

## 1. 2. 3. 8.

## පිණ්ඩොල්‍ය සූත්‍රය

80. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙකැ භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි වූ **කපිලවාස්තු** පුර **සමීපයෙහි නිග්‍රෝධාරාමයෙහි** වැඩ වසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ කිසියම් කරුණෙකැ ලා භික්ෂු සංඝයා බැහැර කොට දෙවන දින පෙවරුයෙහි හැඳ පෙර වැ පා සිවුරු ගෙන කිඹුල්වතට පිඬු පිණිස පිවිසි සේක. කිඹුල්වතෙහි පිඬු පිණිස හැසිර බතින් පසු වැ පිණ්ඩපාතයෙන් වැළැකී සේක් මහාවනය කරා දිවා විහාරය පිණිස එළැඹී සේක. මහාවනයට එළැඹ නහඹුල් බෙලිරුකක් මුලැ දිවාවිහාරය පිණිස වැඩහුන් සේක.

එසඳ රහෝගත වූ ඒකාකී වූ භාග්‍යවතුන් වහන්සේට මෙබඳු චිත්තපරිවිතර්කයෙක් උපන : ''මා විසින් බික්සඟහු බැහැර කරන ලදහ. මෙහි නවක වූ පැවිදි නොබෝකල් ඇති මෙ සස්නට ආධුනික වැ පැමිණි භික්ෂූහු ඇත. මා නො දක්නා ඔවුනට අන්‍යථාත්වයෙක් වෙයි, පෙරළීමෙක් වෙයි. මව නොදක්නා ළපැටි වසුට යම් පරිදි අන්‍යථාත්වයෙක් වේ ද, පෙරළියෙක් වේ ද එපරිදි ම මෙහි නවක වූ පැවිදි නොබෝකල් ඇති මෙ සස්නට අධුනාගත වූ භික්ෂූහු ඇත. මා නො දක්නා ඔවුනට අන්‍යථාත්වයෙක් වෙයි, පෙරළියෙක් වේ. දිය නො ලබන තරුණබීජයන්ට යම් පරිදි අන්‍යථාත්වයෙක් ඇත් ද, පෙරළියෙක් ඇත් ද, එ පරිදි මෙහි නවක වූ අළුත පැවිදි වූ මෙ සස්නට ළහැදී පැමිණි භික්ෂූහු ඇත් ද, දර්ශනය පිණිස මා නො ලබන ඔවුනට අන්‍යථාත්වයෙක් වෙයි, විපරිණාමයෙක් වෙ. යම් පරිදි මා විසින් පෙර බික්සඟහු අනුග්‍රහ කරන ලද්දහු ද, එ පරිදි ම මම දැන් බික් සඟනට අනුග්‍රහ කෙරෙමි නම් මනා මැ නු ''යි.

එසඳ සහම්පතී බ්‍රහ්ම සියසිතින් භාග්‍යවතුන් වහන්සේගේ චිත්තපරිවිතර්කය දැන, යම් පරිදි බලවත් පුරුෂයෙක් හැකුළු අත දිගු කරනේ ද, දිගුකළ අත හෝ හකුළුවා ද එ පරිදි බඹ ලොවැ අතුරුදන් වූයේ බුදුන් ඉදිරියෙහි පහළ වී.

ඉක්බිති සහම්පතී බඹ උත්තරාසංගය එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකෙළේ : ''භාග්‍යවතුන් වහන්ස, තෙල එසේම ය. සුගතයන් වහන්ස, තෙල එසේ මැ යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් බික්සඟහු නෙරන ලදහ. මෙහි ළහැදී පැවිදි වූ මෙ සස්නට ළහැදී, පැමිණි නවක භික්ෂූහු ඇත. බුදුන් නො දක්නා ඔවුනට අන්‍යථාත්වයෙක් වෙයි, පෙරළීමෙක් වෙයි. මවු දෙන නො දක්නා ළපැටි වසුට යම් පරිදි අන්‍යථාත්වය හා විපර්යාසය හා ඇත් ද, එපරිදි ම මෙහි ළහැදී පැවිදි වූ මෙ සස්නට ළහදී පැමිණි භික්ෂූහු වෙති. බුදුන් නො දක්නා ඔවුනට අන්‍යථා භාවය වෙයි, විපයාසය වේ. දිය නො ලබන තරුණබීජවලට යම් පරිදි අන්‍යථාභාවය හා විපරිණාමය හා වේ ද, එපරිදි ම මෙහි පැවිදි නොබෝ කල් ඇති මෙ සස්නට ළහැදී පැමිණි නවක භික්ෂූහු ඇත. බුදුන් දක්නට නො ලබන ඔවුනට අන්‍යථාත්වය වෙයි, විපරිණාමය වේ.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බික්සඟුන් පිළිගන්නා සේක් වා, වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බික්සඟනට ඔවා දෙන සේක්වා. වහන්ස, යම් පරිදි පෙර භාග්‍යවතුන් වහන්සේ විසින් බික්සඟහු අනුග්‍රහ කරන ලද්දහු ද, එපරිදි ම දැනුදු බික්සඟුන් සඟන්නා සේක්වා''යි.

Free Distribution www.aathaapi.org

අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො බ්‍රහ්මා සහම්පති භගවතො අධිවාසනං විදිත්වා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන නිග්‍රොධාරාමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි[1] යථා තෙ භික්ඛූ එකද්විහිකාය සාරජ්ජමානරූපා යෙන භගවා තෙනුපසඞ්කමෙය්‍යුං.

"තෙපි භික්ඛූ එකද්විහිකාය සාරජ්ජමානරූපා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ භගවා එතදවොච: "අන්තමිදං භික්ඛවෙ, ජීවිකානං යදිදං පිණ්ඩොල්‍යං. අභිසාපොයං[2] ලොකස්මිං පිණ්ඩොලො විචරසි පත්තපාණීති" තං ච ඛො එවං භික්ඛවෙ, කුලපුත්තා උපෙන්ති අත්ථවසිකා අත්ථවසං පටිච්ච, නෙව රාජාභිනීතා න චොරාභිනීතා න ඉණට්ටා න භයට්ටා න ආජීවිකාපකතා. අපි ච ඛො ඔතිණ්ණම්හා ජාතියා ජරාමරණෙන[3] සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි දුක්ඛොතිණ්ණා දුක්ඛපරෙතා අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති.

එවං පබ්බජිතො චායං භික්ඛවෙ, කුලපුත්තො, සො ච හොති අභිජ්ඣාලු කාමෙසු තිබ්බසාරාගො බ්‍යාපන්නචිත්තො පදුට්ඨමනසඞ්කප්පො මුට්ඨස්සති අසම්පජානො අසමාහිතො විබ්භන්තචිත්තො පාකතින්ද්‍රියො. සෙය්‍යථාපි භික්ඛවෙ, ඡවාලාතං උභතො පදිත්තං මජ්ඣෙ ගූථගතං නෙව ගාමෙ කට්ඨත්ථං ඵරති, නාරඤ්ඤෙ කට්ඨත්ථං ඵරති, තථූපමාහං භික්ඛවෙ, ඉමං පුග්ගලං වදාමි ගිහිභොගා ච පරිහීනො, සාමඤ්ඤත්ථඤ්ච න පරිපූරෙති.

තයො මෙ භික්ඛවෙ, අකුසලවිතක්කා. කාමවිතක්කො බ්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො. ඉමෙ ච ඛො භික්ඛවෙ, තයො අකුසලවිතක්කා තං ක්ව අපරිසෙසා නිරුජ්ඣන්ති: චතූසු වා සතිපට්ඨානෙසු සුපතිට්ඨිතචිත්තස්ස විහරතො අනිමිත්තං වා සමාධිං භාවයතො.

යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව අනිමිත්තො සමාධි භාවෙතුං. අනිමිත්තො භික්ඛවෙ, සමාධි භාවිතො බහුලීකතො මහප්ඵලො හොති මහානිසංසො.

ද්වෙමා භික්ඛවෙ, දිට්ඨියො භවදිට්ඨි ච විභවදිට්ඨි ච, තත්‍ර භික්ඛවෙ, සුතවා අරියසාවකො ඉති පටිසඤ්චික්ඛති: "අත්ථි නු ඛො තං කිඤ්චි ලොකස්මිං යමහං උපාදියමානො න වජ්ජවා අස්ස"න්ති. සො එවං පජානාති: නත්ථි නු ඛො තං කිඤ්චි ලොකස්මිං යමහං උපාදියමානො න වජ්ජවා අස්සං. අහං ච රූපඤ්ඤෙව උපාදියමානො උපාදියෙය්‍යං,

1. අභිසඞ්ඛාරෙසි - සයා.
2. අභිසාපෙය්‍යං - සී 1, 2.
3. ජරාය මරණෙන - මජසං, සයා, PTS.

භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසූසේක. එසඳ සහම්පතී බඹ භාග්‍යවතුන් වහන්සේගේ අධිවාසනා දැන බුදුන් සකසා වැඳ පැදකුණු කොට එහි ම අතුරුදන් කෙළේ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පිළිසලනින් නැගී සිටියේක් නිග්‍රොධාරාමය කරා එළැඹී සේක. එළැඹ පැන වූ අස්නෙහි වැඩ හුන් සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳ යම් පරිදි එ මහණහු තනි තනි වැ හා දෙදෙනා බැගිනුදු බානසුලු සැහැවී ඇත්තාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹෙත් නම් එබඳු ඉද්ධියක් කළසේක.

එ මහණහු ද තනි තනි වැ හා දෙදෙනා බැගිනුදු බානසුලු වැ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකයා වැඳ එකත් පස්වැ හුන්හ. භාග්‍යවතුන් වහන්සේ එකත්පස් වැ හුන් ඒ මහණුනට තෙල වදළසේක : ''මහණෙනි, ජීවිකාවන් අතුරින් මේ ජීවිකාව ලාමකය, එ කිමෙකයත් : පිඩුසිඟීම යැ. 'පාත්‍රය ගත් අත් ඇති වැ පිඩු සිඟනු වැ හැසිරෙහි' යන මේ ලෝකයෙහි ආක්‍රොෂයෙකැ, මහණෙනි. කුලපුත්‍රයෝ හේතුවශහ වූවාහු අර්ථවශය නිසා මෙසේ ඒ පිඩු සිඟීමට පැමිණෙති. රාජනීතියෙන් අභිනීත වැ නො වෙත් මැ යැ, සොරුන් විසින් අභිනීත වැ නො වෙත් මැ යැ, ණයින් පෙළුණාහු නො වෙත් මැයැ, භයින් පෙළුණාහු නො වෙත් මැ යැ,ජීවිකායෙන් පෙළුණාහු නො වෙත් මැ යි. වැළිත් ජාතියෙනුදු ජරාමරණයෙනුදු ශෝකයෙනුදු පරිදේවයෙනුදු දුකිනුදු දෙම්නසිනුදු උපායාසයෙනුදු බැසගතුම්හ. මෙසේ දුකට බටුම්හ, දුකින් පීඩිතයම්හ, (එයින්) මේ කේවල දුඃඛස්කන්ධයාගේ කෙළවර කිරීමෙක් පැනේ නම් මනා මැ නු''යි කියා යි.

මහණෙනි, මෙසේ පැවිදි වූ මේ කුලපුත්‍රයෙක් වේ ද, හේ ද අභිධ්‍යා බහුල වෙයි, කාමයෙහි තීව්‍රසංරාග ඇති වෙයි, ව්‍යාපන්සිත් ඇති වෙයි, දූෂිත සිත් ඇති වෙයි, මුෂිත ස්මෘති ඇති වෙයි. නිෂ්ප්‍රාඥ වෙයි, එකඟ නො වූ සිත් ඇති වෙයි, භ්‍රාන්ත සිත් ඇති වෙයි ප්‍රකෘති ඉඳුරන් ඇති වේ. මහණෙනි, යම් පරිදි දෙපස ඇවිළැගත්, මැදැ වැකි අගුවී ඇති සොහොන් පෙණ හෙල්ලෙක් ගමෙහි දර පිණිස වෙවයි නොයෙ දේ ද වෙනෙහි කාෂ්ට පිණිස නො යෙදේ ද, මහණෙනි, මම මේ පුඟුලා එවන් උපමා ඇතියෙකැ යි කියමි. ගිහි භෝගයෙනුදු පිරිහිණෑ, ශ්‍රමණාර්ථය ද නො පුරයි.

මහණෙනි, මේ අකුශල විතර්කයෝ තුන් දෙනෙකි : කාමවිතර්ක යැ, ව්‍යාපාද විතර්ක යැ, විහිංසා විතර්ක යි. මහණෙනි, ඒ අකුශල විතර්කයෝ තුන්දෙන නිරවශේෂ වැ කොහි ලා නිරුද්ධ වෙත් ද යත් : සතර සිවටන්හි මොනොවට පිහිටි සිත් ඇති වැ වසනුවහට හෝ විදර්ශනා සමාධිය වඩනුවහට හෝ යැ.

මහණෙනි, භාවනාවශයෙන් වඩන්නට විදර්ශනා සමාධිය නිසි මැ යැ. මහණෙනි, වඩනාලද විදර්ශනා සමාධිය බහුලීකෘත වූයේ මහත්ඵල වෙයි, මහානෘශංස වේ.

මහණෙනි, මේ දෘෂ්ටීහු දෙදෙනෙකි : භවදෘෂ්ටිය විභවදෘෂ්ටිය ද කියායි. මහණෙනි, එහිලා ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවක මෙසේ සලකයි : ''යමක් මම උපාදාන වශයෙන් ගන්නෙම් නිදෙස් වෙම් නම් එබඳු යම්කිසිවක් ඇද්ද හෝ''යි. හේ මෙසේ නුවණින් දනියි : ''යමක් මම උපාදාන වශයෙන් ගන්නෙම් නිදෙස් වෙම් නම් ඒ කිසිදු ලොවැ නැති නු !''යි. මම වැළිත් උපාදාන වශයෙන් ගන්නෙමි රූපය ම උපාදාන කෙරෙමි, උපාදාන වශයෙන්

වෙදනඤ්චෙ උපාදියමානො උපාදියෙය්‍යං, සඤ්ඤඤ්චෙ උපාදියමානො උපාදියෙය්‍යං. සඞ්ඛාරෙ චෙ උපාදියමානො උපාදියෙය්‍යං. විඤ්ඤාණඤ්චෙ උපාදියමානො උපාදියෙය්‍යං, තස්ස මෙ අස්ස උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවෙය්‍යුං. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො අස්ස.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ, යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා ති? දුක්ඛං භන්තෙ, යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං "එතං මම එසො'හමස්මි එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ, වෙදනා-පෙ-සඤ්ඤා-පෙ-සඞ්ඛාරා-පෙ-විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ, යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ, යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ.

තස්මාතිහ භික්ඛවෙ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙ සො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යා කාචි වෙදනා-පෙ-යා කාචි සඤ්ඤා-පෙ-යෙ කෙචි සඞ්ඛාරා-පෙ-යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං 'නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා'ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති වෙදනායපි නිබ්බින්දති සඤ්ඤායපි නිබ්බින්දති සඞ්ඛාරෙසුපි නිබ්බින්දති විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බිදං විරජ්ජති. විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 2. 3. 9.

## පාරිලෙය්‍යක සුත්තං

**81.** එකං සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා, පත්තචීවරමාදාය කොසම්බියං පිණ්ඩාය පාවිසි. කොසම්බියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො සාමං සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය අනාමන්තෙත්වා උපට්ඨාකෙ අනපලොකෙත්වා භික්ඛුසඞ්ඝං එකො අදුතියො චාරිකං පක්කාමි.

ගන්නෙම් වේදනාව ම උපාදාන කෙරෙමි, උපාදානවශයෙන් ගන්නෙම් සංඥව ම උපාදාන කෙරෙමි, උපාදාන වශයෙන් ගන්නෙම් සංස්කාරයන් ම උපාදාන කෙරෙමි, උපාදාන වශයෙන් ගන්නෙම් විඥනය ම උපාදාන කෙරෙමි. එබඳු මට උපාදාන හේතුයෙන් භවය වෙයි, භවහේතුයෙන් ජාතිය, ජාතිහේතුයෙන් ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍යය උපායාස යන මොහු හටගනිත්. මෙසේ තෙල කේවල දුඃඛස්කන්ධයාගේ සමුදය වේ.

මහණෙනි, එ කිසේ හඟිවු ද ? රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ. යමෙක් අනිත්‍ය වේ නම් එ දුඃඛ හෝ සුඛ හෝ වේ ද ? වහන්ස, දුක් යැ. යමෙක් අනිත්‍ය වේ නම් දුක් වේ නම් පෙරළෙන සැහැවි වේ නම් ''තෙල මාගේ යැ, මම තෙලෙ වෙමි, තෙලෙ මාගේ ආත්මය''යි එ නුවණින් දක්නට නිසි වේ දු යි ? වහන්ස, තෙල නිසි නො වේ මැ යි. වේදනා ... සංඥ ... සංස්කාර ... විඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ දු යි ? වහන්ස, අනිත්‍ය යැ. යමෙක් අනිත්‍ය වේ නම් එ දුඃඛ හෝ සුඛ හෝ වේ දු යි ? වහන්ස, දුක් යැ. යමෙක් අනිත්‍ය වේ නම් දුක් වේ නම් පෙරළෙන සැහැවි වේ නම් එය ''තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙලෙ මාගේ ආත්මය''යි නුවණින් දක්නට නිසි වේ දු යි ? වහන්ස, තෙලෙ නිසි නො වේ.

මහණෙනි, එහෙයින් යම් මැ රූපයෙක් අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න වේ ද, අධ්‍යාත්ම හෝ බාහිර හෝ ඔළාරික හෝ සියුම් හෝ හීන හෝ ප්‍රණීත හෝ වේ ද, දුරෙහි වේවයි හම්යෙහි වේවයි යම් රූපයෙක් වේ ද, එ හැම රූපය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේති''යි මෙසේ මෙය ඇති සැටි සම්‍යක්ප්‍රඥයෙන් දතයුතු ය. යම්කිසි වේදනාවක් ... යම්කිසි සංඥවක් ... යම්කිසි සංස්කාර ... යම්කිසි විඥනයෙක් අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූයේ ආධ්‍යාත්මික හෝ බාහිර හෝ ඔළාරික හෝ සියුම් හෝ හීන හෝ ප්‍රණීත හෝ වේ ද, දුරෙහි හෝ සමීපයෙහි හෝ වේ ද, එ හැම විඥන ''තෙල මාගේ නො වෙයි, තෙල මම නො වෙමි, තෙලෙ මාගේ ආත්ම නො වේති''යි මෙය මෙසේ ඇති සැටි සම්‍යක්ප්‍රඥයෙන් දතයුතු යි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපයෙහි ද කලකිරෙයි, වේදනායෙහි ද කලකිරෙයි, සංඥයෙහි ද කලකිරෙයි, සංස්කාරයෙහි ද කලකිරෙයි, විඥනයෙහි ද කලකිරේ. කලකිරෙනුයේ සංරාග වශයෙන් නො ඇලෙයි. එ විරාග හේතුයෙන් මිදෙයි, මිදුණු කල්හි ''විමුක්තයෙමි''යි ඥනය වෙයි. ජාතිය ක්ෂීණ යැ, බඹසර වසන ලද, කරණී කරන ලද මේ අර්හත්ත්වය පිණිස කළමනා කිසෙක් නැති''යි නුවණින් දනියි.

## 1. 2. 3. 9.

## පාරිලෙය්‍යක සූත්‍රය

81. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයෙහි වැඩ වසනසේක. එසඳ භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳැ පෙරෙවැ පාසිවුරු ගෙන කොසඹෑ පුරයට පිඩු පිණිස පිවිසිසේක. කොසඹැයෙහි පිඩු පිණිස හැසිර පසුබත්හි පිණ්ඩපාතයෙන් වැළැකිසේක් තමන් වහන්සේ ම සෙනසුන් සඟවා තබා පා සිවුරු ගෙන උපස්ථායකයන් නො අමතා භික්සඟුන් අපලොකන නො කොට (-නො විචාරා) එකලා වැ දෙවන මහණකු නැති වැ චාරිකාවට වැඩිසේක.



Free Distribution www.aathaapi.org

අථ ඛො අඤ්ඤතරො භික්ඛු අචිරපක්කන්තස්ස භගවතො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං එතදවොච: "එසාවුසො ආනන්ද, භගවා සාමං සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය අනාමන්තෙත්වා උපට්ඨාකෙ අනපලොකෙත්වා භික්ඛුසඞ්ඝං එකො අදුතියො චාරිකං පක්කන්තො"ති.

යස්මිං ආවුසො සමයෙ භගවා සාමං සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය අනාමන්තෙත්වා උපට්ඨාකෙ අනපලොකෙත්වා භික්ඛුසඞ්ඝං එකො අදුතියො චාරිකං පක්කමති එකොව භගවා තස්මිං සමයෙ විහරිතුකාමො හොති. න භගවා තස්මිං සමයෙ කෙනචි අනුබන්ධිතබ්බො හොතී"ති.

අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන පාරිලෙය්‍යකං[1] තදවසරි. තත්‍ර සුදං භගවා පාරිලෙය්‍යකෙ විහරති භද්දසාලමූලෙ. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන ආයස්මා ආනන්දො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං ආනන්දං එතදවොචුං: "චිරස්සුතා ඛො නො ආවුසො ආනන්ද භගවතො සම්මුඛා ධම්මීකථා. ඉච්ඡාම මයං ආවුසො ආනන්ද, භගවතො සම්මුඛා ධම්මිං කථං සොතුන්"ති.

අථ ඛො ආයස්මා ආනන්දො තෙහි භික්ඛූහි සද්ධිං යෙන පාරිලෙය්‍යකං භද්දසාලමූලං යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ භගවා ධම්මියා කථාය සන්දස්සෙසි. සමාදපෙසි. සමුත්තෙජෙසි. සම්පහංසෙසි.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "කථං නු ඛො ජානතො කථං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොතී"ති.

අථ ඛො භගවා තස්ස භික්ඛුනො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය භික්ඛූ ආමන්තෙසි: "විචයසො දෙසිතො භික්ඛවෙ, මයා ධම්මො; විචයසො දෙසිතා චත්තාරො සතිපට්ඨානා. විචයසො දෙසිතා චත්තාරො සම්මප්පධානා. විචයසො දෙසිතා චත්තාරො ඉද්ධිපාදා. විචයසො දෙසිතානි පඤ්චින්ද්‍රියානි. විචයසො දෙසිතානි පඤ්චබලානි. විචයසො දෙසිතා සත්තබොජ්ඣඞ්ගා. විචයසො දෙසිතො අරියො අට්ඨඞ්ගිකො මග්ගො. එවං විචයසො ඛො දෙසිතො භික්ඛවෙ, මයා ධම්මො. එවං විචයසො දෙසිතෙ ඛො භික්ඛවෙ, මයා ධම්මෙ අථ ච පනිධෙකච්චස්ස භික්ඛුනො එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "කථං නු ඛො ජානතො කථං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොතී"ති.

1. පාලිලෙය්‍යකං - මජසං, ස්‍යා.
පාරිලෙය්‍යනගරං - අට්ඨකථා.

ඉක්බිති අන්‍යතර මහණෙක් බුදුන් වැඩි නොබෝ වේලෙහි ආයුෂ්මත් අනඳ තෙරණුවන් කරා එළැඹියේ ය, එළැඹ ආයුෂ්මත් අනඳ තෙරණුවනට තෙල කී : ''ඇවැත් ආනන්දයෙනි, එව, භාග්‍යවතුන් වහන්සේ තුමූ ම සෙනසුන් සඟවා තබා පාසිවුරු ගෙන උවටු මහණුන් නො අමතා බික්සඟුන් නො විචාරා එකලා වැ පසු මහණකු නැති වැ චාරිකාවට නික්ම වැඩිසේකැ''යි.

ඇවැත, යම් කලෙක භාග්‍යවතුන් වහන්සේ සෙනසුන් සඟවා තබා පාසිවුරු ගෙන උපස්ථායකයන් නො අමතා බික්සඟුන් අපලෝකන නො කොට පශ්චාත් ශ්‍රමණයකු නැති වැ එකාකී වැ චාරිකාවට බැස යන සේක් ද, එකල භාග්‍යවතුන් වහන්සේ එකලා වැ ම වසනු කැමැති සේක. එකල්හි යම් මැ කෙනෙකුන් විසින් භාග්‍යවතුන් වහන්සේ ලුහුබැඳියයුතු නො වෙති''යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකා කරනසේක් පාරිලෙය්‍යකවනය කරා වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ ඒ පාරිලෙය්‍යකවනයෙහි භද්‍ර වූ සල්රුකක්මුල වැඩ වසනසේක. එසඳ බොහෝ භික්ෂූහු ආයුෂ්මත් අනඳ තෙරණුවන් කරා එළැඹියහ. එළැඹ ආයුෂ්මත් අනඳ තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහිකළයුතු කථා කොට නිමවා එකත්පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් එ මහණහු ආයුෂ්මත් අනඳ තෙරණුවනට තෙල කීහු : ''ඇවැත්නි අනඳ තෙරණුවනි, අප විසින් බුදුන් හමුයෙහි දැහැම්කථා ඇසූ බොහෝ කල් ඇත. ඇවැත්නි අනඳ තෙරණුවනි, අපි බුදුන් හමුයෙහි දැහැම් කථාවක් අසන්නට කැමැතියම්හ''යි.

එසඳ ආයුෂ්මත් අනඳ තෙරණුවෝ එ මහණුන් සමග පාරිලෙය්‍යකවනයෙහි වූ භද්‍රශාලමූලය වෙතැ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පස්වැ හුන්හ. භාග්‍යවතුන් වහන්සේ එකත්පස් වැ හුන් ඒ මහණුන්හට දැහැමි කථායෙන් කරුණු දැක්වූ සේක, සමාදන් කරවූ සේක, තෙද ගැන්වූ සේක, පිණ වූ සේකි.

එකල එක්තරා මහණක්හට මෙබඳු චිත්තපරිවිතර්කයෙක් උපන. ''කෙසේ දන්නා කෙසේ දක්නා මහණක්හට මාර්ගඥානයට අනන්තර ව ආශ්‍රවක්ෂය වේ දැ''යි.

එසඳ භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහුගේ චිත්තපරිවිතර්කය සිය සිතින් දැන මහණුන් ඇමතූ සේක : ''මහණෙනි, මා විසින් විචය නුවණින් දහම් දෙසන ලද : විචය නුවණින් සතර සිවටන්හු දෙසන ලදහ. විචයනුවණින් සතර සම්‍යක්ප්‍රධන්හු දෙසන ලදහ. විචය නුවණින් සතර ඍද්ධි පාදයෝ දෙසන ලදහ, විචයනුවණින් පඤ්චෙන්ද්‍රියයෝ දෙසන ලදහ, විචයනුවණින් පඤ්චබලයෝ දෙසන ලදහ, විචයනුවණින් සප්ත බොධ්‍යංගයෝ දෙසන ලදහ, විචයනුවණින් අරිඅටඟිමඟ දෙසන ලදී. මහණෙනි, මා විසින් මෙසේ විචයනුවණින් දහම් දෙසන ලදී. මහණෙනි, මා විසින් මෙසේ විචයනුවණින් දහම් දෙසත් ම, වැලිත් මෙහි ලා ඇතැම් මහණක්හට මෙබඳු චිත්තපරිවිතර්කයෙක් උපන : කෙසේ දන්නා කෙසේ දක්නා මහණක්හට අර්හත් මාර්ගඥානයට අනන්තර ව. (ආශ්‍රවක්ෂය සංඛ්‍යාත) අර්හත්ඵලඥානය වේ දැ'යි (කියා යි).

කථං ච භික්ඛවෙ, ජානතො කථං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොති: ඉධ භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති යා ඛො පන සා භික්ඛවෙ, සමනුපස්සනා, සඞ්ඛාරො සො. සො පන සඞ්ඛාරො කින්නිදානො කිංසමුදයො කිඤ්ජාතිකො කිම්පභවො: අවිජ්ජාසම්ඵස්සජෙන භික්ඛවෙ, වෙදයිතෙන ඵුට්ඨස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස උප්පන්නා තණ්හා තතොජො සො සඞ්ඛාරො.

ඉති ඛො භික්ඛවෙ, සොපි ඛො සඞ්ඛාරො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො, සාපි තණ්හා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා, සාපි වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා, සොපි ඵස්සො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො, සාපි අවිජ්ජා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා. එවම්පි ඛො භික්ඛවෙ, ජානතො එවං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොති.

න හෙව ඛො රූපං අත්තතො සමනුපස්සති අපි ච ඛො රූපවන්තං අත්තානං සමනුපස්සති. යා ඛො පන සා භික්ඛවෙ, සමනුපස්සනා සඞ්ඛාරො සො, සො පන සඞ්ඛාරො කින්නිදානො කිංසමුදයො කිඤ්ජාතිකො කිම්පභවො: අවිජ්ජාසම්ඵස්සජෙන භික්ඛවෙ, වෙදයිතෙන ඵුට්ඨස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස උප්පන්නා තණ්හා. තතොජො සො සඞ්ඛාරො. ඉති ඛො භික්ඛවෙ, සොපි සඞ්ඛාරො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො සාපි තණ්හා -පෙ- සාපි වෙදනා -පෙ- සො'පි ඵස්සො -පෙ- සා'පි අවිජ්ජා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා. එවම්පි ඛො භික්ඛවෙ, ජානතො එවං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොති.

න හෙව ඛො රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං අත්තානං සමනුපස්සති. අපි ච ඛො අත්තනි රූපං සමනුපස්සති. යා ඛො පන සා භික්ඛවෙ, සමනුපස්සනා සඞ්ඛාරො සො. සො පන සඞ්ඛාරො කින්නිදානො කිංසමුදයො කිඤ්ජාතිකො කිම්පභවො: අවිජ්ජාසම්ඵස්සජෙන භික්ඛවෙ, වෙදයිතෙන ඵුට්ඨස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස උප්පන්නා තණ්හා තතොජො සො සඞ්ඛාරො.

ඉති ඛො භික්ඛවෙ, සොපි සඞ්ඛාරො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො. සාපි තණ්හා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා, සාපි වෙදනා -පෙ- සොපි ඵස්සො -පෙ- සාපි අවිජ්ජා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා. එවම්පි ඛො භික්ඛවෙ, ජානතො එවං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොති.

න හෙව ඛො රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං අත්තානං සමනුපස්සති, න අත්තනි රූපං සමනුපස්සති. අපි ච ඛො රූපස්මිං අත්තානං සමනුපස්සති. යා ඛො පන සා භික්ඛවෙ, සමනුපස්සනා සඞ්ඛාරො සො. සො පන සඞ්ඛාරො කින්නිදානො

මහණෙනි, කෙසේ දන්නා කෙසේ දක්නා මහණක්හට අර්හත්මාර්ගඥානයට අනන්තර ව ආස්‍රවක්ෂය සංඛ්‍යාත අර්හත්ඵලය වේ ද යත් : මහණෙනි, මෙහි බුද්ධාදි ආර්‍ය්‍යයන් නො දක්නාසුලු ආර්‍ය්‍යධර්මයෙහි අදක්ෂ වූ ආර්‍ය්‍යධර්මයෙහි අකෝවිද වූ ආර්‍ය්‍යධර්මයෙහි අවිනීත වූ, බුද්ධාදි සත්පුරුෂයන් නො දක්නාසුලු සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ වූ සත් පුරුෂධර්මයෙහි අකෝවිද වූ සත්පුරුෂධර්මයෙහි අවිනීත වූ අශ්‍රුතවත් පෘථග්ජන තෙම ශුද්ධ රූපය ම ආත්මවශයෙන් දක්නේ ය. මහණෙනි, යම් ඒ දිට්ඨි සමනුපස්සනායෙක් වේ ද, ඒ සංස්කාර වේ. ඒ සංස්කාර කුමක් නිදන කොට ඇත්තේ ද කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද යත් : මහණෙනි, අවිදු සම්පහයින් උපන් වේදනාවෙන් පහස්නා ලද අශ්‍රුතවත් පෘථග්ජනහට උපන් තෘෂ්ණායෙක් ඇත් ද, ඒ සංස්කාර එයින් හටගත්තේ ය.

මහණෙනි, මෙසේ ඒ සංස්කාර ද අනිත්‍ය ය, සඞ්ඛත ය, ප්‍රත්‍යයෙන් උපන. ඒ තෘෂ්ණා ද අනිත්‍ය ය, සඞ්ඛත ය, ප්‍රත්‍යයෙන් උපන. ඒ වේදනා ද අනිත්‍ය ය, සඞ්ඛත ය, ප්‍රත්‍යයෙන් උපන. ඒ ස්පර්ශ ද අනිත්‍ය ය, සඞ්ඛත ය, ප්‍රත්‍යයෙන් උපන. ඒ අවිද්‍යා ද අනිත්‍ය ය, සඞ්ඛත ය, ප්‍රත්‍යයෙහි උපන. මහණෙනි, මෙසෙයිනුදු දන්නා දක්නා මහණහට අර්හත්මාර්ගයට අනන්තර ව අර්හත්ඵලය වේ.

රූපය ආත්මය යි නො ම දකියි. වැලිදු ආත්මය රූපවත් කොට දකී. මහණෙනි යම් ඒ සමනුපස්සනායෙක් වේ නම් එ සංස්කාර යි. ඒ සංස්කාර කුමක් නිදන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද යත් : මහණෙනි, අවිදු සම්පහයින් හටගත් වේදනායෙන් පහස්නා ලද අශ්‍රුතවත් පෘථග්ජනහට උපන් තෘෂ්ණායෙක් ඇත් ද, ඒ සංස්කාර එයින් උපන. මහණෙනි, මෙසේ මේ සංස්කාර ද අනිත්‍ය ය, සඞ්ඛත ය, ප්‍රත්‍යයෙන් උපන. ඒ තෘෂ්ණා ද, ... ඒ වේදනා ද ... ඒ ස්පර්ශ ද ... ඒ අවිද්‍යා ද අනිත්‍ය ය, සඞ්ඛත ය, ප්‍රත්‍යයෙන් උපන. මහණෙනි, මෙසේ දන්නා දක්නා මහණහට මාර්ගයට ඉක්බිති වැ අර්හත්ඵලය වේ.

රූපය ආත්ම වශයෙන් නො ම දකියි, ආත්මය රූපවත් කොට නො දකියි, වැලිදු රූපය ආත්මයෙහි ලා දකී. මහණෙනි, යම් ඒ සමනුපස්සනායෙක් වේ නම් එ සංස්කාර යි. ඒ සංස්කාර කුමක් නිදන කොට ඇත් ද, කුමක් සමුදය කොට ඇත් ද, කුමක් ජාති කොට ඇත් ද, කුමක් ප්‍රභව කොට ඇත් ද යත් : මහණෙනි, අවිදු සම්පහයින් උපන් වේදනායෙන් පහස්නා ලද අශ්‍රුතවත් පෘථග්ජනහට උපන් තෘෂ්ණායෙන් ඇත් ද, ඒ සංස්කාරය එයින් උපන.

මහණෙනි, ඒ සංස්කාර ද අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය. ඒ තෘෂ්ණා ද අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය. එ වේදනා ද ... ඒ ස්පර්ශ ද ... ඒ අවිද්‍යා ද අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය. මහණෙනි, මෙසේත් දන්නා දක්නා මහණහට මාර්ගයට ඉක්බිති ව අර්හත්ඵලය වේ.

රූපය ආත්මය වශයෙන් නො ම දකියි, ආත්මය රූපවත් කොට නො ම දකියි, රූපය ආත්මයෙහි පිහිටියේ ය යි නො ම දකී. වැලි දු ආත්මය රූපයෙහි ලා දකියි. මහණෙනි, යම් ඒ සමනුපස්සනායෙක් වේ නම් ඒ සංස්කාර යි. ඒ සංස්කාරය කුමක් නිදන කොට

කිංසමුදයො කිංජාතිකො කිම්පභවො: අවිජ්ජාසම්ඵස්සජෙන භික්ඛවෙ, වෙදයිතෙන ඵුට්ඨස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස උප්පන්නා තණ්හා තතොජො, සො සඞ්ඛාරො. ඉති ඛො භික්ඛවෙ, සොපි සඞ්ඛාරො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො. සාපි තණ්හා -පෙ- සාපි වෙදනා -පෙ- සොපි ඵස්සො -පෙ- සාපි අවිජ්ජා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා. එවම්පි ඛො භික්ඛවෙ, ජානතො එවං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොති.

න හෙව ඛො රූපං අත්තතො සමනුපස්සති න රූපවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි රූපං සමනුපස්සති න රූපස්මිං අත්තානං සමනුපස්සති. අපි ච ඛො වෙදනං අත්තතො සමනුපස්සති -පෙ- (යථා රූපක්ඛන්ධෙ විත්ථාරො එවං උපරි චත්තාරො ඛන්ධා විත්ථාරෙතබ්බා.) අපි ච ඛො වෙදනාවන්තං අත්තානං සමනුපස්සති -පෙ- අපි ච ඛො අත්තනි වෙදනං සමනුපස්සති -පෙ- අපි ච ඛො වෙදනාය අත්තානං සමනුපස්සති -පෙ- අපි ච ඛො සඤ්ඤං අත්තතො සමනුපස්සති -පෙ- අපි ච ඛො සඤ්ඤාවන්තං අත්තානං සමනුපස්සති -පෙ- අපිච ඛො අත්තනි සඤ්ඤං සමනුපස්සති -පෙ- අපි ච ඛො සඤ්ඤාය අත්තානං සමනුපස්සති -පෙ- අපි ච ඛො සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති -පෙ- අපි ච ඛො සඞ්ඛාරවන්තං අත්තානං සමනුපස්සති -පෙ- අපි ච ඛො අත්තනි සඞ්ඛාරෙ සමනුපස්සති -පෙ- අපි ච ඛො සඞ්ඛාරෙසු අත්තානං සමනුපස්සති -පෙ- අපි ච ඛො විඤ්ඤාණං අත්තතො සමනුපස්සති -පෙ- අපි ච ඛො විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති -පෙ- අපි ච ඛො අත්තනි විඤ්ඤාණං සමනුපස්සති -පෙ- අපි ච ඛො විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති.

යා ඛො පන සා භික්ඛවෙ සමනුපස්සනා, සඞ්ඛාරො සො. සො පන සඞ්ඛාරො කින්නිදානො කිංසමුදයො කිංජාතිකො කිම්පභවො: අවිජ්ජාසම්ඵස්සජෙන භික්ඛවෙ, වෙදයිතෙන ඵුට්ඨස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස උප්පන්නා තණ්හා. තතොජො සො සඞ්ඛාරො. ඉති ඛො භික්ඛවෙ, සො'පි සඞ්ඛාරො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො. සා'පි තණ්හා -පෙ- සාපි වෙදනා -පෙ- සො'පි ඵස්සො -පෙ- සාපි අවිජ්ජා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා. එවම්පි ඛො භික්ඛවෙ, ජානතො එවං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොති.

න හෙව ඛො රූපං අත්තතො සමනුපස්සති න රූපවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි රූපං සමනුපස්සති න රූපස්මිං අත්තානං සමනුපස්සති. න වෙදනං අත්තතො සමනුපස්සති න වෙදනාවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි වෙදනං සමනුපස්සති න වෙදනාය අත්තානං සමනුපස්සති. න සඤ්ඤං අත්තතො සමනුපස්සති න සඤ්ඤාවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි සඤ්ඤං සමනුපස්සති න සඤ්ඤාය අත්තානං සමනුපස්සති. න සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති න සඞ්ඛාරවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි සඞ්ඛාරෙ සමනුපස්සති න සඞ්ඛාරෙසු අත්තානං සමනුපස්සති, න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති න විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි විඤ්ඤාණං සමනුපස්සති. න විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති.

ඇත්තේ ද කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද යත් : මහණෙනි, අවිද්‍යා සම්පහසින් හටගත් වේදනායෙන් පහස්නා ලද අශ්‍රැතවත් පෘථග්ජනහට උපන් තෘෂ්ණායෙක් ඇත් ද, ඒ සංස්කාරය එයින් උපන. මහණෙනි මෙසේ ඒ සංස්කාර ද අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය. ඒ තෘෂ්ණා ද ... ඒ වේදනා ද ... ඒ ස්පර්ශ ද ... ඒ අවිද්‍යා ද අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය. මහණෙනි, මෙසේත් දන්නා දක්නා මහණහට මාර්ගයට ඉක්බිති අර්හත්ඵලය වේ.

රූපය ආත්ම ය යි නො ම දකියි, ආත්මය රූපවත් කොට නො ම දකියි, රූපය ආත්මයෙහි ලා නො ම දකියි, ආත්මය රූපයෙහි ලා නො ම දකී. වැළි දු වේදනාව ආත්ම ය යි දකියි ... (රූපස්කන්ධයෙහි විස්තරය සේ මතු ස්කන්ධ සතර ම විස්තර කටයුතු යි.) වැළි දු ආත්මය වේදනා ඇත්තෙකැ යි දකී ... වැළි දු වේදනාව ආත්මයෙහි ලා දකී ... වැළි දු ආත්මය වේදනායෙහි ලා දකී ... වැළි දු සංඥාව ම ආත්ම වශයෙන් දකී ... වැළිදු ආත්මය සංඥා ඇත්තෙකැ යි දකී ... වැළිදු සංඥාව ආත්මයෙහි ලා දකී ... වැළිදු ආත්මය සංඥාවෙහි ලා දකී ... වැළිදු සංස්කාර ම ආත්ම ය යි දකී ... වැළිදු ආත්මය සංස්කාර ඇත්තෙකැ යි දකී ... වැළිදු සංස්කාර ආත්මයෙහි ලා දකී ... වැළිදු ආත්මය සංස්කාරයන්හි ලා දකී ... වැළිදු ආත්මය සංස්කාරයන්හි ලා දකී ... වැළිදු විඥානය ම ආත්ම ය යි දකී. ... වැළිදු ආත්මය විඥාන ඇත්තෙකැයි දකී ... වැළිදු විඥානය ආත්මයෙහි ලා දකී ... වැළිදු ආත්මය විඥානයෙහි ලා දකී.

මහණෙනි, යම් ඒ සමනුපස්සනාවක් වේ නම් එය සංස්කාර යි. ඒ සංස්කාරය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද යත් : මහණෙනි අවිදු සම්පහසින් හටගත් වේදනායෙන් පහස්නා ලද අශ්‍රැතවත් පෘථජ්ජනහට තෘෂ්ණා උපන. ඒ සංස්කාර එයින් හටගත්තේ ය. මහණෙනි, මෙසේ ඒ සංස්කාර ද, අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය. ඒ තෘෂ්ණා ද ... ඒ වේදනා ද ... ඒ ස්පර්ශ ද ... ඒ අවිද්‍යා ද අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය. මහණෙනි, මෙසේත් දන්නා දක්නා මහණහට අර්හත්මාර්ගයට අනන්තර ව අර්හත්ඵලය වේ.

මහණෙනි, රූපය ආත්ම ය යි නො ම දකියි, ආත්මය රූපවත් කොට නො ම දකියි, රූපය ආත්මයෙහි ලා නො ම දකියි, රූපයෙහි ලා ආත්මය නො ම දකී. වේදනාව ආත්ම ය යි නො ම දකියි, ආත්මය වේදනා ඇත්තෙකැ යි නො ම දකි යි, වේදනාව ආත්මයෙහි ලා නො ම දකියි, වේදනායෙහි ලා ආත්මය නො ම දකී. සංඥාව ආත්ම ය යි නො ම දකියි, ආත්මය සංඥා ඇත්තෙකැයි නො ම දකියි, සංඥාව ආත්මයෙහි ලා නො ම දකියි, සංඥයෙහි ලා ආත්මය නො ම දකී. සංස්කාර ආත්ම ය යි නො ම දකියි, ආත්මය සංස්කාර ඇත්තෙකැ යි නො ම දකියි, සංස්කාර ආත්මයෙහි ලා නො ම දකියි, සංස්කාරයෙහි ලා ආත්මය නො ම දකී. විඥානය ආත්ම ය යි නො ම දකියි, ආත්මය විඥාන ඇත්තෙකැ යි නො ම දකියි, ආත්මයෙහි ලා විඥානය නො ම දකියි, විඥානයෙහි ලා ආත්මය නො ම දකී.

අපි ච ඛො එවං දිට්ඨි හොති: ''සො අත්තා සො ලොකො සො පෙච්ච භවිස්සාමි නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො''ති. යා ඛො පන සා භික්ඛවෙ, සස්සතදිට්ඨි සඞ්ඛාරො සො, සො පන සඞ්ඛාරො කින්නිදානො කිංසමුදයො කිඤ්ජාතිකො කිම්පභවො: අවිජ්ජාසම්ඵස්සජෙන භික්ඛවෙ, වෙදයිතෙන ඵුට්ඨස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස උප්පන්නා තණ්හා. තතොජො සො සඞ්ඛාරො. ඉති ඛො භික්ඛවෙ, සො'පි සඞ්ඛාරො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො සාපි තණ්හා -පෙ- සා'පි වෙදනා -පෙ- සො'පි ඵස්සො -පෙ- සාපි අවිජ්ජා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා. එවම්පි ඛො භික්ඛවෙ, ජානතො එවං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොති.

න හෙව ඛො රූපං අත්තතො සමනුපස්සති න රූපවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි රූපං සමනුපස්සති න රූපස්මිං අත්තානං සමනුපස්සති. න වෙදනං - පෙ - න සඤ්ඤං - පෙ - න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති න විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි විඤ්ඤාණං සමනුපස්සති. න විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති නා'පි එවං දිට්ඨි හොති. සො අත්තා සො ලොකො සො පෙච්ච භවිස්සාමි නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො'ති, අපි ච ඛො එවං දිට්ඨි හොති: ''නො චස්සං නො ච මෙ සියා න භවිස්සාමි' න මෙ භවිස්සතී''ති. යා ඛො පන සා භික්ඛවෙ, උච්ඡෙදදිට්ඨි සඞ්ඛාරො සො. සො පන සඞ්ඛාරො කින්නිදානො කිංසමුදයො කිඤ්ජාතිකො කිම්පභවො: අවිජ්ජාසම්ඵස්සජෙන, භික්ඛවෙ, වෙදයිතෙන ඵුට්ඨස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස උප්පන්නා තණ්හා තතොජො සො සඞ්ඛාරො. ඉති ඛො භික්ඛවෙ, සො'පි සඞ්ඛාරො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො. සාපි තණ්හා සාපි වෙදනා - පෙ - සොපි ඵස්සො - පෙ - 'සාපි අවිජ්ජා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා, එවම්පි ඛො භික්ඛවෙ, ජානතො එවං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොති.

න හෙව ඛො රූපං අත්තතො සමනුපස්සති න රූපවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි රූපං සමනුපස්සති න රූපස්මිං අත්තානං සමනුපස්සති. න වෙදනං අත්තතො සමනුපස්සති න වෙදනාවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි වෙදනං සමනුපස්සති න වෙදනාය අත්තානං සමනුපස්සති. න සඤ්ඤං අත්තතො සමනුපස්සති න සඤ්ඤාවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි සඤ්ඤං සමනුපස්සති. න සඤ්ඤාය අත්තානං සමනුපස්සති. න සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති. න සඞ්ඛාරවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි සඞ්ඛාරෙ සමනුපස්සති න සඞ්ඛාරෙසු අත්තානං සමනුපස්සති. න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති න විඤ්ඤාණවන්තං අත්තානං සමනුපස්සති න අත්තනි විඤ්ඤාණං සමනුපස්සති. න විඤ්ඤාණස්මිං අත්තානං සමනුපස්සති.

Free Distribution www.aathaapi.org

වැලිදු " ඒ මම ආත්මය වෙමි, ඒ මම ලෝකය වෙමි, ඒ මම පරලොව වන්නෙමි. නිත්‍යයෙමි, ධ්‍රැවයෙමි, ශාශ්වතයෙමි, නො පෙරළෙන සැහැවියෙමි " යි මෙබඳු දෘෂ්ටි ඇත්තේ වේ. මහණෙනි, යම් ඒ ශාශ්වත දෘෂ්ටියක් වේ නම් ඒ සංස්කාර යි. ඒ සංස්කාර කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද යත් ; මහණෙනි, අවිද්‍ය සම්පහසින් හටගත් වේදනායෙන් පහස්නා ලද අශ්‍රැතවත් පෘථජ්ජනහට තෘෂ්ණාව උපන. ඒ සංස්කාර එයින් හටගත්තේ ය. මහණෙනි, මෙසේ ඒ සංස්කාර ද අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය. ඒ තෘෂ්ණා ද ... ඒ වේදනා ද ... ඒ ස්පර්ශ ද ... ඒ අවිද්‍යා ද අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න ය. මහණෙනි, මෙසේ ද දන්නා දක්නා මහණහට අර්හත්මාර්ගයට ඉක්බිති ව අර්හත්ඵලය වේ.

රූපය ආත්ම වීසින් නො ම දකියි, ආත්මය රූපවත් කොට නො ම දකියි ආත්මයෙහි ලා රූපය ඇතැ යි නො ම දකියි, රූපයෙහි ලා ආත්මය ඇතැ යි නො ම දකී. වේදනාව ... නො ම දකී ... සංඥව ... නො ම දකී. සංස්කාර ... නො ම දකී. විඥනය ආත්ම වශයෙන් නො ම දකියි, ආත්මය විඥනවත් කොට නො ම දකියි, ආත්මයෙහි ලා විඥනය නො ම දකියි, විඥනයෙහි ලා ආත්මය නො ම දකී. " ඒ මම ආත්මයෙමි, ඒ මම ලෝකයෙමි, ඒ මම පරලොව වන්නෙමි, නිත්‍යයෙමි, ධ්‍රැවයෙමි, ශාශ්වතයෙමි, නො පෙරළෙන සැහැවියෙමි යි " වැලිදු මෙබඳු දෘෂ්ටි ඇත්තේ ද නො වෙයි. " ඉදින් මම නො වන්නෙම් නම් මට (පිරිකර ද) නො වන්නේ ය. (මම) මතු නො වන්නෙම් නම් මතු ද මට (පිරිකර) නො වන්නේ ය " කියා යි. මහණෙනි, යම් ඒ උච්ඡෙද දෘෂ්ටියක් වේ නම් ඒ සංස්කාරය යි. ඒ සංස්කාරය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද යත් : මහණෙනි. අවිද්‍ය සම්පහසින් හටගත් වේදනායෙන් පහස්නා ලද අශ්‍රැතවත් පෘථජ්ජනහට තෘෂ්ණා උපන. ඒ සංස්කාර එයින් (එ තෘෂ්ණායෙන්) හටගත්තේ ය. මහණෙනි මෙසේ ඒ සංස්කාර ද අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්ච සමුප්පන්න ය. ඒ තෘෂ්ණා ද ... ඒ වේදනා ද ... ඒ ස්පර්ශ ද ... ඒ අවිද්‍යා ද අනිත්‍ය ය, සඞ්ඛත ය, පටිච්චසමුප්පන්න යි. මහණෙනි මෙසේ දන්නා මෙසේ දක්නා මහණහට අර්හත්මාර්ගයට අනන්තර ව අර්හත්ඵලය වේ.

රූපය ආත්ම වශයෙන් නො ම දකියි, ආත්මය රූපවත්ය යි නො ම දකියි ආත්මයෙහි ලා රූපය ඇතැ යි නො ම දකියි, රූපයෙහි ලා ආත්මය ඇතැ යි නො ම දකී. වේදනාව ආත්ම වශයෙන් නො ම දකි යි, ආත්මය වේදනාවත් ය යි නො ම දකියි, ආත්මයෙහි ලා වේදනාව ඇතැ යි නො ම දකියි වේදනායෙහි ලා ආත්මය ඇතැ යි නො ම දකී. සංඥව ආත්ම වශයෙන් නො ම දකියි, ආත්මය සංඥ ඇත්තෙකැ යි නො ම දකී. ආත්මයෙහි ලා සංඥව පවතී ය යි නො ම දකි යි සංඥයෙහි ලා ආත්මය පවතී යයි නො ම දකී, සංස්කාර ආත්ම වශයෙන් නො ම දකියි. ආත්මය. සංස්කාරවත් ය යි නො ම දකියි, ආත්මයෙහි ලා සංස්කාර පවතී ය යි නොම දකියි, සංස්කාරයෙහි ලා අත්මය පවතී යයි නො ම දකිය. විඥනය ආත්ම වශයෙන් නො ම දකියි, ආත්මය විඥනවත් යයි නො ම දකියි, ආත්මයෙහි ලා විඥනය පවතී යයි නො ම දකියි, විඥනයෙහි ලා ආත්මය පවතී යයි නො ම දකියි.

නා'පි එවං දිට්ඨි හොති. 'සො අත්තා සො ලොකො සො පෙච්ච භවිස්සාමි නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො'ති. නා'පි එවං දිට්ඨි හොති: "නො චස්සං නො ච මෙ සියා න භවිස්සාමි[1] න මෙ භවිස්සතී"ති. අපි ච ඛො "කඞ්ඛී හොති වෙචිකිච්ඡී අනිට්ඨඞ්ගතො සද්ධම්මෙ". යා ඛො පන සා භික්ඛවෙ, කඞ්ඛිතා වෙචිකිච්ඡිතා අනිට්ඨඞ්ගතතා සද්ධම්මෙ, සඞ්ඛාරො සො. සො පන සඞ්ඛාරො කින්නිදානො කිංසමුදයො කිඤ්ජාතිකො කිම්පභවො: අවිජ්ජාසම්ඵස්සජෙන භික්ඛවෙ, වෙදයිතෙන ඵුට්ඨස්ස අස්සුතවතො පුථුජ්ජනස්ස උප්පන්නා තණ්හා. තතොජො සො සඞ්ඛාරො ඉති ඛො භික්ඛවෙ, සො'පි සඞ්ඛාරො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො, සා'පි තණ්හා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා, සා'පි වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා සො'පි ඵස්සො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො, සා'පි අවිජ්ජා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා. එවං පි ඛො භික්ඛවෙ, ජානතො එවං පස්සතො අනන්තරා ආසවානං ඛයො හොතීති.

## 1. 2. 3. 10.

## පුණ්ණමාසුත්තං

82.

එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතු පාසාදෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං. තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ පණ්ණරසෙ පුණ්ණාය පුණ්ණමාය රත්තියා භික්ඛුසඞ්ඝපරිවුතො අබ්භොකාසෙ නිසින්නො හොති.

අථ ඛො අඤ්ඤතරො භික්ඛු උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පනාමෙත්වා භගවන්තං එතදවොච: "පුච්ඡෙය්‍යාහං භන්තෙ, භගවන්තං කිඤ්චිදෙව දෙසං. සචෙ මෙ භගවා ඔකාසං කරොති පඤ්හස්ස වෙය්‍යාකරණායාති." "තෙන හි ත්වං භික්ඛු, සකෙ ආසනෙ නිසීදිත්වා පුච්ඡ යදාකඞ්ඛසීති."

එවං භන්තෙති ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා සකෙ ආසනෙ නිසීදිත්වා භගවන්තං එතදවොච: "ඉමෙ නු ඛො භන්තෙ, පඤ්චුපාදානක්ඛන්ධා, සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධොති" "ඉමෙ ඛො භික්ඛු, පඤ්චුපාදානක්ඛන්ධා, සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සංඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධොති.

සාධු භන්තෙති ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා භගවන්තං උත්තරිං පඤ්හං ආපුච්ඡි. "ඉමෙ ඛො පන භන්තෙ, පඤ්චුපාදානක්ඛන්ධා කිම්මූලකාති?" "ඉමෙ ඛො භික්ඛු, පඤ්චුපාදානක්ඛන්ධා ඡන්දමූලකා"ති. "සාධු භන්තෙ"ති ඛො සො භික්ඛු

මෙබඳු දෘෂ්ටි ඇත්තේත් නො වෙයි. ''ඒ මම ආත්මයෙමි, ඒ මම ලෝකයෙමි, ඒ මම පරලොව වන්නෙමි, නිත්‍යයෙමි, ධ්‍රැවයෙමි, ශාශ්වතයෙමි, නො පෙරළෙනසුලු වෙමි''යි. මෙබඳු දෘෂ්ටි ඇත්තේත් නො වෙයි. ''ඉදින් මම නො වන්නෙම් නම් මට (පිරිකර ද) නො වන්නේ ය. (මම) මතු නො වන්නෙම් නම් මතු ද මට (පිරිකර) නො වන්නේ ය''යි. මෙබඳු දෘෂ්ටි ඇත්තේත් නො වෙයි. වැලි දු සැක කරනසුලු වූයේ විචිකිච්ඡා ඇත්තේ සදහම්හි නිමාවට නො ගියේ වෙයි. මහණෙනි, යම් ඒ සැක කරන සුලු බවෙක් විචිකිච්ඡා ඇති බවෙක් සදහම්හි නිමාවට නො ගිය බවෙක් වේ නම් එය සංස්කාර යි. ඒ සංස්කාර කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද යත්: මහණෙනි, අවිදු සම්ඵස්සයෙන් හටගත්, වේදනායෙන් පහස්නා ලද අශ්‍රැතවත් පෘථග්ජනහට තෘෂ්ණාව උපදී. ඒ සංස්කාර එයින් හටගත්තේ ය. මහණෙනි, මෙසේ ඒ සංස්කාරත් අනිත්‍ය ය, සංඛත ය, පටිච්චසමුප්පන්න ය. ඒ තෘෂ්ණාත් අනිත්‍ය ය, සංඛත ය, පටිච්චසමුප්පන්න ය. ඒ වේදනාත් අනිත්‍ය ය, සංඛත, පටිච්චසමුප්පන්න ය. ඒ ස්පර්ශත් අනිත්‍ය ය, සංඛත ය, පටිච්චසමුප්පන්න ය. ඒ අවිද්‍යාත් අනිත්‍ය ය, සංඛත ය, පටිච්චසමුප්පන්න යි. මහණෙනි, මෙසේත් දන්නා මෙසේත් දක්නා මහණහට අර්හත්මාර්ගඥානයට අනන්තරව අර්හත්ඵලඥානය වේ යි.

## 1. 2. 3. 10.

## පුණ්ණමා සූත්‍රය

82. එක් සමයෙකැ, භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ පූර්වාරාම නම් මුවරමාපහයෙහි මහත් භික්ෂු සංඝයා සමඟ වැඩවසන සේක. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ එදින උපෝසථය වූ පසළොස්වක් දිනයෙහි (මාස ආදිය පිරුණු බැවින්) පූර්ණ වූ පුන් සඳ යුත් රැයෙහි ''භික්ෂූන් විසින් පිරිවරන ලද්දාහු අබවස වැඩහුන් සේක් වෙති.

එකල්හි එක්තරා මහණෙක් හුනස්නෙන් නැඟිට උතුරුසඟ එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ ය: ''වහන්ස, ඉදින් මට භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නයක් පිළිවිසීමට අවකාශ දෙන සේක් නම් මම භාග්‍යවතුන් වහන්සේගෙන් කිසි දෙයක් (කරුණක්) විචාරන්නෙමි''යි. මහණ, එසේ වී නම් තෙපි සිය අසුන්හි හිඳ යමක් කැමැත්තහු විචාරව''යි.

ඒ මහණ ''වහන්ස, එසේ ය''යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දී සිය අසුන්හි හිඳ භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ ය; ''වහන්ස, මොහු පඤ්චොපාදනස්කන්ධයෝ යැ ඔහු කවරහ යත්: රූපෝපාදනස්කන්ධ ය. වෙදනෝපාදනස්කන්ධ ය, සංඥෝපාදනස්කන්ධ ය, සංස්කාරෝපාදනස්කන්ධ ය විඥානෝපාදනස්කන්ධ යි, මහණ, මොහු ම පඤ්චොපාදනස්කන්ධයෝ ය. ඔහු කවරහ යත්, රූපෝපාදනස්කන්ධ ය, වෙදනෝපාදනස්කන්ධ ය, සංඥෝපාදනස්කන්ධ ය, සංස්කාරෝපාදනස්කන්ධ ය, විඥානෝපාදනස්කන්ධ' යි

ඒ මහණ ''වහන්ස, මැනැවැ''යි භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගෙන අනුමෝදන් වැ භාග්‍යවතුන් වහන්සේගෙන් මතුයෙහි පැනයක් විචාළේ ය: ''වහන්ස, මේ පඤ්චෝපාදනස්කන්ධයෝ කුමක් මුල් කොට ඇත්තාහු ද''යි. මහණ, මේ පඤ්චොපාදනස්කන්ධයෝ තෘෂ්ණාඡන්දය මුල් කොට ඇතියහ යි. ඒ මහණ. ''වහන්ස මැනැවැ''යි

භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා භගවන්තං උත්තරිං පඤ්හං ආපුච්ඡි: "තඤ්ඤෙව නු ඛො භන්තෙ, උපාදානං තෙ පඤ්චුපාදානක්ඛන්ධා උදාහු අඤ්ඤත්‍ර පඤ්චුපාදානක්ඛන්ධෙහි[1] උපාදානන්ති?" "න ඛො භික්ඛු, තඤ්ඤෙව උපාදානං තෙ පඤ්චුපාදානක්ඛන්ධා, නා'පි අඤ්ඤත්‍ර පඤ්චුපාදානක්ඛන්ධෙහි[1] උපාදානං, අපි ච යො තත්‍ර ඡන්දරාගො තං තත්‍ර උපාදානන්ති."

සාධු භන්තෙති, ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා භගවන්තං උත්තරිං පඤ්හං ආපුච්ඡි: "සියා පන භන්තෙ, පඤ්චුපාදානක්ඛන්ධෙසු ඡන්දරාගවෙමත්තතාති? "සියා භික්ඛූති" භගවා අවොච. "ඉධ භික්ඛු එකච්චස්ස එවං හොති: එවංරූපො සියං අනාගතමද්ධානං, එවංවෙදනො සියං අනාගතමද්ධානං, එවංසඤ්ඤො සියං අනාගතමද්ධානං, එවං සඞ්ඛාරො සියං අනාගතමද්ධානං, එවං විඤ්ඤාණො සියං අනාගතමද්ධානන්ති. එවං ඛො භික්ඛු සියා පඤ්චුපාදානක්ඛන්ධෙසු ඡන්දරාගවෙමත්තතාති.

"සාධු භන්තෙති" ඛො[2] සො භික්ඛු -පෙ- උත්තරිං පඤ්හං ආපුච්ඡි. "කිත්තාවතා නු ඛො භන්තෙ, ඛන්ධානං ඛන්ධාධිවචන"න්ති? යං කිඤ්චි භික්ඛු රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා අයං වුච්චති රූපක්ඛන්ධො. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා අයං වුච්චති විඤ්ඤාණක්ඛන්ධො. එත්තාවතා ඛො භික්ඛු, ඛන්ධානං ඛන්ධාධිවචනන්ති".

"සාධු භන්තෙති" ඛො සො භික්ඛු -පෙ- උත්තරිං පඤ්හං ආපුච්ඡි. "කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො රූපක්ඛන්ධස්ස පඤ්ඤාපනාය? කො හෙතු කො පච්චයො වෙදනාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය? කො හෙතු කො පච්චයො සඤ්ඤාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය? කො හෙතු කො පච්චයො සඞ්ඛාරක්ඛන්ධස්ස පඤ්ඤාපනාය? කො හෙතු කො පච්චයො විඤ්ඤාණක්ඛන්ධස්ස පඤ්ඤාපනායා"ති? චත්තාරො ඛො භික්ඛු, මහාභූතා හෙතු චත්තාරො මහාභූතා පච්චයො රූපක්ඛන්ධස්ස පඤ්ඤාපනාය. ඵස්සො හෙතු ඵස්සො පච්චයො වෙදනාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය. ඵස්සො හෙතු ඵස්සො පච්චයො සඤ්ඤාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය. ඵස්සො හෙතු ඵස්සො පච්චයො සඞ්ඛාරක්ඛන්ධස්ස පඤ්ඤාපනාය. නාමරූපං හෙතු නාමරූපං පච්චයො විඤ්ඤාණක්ඛන්ධස්ස පඤ්ඤාපනායා"ති.

"සාධු භන්තෙ"ති ඛො සො භික්ඛු -පෙ- උත්තරිං පඤ්හං ආපුච්ඡි. "කථං නු ඛො භන්තෙ, සක්කායදිට්ඨි හොතීති? "ඉධ භික්ඛු, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති රූපවන්තං වා අත්තානං

1. පඤ්චහි උපාදානක්ඛන්ධෙහි - මජ්සං, සයා, සීමු.
2. ඛො ඉති ඌනං - කත්ථචි.

Free Distribution www.aathaapi.org

භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන අනුමෝදන් වැ භාග්‍යවතුන් වහන්සේ ගෙන් මතුයෙහි පැනයක් විචාළේ ය : ''වහන්ස, ඒ පඤ්චෝපාදනස්කන්ධ කෙතෙක් ඇද්ද උපාදනය එම වේ ද ? නැතහොත් උපාදනය පඤ්චෝපාදනස්කන්ධ හැර සිටුනේ ද යි? මහණ එම උපාදන ඒ පඤ්චෝපාදනස්කන්ධ නො වේ යි, උපාදනය පඤ්චෝපාදනස්කන්ධ හැර සිටුනේ ද නො වෙයි. වැලිදු එහි යම් ඡන්ද රාගයෙක් වේ නම් එය එහි උපාදන යි.

ඒ මහණ ''වහන්ස, මැනැවැ''යි භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන අනුමෝදන් කොට භාග්‍යවතුන් වහන්සේ අතින් මතුයෙහි පැනයක් විචාළේ ය : වහන්ස, පඤ්චෝපාදනසකන්ධයන්හි ඡන්දරාගනානාත්වයෙක් වන්නේ ද යි ? වන්නේ ය මහණ, යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. මහණ, මෙහි ඇතමකුට මෙසේ අදහසෙක් වෙයි : ''මතුකල මෙබඳු රූ ඇතියෙකිම් වෙමි, මතුකල මෙබඳු වේදනා ඇතියෙකිම් වෙමි, මතුකල මෙබඳු සංඥ ඇතියෙකිම් වෙමි. මතුකල මෙබඳු සංස්කාර ඇතියෙකිම් වෙමි. මතුකල මෙබඳු විඥන ඇතියෙකිම් වෙමි යි. මහණ, මෙසේ පඤ්චෝපාදනස්කන්ධයන්හි ඡන්දරාගනානාත්වයෙක් වේ යි.

''වහන්ස, මැනැවැ''යි ඒ මහණ මතුයෙහි පැනයක් විචාළේ ය. වහන්ස, ස්කන්ධයනට ස්කන්ධ ප්‍රඥප්තිය කෙතෙකින් වේ ද යි ? මහණ, අතීත වේවයි අනාගත වේවයි ප්‍රත්‍යුපන්න වේවයි ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේ වයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් කිසි රූපයෙක් ඇත් ද, දුර වේවයි ළඟැ වේවයි යම් රූපයකුත් ඇත්ද, මෙ රූපස්කන්ධ ය යි කියනු ලැබෙයි, යම් කිසි වේදනාවක් . . . යම්කිසි සංඥවක් . . . යම්කිසි සංස්කාර කෙනෙක්. . . අතීත වේවයි අනාගත වේවයි ප්‍රත්‍යුත්පන්න වේවයි ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම්කිසි විඥනයෙක් ඇත් ද, දුර වේවයි ළඟ වේවයි යම් විඥනයෙකුත් ඇත් ද, මේ විඥනස්කන්ධ ය යි කියනු ලැබේ. මහණ ස්කන්ධයන්ට ස්කන්ධප්‍රඥප්තිය මෙතෙකින් වේ යි.

''වහන්ස, මැනැවැ''යි ඒ මහණ . . . මතුයෙහි පැනයක් විචාළේ ය : වහන්ස, රූපස්කන්ධ ප්‍රඥප්තියට හේතු කවරේ ද, ප්‍රත්‍යය කවරේ ද ? වේදනාස්කන්ධ ප්‍රඥප්තියට හේතු කවරේ ද ? ප්‍රත්‍යය කවරේ ද, සංඥස්කන්ධ ප්‍රඥප්තියට හේතු කවරේ ද ? ප්‍රත්‍යය කවරේ ද ? සංස්කාරකස්කන්ධ ප්‍රඥප්තියට හේතුව කවරේ ද ? ප්‍රත්‍යය කවරේ ද ? විඥනස්කන්ධ ප්‍රඥප්තියෙහි හේතු කවරේ ද ? ප්‍රත්‍යය කවරේ ද යි ? මහණ, රූපස්කන්ධ යෙහි ප්‍රඥප්තියට සතර මහාභූතයෝ හේතුහ, සතර මහාභූතයෝ ප්‍රත්‍යයහ. වේදනා ස්කන්ධ ප්‍රඥප්තියට ස්පර්ශය හේතු ය, ස්පර්ශය ප්‍රත්‍යය ය. ස්පර්ශඥස්කන්ධ ප්‍රඥප්තිය ස්පර්ශය හෙතු ය, ස්පර්ශය ප්‍රත්‍යය ය ; සංස්කාරස්කන්ධ ප්‍රඥප්තියට ස්පර්ශය හෙතු ය, ස්පර්ශය ප්‍රත්‍යය ය. විඥනස්කන්ධ ප්‍රඥප්තියට නාමරූප හේතු ය, නාමරූප ප්‍රත්‍යයයි.

ඒ මහණ ''වහන්ස, මැනැව'' යි. . . මතු පැනයක් විචාළේ ය ; වහන්ස, කෙසේ නම් සත්කායදෘෂ්ටි වේ දයි ? මහණ, මේ ලෝකයෙහි ආර්‍ය්‍යයන් නො දක්නාසුලු ආර්‍ය්‍ය ධර්මයෙහි අදක්ෂ ආර්‍ය්‍යධර්මයෙහි නො හික්මුණු සත්පුරුෂයන් නො දක්නාසුලු, සත්පුරුෂධර්මයෙහි අදක්ෂ සත්පුරුෂධර්මයෙහි නො හික්මුණු අශ්‍රැතවත් පෘථග්ජන

සමනුපස්සති අත්තනි වා රූපං සමනුපස්සති රූපස්මිං වා අත්තානං සමනුපස්සති. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති විඤ්ඤාණවන්තං වා අත්තානං සමනුපස්සති අත්තනි වා විඤ්ඤාණං සමනුපස්සති විඤ්ඤාණස්මිං වා අත්තානං සමනුපස්සති. එවං ඛො භික්ඛු, සක්කායදිට්ඨි හොතී''ති.

''සාධු භන්තෙ''ති, ඛො සො භික්ඛු -පෙ- උත්තරිං පඤ්හං අපුච්ඡි. ''කථං පන භන්තෙ, සක්කායදිට්ඨි න හොතී''ති? ''ඉධ භික්ඛු සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො, න රූපං අත්තතො සමනුපස්සති න රූපවන්තං වා අත්තානං සමනුපස්සති න අත්තනි වා රූපං සමනුපස්සති න රූපස්මිං වා අත්තානං සමනුපස්සති. න වෙදනං -පෙ- න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති න විඤ්ඤාණවන්තං වා අත්තානං සමනුපස්සති න අත්තනි වා විඤ්ඤාණං සමනුපස්සති න විඤ්ඤාණස්මිං වා අත්තානං සමනුපස්සති, එවං ඛො භික්ඛු සක්කායදිට්ඨි න හොතීති.

''සාධු භන්තෙ''ති, ඛො සො භික්ඛු -පෙ- උත්තරිං පඤ්හං අපුච්ඡි: ''කො නු ඛො භන්තෙ, රූපස්ස අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං, කො වෙදනාය -පෙ- කො සඤ්ඤාය -පෙ- කො සඞ්ඛාරානං -පෙ- කො විඤ්ඤාණස්ස අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණන්ති''?

''යං ඛො භික්ඛු, රූපං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං රූපස්ස අස්සාදො. යං රූපං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං, අයං රූපස්ස ආදීනවො. යො රූපස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං රූපස්ස නිස්සරණං යං වෙදනං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං වෙදනාය අස්සාදො. යා වෙදනා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා අයං වෙදනාය ආදීනවො. යො වෙදනාය ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං වෙදනාය නිස්සරණං, යං සඤ්ඤං පටිච්ච -පෙ- යෙ සඞ්ඛාරෙ පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං සඞ්ඛාරානං අස්සාදො. යෙ සඞ්ඛාරා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මා, අයං සඞ්ඛාරානං ආදීනවො. යො සඞ්ඛාරෙසු ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං සඞ්ඛාරානං නිස්සරණං, යං විඤ්ඤාණං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං විඤ්ඤාණස්ස අස්සාදො, යං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං අයං විඤ්ඤාණස්ස ආදීනවො, යො විඤ්ඤාණස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං විඤ්ඤාණස්ස නිස්සරණ''න්ති.

''සාධු භන්තෙ''ති, ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා භගවන්තං උත්තරිං පඤ්හං අපුච්ඡි: ''කථං නු ඛො භන්තෙ, ජානතො කථං පස්සතො ඉමස්මිං ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිංකාරමමිංකාරමානානුසයා න හොන්තී''ති? යං කිඤ්චි භික්ඛු රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං

තෙමේ රූපය ආත්ම වශයෙන් නුනුවණින් දකියි, ආත්මය රූපවත් කොට හෝ දකියි. රූපය ආත්මයෙහි පිහිටියේ ය යි හෝ දකියි ආත්මය රූපයෙහි පිහිටියේ ය යි හෝ දකී. වේදනාව . . . සංඥව. . . සංස්කාර. . . විඥනය ආත්ම වශයෙන් දකියි, ආත්මය විඥනවත් කොට හෝ දකියි. විඥනය ආත්මයෙහි පිහිටියේ ය යි හෝ දකියි. ආත්මය විඥනයෙහි පිහිටියේ ය යි හෝ දකී. මහණ, මෙසේ සත්කායදෘෂ්ටි වෙයි.

ඒ මහණ ''වහන්ස' මැනැවැ''යි මතුයෙහි පැනයක් විචාළේ ය : වහන්ස කෙසේ නම් සත්කායදෘෂ්ටිය නො වේ ද යි ? මහණ, මේ ලෝකයෙහි ආර්‍යයන් දක්නාසුලු ආර්‍ය ධර්මයෙහි දක්ෂ ආර්‍යධර්මයෙහි හික්මුණු, සත්පුරුෂයන් දක්නාසුලු, සත්පුරුෂධර්ම යෙහි දක්ෂ සත්පුරුෂ ධර්මයෙහි හික්මුණු ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙමේ රූපය ආත්ම වශයෙන් නො දකියි, ආත්මය රූපවත් කොට හෝ නො දකියි, ආත්මයෙහි රූපය පවතී ය යි හෝ නො දකියි. රූපයෙහි ආත්මය පවතී ය යි හෝ නො දකී. වේදනාව. . . නො දකී. . . සංඥව. . . නො දකී. . . සංස්කාර. . . නො දකී. විඥනය ආත්ම වශයෙන් නො දකියි, ආත්මය විඥනවත් කොට නො දකියි, ආත්මයෙහි විඥනය පවතී ය යි හෝ නො දකියි, විඥනයෙහි ආත්මය පවතී ය යි හෝ නො දකී. මහණ, මෙසේ සත්කායදෘෂ්ටි නො වේ යි.

''වහන්ස, මැනවැ''යි ඒ මහණ . . . මතුයෙහි පැනයක් විචාළේ ය : වහන්ස, රූපයෙහි ආස්වාද කවරේ ද ? ආදීනව කිමෙක් ද ? නිස්සරණ කිමෙක් ද ? වේදනා යෙහි. . . සංඥයෙහි. . . සංස්කාරයන්ගේ. . . විඥනයෙහි ආස්වාද කවරේ ද ? ආදීනව කවරේ ද ? නිස්සරණ කවරේ ද ? යි

මහණ, රූපය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මේ රූපයෙහි ආස්වාද යි. යම් රූපයෙක් අනිත්‍ය ද, දුක් ද, වෙනස් වනසුලු ද, මේ රූපයෙහි ආදීනව යි. රූපයෙහි යම් ඡන්දරාගවිනයෙක් ඡන්දරාගප්‍රහාණයෙක් වේ නම් මේ රූපයෙහි නිස්සරණ යි. වේදනාව නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මේ වේදනායෙහි ආස්වාද යි. යම් වේදනාවක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් මේ වේදනායෙහි ආදීනව යි. වෙදනායෙහි යම් ඡන්දරාගවිනයෙක් ඡන්දරාගප්‍රහාණයෙක් වේ ද මේ වෙදනායෙහි නිස්සරණ යි. සංඥව නිසා යම්. . . සංස්කාර නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මෙ සංස්කාරයන්ගේ ආස්වාද යි. යම් සංස්කාර කෙනෙක් අනිත්‍ය ද, දුක් ද, වෙනස් වන සැහැවි ඇත් ද මේ සංස්කාරයන්ගේ ආදීනව යි. සංස්කාරයන්හි යම් ඡන්දරාගවිනයයෙක් ඡන්දරාග ප්‍රහාණයෙක් ඇත් ද මේ සංස්කාරයන්ගේ නිස්සරණ යි. විඥනය නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද, මේ විඥනයාගේ ආස්වාද යි. යම් විඥනයෙක් අනිත්‍ය ද, දුක් ද, වෙනස් වන සැහැවි ඇත් ද, මේ විඥනයාගේ ආදීනව යි විඥනයෙහි යම් ඡන්දරාගවිනයයෙක් ඡන්දරාගප්‍රහාණයෙක් ඇත් ද මේ විඥනයාගේ නිස්සරණ යි.

''වහන්ස, මැනැවැ''යි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය පිළිගෙන අනුමෝදන් වැ භාග්‍යවතුන් වහන්සේගෙන් මතුයෙහි පැනයක් විචාළේ ය : ''වහන්ස, කෙසේ දන්නහුට කෙසේ දක්නහුට මේ විඥන සහිත කයෙහි ද, බැහැර සියලු නිමිත්තයන්හි ද, අහංකාර මමංකාර මානානුසය ධර්මයෝ නො වෙද්ද''යි ? මහණ, අතීත වේවයි අනාගත වේවයි පච්චුප්පන්න වේවයි ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් කිසි රූපයෙක් වේ ද, දුර වේවයි ළඟ වේවයි යම් රූපයෙකුත් වේ ද, ඒ සියලු රූපය ''තෙල මාගේ නො වේ''යි, තෙල මම නො වෙමි,

“නෙතං මම නෙසො'හමස්මි න මෙසො අත්තා”ති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති, යා කාචි වේදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගත පච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං නෙතං මම නෙසො'හමස්මි න මෙ'සො අත්තා”ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති, එවං ඛො භික්ඛු, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාරමමිඞ්කාර මානානුසයා න හොන්තීති.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො එවං චෙතසො පරිවිතක්කො උදපාදි: “ඉති කිර භො රූපං අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා. අනත්තකතානි කම්මානි කථමත්තානං ඵුසිස්සන්තීති.

අථ ඛො භගවා තස්ස භික්ඛුනො චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය භික්ඛූ ආමන්තෙසි: “ඨානං ඛො පනෙතං භික්ඛවෙ, විජ්ජති[1] යං ඉධෙකච්චො මොඝපුරිසො අවිද්වා අවිජ්ජාගතො තණ්හාධිගතෙන චෙතසා සත්ථුසාසනං අතිධාවිතබ්බං මඤ්ඤෙය්‍ය: “ඉති කිර භො රූපං අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා, අනත්තකතානි කම්මානි කථමත්තානං ඵුසිස්සන්තී”ති. පටිපුච්ඡාවිනීතා ඛො මෙ තුම්හෙ භික්ඛවෙ, තත්‍ර තත්‍ර තෙසු තෙසු ධම්මෙසු”.

“තං කිංමඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වා”ති? අනිච්චං භන්තෙ.

“යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා”ති? දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං: “එතං මම එසො'හමස්මි එසො මෙ අත්තා”ති? නො හෙතං භන්තෙ,

වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා”ති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ.
“යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං:

“එතං මම එසො'හමස්මි එසො මෙ අත්තා”ති? නො හෙතං භන්තෙ.

---

1. තණ්හාධිපතෙය්‍යෙන - මජසං, PTS.

Free Distribution www.aathaapi.org

තෙල මාගේ ආත්ම නො වෙති''යි මෙසේ මෙය ඇති සැටි මනානුවණින් දකී. යම් කිසි වේදනාවක් . . . යම් කිසි සංඥාවක් . . . යම් කිසි සංස්කාර කෙනෙක් . . . අතීත වේවයි අනාගත වේවයි පච්චුප්පන්න වේවයි ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් කිසි විඥානයෙක් ඇත් ද, දුර වේවයි ළඟ වේවයි යම් විඥානයෙකුත් ඇත් ද, ඒ සියලු විඥානය ''තෙල මාගේ නො වෙයි තෙල මම නො වෙමි. තෙල මාගේ ආත්ම නො වෙති''යි මෙසේ මෙය ඇති සැටි මනා නුවණින් දකී. මහණ, මෙසේ දන්නහුට මෙසේ දක්නහුට මේ සවිඤ්ඤාණක කයෙහිත් පිටත සියලු නිමිත්තයෙහිත් අහංකාර මමංකාර මානානුසය ධර්මයෝ නො වෙත් යි.

එ කල්හි එක්තරා මහණකුහට ''පින්වත්නි, මෙසේ වනාහි රූපය අනාත්ම ල, වේදනාව අනාත්ම ල, සංඥාව අනාත්ම ල, සංස්කාර අනාත්ම ල. විඥානය අනාත්ම ල, (එහෙයින්) අනාත්මක වූ කළ කර්මයෝ කෙසේ නම් ආත්මය ස්පර්ශ කෙරෙත් ද යි (තමා කරා පැමිණෙත් ද යි) මෙබඳු චිත්තපරිවිතර්කයෙක් පහළ විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහුගේ චිත්තපරිවිතර්කය තමන් වහන්සේගේ සිතින් පිරිසිඳ දැන භික්ෂූන් ඇමතූ සේක : මහණෙනි, මේ ලෝකයෙහි නුවණ නැති අවිද්‍යාවට පැමිණි ඇතැම් හිස් පුරුෂයෙක් '' පින්වත්නි, මෙසේ වනාහි රූපය අනාත්ම ල, වේදනාව අනාත්ම ල, සංඥාව අනාත්ම ල, සංස්කාර අනාත්ම ල, විඥානය අනාත්ම ල, අනාත්මක වූ කරන ලද කර්මයෝ කෙසේ ආත්මය ස්පර්ශ කෙරෙත් ද යි'' තෘෂ්ණායෙන් මඩනා ලද සිතින් බුදුසසුන ඉක් මැ යායුතු කොට හඟනේ ද (එහෙයින්) මහණෙනි, තෙපි ඒ ඒ තන්හි මාගේ ඒ ඒ දහම්හි පිළිවිසෑ හික්මුණාහු ය.

මහණෙනි, ඒ කෙසේ හඟිවූ ද රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ.

යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ ද ? වහන්ස, දුක් යැ.

යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැභැවි ඇත් නම් එය 'තෙල මා ගැත්තේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම ය'යි දක්නට නිසි වේ ද ? වහන්ස, තෙල නො වේ මැ යි.

වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ.

යම් දෑයෙක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ ද? වහන්ස, දුක් යැ.

යම් දෑයෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැභැවි ඇත් නම් එය, 'තෙල මා ගැත්තේ යැ, තෙල මම වෙමි, තෙලෙ මාගේ ආත්ම ය'යි දක්නට නිසි වේ ද? වහන්ස, තෙල නො වේ මැ යි.

14–ඒ 50066 (80/06)
Free Distribution www.aathaapi.org

තස්මාතිහ භික්ඛවෙ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං ''නෙතං මම නෙසො'හමස්මි න මෙ'සො අත්තා''ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං : 'නෙතං මම නෙසො'හමස්මි න මෙ සො අත්තා''ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති වෙදනායපි නිබ්බින්දති සඤ්ඤායපි, නිබ්බින්දති සඞ්ඛාරෙසුපි නිබ්බින්දති. විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති. විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති' ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති.''[1]

## ඛජ්ජනීයවග්ගො තතියො.

තස්සුද්දානං :

අස්සාදෙ ද්වෙ සමුදයා - අරහන්තෙහි අපරෙ දුවෙ
සීහො ඛජ්ජනී පිණ්ඩොල්‍යං පාරිලෙය්‍යෙන පුණ්ණමාති.[1]

1. ''ද්වෙ බන්ධා තසෙඤ්ඤච සීහං - අනිච්චනඤ්ච හෙතුනා,
සත්තා යෙන දුවෙ වුත්තා - අස්සාද විඤ්ඤාණකෙන ච,
එතෙ දසවිධා වුත්තා - හොන්ති භික්ඛු පුච්ඡායාති''ති.
දිස්සතෙයං ගාථා මජ්ඣං, ස්‍යා, PTS. පොත්ථකෙසු.

Free Distribution www.aathaapi.org

මහණෙනි, එහෙයින් අතීත–අනාගත–පච්චුප්පන්න වේවයි ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් කිසි රූපයෙක් වේ ද, දුරු වේවයි ළඟ වේවයි යම් රූපයෙකුත් වේ ද, ඒ සියලු රූපය 'තෙල මාගේ නො වේ යැ, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ යයි මෙසේ මෙය ඇති සැටි මනා නුවණින් දක්කයුතු. යම් කිසි වේදනාවක් ... සංඥවක් ... සංස්කාර කෙනෙක් ... අතීත–අනාගත–පච්චුප්පන්න වේවයි ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම්කිසි විඥනයෙක් වේ ද, දුරු වේවයි ළඟ වේවයි යම් විඥනයෙකුත් වේ ද, ඒ සියලු විඥනය 'තෙල මාගේ නො වේ යැ, තෙලෙ මම නො වෙමි, තෙලෙ මාගේ ආත්මය නො වේ ය යි මෙසේ මෙය ඇති සැටි මනානුවණින් දක්කයුතු.

මහණෙනි මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපයෙහිත් කලකිරෙයි, වේදනායෙහිත් කලකිරෙයි, සංඥවෙහිත් කලකිරෙයි, සංස්කාර කෙරෙහිත් කලකිරෙයි, විඥනයෙහිත් කලකිරෙයි කලකිරෙන්නේ නො ඇලෙයි, විරාගහේතුයෙන් මිදෙයි. මිදුණු කල්හි මිදිණැ යි දැනුම වෙයි. ජාතිය ගෙවිණ, මග බඹසර වැස නිමවන ලද, කරණී කරන ලද, මේ රහත්බව පිණිස කළමනා අන්කිසෙක් නැතැ යි දැනගනියි.

තෙවැනි ඛජ්ජනීය වර්ග යි

එහි උද්දානය

අස්සාද සූත්‍රය, සමුදය සූත්‍ර දෙකය, අනෙක් අරහන්ත සූත්‍ර දෙක ය, සීහෝපම සූත්‍ර ය, ඛජ්ජනීය සූත්‍ර ය, පිණ්ඩෝල්‍ය සූත්‍ර ය, පාරිලෙය්‍ය සූත්‍ර ය පුණ්ණමා සූත්‍ර ය යි ඛජ්ජනීය වර්ගයෙහි සූත්‍ර දසයෙකි.

# 4. ථෙරවග්ගො

## 1. 2. 4. 1.

### ආනන්ද සුත්තං

**83.**

එවං මෙ සුතං: එකං සමයං ආයස්මා ආනන්දො, සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො, ආයස්මා ආනන්දො භික්ඛූ ආමන්තෙසි: ‘ආවුසො භික්ඛවො’ති. ‘ආවුසො’ති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසුං, ආයස්මා ආනන්දො එතදවොච: පුණ්ණො නාම ආවුසො ආයස්මා මන්තානිපුත්තො අම්හාකං නවකානං සතං බහූපකාරො හොති. සො අම්හෙ ඉමිනා ඔවාදෙන ඔවදති:

උපාදාය ආවුසො ආනන්ද, ‘අස්මී’ති හොති, නො අනුපාදාය. කිඤ්ච උපාදාය ‘අස්මී’ති හොති නො අනුපාදාය: රූපං උපාදාය ‘අස්මී’ති හොති නො අනුපාදාය. වෙදනා-පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං උපාදාය ‘අස්මී’ති හොති නො අනුපාදාය. සෙය්‍යථාපි ආවුසො ආනන්ද, ඉත්ථි වා පුරිසො වා දහරො යුවා මණ්ඩනජාතිකො[1] ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො උපාදාය පස්සෙය්‍ය, නො අනුපාදාය. එවමෙව ඛො ආවුසො ආනන්ද, රූපං උපාදාය අස්මීති හොති, නො අනුපාදාය, වෙදනං-පෙ-සඤ්ඤං-පෙ-සඞ්ඛාරෙ-පෙ-විඤ්ඤාණං උපාදාය ‘අස්මී’ති හොති, නො අනුපාදාය.

තං කිං මඤ්ඤසි ආවුසො ආනන්ද, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං ආවුසො. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං ආවුසො. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං “එතං මම, එසො’හමස්මි, එසො මෙ අත්තා”ති? නො හෙතං ආවුසො.

වෙදනා – පෙ – සඤ්ඤා – පෙ – සඞ්ඛාරා – පෙ – විඤ්ඤාණං නිච්චං වා, අනිච්චං වාති? අනිච්චං ආවුසො. යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං ආවුසො. යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තාති? නො හෙතං ආවුසො.

---

1. මණ්ඩනජාතියො – සී.මු.

# 4. ථෙර වර්ගය

## 1. 2. 4. 1.

## ආනන්ද සූත්‍රය

83. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමහි වැඩවෙසෙති. එහි දී ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ '' ඇවැත්නි, මහණෙනි '' යි භික්ෂූන් ඇමතූහ. ඒ භික්ෂූහු '' ඇවැත්නි'යි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට පිළිවදන් ඇස්වූහ. '' ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මෙය විදළහ : ඇවැත්නි, මන්තානිපුත්‍ර ආයුෂ්මත් පූර්ණ නම් තෙරණුවෝ නවක වූ ම අපට බොහෝ උපකාර වෙති. උන් වහන්සේ මේ අවවාදයෙන් අපට අවවාද කෙරෙති :

'' ඇවැත්නි, ආනන්දයෙනි (මම) වෙමි ''යි (හැඟීම තෘෂ්ණා දෘෂ්ටි මාන ප්‍රපඤ්ච තුන) නිසා වේ යි. නො නිසා නො වේ. කුමක් නිසා (මම) වෙමි ''යි වේ යැ නො නිසා නො වේ යැ යත් : රූපය නිසා (මම) වෙමියි වෙයි, නො නිසා නො වෙයි, වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය නිසා වෙමි ''යි වෙයි, නො නිසා නො වේ. ඇවැත්නි, ආනන්දයෙනි, යම්සේ සැරසෙනසුලු යොවුන් තරුණ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ සුපිරිසිදු පැහැපත් කැඩපතෙක හෝ පහන් දියබඳුනෙක හෝ සිය මුවනිමිත්ත බලන්නේ නිසා දක්නේ වේ ද, නො නිසා නො දක්නේ වේ ද, ඇවැත්නි, ආනන්දයෙනි, එ සෙයින් ම රූපය නිසා වෙමි ''යි වෙයි, නො නිසා නො වෙයි, වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය නිසා '' වෙමි ''යි වෙයි, නො නිසා නො වේ.

ඇවැත්නි ආනන්දයෙනි, ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද ? ඇවැත්නි, අනිත්‍ය යැ. යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ දැ යි ? ඇවැත්නි, දුක් යැ. යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි ඇත් නම් එය තෙල මාගේ යැ තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යි දක්නට යුතු ද? ඇවත්නි, තෙල යුතු නො වේ මැ යි.

වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද ? ඇවැත්නි, අනිත්‍ය යැ. යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද ? ඇවැත්නි දුක් යැ. යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරෙළෙන සැහැවි ඇත් නම් එය තෙල මාගේ යැ තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම යි දක්නට යුතු ද ? ඇවැත්නි, තෙල යුතු නො වේ මැ යි.

තස්මාතිහ ආවුසො, ආනන්ද, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති", එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති, එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං ආවුසො ආනන්ද, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති. විරාගා විමුච්චති - පෙ - නාපරං ඉත්ථත්තායාති පජානාතීති".

පුණ්ණො නාම ආවුසො, ආයස්මා මන්තානිපුත්තො අම්හාකං නවකානං සතං බහූපකාරො හොති, සො අම්හෙ ඉමිනා ඔවාදෙන ඔවදති. ඉදඤ්ච පන මෙ ආයස්මතො පුණ්ණස්ස මන්තානිපුත්තස්ස ධම්මදෙසනං සුත්වා ධම්මො අභිසමෙතොති.[1]

## 1. 2. 4. 2.

## තිස්ස සුත්තං

84. සාවත්ථියං:

තෙන ඛො පන සමයෙන ආයස්මා **තිස්සො** භගවතො පිතුච්ඡාපුත්තො සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙති; "අපි මෙ ආවුසො, මධුරකජාතො විය කායො දිසාපි මෙ න පක්ඛායන්ති[2]. ධම්මාපි මං නප්පටිභන්ති[3]. ථිනමිද්ධඤ්ච මෙ චිත්තං පරියාදාය තිට්ඨති. අනභිරතො ච බ්‍රහ්මචරියං චරාමි. හොති ච මෙ ධම්මෙසු විචිකිච්ඡා"ති".

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "ආයස්මා භන්තෙ, තිස්සො භගවතො පිතුච්ඡාපුත්තො සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙති: 'අපි මෙ ආවුසො, මධුරකජාතො විය කායො. දිසා'පි මෙ න පක්ඛායන්ති. ධම්මාපි මං නප්පටිභන්ති. ථිනමිද්ධඤ්ච මෙ චිත්තං පරියාදාය තිට්ඨති. අනභිරතො ච බ්‍රහ්මචරියං චරාමි. හොති ච මෙ ධම්මෙසු විචිකිච්ඡා.'"

---

1 අභිසමිතොති - මජ්ඣං, සයා.
2. පෙක්ඛායන්ති - මජ්ඣං, සයා.
3. න පටිභන්ති - මජ්ඣං.

ඇවැත්නි ආනන්දයෙනි, එහෙයින් අතීතානාගත පච්චුප්පන්න වූ ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් කිසි රූපයෙක් වේ ද, දුර වේවයි ළඟ වේවයි යම් රූපයෙකුත් වේ ද, ඒ සියලු රූපය මෙල මාගේ නො වෙයි, මෙල මම නො වෙමි. මෙල මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙල කතු සේ මනානුවණින් දක්කයුතු. යම් කිසි වේදනාවක් ... යම් කිසි සංඥවක් ... යම් කිසි සංස්කාර කෙනෙක් ... අතීතානාගත පච්චුප්පන්න වූ ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් කිසි විඥනයෙක් වේ ද, දුර වේවයි ළඟ වේවයි යම් විඥනයෙකුත් වේ ද, ඒ සියලු විඥනය මෙල මාගේ නො වෙයි, මෙල මම නො වෙමි, මෙල මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ මෙය කතු සේ මනානුවණින් දක්කයුතු.

ඇවැත්නි, ආනන්දයෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපයෙහිත් කලකිරෙයි, වේදනායෙහිත් කලකිරෙයි, සංඥයෙහිත් කලකිරෙයි, සංස්කාරයන්හිත් කලකිරෙයි. විඥනයෙහිත් කලකිරෙයි. කලකිරෙනුයේ නො ඇලෙයි. නො ඇලීම හේතුයෙන් මිදෙයි. ... මේ රහත් බව පිණිස අනෙකෙක් නැත යි දනගනි''යි.

ඇවැත්නි, මන්තානිපුත්‍ර ආයුෂ්මත් පුණ්ණ නම් තෙරණුවෝ නවක වූ ම අපට බොහෝ උපකාර ඇත්තෝ වෙති. උන් වහන්සේ මේ අවවාදයෙන් අපට අවවාද දෙති. මන්තානිපුත්‍ර ආයුෂ්මත් පුණ්ණ තෙරණුවන්ගේ මේ දහම් දෙසුම අසා මාවිසින් දහම් අවබෝධ කරන ලද්දේ යි. (සොතාපන්න වීමි යන අදහසි)

## 1. 2. 4. 2.

## තිස්ස සූත්‍රය

84. සැවැත්නුවර :

එ කල්හි භාග්‍යවතුන් වහන්සේගේ නැන්දණියගේ (පියාගේ සහොදරියගේ) පුත් ආයුෂ්මත් තිස්ස තෙරණුවෝ බොහෝ භික්ෂූන්ට මෙසේ කියති : ''ඇවැත්නි, මාගේ කයත් හටගත් බර ඇත්තක් මෙනි. (අකර්මණ්‍ය ය.) දිශාවෝ ද මට නො පැහැදිලියහ. දහම්හු (පර්‍ය්‍යාප්තිධර්මයෝ) ද මට නො වැටහෙත්. ථීනමිද්ධයත් මා සිත මැඩගෙන සිටියි. නො ඇලුණෙම් ම බඹසර හැසිරෙමි. දහම්හි මට විචිකිච්ඡාවත් වේ''යයි.

එ කල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ : වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ නැන්දණිය පුත් ආයුෂ්මත් තිස්ස තෙරණුවෝ බොහෝ භික්ෂූන්ට මෙසේ ආරොචනා කෙරෙති : ''ඇවැත්නි, මාගේ කයත් හටගත්බර ඇත්තක් මෙනි, දිශාවෝත් මට නො පැහැදිලියහ. දහම්හුත් මට නො වැට හෙත්. ථීනමිද්ධයත් මාගේ සිත මැඩ ගෙන සිටියි, නො ඇලුණෙම් බඹසර සරමි. දහම්හි මට විචිකිච්ඡාවත් වේ ය'' කියා යි.

අථ ඛො භගවා අඤ්ඤතරං භික්ඛුං ආමන්තෙසි· එහි ත්වං භික්ඛු, මම වචනෙන තිස්සං භික්ඛුං ආමන්තෙහි: "සත්ථා තං ආවුසො තිස්ස ආමන්තෙතී"ති. එවං භන්තෙති, ඛො සො භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා තිස්සො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං තිස්සං එතදවොච: "සත්ථා තං ආවුසො තිස්ස ආමන්තෙතී"ති. "එවමාවුසො"ති ඛො ආයස්මා තිස්සො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං තිස්සං භගවා එතදවොච:

සච්චං කිර ත්වං තිස්ස, සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙසි: අපි මෙ ආවුසො මධුරකජාතො විය කායො දිසාපි මෙ න පක්ඛායන්ති. ධම්මාපි මං නප්පටිභන්ති. ථිනමිද්ධඤ්ච මෙ චිත්තං පරියාදාය තිට්ඨති. අනභිරතො ච බ්‍රහ්මචරියං චරාමි. හොති ච මෙ ධම්මෙසු විචිකිච්ඡාති? එවං භන්තෙ,

තං කිං මඤ්ඤසි තිස්ස, රූපෙ අවිගතරාගස්ස අවිගතඡන්දස්ස අවිගතපෙමස්ස අවිගතපිපාසස්ස අවිගතපරිළාහස්ස අවිගතතණ්හස්ස තස්ස රූපස්ස විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛ-දොමනස්සුපායාසාති? එවම්භන්තෙ. සාධු සාධු තිස්ස, එවං හෙතං තිස්ස, හොති යථා තං රූපෙ අවිගතරාගස්ස.

වෙදනාය අවිගතරාගස්ස -පෙ- අවිගතතණ්හස්ස තස්සා වෙදනාය විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති? එවං භන්තෙ, සාධු සාධු තිස්ස, එවං හෙතං තිස්ස, හොති යථා තං වෙදනාය අවිගතරාගස්ස

සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු අවිගතරාගස්ස -පෙ- අවිගතතණ්හස්ස තෙසං සඞ්ඛාරානං විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසාති? එවං භන්තෙ, සාධු සාධු තිස්ස, එවං හෙතං තිස්ස, හොති යථා තං සඞ්ඛාරෙසු අවිගතරාගස්ස.

විඤ්ඤාණෙ අවිගතරාගස්ස අවිගතඡන්දස්ස අවිගතපෙමස්ස අවිගතපිපාසස්ස අවිගතපරිළාහස්ස අවිගතතණ්හස්ස තස්ස විඤ්ඤාණස්ස විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති? එවං භන්තෙ. සාධු සාධු තිස්ස, එවං හෙතං තිස්ස, හොති යථා තං විඤ්ඤාණෙ අවිගතරාගස්ස.

තං කිං මඤ්ඤසි තිස්ස, රූපෙ විගතරාගස්ස විගතපෙමස්ස විගතපිපාසස්ස විගතපරිළාහස්ස විගතතණ්හස්ස තස්ස රූපස්ස විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති? නො හෙතං භන්තෙ, සාධු සාධු තිස්ස, එවං හෙතං තිස්ස, හොති: යථා තං රූපෙ විගතරාගස්ස·

එකල්හි භාග්‍යවතුන් වහන්සේ එක්තරා මහණකු ඇමතූ සේක : "මහණ, එව තොප මාගේ වචනයෙන් "ඇවැත්නි, තිස්සයෙනි, ශාස්තෘන් වහන්සේ තොප අමතන සේකැ"යි තිස්ස මහණහු අමතව"යි. වහන්ස, එසේ යයි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා ආයුෂ්මත් තිස්සයන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් තිස්සයනට "ඇවැත්නි, තිස්සයෙනි ශාස්තෘන් වහන්සේ තොප අමතන සේකැ"යි තෙල කී ය. ආයුෂ්මත් තිස්ස තෙරණුවෝ "ඇවැත්නි, එසේ ය"යි ඒ මහණහට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් තිස්ස තෙරණුවන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක :

තිස්ස, තෙපි බොහෝ භික්ෂූන්ට මෙසේ සැලකළහු යනු සැබෑ ද ? ඇවැත්නි, මාගේ කය හටගත් බර ඇත්තක් මෙනි, දිශා ද මට නො පැහැදිළි යැ, දහම්හු ද මට නො වටහත්, ථීනමිද්ධය ද මා සිත මැඩ ගෙන සිටියි. නො ඇලුණෙම් ම බඹසර හැසිරෙමි. දහම්හි මට විචිකිච්ඡා ද වෙයි කියා යි. වහන්ස, එසේ යැ.

තිස්ස, එ කිමෙකැ යි හඟිවු ද? රූපයෙහි පහ නො වූ රාග ඇති, පහ නො වූ ඡන්ද ඇති, පහ නො වූ ප්‍රේම ඇති, පහ නො වූ පිපාසා ඇති, පහ නො වූ පරිදාහ ඇති, පහ නො වූ තෘෂ්ණා ඇති පුහුල් එ රූපයාගේ විපරිණාම අන්‍යථාභාව (වෙනස්වීම්) හේතුයෙන් සෝක–පරිදේව–දුක්ඛ–දෞර්මනස්ස–උපායාසයෝ උපදිත් ද ? වහන්ස, එසේ යැ. මැනැවි මැනැවි තිස්ස. තිස්ස, රූපයෙහි අවිගතරාග පුද්ගලහට යම්සේ නම් තෙල එසේ මැ වෙයි.

වෙදනායෙහි පහ නො වූ රාග ඇති . . . පහ නො වූ තෘෂ්ණා ඇති පුහුල්හට ඒ වෙදනාවගේ විපරිණාමඅන්‍යථාභාව හේතුයෙන් සෝක–පරිදේව–දුක්ඛ–දෞර්මනස්ස–උපායාසයෝ උපදිද් ද ? වහන්ස, එසේ යැ. මැනැවි මැනවි, තිස්ස. තිස්ස, වෙදනායෙහි අවිගතරාග පුද්ගලහට යම්සේ නම් තෙල එසේ මැ වෙයි.

සංඥායෙහි . . . සංස්කාරයන්හි පහ නො වූ රාග ඇති . . . පහ නො වූ තෘෂ්ණා ඇති පුහුල්හට ඒ සංස්කාරයන්ගේ විපරිණාම අන්‍යථාභාව හේතුයෙන් සෝක–පරිදේව–දුක්ඛ–දෞර්මනස්ස–උපායාසයෝ උපදිත් ද ? වහන්ස, එසේ යැ. මැනවි මැනවි, තිස්ස. තිස්ස, සංස්කාර විෂයෙහි අවිගතරාග පුද්ගලහට යම්සේ නම් තෙල එසේ මැ වෙයි.

විඥානයෙහි පහ නො වූ රාග ඇති, පහ නො වූ ඡන්ද ඇති, පහ නො වූ ප්‍රේම ඇති, පහ නො වූ පිපාසා ඇති පහ නො වූ පරිදාහ ඇති, පහ නො වූ තෘෂ්ණා ඇති පුහුල්හට ඒ විඥානයාගේ විපරිණාම අන්‍යථාභාව හේතුයෙන් සෝක–පරිදේව–දුක්ඛ–දෞර්මනස්ස–උපායාසයෝ උපදිත් ද ? වහන්ස, එසේ යැ. මැනැවි මැනැවි, තිස්ස. තිස්ස, විඥානයෙහි අවිගතරාග පුද්ගලහට යම්සේ නම් තෙල එසේ මැ වෙයි.

තිස්ස, ඒ කිමැයි හඟි ද ? රූපයෙහි පහ වූ රාග ඇති පහ වූ ප්‍රේම ඇති පහ වූ පිපාසා ඇති පහ වූ පරිදාහ ඇති පහ වූ තෘෂ්ණා ඇති පුද්ගලහට ඒ රූපයාගේ වෙනස් වීමෙන් අන් අයුරු වීමෙන් සෝක–පරිදේව–දුක්ඛ–දෞර්මනස්ස–උපායාසයෝ උපදිද් ද ? වහන්ස, තෙල නො වේ මැයි. මැනැවි, මැනැවි. තිස්ස. තිස්ස, රූපයෙහි පහ වූ රාග ඇති පුහුල්හට යම්සේ නම් තෙල එසෙ මැ වෙයි.

වෙදනාය – පෙ – සඤ්ඤාය – පෙ – සඞ්ඛාරෙසු – පෙ – විඤ්ඤාණෙ විගතරාගස්ස විගතච්ඡන්දස්ස විගතපෙමස්ස විගතපිපාසස්ස විගතපරිළාහස්ස විගතතණ්හස්ස තස්ස විඤ්ඤාණස්ස විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාති? නො හෙතං භන්තෙ, "සාධු සාධු තිස්ස, එවං 'හෙතං තිස්ස, හොති යථා තං විඤ්ඤාණෙ විගතරාගස්ස.

තං කිං මඤ්ඤසි තිස්ස රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තාති? නො හෙතං භන්තෙ,

වෙදනා – පෙ – සඤ්ඤා – පෙ – සඞ්ඛාරා – පෙ – විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තංසමනුපස්සිතුං "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ,

"තස්මාතිහ තිස්ස, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යා කාචි වෙදනා – පෙ – යා කාචි සඤ්ඤා – පෙ – යෙ කෙචි සඞ්ඛාරා –පෙ– යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙ'සො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං තිස්ස, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති –පෙ– විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති –පෙ– නාපරං ඉත්ථත්තායාති පජානාති.

සෙය්‍යථාපි[1] තිස්ස, ද්වෙ පුරිසා, එකො පුරිසො අමග්ගකුසලො එකො පුරිසො මග්ගකුසලො, තමෙනං සො අමග්ගකුසලො පුරිසො අමුං මග්ගකුසලං පුරිසං මග්ගං පුච්ඡෙය්‍ය, සො එවං වදෙය්‍ය: "අම්භො පුරිස,[2] අයං මග්ගො. තෙන මුහුත්තං ගච්ඡ. තෙන මුහුත්තං

1. "සෙය්‍යථාපස්සු" – සීමු.
2. එහි භො පුරිස – මජසං, එවං භො පුරිස – ස්‍යා.

Free Distribution www.aathaapi.org

වේදනායෙහි . . . සංඥයෙහි . . . සංස්කාරයන්හි . . . විඥනයෙහි පහ වූ රාග ඇති පහ වූ ඡන්ද ඇති පහ වූ ප්‍රේම ඇති පහ වූ පිපාසා ඇති පහ වූ පරිදාහ ඇති පහ වූ තෘෂ්ණා ඇති පුහුල්හට ඒ විඥනයාගේ වෙනස් වීම් අන් පරිදි වීම් හේතුයෙන් ශෝක–පරිදේව–දුක්ඛ–දෞමනස්ස–උපායාසයෝ උපදිද් ද ? වහන්ස, මෙය නො වේ මැ යි. තිස්ස, මැනැවි, මැනැවි. තිස්ස, විඥනයෙහි පහ වූ රාග ඇති පුද්ගලහට යම්සේ නම් තෙල එසේ ම වෙයි.

තිස්ස, ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද ? සුව හෝ වේ ද ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි ඇත් නම් එය ''තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම''යි දක්නට නිසි ද ? වහන්ස, තෙල නො වේ මැ යි.

වේදනාව . . . සංඥව . . සංස්කාර . . . විඥනය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද ? සුව හෝ වේ ද ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි ඇත් නම් එය තෙල ''මා ගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම''යි දක්නට නිසි ද ? වහන්ස, තෙල නො වේ මැ යි.

තිස්ස, එහෙයින් අතීතානාගත පච්චුප්පන්න වූ ආධ්‍යාත්මික හෝ බාහිර හෝ ඖදරික හෝ සූක්ෂ්ම හෝ හීන හෝ ප්‍රණීත හෝ යම් කිසි රූපයෙක් ඇත් ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් රූපයෙකුත් ඇත් ද ඒ සියලු රූපය ''තෙල මාගේ නො වෙයි, තෙල මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ ය යි මෙසේ තෙල තතු සේ මනානුවණින් දක්කයුතු. යම් කිසි වේදනාවක් . . . යම් කිසි සංඥවක් . . . යම් කිසි සංස්කාර කෙනෙක් . . . අතීතානාගත පච්චුප්පන්න වූ ආධ්‍යාත්මික හෝ බාහිර හෝ ඖදරික හෝ සූක්ෂ්ම හෝ හීන හෝ ප්‍රණීත හෝ යම් කිසි විඥනයෙක් ඇත් ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් විඥනයෙකුත් ඇත් ද, ඒ සියලු විඥනය ''තෙල මාගේ නො වෙයි, තෙල මම නො වෙමි. තෙල මාගේ ආත්ම නො වේ ය''යි මෙසේ තෙල තතු සේ මනානුවණින් දක්කයුතු.

තිස්ස, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපයෙහි දු කලකිරෙයි . . . විඥනයෙහි දු කලකිරෙයි, කලකිරෙන්නේ නො ඇලෙයි . . . මේ රහත් බව පිණිස කළයුතු අන් කිසෙක් නැතැ යි දනගනී.

තිස්ස, යම්සේ පුරුෂයෝ දෙදෙනෙක් වෙද්ද, එක් පුරුෂයෙක් මාර්ගයෙහි අදක්ෂ යැ. එක් පුරුෂයෙක් මාර්ගයෙහි දක්ෂ යැ. ඒ මේ අමග්ගකුසල (මග නොදත්) පුරුෂ මේ මග්ගකුසල (මඟ දත්) පුරුෂයාගෙන් මඟ පුළුවුස්නේ ය. ඔහු මෙසේ කියන්නේ ය: භවත් පුරුෂය, මේ මඟ ය. එයින් මොහොතක් යා, එයින් මොහොතක් ගොස් දෙමං

ගන්ත්වා දක්ඛිස්සසි ද්විධා පථං. තත්‍ථ වාමං මුඤ්චිත්වා දක්ඛිණං ගණ්හාහි. තෙන මුහුත්තං ගච්ඡ, තෙන මුහුත්තා ගන්ත්වා දක්ඛිස්සසි තිබ්බං වනසණ්ඩං. තෙන මුහුත්තං ගච්ඡ. තෙන මුහුත්තං ගන්ත්වා දක්ඛිස්සසි මහන්තං නින්නං පල්ලලං, තෙන මුහුත්තං ගච්ඡ, තෙන මුහුත්තං ගන්ත්වා දක්ඛිස්සසි සොබ්භං පපාතං. තෙන මුහුත්තං ගච්ඡ. තෙන මුහුත්තං ගන්ත්වා දක්ඛිස්සසි සමං භූමිභාගං රමණීයං.

උපමා ඛොම්‍යායං තිස්ස, කතා අත්‍ථස්ස විඤ්ඤාපනාය. අයං චෙවෙත්‍ථ අත්‍ථො: පුරිසො අමග්ගකුසලොති ඛො තිස්ස, පුථුජ්ජනස්සෙතං අධිවචනං. 'පුරිසො මග්ගකුසලො'ති ඛො තිස්ස, තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්ස. 'ද්විධාපථො'ති[1] ඛො තිස්ස, විචිකිච්ඡායෙතං අධිවචනං. 'වාමො මග්ගො'ති ඛො තිස්ස, අට්ඨඞ්ගිකස්සෙතං මිච්ඡාමග්ගස්ස අධිවචනං සෙය්‍යථීදං: මිච්ඡාදිට්ඨියා මිච්ඡාසඞ්කප්පස්ස මිච්ඡාවාචාය මිච්ඡාකම්මන්තස්ස මිච්ඡාආජීවස්ස මිච්ඡාවායාමස්ස මිච්ඡාසතියා මිච්ඡාසමාධිස්ස. දක්ඛිණො මග්ගොති ඛො තිස්ස, අරියස්සෙතං අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස අධිවචනං, සෙය්‍යථීදං: සම්මාදිට්ඨියා සම්මාසඞ්කප්පස්ස සම්මාවාචාය සම්මාකම්මන්තස්ස සම්මාආජීවස්ස සම්මාවායාමස්ස සම්මාසතියා සම්මාසමාධිස්ස. 'තිබ්බො වනසණ්ඩො'ති ඛො තිස්ස, අවිජ්ජායෙතං අධිවචනං. 'මහන්තං නින්නං පල්ලල'න්ති ඛො තිස්ස, කාමානමෙතං අධිවචනං. 'සොබ්භො පපාතො'ති ඛො තිස්ස, කොධූපායාසස්සෙතං අධිවචනං. 'සමො භූමිභාගො රමණීයො'ති ඛො තිස්ස, නිබ්බානස්සෙතං අධිවචනං.

අභිරම තිස්ස, අභිරම තිස්ස, අහමොවාදෙන අහමනුග්ගහෙන අහමනුසාසනියාති, ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා තිස්සො භගවතො භාසිතං අභිනන්දීති.

## 1. 2. 4. 3.

## යමක සුත්තං

85. එවං මෙ සුතං, එකං සමයං ආයස්මා සාරිපුත්තො සාවත්‍ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.

තෙන ඛො පන සමයෙන යමකස්ස නාම භික්ඛුනො එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති තථාහං භගවතා ධම්මං, දෙසිතං ආජානාමි යථා ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා'ති.

අස්සොසුං ඛො සම්බහුලා භික්ඛූ යමකස්ස කිර නාම භික්ඛුනො එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා''ති.

1. ද්වෙධාපථොති - මජ්සං, ස්‍යා.

Free Distribution www.aathaapi.org

සන්ධියක් දක්නෙහි, එහි වම මුද දකුණු ගනු, එයින් මොහොතක් යා. එයින් මොහොතක් ගොස් ඝන වනලැහැබක් දක්නෙහි, එයින් මොහොතක් යා. එයින් මොහොතක් ගොස් මහත් වූ ගැඹුරු ප්‍රපාතයක් මඩවගුරක් දක්නෙහි. එයින් මොහොතක් යා. එයින් මොහොතක් ගොස් හෙබක් දක්නෙහි එයින් මොහොතක් යා. එයින් මොහොතක් ගොස් සිත්කලු සම භූමි භාගයක් දක්නෙහි.

තිස්ස, අරුත් හැඟවීම පිණිස මා විසින් මේ උපමාව කරන ලදි. මේ මෙහි අර්ථ යි. තිස්ස, 'අමාර්ගකුශල (මඟනොදත්) පුරුෂ යන තෙල පුහුදුන්හට නමෙකි. තිස්ස, 'මාර්ග කුශල' (මඟ දත්) පුරුෂ යනු තෙල අර්හත් සම්මාසම්බුද්ධ වූ තථාගතයන්ට නමෙකි. තිස්ස, 'දෙමංසන්ධිය' යන තෙල විචිකිච්ඡාවට නමෙකි. තිස්ස, 'වම් මඟ ය' යන තෙල අෂ්ටාංගික මිථ්‍යාමාර්ගයට නමෙකි. එනම් : මිච්ඡාදිට්ඨියට ය, මිච්ඡා සංකප්පයට ය, මිච්ඡාවචනයට ය, මිච්ඡාකම්මන්තයට ය, මිච්ඡාආජීවයට ය, මිච්ඡා වායාමයට ය, මිච්ඡාසතියට ය, මිච්ඡාසමාධියට යි. තිස්ස, 'දකුණු මඟ' යනු තෙල ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගයට නාමෙකි. එනම් : සම්මාදිට්ඨියට ය, සම්මාසංකප්පයට ය, සම්මාවාචාවට ය, සම්මාකම්මන්තයට ය, සම්මාආජීවයට ය, සම්මාවායාමයට ය, සම්මාසතියට ය, සම්මාසමාධියට යි. තිස්ස, 'ඝන වනලැහැබ' යනු තෙල අවිද්‍යාවට නමෙකි. තිස්සය 'මහත් ගැඹුරු මඩවගුර' යනු තෙල කාමයන්ට නමෙකි. තිස්ස, හෙබ ය (ප්‍රපාතය) යනු තෙල ක්‍රෝධ උපායාස දෙකට නමෙකි. තිස්ස, 'සිත්කලු සම භූමිභාගය' යනු තෙල නිවනට නමෙකි.

තිස්ස, (බඹසරෙහි) ඇලෙව. තිස්ස, ඇලෙව. මම අවවාදයෙන් (පිහිට වෙමි). මම අනුග්‍රහයෙන් (පිහිට වෙමි) මම අනුශාසනායෙන් (පිහිට වෙමි) යි භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් තිස්ස තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගත්හ යි.

## 1. 2. 4. 3.

## යමක සූත්‍රය

85. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සැවැත් නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවෙසෙති.

එසමයෙහි යමක නම් මහණහට යම්සේ ''රහත් මහණ කය බිඳීමෙන් සිඳේ ද, වැනසේ ද මරණින් මතු නො වේ ද, භාග්‍යවතුන් වහන්සේ විසින් එසෙයින් දෙසන ලද දහමක් මම දනිමි ''යි මෙබඳු ලාමක මිථ්‍යාදෘෂ්ටියක් උපන.

බොහෝ භික්ෂූහු යමක නම් මහණහට යම්සේ රහත් මහණ කාබුත් මරණින් සිඳේ ද වැනසේ ද මරණින් මතු නො වේ ද, භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ දෙසන ලද දහමක් මම දනිමි ''යි මෙබඳු ලාමක මිථ්‍යාදෘෂ්ටිගතයෙක් උපනැ යි ඇසූහ.

අථ ඛො තෙ භික්ඛූ යෙනායස්මා යමකො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා යමකෙන සද්ධිං සම්මොදිංසු සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ ආයස්මන්තං යමකං එතදවොචුං: “සච්චං කිර තෙ ආවුසො, යමක, එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං “තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා’’ති.

එවං ඛො’හං[1] ආවුසො භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා’ති.

මා ආවුසො, යමක එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං,[2] න හි භගවා එවං වදෙය්‍ය: “ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා’’ති.

එවම්පි ඛො ආයස්මා යමකො තෙහි භික්ඛූහි වුච්චමානො තථෙව තං පාපකං දිට්ඨිගතං ථාමසා පරාමස්ස[3] අභිනිවිස්ස වොහරති “තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණාති.’’

යතො ඛො තෙ භික්ඛූ නාසක්ඛිංසු ආයස්මන්තං යමකං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුං, අථ ඛො තෙ භික්ඛූ උට්ඨායාසනා යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං එතදවොචුං: යමකස්ස නාම ආවුසො සාරිපුත්ත, භික්ඛුනො එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: “තථා’හං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා’ති. සාධායස්මා සාරිපුත්තො යෙන යමකො භික්ඛු තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා’’ති. අධිවාසෙසි ඛො ආයස්මා සාරිපුත්තො තුණ්හීභාවෙන.

අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා යමකො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා යමකෙන සද්ධිං සම්මොදි සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං යමකං එතදවොච: සච්චං කිර තෙ ආවුසො යමක, එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං? තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා’’ති.

එවඤ්ච ඛොහං ආවුසො, භගවතා ධම්මං දෙසිතං ආජානාමි: “යථා ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා’’ති.

---

1. එවං ඛ්වාහං – සයා, මජසං
2. අබ්භාචික්ඛනං – මජසං.
3. පරාමාසා – මජසං.

එකල්හි ඒ භික්ෂූහු ආයුෂ්මත් යමක තෙරුන් වෙත එළැඹියහ. එළැඹ ආයුෂ්මත් යමක තෙරුන් සමඟ සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත් පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු ආයුෂ්මත් යමක තෙරුන්ට '' ඇවැත්නි, යමකයෙනි, '' රහත් මහණ යම්සේ කය බිඳීමෙන් සිඳේ ද, වැනසේ ද, මරණින් මතු නො වේ ද, එපරිදි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද දහමක් මම දනිමි ''යි මෙබඳු ලාමක මිථ්‍යාදෘෂ්ටි ගතයෙක් තොපට උපන්නේ සැබෑ ද ? යි කීහ.

ඇවැත්නි, යම්සේ රහත් මහණ කය බිඳීමෙන් සිඳේ ද, වැනසේ ද මරණින් මතු නො වේ ද, එසේ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද දහමක් මම දනිමි ''යි.

ඇවැත්නි, යමකයෙනි තහමක් මෙසේ කියවු. භාග්‍යවතුන් වහන්සේට නහමක් අභූතයෙන් චෝදනා කරවු. භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් චෝදනා කිරීම නො ම මැනැවි. '' රහත් මහණ කය බිඳීමෙන් සිඳෙයි, වැනසෙයි. මරණින් මතු නො වෙයි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නහමක් වදරන සේක යි.

ආයුෂ්මත් යමක තෙමේ ඒ භික්ෂූන් විසින් මෙසේ ද කියනු ලබන්නේ යම්සේ රහත් මහණ කය බිඳීමෙන් සිඳේ ද, වැනසේ ද, මරණින් මතු නො වේ ද, භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ දෙසන ලද දහමක් මම දනිමි ''යි යන ලාමක මිථ්‍යාදෘෂ්ටිය එසේ ම දෘෂ්ටි ස්ථාමයෙන්, දෘෂ්ටි පරාමර්ශයෙන් පිළිසගෙන වහරයි.

යම් කලෙක ඒ භික්ෂූහු ආයුෂ්මත් යමක තෙරුන් ඒ ලාමක මිථ්‍යාදෘෂ්ටියෙන් වෙන් කරන්නට නො හැකි වූවාහු ද, එ කල්හි ඒ භික්ෂූහු හුනස්නෙන් නැඟිට ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළැඹියහ. එළැඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙල සැලකළහ : ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, යමක නම් මහණහට යම්සේ රහත් මහණ කය බිඳීමෙන් සිඳේ ද, වැනසේ ද, මරණින් මතු නො වේ ද, භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ දෙසන ලද දහමක් මම දනිමි''යි මෙබඳු ලාමක මිථ්‍යාදෘෂ්ටියක් උපන. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අනුකම්පා පිණිස යමක මහණහු වෙත එළැඹෙත් නම් මැනැව යි. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ තුෂ්ණීම්භාවයෙන් ඉවසූහ.

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස් වේලෙහි පලසමවතින් නැඟී සිටියාහු ආයුෂ්මත් යමක තෙරුන් වෙත එළැඹියහ. එළැඹ ආයුෂ්මත් යමක තෙරුන් සමඟ සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙක වැඩ හුන්හ. එකත්පස් වැ වැඩහුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් යමක තෙරුනට මෙල වදළහ : ඇවැත්නි, යමකයෙනි, යම්සේ '' රහත් මහණ කය බිඳීමෙන් සිඳේ ද, වැනසේ ද, මරණින් මතු නො වේ ද, භාග්‍යවතුන්වහන්සේ විසින් එසේ දෙසන ලද දහමක් මම දනිමි ''යි මෙබඳු ලාමක මිථ්‍යාදෘෂ්ටි ගතයෙක් තොපට උපන්නේ සැබෑ දැයි ?

ඇවැත්නි, '' යම්සේ රහත් මහණ කය බිඳීමෙන් සිඳේ ද, වැනසේ ද මරණින් මතු නො වේ ද, භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ දෙසන ලද දහම මම දනිමි ''යි.

තං කිං මඤ්ඤසි? ආවුසො, යමක, “රූපං නිච්චං වා අනිච්චං වා”ති. අනිච්චං ආවුසො.

“යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා”ති? දුක්ඛං ආවුසො.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං “එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා”ති? නො හෙතං ආවුසො.

වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං ආවුසො,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං ආවුසො

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං “එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා”ති. නො හෙතං ආවුසො.

තස්මාතිහාවුසො යමක, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං “නෙතං මම නෙසොහමස්මි, න මෙ'සො අත්තා”ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං, යා කාචි වේදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං “නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා”ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං ආවුසො යමක, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාති.

තං කිං මඤ්ඤසි ආවුසො යමක, 'රූපං තථාගතො'ති සමනුපස්සසීති? නො හෙතං ආවුසො.

වේදනං -පෙ- සඤ්ඤං පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං තථාගතො'ති සමනුපස්සසීති? නො හෙතං ආවුසො.

තං කිං මඤ්ඤසි ආවුසො යමක, රූපස්මිං “තථාගතො'ති සමනුපස්සසීති? නො හෙතං ආවුසො.

අඤ්ඤත්‍ර රූපා තථාගතොති සමනුපස්සසී'ති? නො හෙතං ආවුසො.

වේදනාය -පෙ- අඤ්ඤත්‍ර වේදනාය -පෙ- සඤ්ඤාය -පෙ- අඤ්ඤත්‍ර සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- අඤ්ඤත්‍ර සඞ්ඛාරෙහි -පෙ- විඤ්ඤාණස්මිං තථාගතො'ති සමනුපස්සසීති? නො හෙතං ආවුසො.

අඤ්ඤත්‍ර විඤ්ඤාණා තථාගතො'ති සමනුපස්සසීති? නො හෙතං ආවුසො.

ඇවැත්නි, යමකයෙනි ඒ කිමැයි හඟිවු ද, රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ? ඇවැත්නි, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම්, එය දුක් හෝ සුව හෝ වේ ද? ඇවැත්නි දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි ඇත් නම් එය '' තෙල මාගේ යැ, තෙල මම වෙමි, තෙල මාගේ ආත්ම ය''යි දක්නට නිසි ද ? ඇවැත්නි, තෙල නිසි නො වේ ම යැ.

වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද ? ඇවැත්නි, අනිත්‍ය යැ.

යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ යි. ඇවැත්නි, දුක් යැ.

යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වන සුලු නම එය '' තෙල මාගේ යැ, තෙල මම් වෙමි, තෙල මාගේ ආත්ම ය''යි දක්නට නිසි ද? ඇවැත්නි, තෙල නිසි නො වේ ම ය.

ඇවැත්නි, යමකයෙනි, එහෙයින් මෙ ලොවැ අතීත-අනාගත-පච්චුප්පන්න වූ ආධ්‍යාත්මික හෝ බාහිර හෝ ඖදරික හෝ සූක්ෂ්ම හෝ හීන හෝ ප්‍රණීත හෝ යම්කිසි රූපයෙක් ඇත් ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් රූපයකුත් ඇත් ද, ඒ සියලු රූපය '' තෙල මාගේ නො වෙයි, තෙල මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේය '' යි මෙසේ තෙල තතු සේ සම්‍යක් ප්‍රඥායෙන් දක්ක යුතු. යම් කිසි වේදනාවක් ... යම් කිසි සංඥාවක් ... යම් කිසි සංස්කාර කෙනෙක් ඇත් ද ... අතීත-අනාගත-පච්චුප්පන්න වූ ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම්කිසි විඥානයෙක් ඇත් ද, දුර වේවයි, ළඟ වේවයි යම් විඥානයෙකුත් ඇත් ද, ඒ සියලු විඥානය '' තෙල මාගේ නො වෙයි, තෙල මම් නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ ය''යි මෙසේ තෙල තතු සේ විවසුන් නුවණින් දක්කයුතු.

ඇවැත්නි, යමකයෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපයෙහි දු කලකිරෙයි ... මේ රහත් බව පිණිස කටයුතු අන් කිසෙක් නැතැ යි දැනගනියි.

ඇවැත්නි, යමකයෙනි, ඒ කිමැ යි හඟිවු ද, රූපය සත්ත්වයා ය යි දකිවු ද ? ඇවැත්නි, තෙල නො වේ ම ය.

වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය සත්ත්වයා යි දකිවු ද ? ඇවැත්නි, තෙල නො වේ ම ය.

ඇවැත්නි, යමකයෙනි, ඒ කිමැ යි හඟි වූ ද, රූපයෙහි සත්ත්වයා වේ යයි දකිවු ද? ඇවැත්නි තෙල නො වේ ම ය.

රූපයෙන් වෙන් වැ සත්ත්වයා වේ යයි දකිවු ද ? ඇවැත්නි මෙය නො වේ ම ය.

වේදනායෙහි ... වේදනායෙන් වෙන් වැ ... සංඥායෙහි ... සංඥායෙන් වෙන් වැ ... සංස්කාරයන්හි ... සංස්කාරයන් ගෙන් වෙන් වැ ... විඥානයෙහි ... සත්ත්වයා වේ යයි දකිවු ද ? ඇවැත්නි, තෙල නොවේම ය.

විඥානයෙන් වෙන් ව සත්ත්වයා වේ ය යි දකිවු ද ? ඇවැත්නි, තෙල නො වේම ය.

15—ඒ 50066 (80/06)

තං කිං මඤ්ඤසි ආවුසො යමක, අයං සො අරූපී අවෙදනො අසඤ්ඤී අසඞ්ඛාරො අවිඤ්ඤාණො තථාගතොති සමනුපස්සසීති. නො හෙතං ආවුසො.

තං කිං මඤ්ඤසි ආවුසො, යමක, රූපං -පෙ- වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ[1] -පෙ- විඤ්ඤාණං තථාගතො'ති සමනුපස්සසීති? නො හෙතං ආවුසො.

එත්ථ ච තෙ ආවුසො, යමක දිට්ඨෙව ධම්මෙ සච්චතො ථෙතතො[2] තථාගතෙ අනුපලබ්භියමානෙ[3] කල්ලං නු තෙ තං වෙය්‍යාකරණං "තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා ඛීණාසවො භික්ඛු කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණාති? අහු ඛො මෙතං ආවුසො සාරිපුත්ත, පුබ්බෙ අවිද්දසුනො පාපකං දිට්ඨිගතං ඉදඤ්ච පන මෙ ආයස්මතො සාරිපුත්තස්ස ධම්මදෙසනං සුත්වා තඤ්චෙව පාපකං දිට්ඨිගතං පහීනං, ධම්මො ච මෙ අභිසමෙතොති.[4]

සචෙ තං ආවුසො යමක, එවං පුච්ඡෙය්‍යුං: "යො සො ආවුසො යමක, භික්ඛු අරහං ඛීණාසවො සො කායස්ස භෙදා පරම්මරණා කිං හොතීති එවං පුට්ඨො ත්වං ආවුසො යමක, කින්ති බ්‍යාකරෙය්‍යාසී"ති?

සචෙ මං ආවුසො එවං පුච්ඡෙය්‍යුං: "යො සො ආවුසො යමක, භික්ඛු අරහං ඛීණාසවො සො කායස්ස භෙදා පරම්මරණා කිං හොතී"ති? එවං පුට්ඨො'හං ආවුසො, එවං බ්‍යාකරෙය්‍යං: රූපං ඛො ආවුසො අනිච්චං, යදනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තං නිරුද්ධං, තදත්ථගතං, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චං යදනිච්චං තං දුක්ඛං යං දුක්ඛං තං නිරුද්ධං තදත්ථගතන්ති". එවං පුට්ඨො'හං ආවුසො, එවං බ්‍යාකරෙය්‍යන්ති.

සාධු සාධු ආවුසො යමක, තෙනහාවුසො යමක, උපමන්තෙ කරිස්සාමි එතස්සෙව අත්ථස්ස භිය්‍යොසොමත්තාය ඤාණාය.

සෙය්‍යථාපි ආවුසො යමක, ගහපති වා ගහපතිපුත්තො වා අඩ්ඪො මහද්ධනො මහාභොගො, සො ච ආරක්ඛසම්පන්නො තස්ස කොචිදෙව පුරිසො උප්පජ්ජෙය්‍ය අනත්ථකාමො අහිතකාමො අයොගක්ඛෙමකාමො ජීවිතා වොරොපෙතුකාමො, තස්ස එවමස්ස: "අයං ඛො ගහපති වා ගහපතිපුත්තො වා අඩ්ඪො මහද්ධනො මහාභොගො, සො ච ආරක්ඛසම්පන්නො. න ව්‍යා සුකරො[5] පසය්හ ජීවිතා වොරොපෙතුං, යන්නූනාහං අනුපඛජ්ජ ජීවිතා වොරොපෙය්‍ය'න්ති. සො තං ගහපතිං වා ගහපතිපුත්තං වා උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය: "උපට්ඨහෙය්‍යං තං භන්තෙ"ති. තමෙනං සො ගහපති වා ගහපති-පුත්තො වා උපට්ඨාපෙය්‍ය, සො උපට්ඨහෙය්‍ය, පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදී. තස්ස සො ගහපති වා

1. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- සයා
2. තථතො - සයා.
3. තථාගතො අනුපලබ්භියමානො - මජ්ඣිමං, සයා.
4. අභිසමිතො - මජ්ඣිමං, සයා.
5. "නායං සුකරො-මජ්ඣිමං නහායං සුකරො- සයා.

Free Distribution www.aathaapi.org

ඇවැත්නි, යමකයෙනි, කිමැ යි හඟිවු ද, රූපය ... වේදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය සත්ත්වයා යි දකිවු දැයි ? ඇවැත්නි, මෙය නො වේ ම ය.

ඇවැත්නි, යමකයෙනි, ඒ කිමැ යි හඟිවු ද ? රූප නො වූ වේදනා නො වූ සංඥා නො වූ සංස්කාර නො වූ විඥාන නො වූ ඒ මේ ධර්මය සත්ත්වයා යි දකිවු දැයි ? ඇවැත්නි, තෙල නො වේ ම ය.

ඇවැත්නි, යමකයෙනි, මෙහි ලා මේ අත්බැවහි ම තොපට සත්‍ය විසින් ස්ථිර විසින් සත්ත්වයකු නො ලැබෙන කල්හි යම්යේ රහත් මහණ කය බිඳීමෙන් සිඳේ ද, වැනසේ ද, මරණින් මතු නො වේ ද, භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ දෙසන ලද දහමක් මම දනිමි '' යි තොපගේ ඒ පැවසීම සුදුසු ද ? ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, නුවණ නැති මට පෙර මේ ලාමක දෘෂ්ටිය විය. ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ මේ දහම් දෙසුම අසා ඒ ලාමක දෘෂ්ටිය පහ වැ ගියේ ය. මා විසින් ධර්මය ද අවබෝධ කරන ලද්දේ '' යයි.

ඇවැත්නි යමකයෙනි, ඉදින් තොප මෙසේ විචාරන්නාහු නම් (එනම්) : '' ඇවැත් යමකයෙනි, යම් ඒ අර්හත් ක්ෂීණාස්‍රව මහණෙක් වේ ද, හේ කාබුන් මරණින් මතු කිම වේ ද''යි ඇවැත් යමකයෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි කිමෙකැයි විසඳා කියන්නාහු ද?

ඇවැත්නි, ඉදින් මා මෙසේ පුළුවුස්නාහු නම් : ඇවැත්නි යමකයෙනි, යම් ඒ අර්හත් ක්ෂීණාස්‍රව මහණෙක් වේ ද, හෙ කාබුන් මරණින් මතු කිම වේද''යි ඇවැත්නි මෙසේ පුළුවුස්නා ලද මම් මෙසේ විසඳා කියන්නෙමි : '' ඇවැත්නි' රූපය අනිත්‍ය යැ, යමක් අනිත්‍ය ද එය දුක් යැ, යමක් දුක් ද එය නිරුද්ධ යැ, අස්තඞ්ගත යැ. වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය අනිත්‍ය යැ, යමක් අනිත්‍ය ද එය දුක් යැ, යමක් දුක් ද එය නිරුද්ධ යැ, අස්තඞ්ගත යැ.'' මෙසේ පුළුවුස්නා ලද මම් මෙසේ විසඳා කියන් නෙමි යි.

ඇවැත්නි යමකයෙනි, මැනවි. මැනවි. ඇවැත්නි, යමකයෙනි, එසේ වී නම් මේ අරුත (මේ ප්‍රථම මාර්ගය) ම බෙහෙවින් දැනීම පිණිස තොපට උපමාවක් කරන්නෙමි :

''ඇවැත්නි, යමකයෙනි, යම් සේ ආඪ්‍ය වූ මහත්ධන ඇති මහත් භෝග ඇති ගැහැවියෙක් හෝ ගැහැවිපුතෙක් හෝ වේ ද, හෙ ද ආරක්ෂාසම්පන්න ය. ඔහුට අවැඩ කැමැති අහිත කැමැති සිවු උපායෙන් ක්ෂේමභාවය නො කැමැති (උවදුරු කැමැති) දිවි තොර කරනු කැමැති කිසියම් පුරුෂයෙක් උපදනේ ය. ඔහුට මෙ බඳු සිතෙක් වන්නේ ය : ''මේ ගැහැවි හෝ ගැහැවිපුත් හෝ ආඪ්‍ය ය. මහත් ධන ඇත්තේ ය. මහත් භෝග ඇත්තේ ය. හෙ ද ආරක්ෂාසම්පන්න ය. මැඩ දිවි තොර කරන්නට සුකර නො වේ. මම ඇතුළට පිවිස දිවි තොර කරන්නෙම් නම් මැනැවැ''යි හෙ ඒ ගැහැවියා වෙත හෝ ගැහැවිපුතු වෙත හෝ එළැඹ ''හිමි, මුබට උවටැන් කරන්නෙමි''යි මෙසේ කියන්නේ ය. ඒ ගැහැවි හෝ ගැහැවිපුත් හෝ ඒ මොහු ලවා උවටැන් කරවාගන්නේ ය. හෙ පළමු නැඟී සිටින්නේ පසු ව හොවින්නේ කුම් කෙරෙම් ද ? යි පුළුවුස්නේ මනාවඩනා ඇ කරනුයේ පියවදන් බණනුයේ උවටැන් කරන්නේ යි ඔහුගේ ඒ ගැහැවි හෝ ගැහැවිපුත් හෝ මිතුරු

ගහපතිපුත්තො වා, මිත්තතො'පි නං සද්දහෙය්‍ය. සුහජ්ජතො'පි නං සද්දහෙය්‍ය තස්මිං විස්සාසං ආපජ්ජෙය්‍ය, යදා ඛො ආවුසො තස්ස පුරිසස්ස එවමස්ස: "සංවිස්සත්ථො ඛො මය්හං ගහපති වා ගහපති-පුත්තො වාති." අථ නං රහොගතං විදිත්වා තිණ්හෙන සත්ථෙන ජීවිතා වොරොපෙය්‍ය.

තං කිං මඤ්ඤසි ආවුසො යමක, යදා'පි සො පුරිසො අමුං ගහපතිං වා ගහපතිපුත්තං වා උපසඞ්කමිත්වා එවමාහ: "උපට්ඨහෙය්‍යං තං භන්තෙ"ති, තදාපි සො වධකොව, වධකඤ්ච පන සන්තං න අඤ්ඤාසි. "වධකො මෙ"ති. යදා'පි සො උපට්ඨාති පුබ්බුට්ඨායී පච්ඡානිපාතී කිඞ්කාරපටිස්සාවී මනාපචාරී පියවාදී. තදා'පි සො වධකොව, වධකඤ්ච පන සන්තං න අඤ්ඤාසි. "වධකො මෙ"ති. යදා'පි නං රහොගතං විදිත්වා තිණ්හෙන සත්ථෙන ජීවිතාවොරොපෙති. තදා'පි සො වධකොව, වධකඤ්ච පන සන්තං න අඤ්ඤාසි "වධකො මෙ"ති. එවමාවුසොති.

එවමෙව ඛො ආවුසො අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා, අත්තානං, වෙදනං -පෙ සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා, විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං. සො අනිච්චං රූපං 'අනිච්චං රූපන්ති යථාභූතං නප්පජානාති, අනිච්චං වෙදනං 'අනිච්චා වෙදනාති යථාභූතං නප්පජානාති, අනිච්චං සඤ්ඤං "අනිච්චා සඤ්ඤාති යථාභූතං නප්පජානාති, අනිච්චෙ සඞ්ඛාරෙ 'අනිච්චා සඞ්ඛාරාති යථාභූතං නප්පජානාති, අනිච්චං විඤ්ඤාණං 'අනිච්චං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති.

දුක්ඛං රූපං 'දුක්ඛං රූපන්ති යථාභූතං නප්පජානාති, දුක්ඛං වෙදනං -පෙ- දුක්ඛං සඤ්ඤං -පෙ- දුක්ඛෙ සඞ්ඛාරෙ -පෙ- දුක්ඛං විඤ්ඤාණං 'දුක්ඛං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති.

අනත්තං රූපං 'අනත්තා[1] රූපන්ති යථාභූතං නප්පජානාති, අනත්තං වෙදනං අනත්තා වෙදනාති යථාභූතං නප්පජානාති, අනත්තං සඤ්ඤං -පෙ- අනත්තෙ සඞ්ඛාරෙ අනත්තා සඞ්ඛාරාති යථාභූතං නප්පජානාති, අනත්තං විඤ්ඤාණං අනත්තං විඤ්ඤාණ"න්ති යථාභූතං නප්පජානාති.

සඞ්ඛතං රූපං සඞ්ඛතං රූපන්ති යථාභූතං නප්පජානාති, සඞ්ඛතං වෙදනං සඞ්ඛතා වෙදනාති යථාභූතං නප්පජානාති, සඞ්ඛතං සඤ්ඤං -පෙ- සඞ්ඛතෙ සඞ්ඛාරෙ සඞ්ඛතා සඞ්ඛාරා"ති යථාභූතං නප්පජානාති, සඞ්ඛතං විඤ්ඤාණං සඞ්ඛතං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති.

වධකං රූපං වධකං රූපන්ති යථාභූතං නප්පජානාති. වධකං වෙදනං -පෙ- වධකං සඤ්ඤං -පෙ- වධකෙ සඞ්ඛාරෙ -පෙ- වධකා සඞ්ඛාරාති යථාභූතං නප්පජානාති, වධකං විඤ්ඤාණං වධකං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති.

---

1. අනත්තං – සීමු.

සෙයිනුදු ඔහු හදහන්නේ ය. සුහද සෙයිනුදු ඔහු හදහන්නේ ය. ඔහු කෙරෙහි විශ්වාසයට පැමිණෙන්නේ ය. ඇවැත්නි, යම් කාලක ඒ පුරුෂහට "මේ ගැහැවි හෝ ගැහැවිපුත් හෝ මාකෙරෙහි ඉතා විශ්වාස ඇත්තේ ය"යි මෙසේ අදහස් වන්නේ ද, එ කල්හි ඔහු එකලා වූවහු දූන තියුණු සැතින් දිවි තොර කරන්නේ යි.

ඇවැත්නි, යමකයෙහි ඒ කිමෙකැයි හඟිවූද, යම් කලෙක ඒ පුරිස් තෙමේ මේ ගැහැවියා වෙත හෝ ගැහැවිපුතු වෙත හෝ එළඹැ "හිමි, මුබට උවටැන් කරම් දැ"යි මෙසේ කී ද, එ කල්හිත් හෙ වධකයා ම ය. වධක වූ ම ඔහු මාගේ වධකයා යි නො දත්තේය. යම් කලෙකත් හෙ පළමු නැඟී සිටින්නේ පසුව හොවින්නේ කුම් කෙරෙම් දැ යි පිළිවදන් අස්වන්නේ මනාප දැ කරන්නේ, පියවදන් බණන්නේ උවටන් කෙරේ ද, එ කල්හිදු හේ වධකයා ම ය. වධක වූ ම ඔහු මාගේ වධකයා යි නො දත්තේ ය. යම් කලෙක්හිදු එකලා වූ ඔහු දූන තියුණු සැතින් දිවි තොර කෙරේ ද, එකල්හිදු හෙ වධකයා ම ය. වධක වූ ම ඔහු මාගේ වධකයා යි නො දත්තේ ය. ඇවැත්නි, එසේ ය යි.

ඇවැත්නි, එසෙයින් ම ආර්‍යයන් නො දක්නා ආර්‍යධර්මයෙහි අදක්ෂ ආර්‍යධර්මයෙහි නො හික්මුණු සත්පුරුෂයන් නො දක්නා සත්පුරුෂධර්මයෙහි අදක්ෂ සත්පුරුෂධර්මයෙහි නො හික්මුණු අශ්‍රුතවත් පෘථග්ජන රූපය ආත්මය යි හෝ ආත්මය රූප ඇත්තෙකැයි හෝ ආත්මයෙහි රූපය ඇතැයි හෝ රූපයෙහි ආත්මය ඇතැයි හෝ දකියි, වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය ආත්මය යි හෝ ආත්මය විඥනවත් යි හෝ ආත්මයෙහි විඥනය ඇතැයි හෝ විඥනයෙහි ආත්මය ඇතැයි හෝ දකී. අනිත්‍ය වූ රූපය අනිත්‍ය වූ රූපය යි තතු සේ නො දනියි, අනිත්‍යවූ වෙදනාව අනිත්‍යවූ වෙදනාව ය යි තතු සේ නොදනියි, අනිත්‍ය වූ සංඥව අනිත්‍ය වූ සංඥව යයි තතු සේ නො දනියි, අනිත්‍ය වූ සංස්කාර අනිත්‍ය වූ සංස්කාරයයි තතු සේ නො දනියි, අනිත්‍ය වූ විඥනය අනිත්‍ය වූ විඥනයයි තතුසේ නො දනී.

දුක් වූ රූපය දුක් වූ රූපය යි තතු සේ නො දනියි, දුක් වූ වෙදනාව . . . දුක් වූ සංඥව . . . දුක් වූ සංස්කාර . . . දුක් වූ විඥනය දුක් වූ විඥන යයි තතු සේ නො දනී.

අනාත්ම වූ රූපය අනාත්ම වූ රූප යයි තතු සේ නො දනියි, අනාත්ම වූ වේදනාව අනාත්ම වූ වෙදනාව යයි තතු සේ නො දනියි. අනාත්ම වූ සංඥව . . . අනාත්ම වූ සංස්කාර අනාත්ම සංස්කාර යි තතු සේ නො දනියි, අනාත්ම වූ විඥනය අනාත්ම වූ විඥනය යි තතු සේ නො දනී.

සංඛත රූපය සංඛත රූප යයි තතු සේ නො දනියි, සංඛත වේදනාව සංඛත වේදනාව ය යි තතු සේ නො දනියි, සංඛත සඤ්ඤව . . . සංඛත සංඛාර සංඛත සංඛාර යයි තතු සේ නො දනියි. සංඛත විඤ්ඤාණය සංඛත විඤ්ඤණ ය යි තතු සේ නො දනී.

වධක රූපය වධක රූප යයි තතු සේ නො දනියි. වධක වේදනාව . . . වධක සඤ්ඤව . . . වධක සංඛාර වධක සංඛාර ය යි තතු සේ නො දනී. වධක විඤ්ඤණය වධක විඤ්ඤය යි තතු සේ නො දනී.

සො රූපං උපෙති උපාදියති අධිට්ඨාති 'අත්තා මෙ'ති, වෙදනං උපෙති උපාදියති අධිට්ඨාති 'අත්තා මෙති' සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ උපෙති උපාදියති අධිට්ඨාති 'අත්තා මෙ'ති. විඤ්ඤාණං උපෙති උපාදියති අධිට්ඨාති 'අත්තා මෙ'ති, තස්සිමෙ පඤ්චුපාදානක්ඛන්ධා උපෙතා උපාදින්නා දීඝරත්තං අහිතාය දුක්ඛාය සංවත්තන්ති.

සුතවා ච ඛො ආවුසො අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං, න වෙදනං -පෙ- න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං.

සො අනිච්චං රූපං අනිච්චං රූපන්ති යථාභූතං පජානාති, අනිච්චං වෙදනං -පෙ- අනිච්චං සඤ්ඤං -පෙ- අනිච්චෙ සඞ්ඛාරෙ -පෙ- අනිච්චං විඤ්ඤාණං අනිච්චං විඤ්ඤාණන්ති යථාභූතං පජානාති.

දුක්ඛං රූපං දුක්ඛං රූපන්ති යථාභූතං පජානාති. දුක්ඛං වෙදනං -පෙ- දුක්ඛං සඤ්ඤං -පෙ- දුක්ඛෙ සඞ්ඛාරෙ -පෙ- දුක්ඛං විඤ්ඤාණං දුක්ඛං විඤ්ඤාණන්ති යථාභූතං පජානාති.

අනත්තං රූපං අනත්තා රූපන්ති යථාභූතං පජානාති, අනත්තං වෙදනං -පෙ- අනත්තං සඤ්ඤං -පෙ- අනත්තෙ සඞ්ඛාරෙ -පෙ- අනත්තං විඤ්ඤාණං අනත්තා විඤ්ඤාණන්ති යථාභූතං පජානාති.

සඞ්ඛතං රූපං සඞ්ඛතං රූපන්ති යථාභූතං පජානාති. සඞ්ඛතං වෙදනං -පෙ- සඞ්ඛතං සඤ්ඤං -පෙ- සඞ්ඛතෙ සඞ්ඛාරෙ -පෙ- සඞ්ඛතං විඤ්ඤාණං සඞ්ඛතං විඤ්ඤාණන්ති යථාභූතං පජානාති.

වධකං රූපං වධකං රූපන්ති යථාභූතං පජානාති. වධකං වෙදනං -පෙ- වධකං සඤ්ඤං -පෙ- වධකෙ සඞ්ඛාරෙ -පෙ- වධකං විඤ්ඤාණං වධකං විඤ්ඤාණන්ති යථාභූතං පජානාති.

සො රූපං න උපෙති, න උපාදියති, න අධිට්ඨාති, අත්තා මෙති. වෙදනං න උපෙති -පෙ- සඤ්ඤං න උපෙති -පෙ- සඞ්ඛාරෙ න උපෙති -පෙ- විඤ්ඤාණං න උපෙති, න උපාදියති, න අධිට්ඨාති අත්තා මෙ'ති, තස්සිමෙ පඤ්චුපාදානක්ඛන්ධා අනුපෙතා අනුපාදින්නා දීඝරත්තං හිතාය සුඛාය සංවත්තන්තීති.

හේ රූපය මාගේ ආත්මය යි දෘෂ්ටි වසින් පැමිණෙයි. දැඩි වැ ගනියි, (එහි) පිහිටයි. වේදනාව මාගේ ආත්මයයි පැමිණෙයි. දැඩි වැ ගනියි, පිහිටයි. සංඥව මාගේ ආත්මයයි . . . සංස්කාරයන් දෘෂ්ටි වසින් පැමිණෙයි ගනී පිහිටයි. විඥනය මාගේ ආත්මයයි පැමිණෙයි දැඩි වැ ගනියි, පිහිටයි. ඔහු විසින් මේ පඤ්චොපාදනස්කන්ධයෝ දීර්ඝ රාත්‍රියෙහි උපගත වූවාහු දැඩි වැ ගන්නා ලද්දහු අහිත පිණිස දුක් පිණිස පවතිත්.

ඇවැත්නි, ආයර්‍ය්‍යයන් දක්නා ආයර්‍ය්‍යධර්මයෙහි දක්ෂ ආයර්‍ය්‍යධර්මයෙහි හික්මුණු සත්පුරුෂයන් දක්නා සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ සත්පුරුෂධර්මයෙහි හික්මුණු ශ්‍රුතවත් ආයර්‍ය්‍යශ්‍රාවක රූපය ආත්ම විසින් නො දකියි, ආත්මය රූපවත් යි හෝ නො දකියි, රූපය ආත්මයෙහි ඇතැයි හෝ නො දකියි, රූපයෙහි ආත්මය ඇතැයි හෝ නො දකී. වෙදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය ආත්ම විසින් නො දකියි, ආත්මය විඥනවත් යයි හෝ නො දකියි, විඥනය ආත්මයෙහි ඇතැයි හෝ නො දකියි, විඥනයෙහි ආත්මය ඇතැයි හෝ නො දකී.

හේ අනිත්‍ය වූ රූපය අනිත්‍ය වූ රූපයයි තතු සේ දනියි, අනිත්‍ය වූ වෙදනාව . . . අනිත්‍ය වූ සංඥව . . . අනිත්‍ය වූ සංස්කාර . . . අනිත්‍ය වූ විඥනය අනිත්‍ය වූ විඥන ය යි තතු සේ දනී.

දුක් වූ රූපය දුක් වූ රූප යයි තතුසේ දනී යි, දුක් වූ වෙදනාව . . . දුක් වූ සංඥව . . . . දුක් වූ සංස්කාර . . . දුක් වූ විඥනය දුක් වූ විඥන ය යි තතු සේ දනී.

අනාත්ම වූ රූපය අනාත්ම වූ රූප ය යි තතු සේ දනියි, අනාත්ම වූ වෙදනාව . . . අනාත්ම වූ සංඥව . . . අනාත්ම වූ සංස්කාර . . . අනාත්ම වූ විඥනය අනාත්මවූ විඥන ය යි තතු සේ දනී.

සංඛත වූ රූපය සංඛත වූ රූප යයි තතු සේ දනියි, සංඛත වූ වෙදනාව . . . . සංඛත වූ සංඥව . . . සංඛත වූ සංස්කාර . . . සංඛත වූ විඥනය සංඛත වූ විඥන යයි තතු සේ දනී.

වධක වූ රූපය වධක වූ රූප යයි තතු සේ දනියි. වධක වූ වේදනාව . . . වධක වූ සංඥව . . . වධක වූ සංස්කාර . . . වධක වූ විඥනය වධක වූ විඥනය යයි තතු සේ දනී.

හේ රූපය මාගේ ආත්මයයි නො පැමිණෙයි. දැඩි වැ නො ගනියි නො පිහිට යි, වේදනාව (මාගේ ආත්මයයි) නො පැමිණෙයි . . . සංඥව නො පැමිණෙයි . . . සංස්කාරයන් නො පැමිණෙයි . . . විඥනය මාගේ ආත්මයයි නො පැමිණෙයි. දැඩිවැ නො ගනියි, නො පිහිටයි. ඔහු විසින් මේ පඤ්චෝපාදනස්කන්ධයෝ උපගත නො වූවාහු දැඩි වැ නො ගන්නා ලද්දහු දිගු කලක් මුළුල්ලෙහි හිත පිණිස සුව පිණිස පවතිත් යයි.

එවමේතං[1] ආවුසො සාරිපුත්ත හොති. යෙසං ආයස්මන්තාදිසා[2] සබ්‍රහ්මචාරිනො අනුකම්පකා අත්ථකාමා ඔවාදකා අනුසාසකා. ඉදඤ්ච පන මේ ආයස්මතො සාරිපුත්තස්ස ධම්මදෙසනං සුත්වා අනුපාදාය ආසවෙහි චිත්තං විමුත්තන්ති.

ඉදමවොච ආයස්මා සාරිපුත්තො. අත්තමනො ආයස්මා යමකො ආයස්මතො සාරිපුත්තස්ස භාසිතං අභිනන්දීති[3]

## 1. 2. 4. 4.

## අනුරාධ සුත්තං

එවං මෙ සුතං[4] එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං, තෙන ඛො පන සමයෙන ආයස්මා අනුරාධො භගවතො අවිදූරෙ අරඤ්ඤකුටිකායං විහරති. අථ ඛො සම්බහුලා අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා යෙනායස්මා අනුරාධො තෙනුපසංකමිංසු, උපසඞ්කමිත්වා ආයස්මතා අනුරාධෙන සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ආයස්මන්තං අනුරාධං එතදවොචුං :

යො සො ආවුසො අනුරාධ, තථාගතො උත්තම්පුරිසො පරම්පුරිසො පරමපත්තිපත්තො, තං තථාගතො ඉමෙසු චතූසු ඨානෙසු පඤ්ඤපයමානො පඤ්ඤපෙති : හොති තථාගතො පරම්මරණා'ති වා න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා'ති.

එවං වුත්තෙ ආයස්මා අනුරාධො[5] තෙ අඤ්ඤතිත්ථියෙ පරිබ්බාජකෙ එතදවොච : "යො සො ආවුසො තථාගතො උත්තම්පුරිසො පරම්පුරිසො පරමපත්තිපත්තො, තං තථාගතො අඤ්ඤත්‍ර ඉමෙහි[6] චතූහි ඨානෙහි පඤ්ඤපයමානො පඤ්ඤපෙති : "හොති තථාගතො පරම්මරණා'ති වා, 'න හොති තථාගතො පරම්මරණා'ති වා 'හොති ච න ච හොති තථාගතො පරම්මරණා'ති වා 'නෙ'ව හොති න න හොති තථාගතො පරම්මරණාති වා''ති.

එවං වුත්තෙ තෙ[7] අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ආයස්මන්තං අනුරාධං එතදවොචුං : "නො වා'යං භික්ඛු නවො භවිස්සති. අචිරපබ්බජිතො, ථෙරො වා පන බාලො අබ්‍යත්තො''ති.

---

1. එවමෙතං - සයා.
2. ආයස්මන්තානං තාදිසා - මජසං, සයා.
3 ඌනොයං පාඨො - මජසං, සයා.
4. ඌනොයං පාඨො මජසං, සයා.
5. එවං වුත්තො අනුරාධො - P. T. S.
6. අඤ්ඤත්‍ර ඉමෙහි - මජසං, සයා.
7. එවං වුත්තෙ - මජසං.

ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, යම් කෙනකුන්ට අනුකම්පා කරන වැඩ කැමැති ඔවදන් දෙන අනුශාසනා කරන ආයුෂ්මතුන් වැනි සබ්‍රම්සරහු වෙත් නම් තෙලෙ මෙසේ වෙයි. ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ මේ ධර්මදේශනාව අසා මාගේ සිත උපාදාන රහිත වැ ආශ්‍රවයන් කෙරෙන් මිදුණේ යයි.

ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙය වදළහ. සතුටු සිත් ඇති ආයුෂ්මත් යමක ස්ථවිර තෙමේ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ දේශනාව පිළිගත්තේ යි.

## 1. 2. 4. 4.

## අනුරාධ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද; එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසල්පුර සමීප යෙහි වූ මහාවනයෙහි කූටාගාරශාලායෙහි වැඩ වසනසේක. එ සමයෙහි ආයුෂ්මත් අනුරාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නුදුරෙන් වන කිළියෙකැ වෙසෙති. එකල්හි බොහෝ අන්තොටු පිරිවැජ්ජෝ ආයුෂ්මත් අනුරාධ තෙරණුවන් කරා එළැඹියහ. එළැඹ ආයුෂ්මත් අනුරාධ තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත් පස් වැ හුන්හ. එකත්පස් වැ හුන් ඒ අන්තොටු පිරිවැජ්ජෝ ආයුෂ්මත් අනුරාධ තෙරණුවන්හට තෙල කීහු :

ඇවැත් අනුරාධයෙනි, උත්තමපුරුෂ වූ පරමපුරුෂ වූ පැමිණිය යුතු උතුම් ඵලයට පැමිණි යම් ඒ තථාගත (සත්ත්වයෙක්) වේ ද, ඒ (තථාගත සංඛ්‍යාත) සත්ත්වයා (ඔබගේ ශාස්තෘ වූ) තථාගතයෝ මේ සතර තන්හි ලා පනවන්නාහු පනවත් ද ? (කවර සතර තැනෙකැ යත් :) සත්ත්ව මරණින් මතු වෙයි හෝ, සත්ත්ව මරණින් මතු නො වෙයි හෝ, සත්ත්ව මරණින් මතු වෙයි නො ද වෙයි හෝ, සත්ත්ව මරණින් මතු නො ද වෙයි නො ද නො වෙයි හෝ''යි.

මෙසේ කී කල්හි ආයුෂ්මත් අනුරාධ තෙරණුවෝ ඒ අන්තොටු පිරිවැජ්ජනට තෙල කීහ: ඇවැත්නි, යම් ඒ උත්තමපුරුෂ වූ පරමපුරුෂ වූ උතුම් ඵලයට පැමිණි සත්ත්ව වේ ද, (අපගේ ශාස්තෘ වූ) තථාගතයන් වහන්සේ ඒ සත්ත්වයා පනවනසේක් ''සත්ත්ව මරණින් මතු වෙයි හෝ, සත්ත්ව මරණින් මතු නො වෙයි හෝ, සත්ත්ව මරණින් මතු වෙයි නො ද වෙයි හෝ, සත්ත්ව මරණින් මතු නො ද වෙයි නො ද නො වෙයි හෝ'' යන මේ සතර තැන් හැර පනවති යි.

මෙසේ කී කල්හි ඒ අන්තොටු පිරිවැජියෝ ආයුෂ්මත් අනුරාධ තෙරණුවන්හට තෙල කීහු : ''මේ මහණ නවකයෙක් පැවිදි වැ නො බෝ කල් ඇත්තෙක් වන්නේය, (නැතහොත්) ස්ථවිර වූයේ බාලයෙක් අව්‍යක්තයෙක් හෝ වන්නේ යි''.

අථ ඛො තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ආයස්මන්තං අනුරාධං නවවාදෙන ච බාලවාදෙන ච අපසාදෙත්වා උට්ඨායාසනා පක්කමිංසු. අථ ඛො ආයස්මතො අනුරාධස්ස අචිරපක්කන්තෙසු තෙසු අඤ්ඤතිත්ථියෙසු පරිබ්බාජකෙසු එතදහොසි:

"සචෙ ඛො මං තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා උත්තරිං පඤ්හං පුච්ඡෙය්‍යුං. කථං බ්‍යාකරමානො නු ඛො'හං[1] තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං වුත්තවාදී චෙව භගවතො අස්සං, න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛෙය්‍යං, ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍යං, න ච කොචි සහධම්මිකො වාදානුවාදො[2] ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍යා"ති.

අථ ඛො ආයස්මා අනුරාධො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා අනුරාධො භගවන්තං එතදවොච;

"ඉදහං භන්තෙ, භගවතො අවිදූරෙ අරඤ්ඤකුටිකායං විහරාමි. අථ ඛො භන්තෙ සම්බහුලා අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා යෙනාහං තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා මම සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො භන්තෙ, තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා මං එතදවොචුං:

යො සො ආවුසො, අනුරාධ, තථාගතො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිපත්තො තං තථාගතො ඉමෙසු චතූසු ඨානෙසු පඤ්ඤපයමානො පඤ්ඤපෙති: "හොති තථාගතො පරම්මරණාති වා, -පෙ- "නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා"ති.

එවං වුත්තා'හං භන්තෙ, තෙ අඤ්ඤතිත්ථියෙ පරිබ්බාජකෙ එතදවොචං: "යො සො ආවුසො තථාගතො උත්තමපුරිසො පරමපුරිසො, පරමපත්තිපත්තො තං තථාගතො අඤ්ඤත්‍රිමෙහි චතූහි ඨානෙහි පඤ්ඤපයමානො පඤ්ඤපෙති: "හොති තථාගතො පරම්මරණා"ති වා -පෙ- "නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා"ති

එවං වුත්තෙ භන්තෙ, තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා මං එතදවොචුං: "සො චා'යං භික්ඛු නවො භවිස්සති අචිරපබ්බජිතො, ථෙරො වා පන බාලො අබ්‍යත්තො"ති.

අථ ඛො මං භන්තෙ, තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා නවවාදෙන ච බාලවාදෙන ච අපසාදෙත්වා උට්ඨායාසනා පක්කමිංසු. තස්ස මය්හං භන්තෙ, අචිරපක්කන්තෙසු තෙසු අඤ්ඤතිත්ථියෙසු පරිබ්බාජකෙසු එතදහොසි:

---

1. ඛ්වාහං – මජසං, ස්‍යා.
2. වාදානුපාතො – සීමු.

ඉක්බිති ඒ අන්තොටු පිරිවැජ්ජෝ ආයුෂ්මත් අනුරාධ තෙරුන්ට නවකවාදයෙන් බාල වාදයෙන් අවමන් කොට හුනස්නෙන් නැගැ ගියහ. ඉක්බිති ආයුෂ්මත් අනුරාධ තෙරුන් හට ඒ අන්තොටු පිරිවැජ්ජන් බැහැර වැ ගිය නොබෝ කල්හි මෙබඳු අදහස විය :

''ඉදින් ඒ අන්තොටු පිරිවැජ්ජෝ මතුයෙහි මා පැන පුළුවස්නාහු නම් ඒ අන්තොටු පිරිවැජියනට මම් කෙසේ විසඳා කියන්නෙම් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්ද කියන්නෙකිම් වෙම් ද, භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් නො ද නුගුණ කියන්නෙකිම් වෙමි ද, (ලොව්තුරු) දහමට අනුලොම් වූ (පිළිවෙත්) දහමක් පවසන්නෙම් ද, කරුණු සහිත වූ කිසි යම් වාදනුවාදයෙක් ගැරහියයුතු කරුණට නො ද පැමිණේද''යි.

ඉක්බිති ආයුෂ්මත් අනුරාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකැත්පස් වැ හුන්හ. එකැත්පස් වැ හුන් ආයුෂ්මත් අනුරාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ.

වහන්ස, මම මෙහි භාග්‍යවතුන් වහන්සේට නුදුරු තැන පන්සලකැ වෙසෙමි. එකල්හි වහන්ස, බොහෝ අන්තොටු පිරිවැජ්ජෝ මා වෙතැ එළැඹියහ. එළැඹ මා සමග සතුටු වූහ. සතුටු වියයුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත් පසෙකැ හුන්හ. එකත් පසෙකැ හුන් ඒ අන්තොටු පිරිවැජියෝ මට මෙසේ කීහු :

''ඇවැත් අනුරාධයෙනි, උත්තමපුරුෂ වූ පරමපුරුෂ වූ පරමප්‍රාප්තියට පැමිණි යම් ඒ සත්ත්ව වේ ද, (යුෂ්මත් ශාස්තෘ වූ) තථාගතයෝ ඒ සත්ත්වයා මෙ සතර තන්හි ලා පනවන්නාහු 'සත්ත්ව මරණින් මතු වෙයි හෝ . . . සත්ත්ව මරණින් මතු නො ද් වෙයි නො ද නො වෙයි හෝ පනවත්ද''යි ?

මෙසේ කීකල්හි වහන්ස, මම ඒ අන්තොටු පිරිවැජ්ජනට මෙසේ කීමි : ''ඇවැත්නි උත්තමපුරුෂ වූ පරමපුරුෂ වූ පරමප්‍රාප්තියට පැමිණි යම් ඒ සත්ත්ව වේ ද, අස්මත් ශාස්තෘ වූ තථාගතයන් වහන්සේ ඒ සත්ත්වයා පනවන්නාහු සත්ත්ව මරණින් මතු වෙයි හෝ . . . සත්ත්ව මරණින් මතු නො ද වෙයි නො ද නො වෙයි හෝ යන සතර තැන හැර පනවනසේකැ''යි.

වහන්ස, මෙසේ කීකල්හි ඒ අන්තොටු පිරිවැජ්ජෝ මට මෙසේ කීහු : ''ඒ මෙ මහණ නවකයෙක්, පැවිදි වූ නොබෝ කල් ඇත්තෙක් වන්නේය, ස්ථවිර වූයේ බාලයෙක් අව්‍යක්තයෙක් වන්නේ හෝ යි''.

වහන්ස, ඉක්බිති ඒ අන්තොටු පිරිවැජ්ජෝ නවක වාදයෙනුදු බාලවාදයෙනුදු මට අවමන් කොට හුනස්නෙන් නැගැ ගියහ. වහන්ස, ඒ අන්තොටු පිරිවැජ්ජන් බැහැර වැ ගිය නොබෝ කල්හි ඒ මට මේ සිත විය :

“සචෙ ඛො මං තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා උත්තරිං පඤ්හං පුච්ඡෙය්‍යුං, කථං බ්‍යාකරමානො නු ඛො'හං තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං වුත්තවාදී චෙව භගවතො අස්සං. න ච භගවන්තං අබ්භාචික්ඛෙය්‍යං. ධම්මස්ස චානුධම්මං බ්‍යාකරෙය්‍යං, න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡෙය්‍යා”ති.

තං කිං මඤ්ඤසි අනුරාධ, “රූපං නිච්චං වා අනිච්චං වා”ති? අනිච්චං භන්තෙ.

“යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා”ති? දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං “එතං මම එසො'හමස්මි' එසො මෙ අත්තා”ති? නො හෙතං භන්තෙ.

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා”ති? අනිච්චං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති? දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලන්නු තං සමනුපස්සිතුං “එතං මම එසො'හමස්මි එසො මෙ අත්තාති? නො හෙතං භන්තෙ.

තස්මාතිහ අනුරාධ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං “නෙතං මම, නෙසොහමස්මි න මෙසො අත්තා”ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං, යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා. යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං ‘නෙතං මම නෙසොහමස්මි, න මෙ'සො අත්තා”ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං, එවං පස්සං අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාති.

තං කිං මඤ්ඤසි අනුරාධ, “රූපං තථාගතො'ති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං තථාගතො'ති සමනුපස්සසීති. නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි අනුරාධ, රූපස්මිං තථාගතොති සමනුපස්සසීති නො හෙතං භන්තෙ.

අඤ්ඤත්‍ර රූපා තථාගතො'ති සමනුපස්සසී”ති? නො හෙතං භන්තෙ.

වෙදනාය -පෙ- අඤ්ඤත්‍ර වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- අඤ්ඤත්‍ර සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- අඤ්ඤත්‍ර සඞ්ඛාරෙහි -පෙ- විඤ්ඤාණස්මිං “තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ.

''ඉදින් ඒ අන්තොටු පිරිවැජ්ජෝ මතුයෙහි මා පැන පුළුවුස්නාහු නම් ඒ අන්තොටු පිරිවැජ්ජනට කෙසේ විසඳා කියන ඔම් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්ද කියන් නෙකිම් වෙම් ද, භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් නො ද නුගුණ කියන්නෙකිම් වෙම් ද, ලොවුතුරු දහමට අනුලොම් වූ පිළිවෙත් දහමක් කියන්නෙම් ද, කරුණු සහිත වූ කිසියම් වාදනුවාදයෙක් ගැරහියුතු කරුණට නො ද පැමිණෙන්නේද''යි.

අනුරාධය, ඒ කිමෙකැයි හඟිහි ද: 'රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ.

යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ ද ? වහන්ස, දුක් යැ.

යමක් අනිත්‍ය නම් දුක් නම පෙරළෙන සැහැවි ඇත්නම් එය ''තෙල මාගේ යැ, තෙලෙ මම් වෙමි, තෙල මාගේ ආත්මය යි දක්නට සුදුසු ද ? වහන්ස, තෙල නො වේ මැයි.

වෙදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ.

යමක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ ද ? වහන්ස, දුක් යැ.

යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි ඇති නම් එය ''තෙල මාගේ යැ, තෙලෙ මම් වෙමි තෙල මාගේ ආත්මය'යි දක්නට නිසි ද ? වහන්ස, තෙල නො වේ මැයි.

එහෙයින් අනුරාධය, මෙහි ලා අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ආධ්‍යාත්ම වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් කිසි රූපයකුත් වේ ද, දුරු වේ වයි ළඟ වේවයි යම් රූපයකුත් වේ ද, (එ) සියලු රූපය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ තෙල ඇතිසැටියෙන් විදසුන් නුවණින් දක්ක යුතු. යම් කිසි වෙදනාවක් වේ ද . . . යම් කිසි සංඥවක් වේ ද . . . යම් කිසි සංස්කාර වේ ද . . . අතීත–අනාගත–පච්චුප්පන්න අජ්ඣත්ත වේවයි බාහිර වේව යි ඔළාරික වේවයි සුඛම වේවයි හීන වේවයි පණීත වේවයි යම කිසි විඥනයකුත් වේ ද, දුරු වේවයි ළඟ වේවයි යම් විඥනයකුත් වේ ද, (එ) සියලු විඥනය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම් නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේ'' මෙසේ තෙල යථාභූත කොට විදර්ශනාඥනයෙන් දක්කයුතු. මෙසේ දක්නා ආර්‍ය්‍යශ්‍රාවක රූපයෙහිදු කලකිරෙයි. . . . මේ රහත්බව පිණිස අනෙකක් නැතැයි දැනගනී.

අනුරාධය ඒ කිමෙකැ යි හඟිහි ද ? රූපය සත්ත්ව යි දකිහි ද ? වහන්ස, තෙල නො වේ මැ යැ. වෙදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය සත්ත්ව වෙ යයි දකිහි ද ? වහන්ස, තෙල නො වේ මැ යි.

අනුරාධය, ඒ කිමෙකැයි හඟිහි ද ? රූපයෙහි සත්ත්ව වේ ය යි දකිහි ද ? වහන්ස, තෙල නො වේ ම යැ.

රූපයෙන් බැහැරැ සත්ත්ව වේ ය යි දකිහි ද ? වහන්ස, මෙය නො වේ මැ යි.

වෙදනායෙහි . වෙදනායෙන් බැහැරැ . . . සංඥයෙහි . . සංඥයෙන් බැහැරැ . . . සංස්කාරයන්හි . . . සංස්කාරයෙන් බැහැරැ . . . විඥනයෙහි සත්ත්ව වේ යයි දකිහි ද ? වහන්ස, මෙය නො වේ ම යැ.

අඤ්ඤත්‍ර විඤ්ඤාණා තථාගතොති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ.

තං කිං මඤ්ඤසි අනුරාධ, රූපං - වෙදනා - සඤ්ඤා - සඞ්ඛාරා - විඤ්ඤාණං තථාගතො'ති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ.

තං කිම්මඤ්ඤසි අනුරාධ, අයං සො අරූපී අවෙදනො අසඤ්ඤී අසඞ්ඛාරො අවිඤ්ඤාණො තථාගතො'ති සමනුපස්සසීති? නො හෙතං භන්තෙ.

එත්ථ ච තෙ අනුරාධ, දිට්ඨෙව ධම්මෙ සච්චතො ථෙතතො තථාගතෙ අනුපලබ්භියමානෙ[1] කල්ලන්නු තෙ තං ව්‍යාකරණං "යො සො ආවුසො, තථාගතො උත්තමපුරිසො පරමපුරිසො පරමපත්ති-පත්තො තං තථාගතො අඤ්ඤත්‍රිමෙහි චතූහි ඨානෙහි පඤ්ඤපයමානො පඤ්ඤපෙය්‍ය[2] "හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න ච හොති තථාගතො පරම්මරණා'ති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා''ති? නො හෙතං භන්තෙ.

සාධු සාධු අනුරාධ, පුබ්බෙ චාහං අනුරාධ, එතරහි ච දුක්ඛඤ්චෙව පඤ්ඤපෙමි දුක්ඛස්ස ච නිරොධන්ති.

## 1. 2. 4. 5.

## වක්කලි සුත්තං

87. එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා වක්කලි කුම්භකාරනිවෙසනෙ විහරති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො.

අථ ඛො ආයස්මා වක්කලි උපට්ඨාකෙ ආමන්තෙසි: එථ තුම්හෙ ආවුසො, යෙන භගවා තෙනුපසඞ්කමථ උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දථ. වක්කලි භන්තෙ භික්ඛු ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. සො භගවතො පාදෙ සිරසා වන්දතීති එවඤ්ච වදෙථ 'සාධු කිර භන්තෙ, භගවා යෙන වක්කලි භික්ඛු තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා''ති.

එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො වක්කලිස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: වක්කලි භන්තෙ, භික්ඛු ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. සො භගවතො පාදෙ සිරසා වන්දති "සාධු කිර භන්තෙ, භගවා යෙන වක්කලි භික්ඛු තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා''ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

1 තථාගතො අනුපලබ්භියමානො - මජ්ඣං, ස්‍යා.
2. පඤ්ඤපෙති - මජ්ඣං. ස්‍යා.

විඥනයෙන් බැහැර සත්ත්ව වේ යයි දකිහි ද ? වහන්ස මෙය නො වේ මැ යි.

අනුරාධය, ඒ කිමෙකැ යි හ ගිහි ද, රූපය–වේදනාව–සංඥව–සංස්කාර–විඥනය සත්ත්ව වේ යයි දකිහි ද ? වහන්ස, මෙය නො වේ මැ ය.

අනුරාධය ඒ කිමැයි හඟියි ද ? රූප නොවූ වේදනා නොවූ සංඥ නො වූ සංස්කාර නො වූ විඥන නොවූ මේ පුද්ගල සත්ත්ව යි දකිහි ද ? වහන්ස, මෙය නො වේ මැ යි.

අනුරාධය මෙහි ලා මේ අත්බැව්හි ම සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් තොපට සත්ත්වයකු නො ලැබෙන කල්හි ''ඇවැත්නි උත්තමපුරුෂ වූ පරමපුරුෂ වූ පරම ප්‍රාප්තියට පැමිණි යම් ඒ තථාගත (සත්ත්ව) ට නම් තථාගතයෝ ඒ සත්ත්වයා පනවන්නාහු සත්ත්ව මරණින් මතු වෙයි හෝ සත්ත්ව මරණින් මතු නො වෙ යි හෝ සත්ත්ව මරණින් මතු වෙයි නො ද වෙයි හෝ සත්ත්ව මරණින් මතු නො ද වෙයි, නො ද නො වෙ යි හෝ යන මේ සිවු තැනින් වෙන් ව පනව ති''යිතොපගේ ඒ විසඳීම නියි ද ? වහන්ස, තෙල නො වේ මැ යි.

අනුරාධය, මැනැවි මැනැවි. අනුරාධය පෙරද්‍ද දනුදු මම් දුඃඛයත් දුඃඛනිරෝධයත් පනවමියි.

## 1. 2. 4. 5.

## වක්කලි සූත්‍රය

87. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසනසේක. එ කල්හි ආයුෂ්මත් වක්කලි තෙරණුවෝ හටගත් ආබාධ ඇත්තාහු දුකට පැමිණියාහු දැඩි සේ ගිලන් වූවාහු කුඹල් කම්හලෙහි වැඩ වෙසෙති.

එ කල්හි ආයුෂ්මත් වක්කලි තෙරණුවෝ උපස්ථායකයන් ඇමතූහ : ඇවැත්නි, එව, තෙපි භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹෙවු. එළැඹැ '' වහන්ස වක්කලි මහණ හටගත් ආබාධ ඇත්තේ දුඃඛිතවූයේ දැඩි සේ ගිලන් වෙයි. හේ භාග්‍යවතුන් වහන්සේගේ පා සඟළ හිසින් වඳී යයි මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පා සඟළ හිසින් වඳිවු. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස වක්කලි මහණහු වෙත එළඹෙනසේක් නම් මැනැවි යි. මෙසේත් කියවු '' යි.

ඇවැත්නි, එසේ යයි ඒ භික්ෂූහු ආයුෂ්මත් වක්කලි තෙරුන්ට පිළිවදන් අස්වා භාග්‍ය වතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත් පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ : '' වහන්ස, වක්කලි මහණ හටගත් ආබාධ ඇත්තේ දුඃඛිත වූයේ දැඩි ගිලන් වෙයි. භාග්‍යවතුන් වහන්සේගේ පා සඟළ හිසින් වඳී, මෙසේත් කිය යි : '' වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස වක්කලි මහණහු වෙත එළැඹෙනසේක් නම් මැනැවි'යි. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දභාවයෙන් ඉවසූසේක.

අථ ඛො භගවා නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙනායස්මා වක්කලි තෙනුපසඞ්කමි. අද්දසා ඛො ආයස්මා වක්කලී භගවන්තං දූරතොව ආගච්ඡන්තං දිස්වාන මඤ්චකෙ සමඤ්චොසි.[1]

අථ ඛො භගවා ආයස්මන්තං වක්කලිං එතදවොච : "අලං වක්කලි මා ත්වං මඤ්චකෙ සමඤ්චොසි. සන්තිමානි ආසනානි පඤ්ඤත්තානි, තත්ථාහං නිසීදිස්සාමී"ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං වක්කලිං එතදවොච :

කච්චි තෙ වක්කලි, ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි තෙ දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති, පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති?

න මෙ භන්තෙ, ඛමනීයං, න යාපනීයං. බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති. අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

කච්චි තෙ වක්කලි, න කිඤ්චි කුක්කුච්චං න කොචි විප්පටිසාරොති? තග්ඝ මෙ භන්තෙ, අනප්පකං කුක්කුච්චං අනප්පකො විප්පටිසාරොති.

කච්චි පන තං වක්කලි, අත්තා සීලතො න උපවදතීති? න ඛො මං භන්තෙ, අත්තා සීලතො උපවදතීති.

නො චෙ කිර තං වක්කලි, අත්තා සීලතො උපවදති, අථ කිඤ්ච[2] තෙ කුක්කුච්චං කො ච විප්පටිසාරොති? චිරපටිකාහං භන්තෙ, භගවන්තං දස්සනාය උපසඞ්කමිතුකාමො. නත්ථි ච මෙ කායස්මිං තාවතිකා බලමත්තා, යාවතාහං[3] භගවන්තං දස්සනාය උපසඞ්කමෙය්‍යන්ති.

අලං වක්කලි, කිං තෙ ඉමිනා පූතිකායෙන දිට්ඨෙන, යො ඛො, වක්කලි, ධම්මං පස්සති සො මං පස්සති, යො මං පස්සති සො ධම්මං පස්සති, ධම්මං හි වක්කලි, පස්සන්තො මං පස්සති. මං පස්සන්තො ධම්මං පස්සති. තං කිං මඤ්ඤසි වක්කලි, "රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති? නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා-සඞ්ඛාර-විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ -පෙ- එසො මෙ අත්තාති? නො හෙතං භන්තෙ.

---

1. මඤ්චකෙ සමධොසි - මජසං.
2. කිස්මිඤ්ච - සී 2.
3. යාහං - සීමු. යායාහං - PTS.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැඳ පෙරව පාසිවුරු ගෙන ආයුෂ්මත් වක්කලි තෙරුන් වෙත එළඹිසේක. ආයුෂ්මත් වක්කලි තෙරණුවෝ වඩනා භාග්‍යවතුන් වහන්සේ දුරදීම දුටහ. දැක ඇඳෙන් නැඟී සිටීමට උත්සාහ ධරූහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් වක්කලි තෙරුන්හට තෙල වදළසේක : '' වක්කලි කම් නැත, තෙපි ඇඳෙන් නැඟී සිටීමට නහමක් උත්සාහ ධරව. මෙ පනවනලද අසුන් ඇත, මම එහි හිඳිමි '' යි භාග්‍යවතුන් වහන්සේ පැනවූ අසුන්හි හුන්සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ආයුෂ්මත් වක්කලි තෙරුන්හට තෙල වදළසේක :

'' වක්කලි කිම, තොපට ඉවසිය හැකි ද ? කිම යැපිය හැකි ? කිම, දුක් වේදනා අඩු වේ ද, වැඩි නො වේ ද ? මේ දුක් වේදනාවන්ගේ අඩුවීම පැනෙයි ද, වැඩිවීම නො පනේ ද ? ''

'' වහන්ස මට නො සැහිය හැක්කැ, නො යැපිය හැකි. මාගේ දැඩි දුක් වේදනා වැඩිවෙයි අඩු නො වේ. මේ දුක් වේදනාවන්ගේ වැඩීම පැනෙයි, නැවැත්ම නො පැනේ යි.

වක්කලි කිම තොපට කිසියම් කුකුසෙක් නැද්ද ? කිසියම විපිළිසරෙක් නැද්ද ? වහන්ස, මට ඒකාන්තයෙන් කුකුස් අනල්ප ය, විපිළිසර අනල්ප යයි.

වක්කලි කිම තෙමේ තොපට ශීලයෙන් උපවාද නො කෙරේ ද ? වහන්ස, තෙමේ මට ශීලයෙන් උපවාද නො කෙරේ යයි.

වක්කලි, ඉදින් තෙමෙ තොපට ශීලයෙන් උපවාද නො කෙරේ නම් එ කල්හි තොපගේ කුකුස කිම, විපිළිසර කිම ? වහන්ස, මම බොහෝ කලෙක පටන් භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස එළඹෙනු කැමැත්තෙමි. යම්තාක් මම භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස එළඹෙන්නෙම් නම් එපමණකුත් බලමාත්‍රයෙක් මා සිරුරෙහි නැති.

වක්කලිය, කම් නැත. මේ කුණුකය දැකීමෙන් තොපට කවර වැඩෙක් ද ? වක්කලි යමෙක් ධර්මය දකී නම් හේ මා දකියි, යමෙක් මා දකී නම් හේ ධර්මය දකියි. වක්කලි, දහම් දක්නේ මා දකියි, මා දක්නේ දහම් දකී. වක්කලි ඒ කිමැයි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේද ? යි. වහන්ස අනිත්‍ය ය.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද? සුව හෝ වේ ද? යි. වහන්ස, දුක් ය.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි නම් එය '' තෙල මගේය, තෙලෙ මම් වෙමි, තෙල මාගේ ආත්ම '' යි. දක්නට සුදුසු දැ යි ?. වහන්ස මෙය නො වේ ම ය.

වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? යි වහන්ස, අනිත්‍ය ය ... තෙල මාගේ ආත්ම යි, (දක්නට සුදුසු දැ යි?.) වහන්ස, මෙය නො වේ ම ය.

16–ජ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

තස්මාතිහ වක්කලි -පෙ- එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

අථ ඛො භගවා ආයස්මන්තං වක්කලිං ඉමිනා ඔවාදෙන ඔවදිත්වා උට්ඨායාසනා යෙන ගිජ්ඣකූටො පබ්බතො තෙන පක්කාමි.

අථ ඛො ආයස්මා වක්කලි අචිරපක්කන්තස්ස භගවතො උපට්ඨාකෙ ආමන්තෙසි: "එථ මං ආවුසො මඤ්චකං ආරොපෙත්වා යෙන ඉසිගිලිපස්සං කාළසිලා තෙනුපසඞ්කමථ. කථං හි නාම මාදිසො අන්තරඝරෙ කාලං කත්තබ්බං මඤ්ඤෙය්‍යා"ති.

එවමාවුසොති ඛො තෙ භික්ඛු ආයස්මතො වක්කලිස්ස පටිස්සුත්වා ආයස්මන්තං වක්කලිං මඤ්චකං ආරොපෙත්වා යෙන ඉසිගිලිපස්සං කාළසිලා තෙනුපසඞ්කමිංසු.

අථ ඛො භගවා තඤ්ච රත්තිං තඤ්ච දිවසාවසෙසං ගිජ්ඣකූටෙ පබ්බතෙ විහාසි.

අථ ඛො ද්වෙ දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු, එකමන්තං ඨිතා ඛො එකා දෙවතා භගවන්තං එතදවොච: වක්කලි භන්තෙ, භික්ඛු විමොක්ඛාය චෙතෙතී'ති. අපරා දෙවතා භගවන්තං එතදවොච: "සො හි නූන භන්තෙ,[1] සුවිමුත්තො විමුච්චිස්සතී'ති, ඉදමවොචුං. තා දෙවතායො ඉදං වත්වා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායිංසු.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛු ආමන්තෙසි: "එථ තුම්හෙ භික්ඛවෙ, යෙන වක්කලි භික්ඛු තෙනුපසඞ්කමථ, උපසඞ්කමිත්වා වක්කලිං භික්ඛුං එවං වදෙථ: "සුණාවුසො[2] වක්කලි, භගවතො වචනං ද්වින්නඤ්ච දෙවතානං, ඉමං ආවුසො රත්තිං ද්වෙ දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො ආවුසො එකා දෙවතා භගවන්තං එතදවොච: "වක්කලි භන්තෙ, භික්ඛු විමොක්ඛාය චෙතෙතී"ති. අපරා දෙවතා භගවන්තං එතදවොච: "සො හි නූන භන්තෙ[2] සුවිමුත්තො විමුච්චිස්සතී"ති, භගවා ච තං ආවුසො වක්කලි, එවමාහ. "මා භායි වක්කලි, අපාපකං තෙ මරණං භවිස්සති අපාපිකා කාලකිරියා"ති.

එවං භන්තෙති ඛො තෙ භික්ඛු භගවතො පටිස්සුත්වා යෙනායස්මා වක්කලි තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා ආයස්මන්තං වක්කලිං එතදවොචුං: "සුණාවුසො වක්කලි,[3] භගවතො වචනං ද්වින්නඤ්ච දෙවතාන"න්ති.

---

1. සො භන්තෙ – සි, සීමු, ස්‍යා.
2. සො හි නූන සො භන්තෙ – සීමු, සි, 2, ස්‍යා
3. සුණාවුසො ත්වං – මජසං, ස්‍යා.

වක්කලිය, එහෙයින් මෙහි ලා ... මෙසේ දක්නා ... මේ බැව් පිණිස අනෙකෙක් නැතැයි දැනගනී යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් වක්කලි තෙරුන්ට මේ අවවාදයෙන් අවවාද කොට හුනස්නෙන් නැඟී ගිජ්ඣකූළපව්ව වෙත වැඩම කළ සේක.

එ කල්හි ආයුෂ්මත් වක්කලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වැඩම කළ නොබෝ කල්හි උපස්ථායකයන් ඇමතූහ. ඇවැත්නි, එවූ. මා ඇඳකට නංවා ගෙන ඉසිගිලිපස කළුගල්තලාව වෙත එළඹෙවූ. කෙසේ මා වැන්නෙක් ඇතුළුගම කලුරියකළයුතු කොට හඟනේ දැ'යි.

ඇවැත්නි, එසේ යයි ඒ භික්ෂූහු ආයුෂ්මත් වක්කලි තෙරුන්ට පිළිතුරු දී ආයුෂ්මත් වක්කලි තෙරුන් ඇඳකට නංවාගෙන ඉසිගිලි පස කළුගල්තලාව වෙත එළැඹියහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ රැයත් ඉතිරි දහවලත් ගිජුකුළු පව්වෙහි විසූ සේක.

ඉක්බිති රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මනා ජව්වර්ණ ඇති දේවතාවෝ දෙදෙනෙක් මුළු ගිජ්ඣකූළපව්ව බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේට " වහන්ස වක්කලි මහණ මාර්ගවිමොක්ෂය පිණිස සිතා ය''යි තෙල සැලකෙළේ ය. අනෙක් දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට ''වහන්ස, ඒතෙමේ ඒකාන්තයෙන් අර්හත්ඵල විමුක්තියෙන් විමුක්තව මිදෙන්නේ''යයි තෙල සැල කෙළේය. ඒ දේවතාවෝ මෙය කීහ. මෙය කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් වූහු.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රැය ඇවෑමෙන් භික්ෂූන් ඇමතූසේක : මහණෙනි, එව, තෙපි වක්කලි මහණ වෙත එළඹෙවූ. එළඹ වක්කලි මහණහට මෙසේ කියවූ : ඇවැත්නි, වක්කලිය, භාග්‍යවතුන් වහන්සේගේ ද දෙවියන් දෙදෙනකුන්ගේ ද වදන් අසව. ඇවැත්නි, මේ රැය, මනහර ජව්වර්ණ ඇති දෙවියෝ දෙදෙනෙක් රෑ පෙරයම ඉක්ම ගිය කල්හි මුළු ගිජ්ඣකුළු පව්ව බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියහ. ඇවැත්නි, එකත් පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේට '' වහන්ස, වක්කලි මහණ තෙමේ මාර්ග විමොක්ෂය පිණිස සිතා යයි මෙය සැලකෙළේ ය. අනෙක් දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට '' වහන්ස, ඒතෙමේ ඒකාන්තයෙන් අර්හත්ඵල විමුක්තියෙන් විමුක්තව මිදෙන්නේ යයි මෙය සැලකෙළේ ය. ඇවැත්නි වක්කලි, භාග්‍යවතුන් වහන්සේ ද තොපට '' වක්කලි නහමක් බිය වවූ. වක්කලි නහමක් බිය වවූ. තොපගේ මරණය අලාමක වන්නේ ය. කාලක්‍රියාව අලාමක වන්නී යයි මෙසේ වදාළ සේකැ''යි.

වහන්ස, එසේ යයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් අස්වා ආයුෂ්මත් වක්කලි තෙරුන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් වක්කලි තෙරුන්ට '' ඇවැත්නි වක්කලි ය, භාග්‍යවතුන් වහන්සේගේත් දෙවියන් දෙදෙනකුන්ගේත් වදන් අසව යි. තෙල කීහු.

අථ ඛො ආයස්මා වක්කලී උපට්ඨාකෙ ආමන්තෙසි: “එථ මං ආවුසො, මඤ්චකා ඔරොපෙථ, කථං හි නාම මාදිසො උච්චෙ ආසනෙ නිසීදිත්වා තස්ස භගවතො සාසනං සොතබ්බං මඤ්ඤෙය්‍යා”ති.

එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො වක්කලිස්ස පටිස්සුත්වා ආයස්මන්තං වක්කලිං මඤ්චකා ඔරොපෙසුං.

ඉමං ආවුසො රත්තිං ද්වෙ දෙවතායො අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ගිජ්ඣකූටං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු, එකමන්තං ඨිතා ඛො ආවුසො එකා දෙවතා භගවන්තං එතදවොච: “වක්කලි භන්තෙ, භික්ඛු විමොක්ඛාය චෙතෙතී”ති. අපරා දෙවතා භගවන්තං එතදවොච: ‘සො හි නූන භන්තෙ, සුවිමුත්තො විමුච්චිස්සතී”ති. භගවා ච තං ආවුසො වක්කලි, එවමාහ: “මා භායි වක්කලි, මා භායි වක්කලි, අපාපකං තෙ මරණං භවිස්සති, අපාපිකා කාලකිරියා”ති.

තෙනහාවුසො මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දථ. “වක්කලි භන්තෙ, භික්ඛු ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සො භගවතො පාදෙ සිරසා වන්දති, එවඤ්ච වදෙති[1]: “රූපං අනිච්චං තාහං භන්තෙ, න කඞ්ඛාමි “යදනිච්චං තං දුක්ඛන්ති න විචිකිච්ඡාමි. යදනිච්චං දුක්ඛං විපරිණාමධම්මං නත්ථි මෙ තත්ථ ඡන්දො වා රාගො වා පෙමං වාති න විචිකිච්ඡාමි, වෙදනා අනිච්චා තාහං භන්තෙ, න කඞ්ඛාමි. -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චං තාහං භන්තෙ, න කඞ්ඛාමි, යදනිච්චං තං දුක්ඛන්ති න විචිකිච්ඡාමි, යදනිච්චං දුක්ඛං විපරිණාමධම්මං, නත්ථි මෙ තත්ථ ඡන්දො වා රාගො වා පෙමං වා”ති න විචිකිච්ඡාමී”ති.

එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො වක්කලිස්ස පටිස්සුත්වා පක්කාමිංසු.

අථ ඛො ආයස්මා වක්කලි අචිරපක්කන්තෙසු තෙසු භික්ඛූසු සත්ථං ආහරෙසි.[2]

අථ ඛො තෙ භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: වක්කලි භන්තෙ, භික්ඛු ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. සො භගවතො පාදෙ සිරසා වන්දති, එවඤ්ච වදෙති: රූපං අනිච්චං, තාහං භන්තෙ, න කඞ්ඛාමි, යදනිච්චං තං දුක්ඛන්ති න විචිකිච්ඡාමි යදනිච්චං දුක්ඛං විපරිණාමධම්මං නත්ථි මෙ තත්ථ ඡන්දො වා රාගො වා පෙමං වාති න විචිකිච්ඡාමි. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චං තාහං භන්තෙ න කඞ්ඛාමි, යදනිච්චං තං දුක්ඛන්ති න විචිකිච්ඡාමි, යදනිච්චං දුක්ඛං විපරිණාමධම්මං නත්ථි මෙ තත්ථ ඡන්දො වා රාගො වා පෙමං වාති න විචිකිච්ඡාමීති.

---

1. වන්දතීති ත්වං ච වදෙථ - මජසං.
2. ආහාරෙසි - සීමු.

එ කල්හි ආයුෂ්මත් වක්කලි තෙරණුවෝ උපස්ථායකයන් ඇමතූහ. ඇවැත්නි, එවූ, මා ඇඳෙන් බස්වවූ, කෙසේ නම් මා වැනියෙක් උසසුනෙක හිඳ ඒ භාග්‍යවතුන් වහන්සේගේ හසුන ඇසිය යුතු කොට හඟනේ ද ? යි.

ඇවත්නි, එසේ යයි ඒ භික්ෂූහු ආයුෂ්මත් වක්කලි තෙරුන්ට පිළිතුරු දී ආයුෂ්මත් වක්කලි තෙරුන් ඇඳෙන් බැස්වූහ.

ඇවැත්නි, මේ රැය මනහර ඡවිවර්ණ ඇති දෙවියෝ දෙදෙනෙක් රැපෙරයම ඉක්ම ගිය කල්හි මුළු ගිජිකුළු පව්ව බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියහ. ඇවැත්නි, එකත් පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේට '' වහන්ස වක්කලි මහණ මාර්ගවිමෝක්ෂය පිණිස සිතා ය ''යි තෙල සැලකෙළේය. අනෙක් දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට '' වහන්ස, හෙතෙමේ ඒකාන්තයෙන් අර්හත්ඵල විමුක්තියෙන් විමුක්තව මිදෙන්නේ ය''යි තෙල සැලකෙළේය. ඇවැත්නි, වක්කලිය, භාග්‍යවතුන් වහන්සේත් තොපට '' වක්කලි නහමක් බිය වවූ, වක්කලි නහමක් බිය වවූ. තොපගේ මරණය අලාමක වන්නේ ය. කාලක්‍රියාව අලාමක වන්නී ය''යි මෙසේ වදළ සේක යි.

ඇවැත්නි, එසේ වී නම් මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පා සඟළ හිසින් වඳිවූ. '' වහන්ස වක්කලි මහණ හටගත් ආබාධ ඇත්තේ දුඃඛිත වූයේ දැඩි සේ ගිලන් වෙයි. හේ භාග්‍යවතුන් වහන්සේගේ පාසඟළ හිසින් වඳියි. මෙසේත් කියයි : (කෙසේ යැ යත් :) රූපය අනිත්‍යය. වහන්ස මම් එය සැක නො කරමි. යමෙක් අනිත්‍ය නම් එය දුකැ යි විචිකිච්ඡා නො කරමි. යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස්වන සුලු නම් එහි මාගේ ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැ යි සැක නො කරමි. වේදනාව අනිත්‍ය ය. වහන්ස, එය මම සැක නො කරමි ... සංඥව ... සංස්කාර ... විඥනය අනිත්‍ය ය. වහන්ස, එය මම සැක නො කරමි. යමෙක් අනිත්‍ය නම් එය දුකැ යි විචිකිච්ඡා නො කරමි. යමක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වන ස්වභාව ඇත්තේ නම් එහි මාගේ ඡන්දයෙක් රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැ යි සැක නො කරමි''යි.

ඇවැත්නි, එසේ යයි ඒ භික්ෂූහු ආයුෂ්මත් වක්කලි තෙරුන්ට පිළිතුරු දී නික්මැ ගියහ.

ඉක්බිති ආයුෂ්මත් වක්කලි තෙරණුවෝ ඒ භික්ෂූන් ගිය නො බෝ කල්හි සැතකින් ගලනළ සිඳගත්හ.

එ කල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන්, වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන් සේට තෙල සැලකළහ : ''වහන්ස, වක්කලි මහණ හටගත් ආබාධ ඇත්තේ ය. දුඃඛිත වූයේ දැඩි සේ ගිලන් වෙයි. හේ භාග්‍යවතුන් වහන්සේගේ පාසඟුළුවන් දෙහොත් මුදුන් තබා වඳියි. මෙසේත් කියයි : රූපය අනිත්‍ය ය. එය මම සැක නො කරමි. යමෙක් අනිත්‍ය නම් එය දුකැ යි විචිකිච්ඡා නො කරමි. යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එහි මාගේ ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැ යි සැක නො කරමි. වේදනා ... සංඥා ... සංස්කාරයෝ ... විඥන අනිත්‍ය යැ. වහන්ස, එය මම සැක නො කරමි. යමෙක් අනිත්‍ය වී නම් එය දුකැයි විචිකිච්ඡා නො කරමි. යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වන සුලු නම එහි මාගේ ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රේමයෙක් හෝ නැතැයි සැක නො කරමි''යි.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. ආයාම භික්ඛවෙ, යෙන ඉසිගිලිපස්සං කාළසිලා තෙනුපසඞ්කමිස්සාම, යත්ථ වක්කලිනා කුලපුත්තෙන සත්ථං ආහරිතන්ති. "එවං භන්තෙ"ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං.

අථ ඛො භගවා සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං යෙන ඉසිගිලිපස්සං කාළසිලා තෙනුපසඞ්කමි, අද්දසා ඛො භගවා ආයස්මන්තං වක්කලිං දූරතොව මඤ්චකෙ විවත්තක්ඛන්ධං සෙමානං.

තෙන ඛො පන සමයෙන ධූමායිතත්තං තිමිරායිතත්තං ගච්ඡතෙව පුරිමං දිසං, ගච්ඡති පච්ඡිමං දිසං, ගච්ඡති උත්තරං දිසං, ගච්ඡති දක්ඛිණං දිසං, ගච්ඡති උද්ධං, ගච්ඡති අධො, ගච්ඡති[1] අනුදිසං.

අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, එතං[2] ධූමායිතත්තං තිමිරායිතත්තං ගච්ඡතෙව පුරිමං දිසං, ගච්ඡති පච්ඡිමං දිසං, ගච්ඡති උත්තරං දිසං, ගච්ඡති දක්ඛිණං දිසං, ගච්ඡති උද්ධං, ගච්ඡති අධො, ගච්ඡති අනුදිසන්ති? එවං භන්තෙ.

එසො ඛො භික්ඛවෙ, මාරො පාපිමා වක්කලිස්ස කුලපුත්තස්ස විඤ්ඤාණං සමන්වෙසති, කත්ථ වක්කලිස්ස කුලපුත්තස්ස විඤ්ඤාණං පතිට්ඨිතන්ති.

අප්පතිට්ඨිතෙන ච භික්ඛවෙ, විඤ්ඤාණෙන වක්කලි කුලපුත්තො පරිනිබ්බුතොති.

## 1. 2. 4. 6.

## අස්සජි සුත්තං

88. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා අස්සජි කස්සපකාරාමෙ විහරති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො.

අථ ඛො ආයස්මා අස්සජි උපට්ඨාකෙ ආමන්තෙසි "එථ තුම්හෙ ආවුසො යෙන භගවා තෙනුපසඞ්කමථ, උපසඞ්කමිත්වා මම වචනෙන භගවතො පාදෙ සිරසා වන්දථ "අස්සජි භන්තෙ, භික්ඛු ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සො භගවතො පාදෙ සිරසා වන්දතී"ති, එවඤ්ච වදෙථ: "සාධු කිර භන්තෙ, භගවා යෙන අස්සජි භික්ඛු තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා"ති. එවමාවුසොති ඛො තෙ භික්ඛූ ආයස්මතො අස්සජිස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: අස්සජි භන්තෙ, භික්ඛු ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො සො භගවතො පාදෙ සිරසා වන්දති, එවං ච[3] වදෙති; සාධු කිර භන්තෙ, භගවා යෙන අස්සජි භික්ඛු තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා'ති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

---

1. උද්ධං දිසං ගච්ඡති අධො දිසං - මජ්ඣං, ස්‍යා.
2. එවං - ස්‍යා.
3. එවං - ස්‍යා.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, යම්හ වක්කලි කුලපුත්‍ර විසින් යම් තැනෙක දී සැතෙකින් ගලනාල සිඳ ගන්නා ලද ද, ඒ ඉසිගිලිපස කළුගල් තලාව වෙත එළඹෙන්නෙමු යි. වහන්ස, එසේ යයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් සමග ඉසිගිලිපස කළුගල්තලාව වෙත එළැඹි සේක. භාග්‍යවතුන් වහන්සේ පෙරළුණු කඳ ඇති ව ඇඳෙහි හොත්නා, ආයුෂ්මත් වක්කලි තෙරහු දුර දී ම දුටු සේක.

එ සමයෙහි දුමනබවෙක් අඳුරුබවෙක් පෙරදිගට යේ ම ය. පැසුළුදිගට යෙයි. උතුරු දිගට යෙයි. දකුණු දිගට යෙයි. උඩට යෙයි. යටට යෙයි. අනුදිගට යෙයි.

එ කල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, තෙපි පෙරදිගට යන පැළදිගට යන උතුරු දිගට යන දකුණුදිගට යන උඩට යන යටට යන අනුදිගට යන මේ දුමනබව අඳුරුබව දකිවු ද ? වහන්ස, එසේ යැ.

මහණෙනි, මෙතෙල පවිටු මරු ය. වක්කලි කුලපුතුගේ විඥනය කොහි පිහිටියේ දැ යි. වක්කලි කුලපුතුගේ විඥනය සොයයි.

මහණෙනි, වක්කලි කුලපුත් නො පිහිටි විඥනයෙන් පිරිනිවියේ යි වදළසේක.

## 1. 2. 4. 6.

## අස්සජි සූත්‍රය

88. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එ සමයෙහි ආයුෂ්මත් අස්සජි තෙරණුවෝ හටගත් ආබාධ ඇත්තාහු දුඃඛිත වූවාහු දැඩි සේ ගිලන් වූවාහු කස්සපකාරාමයෙහි (කසුප් සිටු විසින් කරවන ලද අරම්හි) වැඩවෙසෙති.

එ කල්හි ආයුෂ්මත් අස්සජි තෙරණුවෝ උපස්ථායකයන් ඇමතූහ. ''ඇවැත්නි, එවු, තෙපි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹෙවු ; ''වහන්ස, අස්සජි මහණ හටගත් ආබාධ ඇත්තේ යැ. දුකට පැමිණියේ යැ දැඩිසේ ගිලන් වෙයි. හේ භාග්‍යවතුන් වහන්සේගේ පාසහළුවන් දෙහොත් මුඳුන් තබා වඳී යයි මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාසහුළුවන් දෙහොත් මුදුන්හි තබා වඳිවු. මෙසේත් කියවු ''වහන්ස භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස අස්සජි මහණහු වෙත එළඹෙන සේක් නම් මැනැවැ'' යි. ඇවැත්නි, එසේ යයි ඒ භික්ෂූහු ආයුෂ්මත් අස්සජි තෙරුන්ට' පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත් පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. වහන්ස, අස්සජි මහණ හටගත් ආබාධ ඇත්තේ යැ. දුඃඛිත යැ දැඩිසේ ගිලන් වෙයි. හේ භාග්‍යවතුන් වහන්සේගේ පාසහුළුවන් හිස් මුඳුනින් වඳියි. මෙසේත් කියයි : වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා පිණිස අස්සජි මහණහු වෙත එළඹෙන සේක් නම් මැනැවැ යි. භාග්‍යවතුන් වහන්සේ මුනින් නො බැණ ඉවසූ සේක.

අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා අස්සජි තෙනුපසඞ්කමි. අද්දසා ඛො ආයස්මා අස්සජි භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන මඤ්චකෙ සමඤ්චොසි.[1]

අථ ඛො භගවා ආයස්මන්තං අස්සජිං එතදවොච: අලං අස්සජි, මා ත්වං මඤ්චකෙ සමඤ්චොසි, සන්තිමානි ආසනානි පඤ්ඤත්තානි. තත්ථාහං නිසීදිස්සාමීති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ, නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං අස්සජිං එතදවොච: "කච්චි තෙ අස්සජි ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති? පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමො'ති?

න මෙ භන්තෙ, ඛමනීයං, න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා, අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති, නො පටික්කමොති.

කච්චි තෙ අස්සජි න කිඤ්චි කුක්කුච්චං න කොචි විප්පටිසාරොති?

තග්ඝ මෙ භන්තෙ, අනප්පකං කුක්කුච්චං අනප්පකො විප්පටිසාරොති.

කච්චි පන තං අස්සජි, අත්තා සීලතො න උපවදතීති?

න ඛො මං භන්තෙ, අත්තා සීලතො උපවදතීති.

නො චෙ කිර තං අස්සජි අත්තා සීලතො උපවදති,

අථ කිඤ්ච තෙ කුක්කුච්චං, කො ච විප්පටිසාරොති?

පුබ්බෙ ඛ්වාහං භන්තෙ, ගෙලඤ්ඤෙ[2] පස්සම්භෙත්වා කායසඞ්ඛාරෙ විහරාමි.[3] සොහං[4] තං සමාධිං නප්පටිලභාමි. තස්ස මය්හං භන්තෙ, තං සමාධිං අප්පටිලභතො එවං හොති "නො ච ඛ්වාහං පරිහායාමී"ති.

යෙ තෙ අස්සජි, සමණබ්‍රාහ්මණා සමාධිසාරකා සමාධිසාමඤ්ඤා තෙසං තං සමාධිං අප්පටිලභතං එවං හොති "නො ච මයං පරිහායාමා"ති.

තං කිං මඤ්ඤසි අස්සජි, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

තස්මාතිහ අස්සජි -පෙ- එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාති.

---

1. මඤ්චකෙ සමධොසි - මජ්ඣං.
2. ගෙලඤ්ඤං - සීමු.
3. විප්පටිසාරී විහරාමි - සීමු.
4. සොහං - PTS.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස්කල ඵලසමවතින් නැඟිසිටි සේක් ආයුෂ්මත් අස්සජි තෙරුන් වෙත එළඹිසේක. ආයුෂ්මත් අස්සජි තෙරණුවෝ වැඩම කරන භාග්‍යවතුන් වහන්සේ දුරදී ම දුටහ. දැක ඇඳෙන් නැඟී සිටීමට උත්සාහ දරන අයුරක් දක්වූහ.

එ කල්හි භාග්‍යවතුන් වහන්සේ අස්සජි තෙරුන්ට තෙල වදාළ සේක : ''අස්සජි, කම් නැත. තෙපි ඇඳෙන් නැඟී සිටීමට උත්සාහ නො දරවු. පනවන ලද මේ අසුන් ඇත. මම එහි හිඳින්නෙමි ''යි භාග්‍යවතුන් වහන්සේ පනවන ලද අස්නෙහි වැඩහුන් සේක, වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අස්සජි තෙරුන්ට තෙල වදාළ සේක : ''අස්සජි. කිම. තොපට ඉවසිය හැකි ද ? කිම යැපිය හැකි ද ? කිම දුක් වේදනාවෝ පිරිහෙද්ද ? නො වැඩෙත්ද ? මේ දුක්වේදනාවන්ගේ පිරිහීම පැනෙයි ද ? වැඩීම නො පැනේ දැ යි ?

වහන්ස, මට නොඉවසිය හැකි ය. නො යැපිය හැකි ය. මාගේ දුක්වේදනාවෝ වැඩෙති. නො පිරිහෙති. මේ දුක් වේදනාවන්ගේ වැඩීම පැනෙයි, පිරිහීම නො පැනේ යි.

අස්සජිය, කිම ? තොපට කිසියම් කුකුසෙක් නැද්ද ? කිසි යම් විපිළිසරෙක් නැද්දැ ?යි.

වහන්ස, මට ඒකාන්තයෙන් කුකුස් අනල්ප ය, විපිළිසර අනල්පය යි.

අස්සජි කිම. තෙමේ තොපට ශීලයෙන් උපවාද නො කෙරේ දැ යි ?

වහන්ස, මට තෙමේ ශීලයෙන් උපවාද නො කෙරේ ය යි.

අස්සජිය, ඉදින් තෙමේ තොපට ශීලයෙන් උපවාද නො කෙරේ නම් එ කල්හි තොපගේ කුකුස කිමෙක් ද ? විපිළිසර කිමෙක් දැ ? යි.

වහන්ස, පෙර මම ගිලන්බැව්හි කායසංඛාරයන් (අස්සාස පස්සාස දෙක) සන්හිඳුවා වෙසෙමි. මම ඒ සමාධිය නො පිළිලබමි. වහන්ස, ඒ සමාධිය නොපිළි ලබන මට ''මම නො ද පිරිහෙමි දැ?'' යි මෙ බඳු සිතෙක් වෙයි.

අස්සජි, සමාධිය සාර කොට ඇති සමාධිය ශ්‍රමණ බව කොට ඇති යම් ඒ මහණ බමුණෝ වෙත් නම් ඒ සමාධිය නො පිළිලබන ඔවුන්ට 'අපි පිරිහෙන්නමෝ නො වමු දැ'යි මෙ බඳු සිතෙක් වෙයි.

අස්සජි, ඒ කිමැ ?යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ ? අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය ය . . .

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඤ්ඤානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය ය . . .

අස්සජි එහෙයින් මෙහි ලා . . . මෙසේ දක්නා . . . මේ බව පිණිස අනෙකෙක් නැතැ යි දැනගනී.

සො සුඛං චෙ වෙදනං වෙදියති සා අනිච්චාති පජානාති. අනජ්ඣොසිතාති පජානාති අනභිනන්දිතාති පජානාති, දුක්ඛං චෙ වෙදනං වෙදියති සා අනිච්චාති පජානාති අනජ්ඣොසිතාති පජානාති අනභිනන්දිතාති පජානාති. අදුක්ඛමසුඛං චෙ වෙදනං වෙදියති සා අනිච්චාති පජානාති අනජ්ඣොසිතාති පජානාති, අනභිනන්දිතාති පජානාති.

සො සුඛං චෙ වෙදනං වෙදියති විසඤ්ඤුත්තො නං වෙදියති. දුක්ඛඤ්චෙ වෙදනං වෙදියති විසඤ්ඤුත්තො නං වෙදියති, අදුක්ඛමසුඛඤ්චෙ වෙදනං වෙදියති විසඤ්ඤුත්තො නං වෙදියති, සො කායපරියන්තිකඤ්චෙ වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති, ජීවිතපරියන්තිකඤ්චෙ වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති. කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතීභවිස්සන්තීති පජානාති.

සෙය්‍යථාපි අස්සජි, තෙලඤ්ච පටිච්ච වට්ටිඤ්ච පටිච්ච තෙලප්පදීපො ඣායෙය්‍ය. තස්සෙව තෙලස්ස ච වට්ටියා ච පරියාදානා අනාහාරො නිබ්බායෙය්‍ය, එවමෙව ඛො අස්සජි භික්ඛු කායපරියන්තිකං වෙදනං වෙදියමානො කායපරියන්තිකං වෙදනං වෙදියාමීති පජානාති, ජීවිතපරියන්තිකං වෙදනං වෙදියමානො ජීවිතපරියන්තිකං වෙදනං වෙදියාමී'ති පජානාති, කායස්ස භෙදා උද්ධං ජීවිතපරියාදානා ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීතීභවිස්සන්තීති පජානාතීති.

## 1. 2. 4. 7.

### ඛෙමක සුත්තං

89. එකං සමයං සම්බහුලා ථෙරා භික්ඛූ කොසම්බියං විහරන්ති ඝොසිතාරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ඛෙමකො බදරිකාරාමෙ විහරති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො.

අථ ඛො ථෙරා භික්ඛූ සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතා ආයස්මන්තං දාසකං ආමන්තෙසුං: ''එහි ත්වං ආවුසො දාසක, යෙන ඛෙමකො භික්ඛු තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා ඛෙමකං භික්ඛුං එවං වදෙහි: ථෙරා තං ආවුසො ඛෙමක, එවමාහංසු: ''කච්චි තෙ ආවුසො ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති? පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති?

''එවමාවුසොති ඛො ආයස්මා දාසකො ථෙරානං භික්ඛූනං පටිස්සුත්වා යෙනායස්මා ඛෙමකො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං ඛෙමකං එතදවොච: ''ථෙරා තං ආවුසො ඛෙමක, එවමාහංසු: කච්චි තෙ ආවුසො ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති? පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති?

Free Distribution www.aathaapi.org

හේ ඉදින් සුවවේදනාවක් විඳී ද, එය අනිත්‍ය යයි දනියි, (තෘෂ්ණාදෘෂ්ටි විසින්) නො බැසගන්නා ලද්ද යි දනියි, නො පතන ලද්ද යි දනියි, ඉදින් දුක්වේදනාවක් විඳී ද, එය අනිත්‍ය යයි දනියි. නොබැසගන්නා ලද්ද යි දැනගනියි, නොපතන ලද්ද යි දැනගනියි, ඉදින් නොදුක් නොසුව වේදනාවක් විඳී ද එම අනිත්‍ය ය යි දැනගනියි, (තෘෂ්ණා දෘෂ්ටි විසින්) නො බැසගන්නා ලද්ද යි දැනගනියි, නො පතන ලද්ද යි දැනගනී.

ඉදින් හේ සුවවේදනාවක් විඳී නම් (තණ්හා වශයෙන්) නො යෙදී එය විඳියි. ඉදින් දුක්වේදනාවක් විඳී නම් නො යෙදී එය විඳියි. ඉදින් නො දුක් නො සුව වේදනාවක් විඳී නම් නො යෙදී එය විඳියි. හේ කය හිම් කොට ඇති වේදනාවක් විඳී නම් කය හිම් කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනියි, ඉදින් දිවි හිම් කොට ඇති වේදනාවක් විඳී නම් දිවි හිම් කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනියි, කය බිඳීමෙන් මතු දිවි කෙළවර වීමෙන් නො පතන ලද සියලු වේදනාවෝ මෙහි ම සන්හිඳෙන්නාහ යි දැනගනී.

අස්සජි, යම්සේ තෙලත් නිසා වැටියත් නිසා තෙල්පහන දැල්වෙන්නේ ද, එ ම තෙලත් වැටියත් ගෙවී යෑමෙන් ප්‍රත්‍යය රහිත වැ නිවෙන්නේ ද, අස්සජි, එසෙයින් ම මහණ කය හිම් කොට ඇති වේදනාවක් විඳින්නේ කය හිම් කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනියි, දිවි හිම් කොට ඇති වේදනාවක් විඳින්නේ දිවි හිම් කොට ඇති වේදනාවක් විඳිමි යි දැනගනියි. කය බිඳීමෙන් මතු දිවි කෙළවර වීමෙන් නො පතන ලද සියලු වේදනාවෝ මෙහි ම සන්හිඳෙන්නාහ යි දැනගනි යි.

## 1. 2. 4. 7.

## ඛෙමක සූත්‍රය

89. එක්කලෙක බොහෝ වූ ස්ථවිර භික්ෂූහු කොසඹෑ නුවර සමීපයෙහි ඝෝසිතාරාමයෙහි වැඩවෙසෙත්. එසමයෙහි ආයුෂ්මත් ඛෙමක තෙරණුවෝ හටගත් ආබාධ ඇත්තාහු දුකට පැමිණියාහු දැඩි සේ ගිලන් වූවාහු බදරිකාරාමයෙහි වෙසෙති.

එ කල්හි ස්ථවිරභික්ෂූහු සවස්කලැ විවේකයෙන් නැඟී සිටියාහු ආයුෂ්මත් දසක තෙරුන් ඇමතූහ : ''ඇවැත්නි, දසකයෙනි, එවූ. තෙපි ඛෙමක තෙරුන් වෙත එළැඹෙවු. එළැඹැ ඛෙමක තෙරුන්ට මෙසේ කියවු. ඇවැත්නි, ඛෙමකයෙනි, ස්ථවිර භික්ෂූහු තොපට මෙසේ කීහ : ''ඇවැත්නි, කිම, තොපට ඉවසිය හැකි ද ? කිම යැපිය හැකි ද ? කිම දුක්වේදනාවෝ පිරිහෙද්ද ? නො වැඩෙද්ද ? මේ දුක්වේදනාවන්ගේ පිරිහීම පෙනේ ද ? වැඩීම නො පෙනේ ද''යි ?

ඇවැත්නි, එසේ ය යි ආයුෂ්මත් දසක තෙරණුවෝ ස්ථවිර භික්ෂූන්ට පිළිතුරු දී ආයුෂ්මත් ඛෙමක තෙරුන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ඛෙමක තෙරුන්ට මෙය කීහ : ''ඇවැත්නි, ඛෙමකයෙනි, තෙරහු තොපට මෙමෙය් කීහ : ''ඇවැත්නි, කිම ? තොපට ඉවසිය හැකි ද ? කිම ? යැපිය හැකි ද ? කිම දුක්වේදනාවෝ පිරිහෙත් ද, නො වැඩෙත් ද, මේ දුක්වේදනාවන්ගේ පිරිහීම පෙනෙයි ද වැඩීම නො පෙනේ ද යි ?

න මෙ ආවුසො ඛමනීයං න යාපනීයං, බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

අථ ඛො ආයස්මා දාසකො යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ එතදවොච: ඛෙමකො ආවුසො, භික්ඛු එවමාහ: "න මෙ ආවුසො ඛමනීයං න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති.

එහි ත්වං ආවුසො දාසක, යෙන ඛෙමකො භික්ඛු තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා ඛෙමකං භික්ඛුං එවං වදෙහි "ථෙරා තං ආවුසො ඛෙමක, එවමාහංසු: "පඤ්චිමෙ ආවුසො උපාදානක්ඛන්ධා වුත්තා භගවතා සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉමෙසු ආයස්මා ඛෙමකො පඤ්චසුපාදානක්ඛන්ධෙසු කිඤ්චි අත්තානං[1] වා අත්තනියං වා සමනුපස්සතීති?

එවමාවුසොති ඛො ආයස්මා දාසකො ථෙරානං භික්ඛූනං පටිස්සුත්වා යෙනායස්මා ඛෙමකො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා ආයස්මන්තං ඛෙමකං එතදවොච: "ථෙරා තං ආවුසො ඛෙමක, එවමාහංසු: "පඤ්චිමෙ ආවුසො උපාදානක්ඛන්ධා වුත්තා භගවතා සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉමෙසු ආයස්මා ඛෙමකො පඤ්චසුපාදානක්ඛන්ධෙසු කිඤ්චි අත්තානං[1] වා අත්තනියං වා සමනුපස්සතීති.

පඤ්චිමෙ ආවුසො උපාදානක්ඛන්ධා වුත්තා භගවතා සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො. ඉමෙසු ඛොහං[2] ආවුසො පඤ්චසුපාදානක්ඛන්ධෙසු න කිඤ්චි අත්තානං වා අත්තනියං වා සමනුපස්සාමීති.

අථ ඛො ආයස්මා දාසකො යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ එතදවොච: ඛෙමකො ආවුසො භික්ඛු එවමාහ: "පඤ්චිමෙ ආවුසො උපාදානක්ඛන්ධා වුත්තා භගවතා, සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො. ඉමෙසු ඛොහං ආවුසො පඤ්චසුපාදානක්ඛන්ධෙසු න කිඤ්චි අත්තානං වා අත්තනියං වා සමනුපස්සාමීති.

එහි ත්වං ආවුසො දාසක, යෙන ඛෙමකො භික්ඛු තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා ඛෙමකං භික්ඛුං එවං වදෙහි: ථෙරා තං ආවුසො ඛෙමක, එවමාහංසු: "පඤ්චිමෙ ආවුසො උපාදානක්ඛන්ධා වුත්තා භගවතා, සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො. නො චෙ කිරායස්මා ඛෙමකො ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු කිඤ්චි අත්තානං වා අත්තනියං වා සමනුපස්සති, තෙන'හායස්මා ඛෙමකො අරහං ඛීණාසවොති.

---

1. අත්තං - මජසං.
2. ඛ්වාහං - මජසං, සයා.

ඇවැත්නි, මට නොඉවසිය හැකි ය. නොයැපිය හැකි ය. මාගේ දැඩි දුක්වේදනාවෝ වැඩෙත්, නො පිරිහෙත්, මේ දුක්වේදනාවන්ගේ වැඩීම පෙනෙයි, පිරිහීම නො පෙනේ යි.

ඉක්බිති ආයුෂ්මත් දසක තෙරණුවෝ ස්ථවිර භික්ෂූන් වෙත එළඹියහ. එළඹ ස්ථවිර භික්ෂූන්ට මෙය කීහ : ඇවැත්නි, ඛෙමක භික්ෂු තෙමේ මෙසේ කී ය : ඇවැත්නි, මට නොඉවසිය හැකි ය, නො යැපිය හැකි ය. මාගේ දැඩි දුක්වෙදනාවෝ වැඩෙති, නො පිරිහෙත්. මේ දුක්වේදනාවන්ගේ වැඩීම පෙනෙයි, පිරිහීම නො පෙනේ යි.

ඇවැත්නි, දසකයෙනි, එව්. තෙපි ඛෙමක භික්ෂුහු වෙත එළඹෙව්. එළඹ ඛෙමක භික්ෂුහට මෙසේ කියවු : ''ඇවැත්නි, ඛෙමකයෙනි, තෙරහු තොපට මෙසේ කීහ : ''ඇවැත්නි, මේ පස් උපාදනස්කන්ධ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදහ. එනම් : රූපෝපාදනස්කන්ධ ය, වේදනෝපාදනස්කන්ධ ය, සංඥෝපාදනස්කන්ධ ය, සංස්කාරෝපාදනස්කන්ධ ය, විඥනෝපාදනස්කන්ධ යි. ආයුෂ්මත් ඛෙමක තෙමේ මේ පඤ්චෝපාදානස්කන්ධයන් අතුරෙන් කිසිවෙක් ආත්ම යි හෝ ආත්මයට අයත් යි හෝ දකී ද''යි ?

ඇවැත්නි එසේ ය යි ආයුෂ්මත් දසක ස්ථවිර තෙමේ ස්ථවිර භික්ෂූන්ට පිළිතුරු දී ආයුෂ්මත් ඛෙමක තෙරුන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ඛෙමක තෙරුන්ට මෙය කී ය : ''ඇවැත්නි ඛෙමකයෙනි, තෙරහු තොපට මෙසේ කීහ : ඇවැත්නි මේ පස් උපාදන ස්කන්ධ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදහ. එනම් : රූපෝපාදන ස්කන්ධ ය . . . විඥනෝපාදනස්කන්ධ යි. ආයුෂ්මත් ඛෙමක තෙමේ මේ පඤ්චෝ පාදනස්කන්ධයන් අතුරින් කිසිවක් ආත්ම යි හෝ ආත්මයට අයත් යි හෝ දකී ද?''යි

ඇවැත්නි, මේ පස් උපාදනස්කන්ධ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදහ. එනම් : රූපොපාදනස්කන්ධ ය ... විඥනොපාදනස්කන්ධ යි. ඇවැත්නි මේ පඤ්චොපාදනස්කන්ධයන් අතුරෙන් කිසිවක් ආත්ම ය යි හෝ ආත්මයට අයත් ය යි හෝ මම නො දකිමි යි.

ඉක්බිති ආයුෂ්මත් දසක ස්ථවිර තෙමේ ස්ථවිර භික්ෂූන් වෙත එළඹියේ ය. එළඹ ස්ථවිර භික්ෂූන්ට මෙය කී ය : ඇවැත්නි ඛෙමක භික්ෂු තෙමේ මෙසේ කී ය : ඇවැත්නි, මේ පස් උපාදනස්කන්ධ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදහ එනම් : රූපොපාදනස්කන්ධ ය, . . . විඥනොපාදනස්කන්ධ යි. ඇවැත්නි, මේ පඤ්චො පාදනස්කන්ධයන් අතුරින් කිසිවක් ආත්ම ය යි හෝ ආත්මයට අයත් ය යි හෝ මම නො දකිමි යි.

ඇවැත්නි, දසකයෙනි, එව්. තෙපි ඛෙමක භික්ෂුහු වෙත එළඹෙව්. එළඹ ඛෙමක භික්ෂුහට මෙසේ කියවු : ඇවැත්නි, ඛෙමකයෙනි, තෙරහු තොපට මෙසේ කීහ : ඇවැත්නි, මේ පස් උපාදනස්කන්ධ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදහ. එනම් : රූපෝපාදනස්කන්ධ ය ... විඥනෝපාදනස්කන්ධ යි. ආයුෂ්මත් ඛෙමක තෙමේ මේ පඤ්චෝපාදනස්කන්ධ අතුරින් කිසිවක් ආත්ම යි හෝ ආත්මයට අයත් යි හෝ ඉදින් නො දකී ද ? එසේ වීනම් ආයුෂ්මත් ඛෙමක තෙමේ අර්හත් වූ ක්ෂීණාස්‍රවයෙකැ යි.

එවමාවුසොති ඛො ආයස්මා දාසකො ථෙරානං භික්ඛූනං පටිස්සුත්වා යෙනායස්මා ඛෙමකො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ඛෙමකං එතදවොච : ථෙරා තං ආවුසො ඛෙමක, එවමාහංසු : පඤ්චිමෙ ආවුසො උපාදානක්ඛන්ධා වුත්තා භගවතා සෙය්‍යථීදං : රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො, නො චෙ කිරායස්මා ඛෙමකො ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු. කිඤ්චි අත්තානං වා අත්තනියං වා, සමනුපස්සති. තෙන'හායස්මා ඛෙමකො අරහං ඛීණාසවොති.

පඤ්චිමෙ ආවුසො උපාදානක්ඛන්ධා වුත්තා භගවතා, සෙය්‍යථීදං : රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො ඉමෙසු ඛොහං ආවුසො පඤ්චසුපාදානක්ඛන්ධෙසු න කිඤ්චි අත්තානං වා අත්තනියං වා සමනුපස්සාමි. නචම්හි[1] අරහං ඛීණාසවො, අපි ච මෙ ආවුසො පඤ්චසුපාදානක්ඛන්ධෙසු 'අස්මී'ති අධිගතං. "අයමහමස්මී"ති ච න සමනුපස්සාමීති.

අථ ඛො ආයස්මා දාසකො යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ එතදවොච : "ඛෙමකො ආවුසො : භික්ඛු එවමාහ "පඤ්චිමෙ ආවුසො උපාදානක්ඛන්ධා වුත්තා භගවතා, සෙය්‍යථීදං : රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉමෙසු ඛො'හං ආවුසො පඤ්චසුපාදානක්ඛන්ධෙසු න කිඤ්චි අත්තානං වා අත්තනියං වා සමනුපස්සාමි. න චම්හි අරහං ඛීණාසවො, අපිච මෙ ආවුසො පඤ්චසුපාදානක්ඛන්ධෙසු අස්මී'ති 'අධිගතං, අයමහමස්මීති ච න සමනුපස්සාමී'ති.

එහි ත්වං ආවුසො දාසක යෙන ඛෙමකො භික්ඛු තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා ඛෙමකං භික්ඛුං එවං වදෙහි : "ථෙරා තං ආවුසො ඛෙමක, එවමාහංසු : 'යමෙතං ආවුසො ඛෙමක, 'අස්මී'ති වදෙසි, කිමෙතං 'අස්මීති' වදෙසි ? රූපං 'අස්මී'ති වදෙසි ? අඤ්ඤත්‍ර රූපා 'අස්මී'ති වදෙසි ? වෙදනං 'අස්මීති' වදෙසි අඤ්ඤත්‍ර වෙදනාය 'අස්මී'ති වදෙසි ? සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ 'අස්මී'ති වදෙසි ? අඤ්ඤත්‍ර සඞ්ඛාරෙහි 'අස්මී'ති වදෙසි ? විඤ්ඤාණං 'අස්මී'ති වදෙසි ? අඤ්ඤත්‍ර විඤ්ඤාණා 'අස්මී'ති වදෙසි ? යමෙතං ආවුසො ඛෙමක, 'අස්මී'ති වදෙසි, කිමෙතං 'අස්මී'ති වදෙසී'ති ?

එවමාවුසොති ඛො ආයස්මා දාසකො ථෙරානං භික්ඛූනං පටිස්සුත්වා යෙනායස්මා ඛෙමකො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං ඛෙමකං එතදවොච : "ථෙරා තං ආවුසො ඛෙමක, එවමාහංසු. "යමෙතං ආවුසො ඛෙමක, 'අස්මී'ති වදෙසි කිමෙතං 'අස්මී'ති වදෙසි ? රූපං 'අස්මී'ති වදෙසි ? අඤ්ඤත්‍ර රූපා 'අස්මී'ති වදෙසි ? වෙදනං -පෙ- සඤ්ඤං -- සඞ්ඛාරෙ -- විඤ්ඤාණං 'අස්මී'ති වදෙසි ? අඤ්ඤත්‍ර විඤ්ඤාණා 'අස්මී'ති වදෙසි ? යමෙතං ආවුසො ඛෙමක, 'අස්මී'ති වදෙසි, කිමෙතං 'අස්මී'ති වදෙසීති ?

අලං ආවුසො දාසක, කිං ඉමාය සන්ධාවනිකාය, ආහරාවුසො, දණ්ඩං අහමෙව යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමිස්සාමීති.

1. න ච - මජසං.

ඇවැත්නි, එසේ යයි ආයුෂ්මත් දසක ස්ථවිර තෙමේ ස්ථවිර භික්ෂූන්ට පිළිතුරු දී ආයුෂ්මත් ඛෙමකයන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ඛෙමකයන්ට මෙය කී ය: ඇවැත්නි ඛෙමකයෙනි, තෙරහු තොපට මෙසේ කීහ: ඇවැත්නි, මේ පස් උපාදන ස්කන්ධ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදහ. එනම්: රූපෝපාදන ස්කන්ධ ය ... විඥානෝපාදනස්කන්ධ යි. ඉදින් ආයුෂ්මත් ඛෙමක තෙමේ මේ, පඤ්චෝපාදනස්කන්ධය අතුරින් කිසිවක් ආත්ම යි හෝ ආත්මයට අයත් යි හෝ නො දකී ද, එසේ වී නම් ආයුෂ්මත් ඛෙමක තෙමේ අ ර්හත් වූ ක්ෂීණාශ්‍රවයෙකැ යි.

ඇවැත්නි, මේ පස් උපාදනස්කන්ධ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදහ. එනම්: රූපෝපාදනස්කන්ධ ය ... විඥානෝපාදනස්කන්ධ යි. ඇවැත්නි, පඤ්චෝපාදනස්කන්ධයන් අතුරින් කිසිවක් ආත්ම යයි හෝ ආත්මයට අයත් යයි හෝ මම නො දකිමි. අර්හත් වූ ක්ෂීණාශ්‍රවයෙක් ද නො වෙමි. ඇවැත්නි, වැලිදු මා විසින් මේ පඤ්චෝපාදනස්කන්ධයන්හි 'වෙමි'යි පැවැති (තෘෂ්ණාමාන) අවබෝධ කරන ලදි. 'මේ මම වෙමි'යි ද (දෘෂ්ටි විසින්) නො දකිමි යි.

ඉක්බිති ආයුෂ්මත් දසක ස්ථවිර තෙමේ ස්ථවිර භික්ෂූන් වෙත එළැඹියේ ය. එළඹ ස්ථවිර භික්ෂූන්ට මෙය කී ය: ඇවැත්නි ඛෙමක භික්ෂු තෙමේ මෙසේ කී ය: ඇවැත්නි, මේ පස් උපාදනස්කන්ධ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදහ. එනම් රූපෝපාදනස්කන්ධ ය ... විඥානෝපාදනස්කන්ධ යි. ඇවැත්නි, මේ පඤ්චෝපාදනස්කන්ධයන් අතුරින් කිසිවක් ආත්ම යයි හෝ ආත්මයට අයත් ය යි හෝ මම නො දකිමි. අර්හත් වූ ක්ෂීණාශ්‍රවයෙක් ද නො වෙමි. ඇවැත්නි වැලිදු මා විසින් පඤ්චෝපාදනස්කන්ධයන්හි ' වෙමි ' යි පැවැති (තෘෂ්ණාමාන) අවබෝධ කරන ලදි. 'මේ මම වෙමි යි ද නො දකිමි යි.

ඇවැත්නි, දසකයෙනි, එවු තොපි ඛෙමක භික්ෂූහු වෙත එළඹෙවු. එළැඹැ ඛෙමක භික්ෂුහට මෙසේ කියවු: ඇවැත්නි, ඛෙමකයෙනි, තෙරහු තොපට මෙසේ කීහ: ඇවැත්නි ඛෙමකයෙනි, තෙල යමක් වෙමි'යි කියවු නම් තෙල කුමක් වෙමි'යි කියවු ද, රූපය මම වෙමි'යි කියවු ද? රූපයෙන් පිටත් අනෙකක් මම වෙමි'යි කියවු ද ? වේදනාව මම වෙමි'යි කියවු ද ? වේදනාවෙන් පිටත් අනෙකක් මම වෙමි යි කියවු ද ? සංඥාව ... සංස්කාර මම වෙමි යි කියවු ද ? සංස්කාරයෙන් පිටත් අනෙකක් මම වෙමි යි කියවු ද ? විඥානය මම වෙමි යි කියවු ද ? විඥානයෙන් පිටත් අනෙකක් මම වෙමි යි කියවු ද ? ඇවැත්නි, ඛෙමකයෙනි තෙල යමක් මම වෙමි යි කියවු නම් තෙල කුමක් මම වෙමි යි කියවු ද ? යි.

ඇවැත්නි, එසේ යැ යි ආයුෂ්මත් දසක ස්ථවිර තෙමේ ස්ථවිර භික්ෂූන්ට පිළිවදන් අස්වා ආයුෂ්මත් ඛෙමකයන් වෙත එළඹියේය. එළඹ ආයුෂ්මත් ඛෙමකයන්ට මෙය කී ය: ඇවැත්නි, ඛෙමකයෙනි, තෙරහු තොපට මෙසේ කීහ: ඇවැත්නි, ඛෙමකයෙනි තෙල යමක් 'වෙමි' යි කියවු නම් කුමක් වෙමි යි කියවු ද ? රූපය මම වෙමි'යි කියවු ද ? රූපයෙන් බැහැර අනෙකක් 'වෙමි'යි කියවු ද ? වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය 'වෙමි'යි කියවු ද? විඥානයෙන් බැහැර අනෙකක් 'වෙමි'යි කියවු ද ? ඇවැත්නි ඛෙමකයෙනි තෙල යමක් වෙමි යි කියනු නම් තෙල කුමක් වෙමි යි කියවු ද ? යි.

ඇවැත්නි, දසකයෙනි, කම් නැත. මේ පුනපුනා ගමනාගමනින් කිම ? ඇවත්නි සැරයටිය ගෙනෙව. මම ම ස්ථවිර භික්ෂූන් වෙත එළඹෙන්නෙමි යි.

අථ ඛො ආයස්මා ඛෙමකො දණ්ඩමොලුබ්භ යෙන ථෙරා භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ථෙරෙහි භික්ඛූහි සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං ඛෙමකං ථෙරා භික්ඛූ එතදවොචුං: "යමෙතං ආවුසො ඛෙමක. 'අස්මී'ති වදෙසි කිමෙතං 'අස්මී'ති වදෙසි? රූපං 'අස්මී'ති වදෙසි? අඤ්ඤත්‍ර රූපා 'අස්මී'ති වදෙසි? වෙදනං – සඤ්ඤං – සඞ්ඛාරෙ – විඤ්ඤාණං 'අස්මී'ති වදෙසි? අඤ්ඤත්‍ර විඤ්ඤාණා 'අස්මී'ති වදෙසි? යමෙතං ආවුසො ඛෙමක, "අස්මී"ති වදෙසි? කිමෙතං "අස්මී"ති වදෙසීති?

න ඛො'හං ආවුසො, රූපං 'අස්මී'ති වදාමි නපි අඤ්ඤත්‍ර රූපා 'අස්මී'ති වදාමි. න වෙදනං 'අස්මී'ති වදාමි නපි අඤ්ඤත්‍ර වෙදනාය 'අස්මී'ති වදාමි. න සඤ්ඤං–න සඞ්ඛාරෙ 'අස්මී'ති වදාමි. නපි අඤ්ඤත්‍ර සඞ්ඛාරෙහි 'අස්මී'ති වදාමි. න විඤ්ඤාණං 'අස්මී'ති වදාමි. නපි අඤ්ඤත්‍ර විඤ්ඤාණා අස්මීති වදාමි. අපි ච මෙ ආවුසො, පඤ්චසු-පාදානක්ඛන්ධෙසු 'අස්මී'ති අධිගතං "අයමහමස්මී"ති න ච සමනුපස්සාමි.

සෙය්‍යථාපි ආවුසො, උප්පලස්ස වා පදුමස්ස වා පුණ්ඩරීකස්ස වා ගන්ධො යො නු ඛො එවං වදෙය්‍ය: "පත්තස්ස ගන්ධොති වා, වණ්ණස්ස ගන්ධොති වා කිඤ්ජක්ඛස්ස ගන්ධොති වා, සම්මා නු ඛො සො වදමානො වදෙය්‍යා'ති?

නො හෙතං ආවුසො,

යථා කථම්පනාවුසො, සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍යාති?

පුප්ඵස්ස ගන්ධොති ඛො ආවුසො, සම්මා බ්‍යාකරමානො බ්‍යාකරෙය්‍යාති.

එවමෙව ඛො'හං ආවුසො, න රූපං 'අස්මී'ති වදාමි. නපි අඤ්ඤත්‍ර රූපා 'අස්මී'ති වදාමි. න වෙදනං–න සඤ්ඤං–න සඞ්ඛාරෙ–න විඤ්ඤාණං 'අස්මී'ති වදාමි. නපි අඤ්ඤත්‍ර විඤ්ඤාණා 'අස්මී'ති වදාමි. අපි ච මෙ ආවුසො, පඤ්චසුපාදානක්ඛන්ධෙසු 'අස්මී'ති අධිගතං අයමහමස්මීති න ච සමනුපස්සාමි.

කිඤ්චාපි ආවුසො, අරියසාවකස්ස පඤ්චොරම්භාගියානි සඤ්ඤොජනානි පහීනානි භවන්ති අථ ඛ්වස්ස හොතියෙව පඤ්චසුපාදානක්ඛන්ධෙසු අණුසහගතො 'අස්මී'ති මානො 'අස්මී'ති ඡන්දො 'අස්මී'ති අනුසයො අසමූහතො, සො අපරෙන සමයෙන පඤ්චසුපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහරති "ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො, ඉති වෙදනා – පෙ – ඉති සඤ්ඤා – පෙ – ඉති සඞ්ඛාරා – පෙ – ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමොති, තස්ස ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සිනො විහරතො යොපිස්ස හොති පඤ්චසුපාදානක්ඛන්ධෙසු අණුසහගතො 'අස්මී'ති මානො 'අස්මී'ති ඡන්දො 'අස්මී'ති අනුසයො අසමූහතො, සො'පි සමුග්ඝාතං ගච්ඡති.

ඉක්බිති ආයුෂ්මත් ඛෙමක ස්ථවිර තෙමේ සැරයටිය එල්බ ගෙන ස්ථවිර භික්ෂූන් වෙත එළැඹියේ යැ. එළැඹ ස්ථවිර භික්ෂූන් සමග සතුටු වියැ. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ යැ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ඛෙමක යන්ට ස්ථවිර භික්ෂූහු මෙය කීහ : ඇවැත්නි, ඛෙමකයෙනි, තෙල යමක් මම් වෙමි'යි කියවූ නම් තෙල කුමක් 'මම් වෙමි' යි කියවූ ද ? රූපය 'මම් වෙමි'යි කියවූ ද ? රූපයෙන් බැහැර අනෙකක් 'මම් වෙමි'යි කියවූ ද ? වේදනාව ... සංඥාව ... සංස්කාර ... විඥානය 'මම් වෙමි'යි කියවූ ද ? විඥානයෙන් බැහැර අනෙකක් 'මම් වෙමි'යි කියවූ ද ? ඇවැත්නි ඛෙමකයෙනි, තෙල යමක් 'මම් වෙමි'යි කියවූ නම් තෙල කුමක් 'මම් වෙමි'යි කියවූ ද? යි.

ඇවැත්නි. මම රූපය 'මම් වෙමි'යි නො කියමි. රූපයෙන් බැහැර අනෙකක් 'මම් වෙමි'යි නො කියමි, වේදනාව 'මම් වෙමි'යි නො කියමි. වේදනාවෙන් බැහැර අනෙකක් 'මම් වෙමි'යි නො කියමි. සංඥාව ... සංස්කාර 'මම් වෙමි'යි නො කියමි. සංස්කාරයෙන් බැහැර අනෙකක් 'මම් වෙමි'යි නො කියමි. විඥානය 'මම් වෙමි'යි නො කියමි. විඥානයෙන් බැහැර අනෙකක් 'මම් වෙමි'යි නො කියමි. ඇවැත්නි, වැලිදු මා විසින් පඤ්චෝපාදනස්කන්ධයන්හි වෙමි යි (පැවති තෘෂ්ණාමාන) අවබෝධ කරන ලදී. මෙ මම වෙමි'යි ද නො දකිමි.

ඇවැත්නි, යම්සේ උපුලෙක හෝ පියුමෙක හෝ හෙළ පියුමෙක හෝ ගඳෙක් වේ ද, යමෙක් වනාහි පෙත්තෙහි ගඳ යයි හෝ වර්ණයෙහි ගඳ යයි හෝ රෙණුයෙහි ගඳ යයි හෝ මෙසේ කියන්නේ නම් එසේ කියන හේ මනා කොට කියන්නේ දැ යි ?

ඇවැත්නි, තෙල නො වේ ම ය.

ඇවැත්නි, මැනැවින් පවසන්නෙක් ඒ කෙසේ නම් පවසන්නේ ද ?

ඇවැත්නි, මැනැවින් පවසන්නෙක් මලෙහි ගඳ යයි පවසන්නේ යි.

ඇවැත්නි, එසෙයින් ම මම රූපය 'මම් වෙමි'යි නො කියමි. රූපයෙන් පිටත අනෙකක් 'මම් වෙමි'යි ද නො කියමි. වේදනාව ... නො කියමි. සංඥාව ... නො කියමි. සංස්කාර ... නො කියමි. විඥානය 'මම් වෙමි'යි නො කියමි. විඥානයෙන් බැහැර අනෙකක් 'මම් වෙමි'යි ද නො කියමි. ඇවැත්නි, වැලි දු මා විසින් පඤ්චෝපාදනස් කන්ධයන්හි 'වෙමි'යි (පැවැති තෘෂ්ණාමාන) අවබෝධ කරන ලදී. 'මෙ මම වෙමි'යි ද නො දකිමි.

ඇවැත්නි, ආර්යශ්‍රාවකහට ඔරම්භාගිය සංයෝජන පස ප්‍රහීණ වුයේ නමුදු වැලිත් ඔහුට පඤ්චෝපාදනස්කන්ධයන්හි අණු සහගත වූ 'මම් වෙමි' යන මානය, 'මම් වෙමි' යන ඡන්දය, 'මම් වෙමි' යන අනුශය නො නසන ලද වෙයි. අපරභාගයෙහි රූපය මෙසේ යැ, රූපයේ හටගැනීම මෙසේ යැ, රූපයේ අස්තඞ්ගමය මෙසේ යැ. වේදනාව මෙසේ යැ ... සංඥාව මෙසේ යැ ... සංස්කාර මෙසේ යැ ... විඥානය මෙසේ යැ, විඥානයේ හටගැනීම මෙසේ යැ, විඥානයේ අස්තඞ්ගමය මෙසේ යයි පඤ්චොපාදනස්කන්ධයන්හි උදයව්‍යය (හටගැනීම හා විනාශය) දක්නාසුලු වැ වෙසෙයි. මේ පඤ්චෝපාදනස්කන්ධයන්හි උදයව්‍යය අනු වැ දක්නාසුලු වැ වෙසෙන ඔහුට පඤ්චොපාදනස්කන්ධයන්හි අණුසහගත (සියුම්) වූ 'මම් වෙමි'යි පවත්නා යම් මානයෙක් 'මම් වෙමි'යි පවත්නා යම් ඡන්දයෙක් 'මම් වෙමි'යි පවත්නා යම් අනුසයෙක් නො නස්නා ලද වේ නම් හෙද සහමුලින් නැසීමට යෙයි.

17—ඒ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

සෙය්‍යථාපි ආවුසො, වත්ථං සඞ්කිලිට්ඨං මලග්ගහිතං. තමෙනං සාමිකා රජකස්ස අනුපදජ්ජුං, තමෙනං රජකො ඌසෙ වා ඛාරෙ වා ගොමයෙ වා සම්මද්දිත්වා අච්ඡෙ උදකෙ වික්ඛාලෙති. කිඤ්චාපි තං හොති වත්ථං පරිසුද්ධං පරියොදාතං. අථ ඛ්වස්ස හොතෙව[1] අණුසහගතො ඌසගන්ධො වා ඛාරගන්ධො වා ගොමයගන්ධො වා අසමූහතො, තමෙනං රජකො සාමිකානං දෙති. තමෙනං සාමිකා ගන්ධපරිභාවිතෙ කරණ්ඩකෙ නික්ඛිපන්ති. යොපිස්ස හොති අණුසහගතො ඌසගන්ධො වා ඛාරගන්ධො වා ගොමයගන්ධො වා අසමූහතො. සොපි සමුග්ඝාතං ගච්ඡති.

එවමෙව ඛො ආවුසො, කිඤ්චාපි අරියසාවකස්ස පඤ්චොරම්භාගියානි සඤ්ඤොජනානි පහීනානි භවන්ති. අථ ඛ්වස්ස හොතියෙව පඤ්චසු උපාදානක්ඛන්ධෙසු අණුසහගතො 'අස්මී'ති මානො 'අස්මී'ති ඡන්දො 'අස්මී'ති අනුසයො අසමූහතො. සො අපරෙන සමයෙන පඤ්චසු උපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහරති, "ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො, ඉති වෙදනා, -පෙ- ඉති සඤ්ඤා -පෙ- ඉති සඞ්ඛාරා -පෙ- ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමො'ති, තස්ස ඉමෙසු පඤ්චසුපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සිනො විහරතො යොපිස්ස හොති පඤ්චසු උපාදානක්ඛන්ධෙසු අණුසහගතො 'අස්මී'ති මානො 'අස්මී'ති ඡන්දො 'අස්මී'ති අනුසයො අසමූහතො, සොපි සමුග්ඝාතං ගච්ඡතීති.

එවං වුත්තෙ තෙ ථෙරා භික්ඛූ ආයස්මන්තං ඛෙමකං එතදවොචුං: "න ඛො මයං ආයස්මන්තං ඛෙමකං විහෙසාපෙක්ඛා ආපුච්ඡිම්හා[2] අපි ච ආයස්මා ඛෙමකො පහොති තස්ස භගවතො සාසනං විත්ථාරෙන ආචික්ඛිතුං දෙසෙතුං පඤ්ඤාපෙතුං[3] පට්ඨපෙතුං විවරිතුං විභජිතුං උත්තානීකාතුං, තයිදං ආයස්මතා ඛෙමකෙන තස්ස භගවතො සාසනං විත්ථාරෙන ආචික්ඛිතං දෙසිතං පඤ්ඤපිතං පට්ඨපිතං විවරිතං විභජිතං උත්තානීකතන්ති.

ඉදමවොච ආයස්මා ඛෙමකො, අත්තමනා ථෙරා භික්ඛූ ආයස්මතො ඛෙමකස්ස භාසිතං අභිනන්දුං.

ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සට්ඨිමත්තානං ථෙරානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසු ආයස්මතො ච ඛෙමකස්සාති.

## 1. 2. 4. 8.

### ඡන්න සුත්තං

90. එකං සමයං සම්බහුලා ථෙරා භික්ඛූ බාරාණසියං විහරන්ති. ඉසිපතනෙ මිගදායෙ. අථ ඛො ආයස්මා ඡන්නො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො අවාපුරණං[4] ආදාය විහාරෙන විහාරං

1. හොති යො – සීමු.
2. පුච්ඡිම්හ – මජ්සං.
3. පඤ්ඤපෙතුං – මජ්සං.
4. අපාපුරණං – සීමු, ස්‍යා.

ඇවැත්නි, යම්සේ කිලිටි වූ හටගත් මල ඇති වස්ත්‍රයෙක් වේ ද, තෙල වස්ත්‍රය හිමියෝ රජකයාහට දෙන්නාහු ය. රජක තෙමේ තෙල වස්ත්‍රය අළුදියෙහි හෝ කරදියෙහි හෝ ගොමදියෙහි මැඩ පහන්දියෙහි සෝදලයි. ඒ වත පිරිසුදු වූයේ හාත්පසින් බබළන්නේ නමුදු වැලිත් එහි අනුසහගත (සියුම්) වූ අළුගඳ හෝ කරගඳ හෝ ගොමගඳ හෝ නො නටුයේ වෙයි. රජක තෙමේ තෙල වස්ත්‍රය හිමියන්ට දෙයි. හිමියෝ තෙල වස්ත්‍රය ගඳින් පිරිබඩ කළ කරඬුවෙක බහා තබත්, එහි අනුසහගත වූ (සියුම් වූ) නො නට යම් අළු ගඳෙක් හෝ කරගඳෙක් හෝ ගොම ගඳෙක් හෝ වේ නම් හෙද සහමුලින් නැසීමට යෙයි.

ඇවැත්නි, එසෙයින් ම කෙසේ හෝ අරිසවුහුගේ ඔරම්භාගිය සංයෝජනා පස ප්‍රහීණ වූයේ නමුදු වැලිත් ඔහුගේ පඤ්චෝපාදනස්කන්ධයන්හි අනුසහගත වූ (සියුම් වූ) සහමුලින් නො නස්නා ලද 'මම් වෙමි'යි පවත්නා මානයෙක් 'මම් වෙමි'යි පවත්නා ඡන්දයෙක් 'මම් වෙමි'යි පවත්නා අනුසයෙක් වේ ම ය. හේ අපරභාගයෙහි පඤ්චෝපාදනස්කන්ධයන්හි ''රූපය මෙසේ යැ. රූපයේ හටගැනීම මෙසේ යැ, රූපයේ අස්තඞ්ගමය මෙසේ යැ. වේදනාව මෙසේ යැ ... සංඥාව මෙසේ යැ ... සංස්කාර මෙසේ යැ ... විඥනය මෙසේ යැ ... විඥානයේ හටගැනීම මෙසේ යැ විඥනයේ අස්තඞ්ගමය මෙසේ යැ'යි උදයව්‍යය අනු වැ දක්නාසුලු වැ වෙසෙයි. මේ පඤ්චෝපාදනස්කන්ධයන්හි උදයව්‍යය අනු වැ දක්නාසුලු වැ වෙසෙන ඔහුගේ පඤ්චෝපාදනස්කන්ධයන්හි සියුම් වූ සහමුලින් නො නස්නා ලද ''වෙමි'' යි පවත්නා යම් මානයෙකුත් 'වෙමි' යි පවත්නා යම් ඡන්දයෙකුත් 'වෙමි'යි පවත්නා යම් අනුසයෙකුත් නො නටුයේ ද හෙ ද සහමුලින් නැසීමට යේ.

මෙසේ කී කල්හි ස්ථවිර භික්ෂූහු ආයුෂ්මත් ඛෙමකයන්ටමෙය කීහු : ''අපි ආයුෂ්මත් ඛෙමකයන් වෙහෙසනු කැමැත්තමෝ නො විචාළම්හ. එහෙත් ආයුෂ්මත් ඛෙමක තෙමේ ඒ භාග්‍යවතුන් වහන්සේගේ සස්න විස්තර වශයෙන් කියන්නට දේශනා කරන්නට පනවන්නට පිහිටු වන්නට විවරණය කරන්නට බෙදන්නට උඩුහුරු කරන්නට පොහෝනේ යැ. ඒ භාග්‍යවතුන් වහන්සේගේ මේ ශාසනය ආයුෂ්මත් ඛෙමකයන් විසින් විස්තර වශයෙන් කියන ලද්දේ යැ. දේශනා කරන ලද්දේ යැ. පනවන ලද්දේ යැ. පිහිටුවන ලද්දේ යැ. විවරණය කරන ලද්දේ යැ. බෙදන ලද්දේ යැ. උඩුහුරු කරන ලද්දේ ''යි.

ආයුෂ්මත් ඛෙමක තෙරණුවෝ මෙය වදාළහ. සතුටු සිත් ඇති ස්ථවිර භික්ෂූහු ආයුෂ්මත් ඛෙමක තෙරුන්ගේ දේශනාව පිළිගත්හ.

මේ වෙය්‍යාකරණය (නිග්ගාථක සූත්‍රය) බණන කල්හි සැටක් පමණ ස්ථවිර භික්ෂූන්ගේත් ආයුෂ්මත් ඛෙමක තෙරුන් ගේත් සිත් උපාදාන රහිත වැ කෙලෙසුන්ගෙන් මිදුණේ යි.

## 1. 2. 4. 8.

## ඡන්න සූත්‍රය

90. එක් කලෙක බොහෝ ස්ථවිර භික්ෂූහු බරණැස් නුවර සමීපයෙහි මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි වැඩවෙසෙති. එ කල්හි ආයුෂ්මත් ඡන්න (ස්ථවිර) සවස්කල විවේකයෙන් නැඟී සිටියේ යතුර රැගෙන වෙහෙරින් වෙහෙරට එළඹැ ස්ථවිර භික්ෂූන්ට

උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ එතදවොච: "ඔවදන්තු මං ආයස්මන්තො.[1] ථෙරා අනුසාසන්තු මං ආයස්මන්තො ථෙරා. කරොන්තු මෙ ආයස්මන්තො ථෙරා ධම්මිං කථං යථාහං ධම්මං පස්සෙය්‍යන්ති.

එවං වුත්තෙ ආයස්මන්තං ඡන්නං ථෙරා භික්ඛූ එතදවොචුං: "රූපං ඛො ආවුසො ඡන්න, අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සඞ්ඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චං, රූපං අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා, සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ ධම්මා අනත්තා"ති.

අථ ඛො ආයස්මතො ඡන්නස්ස එතදහොසි: මය්හම්පි ඛො එතං එවං හොති: "රූපං අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සඞ්ඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චං, රූපං අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා, සබ්බෙ සඞ්ඛාරා අනිච්චා සබ්බෙ ධම්මා අනත්තාති. අථ ච පන මෙ සබ්බසඞ්ඛාරසමථෙ සබ්බූපධිපටිනිස්සග්ගෙ තණ්හක්ඛයෙ විරාගෙ නිරොධෙ නිබ්බානෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති නාධිමුච්චති[2] පරිතස්සනා උපාදානං උප්පජ්ජති, පච්චුදාවත්තති මානසං, අථ කො චරහි මෙ අත්තාති, න ඛො පනෙවං[3] ධම්මං පස්සතො හොති "කො නු ඛො මෙ තථා ධම්මං දෙසෙය්‍ය යථාහං ධම්මං පස්සෙය්‍ය"න්ති.

අථ ඛො ආයස්මතො ඡන්නස්ස එතදහොසි: "අයං ඛො ආයස්මා ආනන්දො කොසම්බියං විහරති ඝොසිතාරාමෙ, සත්ථු චෙව සංවණ්ණිතො සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති ච මෙ ආයස්මා ආනන්දො තථා ධම්මං දෙසෙතුං යථාහං ධම්මං පස්සෙය්‍යං, අත්ථි ච මෙ ආයස්මන්තෙ ආනන්දෙ තාවතිකා විස්සට්ඨි, යන්නූනාහං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමෙය්‍ය"න්ති.

අථ ඛො ආයස්මා ඡන්නො සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරමාදාය යෙන කොසම්බී ඝොසිතාරාමො, යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ඡන්නො ආයස්මන්තං ආනන්දං එතදවොච: "එකමිදාහං ආවුසො ආනන්ද, සමයං බාරාණසියං විහරාමි ඉසිපතනෙ මිගදායෙ, අථ ඛො අහං ආවුසො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො අවාපුරණං ආදාය විහාරෙන විහාරං උපසඞ්කමිං. උපසඞ්කමිත්වා ථෙරෙ භික්ඛූ එතදවොචං: "ඔවදන්තු මං ආයස්මන්තො ථෙරා අනුසාසන්තු මං ආයස්මන්තො ථෙරා, කරොන්තු මෙ ආයස්මන්තො ථෙරා ධම්මිං කථං යථාහං ධම්මං පස්සෙය්‍ය"න්ති.

එවං වුත්තෙ මං ආවුසො, ථෙරා භික්ඛූ එතදවොචුං: රූපං ඛො ආවුසො ඡන්න, අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා, සඞ්ඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චං. රූපං අනත්තා, වෙදනා අනත්තා, සඤ්ඤා අනත්තා, සඞ්ඛාරා අනත්තා, විඤ්ඤාණං අනත්තා, සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ ධම්මා අනත්තා'ති.

1. ආයස්මන්තා - සීමු, සී 2.
2. න විමුච්චති - සීමු.
3. නඛොපනෙතං - සීමු.

තෙල කී ය : යම්සේ මම දහම් දක්නෙම් නම් එ පරිද්දෙන් ආයුෂ්මත් තෙරහු මට අවවාද කෙරෙත්වා. ආයුෂ්මත් තෙරහු මට අනුශාසනා කෙරෙත් වා. ආයුෂ්මත් තෙරහු මට දැහැමි කතා කෙරෙත්වා '' යි.

මෙසේ කී කල්හි ස්ථවිර භික්ෂූහු ආයුෂ්මත් ඡන්නහට තෙල කීහු : ''ඇවැත්නි, ඡන්නයෙනි, රූපය අනිත්‍ය යැ, වේදනාව අනිත්‍ය යැ, සංඥාව අනිත්‍ය යැ, සංස්කාරයෝ අනිත්‍යයහ, විඥානය අනිත්‍ය යි. රූපය අනාත්ම යැ, වේදනාව අනාත්ම යැ, සංඥාව අනාත්ම යැ, සංස්කාර අනාත්ම යැ, විඥානය අනාත්ම යි. සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. සියලු ධර්මයෝ අනාත්මයහ'' යි.

එ කල්හි ආයුෂ්මත් ඡන්නහට තෙල සිත විය : ''මට ද තෙල මෙසේ වෙයි. රූපය අනිත්‍ය යැ, වේදනාව අනිත්‍ය යැ, සංඥාව අනිත්‍ය යැ, සංස්කාර අනිත්‍ය යැ, විඥානය අනිත්‍ය යි.රූපය අනාත්ම යැ, වේදනාව අනාත්ම යැ සංඥාව අනාත්ම යැ, සංස්කාර අනාත්ම යැ, විඥානය අනාත්ම යි. සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. සියලු ධර්මයෝ අනාත්මයහ''යි. වැලි දු මා ගේ සිත සියලු සංස්කාරයන්ගේ සන්හිඳීම වූ සියලු උපධීන් ගේ දුරලීම වූ තෘෂ්ණායෙහි ක්ෂය කිරීම වූ නො ඇලීම වූ නැවැත්ම වූ නිවනෙහි නො වැද ගනියි, නො පහදියි නො සිටියි, නො බැඳෙයි, තැතිගැනුම ද දැඩි කොට ගැනුම ද උපදියි. වැලි කුමක් මාගේ ආත්මය ද යි මා සිත පෙරළා එයි, දහම් දක්නහුට එසේ නො වෙයි, යම්සේ මම දහම් දක්නෙම් නම් එසෙයින් කවුරු නම් මට දහම් දෙසත් ද''යි,

එ කල්හි ආයුෂ්මත් ඡන්නහට තෙල සිත විය : ''ශාස්තෲන් වහන්සේ විසින් වර්ණනා කරන ලද, නුවණැති සබ්‍රම්සරුන් විසින් බුහුමන් කරන ලද මේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ කොසඹෑ නුවර ඝෝසිතාරාමයෙහි වැඩවෙසෙති. යම්සේ මම දහම් දක්නෙම් නම් එ පරිද්දෙන් මට දහම් දෙසන්නට ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පොහො සත් ද වෙති. ආයුෂ්මත් ආනන්ද තෙරුන් කෙරෙහි එ පමණ විශ්වාසයෙක් ද මට ඇත්තේ ය. මම ආයුෂ්මත් ආනන්ද තෙරුන් වෙත එළැඹෙන්නෙම් නම් මැනැවැ''යි,

ඉක්බිති ආයුෂ්මත් ඡන්න ස්ථවිර සෙනසුන් සකසා තබා පා සිවුරු ගෙන කොසඹෑ නුවර ඝෝසිතාරාමයෙහි ආයුෂ්මත් ආනන්ද තෙරුන් වෙත එළැඹියේ යැ. එළැඹ ආයුෂ්මත් ආනන්ද තෙරුන් සමඟ සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්නේ යැ. එකත් පසෙක හුන් ආයුෂ්මත් ඡන්න ස්ථවිර ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට තෙල කී ය : ඇවැත්නි, ආනන්දයෙනි, මම එක්කලෙක මේ බරණැස් නුවර සමීපයෙහි මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහි වෙසෙමි. ඇවැත්නි, එ කල්හි මම සවස්කල විවේකයෙන් නැඟීසිටියෙම් යතුර රැගෙන වෙහෙරින් වෙහෙරට එළැඹියෙමි. එළැඹ ස්ථවිර භික්ෂූන්ට තෙල කීයෙමි : ''යම්සේ මම දහම් දක්නෙම් නම් ආයුෂ්මත් තෙරහු මට එසේ අවවාද කෙරෙත්වා. ආයුෂ්මත් තෙරහු මට අනුශාසනා කෙරෙත්වා. ආයුෂ්මත් තෙරහු මට දැහැමිකතා කෙරෙත්වා''යි.

ඇවැත්නි, මෙසේ කී කල්හි ස්ථවිර භික්ෂූහු මට තෙල කීහු : ''ඇවැත්නි, ඡන්නයෙනි, රූපය අනිත්‍ය යැ. වේදනාව අනිත්‍ය යැ. සංඥාව අනිත්‍ය යැ. සංස්කාර අනිත්‍ය යැ, විඥානය අනිත්‍ය යි. රූපය අනාත්ම යැ, වේදනාව අනාත්ම යැ, සංඥාව අනාත්ම යැ, සංස්කාර අනාත්ම යැ, විඥානය අනාත්ම යි. සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. සියලු ධර්මයෝ අනාත්මයහ''යි.

තස්ස මය්හං ආවුසො, එතදහොසි: “මය්හම්පි ඛො එතං එවං හොති: රූපං අනිච්චං, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චං. රූපං අනත්තා, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනත්තා, සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ ධම්මා අනත්තා’ති.

අථ ච පන මෙ සබ්බසඞ්ඛාරසමථෙ සබ්බූපධිපටිනිස්සග්ගෙ තණ්හක්ඛයෙ විරාගෙ නිරොධෙ නිබ්බානෙ චිත්තං න පක්ඛන්දති නප්පසීදති න සන්තිට්ඨති නාධිමුච්චති. පරිතස්සනා උපාදානං උප්පජ්ජති. පච්චුදාවත්තති මානසං. අථ කො චරහි මෙ අත්තාති. න ඛො පනෙතං ධම්මං පස්සතො හොති, කො නු ඛො මෙ තථා ධම්මං දෙසෙය්‍ය යථාහං ධම්මං පස්සෙය්‍ය’න්ති.

තස්ස මය්හං ආවුසො, එතදහොසි: “අයං ඛො ආයස්මා ආනන්දො කොසම්බියං විහරති ඝොසිතාරාමෙ සත්ථු චෙව සංවණ්ණිතො සම්භාවිතො ච විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං. පහොති ච මෙ ආයස්මා ආනන්දො තථා ධම්මං දෙසෙතුං, යථාහං ධම්මං පස්සෙය්‍යං. අත්ථි ච මෙ ආයස්මන්තෙ ආනන්දෙ තාවතිකා විස්සට්ඨි, යන්නූනාහං යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමෙය්‍ය’න්ති. ඔවදතු මං ආයස්මා ආනන්දො, අනුසාසතු මං ආයස්මා ආනන්දො, කරොතු මෙ ආයස්මා ආනන්දො ධම්මිං කථං, යථාහං ධම්මං පස්සෙය්‍යන්ති.

එත්තකෙනපි මයං ආයස්මතො ඡන්නස්ස අත්තමනා අභිරද්ධා, තං[1] ආයස්මා ඡන්නො ආවිඅකාසි. ඛිලං පභින්දි,[2] ඔදහාවුසො ඡන්න සොතං. භබ්බොසි ධම්මං විඤ්ඤාතුන්ති. අථ ඛො ආයස්මතො ඡන්නස්ස තාවතකෙනෙව[3] උළාරං පීතිපාමොජ්ජං උප්පජ්ජි භබ්බො කිරස්මි ධම්මං විඤ්ඤාතු”න්ති.

සම්මුඛා මෙතං ආවුසො ඡන්න, භගවතො සුතං සම්මුඛා ච පටිග්ගහිතං කච්චානගොත්තං භික්ඛුං ඔවදන්තස්ස “ද්වයනිස්සිතො ඛ්වායං කච්චාන, ලොකො යෙභුය්‍යෙන අත්ථිතඤ්චෙව නත්ථිතඤ්ච, ලොකසමුදයං ඛො කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ නත්ථිතා සා න හොති. ලොකනිරොධං ඛො කච්චාන යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සතො යා ලොකෙ අත්ථිතා සා න හොති. උපයුපාදානාභිනිවෙසවිනිබන්ධො ඛ්වා’යං කච්චාන, ලොකො යෙභුය්‍යෙන, තඤ්චායං උපයුපාදානං චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයං න උපෙති. න උපාදියති න අධිට්ඨාති ‘අත්තා මෙ’ති දුක්ඛමෙව උප්පජ්ජමානං උප්පජ්ජති. දුක්ඛං නිරුජ්ඣමානං නිරුජ්ඣතී”ති. න කඞ්ඛති න විචිකිච්ඡති. අපරපච්චයා ඤාණමෙවස්ස එත්ථ හොති. එත්තාවතා ඛො කච්චාන, සම්මාදිට්ඨි හොති.

---

1. අත්තමනා අපිනාම තං - මජසං,
2. ඛිලං ඡින්දි - මජසං.
3. තාවදෙව - සීමු.

ඇවැත්නි, ඒ මට මෙසේ සිත විය : "මට ද මෙසේ වෙයි. රූපය අනිත්‍ය යැ. වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය අනිත්‍ය යි. රූපය අනාත්ම යැ. වෙදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය අනාත්ම යි. සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. සියලු ධර්මයෝ අනාත්මයහ"යි.

වැලි දු මාගේ සිත සියලු සංස්කාරයන්ගේ සන්හිඳීම වූ සියලු උපධීන්ගේ දුරලීම වූ තෘෂ්ණායෙහි ක්ෂය කිරීම වූ නො ඇල්ම වූ නැවැත්ම වූ නිවනෙහි නො වැදගනියි නො පහදියි, මැනවින් නො සිටියි, නො බැඳෙයි. තැතිගැනුමත් දැඩි කොට ගැනුමත් උපදී, "වැලි කිමෙක් මාගේ ආත්මය දැ"යි සිත පෙරළා එයි. සිවුසස් දහම් දක්නාහට මෙසේ නො ම වේ. යම්සේ මම දහම් දක්නෙම් නම් කවරෙක් මට එසේ දහම් දෙසන්නේ දැ"යි.

ඇවැත්නි ඒ මට මෙසේ සිත විය : "ශාස්තෘන් වහන්සේ විසින් වර්ණනා කරන ලද නුවණැති සබ්‍රම්සරුන් විසින් බුහුමන් කරන ලද මේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ කොසඹෑනුවර ඝොසිතාරාමයෙහි වැඩවෙසෙති යම්සේ මම දහම් දක්නෙම් නම් එසේ මට දහම් දෙසන්නට ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පොහොසත් ද වෙති. ආයුෂ්මත් ආනන්ද තෙරුන් කෙරෙහි එ පමණ විශ්වාසයෙකුදු මට ඇත. මම ආයුෂ්මත් ආනන්ද තෙරුන් වෙත එළඹෙන්නෙම් නම් මැනැවැ"යි යම්සේ මම දහම් දක්නෙම් නම් එසේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මට අවවාද කරන සේක්වා, ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මට අනුශාසනා කරන සේක්වා, ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ මට දැහැමි කතා කරන සේක්වා"යි.

මෙ පමණෙකිනුදු අපි ආයුෂ්මත් ඡන්නහට සතුටු වම්හ, ආයුෂ්මත් ඡන්න විසින් ආරාධිතයම්හ. ආයුෂ්මත් ඡන්න එය හෙළි කෙළේ යැ. (මාන) හුල බින්දේ ය. ඡන්නයෙනි, කන් යොමු කර, දහම් දැනගන්නට සුදුස්සෙහි. එකල්හි ආයුෂ්මත් ඡන්නහට "දහම් දැනගන්නට සුදුස්සෙමි"යි එ පමණෙකින් ම උදරප්‍රීති ප්‍රමොද්‍යය උපන.

ඇවැත්නි, ඡන්නයෙනි, කච්චානගොත්ත මහණහට අවවාද කරන භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙහි ම මා විසින් මෙසේ අසන ලද වෙයි, හමුයෙහි ම පිළිගන්නා ලද ද වෙයි : කච්චානය මෙලෝ වැසි තෙමේ බෙහෙවින් ඇති බව ද නැති බව ද යන දෙක ඇසුරු කෙළේ ය. කච්චානය, ලොකයේ හටගැන්ම තතුසේ විදසුන් නුවණින් දක්නහුට ලොව යම් නැති බවෙක් වේ නම් එය නො වෙයි, කච්චානය, ලොකනිරොධය තතු සේ මනා නුවණින් දක්නහුට ලොව යම් ඇති බවෙක් වේ නම් එය නො වේ. කච්චානය, මෙ ලෝවැසි තෙමේ (තණ්හාදී කාමාදි) උපය උපාදාන විනිබන්ධ ඇත්තේ යැ. මේ තෙමේ ඒ උපය උපාදාන දෙකට ද සිතේ පිහිටීම ඇතුළත පිවිසීම අනුසය යන මොවුන්ට ද නො පැමිණේ. මාගේ ආත්මය යි නො ගනී. නො පිහිටයි. උපදනේ දුක ම උපදී. නිරුද්ධ වන්නේ දුක ම නිරුද්ධ වේ යයි සැක නො කෙරේ. විචිකිච්ඡා නො කෙරේ. පරප්‍රත්‍යය රහිත බැවින් ඔහුට මෙහි ලා දැනීම ම වෙයි. කච්චානය මෙතෙකින් සම්මාදිට්ඨිය වෙයි.

"සබ්බමත්ථී"ති ඛො කච්චාන, අයමෙකො අන්තො, "සබ්බං නත්ථී"ති ඛො අයං දුතියො අන්තො, එතෙ තෙ කච්චාන, උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති: "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො. උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"ති.

එවමෙතං[1] ආවුසො ආනන්ද හොති, යෙසං ආයස්මන්තානං තාදිසා සබ්‍රහ්මචාරයො අනුකම්පකා අත්ථකාමා ඔවාදකා අනුසාසකා. ඉදඤ්ච පන මෙ ආයස්මතො ආනන්දස්ස ධම්මදෙසනං සුත්වා ධම්මො අභිසමෙතොති.

## 1. 2. 4. 9.

## පඨම රාහුල සුත්තං

91. සාවත්ථියං:

අථ ඛො ආයස්මා රාහුලො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාහුලො භගවන්තං එතදවොච

කථං නු ඛො භන්තෙ, ජානතො කථං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාරමමිඞ්කාරමානානුසයා[2] න හොන්තීති?

යං කිඤ්චි රාහුල, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං "නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. යා කාචි වෙදනා

1. එවඤ්ච තෙ – සීමු.
2. "අහංකාරමමිංකාරමානානුසයා – මජ්ඣං, සතා, PTS

කච්චානය, ''සියල්ල ඇතැ''යි යන මෙය එක් අන්තයෙකැ, ''සියල්ල නැතැ''යි යන මෙය දෙවෙනි අන්ත යයි. කච්චානය, තෙල අන්ත දෙකට නො පැමිණ තථාගතයෝ මැදුම් මඟින් දහම් දෙසති. අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාර වෙයි, සංස්කාර ප්‍රත්‍යයයෙන් විඥානය වෙයි, විඥානප්‍රත්‍යයයෙන් නාමරූප වෙයි, නාමරූපප්‍රත්‍යයයෙන් ෂඩායතන වෙයි, ෂඩායතන ප්‍රත්‍යයයෙන් ස්පර්ශ වෙයි, ස්පර්ශප්‍රත්‍යයයෙන් වෙදනා වෙයි, වෙදනාප්‍රත්‍යයයෙන් තෘෂ්ණා වෙයි, තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදාන වෙයි, උපාදාන ප්‍රත්‍යයයෙන් භව වෙයි, භවප්‍රත්‍යයයෙන් ජාතිය වෙයි, ජාති ප්‍රත්‍යයයෙන් ජරාමරණ ශොකපරිදෙව දුක්ඛ දෞර්මනස්ස උපායාසයෝ වන්නාහ. මෙසේ තෙල කෙවල දුඃඛස්කන්ධයාගේ සමුදය වෙයි.

අවිද්‍යාවෙ ම නිරවශේෂ විරාගනිරෝධයෙන් සංස්කාර නිරෝධය වෙයි, සංස්කාර නිරෝධයෙන් විඥානනිරෝධය වෙයි, විඥානනිරෝධයෙන් නාමරූපනිරෝධය වෙයි, නාමරූපනිරෝධයෙන් ෂඩායතනනිරෝධය වෙයි, ෂඩායතනනිරොධයෙන් ස්පර්ශ නිරෝධය වෙයි, ස්පර්ශනිරෝධයෙන් වෙදනානිරෝධය වෙයි, වේදනානිරෝධයෙන් තෘෂ්ණානිරෝධය වෙයි, තෘෂ්ණානිරෝධයෙන් උපාදානනිරෝධය වෙයි, උපාදාන නිරෝධයෙන් භවනිරෝධය වෙයි, භවනිරෝධයෙන් ජාතිනිරෝධය වෙයි, ජාති නිරෝධයෙන් ජරාමරණ සෝකපරිදෙව දුක්ඛදෞර්මනස්සඋපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ තෙල හුදු දුඃඛරාශිහුගේනිරෝධය වේ යයි.

ඇවැත්නි, ආනන්දයෙනි, යම් කෙනකුන්ට අනුකම්පා කරන වැඩ කැමැති අවවාද කරන අනුශාසනා කරන ආයුෂ්මතුන් වැනි සබ්‍රම්සරහු වෙත්. නම් ඔහු මෙසේ වෙති. ආයුෂ්මත් ආනන්ද තෙරුන්ගේ මේ දම්දෙසුන් අසා මා විසින් දහම් අවබොධ කරන ලද්දේ යයි.

## 1. 2. 4. 9.

## පළමුවැනි රාහුල සූත්‍රය

**91. සැවැත්නුවර :**

එ කල්හි ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය :

''වහන්ස, කෙසේ දන්නහුට කෙසේ දක්නහුට මේ සවිඥ්ඥාණක කයෙහිත් පිටත සියලු නිමිත්තයන්හිත් අහංකාර (දිට්ඨි) මමංකාර (තණ්හා) මාන යන අනුශය ධර්මයෝ නො වෙත් දැ යි ?

රාහුලය, අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි රූපයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් රූපයෙකුත් වේ ද ඒ සියලු රූපය ''තෙල මාගේ නො වේ තෙලෙ මම නො වෙමි තෙල මාගේ ආත්ම නො වේ'' යයි මෙසේ සම්‍යක් ප්‍රඥයෙන් තෙල තතු සේ දකියි, යම් කිසි වේදනාවක් . . . යම් කිසි සංඥවක් . . . යම් කිසි

-පෙ- යා කාචි සඤ්ඤා - යෙ කෙචි සඞ්ඛාරා - යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසොහමස්මි න මෙ'සො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති.

එවං ඛො රාහුල, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහඞ්කාරමමඞ්කාරමානානුසයා න හොන්තී"ති.

## 1. 2. 4. 10.

## දුතිය රාහුල සුත්තං

92. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාහුලො භගවන්තං එතදවොච:

කථං නු ඛො භන්තෙ, ජානතො කථං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහඞ්කාරමමඞ්කාර-මානාපගතං මානසං හොති විධාසමතික්කන්තං සන්තං සුවිමුත්තන්ති?

යං කිඤ්චි රාහුල, රූපං -පෙ- යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං "නෙතං මම, නෙසො'හමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුපාදවිමුත්තො හොති. යා කාචි වෙදනා - පෙ - යා කාචි සඤ්ඤා - යෙ කෙචි සඞ්ඛාරා - යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුපාදා විමුත්තො හොති.

එවං ඛො රාහුල, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහඞ්කාරමමඞ්කාරමානාපගතං මානසං හොති විධාසමතික්කන්තං සන්තං සුවිමුත්තන්ති.

ථෙරවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

ආනන්දො තිස්සො යමකො අනුරාධො ච වක්කලි
අස්සජි ඛෙමකො ඡන්නො රාහුලා අපරෙ දුවෙති.

සංස්කාර කෙනෙක් . . . අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි විඥානයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් විඥානයෙකුත් වේ ද, ඒ සියලු විඥානය "තෙල මා ගේ නො වෙයි, තෙල මම නො වෙමි තෙල මාගේ ආත්මය නො වේ'' යයි මෙසේ සම්‍යක් ප්‍රඥයෙන් තෙල ඇති සැටි දකියි.

රාහුල, මෙසේ දන්නහුට මෙසේ දක්නහුට මේ සවිඤ්ඤාණක කයෙහිත් බැහැර සියලු නිමිත්තයන්හිත් අහංකාර මමංකාර මානානුසයයෝ නො වෙති යි.

## 1. 2. 4. 10.

## දෙවැනි රාහුල සූත්‍රය

92. සැවැත්නුවර :

එකත් පසෙක හුන් ආයුෂ්මත් රාහුල තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය :

"වහන්ස, කෙසේ දන්නාහට කෙසේ දක්නාහට මේ සවිඤ්ඤාණක කයෙහිත් බැහැර සියලු නිමිත්තයන්හිත් අහංකාර මමංකාරමානයෙන් වෙන් වූ මාන කොටසුන් ඉක්මවූ සන්හුන් වූ මොනොවට මිදුණු සිත වේ ද ?''යි.

රාහුලය, . . . යම් කිසි රූපයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් රූපයෙකුත් වේ ද, ඒ සියලු රූපය 'තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ'' යයි මෙසේ තෙල තතු සේ මනා නුවණින් දැක උපාදාන රහිත වැ මිදුණේ වෙයි යම් කිසි වේදනාවක් . . . යම් කිසි සංඥාවක් . . . යම් කිසි සංස්කාර කෙනෙක් . . . අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි විඥානයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් විඥානයෙකුත් වේ ද, ඒ සියලු විඥානය 'තෙල මාගේ නො වෙයි, තෙල මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේ' යයි මෙසේ තෙල තතු සේ මනා නුවණින් දැක උපාදාන රහිත ව මිදුණේ වෙයි.

රාහුලය, මෙසේ දන්නා මෙසේ දක්නා පුද්ගලහට මේ සවිඤ්ඤාණක කයෙහිත් පිටත සියලු නිමිත්තයන්හිත් අහඞ්කාර (දිට්ඨි) මමඞ්කාර (තණ්හා) මානයෙන් වෙන් වූ මාන කොටසුන් ඉක්ම වූ සන්හුන් වූ මැනවින් මිදුණ සිත වේ යි.

### සිවුවැනි ථෙර වර්ග යි

එහි උද්දානය :

ආනන්ද, තිස්ස, යමක, අනුරාධ, වක්කලි, අස්සජි, ඛෙමක, ඡන්න යන සූත්‍ර ද, අනෙක් රාහුල සූත්‍ර දෙක ද යි සූත්‍ර දශයෙකි.

## 5. පුප්ඵවග්ගො

### 1. 2. 5. 1.

### නදී සුත්තං

93. සාවත්ථියං :

සෙය්‍යථාපි භික්ඛවෙ, නදී පබ්බතෙය්‍යා ඔහාරිනී දූරඞ්ගමා සීඝසොතා, තස්සා උභොසු තීරෙසු[1] කාසා චෙපි ජාතා අස්සු. තෙ නං අජ්ඣොලම්බෙය්‍යුං, කුසා චෙපි ජාතා අස්සු. තෙ නං අජ්ඣොලම්බෙය්‍යුං. බබ්බජා චෙපි ජාතා අස්සු. තෙ නං අජ්ඣොලම්බෙය්‍යුං. බීරණා චෙපි ජාතා අස්සු. තෙ නං අජ්ඣොලම්බෙය්‍යුං. රුක්ඛා චෙපි ජාතා අස්සු. තෙ නං අජ්ඣොලම්බෙය්‍යුං.

තස්සා පුරිසො සොතෙන වුය්හමානො කාසෙ චෙපි ගණ්හෙය්‍ය, තෙ පලුජ්ජෙය්‍යුං. සො තතො නිදානං අනයබ්‍යසනං ආපජ්ජෙය්‍ය. කුසෙ චෙපි ගණ්හෙය්‍ය තෙ පලුජ්ජෙය්‍යුං. සො තතො නිදානං අනයබ්‍යසනං ආපජ්ජෙය්‍ය බබ්බජෙ චෙපි ගණ්හෙය්‍ය තෙ පලුජ්ජෙය්‍යුං. සො තතො නිදානං අනයබ්‍යසනං ආපජ්ජෙය්‍ය. බීරණෙ චෙපි ගණ්හෙය්‍ය තෙ පලුජ්ජෙය්‍යුං. සො තතො නිදානං අනයබ්‍යසනං ආපජ්ජෙය්‍ය. රුක්ඛෙ චෙපි ගණ්හෙය්‍ය. තෙ පලුජ්ජෙය්‍යුං. සො තතො නිදානං අනයබ්‍යසනං ආපජ්ජෙය්‍ය.

එවමෙව ඛො භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං, තස්ස තං රූපං පලුජ්ජති. සො තතො නිදානං අනයබ්‍යසනං ආපජ්ජති

වෙදනං අත්තතො සමනුපස්සති -පෙ- වෙදනාය වා අත්තානං, තස්ස සා වෙදනා පලුජ්ජති. සො තතො නිදානං අනයබ්‍යසනං ආපජ්ජති. සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති. සඞ්ඛාරවන්තං වා අත්තානං අත්තනි වා සඞ්ඛාරෙ සඞ්ඛාරෙසු වා අත්තානං, තස්ස තෙ සඞ්ඛාරා පලුජ්ජන්ති. සො තතො නිදානං අනයබ්‍යසනං ආපජ්ජති. විඤ්ඤාණං අත්තතො සමනුපස්සති. විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. තස්ස තං විඤ්ඤාණං පලුජ්ජති. සො තතො නිදානං අනයබ්‍යසනං ආපජ්ජති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ,

---

1. උභතො තීරෙ - සීමු.
උභතො තීරෙසු - ස්‍යා.



Free Distribution www.aathaapi.org

# 5. පුප්ඵ වර්ගය

## 1. 2. 5. 1

## නදී සූත්‍රය

**93.** සැවැත්නුවර :

මහණෙනි, යම්සේ පර්වතයෙන් ගලා බස්නා, දියෙහි වැටුණු වැටුණු දෑ පහළට ගෙන යන, දුරට ගමන් කරන, වේගවත් ජලධාරා ඇති නදියක් වේ ද, ඉදින් එහි දෙතෙර හටගත් වැලුක් තෘණයෝ වෙත් ද, ඔහු ඒ නදිය එල්බ ගන්නාහ. ඉදින් හටගත් කුශ තෘණයෝ වෙත් ද, ඔහු ඒ නදිය එල්බ ගන්නාහ. ඉදින් හටගත් බබුස් තෘණයෝ වෙත් ද, ඔහු ඒ නදිය එල්බ ගන්නාහ. ඉදින් හටගත් සුවඳහොට තෘණයෝ වෙත් ද, ඔහු ඒ නදිය එල්බ ගන්නාහ. ඉදින් හටගත් (එරඬු ආදී දුබල) වෘක්ෂයෝ වෙත් ද, ඔහු ඒ නදිය එල්බ ගන්නාහු ය.

ඒ නදියේ සැඩ පහරින් පහතට ගෙන යනු ලබන (පාවෙන) පුරුෂයෙක් ඉදින් ඒ වැලුක් එල්බ ගන්නේ ද, ඒ තෘණ සිඳෙන්නේ යැ. හේ ඒ හේතු කොට ඇති බලවත් ව්‍යසනයට පැමිණෙන්නේ යැ. ඉදින් කුසතණ ගන්නේ ද, ඒ තෘණ සිඳෙන්නේ යැ. හේ ඒ හේතු කොට ඇති බලවත් ව්‍යසනයට පැමිණෙන්නේ යැ. ඉදින් බබුස් තණ ගන්නේ ද, ඒ තෘණ සිඳෙන්නේ යැ. හේ ඒ හේතු කොට ඇති බලවත් ව්‍යසනයට පැමිණෙන්නේ යැ. ඉදින් සුවඳහොට ගන්නේ ද, ඒ තෘණ සිඳෙන්නේ යැ. හේ ඒ හේතු කොට ඇති බලවත් ව්‍යසනයට පැමිණෙන්නේ යැ. ඉදින් රුක් ගන්නේ ද, ඒ රුක් සිඳෙන්නේ යැ, හේ ඒ හේතු කොට ඇති බලවත් ව්‍යසනයට පැමිණෙන්නේ යැ.

මහණෙනි, එසෙයින් ම බුද්ධාදි ආර්යයන් නො දක්නා ආර්ය්‍යධර්මයෙහි අදක්ෂ, ආර්ය්‍ය ධර්මයෙහි නො හික්මුණු, බුද්ධාදි සත්පුරුෂයන් නො දක්නා, සත්පුරුෂධර්මයෙහි අදක්ෂ, සත්පුරුෂධර්මයෙහි නො හික්මුණු අශ්‍රැතවත් පෘථග්ජන රූපය ආත්ම වශයෙන් දකියි, රූපවත් ආත්මය හෝ, රූපය ආත්මයෙහි ලා හෝ ආත්මය රූපයෙහි ලා හෝ දකියි. ඔහට ඒ රූපය නැසෙයි. හෙ ඒ නිදාන කොට ඇති මහත් ව්‍යසනයට පැමිණෙයි.

වේදනාව ආත්ම යයි දකියි ... වේදනාවෙහි ආත්මය පවතී යයි හෝ දකියි. ඔහුගේ ඒ වේදනාව නැසෙයි. හෙ ඒ හෙතු කොට ඇති මහත් ව්‍යසනයට පැමිණෙයි, සංඥව ... සංස්කාර ආත්මය යි දකියි, ආත්මය සංස්කාර ඇත්තෙකැ යි හෝ ආත්මයෙහි සංස්කාර පවතී යි හෝ සංස්කාරයන්හි ආත්මය පවතී යි හෝ දකියි. ඔහුගේ ඒ සංස්කාරයෝ නැසෙති, හේ ඒ හේතු කොට ඇති බලවත් ව්‍යසනයට පැමිණෙ යි, විඥානය ආත්මය යි දකියි, ආත්මය විඥාන ඇත්තෙකැ යි හෝ ආත්මයෙහි විඥානය පවතී යි හෝ විඥානයෙහි ආත්මය පවතී යි හෝ දකියි, ඔහුගේ ඒ විඥානය නැසෙයි. හේ ඒ හේතු කොට බලවත් දුකට පැමිණේ.

මහණෙනි, ඒ කිමැයි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැ ? යි

වහන්ස, අනිත්‍ය යැ.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං: "එතං මම එසොහමස්මි, එසො මෙ අත්තාති?".

නො හෙතං භන්තෙ,

වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

තස්මාතිහ භික්ඛවෙ -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 2. 5. 2.

## පුප්ඵ සුත්තං

94. සාවත්ථියං:

නාහං භික්ඛවෙ, ලොකෙන විවදාමි. ලොකො ච[1] ඛො භික්ඛවෙ, මයා විවදති. න භික්ඛවෙ, ධම්මවාදී කෙනචි ලොකස්මිං විවදති.

යං භික්ඛවෙ, නත්ථිසම්මතං ලොකෙ පණ්ඩිතානං අහම්පි තං නත්ථීති වදාමි.[2] යං භික්ඛවෙ, අත්ථිසම්මතං ලොකෙ පණ්ඩිතානං අහම්පි තං අත්ථීති වදාමි.

කිඤ්ච භික්ඛවෙ, නත්ථිසම්මතං ලොකෙ පණ්ඩිතානං යමහං නත්ථීති වදාමි.

රූපං භික්ඛවෙ, නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං නත්ථිසම්මතං ලොකෙ පණ්ඩිතානං අහම්පි තං නත්ථීති වදාමි. වේදනා නිච්චා, ධුවා සස්සතා අවිපරිණාමධම්මා නත්ථිසම්මතා ලොකෙ පණ්ඩිතානං අහම්පි තං නත්ථීති වදාමි. සඤ්ඤා -පෙ- සඞ්ඛාරා නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා නත්ථිසම්මතා ලොකෙ පණ්ඩිතානං අහම්පි තං නත්ථීති වදාමි. විඤ්ඤාණං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං නත්ථිසම්මතං ලොකෙ පණ්ඩිතානං අහම්පි තං නත්ථීති වදාමි. ඉදං ඛො භික්ඛවෙ, නත්ථිසම්මතං ලොකෙ පණ්ඩිතානං යමහං නත්ථීති වදාමි.[2]

කිඤ්ච භික්ඛවෙ, අත්ථිසම්මතං ලොකෙ පණ්ඩිතානං යමහං අත්ථීති වදාමි.

රූපං භික්ඛවෙ, අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං අත්ථිසම්මතං ලොකෙ පණ්ඩිතානං අහම්පි තං අත්ථීති වදාමි. වේදනා අනිච්චා දුක්ඛා විපරිණාමධම්මං අත්ථිසම්මතා ලොකෙ පණ්ඩිතානං අහම්පි තං අත්ථීති වදාමි, සඤ්ඤා -පෙ- සඞ්ඛාරා අනිච්චා, දුක්ඛා විපරිණාමධම්මා අත්ථිසම්මතා ලොකෙ පණ්ඩිතානං අහම්පි තං අත්ථීති වදාමි. විඤ්ඤාණං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං අත්ථිසම්මතං ලොකෙ පණ්ඩිතානං අහම්පි තං අත්ථීති වදාමි.

---

1. ලොකොච - මජ්ඣං.
2. නත්ථි වදාමි - මජ්ඣං.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද ? සුව හෝ වේ ද යි.?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වන සැහැවි නම් එය '' තෙල මාගේ යැ. තෙල මම වෙමි. තෙල මාගේ ආත්ම යයි දක්නට සුදුසු ද ? ''යි.

වහන්ස, මෙය යුතු නො වේ ම ය.

වේදනාව ... සංඥව ... සංස්කාරයෝ ... විඥනය නිත්‍ය හෝ වෙත් ද, අනිත්‍ය හෝ වෙත් ද ? යි.

වහන්ස, අනිත්‍ය ය ....

මහණෙනි, එහෙයින් මෙහි ... මේ රහත් බව පිණිස අන් කිසෙක් නැතැ යි දනගනී යි.

## 1. 2. 5. 2.

## පුප්ඵ සූත්‍රය

**94. සැවැත්නුවර :**

මහණෙනි, මම ලෝකයා සමඟ විවාද නො කරමි. මහණෙනි, ලෝකයා වූ කලී මා සමග විවාද කෙරෙයි. මහණෙනි, ධර්මවාදියෙක් ලොව කිසිවකු සමග විවාද නො කෙරෙයි.

මහණෙනි, ලොව පණ්ඩිතයන් විසින් යමෙක් නැතැ යි සම්මත නම් මම ද එය නැතැ යි කියමි. මහණෙනි, ලොව යමෙක් පණ්ඩිතයන් විසින් ඇතැ යි සම්මත නම් මම ද එය ඇතැ යි කියමි.

මහණෙනි, මම යමක් නැතැ යි කියමි ද, ලොව එ බඳු කිමෙක් පණ්ඩිතයන් විසින් නැතැ යි සම්මත ද යත් :

මහණෙනි, නිත්‍ය ධ්‍රැව ශාශ්වත අවිපරිණාමධර්ම රූපයක් ලොව නැතැ යි පණ්ඩිතයන් විසින් සම්මත යැ. මම ද එය නැතැ යි කියමි. නිත්‍ය ධ්‍රැව ශාශ්වත අවිපරණාමධර්ම වේදනාවක් නැතැ යි පණ්ඩිතයන් විසින් සම්මත යැ. මම ද එය නැතැ යි කියමි. සංඥවක් ... නිත්‍ය ධ්‍රැව ශාශ්වත අවිපරිණාමධර්ම සංස්කාර ලොව නැතැ යි පණ්ඩිතයන් විසින් සම්මත යැ. මම ද එය නැතැ යි කියමි. නිත්‍ය ධ්‍රැව ශාශ්වත අවිපරිණාමධර්ම විඥනයක් ලොව නැතැ යි පණ්ඩිතයන් විසින් සම්මත යැ. මම ද එය නැතැ යි කියමි. මහණෙනි, මම යමක් නැතැ යි කියමි ද, මේ වූකලී ලෝකයෙහි පණ්ඩිතයන් විසින් නැතැ යි සම්මත යි.

මහණෙනි, මම යමෙක් ඇතැ යි කියමි ද, ඒ කිමෙක් ලොව පණ්ඩිතයන් විසින් ඇතැ යි සම්මත ද යත් :

මහණෙනි, අනිත්‍ය, දුඃඛ, විපරිණාමධර්ම රූපයක් ලොව ඇතැ යි පණ්ඩිතයන් විසින් සම්මත ය. මම ද එය ඇතැ යි කියමි. අනිත්‍ය, දුඃඛ, විපරිණාමධර්ම වේදනාවක් ලොව ඇතැ යි පණ්ඩිතයන් විසින් සම්මත යැ, මම ද එය ඇතැ යි කියමි. සංඥවක් ... අනිත්‍ය දුඃඛ විපරිණාමධර්ම සංස්කාර ලොව ඇතැ යි පණ්ඩිතයන් විසින් සම්මත යැ. මම ද එය ඇතැ යි කියමි. අනිත්‍ය, දුඃඛ, විපරිණාමධර්ම විඥනයක් පණ්ඩිතයන් විසින් ලොව ඇතැ යි සම්මත යැ, මම ද එය ඇතැ යි කියමි.

ඉදං ඛො භික්ඛවෙ, අත්ථිසම්මතං ලොකෙ පණ්ඩිතානං සමහං අත්ථීති වදාමි.

අත්ථි භික්ඛවෙ, ලොකෙ ලොකධම්මො, යං[1] තථාගතො අභිසම්බුජ්ඣති අභිසමෙති අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති පට්ඨපෙති විවරති විභජති උත්තානීකරොති. කිඤ්ච භික්ඛවෙ, ලොකෙ ලොකධම්මො යං තථාගතො අභිසම්බුජ්ඣති, අභිසමෙති. අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති දෙසෙති, පඤ්ඤපෙති, පට්ඨපෙති විවරති විභජති උත්තානීකරොති?

රූපං භික්ඛවෙ, ලොකෙ ලොකධම්මො, තං තථාගතො අභිසම්බුජ්ඣති අභිසමෙති, අභිම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති පට්ඨපෙති විවරති විභජති උත්තානීකරොති. යො භික්ඛවෙ, තථාගතෙන එවං ආචික්ඛියමානෙ දෙසියමානෙ පඤ්ඤපියමානෙ පට්ඨපියමානෙ විවරියමානෙ විභජියමානෙ උත්තානීකයිරමානෙ න ජානාති න පස්සති තමහං භික්ඛවෙ, බාලං පුථුජ්ජනං අන්ධං අචක්ඛුකං අජානන්තං අපස්සන්තං කින්ති කරෙමි.

වෙදනා භික්ඛවෙ, ලොකෙ ලොකධම්මො – පෙ – සඤ්ඤා භික්ඛවෙ ලොකෙ ලොකධම්මො – පෙ – සඞ්ඛාරා භික්ඛවෙ, ලොකෙ ලොකධම්මො –පෙ– විඤ්ඤාණං භික්ඛවෙ, ලොකෙ ලොකධම්මො. තං තථාගතො අභිසම්බුජ්ඣති අභිසමෙති, අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති පට්ඨපෙති විවරති විභජති උත්තානීකරොති. යො භික්ඛවෙ, තථාගතෙන එවං ආචික්ඛියමානෙ දෙසියමානෙ පඤ්ඤපියමානෙ පට්ඨපියමානෙ විවරියමානෙ විභජියමානෙ උත්තානීකයිරමානෙ න ජානාති න පස්සති. තමහං භික්ඛවෙ, බාලං පුථුජ්ජනං අන්ධං අචක්ඛුකං අජානන්තං අපස්සන්තං කින්ති කරෙමි.

සෙය්‍යථාපි භික්ඛවෙ, උප්පලං වා පදුමං වා පුණ්ඩරීකං වා උදකෙ ජාතං උදකෙ සංවද්ධං[2] උදකා අච්චුග්ගම්ම ඨාති. අනුපලිත්තං උදකෙන, එවමෙව ඛො භික්ඛවෙ, තථාගතො ලොකෙ ජාතො, ලොකෙ සංවද්ධො ලොකං අභිභුය්‍ය විහරති අනුපලිත්තො ලොකෙනාති.

## 1. 2. 5. 3.

## ඵෙණපිණ්ඩූපම සුත්තං

95. එකං සමයං භගවා අයුජ්ඣායං[3] විහරති ගඞ්ගාය නදියා තීරෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: 'භික්ඛවොති, භදන්තා'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

1. තං – මජසං, ස්‍යා.
2. සංවඩ්ඪං – සී, ස්‍යා.
3. අයොජ්ඣායං – සී 2.

Free Distribution www.aathaapi.org

මහණෙනි, මම යමෙක් ඇතැ යි කියම් ද, මෙය වූකලි පණ්ඩිතයන් විසින් ලොව ඇතැ යි සම්මත යි.

මහණෙනි, තථාගත තෙමේ යමක් මොනොවට අවබොධ කෙරෙයි ද, මොනොවට දනගනියි ද, මොනොවට අවබොධ කොට මොනොවට දැනගෙන කියයි ද, දෙශනා කෙරෙයි ද, පනවයි ද, පිහිටුවයි ද, විවරණ කෙරෙයි ද, බෙදයි ද, උඩුහුරු කෙරෙයි ද, ඒ ලොකධර්මය (ස්කන්ධ පඤ්චකය) ලොව ඇති. මහණෙනි, තථාගත තෙමේ යමක් මැනවින් අවබොධ කෙරෙයි නම් මනාකොට දැනගනියි නම් අවබොධ කොට දැන කියා නම් දෙශනා කෙරේ නම් පනවා නම් පිහිටුවා නම් විවරණය කෙරේ නම්, බෙද නම් උඩුහුරු කෙරේ නම් ලොව ඒ ලොකධර්මය කිමෙක යත් :

මහණෙනි, රූපය ලොව ලොකධර්මයෙකි. තථාගත තෙමේ එය මැනැවින් අවබොධ කෙරෙයි, මැනැවින් දැනගනියි, මැනවින් අවබොධ කොට මැනවින් දැනගෙන කියයි. දෙසයි, පනවයි, පිහිටුවයි, විවරණ කෙරෙයි, බෙදයි, උඩුහුරු කෙරෙයි. මහණෙනි, තථාගතයන් විසින් මෙසේ කියනු ලබන කල්හි දෙශනා කරනු ලබන කල්හි පනවනු ලබන කල්හි පිහිටුවනු ලබන කල්හි විවරණ කරනු ලබන කල්හි බෙදනු ලබන කල්හි උඩුහුරු කරනු ලබන කල්හි යමෙක් නො දනී නම් නො දකී නම් මහණෙනි, අන්ධ වූ ඇස් නැති නො දන්නා නො දක්නා ඒ බාල පුහුදුන්හට මම කුමක් කෙරෙම් ද ?

මහණෙනි, වෙදනාව ලොවැ ලොකධර්මයෙකි . . . මහණෙනි, සංඥව ලොවැ ලොකධර්මයෙකි . . . මහණෙනි, සංස්කාරයෝ ලොවැ ලොකධර්මයෝ ය මහණෙනි, විඥනය ලොවැ ලොකධර්මයෙකි. තථාගත තෙමේ එය මැනැවින් අවබොධ කෙරෙයි, මැනැවින් දැනගනී. මැනවින් අවබොධ කොට මැනැවින් දැන කියයි, දෙශනා කෙරෙයි, පනවයි, පිහිටුවයි, විවරණ කෙරෙයි, බෙදයි, උඩුහුරු කෙරෙයි. මහණෙනි, තථාගතයන් විසින් මෙසේ කියනු ලබන කල්හි දෙශනා කරනු ලබන කල්හි පනවනු ලබන කල්හි පිහිටුවනු ලබන කල්හි විවරණ කරනු ලබන කල්හි බෙදනු ලබන කල්හි උඩුහුරු කරනු ලබන කල්හි යමෙක් නො දනියි නො දකියි නම්, මහණෙනි, අන්ධ වූ ඇස් නැති නො දන්නා නො දක්නා ඒ බාලපුහුදුන්හට මම කුමක් කෙරෙම් ද ?

මහණෙනි, දියෙහි හටගත් දියෙහි වැඩුණු උපුලෙක් හෝ පියුමෙක් හෝ හෙළපියුමෙක් හෝ දියෙන් නැඟී දියෙන් නො ගැටී යමසේ සිටුනේ ද මහණෙනි, එසෙයින් ම තථාගත තෙමේ ලොවැ උපන්නේ ලොවැ වැඩුණේ ලොව මැඩගෙන ලොකයා හා නො ගැටී වාසය කෙරේ යි.

## 1. 2. 5. 3.

## ඵෙණ පිණ්ඩූපම සූත්‍රය

95. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ අයොධ්‍යා නගර සමීපයෙහි ගංගා නම් ගංඉවුරෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, යි භික්ෂූන් ඇමතූ සේක. පින්වතුන් වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ මෙල වදාළ සේක :



Free Distribution www.aathaapi.org

සෙය්‍යථාපි භික්ඛවෙ, අයං ගඞ්ගානදී මහන්තං ඵෙණපිණ්ඩං ආවහෙය්‍ය තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙය්‍ය නිජ්ඣායෙය්‍ය යොනිසො උපපරික්ඛෙය්‍ය, තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායෙය්‍ය තුච්ඡකඤ්ඤෙව ඛායෙය්‍ය, අසාරකඤ්ඤෙව ඛායෙය්‍ය කිං හි සියා භික්ඛවෙ, ඵෙණපිණ්ඩෙ[1] සාරො?

එවමෙව ඛො භික්ඛවෙ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, තං භික්ඛු පස්සති නිජ්ඣායති යොනිසො උපපරික්ඛති,තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායති තුච්ඡකඤ්ඤෙව ඛායති අසාරකඤ්ඤෙව ඛායති කිං හි සියා භික්ඛවෙ, රූපෙ සාරො?

සෙය්‍යථාපි භික්ඛවෙ, සරදසමයෙ ථුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ උදකෙ උදකබුබ්බුළං[1] උප්පජ්ජති චෙව නිරුජ්ඣති ච. තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙය්‍ය නිජ්ඣායෙය්‍ය යොනිසො උපපරික්ඛෙය්‍ය, තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො, රිත්තකඤ්ඤෙව ඛායෙය්‍ය තුච්ඡකඤ්ඤෙව ඛායෙය්‍ය අසාරකඤ්ඤෙව ඛායෙය්‍ය. කිං හි සියා භික්ඛවෙ උදකබුබ්බුළෙ සාරො?

එවමෙව ඛො භික්ඛවෙ, යා කාචි වෙදනා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යං දූරෙ සන්තිකෙ වා, තං භික්ඛු පස්සති නිජ්ඣායති යොනිසො උපපරික්ඛති. තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායති. තුච්ඡකඤ්ඤෙව ඛායති අසාරකඤ්ඤෙව ඛායති. කිං හි සියා භික්ඛවෙ, වෙදනාය සාරො?

සෙය්‍යථාපි භික්ඛවෙ, ගිම්හානං පච්ඡිමෙ මාසෙ ඨිතෙ මජ්ඣන්හිකෙ කාලෙ මරීචි ඵන්දති, තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙය්‍ය නිජ්ඣායෙය්‍ය යොනිසො උපපරික්ඛෙය්‍ය, තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායෙය්‍ය තුච්ඡකඤ්ඤෙව ඛායෙය්‍ය අසාරකඤ්ඤෙව ඛායෙය්‍ය. කිං හි සියා භික්ඛවෙ, මරීචිකාය සාරො?

එවමෙව ඛො භික්ඛවෙ, යා කාචි සඤ්ඤා අතීතානාගතපච්චුප්පන්නා -පෙ- යා දූරෙ සන්තිකෙ වා. තං භික්ඛු පස්සති නිජ්ඣායති යොනිසො උපපරික්ඛති. තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායති තුච්ඡකඤ්ඤෙව ඛායති. අසාරකඤ්ඤෙව ඛායති. කිං හි සියා භික්ඛවෙ, සඤ්ඤාය සාරො?

---

1. ඵෙණපිණ්ඩස්ස - සී මු.
2. උදකපුබ්බුළකං - මජ්සං, උදකෙ බුබ්බුළං P.T.S.

මහණෙනි, යම්සේ මේ "ගංගා" නදිය මහත් පෙණපිඩක් එළවන්නේ ද, ඇස් ඇති පුරුෂයෙක් තෙල පෙණපිඩ දක්නේ යැ. සිතන්නේ යැ., නුවණින් පිරික්සන්නේ ය. දක්නා, සිතන, නුවණින් පිරික්සන ඔහුට එය හිස් වූවක් සේ ම වැටහෙන්නේ ය. බොල් වූවක් සේ ම වැටහෙන්නේ ය. හර නැත්තක් සේ ම වැටහෙන්නේ ය. මහණෙනි· කිම, පෙණපිඩෙහි හරයෙක් වන්නේ ද ?

මහණෙනි, එසෙයින් ම අතීත–අනාගත–පච්චුප්පන්න ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි රූපයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් රූපයෙකුත් වේ ද, මහණ එය දකියි, සිතයි, නුවණින් පිරික්සයි. දකින, සිතන, නුවණින් පිරික්සන ඔහුට එය හිස් වූවක් සේ ම වැටහෙයි. බොල් වූවක් සේ ම වැටහෙයි. හර නැත්තක් සේ ම වැටහෙයි. මහණෙනි, කිම, රූපයෙහි හරයෙක් වන්නේ ද ?

මහණෙනි, යම්සේ සරත්කල මහත්පොද ඇති වැස්ස වස්නා කල්හි දියෙහි දියබුබුළෙක් හටගන්නේත් වේ ද, නැසෙන්නේත් වේ ද, ඇස් ඇති පුරුෂයෙක් තෙල දිය බුබුළ දක්නේ යැ. සිතන්නේ යැ. නුවණින් පුනපුනා පිරික්සන්නේ යැ. දකින සිතන නුවණින් පිරික්සන ඔහුට එය හිස් වූවක් සේ ම වැටහෙන්නේ යැ. බොල් වූවක් සේ ම වැටහෙන්නේ යැ, හර නැත්තක් සේ ම වැටහෙන්නේ යැ. මහණෙනි, කිම, දියබුබුළෙහි හරයෙක් වන්නේ ද ?

මහණෙනි, එසෙයින් ම අතීත–අනාගත–පච්චුප්පන්න ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි වේදනාවක් ඇත් ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් වේදනාවකුත් ඇත් ද, මහණ එය දකියි, සිතයි, නුවණින් පිරික්සයි. දකින සිතන නුවණින් පිරික්සන ඔහුට එය හිස් වූවක් සේ ම වැටහෙයි, බොල් වූවක් සේ ම වැටහෙයි, හර නැත්තක් සේ ම වැටහෙයි. මහණෙනි, කිම, වේදනායෙහි සාරයෙක් ඇත්තේ ද ?

මහණෙනි, යම්සේ ගිම්හල පැසුළුමස මධ්‍යාහ්නයෙහි මිරිඟු සැලේ ද, ඇස් ඇති පුරුෂයෙක් තෙල මිරිඟුව දක්නේ යැ. සිතන්නේ යැ, නුවණින් පිරික්සන්නේ යැ. බලන සිතන නුවණින් පිරික්සන ඔහුට එය හිස් වූවක් සේම වැටහෙන්නේ යැ, බොල් වූවක් සේ ම වැටහෙන්නේ යැ, හර නැත්තක් සේ ම වැටහෙන්නේ යැ. මහණෙනි, කිම, මිරිඟුවෙහි හරයෙක් වන්නේ ද ?

මහණෙනි, එසෙයින් ම අතීත–අනාගත–පච්චුප්පන්න . . . යම් කිසි සංඥවක් ඇත්ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් සංඥවකුත් ඇත් ද, මහණ එය දකියි, සිතයි., නුවණින් පිරික්සයි. දකින සිතන නුවණින් පිරික්සන ඔහුට එය හිස් වූවක් සේ ම වැටහෙයි, බොල් වූවක් සේ ම වැටහෙයි, හර නැත්තක් සේ ම වැටහෙයි. මහණෙනි, කිම, සංඥයෙහි හරයෙක් වන්නේ ද ?

සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො තිණ්හං කුඨාරිං ආදාය වනං පවිසෙය්‍ය, සො තත්ථ පස්සෙය්‍ය මහන්තං කදලික්ඛන්ධං උජුං නවං අකුක්කුකජාතං[1] තමෙනං මූලෙ ඡින්දෙය්‍ය, මූලෙ ඡෙත්වා අග්ගෙ ඡින්දෙය්‍ය, අග්ගෙ ඡෙත්වා පත්තවට්ටිං විනිබ්භුජෙය්‍ය, සො තත්ථ පත්තවට්ටිං විනිබ්භුජන්තො ඵෙග්ගුම්පි නාධිගච්ඡෙය්‍ය. කුතො සාරං? තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙය්‍ය නිජ්ඣායෙය්‍ය යොනිසො උපපරික්ඛෙය්‍ය, තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායෙය්‍ය තුච්ඡකඤ්ඤෙව ඛායෙය්‍ය අසාරකඤ්ඤෙව ඛායෙය්‍ය. කිං හි සියා භික්ඛවෙ, කදලික්ඛන්ධෙ සාරො?

එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි සඞ්ඛාරා අතීතානාගතපච්චුප්පන්නා අජ්ඣත්තා වා බහිද්ධා වා ඔළාරිකා වා සුඛුමා වා හීනා වා පණීතා වා යෙ දූරෙ සන්තිකෙ වා, තං භික්ඛු පස්සති නිජ්ඣායති යොනිසො උපපරික්ඛති, තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායති තුච්ඡකඤ්ඤෙව ඛායති අසාරකඤ්ඤෙව ඛායති. කිං හි සියා භික්ඛවෙ, සඞ්ඛාරෙසු සාරො?

සෙය්‍යථාපි භික්ඛවෙ, මායාකාරො වා මායාකාරන්තෙවාසී වා චාතුම්මහාපථෙ[2] මායං විදංසෙය්‍ය, තමෙනං චක්ඛුමා පුරිසො පස්සෙය්‍ය නිජ්ඣායෙය්‍ය යොනිසො උපපරික්ඛෙය්‍ය, තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායෙය්‍ය තුච්ඡකඤ්ඤෙව ඛායෙය්‍ය අසාරකඤ්ඤෙව ඛායෙය්‍ය. කිං හි සියා භික්ඛවෙ, මායාය සාරො?

එවමෙව ඛො භික්ඛවෙ, යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, තං භික්ඛු පස්සති නිජ්ඣායති යොනිසො උපපරික්ඛති. තස්ස තං පස්සතො නිජ්ඣායතො යොනිසො උපපරික්ඛතො රිත්තකඤ්ඤෙව ඛායති තුච්ඡකඤ්ඤෙව ඛායති අසාරකඤ්ඤෙව ඛායති. කිං හි සියා භික්ඛවෙ, විඤ්ඤාණෙ සාරො?

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති වෙදනායපි නිබ්බින්දති සඤ්ඤායපි නිබ්බින්දති සඞ්ඛාරෙසුපි නිබ්බින්දති විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති විමුත්තස්මිං 'විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා'ති පජානාතීති.

ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

1. ඵෙණපිණ්ඩූපමං රූපං වෙදනා බුබ්බුළූපමා
   මරීචිකූපමා සඤ්ඤා සඞ්ඛාරා කදලූපමා,
   මායූපමඤ්ච විඤ්ඤාණං දීපිතාදිච්චබන්ධුනා.

---

1. අකකුසජාතං - සීමු. අකුක්කුජකජාතං - සයා.
2. චතුමහාපථෙ - මජසං.
3. දෙසිතා - මජසං, සයා.

යම්සේ පුරුෂයෙක් හරයෙන් ප්‍රයෝජන ඇතියේ හර සොයනුයේ හර සෙවීමෙහි සරනුයේ තියුණු කෙටේරියක් ගෙන වනයට පිවිසෙනුයේ ද, හේ එහි ඇද නැති අලුත් නොහටගත් බඩය ඇති මහත් කෙසෙල් කඳක් දක්නේ යැ. තෙල කෙසෙල් කඳ මුල සිඳින්නේ යැ. මුල සිඳ අග සිඳින්නේ යැ, අග සිඳ, පත්වැටි ගලවන්නේ යැ, හේ එහි පත්වැටි ගලවනුයේ එලය ද නො ලබන්නේ ය. හර කොයින් ද ? ඇස් ඇති පුරුෂයෙක් ඒ තෙල කෙසෙල් කඳ දක්නේ යැ. සිතන්නේ යැ, නුවණින් විමසන්නේ යැ. දකින සිතන නුවණින් විමසන ඔහුට එය හිස් වූවක් සේ ම වැටහෙන්නේ යැ, බොල් වූවක් සේ ම වැටහෙන්නේ යැ, හර නැත්තක් සේ ම වැටහෙන්නේ යි. කිම, මහණෙනි. කෙසෙල් කඳෙහි හරයෙක් වන්නේ ද ?

මහණෙනි, එසෙයින් ම අතීත–අනාගත–පච්චුප්පන්න වූ ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ; ප්‍රණීත වේවයි යම් කිසි සංස්කාර කෙනෙක් ඇද්ද, දුර වේවයි ළඟ වේවයි යම් සංස්කාර කෙනෙකුත් ඇද්ද, මහණ එය දකියි, සිතයි, නුවණින් පිරික්සයි. දකින සිතන නුවණින් පිරික්සන ඔහුට එය හිස් වූවක් සේ ම වැටහෙන්නේ යැ, බොල් වූවක් සේ ම වැටහෙන්නේ යැ. හර නැත්තක් සේ ම වැටහෙන්නේ යැ. මහණෙනි, සංස්කාරයන්හි කුමන හරයෙක් වන්නේ ද ?

මහණෙනි, යම්සේ ඉන්ද්‍රජාලියෙක් (විජ්ජාකරුවෙක්) හෝ ඉන්ද්‍රජාලියකුගේ අතැවැස්සෙක් හෝ සිව්මංසලෙක මායාවක් (විජ්ජාවක්) දක්වන්නේ ද, ඇස් ඇති පුරුෂයෙක් තෙල මායාව දක්නේ යැ, සිතන්නේ යැ, නුවණින් පිරික්සන්නේ යැ. දකින සිතන නුවණින් පිරික්සන ඔහුට එය හිස් වූවක් සේ මැ වැටහෙන්නේ යැ, බොල් වූවක් සේ මැ වැටහෙන්නේ යැ, හර නැත්තක් සේ මැ වැටැහෙන්නේ යැ. කිමැ මහණෙනි, මායාවෙහි හරයෙක් වන්නේ ද ?

මහණෙනි, එසෙයින් ම අතීත–අනාගත–වර්තමාන වූ ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි ඖදරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි යම් කිසි විඥනයෙක් ඇත් ද, දුර වේවයි ළඟ වේවයි යම් විඥනයෙකුත් ඇත් ද ? මහණ ඒ විඥනය දකියි. සිතයි, නුවණින් පිරික්සයි. දකින සිතන නුවණින් පිරික්සන ඔහුට එය හිස් වූවක් සේ ම වැටහෙයි, බොල් වූවක් සේ ම වැටහෙයි, හර නැත්තක් සේ ම වැටහෙයි. කිමැ මහණෙනි, විඥනයෙහි හරයෙක් වන්නේ ද ?

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපයෙහි දු කලකිරෙයි, වේදනායෙහි දු කලකිරෙයි, සංඥයෙහි දු කලකිරෙයි, සංස්කාරයෙහි දු කලකිරෙයි, විඥනයෙහි දු කලකිරෙයි, කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇලීම් හේතුයෙන් (පස් කඳෙන්) මිදෙයි ; මිදුණු කල්හි මිදිණැ යි දැනීම (ප්‍රත්‍යවේක්ෂා ඥනය) වෙයි. ජාතික්ෂය විය. මහබඹසර වැසැ නිමවන ලද කරණී කරන ලද, මේ රහත් බව පිණිස අන් කිසෙක් නැතැ යි දැනගනියි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. සුගත වූ ශාස්තෲන් වහන්සේ මෙය වදරා යළි මතුදු තෙල ගාථා වදළ සේක :

(1) රූපය පෙණපිඩක් වැන්න, වේදනාව දියබුබුළක් වැන්න ; සංඥව මිරිඟුවක් වැන්න ; සංස්කාර කෙසෙල්කඳක් වැන්න ; විඥනය මායාවක් වැන්නැ යි ආදිච්චබන්ධු වූ බුදුරජාණන් වහන්සේ විසින් දක්වන ලදී.

2. යථා යථා නං[1] නිජ්ඣායති[2] යොනිසො උපපරික්ඛති,
රිත්තකං තුච්ඡකං හොති යො නං පස්සති යොනිසො.

3. යො ඉමං කායං ගාරය්හං[3] භූරිපඤ්ඤෙන දෙසිතං,
පහානං තිණ්ණං ධම්මානං රූපං පස්සෙථ[4] ජඩ්ඩිතං.

4. ආයු උස්මා ච විඤ්ඤාණං යදා කායං ජහන්තිමං,
අපවිද්ධො තදා සෙති පරභත්තං අචෙතනං.

5. එතාදිසායං සන්තානො මායායං බාලලාපිනී,
වධකො එසො අක්ඛාතො සාරො එත්ථ න විජ්ජති.

6. එවං ඛන්ධෙ අවෙක්ඛෙය්‍ය භික්ඛු ආරද්ධවීරියො,
දිවා වා යදි වා රත්තිං සම්පජානො පතිස්සතො[5].

7. පජහෙ[6] සබ්බසංයොගං කරෙය්‍ය සරණත්තනො,
චරෙය්‍යාදිත්තසීසොව පත්ථයං අච්චුතං පදන්ති.

## 1. 2. 5. 4.

## ගොමය පිණ්ඩූපම සුත්තං

96. සාවත්ථියං:

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

අත්ථි නු ඛො භන්තෙ, කිඤ්චි රූපං යං රූපං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සති? අත්ථි නු ඛො භන්තෙ, කාචි වෙදනා යා වෙදනා නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තථෙව ඨස්සති? අත්ථි නු ඛො භන්තෙ, කාචි සඤ්ඤා යා සඤ්ඤා -පෙ- අත්ථි නු ඛො භන්තෙ, කෙචි සඞ්ඛාරා යෙ සඞ්ඛාරා නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තථෙව ඨස්සන්ති? අත්ථි නු ඛො භන්තෙ, කිඤ්චි විඤ්ඤාණං, යං විඤ්ඤාණං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සතීති?

නත්ථි ඛො භික්ඛු, කිඤ්චි රූපං යං රූපං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සති. නත්ථි ඛො භික්ඛු, කාචි වෙදනා – පෙ – කාචි සඤ්ඤා – පෙ – කෙචි සඞ්ඛාරා – පෙ – නත්ථි ඛො භික්ඛු කිඤ්චි විඤ්ඤාණං යං විඤ්ඤාණං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සති.

1. 'නං' ඌනං – මජ්ඣං, ස්‍යා, PTS.
2. නිජ්ඣාති – සී 2
3. ඉමඤ්ච කායං ආරබ්භ – මජ්ඣං, ස්‍යා, PTS.
4. පස්සථ – මජ්ඣං.
5. පටිස්සතො – මජ්ඣං, ස්‍යා.
6. ජහෙය්‍ය – මජ්ඣං.

(2) යමෙක් එය නුවණින් දකී ද, යම් යම් පරිද්දෙන් එය සිතා ද, නුවණින් පිරික්සා ද, එපරිද්දෙන් හිස් වූවක් බොල් වූවක් වෙයි.

(3) පතළ නුවණැති බුදුරජාණන් වහන්සේ විසින් ගැරහියයුතු කොට දේශිත, (ආයු ආදි) දහම් තුනෙක ප්‍රහාණය ඇති, යොහොනෙහි දමන ලද රූපස්කන්ධ සංඛ්‍යාත මෙ කය යමෙක් දක්නේ ද,

(4) ආයුෂත් (ජීවිතෙන්ද්‍රියත්) උණුසුමත් (කර්මජතේජෝධාතුවත්) විඥනයත් යම් කලෙක මේ කය හැර දමා ද, එ කල්හි බැහැර කරන ලද්දේ (කෘමිගණාදි) මෙරමා හට බත් ව අචේතන ව හොවී යි (දකියි.)

(5) (මළහු පිළිබඳ) මේ ප්‍රවේණිය (ක්‍රියාවලිය) මෙ බඳු ය. මේ විඥනය බාලයන් ලවා මැනැවැ යි කියවන මායාවෙකි. තෙල ස්කන්ධ (ඔවුනොවුන් නසාලන අරියෙන්) වධකයෙකැ යි පවසන ලදි. මෙහි හරයෙක් නැති.

(6) ඇරැඹූ වෙර ඇති මහණ ඉදින් දහවල් හෝ රැය හෝ මනා නුවණ ඇත්තේ එළඹ සිටි සිහි ඇත්තේ ස්කන්ධයන් මෙසේ බලන්නේ යි.

(7) අච්‍යුත සඞ්ඛ්‍යාත නිවන පතනුයේ සියලු සංයෝජන දුරු කරන්නේ යැ, තමහට පිහිටක් කර ගන්නේ යැ, හිස ගිනි ගත්තකු සේ හැසිරෙන්නේ යි.

## 1. 2. 5. 4.

## ගෝමය පිණ්ඩූපම සූත්‍රය

**96. සැවැත්නුවර :**

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ යැ, එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය :

'' වහන්ස, යම් රූපයෙක් නිත්‍ය වූයේ ධ්‍රැව වූයේ ශාශ්වත වූයේ නො පෙරළෙන සැහැවි ඇත්තේ ශාශ්වතවස්තු හා සම වූයේ එසේ ම සිටුනේ නම් එබඳු කිසි රූපයෙක් ඇද්ද ? වහන්ස, යම් වේදනාවක් නිත්‍ය ද, ධ්‍රැව ද, ශාශ්වත ද, නො පෙරළෙන සැහැවි ඇත් ද, ශාශ්වත වස්තූන් හා සම ව එසේ ම සිටියි නම් එ බඳු කිසියම් වේදනාවක් ඇද්ද ? වහන්ස, යම් සංඥවක් ... එ බඳු කිසියම් සංඥවක් ඇද්ද ? වහන්ස, යම් සංස්කාර කෙනෙක් නිත්‍ය ද, ධ්‍රැව ද, ශාශ්වත ද, නො පෙරළෙන සැහැවි ඇත් ද, ශාශ්වතවස්තූන් හා සම ව එසේ ම සිටිත් නම් එ බඳු කිසියම් සංස්කාර කෙනෙක් ඇද්ද ? වහන්ස, යම් විඥනයෙක් නිත්‍ය ද, ධ්‍රැව ද, ශාශ්වත ද, නො පෙරළෙන සැහැවි ඇත් ද ශාශ්වත වස්තූන් හා සම ව එසේ ම සිටුනේ නම් එ බඳු කිසියම් විඥනයක් ඇද්දැ ''යි.

මහණ, යම් කිසි රූපයෙක් නිත්‍ය නම් ධ්‍රැව නම් ශාශ්වත නම් නොවෙනස් වන ස්වභාව ඇත්තේ නම ශාශ්වත වස්තූන් හා සම ව එසේ ම සිටුනේ නම් එබඳු කිසි රූපයෙක් නැත් මැ යැ, මහණ, ... කිසි වේදනාවක් නැත් මැ යැ, කිසි සංඥවක් ... කිසි සංස්කාර කෙනෙක් ... මහණ, යම් විඥනයෙක් නිත්‍ය නම් ධ්‍රැව නම් ශාශ්වත නම් නො වෙනස් වන ස්වභාව ඇත්තේ නම ශාශ්වතවස්තූන් හා සම ව එසේ ම සිටුනේ නම් එබඳු කිසි විඥනයෙක් නැත් මැ යි.

අථ ඛො භගවා පරිත්තං ගොමයපිණ්ඩං පාණිනා ගහෙත්වා තං භික්ඛුං එතදවොච: එත්තකොපි ඛො භික්ඛු, අත්තභාවපටිලාභො නත්ථි නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො, එත්තකො චෙපි භික්ඛු, අත්තභාවපටිලාභො අභවිස්ස නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො නයිදං බ්‍රහ්මචරියවාසො පඤ්ඤායෙථ සම්මා දුක්ඛක්ඛයාය, යස්මා ච ඛො භික්ඛු, එත්තකොපි අත්තභාවපටිලාභො නත්ථි නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො. තස්මා, බ්‍රහ්මචරියවාසො පඤ්ඤායති සම්මා දුක්ඛක්ඛයාය.

"භූතපුබ්බාහං භික්ඛු, රාජා අහොසිං ඛත්තියො මුද්ධාවසිත්තො. තස්ස මය්හං භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරසීති නගරසහස්සානි අහෙසුං කුසාවතීරාජධානිපමුඛානි.

තස්ස මය්හං භික්ඛු රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරසීති පාසාදසහස්සානි අහෙසුං ධම්මපාසාදපමුඛානි.

තස්ස මය්හං භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිකූටාගාරසහස්සානි අහෙසුං මහාබ්‍යූහකූටාගාරපමුඛානි.

තස්ස මය්හං භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිපල්ලඞ්කසහස්සානි අහෙසුං දන්තමයානි සාරමයානි සොවණ්ණමයානි රූපියමයානි ගොනකත්ථතානි[1] පටිකත්ථතානි පටලිකත්ථතානි කාදලිමිගපවරපච්චත්ථරණානි සඋත්තරච්ඡදනි[2] උභතොලොහිතකූපධානානි.

තස්ස මය්හං භික්ඛු රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිනාගසහස්සානි අහෙසුං සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණද්ධජානි හෙමජාලපටිච්ඡන්නානි උපොසථනාගරාජපමුඛානි.

තස්ස මය්හං භික්ඛු රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිඅස්සසහස්සානි අහෙසුං සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණද්ධජානි හෙමජාලපටිච්ඡන්නානි වලාහකඅස්සරාජපමුඛානි.

තස්ස මය්හං භික්ඛු රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිරථසහස්සානි අහෙසුං සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණද්ධජානි හෙමජාලපටිච්ඡන්නානි වෙජයන්තරථපමුඛානි.

තස්ස මය්හං භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීති මණිසහස්සානි අහෙසුං මණිරතනපමුඛානි.

තස්ස මය්හං භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීති ඉත්ථිසහස්සානි අහෙසුං සුභද්දාදෙවිපමුඛානි.

තස්ස මය්හං භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීති ඛත්තියසහස්සානි අහෙසුං අනුයුත්තානි[3] පරිනායකරතනපමුඛානි.

1. සොවණ්ණමයානි ගොනකත්ථතානි - මජ්ඣං
2. සඋත්තරච්ඡදනානි, - PTS, සී 2.
3. අනුයන්තානි - මජ්ඣං, සයා.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අල්ප වූ ගොමපිඩක් අතින් ගෙන ඒ මහණහට මෙය වදාළ සේක : මහණ, නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නො පෙරළෙන සැහැවි ඇති මෙ පමණ වූද ලබන ලද අත්බවෙක් නැත. මහණ, ඉදින් නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නො පෙරළෙන සැහැවි ඇති මෙ පමණ වූ ද පිළිලද අත්බවෙක් වී නම් මොනොවට දුක් ගෙවීම පිණිස මේ බඹසර විසුම නො පැනෙන්නේ යැ. මහණ යම් හෙයෙකින් නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නොවෙනස් වන ස්වභාව ඇති මෙ පමණ වූ ද අත් බැව පිළිලැබීමෙක් නැද්ද, එ හෙයින් මොනොවට දුක් ගෙවීම පිණිස බඹසර විසුම පැනේ.

මහණ, පෙර වූවක් කියමි : මම මුදුන්හි අභිෂේක කළ කැත්රජෙක් වීමි. මහණ, මුදුන්හි අභිෂික්ත කැත්රජකු වූ ඒ මට කුසාවතී රාජධානිය ප්‍රමුඛ කොට ඇති නගරයෝ සුවාසූ දහසක් වූහ.

මහණ, මුදුන්හි, අභිෂික්ත කැත්රජකු වූ ඒ මට දහම්පහය ප්‍රමුඛ කොට ඇති ප්‍රාසාදයෝ සුවාසූදහසක් වූහ.

මහණ, මුදුන්හි අබිසෙස් කළ කැත්රජකු වූ ඒ මට මහාව්‍යූහ කූළුගෙය ප්‍රමුඛ කොට ඇති කුළුගෙවල් සුවාසුදහසක් විය.

මහණ, මුදුන්හි බිසෙස් කළ කැත්රජකු වූ ඒ මට දළමුවා වූ ද හරමුවා වූ ද රන්මුවා වූ ද රිදීමුවා වූ ද කොදුපලස් අතුරන ලද්දවූ ද දෙපස එළලොම්මුවා සුදු කම්බිලි අතුරන ලද්ද වූ ද ගනපුප් එළලොම්මුවා අතුරුණු අතුරන ලද්දවූ ද කෙසෙල්මුවසමින් කළ උතුම් පසතුරුණු ඇති උඩුවියන් සහිත වූ දෙපස රත් කන්වයින් ඇති පලහනු සුවාසුදහසක් වූහ.

මහණ, මුදුන්හි, අභිෂික්ත කැත්රජකු වූ ඒ මට රන් අබරණ ඇති රන් දද ඇති රන්දැලින් වැසුණු උපොසථ ඇත්රජ ප්‍රමුඛ කොට ඇති ඇත්හු සුවාසූදහසක් වූහ.

මහණ මුදුන්හි අභිෂේක කළ කැත්රජකු වූ ඒ මට රන් අබරණ ඇති රන්දද ඇති රන් දැලින් වැසුණු වලාහක අස්රජ ප්‍රමුඛ කොට ඇති අස්හු සුවාසූදහසක් වූහ.

මහණ, මුදුනෙහි අභිෂේක කරන ලද කැත්රජකු වූ ඒ මට රන් අබරණ ඇති රන්දද ඇති රන්දැලින් වැසුණ විජයොත් රිය ප්‍රමුඛ කොට ඇති රියහු සුවාසූදහසක් වූහ.

මහණ, මුදුන්හි අභිෂේක කළ කැත්රජකු වූ ඒ මට මිණිරුවන් ප්‍රමුඛ කොට ඇති මාණික්‍යයෝ සුවාසූදහසක් වූහ.

මහණ, මුදුන්හි අභිෂේක කළ කැත්රජකු වූ ඒ මට සුභද්‍රා දේවිය ප්‍රමුඛ කොට ඇති ස්ත්‍රීහු සුවාසුදහසක් වූහ.

මහණ, මුදුන්හි අභිෂික්ත කැත්රජකු වූ ඒ මට අනුගත පරිණායක රත්නය ප්‍රමුඛ කොට ඇති කැත්රජහු සුවාසූදහයක් වූහ.

තස්ස මය්හං භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිධෙනුසහස්සානි අහෙසුං දුකූලසන්දනානි[2] කංසූපධාරණානි.

තස්ස මය්හං භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිවත්ථකොටිසහස්සානි අහෙසුං: ඛොමසුඛුමානි කොසෙය්‍යසුඛුමානි කම්බලසුඛුමානි කප්පාසිකසුඛුමානි.

තස්ස මය්හං භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිථාලිපාකසහස්සානි අහෙසුං සායං පාතං භත්තාභිහාරො අභිහරිත්ථ.

තෙසං ඛො පන භික්ඛු, චතුරාසීතියා නගරසහස්සානං එකඤ්ඤෙව තං නගරං හොති යමහං තෙන සමයෙන අජ්ඣාවසාමි කුසාවතී රාජධානි.

තෙසං ඛො පන භික්ඛු; චතුරාසීතියා පාසාදසහස්සානං එකොයෙව පාසාදො හොති යමහං තෙන සමයෙන අජ්ඣාවසාමි ධම්මපාසාදො.

තෙසං ඛො පන භික්ඛු, චතුරාසීතියා කූටාගාරසහස්සානං එකඤ්ඤෙව තං කූටාගාරං හොති යමහං තෙන සමයෙන අජ්ඣාවසාමි මහාබ්‍යූහං කූටාගාරං.

තෙසං ඛො පන භික්ඛු, චතුරාසීතියා පල්ලඞ්කසහස්සානං එකොයෙව සො පල්ලඞ්කො හොති යමහං තෙන සමයෙන පරිභුඤ්ජාමි දන්තමයො වා සාරමයො වා සොවණ්ණමයො වා රූපියමයො වා.

තෙසං ඛො පන භික්ඛු, චතුරාසීතියා නාගසහස්සානං එකොයෙව සො නාගො හොති යමහං තෙන සමයෙන අභිරූහාමි උපොසථො නාගරාජා.

තෙසං ඛො පන භික්ඛු, චතුරාසීතියා අස්සසහස්සානං එකොයෙව සො අස්සො හොති යමහං තෙන සමයෙන අභිරූහාමි වලාහකො අස්සරාජා.

තෙසං ඛො පන භික්ඛු, චතුරාසීතියා රථසහස්සානං එකොයෙව සො රථො හොති යමහං තෙන සමයෙන අභිරූහාමි වෙජයන්තො රථො.

තෙසං ඛො පන භික්ඛු, චතුරාසීතියා ඉත්ථිසහස්සානං එකායෙව සා ඉත්ථී හොති යා මං තෙන සමයෙන පච්චුපට්ඨාති ඛත්තියා වා වෙලාමිකා වා.

තෙසං ඛො පන භික්ඛු, චතුරාසීතියා වත්ථකොටිසහස්සානං එකඤ්ඤෙව තං වත්ථයුගං හොති යමහං තෙන සමයෙන පරිදහාමි ඛොමසුඛුමං වා කොසෙය්‍යසුඛුමං වා කම්බලසුඛුමං වා කප්පාසිකසුඛුමං වා.

---

2. දුකූලසන්නතානි - මජසං, සී 2.

මහණෙ මුදුන්හි අභිෂේක කළ කැත්රජකු වූ ඒ මට දුහුල් අතුරුණු ඇති රිදීමුවා දෝනා බඳුන් ඇති සුවාසූදහසක් දෙන්හු වූහ.

මහණ, මුදුන්හි බිසෙස් කළ කැත්රජකු වූ ඒ මට සියුම් කොමු පිළි යැ, සියුම් කසීසළු යැ, සියුම් කම්බිලි යැ, සියුම් කපුපිළිය යි වස්ත්‍රයුගළ සුවාසූ දහසක් විය.

මහණ, මස්තකාභිෂික්ත ක්ෂත්‍රියරාජන් වූ ඒ මට උදය සවස එළැවියයුතු බත එළැවනු ලැබී ද (එබඳු) සුවාසූදහසක් බත් බඳුන් වියැ.

මහණ, එ සමයෙහි මම් යම් නගරයෙකැ වෙසෙම් ද, ඒ සුවාසූදහසක් නගර අතුරින් ඒ එක ම නගරය කුසාවතී රාජධානිය වෙයි.

මහණ, එ සමයෙහි මම් යම් පහයෙකැ වෙසෙම් ද, ඒ සුවාසූදහසක් පහය අතුරෙන් ඒ එකම පහය ධර්මප්‍රාසාදය වෙයි.

මහණ එ සමයෙහි මම් යම් කුටාගාරයෙකැ වෙසෙම් ද ඒ සුවාසූදහසක් කූටාගාර අතුරින් ඒ එකම කූටාගාරය මහාව්‍යුහ කූටාගාරය වෙයි.

මහණ, එ සමයෙහි මම් යම් පර්‍ය්‍යඞ්කයක් පරිභෝග කෙරෙම් ද, සුවාසූදහසක් පර්යඞ්ක අතුරින් ඒ එකම පර්යඞ්කය දළමුවා හෝ හරමුවා හෝ රන්මුවා හෝ රිදීමුවා හෝ වෙයි.

මහණ, එසමයෙහි මම් යම් ඇතකු නැඟෙම් ද, ඒ සුවාසූදහසක් ඇතුන් අතුරින් එක ම ඇතා උපොසථ කුලයෙහි වූ ඇත් රජ යි.

මහණ, එසමයෙහි මම් යම් අසකු නැගෙම් ද, ඒ සුවාසූදහසක් අසුන් අතුරින් ඒ එක ම අස්රජ වලාහක අශ්වරාජ යි.

මහණ, එසමයෙහි මම් යම් රියක නැගෙම් ද, ඒ සුවාසූදහසක් රිය අතුරින් ඒ එක ම රිය වෛජයන්ත රථය වෙයි.

මහණ, එසමයෙහි යම් ස්ත්‍රියක් මා උවටැන් කෙරේ ද, ඒ සුවාසූදහසක් ස්ත්‍රීන් අතුරින් ඒ එක ම ස්ත්‍රිය ක්ෂත්‍රිය හෝ වෙලාමික (ක්ෂත්‍රියකුට දව බැමිණියකගේ හෝ බමුණකුට දව ක්ෂත්‍රියාවකගේ හෝ කුසින් උපන් ස්ත්‍රිය) හෝ වෙයි.

මහණ, එ සමයෙහි මම් වස්ත්‍ර යුගළයක් හදිම ද, ඒ සුවාසූ දහසක් වස්ත්‍ර යුගළ අතුරින් ඒ එක ම වත්යුවළ සියුම් කොමුපිළි හෝ සියුම් කසීසළු හෝ සියුම් කම්බිලි හෝ සියුම් කපුපිළි හෝ වෙයි.

තෙසං ඛො පන භික්ඛු, චතුරාසීතියා ථාලිපාකසහස්සානං එකොයෙව සො ථාලිපාකො හොති යතො නාලිකොදනපරමං භුඤ්ජාමි තදුපියඤ්ච සූපෙය්‍යං.

ඉති ඛො භික්ඛු, සබ්බෙ තෙ සඞ්ඛාරා අතීතා නිරුද්ධා, විපරිණතා. එවං අනිච්චා ඛො භික්ඛු, සඞ්ඛාරා, එවං අද්ධුවා ඛො භික්ඛු සඞ්ඛාරා, එවං අනස්සාසිකා ඛො භික්ඛු සඞ්ඛාරා, යාවඤ්චිදං භික්ඛු, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං අලං විරජ්ජිතුං අලං විමුච්චිතුන්ති.

## 1. 2. 5. 5.

## නඛසිඛොපම සුත්තං

97. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු, භගවන්තං එතදවොච:

"අත්ථි නු ඛො භන්තෙ, කිඤ්චි රූපං යං රූපං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සති? අත්ථි නු ඛො භන්තෙ, කාචි වෙදනා -පෙ- කාචි සඤ්ඤා -පෙ- අත්ථි නු ඛො භන්තෙ, කෙචි සඞ්ඛාරා -පෙ- අත්ථි නු ඛො භන්තෙ, කිඤ්චි විඤ්ඤාණං යං විඤ්ඤාණං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සතීති?

නත්ථි ඛො භික්ඛු, කිඤ්චි රූපං යං රූපං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සති. නත්ථි ඛො භික්ඛු, කාචි වෙදනා -පෙ- නත්ථි ඛො භික්ඛු, කාචි සඤ්ඤා -පෙ- නත්ථි ඛො භික්ඛු කෙචි සඞ්ඛාරා -පෙ- නත්ථි ඛො භික්ඛු කිඤ්චි විඤ්ඤාණං යං විඤ්ඤාණං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සතීති.

අථ ඛො භගවා පරිත්තං නඛසිඛායං පංසුං ආරොපෙත්වා තං භික්ඛුං එතදවොච: "එත්තකම්පි ඛො භික්ඛු, රූපං නත්ථි නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සති. එත්තකම්පි චෙ භික්ඛු, රූපං අභවිස්ස නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං, නයිදං බ්‍රහ්මචරියවාසො පඤ්ඤායෙථ සම්මා දුක්ඛක්ඛයාය. යස්මා ච ඛො භික්ඛු එත්තකම්පි රූපං නත්ථි නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං තස්මා බ්‍රහ්මචරියවාසො පඤ්ඤායති සම්මා දුක්ඛක්ඛයාය, එත්තිකාපි[1] ඛො භික්ඛු, වෙදනා නත්ථි නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තථෙව ඨස්සති, එත්තිකාපි චෙ භික්ඛු, වෙදනා අභවිස්ස නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා, නයිදං බ්‍රහ්මචරියවාසො පඤ්ඤායෙථ සම්මා දුක්ඛක්ඛයාය. යස්මා ච ඛො භික්ඛු, එත්තිකාපි වෙදනා නත්ථි නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා තස්මා බ්‍රහ්මචරියවාසො පඤ්ඤායති සම්මා දුක්ඛක්ඛයාය. එත්තිකාපි ඛො භික්ඛු සඤ්ඤා නත්ථි -පෙ- එත්තකා පි ඛො භික්ඛු, සඞ්ඛාරා නත්ථි නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තථෙව ඨස්සන්ති, එත්තකාපි භික්ඛු, සඞ්ඛාරා අභවිස්සංසු නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා නයිදං බ්‍රහ්මචරියවාසො පඤ්ඤායෙථ සම්මා දුක්ඛක්ඛයාය. යස්මා ච

1. එත්තකාපි භික්ඛු - ස්‍යා.

මහණ, ඒ සමයෙහි යම් සැළියෙකින් ගෙන ඕදන හා එයට අනුරූප වූ සූප ද වළඳම් ද, ඒ සුවාසූදහසක් අහර බඳුන් අතුරින් ඒ එකම අහර බඳුන වෙයි.

මහණ, මෙසේ වනාහි ඒ සියලු සංස්කාරයෝ ඉක්මැ ගියහ, නිරුද්ධයහ, පරිණාමයට (වෙනස් බවට) ගියහ. මහණ, සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ. මහණ, සංස්කාරයෝ මෙසේ අධ්‍රැවයහ. (ස්ථිර ව නො පවත්නාහ), මහණ, සංස්කාරයෝ මෙසේ අස්වැසිලි රහිතයහ. මහණ, සියලු සංස්කාරයන්හි කලකිරෙන්නට සුදුසු යැ, නො ඇලෙන්නට සුදුසු යැ, මිදෙන්නට සුදුසු යි.

## 1. 2. 5. 5.

## නඛසිඛොපම සූත්‍රය

97. සැවැත්නුවර :

එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය :

වහන්ස, යම් රූපයෙක් නිත්‍ය ද ධ්‍රැව ද ශාශ්වත ද නොවෙනස් වන ස්වභාව ඇත්තේ ද ශාශ්වතවස්තූන් හා සම ව එසේ ම සිටුනේ ද එබඳු කිසි රූපයෙක් ඇද්ද ? වහන්ස, ... කිසි වේදනාවක් ඇද්ද ? වහන්ස ... කිසි සංඥාවක් ඇද්ද ? වහන්ස ... කිසි සංස්කාර කෙනෙක් ඇද්ද ? වහන්ස, යම් විඥානයෙක් නිත්‍ය ද ධ්‍රැව ද ශාශ්වත ද නොවෙනස් වන ස්වභාව ඇත්තේ ද ශාශ්වත වස්තූන් හා සම ව එසේ ම සිටුනේ ද එබඳු කිසි විඥානයෙක් ඇද්ද''යි.

මහණ, යම් රූපයෙක් නිත්‍ය ද, ධ්‍රැව ද, ශාශ්වත ද, නොවෙනස් වන ස්වභාව ඇත්තේ ද, ශාශ්වතවස්තූන් හා සම ව එසේ ම සිටුනේ ද එබඳු කිසි රූපයෙක් නැත් ම යැ, මහණ,... කිසි වේදනාවක් නැත් ම යැ, මහණ, ... කිසි සංඥාවක් නැත් ම යැ, මහණ, ... කිසි සංස්කාර කෙනෙක් නැත් ම යැ, මහණ, යම් විඥානයෙක් නිත්‍ය ද, ධ්‍රැව ද, ශාශ්වත ද, නොවෙනස් වන ස්වභාව ඇත් ද ශාශ්වතවස්තූන් හා සම ව එසේ ම සිටුනේ නම් එ බඳු කිසි විඥානයෙක් නැත් මැ යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පස් බිඳක් නියසිළෙහි තබා ඒ මහණහට තෙල වදළ සේක : මහණ, නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ පෙරළෙන සැහැවි ඇති ශාශ්වතවස්තූන් හා සම ව එසේ ම සිටුනා මෙ පමණ වූ ද රූපයෙක් නැත. මහණ නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නොපෙරළෙන සැහැවි ඇති මෙ පමණ වූ ද රූපයෙක් ඉදින් වී නම් මොනොවට දුක් ගෙවීම පිණිස මේ බඹසරවිසුම නො පැනෙන්නේ යැ. මහණ යම් හෙයෙකින් නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නොපෙරළෙන සැහැවි ඇති මෙ පමණ වූ ද රූපයෙක් නැද්ද, එ හෙයින් මැනවින් දුක් ගෙවීම පිණිස බඹසරවිසුම පැනේ. මහණ, නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නොවෙනස් වන ස්වභාව ඇති ශාශ්වතවස්තූන් හා සම ව එසේ ම සිටුනා මෙ පමණ වූ ද වේදනාවක් නැත. මහණ, ඉදින් නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නොවෙනස් වන ස්වභාව ඇති මෙපමණ වූ ද වේදනාවක් වී නම් මොනොවට දුක් ගෙවීම පිණිස මේ බඹසරවිසුම නො පැනෙන්නේ ය. මහණ, යම් හෙයෙකින් නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නොවෙනස් වන ස්වභාව ඇති මෙ පමණ වූ ද වේදනාවක් නැද්ද, එ හෙයින් මොනොවට දුක් ගෙවීම පිණිස බඹසර විසුම පැනෙයි. මහණ, මෙ පමණ වූ ද සංඥාවක් නැත. ... මහණ, නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නොවෙනස් වන ස්වභාව ඇති ශාශ්වත වස්තූන් හා සම ව එසේ ම සිටුනා මෙපමණ වූ ද සංස්කාරකෙනෙක් නැත. මහණ, නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නො වෙනස් වන ස්වභාව ඇති මෙපමණ වූ ද සංස්කාර කෙනෙක් ඉදින් වූහු නම් මොනොවට දුක් ගෙවීම පිණිස මේ බඹසර විසුම නො පැනෙන්නේ යැ. මහණ, යම් හෙයෙකින් නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ

ඛො භික්ඛු එත්තකාපි සඞ්ඛාරා නත්ථි නිච්චා ධුවා සස්සතා අවිපරිණාම ධම්මා, තස්මා බ්‍රහ්මචරියවාසො පඤ්ඤායති සම්මා දුක්ඛක්ඛයාය. එත්තකම්පි ඛො භික්ඛු විඤ්ඤාණං නත්ථි නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සති. එත්තකම්පි චෙ භික්ඛු, විඤ්ඤාණං අභවිස්ස නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං, නයිදං බ්‍රහ්මචරියවාසො පඤ්ඤායෙථ සම්මා දුක්ඛක්ඛයාය. යස්මා ච ඛො භික්ඛු, එත්තකම්පි විඤ්ඤාණං නත්ථි නිච්චං ධුවං සස්සතං අවිපරිණාම ධම්මං තස්මා බ්‍රහ්මචරියවාසො පඤ්ඤායති සම්මා දුක්ඛක්ඛයාය.

තං කිං මඤ්ඤසි භික්ඛු, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

තස්මාතිහ භික්ඛු -පෙ- එවං පස්සං භික්ඛු, සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 2. 5. 6.

## සුද්ධික සුත්තං

98. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

අත්ථි නු ඛො භන්තෙ, කිඤ්චි රූපං යං රූපං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සති? අත්ථි නු ඛො භන්තෙ, කාචි වෙදනා -පෙ- අත්ථි නු ඛො භන්තෙ, කාචි සඤ්ඤා -පෙ- අත්ථි නු ඛො භන්තෙ, කෙචි සඞ්ඛාරා -පෙ- අත්ථි නු ඛො භන්තෙ, කිඤ්චි විඤ්ඤාණං යං විඤ්ඤාණං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සතීති.

නත්ථි ඛො භික්ඛු, කිඤ්චි රූපං යං රූපං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සති.

නත්ථි ඛො භික්ඛු, කාචි වෙදනා -පෙ- කාචි සඤ්ඤා -පෙ- කෙචි සඞ්ඛාරා -පෙ- නත්ථි ඛො භික්ඛු, කිඤ්චි විඤ්ඤාණං යං විඤ්ඤාණං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සතීති.

නොවෙනස් වන ස්වභාව ඇති මෙපමණ වූ ද සංස්කාර කෙනෙක් නැත්තාහු ද එ හෙයින් මොනොවට දුක් ගෙවීම පිණිස බඹසර විසුම පැනෙයි. මහණ, නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නොවෙනස් වන ස්වභාව ඇති ශාශ්වත වස්තූන් හා සම ව එසේ ම සිටුනා මෙපෙමණ වූ ද විඥනයෙක් නැත. මහණ, නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නොවෙනස් වන ස්වභාව ඇති මෙපමණ වූ ද විඥනයෙක් ඉදින් වී නම් මොනොවට දුක් ගෙවීම පිණිස මේ බඹසර විසුම නො පැනෙන්නේ යැ. මහණ, යම් හෙයකින් නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නොවෙනස් වන ස්වභාව ඇති මෙ පමණ වූ ද විඥනයෙක් නැද්ද. එ හෙයින් මැනවින් දුක් ගෙවීම පිණිස බඹසර විසුම පැනේ.

මහණ, ඒ කිමැ යි හඟිහි ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? යි

වහන්ස, අනිත්‍ය ය.

වේදනාව ... සංඥව ... සංස්කාර ... විඥනය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? යි

වහන්ස, අනිත්‍ය ය.

මහණ, එ හෙයින් මෙහි ලා ... මහණ, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක ... මේ බැවි පිණිස අනෙකක් නැතැ'යි දැනගනී යි.

## 1. 2. 5. 6.

## සුද්ධික සූත්‍රය

98. සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ ය :

වහන්ස, යම් රූපයෙක් නිත්‍ය නම් ධ්‍රැව නම් ශාශ්වත නම් නොවෙනස් වන ස්වභාව ඇත්තේ නම් ශාශ්වත වස්තූන් හා සම ව එසේ ම සිටුනේ නම් එ බඳු කිසි රූපයෙක් ඇද්ද ? වහන්ස, ... කිසි වේදනාවක් ඇද්ද ? වහන්ස, ... කිසි සංඥවක් ඇද්ද ? වහන්ස, . . . කිසි සංස්කාර කෙනෙක් ඇත්තාහු ද ? වහන්ස, යම් විඥනයෙක් නිත්‍ය නම් ධ්‍රැව නම් ශාශ්වත නම් නොවෙනස් වන ස්වභාව ඇත් නම් ශාශ්වත වස්තූන් හා සම ව එසේ ම සිටුනේ නම් එ බඳු කිසි විඥනයෙක් ඇද්ද ? ''යි.

මහණ, යම් රූපයෙක් නිත්‍ය නම ධ්‍රැව නම් ශාශ්වත නම් නොවෙනස් වන ස්වභාව ඇත්තේ නම් ශාශ්වත වස්තූන් හා සම ව එසේ ම සිටුනේ නම් එ බඳු කිසි රූපයෙක් නැත් ම යැ.

මහණ, ... කිසි වේදනාවක් නැත් ම ය. කිසි සංඥවක් ... කිසි සංස්කාර කෙනෙක් ... මහණ, යම් විඥනයෙක් නිත්‍ය නම් ධ්‍රැව නම් ශාශ්වත නම් නොවෙනස් වන ස්වභාව ඇත් නම් ශාශ්වත වස්තූන් හා සම ව එසේ ම සිටුනේ නම එ බඳු කිසි විඥනයෙක් නැත් මැ යි.

## 1. 2. 5. 7.

### ගද්දුලබද්ධ සුත්තං

**99. සාවත්ථියං:**

අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො. පුබ්බාකොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං.

හොති ඛො සො[1] භික්ඛවෙ, සමයො යං මහාසමුද්දො උස්සුස්සති විසුස්සති න භවති, න ත්වෙවාහං භික්ඛවෙ, අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං දුක්ඛස්ස අන්තකිරියං වදාමි.

හොති ඛො සො භික්ඛවෙ, සමයො යං සිනෙරුපබ්බතරාජා උඩ්ඩය්හති[2] විනස්සති න භවති. න ත්වෙවාහං භික්ඛවෙ, අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං දුක්ඛස්ස අන්තකිරියං වදාමි.

හොති ඛො සො භික්ඛවෙ, සමයො යං මහාපඨවී උඩ්ඩය්හති විනස්සති න භවති න ත්වෙවාහං භික්ඛවෙ, අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං දුක්ඛස්ස අන්තකිරියං වදාමි.

සෙය්‍යථාපි භික්ඛවෙ සා ගද්දුලබද්ධො දළ්හෙ ඛීලෙ වා ථම්භෙ වා උපනිබද්ධො, තමෙව ඛීලං වා ථම්භං වා අනුපරිධාවති, අනුපරිවත්තති. එවමෙව ඛො භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, රූපං අත්තතො සමනුපස්සති. රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං.

වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අත්තතො සමනුපස්සති. විඤ්ඤාණවන්තං වා අත්තානං අත්තනි වා විඤ්ඤාණං විඤ්ඤාණස්මිං වා අත්තානං. සො රූපඤ්ඤෙව අනුපරිධාවති අනුපරිවත්තති. වෙදනඤ්ඤෙව අනුපරිධාවති අනුපරිවත්තති, සඤ්ඤඤ්ඤෙව අනුපරිධාවති අනුපරිවත්තති, සඞ්ඛාරෙයෙව අනුපරිධාවති අනුපරිවත්තති. විඤ්ඤාණඤ්ඤෙව අනුපරිධාවති අනුපරිවත්තති.

සො රූපං අනුපරිධාවං අනුපරිවත්තං වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අනුපරිධාවං අනුපරිවත්තං න පරිමුච්චති රූපම්හා න පරිමුච්චති වෙදනාය න පරිමුච්චති සඤ්ඤාය න පරිමුච්චති සඞ්ඛාරෙහි න පරිමුච්චති විඤ්ඤාණම්හා න පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි.

---

1. හොති සො - මජ්සං, ස්‍යා.
2. ඩය්හති - මජ්සං, ස්‍යා, PTS.

Free Distribution www.aathaapi.org

## 1. 2. 5. 7.

## ගද්දුලබද්ධ සූත්‍රය

**99. සැවැත්නුවර :**

මහණෙනි, මෙ සසර අනවරාග්‍ර යැ. අවිද්‍යාව නිවරණ කොට ඇති තෘෂ්ණාව සංයෝජන කොට ඇති භවයෙන් භවයට සංධාවන කරන ච්‍යුති ප්‍රතිසන්ධි වියින් සැරිසරන සත්ත්වයන්ගේ මුල් කෙළෙවර නො පෙනේ.

මහණෙනි, යම් කලෙක මේ මහමුහුද සිඳේ ද, වියළේ ද, නො වේ ද, එ බඳු කලෙක් වේ ම යැ. මහණෙනි, අවිද්‍යාව නිවරණ කොට ඇති තෘෂ්ණාව සංයෝජන කොට ඇති සංධාවන සංසරණ කරන සත්ත්වයන්ගේ දුක් කෙළවර කිරීමක් මම නො ම කියමි.

මහණෙනි, යම් කලෙක මේ සිනෙරු පර්වතරාජයා දැවේ ද, වැනසේ ද, නො වේ ද, එ බඳු කලෙක් වේ මැ යැ. මහණෙනි, අවිද්‍යාව නිවරණ කොට ඇති තෘෂ්ණාව සංයෝජන කොට ඇති දිවෙන සැරිසරන සත්ත්වයන්ගේ දුක කෙළවර කිරීමක් මම නො මැ කියමි.

මහණෙනි, යම් කලෙක මේ මහපොළොව දැවේ ද, වැනසේ ද, නො වේ ද, එ බඳු කලෙක් වේ ම යැ. මහණෙනි, අවිද්‍යාව නිවරණ කොට ඇති තෘෂ්ණාව සංයොජන කොට ඇති දිවෙන සැරිසරන සත්ත්වයන්ගේ දුක කෙළෙවර කිරීමක් මම නො මැ කියමි.

මහණෙනි, බලුදම්න් බැඳුණු ශුනකයෙක් දැඩි හුලෙක හෝ ටැඹෙක හෝ බඳනා ලද්දේ යම්සේ ඒ හුල මැ හෝ ටැඹ මැ හෝ වටාගෙන අනුව දිවේ ද, අනුව පෙරළේ ද, මහණෙනි, එසෙයින් මැ ආර්යයන් නොදක්නා ආර්ය ධර්මයෙහි අදක්ෂ ආර්යධර්මයෙහි නොහික්මුණු සත්පුරුෂයන් නො දක්නා සත්පුරුෂධර්මයෙහි අදක්ෂ සත්පුරුෂධර්මයෙහි නොහික්මුණු අශ්‍රැතවත් පෘථජ්ජන තෙමේ රූපය ආත්ම වශයෙන් හෝ ආත්මය රූපවත් කොට හෝ ආත්මයෙහි ලා රූපය හෝ රූපයෙහි ලා ආත්මය හෝ දකියි.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය ආත්මය වශයෙන් හෝ ආත්මය විඥනවත්ය යි හෝ ආත්මයෙහි විඥනය ඇතැ යි හෝ විඥනයෙහි ආත්මය ඇතැ යි හෝ දකියි. හේ රූපය මැ අනුව දිවෙයි, රූපය මැ අනුව පෙරළෙයි. වේදනාව ම අනුව දිවෙයි, වේදනාව ම අනුව පෙරළෙයි. සංඥව ම අනුව දිවෙයි, සංඥව මැ අනුව පෙරළෙයි, සංස්කාර මැ අනුව දිවෙයි, සංස්කාර මැ අනුව පෙරළෙයි. විඥනය මැ අනුව දිවෙයි විඥනය මැ අනුව පෙරළේ.

හේ රූපය අනුව දිවෙන්නේ අනුව පෙරළෙන්නේ වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය අනුව දිවෙන්නේ අනුව පෙරළෙන්නේ රූපයෙන් නො මිදෙයි, වේදනාවෙන් නො මිදෙයි, සංඥවෙන් නො මිදෙයි, සංස්කාරයන් ගෙන් නො මිදෙයි, විඥනයෙන් නො මිදෙයි. ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් පරිදේවයෙන් කායික දුකෙන් දෙම්නසින් දැඩි ආයාසයෙන් නො මිදෙයි. (පස්කඳ) දුකින් නො මිදේ යයි කියමි.

සුතවා ච ඛො භික්ඛවෙ, අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති න රූපවන්තං වා අත්තානං න අත්තනි වා රූපං න රූපස්මිං වා අත්තානං, න වෙදනං -පෙ- න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ -පෙ- න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති න විඤ්ඤාණවන්තං වා අත්තානං න අත්තනි වා විඤ්ඤාණං න විඤ්ඤාණස්මිං වා අත්තානං.

සො රූපං නානුපරිධාවති නානුපරිවත්තති. වෙදනං නානුපරිධාවති නානුපරිවත්තති සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ නානුපරිධාවති. නානුපරිවත්තති. විඤ්ඤාණං නානුපරිධාවති නානුපරිවත්තති.

සො රූපං අනනුපරිධාවං අනනුපරිවත්තං වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං අනනුපරිධාවං අනනුපරිවත්තං පරිමුච්චති රූපම්හා පරිමුච්චති වෙදනාය, පරිමුච්චති සඤ්ඤාය, පරිමුච්චති සඞ්ඛාරෙහි, පරිමුච්චති විඤ්ඤාණම්හා, පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි පරිමුච්චති දුක්ඛස්මාති වදාමීති.

## 1. 2. 5. 8.

## දුතිය ගද්දුලබද්ධ සුත්තං

**100. සාවත්ථියං:**

අනමතග්ගොයං භික්ඛවෙ, සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. සෙය්‍යථාපි භික්ඛවෙ, සා ගද්දුලබද්ධො දළ්හෙ ඛීලෙ වා ථම්භෙ වා උපනිබද්ධො සො ගච්ඡති චෙපි තමෙව ඛීලං වා ථම්භං වා උපගච්ඡති[1]. තිට්ඨති චෙපි තමෙව ඛීලං වා ථම්භං වා උපතිට්ඨති, නිසීදති චෙ'පි තමෙව ඛීලං වා ථම්භං වා උපනිසීදති, නිපජ්ජති. චෙපි තමෙව ඛීලං වා ථම්භං වා උපනිපජ්ජති.

"එවමෙව ඛො භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො රූපං "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සති වෙදනං "එතං මම -පෙ- සඤ්ඤං "එතං මම -පෙ- සඞ්ඛාරෙ "එතං මම -පෙ- විඤ්ඤාණං "එතං මම එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සති. සො ගච්ඡති චෙ'පි ඉමෙව පඤ්චුපාදානක්ඛන්ධෙ උපගච්ඡති. තිට්ඨති චෙ'පි ඉමෙව පඤ්චුපාදානක්ඛන්ධෙ උපතිට්ඨති, නිසීදති චෙපි ඉමෙව පඤ්චුපාදානක්ඛන්ධෙ උපනිසීදති. නිපජ්ජති චෙපි ඉමෙව පඤ්චුපාදානක්ඛන්ධෙ උපනිපජ්ජති.

---

1. උපනිගච්ඡති - සීමු, සී 2.

මහණෙනි, ආර්යයන් දක්නාසුලු ආර්යධර්මයෙහි දක්ෂ ආර්යධර්මයෙහි හික්මුණු සත්පුරුෂයන් දක්නා සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ සත්පුරුෂ ධර්මයෙහි හික්මුණු ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපය ආත්මය වශයෙන් නො දකියි, ආත්මය රූප ඇත්තෙකැ යි හෝ නො දකියි, ආත්මයෙහි රූපය ඇතැයි හෝ නො දකියි, රූපයෙහි ආත්මය ඇතැ යි හෝ නො දකියි. වේදනාව . . . නො දකියි, සංඥව . . . නො දකියි, සංස්කාර . . . නො දකියි, විඥනය ආත්මය වශයෙන් නො දකියි, ආත්මය විඥන ඇත්තෙකැ යි හෝ නො දකියි, ආත්මයෙහි විඥනය ඇතැ යි හෝ නො දකියි. විඥනයෙහි ආත්මය ඇතැ යි හෝ නො දකී.

හේ රූපය අනුව නො දිවෙයි, නො පෙරළෙයි. වේදනාව අනුව නො දිවෙයි, නො පෙරළෙයි. සංඥව . . . සංස්කාරයන් අනුව නො දිවෙයි. නො පෙරළෙයි. විඥනය අනුව නො දිවෙයි. නො පෙරළෙයි.

හේ රූපය අනුව නො දිවෙන්නේ නො පෙරළෙන්නේ වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය අනුව නො දිවෙන්නේ අනුව නො පෙරළෙන්නේ රූපයෙන් මිදෙයි, වේදනාවෙන් මිදෙයි, සංඥවෙන් මිදෙයි, සංස්කාරයන් ගෙන් මිදෙයි, විඥනයෙන් මිදෙයි, ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් පරිදේවයෙන් කායික දුකෙන් දෙම්නසින් දැඩි ආයාසයෙන් මිදෙයි. (පස්කඳ) දුකින් මිදේ යයි කියමි යි.

## 1. 2. 5. 8.
## දුතිය ගද්දුලබද්ධ සූත්‍රය

**100.** සැවැත්නුවර :

මහණෙනි, මෙ සසර අනවරාග්‍ර යැ. අවිද්‍යාව නීවරණ කොට ඇති තෘෂ්ණාව සංයෝජන කොට ඇති දිවෙන සැරිසරන සතුන්ගේ මුල් කෙළවර නො පැනෙයි. මහණෙනි, යම් සේ බලුදමින් බැඳුණු ශුනකයෙක් දැඩි හුලෙක හෝ ටැඹෙක හෝ බඳනා ලද්දේ ද, ඉදින් හේ යේ නම් ඒ හුල මැ හෝ ටැඹ මැ හෝ ළඟට යෙයි. ඉදින් සිටී නම් ඒ හුල මැ හෝ ටැඹ මැ හෝ ළඟ සිටියි. ඉදින් හිඳී නම් ඒ හුල මැ හෝ ටැඹ මැ හෝ ළඟ හිඳියි. ඉදින් ලගී නම් ඒ හුල මැ හෝ ටැඹ මැ හෝ ළඟ ලගියි.

මහණෙනි, එලෙසින් ම අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ රූපය ''තෙල මාගේ ය. තෙලෙ මම වෙමි. තෙල මාගේ ආත්ම ය යි දකී. වේදනාව තෙල මාගේ යැ . . . සංඥව තෙල මාගේ යැ . . . සංස්කාර තෙල මාගේ යැ . . . විඥනය තෙල මාගේ යැ. තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම යයි දකියි. හේ ඉදින් යේ නම් මේ පඤ්චෝපාදන ස්කන්ධ වෙත මැ යෙයි, ඉදින් සිටී නම් මේ පඤ්චෝපාදනස්කන්ධ වෙත මැ සිටියි, ඉදින් හිඳී නම් මේ පඤ්චෝපාදනස්කන්ධ වෙත ම ඉඳියි, ඉදින් හොවී නම් මේ පඤ්චෝපාදාන ස්කන්ධය වෙත මැ හොවී.

තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුනා අභික්ඛණං[1] සකං චිත්තං පච්චවෙක්ඛිතබ්බං දීඝරත්තමිදං චිත්තං සඞ්කිලිට්ඨං. රාගෙන දොසෙන මොහෙනාති. චිත්තසංකිලෙසා භික්ඛවෙ, සත්තා සංකිලිස්සන්ති. චිත්තවොදානා සත්තා විසුජ්ඣන්ති, දිට්ඨං වො භික්ඛවෙ, චරණං නාම චිත්තන්ති?

එවම්භන්තෙ,

තම්පි ඛො භික්ඛවෙ, චරණං[2] චිත්තං චිත්තෙනෙව චින්තිතං තෙන'පි ඛො භික්ඛවෙ, චරණෙන චිත්තෙන චිත්තඤ්ඤෙව චිත්තතරං. තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුනා අභික්ඛණං සකං චිත්තං පච්චවෙක්ඛිතබ්බං "දීඝරත්තමිදං චිත්තං සංකිලිට්ඨං රාගෙන දොසෙන මොහෙනා"ති. චිත්තසංකිලෙසා භික්ඛවෙ, සත්තා සංකිලිස්සන්ති. චිත්තවොදානා සත්තා විසුජ්ඣන්ති.

නාහං භික්ඛවෙ, අඤ්ඤං එකනිකායම්පි සමනුපස්සාමි, එවං චිත්තං යථයිදං භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා. තෙ'පි ඛො භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා චිත්තෙනෙව චින්තිතා,[3] තෙහි'පි ඛො භික්ඛවෙ, තිරච්ඡානගතෙහි පාණෙහි චිත්තඤ්ඤෙව චිත්තතරං. තස්මාතිහ භික්ඛවෙ, භික්ඛුනා අභික්ඛණං[4] සකං චිත්තං පච්චවෙක්ඛිතබ්බං "දීඝරත්තමිදං චිත්තං සංකිලිට්ඨං රාගෙන දොසෙන මොහෙනා"ති. චිත්තසංකිලෙසා භික්ඛවෙ, සත්තා සංකිලිස්සන්ති. චිත්තවොදානා සත්තා විසුජ්ඣන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ, රජකො වා චිත්තකාරකො වා සති රජනාය වා ලාඛාය වා හලිද්දියා වා නීලාය වා[5] මඤ්ජෙට්ඨාය වා සුපරිමට්ඨෙ[7] වා ඵලකෙ භිත්තියා වා දුස්සපට්ටෙ වා ඉත්ථිරූපං වා පුරිසරූපං වා අභිනිම්මිනෙය්‍ය සබ්බඞ්ගපච්චඞ්ගං. එවමෙව ඛො භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො රූපඤ්ඤෙව අභිනිබ්බත්තෙන්තො අභිනිබ්බත්තෙති. වෙදනඤ්ඤෙව - පෙ - සඤ්ඤඤ්ඤෙව - සඞ්ඛාරෙයෙව - විඤ්ඤාණඤ්ඤෙව අභිනිබ්බත්තෙන්තො අභිනිබ්බත්තෙති.

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

තස්මාතිහ භික්ඛවෙ එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

---

1. භික්ඛවෙ අභික්ඛණං - මජ්ඣං, සයා, සී 2.
2. චරණං නාම, මජ්ඣං, සයා PTS
3. චිත්තිතා - සී.2 PTS
4. භික්ඛවෙ අභික්ඛණං - මජ්ඣං, සයා.
5. පනීලියා වා - මජ්ඣං, සී2.
6. මඤ්ජිට්ඨාය - මජ්ඣං, මඤ්ජෙට්ඨියා - PTS
7. සුපරිමට්ඨෙ - මජ්ඣං, PTS

මහණෙනි, එ හෙයින් මහණහු විසින් ''මේ සිත දිගුකලක් මුළුල්ලෙහි රාගයෙන් ද්වේෂයෙන් මෝහයෙන් සකිලිටි ය''යි සිය සිත නිතර පසිවිකියයුතු යි. මහණෙනි, සිත සංකෙලෙස් වීමෙන් සත්ත්වයෝ කෙලෙසෙති. සිත පිරිසිදු වීමෙන් සත්ත්වයෝ පිරිසිදු වෙති. මහණෙනි, තොප විසින් චරණ නම් චිත්‍රය දක්නා ලද ද ?

වහන්ස, එසේ යැ.

මහණෙනි, ඒ චරණචිත්‍රය ද සිතින් ම විසිතුරු කරන ලද යැ, මහණෙනි, ඒ චරණ චිත්‍රයට ද වඩා සිත ම ඉතා විසිතුරු යි. මහණෙනි, එ හෙයින් මෙහි ලා මහණහු විසින් ''මේ සිත දිගුකලක් මුළුල්ලෙහි රාගයෙන් ද්වේෂයෙන් මෝහයෙන් සකිලිටි ය යි නිතොර සිය සිත පසිවිකියයුතු යැ. මහණෙනි, සිත සකිලිටි වීමෙන් සත්ත්වයෝ කෙලෙසෙති. සිත පිරිසිදු වීමෙන් සත්ත්වයෝ පිරිසිදු වෙත්.

මහණෙනි, මේ තිරිසන්ගත ප්‍රාණීහු යම් බඳු වෙත් ද මහණෙනි, එසේ විසිතුරු වූ අන් එක ද සමූහයක් මම නො දකිමි. මහණෙනි, ඒ තිරිසන් ගත ප්‍රාණීහු ද සිතින් ම විසිතුරු වූහ. මහණෙනි, ඒ තිරිසන්ගත ප්‍රාණීන්ට ද වඩා සිත ම ඉතා විසිතුරු යැ. මහණෙනි, එ හෙයින් මෙහි ලා මහණහු විසින් මේ සිත දිගුකලක් මුළුල්ලෙහි රාගයෙන් ද්වේෂයෙන් මෝහයෙන් සකිලිටි ය යි නිතොර සිය සිත පසිවිකියයුතු යැ. මහණෙනි, සිත කෙලෙසී මෙන් සත්ත්වයෝ කෙලෙසෙති. සිත පිරිසිදු වීමෙන් සත්ත්වයෝ පිරිසිදු වෙත්.

මහණෙනි, යම්සේ, රජකයෙක් වේවයි සිත්තරෙක් වේවයි, රඳන් හෝ ලතු හෝ රන්වන් පැහැය හෝ නිල්පැහැය හෝ මදට හෝ ඇති කල්හි මැනවින් මට වූ පුවරුවෙක හෝ බිතෙක හෝ රෙදිපිටෙක හෝ සියලු අඟපසඟ ඇති ඉතිරි රුවක් වේවයි පුරුෂ රුවක් වේවයි මවන්නේ ද ? මහණෙනි, එසෙයින් මැ අශ්‍රැතවත් පෘථග්ජන නිපදවන්නේ රූපය මැ නිපදවයි. වේදනාව මැ . . . සංඥව මැ . . . සංස්කාර මැ . . . නිපදවන්නේ විඥනය ම නිපදවයි.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ?යි.

වහන්ස, අනිත්‍ය ය . . .

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? යි.

වහන්ස, අනිත්‍ය ය. . .

මහණෙනි එ හෙයින් මෙහි ලා මෙසේ දක්නා . . . මේ බැව් පිණිස අන්කිසෙක් නැතැ යි දනගනී.

## 1. 2. 5. 9.

### වාසිජටොපම සුත්තං

**101. සාවත්ථියං :**

ජානතො'හං භික්ඛවෙ, පස්සතො ආසවානං ඛයං වදාමි. නො අජානතො නො අපස්සතො.

කිඤ්ච භික්ඛවෙ, ජානතො කිං පස්සතො ආසවානං ඛයො හොති :

ඉති රූපං ඉති රූපස්ස සමුදයො ඉති රූපස්ස අත්ථඞ්ගමො, ඉති වෙදනා -පෙ- ඉති සඤ්ඤා - ඉති සඞ්ඛාරා - ඉති විඤ්ඤාණං ඉති විඤ්ඤාණස්ස සමුදයො ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමොති. එවං ඛො භික්ඛවෙ, ජානතො එවං පස්සතො ආසවානං ඛයො හොති.

භාවනානුයොගමනනුයුත්තස්ස භික්ඛවෙ, භික්ඛුනො විහරතො කිඤ්චා'පි එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය : "අහො වත මෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චෙය්‍යා"ති, අථ ඛ්වස්ස නෙව අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති.

තං කිස්ස හෙතු,

කිස්ස අභාවිතත්තා ?

අභාවිතත්තා තිස්ස වචනීයං.

අභාවිතත්තා චතුන්නං සතිපට්ඨානානං, අභාවිතත්තා චතුන්නං සම්මප්පධානානං, අභාවිතත්තා චතුන්නං ඉද්ධිපාදානං, අභාවිතත්තා පඤ්චන්නං ඉන්ද්‍රියානං, අභාවිතත්තා පඤ්චන්නං බලානං, අභාවිතත්තා සත්තන්නං බොජ්ඣඞ්ගානං, අභාවිතත්තා අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස.

සෙය්‍යථාපි භික්ඛවෙ, කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා ද්වාදස වා තානස්සු කුක්කුටියා න සම්මා අධිසයිතානි න සම්මා පරිසෙදිතානි න සම්මා පරිභාවිතානි. කිඤ්චා'පි තස්සා කුක්කුටියා එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය : "අහො වත මෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජෙය්‍යු"න්ති. අථ ඛො අභබ්බා'ව තෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජිතුං.

තං කිස්ස හෙතු ?

තථා හි පන භික්ඛවෙ, කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා ද්වාදස වා තානි කුක්කුටියා න සම්මා අධිසයිතානි න සම්මා පරිසෙදිතානි න සම්මා පරිභාවිතානි.

එවමෙව ඛො භික්ඛවෙ, භාවනානුයොගමනනුයුත්තස්ස භික්ඛුනො විහරතො කිඤ්චාපි එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය : "අහො වත මෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චෙය්‍යා"ති. අථ ඛ්වස්ස නෙව අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති.

## 1. 2. 5. 9.

## වාසිජටෝපම සූත්‍රය

**101.** සැවැත්නුවර :

මහණෙනි, මම දන්නා දක්නා පුහුල්හට ආස්‍රවක්ෂය කියමි. නො දන්නාහට නො කියමි, නො දක්නාහට නො කියමි.

මහණෙනි, කුමක් දන්නා කුමක් දක්නා පුහුල්හට ආස්‍රවක්ෂය වේ යැ යත් :

රූපය මෙසේ යැ, රූපසමුදය (-හට ගැනීම) මෙසේ යැ, රූප අස්තංගමය (-අභාවය) මෙසේ යැ. වෙදනාව මෙසේ යැ . . . සංඥාව මෙසේ යැ . . . සංස්කාර මෙසේ යැ . . . විඥානය මෙසේ යැ. විඥානයාගේ හටගැනීම මෙසේ යැ, විඥානයාගේ අස්තංගමය මෙසේ යි. මහණෙනි, මෙසේ දන්නා මෙසේ දක්නා පුහුල්හට ආස්‍රවක්ෂය වේ.

භාවනානුයෝගයෙහි යෙදී වාස කරන මහණහට ''මාගේ සිත උපාදාන විසින් ග්‍රහණය නො කොට ආස්‍රවයන්ගෙන් මිදෙන්නේ නම් මනා''යි ඉදින් මෙබඳු රිසියෙක් උපදනේ ද, එසේ නමුදු ඔහුගේ සිත උපාදාන විසින් ග්‍රහණය නො කොට ආස්‍රවයන් ගෙන් නො මිදෙයි.

ඒ කවර හෙයිනැ යත් :

නො වඩනා ලද හෙයිනැ යි කියයුතු යි.

කුමක් නො වඩනාලද හෙයිනැ යත් :

සතර සතිපට්ඨාන නො වඩනාලද හෙයිනැ, සතරසම්මප්පධාන නො වඩනා ලද හෙයිනැ, සතර ඉද්ධිපාද නො වඩනාලද හෙයිනැ, පඤ්චෙන්ද්‍රිය නො වඩනා ලද හෙයිනැ. පඤ්චබල නො වඩනාලද හෙයිනැ, සත්ත බොජ්ඣඞ්ග නො වඩනා ලද හෙයිනැ, ආය්‍ය්‍යීඅෂ්ටාඞ්ගික මාර්ගය නො වඩනා ලද හෙයිනි.

මහණෙනි, යම්සේ කිකිළියකගේ බිජුවටහු අටෙක් හෝ දශයෙක් හෝ දෙළොසෙක් හෝ වෙත් ද, කිකිළිය විසින් ඒ මතුයෙහි ලැගැ මොනොවට නො රක්නා ලද්දහු මොනොවට උණුසුම් නො ගන්වන ලද්දහු මොනොවට කුකුළුගඳ නො ගන්වන ලද්දහු වෙති. ඒ කිකිළියට ''මාගේ කුකුළු පැටවු පානියසිළින් හෝ මුවතුඩින් හෝ බිජුවට පළා ගෙන සුවසේ නික්මෙන්නාහු නම් මැනවැ''යි ඉදින් මෙ බඳු ආශාවක් උපදනේ ද ? එහෙත් ඒ කුකුළු පැටවු පානියසිළින් හෝ මුවතුඩින් හෝ බිජුවට පළා ගෙන සුවසේ නික්මෙන්නට අසමත්හු මැ යි.

ඒ කුම හෙයිනැ යත් :

මහණෙනි ඒ එසේ මැ යි. අටක් වූ හෝ දශයක් වූ හෝ දෙළසක් වූ හෝ කිකිළිය ගේ ඒ බිජුවටහු කිකිළිය විසින් මැනැවින් නොලගින ලද්දහු යැ, මැනැවින් උණුසුම් නොගන්වන ලද්දහු යැ, මැනැවින් නොවඩන ලද්දහු යි. (එහෙයිනි).

මහණෙනි, එසෙයින් ම භාවනානුයෝගී වැ වෙසෙන මහණහට ''මා සිත උපාදාන රහිත ව ආස්‍රවයන් කෙරෙන් මිදෙන්නේ නම් මැනවැ''යි කෙසේ හෝ මෙ බඳු ආශාවක් උපදනේ ද, එහෙත් ඔහුගේ සිත උපාදාන රහිත ව ආස්‍රවයන් කෙරෙන් නො මැ මිදෙයි.

තං කිස්ස හෙතු?

අභාවිතත්තා'තිස්ස වචනීයං.

කිස්ස අභාවිතත්තා:

අභාවිතත්තා චතුන්නං සතිපට්ඨානානං අභාවිතත්තා චතුන්නං සම්මප්පධානානං අභාවිතත්තා චතුන්නං ඉද්ධිපාදානං අභාවිතත්තා පඤ්චන්නං ඉන්ද්‍රියානං අභාවිතත්තා පඤ්චන්නං බලානං අභාවිතත්තා සත්තන්නං බොජ්ඣඞ්ගානං අභාවිතත්තා අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස.

භාවනානුයොගමනුයුත්තස්ස භික්ඛවෙ, භික්ඛුනො විහරතො කිඤ්චාපි න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය, 'අහො වත මෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චෙය්‍යා'ති, අථ ඛ්වස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති.

තං කිස්ස හෙතු?

භාවිතත්තා'තිස්ස වචනීයං.

කිස්ස භාවිතත්තා:

භාවිතත්තා චතුන්නං සතිපට්ඨානානං, භාවිතත්තා චතුන්නං සම්මප්පධානානං භාවිතත්තා චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවිතත්තා පඤ්චන්නං බලානං භාවිතත්තා සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවිතත්තා අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස.

සෙය්‍යථාපි භික්ඛවෙ, කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා ද්වාදස වා තානස්සු කුක්කුටියා සම්මා අභිසයිතානි, සම්මා පරිසෙදිතානි සම්මා පරිභාවිතානි. කිඤ්චාපි තස්සා කුක්කුටියා න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: "අහො වත මෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජෙය්‍යු"න්ති. අථ ඛො භබ්බාව තෙ කුක්කුටපොතකා පාදනඛසිඛාය වා මුඛතුණ්ඩකෙන වා අණ්ඩකොසං පදාලෙත්වා සොත්ථිනා අභිනිබ්භිජ්ජිතුං.

තං කිස්ස හෙතු?

තථා හි පන භික්ඛවෙ, කුක්කුටියා අණ්ඩානි අට්ඨ වා දස වා ද්වාදස වා තානස්සු කුක්කුටියා සම්මා අභිසයිතානි සම්මා පරිසෙදිතානි සම්මා පරිභාවිතානි.

එවමෙව ඛො භික්ඛවෙ, භාවනානුයොගමනුයුත්තස්ස භික්ඛුනො විහරතො කිඤ්චාපි න එවං ඉච්ඡා උප්පජ්ජෙය්‍ය: "අහො වත මෙ අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චෙය්‍යා"ති. අථ ඛ්වස්ස අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චති.

තං කිස්ස හෙතු?

භාවිතත්තා'තිස්ස වචනීයං.

ඒ කවර හෙයින යත් :

නොවඩන ලද බැවිනැ යි කියයුතු වෙයි.

කුමක් නොවඩනා ලද බැවිනැ යත් :

සතරසතිපට්ඨාන නොවඩන ලද බැවිනැ සතරසම්මප්පධාන නොඩවන ලද බැවිනැ. සතරඉද්ධිපාද නොවඩන ලද බැවිනැ. පඤ්චෙන්ද්‍රිය නොවඩන ලද බැවිනැ, පඤ්චබල නොවඩන ලද බැවිනැ, සත්තබොජ්ඣඞ්ග නොවඩන ලද බැවිනැ, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය නොවඩන ලද බැවිනි.

මහණෙනි, භාවනානුයොගී වැ වෙසෙන මහණහුට "මා සිත උපාදන රහිත වැ ආශ්‍රවයන් කෙරෙන් මිදෙන්නේ නම් මැනවැ"යි ඉදින් මෙ බඳු ආශාවක් නූපදනේ ද? එහෙත් ඔහුගේ සිත උපාදන රහිත වැ ආශ්‍රවයන් කෙරෙන් මිදෙයි.

ඒ කවර හෙයිනැ යත් :

වඩන ලද බැවිනැ යි කියයුතු වෙයි.

කුමක් වඩන ලද බැවිනැ යත් :

සතර සිව්වටන් වඩන ලද බැවිනැ, සතර සම්මප්පධාන වඩනා ලද බැවිනැ, සිවුඉද්පා වඩන ලද බැවිනැ, පසිඳුරන් වඩන ලද බැවිනැ. පස්බලන් වඩන ලද බැවිනැ. සත්තබොජ්ඣඞ්ග වඩන ලද බැවිනැ. අරිඅටඟිමඟ වඩන ලද බැවිනි.

මහණෙනි, යම්සේ කිකිළියකගේ බිජුවටහු අටෙක් හෝ දශයෙක් හෝ දෙළසෙක් හෝ වෙත් ද, ඒවා කිකිළිය විසින් මැනවින් ලගිනා ලද්දහු මැනවින් උණුසුම් ගන්වන ලද්දහු මැනවින් වඩන ලද්දහු වෙත් ද, ඒ කිකිළියට මාගේ කුකුළුපැටහු පානියසිළින් හෝ, මුවතුඩින් හෝ බිජුවට පළා ගෙන සුවසේ නික්මෙන්නාහු නම් මැනවැ"යි ඉදින් මෙ බඳු ආශාවක් නූපදනේ ද, එහෙත් ඒ කුකුළුපැටහු පානියසිළින් හෝ මුවතුඩින් හෝ බිජුවට පළාගෙන සුවසේ නික්මෙන්නට සමර්ථහු මැ යි.

එ කවර හෙයිනැ යත් :

මහණෙනි, ඒ එසේ මැ යි. අටක් වූ හෝ දශයක් වූ හෝ දෙළසක් වූ හෝ කිකිළියගේ ඒ බිජුවටහු කිකිළිය විසින් මැනවින් ලගින ලද්දෝ මැනවින් උණුසුම් ගන්වන ලද්දෝ මැනවින් වඩන ලද්දෝ වන්නාහු ය. (එහෙයිනි)

මහණෙනි, එසෙයින් මැ භාවනානුයෝගී වැ වෙසෙන මහණහට "මා සිත උපාදන රහිත ව ආශ්‍රවයන් ගෙන් මිදෙන්නේ නම් මැනවැ යි. ඉදින් මෙ බඳු ආශාවක් නූපදනේ ද, එහෙත් ඔහු සිත උපාදන රහිත ව ආශ්‍රවයන් කෙරෙන් මිදෙයි.

ඒ කුම් හෙයින යත් :

වඩන ලද බැවිනැ යි කියයුතු වෙයි.

කිස්ස භාවිතත්තා?

භාවිතත්තා චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා චතුන්නං සම්මප්පධානානං භාවිතත්තා චතුන්නං ඉද්ධිපාදානං භාවිතත්තා පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවිතත්තා පඤ්චන්නං බලානං භාවිතත්තා සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවිතත්තා අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස.

සෙය්‍යථාපි භික්ඛවෙ, පලගණ්ඩස්ස වා පලගණ්ඩන්තෙවාසිස්ස වා වාසිජටෙ දිස්සන්තෙව අඞ්ගුලිපදානි[1] දිස්සති අඞ්ගුට්ඨපදං[2], නො ච ඛ්වස්ස එවං ඤාණං හොති; "එත්තකං වත[3] මෙ අජ්ජ වාසිජටං ඛීණං එත්තකං හිය්‍යො, එත්තකං පරෙ"ති.* *අථ ඛ්වස්ස ඛීණෙ ඛීණංත්වෙව ඤාණං හොති.

එවමෙව ඛො භික්ඛවෙ, භාවනානුයොගමනුයුත්තස්ස භික්ඛුනො විහරතො කිඤ්චාපි න එවං ඤාණං හොති: "එත්තකං වත මෙ අජ්ජ ආසවානං ඛීණං, එත්තකං හිය්‍යො, එත්තකං පරෙ"ති. අථ ඛ්වස්ස ඛීණෙ ඛීණංත්වෙව ඤාණං හොති

සෙය්‍යථාපි භික්ඛවෙ, සාමුද්දිකාය නාවාය වෙත්තබන්ධනබද්ධාය ඡම්මාසානි[4] උදකෙ පරියාදාය[5] හෙමන්තිකෙන[6] ථලං උක්ඛිත්තාය වාතාතපපරෙතානි බන්ධනානි, තානි පාවුස්සකෙන මෙඝෙන අභිප්පවුට්ඨානි[7] අප්පකසිරෙන පටිප්පස්සම්භන්ති පූතිකානි භවන්ති.

එවමෙව ඛො භික්ඛවෙ, භාවනානුයොගමනුයුත්තස්ස භික්ඛුනො විහරතො අප්පකසිරෙනෙව සඤ්ඤොජනානි පටිප්පස්සම්භන්ති, පූතිකානි භවන්තීති.

## 1. 2. 5. 10.

### අනිච්චසඤ්ඤා සුත්තං

**102.** සාවත්ථියං:

අනිච්චසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති. සබ්බං රූපරාගං පරියාදියති. සබ්බං භවරාගං පරියාදියති. සබ්බං අවිජ්ජං පරියාදියති. සබ්බං අස්මිමානං පරියාදියති, සමූහනති[8].

---

1. අඞ්ගුට්ඨපාදානි - සීමු.
2. අඞ්ගුට්ඨපදං - මජ්ඣං,
3. එත්තකං වා - සීමු, ස්‍යා

* අයං පාඨො 'මජ්ඣං' පොත්ථකෙ න දිස්සතෙ

4. ඡස්සමාසානි - මජ්ඣං
5. පරියොදාතාය - සී 2
6. හෙමන්තිකෙ - මජ්ඣං
7. අභිප්පවට්ටා - සී 2
8. අස්මිමානං සමූහනති - මජ්ඣං.

කුමක් වඩන ලද බැවිනැ යත් :

සතර සිව්වටන් වඩන ලද බැවිනැ. සිවුසම්පධන් වඩන ලද බැවිනැ. සිවුඉද්ධපා වඩන ලද බැවිනැ. පසිඳුරන් වඩන ලද බැවිනැ. පස්බලන් වඩන ලද බැවිනැ. සත්බොජ්ඣ වඩන ලද බැවිනැ. අරිඅටඟිමඟ වඩන ලද බැවිනි.

මහණෙනි, යම්සේ වඩුවකුගේ හෝ වඩු අතවැස්සකුගේ හෝ වෑමිටෙහි ඇඟිලි සටහන් හෝ මහපටැඟිලි සටහන් හෝ දක්නා ලැබේ ද, ඔහුට : " මාගේ වෑමිට අද මෙ පමණ ගෙවිණැ. ඊයේ මෙ පමණ ගෙවිණැ, පෙර දවස මෙ පමණ ගෙවිණැ "යි මෙසේ දැනීම නො ද වෙයි. එතෙකුදු වුවත් ගෙවුණු කල්හි ගෙවුණේ ම යයි දැනුම ඔහුට වෙයි.

මහණෙනි, එසෙයින් ම භාවනානුයෝගී වැ වෙසෙන මහණහුට : "මාගේ ආස්‍රවයන් ගෙන් අද මෙ තෙක් ගෙවිණැ, ඊයේ මෙතෙක් ගෙවිණැ, පෙර දවස මෙතෙක් ගෙවිණැ"යි ඉදින් මෙ බඳු දැනීමෙක් නො වෙයි. එහෙත් ඔහුට ක්‍ෂය වූ කල්හි ක්‍ෂය වූයේ ම යයි දැනුම වෙයි.

මහණෙනි, වෙවැල්බැඳුමෙන් බඳනා ලද සමසක් දියෙහි රැඳුණු හිමන්කල ගොඩට නඟන ලද මුහුදෙහි වූ නැවක අවුසුළඟින් පහළ බැඳුම් වේ ද, ඒ බන්ධනයෝ වැසිකල මේඝයෙන් වෙසෙයින් තෙමුණාහු පහසුවෙන් දුබල වෙති. දිරායෙති.

මහණෙනි, එසෙයින් ම භාවනානුයෝගයෙහි යෙදී වෙසෙන මහණහුගේ සංයෝජනයෝ නිදුකින් ම සන්හිඳෙති. දිරායෙති යි. (නො පැනෙන බවට යෙති.)

## 1. 2. 5. 10.
## අනිච්චසඤ්ඤා සූත්‍රය

**102.** සැවැත්නුවර :

මහණෙනි, භාවිත වූ බහුලීකෘත වූ අනිච්චසඤ්ඤාව සියලු කාමරාගය ගෙවයි. සියලු රූපරාගය ගෙවයි. සියලු භවරාගය ගෙවයි. සියලු අවිද්‍යාව ගෙවයි. සියලු අස්මිමානය ගෙවයි, නසයි.

සෙය්‍යථාපි භික්ඛවෙ, සරදසමයෙ කස්සකො මහානඞ්ගලෙන කසන්තො සබ්බානි මූලසන්තානකානි සම්පදාලෙන්තො කසති. එවමෙව ඛො භික්ඛවෙ, අනිච්චසඤ්ඤා භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති. සබ්බං රූපරාගං පරියාදියති. සබ්බං භවරාගං පරියාදියති. සබ්බං අවිජ්ජං පරියාදියති. සබ්බං අස්මිමානං පරියාදියති, සමූහනති.

සෙය්‍යථාපි භික්ඛවෙ, බබ්බජලායකො බබ්බජං ලායිත්වා අග්ගෙ ගහෙත්වා ඔධුනාති නිද්ධුනාති නිප්ඵොටෙති, එවමෙව ඛො භික්ඛවෙ, අනිච්චසඤ්ඤා භාවිතා සබ්බං කාමරාගං -පෙ- සමූහනති.

සෙය්‍යථාපි භික්ඛවෙ, අම්බපිණ්ඩියා වණ්ටච්ඡින්නාය යානි තත්‍ර අම්බානි වණ්ටූපනිබන්ධානි[1] සබ්බානි තානි තදන්වයානි[2] භවන්ති. එවමෙව ඛො භික්ඛවෙ, අනිච්චසඤ්ඤා භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං -පෙ- සමූහනති.

සෙය්‍යථාපි භික්ඛවෙ, කූටාගාරස්ස යා කාචි ගොපානසියො සබ්බා තා කූටඞ්ගමා කූටනින්නා කූටසමොසරණා, කූටං තාසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, අනිච්චසඤ්ඤා භාවිතා -පෙ- සමූහනති.

සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි මූලගන්ධා කාලානුසාරි[3]. තෙසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ, අනිච්චසඤ්ඤා භාවිතා -පෙ- සමූහනති.

සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි සාරගන්ධා ලොහිතචන්දනං තෙසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ, අනිච්චසඤ්ඤා භාවිතා -පෙ- සමූහනති.

සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි පුප්ඵගන්ධා වස්සිකං තෙසං අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ අනිච්චසඤ්ඤා භාවිතා -පෙ- සමූහනති.

සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි කුඩ්ඩරාජානො[4] සබ්බෙ තෙ රඤ්ඤො චක්කවත්තිස්ස අනුයුත්තා භවන්ති. රාජා තෙසං චක්කවත්ති අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ, අනිච්චසඤ්ඤා භාවිතා -පෙ- සමූහනති.

සෙය්‍යථාපි භික්ඛවෙ, යා කාචි තාරකරූපානං පභා සබ්බා තා චන්දිමප්පභාය කලං නාග්ඝන්ති සොළසිං, චන්දප්පභා තාසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, අනිච්චසඤ්ඤා භාවිතා -පෙ- සමූහනති.

1. වණ්ටප්පටිබන්ධානි - සයා.
2. තන්වයානි - සයා.
3. කාලානුසාරි ගන්ධො - මජසං.
4. කුට්ඨරාජානො - සයා.

මහණෙනි, යම්සේ ගොවියෙක් සරත්කල මහනඟුලෙන් සාන්නේ පැතිර සිටි සියලු මුල් සිඳිමින් සා ද, මහණෙනි, එසෙයින් ම අනිච්චසඤ්ඤාව වඩනා ලද්දී බහුල කරන ලද්දී සියලු කාමරාගය ගෙවයි. සියලු රූපරාගය ගෙවයි. සියලු භවරාගය ගෙවයි. සියලු අවිද්‍යාව ගෙවයි. සියලු අස්මිමානය ගෙවයි, නසයි.

මහණෙනි, යම්සේ බබුස්තණ කපන්නෙක් බබුස්තණ කපා අගින් ගෙන යටට සලා ද, පොළා ද, පොළා පසෙක දමා ද, මහණෙනි, එසෙයින් ම භාවිත බහුලීකෘත අනිච්ච සංඥාව සියලු කාමරාගය . . . නසයි.

මහණෙනි, යම්සේ අඹකැනෙක තුවටු සිඳි කල්හි එහි යම් තුවටුයෙහි බැඳුණු අඹ වේ නම් ඒ සියල්ල එය අනුව පවත්නේ (පතනය) වේ ද මහණෙනි, එසෙයින් ම . . . නසයි. භාවිත බහුලීකෘත අනිත්‍යසංඥාව සියලු කාමරාගය . . . නසයි.

මහණෙනි, කුළුගෙයෙක යම්කිසි ගොනැස්හු වෙද්ද ඒ සියල්ලෝ කැණිමඩලට ගියාහු කැණිමඩලට නැමුණාහු කැණිමඩල අනුව පැතිර සිටියාහු වෙත් ද කැණිමඩල ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබෙයි. මහණෙනි. එසෙයින් ම භාවිත අනිච්චසඤ්ඤාව . . . නසයි.

මහණෙනි, යම්සේ යම් කිසි මුලගන්ධයෝ වෙද්ද ? කළුඅගිල්ගඳ ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබෙයි, මහණෙනි, එසෙයින් ම භාවිත අනිච්චසඤ්ඤාව . . . නසයි.

මහණෙනි, යම්සේ යම් කිසි හරගඳහු වෙද්ද ? රත්සඳුන් ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම භාවිත අනිච්චසඤ්ඤාව . . . නසයි.

මහණෙනි, යම්සේ යම් කිසි මල්ගඳහු වෙද්ද ? දෑසමන් ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබෙයි. මහණෙනි, එසෙයින් ම අනිච්චසඤ්ඤාව වඩන ලද්දී . . . නසයි.

මහණෙනි, යම්සේ යම් කිසි කුඩා රජහු වෙද්ද ? ඒ සියල්ලෝ සක්විති රජුට අනුකූල වූවාහු වෙත්, සක්විතිරජ ඔවුන්ට අග්‍ර ය යි කියනු ලැබෙ යි, මහණෙනි, එසෙයින් ම භාවිත අනිච්චසඤ්ඤාව . . . නසයි.

මහණෙනි, යම්සේ තාරක රූපයන්ගේ යම්කිසි කැලුම් වේ ද ඒ සියලු කැලුම් සඳ කැලුම්හි සොළොස් වන කලාවත් නො අගි ද, සඳ කැලුම් ඔවුනට අග්‍ර යයි කියනු ලැබෙයි. මහණෙනි, එසෙයින් ම භාවිත අනිච්චසඤ්ඤාව . . . නසයි.

සෙය්‍යථාපි භික්ඛවෙ, සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ආදිච්චො නභං අබ්භුස්සුක්කමානො[1] සබ්බං ආකාසගතං තමගතං අභිවිහච්ච භාසතෙ ච, තපතෙ ච, විරොචතෙ[2] ච. එවමෙව ඛො භික්ඛවෙ, අනිච්චසඤ්ඤා භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති, සබ්බං රූපරාගං පරියාදියති, සබ්බං භවරාගං පරියාදියති, සබ්බං අවිජ්ජං පරියාදියති, සබ්බං අස්මිමානං පරියාදියති, සමූහනති.

කථං භාවිතා ච භික්ඛවෙ, අනිච්චසඤ්ඤා කථං බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති -පෙ- සබ්බං අස්මිමානං පරියාදියති, සමූහනති.

ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථගමො. ඉති වෙදනා -පෙ- ඉති සඤ්ඤා -පෙ- ඉති සඞ්ඛාරා -පෙ- ඉති විඤ්ඤාණං ඉති විඤ්ඤාණස්ස සමුදයො ඉති විඤ්ඤාණස්ස අත්ථගමොති, එවං භාවිතා ඛො භික්ඛවෙ, අනිච්චසඤ්ඤා එවං බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති, සබ්බං රූපරාගං පරියාදියති, සබ්බං භවරාගං පරියාදියති, සබ්බං අවිජ්ජං පරියාදියති, සබ්බං අස්මිමානං පරියාදියති, සමූහනතීති.

පුප්ඵවග්ගො පඤ්චමො.

තස්සුද්දානං:

නදී පුප්ඵඤ්ච ඵෙණඤ්ච ගොමයඤ්ච නඛසිඛං
සුද්ධිකං ද්වෙ ච ගද්දුලා වාසිජටං අනිච්චතාති.

මජ්ඣිමපණ්ණාසකං සමත්තං

තස්ස මජ්ඣිමපණ්ණාසකස්ස වග්ගුද්දානං:

උපයො අරහන්තා ච ඛජ්ජනීයො ථෙරවහයො
පුප්ඵවග්ගෙන පණ්ණාසො දුතියො තෙන වුච්චති.

1. අබ්භුස්සක්කමානො - මජ්ඣං, ස්‍යා. අබ්භුස්සුක්කමානො - සීමු.
2. විරොචති - සීමු. සී 2

මහණෙනි, යම්සේ සරත්කල අහස පහන් වූ කල්හි පහ වූ වලාකුළු ඇති කල්හි හිර අහසට නැඟෙන්නේ අහසෙහි වූ සියලු අඳුර වෙසෙසින් නසා දිලියෙන්නේ වේ ද, බබළන්නේත් වේ ද, වෙසෙසින් බබළන්නේ වේ ද, මහණෙනි, එසෙයින් ම වඩනා ලද බහුල කරන ලද අනිත්‍ය සංඥව සියලු කාමරාගය ගෙවයි, සියලු රූපරාගය ගෙවයි, සියලු භවරාගය ගෙවයි, සියලු අවිද්‍යාව ගෙවයි, සියලු අස්මිමානය ගෙවයි, නසයි.

මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද අනිච්චසඤ්ඤාව සියලු කාමරාගය ගෙවා ද . . . සියලු අස්මිමානය ගෙවා ද, නසා ද යත් :

රූපය මෙසේ යැ, රූපයේ හටගැන්ම මෙසේ යැ, රූපයේ අස්තඞ්ගමය මෙසේ යැ, වේදනාව මෙසේ යැ . . . සංඥව මෙසේ යැ . . . සංස්කාර මෙසේ යැ . . . විඥනය මෙසේ යැ, විඥනයාගේ හටගැන්ම මෙසේ යැ, විඥනයේ අස්තඞ්ගමය මෙසේ යි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද අනිච්චසඤ්ඤාව සියලු කාමරාගය ගෙවයි, සියලු රූපරාගය ගෙවයි. සියලු භවරාගය ගෙවයි, සියලු අවිද්‍යාව ගෙවයි, සියලු අස්මිමානය ගෙවයි, නසා යි.

**පස්වැනි පුප්ඵ වර්ග යි**

එහි සූත්‍ර නාමාවලිය :

නදී, පුප්ඵ, ඵෙණපිණ්ඩොපම, ගොමයපිණ්ඩොපම, නඛසිඛොපම සුද්ධික සූත්‍ර ද ගද්දුලබද්ධ සූත්‍ර දෙක ද වාසිජට, අනිච්චසඤ්ඤ සූත්‍ර දෙක ද යි සූත්‍ර දශයෙකි.

**මජ්ඣිමපණ්ණාසක නිමි.**

ඒ මජ්ඣිමපණ්ණාසකයේ වර්ගනාමාවලිය :

උපය, අරහන්ත, ඛජ්ජනීය, ථෙර, පුප්ඵ යන වර්ගවලින් ද්‍විතීය පණ්ණාසක කියනු ලැබේ.

## 3. උපරිපණ්ණාසකං

### 1. අන්තවග්ගො

#### 1. 3. 1. 1.

#### අන්ත සුත්තං

**103. සාවත්ථියං :**

චත්තාරොමෙ භික්ඛවෙ, අන්තා. කතමෙ චත්තාරො :

සක්කායන්තො සක්කායසමුදයන්තො සක්කායනිරොධන්තො සක්කායනිරොධගාමිනිපටිපදන්තො.

කතමො ච භික්ඛවෙ, සක්කායන්තො :

පඤ්චුපාදානක්ඛන්ධාතිස්ස වචනීයං,

කතමෙ පඤ්ච,

සෙය්‍යථීදං : රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො. අයං වුච්චති භික්ඛවෙ, සක්කායන්තො.

කතමො ච භික්ඛවෙ, සක්කායසමුදයන්තො,

යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං : කාමතණ්හා භවතණ්හා විභවතණ්හා, අයං වුච්චති භික්ඛවෙ, සක්කායසමුදයන්තො.

කතමො ච භික්ඛවෙ, සක්කායනිරොධන්තො,

යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො. අයං වුච්චති භික්ඛවෙ, සක්කායනිරොධන්තො.

කතමො ච භික්ඛවෙ, සක්කායනිරොධගාමිනීපටිපදන්තො,

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං : සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, සක්කායනිරොධගාමිනීපටිපදන්තො. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො අන්තාති.



Free Distribution www.aathaapi.org

# 3. උපරිපණ්ණාසකය

## 1. අනත වර්ගය

### 1. 3. 1. 1.

### අන්ත සූත්‍රය

**103.** සැවැත්නුවර:

මහණෙනි, මේ අන්ත සතරෙකි. කවර සතරෙකැ යත්:

සක්කාය අන්ත යැ, සක්කායසමුදය අන්ත යැ, සක්කායනිරොධ අන්ත යැ, සක්කාය නිරොධගාමිනීපටිපද අන්ත යයි.

මහණෙනි, සක්කාය අන්තය කවර යත්:

පඤ්චොපාදනස්කන්ධ යයි කියැයුතු වෙයි.

කවර පසෙකැ යත්:

එනම්: රූපොපාදනස්කන්ධ යැ, වේදනොපාදනස්කන්ධ යැ, සංඥොපාදනස්කන්ධ යැ, සංස්කාරොපාදනස්කන්ධ යැ, විඥනොපාදනස්කන්ධ යි. මහණෙනි, මේ සක්කායඅන්ත යයි කියනු ලැබෙයි.

මහණෙනි, සක්කායසමුදය අන්තය කවර යත්:

පුනර්භවය ඇති කරන නන්දිරාගය සහගිය ඒ ඒ තන්හි ඇල්ම ඇති කරන යම් යම් තෘෂ්ණාවක් වේ ද, එනම්: කාමතෘෂ්ණාව ය, භවතෘෂ්ණාව ය, විභවතෘෂ්ණාව යි, මහණෙනි, මේ සක්කාසමුදය අන්ත යයි කියනු ලැබෙයි.

මහණෙනි, සක්කායනිරොධ අන්තය කවර යත්:

ඒ තෘෂ්ණාවෙ ම යම් නිරවශේෂවිරාගනිරොධයෙක් දුරලීමෙක් බැහැරලීමෙක් මිදීමෙක් නො ඇල්මෙක් වේ ද, මහණෙනි, මේ සක්කායනිරොධ අනත යයි කියනු ලැබෙයි.

මහණෙනි, සක්කායනිරොධගාමිනීපටිපද අන්තය කවර යත්:

මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය මැ යි. එ නම්: සම්මාදිට්ඨි යැ, සම්මාසංකප්ප යැ, සම්මාවාචා යැ, සම්මාකම්මන්ත යැ, සම්මාආජීව යැ, සම්මාවායාම යැ, සම්මාසති යැ, සම්මාසමාධි යි. මහණෙනි. මේ සක්කායනිරොධගාමිනීපටිපද අන්ත යයි කියනු ලැබෙ. මහණෙනි, මේ අන්ත සතර යි.



20—ඒ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

## 1. 3. 1. 2.

### දුක්ඛ සුත්තං

**104.** සාවත්ථියං :

දුක්ඛඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි දුක්ඛසමුදයඤ්ච දුක්ඛනිරොධඤ්ච දුක්ඛනිරොධගාමිනිඤ්ච පටිපදං තං සුණාථ.

කතමඤ්ච භික්ඛවෙ, දුක්ඛං :

පඤ්චුපාදානක්ඛන්ධාතිස්ස වචනීයං.

කතමෙ පඤ්ච,

සෙය්‍යථීදං : රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො, ඉදං වුච්චති භික්ඛවෙ, දුක්ඛං.

කතමො ච භික්ඛවෙ, දුක්ඛසමුදයො :

යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී සෙය්‍යථීදං : කාමතණ්හා භවතණ්හා විභවතණ්හා, අයං වුච්චති භික්ඛවෙ, දුක්ඛසමුදයො.

කතමො ච භික්ඛවෙ, දුක්ඛනිරොධො :

යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො, අයං වුච්චති භික්ඛවෙ, දුක්ඛනිරොධො.

කතමා ච භික්ඛවෙ, දුක්ඛනිරොධගාමිනීපටිපදා :

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං : සම්මාදිට්ඨි -පෙ- සම්මා සමාධි, අයං වුච්චති භික්ඛවෙ, දුක්ඛනිරොධගාමිනීපටිපදාති.

## 1. 3. 1. 3.

### සක්කාය සුත්තං

**105.** සාවත්ථියං :

සක්කායඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි සක්කායසමුදයඤ්ච සක්කායනිරොධඤ්ච සක්කායනිරොධගාමිනිඤ්ච පටිපදං තං සුණාථ.

කතමො ච භික්ඛවෙ, සක්කායො :

පඤ්චුපාදානක්ඛන්ධාතිස්ස වචනීයං.

කතමෙ පඤ්ච,

සෙය්‍යථීදං : රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො, අයං වුච්චති භික්ඛවෙ, සක්කායො.

## 1. 3. 1. 2.

## දුක්ඛ සූත්‍රය

**104.** සැවැත්නුවර :

මහණෙනි, තොපට දුක්ඛයත්, දුක්ඛසමුදයත්, දුක්ඛනිරොධයත්, දුක්ඛනිරොධගාමිනී පටිපදාවත් දේශනා කරන්නෙමි. එය අසවු.

මහණෙනි, දුක්ඛය කවරේ යැ යත් :

පඤ්චෝපාදානස්කන්ධ යි කියයුතු වෙයි.

කවර පසෙකැ යත් :

රූපෝපාදනස්කන්ධ ය, . . . විඥානෝපාදනස්කන්ධ යි, මහණෙනි, මේ දුක්ඛය යි කියනු ලැබේ.

මහණෙනි, දුක්ඛසමුදය කවරැ යත් :

පුනර්භවය කරන නන්දිරාගය සහගිය ඒ ඒ තන්හි ඇල්ම ඇති කරන යම් මේ තෘෂ්ණාවක් වේ ද, එ නම් : කාමතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභවතෘෂ්ණා යි. මහණෙනි මේ දුක්ඛසමුදය යි කියනු ලැබෙයි.

මහණෙනි, දුක්ඛනිරෝධය කවරේ යැ යත් :

ඒ තෘෂ්ණාවේ ම යම් නිරවශේෂ විරාගනිරොධයෙක් දුරලීමෙක් බැහැරලීමෙක් මිදීමෙක් නො ඇල්මෙක් වේ ද මහණෙනි, මේ දුක්ඛනිරොධ යි කියනු ලැබේ.

මහණෙනි, දුක්ඛනිරොධගාමිනීපටිපදාව කවරැ යත් : මේ අරිඅටැංගිමඟ මැ යි. එ නම් : සම්මාදිට්ඨි . . . සම්මාසමාධි යි. මහණෙනි, මේ දුක්ඛනිරොධගාමිනී පටිපදාව යයි කියනු ලැබේ යි.

## 1. 3. 1. 3.

## සක්කාය සූත්‍රය

**105.** සැවැත්නුවර :

මහණෙනි, තොපට සක්කායයත්, සක්කායසමුදයයත්, සක්කායනිරොධයත්, සක්කාය නිරොධගාමිනීපටිපදාවත් දේශනා කරන්නෙමි. එය අසවු.

මහණෙනි, සක්කාය කවරැ යත් :

පඤ්චොපාදානස්කන්ධ යයි කියයුතු වෙයි.

කවර පසෙකැ යත් :

රූපෝපාදනස්කන්ධ ය . . . විඥානෝපාදනස්කන්ධ යි. මහණෙනි, මේ සක්කාය යයි කියනු ලැබේ යි.

කතමො ච භික්ඛවෙ, සක්කායසමුදයො:

යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා, අයං වුච්චති භික්ඛවෙ, සක්කායසමුදයො.

කතමො ච භික්ඛවෙ, සක්කායනිරොධො:

යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො, අයං වුච්චති භික්ඛවෙ, සක්කායනිරොධො.

කතමා ච භික්ඛවෙ, සක්කායනිරොධගාමිනී පටිපදා:

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි, අයං වුච්චති භික්ඛවෙ, සක්කායනිරොධගාමිනී පටිපදාති.

## 1. 3. 1. 4.

## පරිඤ්ඤෙය්‍ය සුත්තං

**106.** සාවත්ථියං:

පරිඤ්ඤෙය්‍යෙ ච භික්ඛවෙ, ධම්මෙ දෙසිස්සාමි පරිඤ්ඤඤ්ච පරිඤ්ඤාතාවිඤ්ච පුග්ගලං. තං සුණාථ.

කතමෙ ච භික්ඛවෙ, පරිඤ්ඤෙය්‍යා ධම්මා:

රූපං භික්ඛවෙ, පරිඤ්ඤෙය්‍යො ධම්මො, වෙදනා පරිඤ්ඤෙය්‍යො ධම්මො, සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යො ධම්මො, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, පරිඤ්ඤෙය්‍යා ධම්මා.

කතමා ච භික්ඛවෙ, පරිඤ්ඤා:

යො භික්ඛවෙ, රාගක්ඛයො[1] දොසක්ඛයො මොහක්ඛයො, අයං වුච්චති භික්ඛවෙ, පරිඤ්ඤා.

කතමො ච භික්ඛවෙ, පරිඤ්ඤාතාවී පුග්ගලො:

අරහා'තිස්ස වචනීයං. යො'යං ආයස්මා එවංනාමො එවංගොත්තො, අයං වුච්චති භික්ඛවෙ, පරිඤ්ඤාතාවී පුග්ගලොති.

1. පරිඤ්ඤා රාගක්ඛයො - මජ්ඣං, සයා.

මහණෙනි, සක්කායසමුදයය කවරැ යත් :

පුනර්භවය කරන නන්දිරාගය සහගිය ඒ ඒ තන්හි ඇල්ම ඇති කරන යම් මේ තෘෂ්ණාවක් වේ ද, එනම් : කාමතෘෂ්ණාය, භවතෘෂ්ණාය, විභවතෘෂ්ණා යි. මහණෙනි, මෙ සක්කායසමුදය යයි කියනු ලැබේ යි.

මහණෙනි, සක්කායනිරොධය කවරේ යැ යත් :

ඒ තෘෂ්ණාවේ ම යම් නිරවශේෂවිරාගනිරොධයෙක් දුරලීමෙක් බැහැරලීමෙක් මිදීමෙක් නො ඇල්මෙක් වේ ද, මහණෙනි, මේ සක්කායනිරොධ යි කියනු ලැබේ.

මහණෙනි, සක්කායනිරෝධගාමිනීපටිපදව කවරැ යත් :

මේ අරිඅටඟිමඟ මැ යි. එ නම් : සම්මාදිට්ඨී ය . . . සම්මාසමාධි යි. මහණෙනි, මෙ සක්කායනිරෝධගාමිනී පටිපද යි කියනු ලැබෙ යි.

## 1. 3. 1. 4.

## පරිඤ්ඤෙය්‍යා සූත්‍රය

106. සැවැත්නුවර :

මහණෙනි පිරිසිඳ දතයුතු දහම් ද, පිරිසිඳ දැනිම ද, පිරිසිඳ දැන සිටි පුඟලා ද දේශනා කරන්නෙමි. එය අසවු.

මහණෙනි, පිරිසිඳ දතයුතු දහම්හු කවරහ යත් :

මහණෙනි, රූපය පිරිසිඳ දතයුතු දහමෙකි. වේදනාව පිරිසිඳ දතයුතු දහමෙකි. සංඥාව . . . සංස්කාර . . . විඥානය පිරිසිඳ දතයුතු දහමෙකි. මහණෙනි, මොහු පිරිසිඳ දතයුතු දහම්හු යි කියනු ලැබෙති.

මහණෙනි, පිරිසිඳ දැනීම කවර යැ යත් :

මහණෙනි, යම් රාගය ක්ෂය කිරීමෙක් වේ ද, ද්වේෂය ක්ෂය කිරීමෙක් වේ ද, මොහය ක්ෂය කිරීමෙක් වේ ද, මහණෙනි, මේ පිරිසිඳ දැනීම යි කියනු ලැබේ යි.

මහණෙනි, පිරිසිඳ දැන සිටි පුහුල් කවරේ යැ යත් :

රහත් තෙමේ යයි කියයුතු වෙයි. මෙබඳු නම් ඇති මෙබඳු ගොත් ඇති යම් මේ ආයුෂ්මතෙක් වේ ද, මහණෙනි, මේ පිරිසිඳ දත් පුඟුල් යයි කියනු ලැබෙ යි.

## 1. 3. 1. 5.

### සමණ සුත්තං

**107.** සාවත්ථියං:

පඤ්චිමෙ භික්ඛවෙ, උපාදානක්ඛන්ධා, කතමෙ පඤ්ච, සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණුපාදානක්ඛන්ධො.

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති. න මෙතෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව සමණසම්මතා බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා, න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානන්ති. තෙ ඛො මෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව සමණසම්මතා බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා, තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 1. 3. 1. 6.

### දුතිය සමණ සුත්තං

**108.** සාවත්ථියං:

පඤ්චිමෙ භික්ඛවෙ, උපාදානක්ඛන්ධා. කතමෙ පඤ්ච, සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණුපාදානක්ඛන්ධො.

යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති -පෙ- පජානන්ති -පෙ- සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 1. 3. 1. 7.

### සොතාපන්න සුත්තං

**109.** සාවත්ථියං:

පඤ්චිමෙ භික්ඛවෙ, උපාදානක්ඛන්ධා කතමෙ පඤ්ච, සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණුපාදානක්ඛන්ධො.

යතො ඛො භික්ඛවෙ, අරියසාවකො ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති, අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

## 1. 3. 1. 5.

## සමණ සූත්‍රය

107. සැවැත්නුවර:

මහණෙනි, මේ උපාදනස්කන්ධයෝ පසෙකි. කවර පසෙකැ යත්: එනම් . . . රූපො පාදනස්කන්ධ යැ . . . විඥනොපාදනස්කන්ධ යි.

මහණෙනි, යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ මේ පඤ්චොපාදනස් කන්ධයන්ගේ ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතු සේ නො දනිද්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මහණුන් කෙරෙහි මහණ ය යි ද සම්මත නො වෙති. බමුණන් කෙරෙහි බමුණු ය යි ද සම්මත නො වෙති. ඒ ආයුෂ්මත්හු මහණකම්හි ඵලය හෝ බමුණුකම්හි ඵලය හෝ මේ අත්බැව්හි ම තුමූ ම මැනවින් දැන පසක් කොට එයට එළැඹැ නො ද වෙසෙති.

මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ පඤ්චොපාදන ස්කන්ධයන්ගේ ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ දනිද්ද, මහණෙනි, ඒ මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මහණුන් කෙරෙහි මහණ යයි ද සම්මතයහ, බමුණන් කෙරෙහි බමුණු ය යි ද සම්මතයහ. ඒ ආයුෂ්මත්හු ද මහණකමේ ඵලයත් බමුණුකමේ ඵලයත් මේ අත්බැව්හි ම තුමූ ම වෙසෙසින් දැන පසක් කොට එයට එළැඹැ වෙසෙති යි.

## 1. 3. 1. 6.

## දුතිය සමණ සූත්‍රය

108. සැවැත්නුවර:

මහණෙනි, මේ උපාදනස්කන්ධ පසෙකි. කවර පසෙකැ යත්: එනම් . . . රූපො පාදනස්කන්ධ යැ, . . . විඥනොපාදනස්කන්ධ යි.

මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ පඤ්චොපාදන ස්කන්ධයන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ නො දනිද්ද . . . දනිද්ද, . . . තුමූ මැ වෙසෙසින් දැන පසක් කොට ඊට එළඹ වෙසෙත් යි.

## 1. . 1. 7.

## සෝතාපන්න සූත්‍රය

109. සැවැත්නුවර:

මහණෙනි, මේ උපාදනස්කන්ධ පසෙකි. කවර පසෙකැ යත්: එනම් . . . රූපොපාදන ස්කන්ධ ය . . . විඥනොපාදනස්කන්ධ යි.

මහණෙනි, යම් කලෙක පටන් ආර්යශ්‍රාවක තෙමේ මේ පඤ්චොපාදනස්කන්ධයන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ දනී ද, මහණෙනි, මේ තෙමේ සිවුඅපායෙහි නොවැටෙන ස්වභාව ඇති (ධම්මනියාම වශයෙන්) නියත වූ (මතු තෙමහ නමැති) සම්බෝධිය පිහිට කොට ඇති සෝවන් වූ අරිසවූ යයි කියනු ලැබෙ යි.

## 1. 3. 1. 8.

### අරහන්ත සුත්තං

**110.** සාවත්ථියං :

පඤ්චිමෙ භික්ඛවෙ, උපාදානක්ඛන්ධා, කතමෙ පඤ්ච, සෙය්‍යථීදං : රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො.

යතො ඛො භික්ඛවෙ, භික්ඛු ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තො හොති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තොති.

## 1. 3. 1. 9.

### පඨම ඡන්දරාග සුත්තං

**111.** සාවත්ථියං :

රූපෙ භික්ඛවෙ, යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා තං පජහථ, එවං තං රූපං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං.

වෙදනාය යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා තං පජහථ. එවං සා වෙදනා පහීනා භවිස්සති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා

සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා, තං පජහථ. එවං තෙ සඞ්ඛාරා පහීනා භවිස්සන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා.

විඤ්ඤාණෙ යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා තං පජහථ. එවං තං විඤ්ඤාණං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මන්ති.

## 1. 3. 1. 10.

### දුතිය ඡන්දරාග සුත්තං

**112.** සාවත්ථියං :

රූපෙ ඛො භික්ඛවෙ, යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයුපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා තෙ පජහථ, එවං තං රූපං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං.

Free Distribution www.aathaapi.org

## 1. 3. 1. 8.

## අරහන්ත සූත්‍රය

110. සැවැත්නුවර :

මහණෙනි, මේ උපාදානස්කන්ධ පසෙකි. කවර පසෙක් ද යත් : එ නම්.— රූපොපාදානස්කන්ධ ය . . . විඥානොපාදානස්කන්ධ යි.

මහණෙනි, යම් කලෙක පටන් මහණ මේ පඤ්චොපාදානස්කන්ධයන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ දැන උපාදාන රහිත වැ මිදුණේ වේ ද, මහණෙනි, මේ මහණ අර්හත් යැ, ක්ෂීණාස්‍රව යැ, වුසූ බඹසර ඇත්තේ යැ, කළ සිවුමඟ කිස ඇත්තේ යැ, බහා තැබූ පස්කඳ බර ඇත්තේ යැ, (මඟ පල) පිළිවෙළින් පැමිණි ස්වාර්ථ ඇත්තේ යැ, ක්ෂය වී ගිය භවසංයෝජන ඇත්තේ යැ, මොනොවට දැන (සසරින්) මිදුණේ යි කියනු ලැබේ.

## 1. 3. 1. 9.

## පඨම ඡන්දරාග සූත්‍රය

111. සැවැත්නුවර :

මහණෙනි, රූපයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තණ්හාවක් ඇත් ද, එය දුරු කරවු. මෙසේ ඒ රූපය ප්‍රහීණ වූයේ උසුන්මුල් ඇත්තේ හිස් සුන් තල්ගසක් මෙන් වෙන් කරන ලද්දේ නැවත නොහටගන්නක් කරන ලද්දේ මතු නූපදනා සැහැවි ඇත්තේ වන්නේ යැ.

වේදනායෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තෘෂ්ණායෙක් ඇත් ද එය දුරු කරවු. මෙසේ ඒ වේදනාව ප්‍රහීණ වූවා වෙයි. උසුන් මුල් ඇති වෙයි, හිස් සුන් තල්ගසක් මෙන් කරන ලද වෙයි, යළි නොහටගන්නක් කරන ලද වෙයි. මතු නූපදනා ස්වභාව ඇති වෙයි.

සංඥයෙහි . . . . සංස්කාරයන්හි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තණ්හාවක් ඇත් ද, එය දුරු කරවු. මෙසේ ඒ සංස්කාරයෝ ප්‍රහීණ වූවාහු උසුන් මුල් ඇත්තාහු හිස් සුන් තල්ගසක් මෙන් කරන ලද්දාහු නැවත නොහටගන්නා බවට පමුණුවන ලද්දාහු මතු නූපදනා ස්වභාව ඇති වන්නාහු ය.

විඥානයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තණ්හාවෙක් ඇත් ද, එය දුරු කරවු. මෙසේ ඒ විඥානය ප්‍රහීණ වූයේ උසුන් මුල් ඇත්තේ හිස් සුන් තල් ගසක් මෙන් කරන ලද්දේ නැවත නොහටගන්නා බවට පමුණුවන ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තේ වන්නේ යි.

## 1. 3. 1. 10.

## දුතිය ඡන්දරාග සූත්‍රය

112. සැවැත්නුවර :

මහණෙනි, රූපයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තණ්හාවෙක් වේ ද, යම් උපය උපාදානයෝ චිත්තයාගේ අධිෂ්ඨාන අභිනිවෙස අනුසයයෝ වෙද්ද ඔවුන් දුරු කරවු. මෙසේ ඒ රූපය ප්‍රහීණ වූයේ උසුන් මුල් ඇත්තේ හිස් සුන් තල්ගසක් මෙන් කරන ලද්දේ නැවත නොහටගන්නා බවට පමුණුවන ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තේ වන්නේ යැ.

වේදනාය යෙ ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයුපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ පජහථ, එවං සා වේදනා පහීනා භවිස්සති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා, අනභාවඞ්කතා ආයතිං අනුප්පාදධම්මා.

සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයුපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ පජහථ. එවං තං විඤ්ඤාණං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවඞ්කතං ආයතිං අනුප්පාදධම්මන්ති.

අන්තවග්ගො පඨමො.

තත්රුද්දානං :

අන්තො දුක්ඛඤ්ච සක්කායො පරිඤ්ඤෙය්‍යා සමණා ද්වෙ,
සොතාපන්නො අරහා ච ද්වෙ ඡන්දරාගිනාති

වේදනායෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තණ්හාවක් ඇත් ද, යම් උපයඋපාදනයෝ චිත්තයාගේ අධිට්ඨාන-අභිනිවෙස-අනුසයයෝ ඇත් ද, ඔවුන් දුරු කරවු. මෙසේ ඒ වේදනාව ප්‍රහීණ වූවා, උසුන් මුල් ඇත්තී හිස් සුන් තල් ගසක් මෙ කරන ලද්දී නැවත නො හටගන්නා බවට පමුණුවන ලද්දී මතු නූපදනා ස්වභාව ඇත්තී වන්නී ය.

සංඥාවෙහි . . . සංස්කාරයන්හි . . . විඥානයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තෘෂ්ණාවක් ඇත් ද, යම් උපය උපාදනයෝ චිත්තයාගේ අධිට්ඨාන අභිනිවෙස අනුසයයෝ ඇත්ද ඔවුන් දුරු කරවු. මෙසේ ඒ විඥානය ප්‍රහීණ වූයේ උසුන් මුල් ඇත්තේ හිස් සුන් තල්ගසක් මෙන් කරන ලද්දේ නැවත නොහටගන්නා බවට පමුණු වන ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තේ වන්නේ යයි.

පළමු වැනි අන්ත වර්ග යි

එහි උද්දානය :

අන්ත, දුක්ඛ, සක්කාය, පරිඤ්ඤෙය්‍යා යන සූත්‍ර සතර යැ, සමණසූත්‍ර දෙක යැ. සොතා පන්න අරහන්ත සූත්‍ර දෙක යැ, ඡන්දරාග සූත්‍රදෙක දූ යි සූත්‍ර දශයෙකි.

## 2. ධම්මකථිකවග්ගො

### 1. 3. 2. 1.

### අවිජ්ජා සුත්තං

**113. සාවත්ථියං :**

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : ''අවිජ්ජා අවිජ්ජා''ති භන්තෙ වුච්චති. කතමා නු ඛො භන්තෙ, අවිජ්ජා කිත්තාවතා ච අවිජ්ජාගතො හොතීති.

ඉධ භික්ඛු අස්සුතවා පුථුජ්ජනො රූපං නප්පජානාති, රූපසමුදයං නප්පජානාති, රූපනිරොධං නප්පජානාති, රූපනිරොධගාමිනිං පටිපදං නප්පජානාති, වෙදනං නප්පජානාති -පෙ- සඤ්ඤං නප්පජානාති -පෙ- සඞ්ඛාරෙ නප්පජානාති -පෙ- විඤ්ඤාණං නප්පජානාති, විඤ්ඤාණසමුදයං නප්පජානාති, විඤ්ඤාණනිරොධං නප්පජානාති, විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං නප්පජානාති. අයං වුච්චති භික්ඛවෙ, අවිජ්ජා එත්තාවතා ච අවිජ්ජාගතො හොතීති.

### 1. 3. 2. 2.

### විජ්ජා සුත්තං

**114. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : ''විජ්ජා විජ්ජා''ති භන්තෙ, වුච්චති. කතමා නු ඛො, භන්තෙ, විජ්ජා කිත්තාවතා ච විජ්ජාගතො හොතීති.

ඉධ භික්ඛු සුතවා අරියසාවකො රූපං පජානාති, රූපසමුදයං පජානාති, රූපනිරොධං පජානාති, රූපනිරොධගාමිනිං පටිපදං පජානාති, වෙදනං පජානාති -පෙ- සඤ්ඤං පජානාති -පෙ- සඞ්ඛාරෙ පජානාති -පෙ- විඤ්ඤාණං පජානාති, විඤ්ඤාණසමුදයං පජානාති, විඤ්ඤාණනිරොධං පජානාති, විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං පජානාති. අයං වුච්චති භික්ඛු විජ්ජා, එත්තාවතා ච විජ්ජාගතො හොතීති.

### 1. 3. 2. 3.

### පඨම ධම්මකථිකසුත්තං

**115. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : ''ධම්මකථිකො ධම්මකථිකො''ති භන්තෙ, වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ, ධම්මකථිකො හොතීති.



Free Distribution www.aathaapi.org

# 2. ධම්මකථික වර්ගය

## 1. 3. 2. 1.

## අවිජ්ජා සූත්‍රය

113. සැවැත්නුවර :

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙකැ හුන්නේ යැ. එකත්පසෙකැ හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල සැලකෙළේ යැ : වහන්ස, අවිද්‍යා යැ, අවිද්‍යා යැ යි කියනු ලැබේ. වහන්ස, අවිද්‍යාව නම් කවර යැ ? කොපමණෙකින් (අවිද්‍යාවට ගියේ) අවිද්‍යාගත වේ ද ?

මහණ, මෙහි අශ්‍රැතවත් පෘථග්ජන රූපය නො දනී ද, රූපසමුදය නො දනී ද, රූප නිරෝධය නො දනී ද, රූපනිරොධගාමිනීපටිපදව නො දනී ද, වේදනාව නො දනී ද, . . . සඤ්ඤා නො දනී ද, . . . සංඛාර නො දනී ද . . . විඤ්ඤාණය නො දනී ද, විඤ්ඤාණසමුදය නො දනී ද, විඤ්ඤාණනිරොධය නො දනී ද, විඤ්ඤාණනිරොධගාමිනී පටිපදව නො දනී ද, මහණෙනි, මේ අවිද්‍යා යි කියනු ලැබේ, මෙ පමණෙකින් අවිද්‍යාගත ද වේ ය යි.

## 1. 3. 2. 2.

## විජ්ජා සූත්‍රය

114. සැවැත්නුවර :

එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල සැලකෙළේ යැ : වහන්ස, විද්‍යා යැ, විද්‍යා යි කියනු ලැබේ. වහන්ස, විද්‍යාව නම් කවර යැ. කොපමණෙකින් විද්‍යාගතත් වේ ද ?

මහණ, මෙහි ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙමේ රූපය දනී ද, රූපසමුදය දනී ද, රූපනිරොධය දනී ද, රූපනිරොධගාමිනීපටිපදව දනී ද, වෙදනාව දනී ද . . . සඤ්ඤාව දනී ද . . . සංඛාර දනී ද . . . විඤ්ඤාණය දනී ද, විඤ්ඤාණසමුදය දනී ද, විඤ්ඤාණනිරොධය දනී ද, විඤ්ඤාණ නිරොධගාමිනීපටිපදව දනී ද මහණ, මේ විද්‍යා යයි කියනු ලැබේ. මෙපම ණෙකින් විද්‍යාගත ද වේ යයි.

## 1. 3. 2. 3.

## පඨම ධම්ම කථික සූත්‍රය

115. සැවැත්නුවර :

එකත්පසෙකැ හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල සැලකෙළේ යැ : වහන්ස, "ධම්මකථික ය, ධම්මකථික" ය යි කියනු ලැබේ. වහන්ස, කොපමණෙකින් "ධම්ම කථික" වේ ද යි.



Free Distribution www.aathaapi.org

රූපස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරෝධාය ධම්මං දෙසෙති, ''ධම්මකථිකො භික්ඛූ''ති අලං වචනාය. රූපස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරෝධාය පටිපන්නො හොති, ''ධම්මානුධම්මපටිපන්නො භික්ඛූ''ති අලං වචනාය, රූපස්ස චෙ භික්ඛු නිබ්බිදා විරාගා නිරෝධා අනුපාදා විමුත්තො හොති, ''දිට්ඨධම්මනිබ්බානප්පත්තො භික්ඛූ''ති අලං වචනාය.

වේදනාය චෙ භික්ඛු -පෙ- සඤ්ඤාය චෙ භික්ඛු -පෙ- සඞ්ඛාරානං චෙ භික්ඛු -පෙ- විඤ්ඤාණස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරෝධාය ධම්මං දෙසෙති ''ධම්මකථිකො භික්ඛූ''ති අලං වචනාය, විඤ්ඤාණස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරෝධාය පටිපන්නො හොති ''ධම්මානුධම්මපටිපන්නො භික්ඛූ''ති අලං වචනාය. විඤ්ඤාණස්ස චෙ භික්ඛු නිබ්බිදා විරාගා නිරෝධා අනුපාදා විමුත්තො හොති ''දිට්ඨධම්මනිබ්බානප්පත්තො භික්ඛූ''ති අලං වචනායාති.

## 1. 3. 2. 4.

## දුතිය ධම්මකථික සුත්තං

**116.** සාවත්ථියං:

ඒකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ''ධම්මකථිකො, ධම්මකථිකො''ති භන්තෙ, වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ, ධම්මකථිකො හොති? කිත්තාවතා ධම්මානුධම්මපටිපන්නො හොති? කිත්තාවතා දිට්ඨධම්මනිබ්බානප්පත්තො හොති''ති?

රූපස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරෝධාය ධම්මං දෙසෙති, ''ධම්මකථිකො භික්ඛූ''ති අලං වචනාය. රූපස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරෝධාය පටිපන්නො හොති, ''ධම්මානුධම්මපටිපන්නො භික්ඛූ''ති අලං වචනාය. රූපස්ස චෙ භික්ඛු නිබ්බිදා විරාගා නිරෝධා අනුපාදා විමුත්තො හොති, ''දිට්ඨධම්මනිබ්බානප්පත්තො භික්ඛූ''ති අලං වචනාය.

වේදනාය චෙ භික්ඛු -පෙ- සඤ්ඤාය චෙ භික්ඛු -පෙ- සඞ්ඛාරානං චෙ භික්ඛු -පෙ- විඤ්ඤාණස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරෝධාය ධම්මං දෙසෙති ''ධම්මකථිකො භික්ඛූ''ති අලං වචනාය. විඤ්ඤාණස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරෝධාය පටිපන්නො හොති, ''ධම්මානුධම්මපටිපන්නො භික්ඛූ''ති අලං වචනාය. විඤ්ඤාණස්ස චෙ භික්ඛු නිබ්බිදා විරාගා නිරෝධා අනුපාදා විමුත්තො හොති, ''දිට්ඨධම්මනිබ්බානප්පත්තො භික්ඛූ''ති අලං වචනායාති.

Free Distribution www.aathaapi.org

මහණ, ඉදින් රූපයෙහි කලකිරීම පිණිස නො ඇල්ම පිණිස නිරෝධය පිණිස දහම් දෙසා නම්, (ඒ) මහණ ''ධම්මකථික'' ය යි කියන්නට සුදුසු වෙයි. මහණ ඉදින් රූපයෙහි කලකිරීම පිණිස නො ඇල්ම පිණිස නිරෝධය පිණිස පිළිපන්නේ වේ නම්, (ඒ) මහණ ''ධම්මානුධම්මපටිපන්න'' ය යි කියන්නට සුදුසු වෙයි. මහණ ඉදින්, රූපයෙහි කලකිරීමෙන් නොඇල්මෙන් නිරොධයෙන් උපාදන රහිත වැ මිදුණේ වේ නම් (ඒ) මහණ දිටුදැමියෙහි නිවනට පැමිණියේ යි කියන්නට සුදුසු වෙයි.

මහණ, ඉදින් වේදනායෙහි . . . මහණ, ඉදින් සඤ්ඤායෙහි . . . මහණ ඉදින් සංඛාරයන්හි . . . මහණ, ඉදින් විඤ්ඤාණයෙහි කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරෝධය පිණිස දහම් දෙසා නම්, (ඒ) මහණ ''ධම්මකථික'' ය යි කීමට සුදුසු වෙයි. මහණ, ඉදින් විඤ්ඤාණයෙහි කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ නම් (ඒ) මහණ ''ධම්මානුධම්මපටිපන්න'' යයි කියන්නට සුදුසු වෙයි. මහණ ඉදින් විඤ්ඤාණයෙහි කලකිරීමෙන් නොඇල්මෙන් නිරොධයෙන් උපාදනරහිත ව මිදුණේ වේ නම්, (ඒ) මහණ තෙමේ දිටුදැමියෙහි නිවනට පැමිණියේ ය යි කියන්නට සුදුසු වේ යි.

## 1. 3. 2. 4.
## දුතිය ධම්මකථික සූත්‍රය

**116.** සැවැත්නුවර :

එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය : වහන්ස, ධම්මකථික ය, ධම්මකථික ය යි කියනු ලැබෙ. වහන්ස, කොපමණෙකින් ධම්මකථික වේ ද ? කොපමණෙකින් ධම්මානුධම්මපටිපන්න වේ ද ? කොපමණෙකින් දිටුදැමියෙහි නිවනට පැමිණියේ වේ දැ යි.

මහණ, ඉදින් රූපයෙහි කලකිරීම පිණිස නොඇලීම පිණිස නිරොධය පිණිස දහම් දෙසා නම්, (ඒ) මහණ ''ධම්මකථික'' යයි කියන්නට සුදුසු වේ. මහණ ඉදින් රූපයෙහි කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ නම්, (ඒ) මහණ ''ධම්මානුධම්මපටිපන්න'' ය යි කියන්නට සුදුසු වෙයි. මහණ, ඉදින් රූපයෙහි කලකිරීමෙන් නොඇල්මෙන් නිරොධයෙන් උපාදන රහිත ව මිදුණේ වේ නම් (ඒ) මහණ දිටුදැමියෙහි නිවනට පැමිණියේ ය යි කියන්නට සුදුසු වෙයි.

මහණ, ඉදින් වේදනායෙහි . . . මහණ, ඉදින් සංඥයෙහි . . . මහණ, ඉදින් සංස්කාරයන්හි . . . මහණ, ඉදින් විඥනයෙහි කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරෝධය පිණිස දහම් දෙසා නම්, (ඒ) මහණ තෙමේ ''ධම්මකථික'' ය යි කියන්නට සුදුසු වෙයි. මහණ, ඉදින් විඥනයෙහි කලකිරීම පිණිස නොඇල්ම පිණිස නිරොධය පිණිස පිළිපන්නේ වේ නම් (ඒ) මහණ ''ධම්මානුධම්මපටිපන්න'' යයි කියන්නට සුදුසු වෙයි. මහණ ඉදින් විඥනයෙහි කලකිරීමෙන් නොඇල්මෙන් නිරොධයෙන් උපාදන රහිත ව මිදුණේ වේ නම්, (ඒ) මහණ තෙමේ දිටුදැමියෙහි නිවනට පැමිණියේ යයි කියන්නට සුදුසු වේ.

## 1. 3. 2. 5.

## බන්ධන සුත්තං

117. සාවත්ථියං:

අස්සුතවා[1] භික්ඛවේ, පුථුජ්ජනො අරියානං අදස්සාවී -පෙ- සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති. රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං, අයං වුච්චති භික්ඛවේ, අස්සුතවා පුථුජ්ජනො රූපබන්ධනබද්ධො සන්තරබාහිරබන්ධනබද්ධො අතීරදස්සී අපාරදස්සී, බද්ධො ජායති[2], බද්ධො මීයති[3], බද්ධො අස්මා ලොකා පරං ලොකං ගච්ඡති.

වේදනං අත්තතො සමනුපස්සති -පෙ- වේදනාය වා අත්තානං, අයං වුච්චති භික්ඛවේ, අස්සුතවා පුථුජ්ජනො වේදනාබන්ධනබද්ධො සාන්තරබාහිරබන්ධනබද්ධො අතීරදස්සී අපාරදස්සී. බද්ධො ජායති[2], බද්ධො මීයති, බද්ධො අස්මා ලොකා පරං ලොකං ගච්ඡති.

සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති -පෙ- සඞ්ඛාරෙසු වා අත්තානං. අයං වුච්චති භික්ඛවේ, අස්සුතවා පුථුජ්ජනො සඞ්ඛාරබන්ධනබද්ධො සාන්තරබාහිරබන්ධනබද්ධො අතීරදස්සී අපාරදස්සී, බද්ධො ජායති බද්ධො මීයති බද්ධො අස්මා ලොකා පරං ලොකං ගච්ඡති.

විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. අයං වුච්චති භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො විඤ්ඤාණබන්ධනබද්ධො සන්තරබාහිරබන්ධනබද්ධො අතීරදස්සී අපාරදස්සී, බද්ධො ජායති, බද්ධො මීයති, බද්ධො අස්මා ලොකා පරං ලොකං ගච්ඡති.

සුතවා ච ඛො භික්ඛවේ, අරියසාවකො අරියානං දස්සාවී -පෙ- සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං, අයං වුච්චති භික්ඛවෙ, සුතවා අරියසාවකො න රූපබන්ධනබද්ධො න සන්තරබාහිරබන්ධනබද්ධො තීරදස්සී පාරදස්සී, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි.

න වේදනං අත්තතො සමනුපස්සති -පෙ- න වේදනාය වා අත්තානං, අයං වුච්චති භික්ඛවේ, සුතවා අරියසාවකො න වේදනාබන්ධනබද්ධො න සන්තරබාහිරබන්ධනබද්ධො තීරදස්සී පාරදස්සී, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි.

---

1. ඉධ භික්ඛවේ අස්සුතවා - මජසං, සයා, PTS.
2. ජීයති - මජසං, ජීයන්ති - සයා.
3. මීයන්ති - සයා.

## 1. 3. 2. 5.

## බන්ධන සූත්‍රය

117. සැවැත්නුවර:

මහණෙනි, බුද්ධාදි ආර්‍ය්‍යයන් නො දක්නා . . . සත්පුරුෂ ධර්මයෙහි නො හික්මුණු අශ්‍රුතවත් පෘථග්ජන රූපය ආත්ම වශයෙන් දකියි, රූපවත් හෝ ආත්මය දකියි, ආත්මයෙහි හෝ රූපය දකියි, රූපයෙහි හෝ ආත්මය දකියි, මහණෙනි, මේ අශ්‍රුතවත් පෘථග්ජන රූපබන්ධනයෙන් බැඳුණේ අභ්‍යන්තර බාහිර බන්ධනයෙන් (ඔරම්භාගිය සංයෝජන සහිත උද්ධම්භාගිය සංයෝජනයෙන්) බැඳුණේ සංසාර වර්තය නො දක්නේ නිර්වාණපාරය නො දක්නේ (ක්ලෙශබන්ධනයෙන්) බැඳුණේ උපදියි, බැඳුණේ මියෙයි, බැඳුණේ මෙලොවින් පරලොවට යේ යි කියනු ලැබෙයි.

මහණෙනි, වේදනාව ආත්ම වශයෙන් දකියි . . . වේදනායෙහි හෝ ආත්මය දකියි. මහණෙනි, මේ අශ්‍රුතවත් පෘථග්ජන වේදනාබන්ධනයෙන් බැඳුණේ අභ්‍යන්තර බාහිර (සංයොජන) බන්ධනයෙන් බැඳුණේ සසරවට නො දක්නේ නිවන නො දක්නේ බැඳුණේ උපදියි. බැඳුණේ මියෙයි. බැඳුණේ මෙලොවින් පරලොව යේ යි කියනු ලැබෙයි.

සංඥාව . . . සංස්කාර ආත්ම වශයෙන් දකියි . . . සංස්කාරයෙහි හෝ ආත්මය දකියි. මහණෙනි, මේ අශ්‍රුතවත් පෘථග්ජන සංස්කාර බන්ධනයෙන් බැඳුණේ, ආධ්‍යාත්මික බාහිර බන්ධනයෙන් බැඳුණේ, සසරවට නො දක්නේ, නිවන නො දක්නේ, බැඳුණේ උපදියි, බැඳුණේ මියෙයි, බැඳුණේ මෙලොවින් පරලොවට යේ යි කියනු ලැබෙයි.

විඥානය ආත්ම වශයෙන් දකියි, විඥානවත් හෝ ආත්මය දකියි, ආත්මයෙහි හෝ විඥානය දකියි, විඥානයෙහි හෝ ආත්මය දකියි. මහණෙනි, මේ අශ්‍රුතවත් පෘථග්ජන සංසාර වර්තය නො දක්නේ නිර්වාණපාරය නො දක්නේ (ක්ලෙශ බන්ධනයෙන්) බැඳුණේ උපදියි, බැඳුණේ මියෙයි, බැඳුණේ මෙලොවින් පරලොව යේ යි කියනු ලැබේ.

මහණෙනි, බුද්ධාදි ආර්‍ය්‍යයන් දක්නා . . . සත්පුරුෂධර්මයෙහි මොනොවට හික්මුණු ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපය ආත්ම වශයෙන් නො දකියි. රූපවත් හෝ ආත්මය නො දකියි, ආත්මයෙහි හෝ රූපය නො දකියි, රූපයෙහි හෝ ආත්මය නො දකියි. මහණෙනි. මේ ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපබන්ධනයෙන් නො බැඳුණේ ඔරම්භාගිය සංයෝජන සහිත උද්ධම්භාගිය සංයෝජනයෙන් බැඳුණේ සසරතෙර දක්නේ නිර්වාණ පාරය දක්නේ යි කියනු ලැබෙ. හේ (සියලු) දුකින් මිදුණේ යයි කියමි.

වේදනාව ආත්මවශයෙන් නො දකියි . . . වේදනායෙහි හෝ ආත්මය නො දකියි, මේ ශ්‍රුතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක වේදනා බන්ධනයෙන් නො බැඳුණේ යයි කියනු ලැබෙයි. අභ්‍යන්තර සහිත බාහිර බන්ධනයෙන් නො බැඳුණේ යයි කියනු ලැබෙයි, සසර තෙර. දක්නේ යයි කියනු ලැබෙයි, නිර්වාණපාරය දක්නේ යයි කියනු ලැබෙ. හේ (සියලු) දුකින් මිදුණෑ යි කියමි.

21—ඒ 50066 (80/06)

න සඤ්ඤං -පෙ- න සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සති -පෙ- න සඞ්ඛාරෙසු වා අත්තානං. අයං වුච්චති භික්ඛවෙ, සුතවා අරියසාවකො න සඞ්ඛාරබන්ධනබද්ධො න සන්තරබාහිරබන්ධනබද්ධො තීරදස්සී පාරදස්සී, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමි.

න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං, අයං වුච්චති භික්ඛවෙ, සුතවා අරියසාවකො න විඤ්ඤාණබන්ධනබද්ධො තීරදස්සී පාරදස්සී, පරිමුත්තො සො දුක්ඛස්මාති වදාමීති.

## 1. 3. 2. 6.

## පඨම පරිපුච්ඡිත සුත්තං

**118.** සාවත්ථියං :

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං ‘‘එතං මම එසොහමස්මි, එසො මෙ අත්තා’’ති සමනුපස්සථාති? නො හෙතං භන්තෙ, සාධු භික්ඛවෙ. රූපං භික්ඛවෙ ‘‘නෙතං මම නෙසොහමස්මි, න මෙ සො අත්තා’’ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං, වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං ‘‘එතං මම එසොහමස්මි එසො මෙ අත්තා’’ති සමනුපස්සථාති? නො හෙතං භන්තෙ. සාධු භික්ඛවෙ, විඤ්ඤාණං භික්ඛවෙ, ‘‘නෙතං මම නෙසොහමස්මි න මෙ සො අත්තා’’ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති -පෙ- වෙදනායපි -පෙ- සඤ්ඤායපි -පෙ- සඞ්ඛාරෙසුපි -පෙ- විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 3. 2. 7.

## දුතිය පරිපුච්ඡිත සුත්තං

**119.** සාවත්ථියං :

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, රූපං ‘‘නෙතං මම නෙසොහමස්මි න මෙ සො අත්තා’’ති සමනුපස්සථාති? එවං භන්තෙ.

සාධු භික්ඛවෙ, රූපං භික්ඛවෙ, ‘‘නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තා’’ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. වෙදනං ‘‘නෙතං මම -පෙ- සඤ්ඤං ‘නෙතං මම -පෙ- සඞ්ඛාරෙ නෙතං මම -පෙ- විඤ්ඤාණං ‘‘නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තා’’ති සමනුපස්සථාති?

සංඥාව ආත්ම වශයෙන් නො දකියි . . . සංස්කාර ආත්ම වශයෙන් නො දකියි . . . සංස්කාරයෙහි හෝ ආත්මය නො දකියි. මහණෙනි, මේ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක සංස්කාර බන්ධනයෙන් නො බැඳුණේ යයි කියනු ලැබෙයි, අභ්‍යන්තර සහිත බාහිර බන්ධනයෙන් නො බැඳුණේ යයි කියනු ලැබෙයි, සංසාරවර්තය දක්නේ යයි කියනු ලැබෙයි. නිර්වාණ පාරය දක්නේ යයි කියනු ලැබේ. හේ (සියලු) දුකින් මිදුණෑ යි කියමි.

විඥානය ආත්ම වශයෙන් නො දකියි. විඥානවත් හෝ ආත්මය නො දකියි. ආත්මයෙහි හෝ විඥානය නො දකියි, විඥානයෙහි හෝ ආත්මය නො දකියි. මහණෙනි, මේ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක විඥාන බන්ධනයෙන් නො බැඳුණේ යයි කියනු ලැබෙයි. අභ්‍යන්තර බාහිර සංයෝජනයෙන් නො බැඳුණේ යයි කියනු ලැබෙයි, සසර තෙර දක්නේ යයි කියනු ලැබෙයි. නිර්වාණපාරය දක්නේ යයි කියනු ලැබේ. හේ (සියලු) දුකින් මිදුණේ යයි කියමි.

## 1. 3. 2. 6.

## පඨම පරිපුච්ඡිත සූත්‍රය

**118.** සැවැත්නුවර :

මහණෙනි, ඒ කිමැයි හඟිවූ ද ? රූපය ''තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම ''යි දකිවූ දූ යි. වහන්ස, තෙල නො වේ ම යැ. මහණෙනි, මැනැවි. මහණෙනි, රූපය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ තෙල තතුසේ මනානුවණින් දක්ක යුතු යි. වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය ''තෙල මාගේ යැ. තෙලෙ මම වෙමි. තෙල මාගේ ආත්ම''යි දකිවූ දූ යි වහන්ස, තෙල නො වේ මැ යි. මහණෙනි, මැනවි. මහණෙනි, විඥානය ''තෙල මාගේ නො වෙයි. තෙලෙ මම නො වෙමි. තෙල මාගේ ආත්මය නො වේ ය''යි මෙසේ තෙල තතු යේ මනානුවණින් දක්කයුතු.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපයෙහිත් කලකිරෙයි . . . වෙදනාවෙහිත් . . . සංඥාවෙහිත් . . . සංස්කාරයන්හිත් . . . විඥානයෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි . . . මේ බැව් පිණිස කළයුතු අන්කිසෙක් නැතැ යි දැනගනී යි.

## 1. 3. 2. 7.

## ද්‍රුතිය පරිපුච්ඡිත සූත්‍රය

**119.** සැවැත්නුවර :

මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද ? රූපය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ ය''යි දකිවූ දූ යි. වහන්ස එසේ යැ.

මහණෙනි, මැනවි. මහණෙනි, රූපය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේ යයි මෙසේ තෙල තතු සේ මනානුවණින් දක්ක යුතු යැ. වෙදනාව . . . තෙල මාගේ නො වෙයි . . . සංඥාව තෙල මාගේ නො වෙයි. . . සංස්කාර ''තෙල මාගේ නො වෙයි . . . විඥානය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේ ය''යි දකිවූ දූ යි.

එවං භණන්ත, සාධු භික්ඛවෙ, විඤ්ඤාණං භික්ඛවෙ, "නෙතං මම නෙසොහමස්මි න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 3. 2. 8.

## සඤ්ඤොජනිය සුත්තං

**120.** සාවත්ථියං:

සඤ්ඤොජනියෙ ච භික්ඛවෙ, ධම්මෙ දෙසිස්සාමි සඤ්ඤොජනඤ්ච, තං සුණාථ.

කතමෙ ච භික්ඛවෙ, සඤ්ඤොජනියා ධම්මා, කතමං සඤ්ඤොජනං:

රූපං භික්ඛවෙ, සඤ්ඤොජනියො ධම්මො. යො තත්ථ ඡන්දරාගො තං තත්ථ සඤ්ඤොජනං. වෙදනා සඤ්ඤොජනියො ධම්මො, යො තත්ථ ඡන්දරාගො, තං තත්ථ සඤ්ඤොජනං. සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං සඤ්ඤොජනියො ධම්මො, යො තත්ථ ඡන්දරාගො, තං තත්ථ සඤ්ඤොජනං, ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, සඤ්ඤොජනියා ධම්මා, ඉදං සඤ්ඤොජනන්ති.

## 1. 3. 2. 9.

## උපාදානිය සුත්තං

**121.** සාවත්ථියං:

උපාදානියෙ ච භික්ඛවෙ, ධම්මෙ දෙසිස්සාමි උපාදානඤ්ච, තං සුණාථ.

කතමෙ ච භික්ඛවෙ, උපාදානියා ධම්මා, කතමං උපාදානං:

රූපං භික්ඛවෙ, උපාදානියො ධම්මො, යො තත්ථ ඡන්දරාගො තං තත්ථ උපාදානං. වෙදනා උපාදානියො ධම්මො, යො තත්ථ ඡන්දරාගො තං තත්ථ උපාදානං. සඤ්ඤා උපාදානියො ධම්මො -පෙ- සඞ්ඛාරා උපාදානියො ධම්මො -පෙ- විඤ්ඤාණං උපාදානියො ධම්මො, යො තත්ථ ඡන්දරාගො තං තත්ථ උපාදානං. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, උපාදානියා ධම්මා, ඉදං උපාදානන්ති.

වහන්ස, එසේ යි.

මහණෙනි, මැනවි. මහණෙනි, විඥානය ''තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්ම නො වේ ය''යි මෙසේ තෙල තතු සේ මනානුවණින් දක්ක යුතු යි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපයෙහිත් කලකිරෙයි ... මේ බැව් පිණිස අන් කිසෙක් නැතැ යි දනගනී යි.

## 1. 3. 2. 8.

## සඤ්ඤොජනිය සූත්‍රය

**120.** සැවැත්නුවර :

මහණෙනි, සංයෝජනීය (සංයෝජනයන්ට හිතවූ) ධර්ම ද සංයෝජන ද දේශනා කරන්නෙමි. එය අසවු.

මහණෙනි, සංයෝජනීය ධර්මයෝ කවරහු ද, සංයෝජන කවරහු ද යත් :

මහණෙනි, රූපය සංයෝජනීය දහමෙකි, එහි යම් ඡන්දරාගයෙක් වේ ද, එය එහි සංයෝජන ය යි. වේදනාව සංයෝජනීය දහමෙකි. එහි යම් ඡන්දරාගයෙක් වේ ද එය එහි සංයෝජන යි. සංඥාව . . . සංස්කාර . . . විඥානය සංයෝජනීය දහමෙකි. එහි යම් ඡන්දරාගයෙක් වේ ද එය එහි සංයෝජන යි. මහණෙනි, මොහු සංයෝජනීය දහම්හු යයි කියනු ලැබෙත්. මේ (ඡන්දරාගය) සංයෝජන යි.

## 1. 3. 2. 9.

## උපාදනිය සූත්‍රය

**121.** සැවැත්නුවර :

මහණෙනි, උපාදනිය (උපාදනයන්ට හිතවූ) දහම් ද උපාදන ද දේශනා කරන්නෙමි. එය අසවු.

මහණෙනි, උපාදනිය දහම්හු කවරහු ද, උපාදනය කවරේ ද යත් :

මහණෙනි' රූපය උපාදනිය දහමෙකි. එහි යම් ඡන්දරාගයෙක් ඇත් ද එය එහි උපාදන යි, වේදනාව උපාදනිය දහමෙකි. එහි යම් ඡන්දරාගයෙක් ඇත් ද එය එහි උපාදන යි, සඤ්ඤාව උපාදනිය දහමෙකි . . . සංඛාර උපාදනිය දහමෙකි . . . විඤ්ඤාණය උපාදනිය දහමෙකි. එහි යම් ඡන්දරාගයෙක් ඇත් ද එය එහි උපාදන යි. මහණෙනි, මොහු උපාදනිය දහම්හු ය යි කියනු ලැබෙත්. මේ (ඡන්දරාගය) උපාදන යි.

## 1. 3. 2. 10.

### සීල සුත්තං

**122.**

එකං සමයං ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාකොට්ඨිතො,[1] බාරාණසියං විහරන්ති ඉසිපතනෙ මිගදායෙ. අථ ඛො ආයස්මා මහාකොට්ඨිතො[1] සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීය වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "සීලවතා ආවුසො සාරිපුත්ත, භික්ඛුනා කතමෙ ධම්මා යොනිසො මනසිකාතබ්බා"ති.

සීලවතාවුසො කොට්ඨිත, භික්ඛුනා පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො යොනිසො මනසිකාතබ්බා. කතමෙ පඤ්ච, සෙය්‍යථීදං: රූපුපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණුපාදානක්ඛන්ධො. සීලවතාවුසො, කොට්ඨිත, භික්ඛුනා ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො දුක්ඛතො -පෙ- අනත්තතො යොනිසො මනසිකාතබ්බා. ඨානං ඛො පනෙතං ආවුසො, විජ්ජති යං සීලවා භික්ඛු ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො -පෙ- අනත්තතො යොනිසො මනසි කරොන්තො සොතාපත්තිඵලං සච්ඡිකරෙය්‍යා'ති.

සොතාපන්නෙන පනාවුසො සාරිපුත්ත, භික්ඛුනා කතමෙ ධම්මා යොනිසො මනසිකාතබ්බා'ති.

සොතාපන්නෙන'පි ඛො ආවුසො කොට්ඨිත, භික්ඛුනා ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො -පෙ- අනත්තතො යොනිසො මනසිකාතබ්බා, ඨානං ඛො පනෙතං ආවුසො, විජ්ජති යං සොතාපන්නො භික්ඛු ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො -පෙ- අනත්තතො යොනිසො මනසිකරොන්තො සකදාගාමිඵලං සච්ඡිකරෙය්‍යා'ති.

සකදාගාමිනා පනාවුසො සාරිපුත්ත, භික්ඛුනා කතමෙ ධම්මා යොනිසො මනසිකාතබ්බා'ති.

සකදාගාමිනාපි ඛො ආවුසො කොට්ඨිත, භික්ඛුනා ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො දුක්ඛතො -පෙ- අනත්තතො යොනිසො මනසිකාතබ්බා. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති යං සකදාගාමී භික්ඛු ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො -පෙ- අනත්තතො යොනිසො මනසිකරොන්තො අනාගාමිඵලං සච්ඡිකරෙය්‍යා'ති.

---

1. මහාකොට්ඨිතො - මජ්ඣං.

## 1. 3. 2. 10.

## සීල සූත්‍රය

122.

එක් කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ද ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ද බරණැස සමීපයෙහි ඉසිපතන නම් වූ මිගදායයෙහි වාස කෙරෙති. එ කල්හි ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ සවස්කල විවේකයෙන් නැඟී සිටියාහු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළැඹියහ. එළැඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් සමඟ සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත් පස් ව හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීහ : ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, සිල්වත් මහණහු විසින් කවර දහම්හු නුවණින් මෙනෙහි කටයුත්තාහු දැ යි.

ඇවැත්නි, කොට්ඨිතයෙනි, සිල්වත් මහණහු විසින් පඤ්චොපාදනස්කන්ධයෝ අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගඩ වශයෙන් හුල් වශයෙන් පීඩා වශයෙන් ආබාධ වශයෙන් මෙරමා වශයෙන් වැනසීම් වශයෙන් ශූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කටයුත්තාහු ය. කවර පස් කඳෙකැ යත් : එනම්–රූපෝපාදනස්කන්ධ යැ . . . විඤ්ඤාණෝපාදනස්කන්ධ යි. ඇවැත්නි, කොට්ඨිතයෙනි, සිල්වත් මහණහු විසින් මේ පඤ්චෝපාදනස්කන්ධයෝ අනිත්‍ය වශයෙන් . . . දුක් වශයෙන් . . . අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කටයුත්තාහු යි. ඇවැත්නි, සිල්වත් මහණ මේ පඤ්චෝපාදනස්කන්ධයන් අනිත්‍ය විසින් දුක් විසින් . . . අනාත්ම විසින් නුවණින් මෙනෙහි කරනුයේ සෝවන්ඵල පසක් කරන්නේ ය යන යම් කරුණෙක් වේ නම් මෙල කරුණ ඇත්තේ යැ.

ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, සෝවන් මහණහු විසින් කවර දහම්හු නුවණින් මෙනෙහි කටයුත්තාහු දැ යි ?

ඇවැත්නි, කොට්ඨිතයෙනි, සෝවන් මහණහු විසිනුදු මේ පඤ්චොපාදනස්කන්ධයෝ අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් . . . අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කටයුත්තාහු යැ. ඇවැත්නි, සෝවන් මහණ මේ පඤ්චොපාදනස්කන්ධයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් . . . අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කරනුයේ සෙදගැමි ඵලය පසක් කරන්නේ ය යන යම් කරුණෙක් වේ නම් මෙල කරුණ ඇත්තේ යැ.

ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, සෙදගැමි මහණහු විසින් කවර දහම් කෙනෙක් නුවණින් මෙනෙහි කටයුත්තාහු දැ යි.

ඇවැත්නි, කොට්ඨිතයෙනි, සෙදගැමි මහණහු විසින් මේ පඤ්චොපාදනස්කන්ධයෝ අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් . . . අනාත්ම වශයෙන් නුවණින් මෙනෙහි කටයුත්තාහ. ඇවැත්නි, සෙදගැමි මහණ, මේ පඤ්චොපාදනස්කන්ධයන් අනිත්‍ය විසින් දුක් විසින් . . . අනාත් විසින් නුවණින් මෙනෙහි කරනුයේ අනගැමි ඵලය පසක් කරන්නේ ය යන යම් කරුණෙක් වේ නම් මෙල කරුණ ඇත්තේ යැ.

අනාගාමිනා පනාවුසො සාරිපුත්ත, භික්ඛුනා කතමෙ ධම්මා යොනිසො මනසිකාතබ්බා'ති? අනාගාමිනාපි ඛො ආවුසො කොට්ඨිත, භික්ඛුනා ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො දුක්ඛතො -පෙ- අනත්තතො යොනිසො මනසිකාතබ්බා. ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති යං අනාගාමී භික්ඛු ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො -පෙ- අනත්තතො යොනිසො මනසිකරොන්තො අරහත්තඵලං[1] සච්ඡිකරෙය්‍යා'ති.

අරහතා පනාවුසො සාරිපුත්ත, කතමෙ ධම්මා යොනිසො මනසිකාතබ්බා'ති.

අරහතා'පි ඛො ආවුසො කොට්ඨිත, ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො යොනිසො මනසිකාතබ්බා. නත්ථි ඛො ආවුසො අරහතො උත්තරිං කරණීයං, කතස්ස වා පතිචයො,[2] අපි ච ඉමෙ ධම්මා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරාය චෙව සංවත්තන්ති සතිසම්පජඤ්ඤාය චා'ති.

## 1. 3. 2. 11.

### සුතවන්ත සුත්තං

**123. බාරාණසියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: සුතවතාවුසො සාරිපුත්ත, භික්ඛුනා කතමෙ ධම්මා යොනිසො මනසිකාතබ්බා'ති.

සුතවතාවුසො කොට්ඨිත, භික්ඛුනා පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො යොනිසො මනසිකාතබ්බා.

කතමෙ පඤ්ච, සෙය්‍යථිදං: රූපුපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණුපාදානක්ඛන්ධො, සුතවතාවුසො කොට්ඨිත, භික්ඛුනා ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො දුක්ඛතො -පෙ- අනත්තතො යොනිසො මනසිකාතබ්බා.

ඨානං ඛො පනෙතං ආවුසො විජ්ජති යං සුතවා භික්ඛු ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො -පෙ- අනත්තතො යොනිසො මනසිකරොන්තො සොතාපත්තිඵලං සච්ඡිකරෙය්‍යා'ති -පෙ- සකදාගාමිඵලං සච්ඡිකරෙය්‍යා'ති -පෙ- අනාගාමිඵලං සච්ඡිකරෙය්‍යා'ති. -පෙ- අරහත්තඵලං සච්ඡිකරෙය්‍යා'ති.

---

1. අරහත්තං - මජසං, ස්‍යා.
2. පටිච්චයො - ස්‍යා, PTS.

ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, අනාගාමී මහණහු විසින් කවර දහම් කෙනෙක් නුවණින් මෙනෙහි කළ යුත්තාහු ද යි. ඇවැත්නි, කොට්ඨිතයෙනි, අනාගාමී මහණහු විසිනුදු මේ පඤ්චොපාදනස්කන්ධයෝ අනිය විසින් දුක් විසින් . . . අනාත් විසින් නුවණින් මෙනෙහි කළයුත්තාහු ය. ඇවැත්නි, අනාගාමී මහණ මේ පඤ්චොපාදනස්කන්ධයන් අනිය විසින් දුක් විසින් . . . අනාත් විසින් නුවණින් මෙනෙහි කරනුයේ රහත් ඵලය පසක් කරන්නේ ය යන යම් කරුණෙක් වේ නම් තෙල කරුණ ඇත්තේ යැ.

ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, රහත්හු විසින් කවර දහම් කෙනෙක් නුවණින් මෙනෙහි කළ යුත්තාහු ද යි ?

ඇවැත්නි, කොට්ඨිතයෙනි, රහත්හු විසිනුදු මේ පඤ්චොපාදනස්කන්ධයෝ අනිය විසින් දුක් විසින් රෝග විසින් ගඩ විසින් හුල් විසින් විපත් විසින් පෙළීම් විසින් මෙරමා විසින් වැනසීම් විසින් සිස් විසින් අනාත් විසින් නුවණින් මෙනෙහි කටයුත්තාහ. ඇවැත්නි, රහත්හට මත්තෙහි කළ යුත්තෙක් නැත, කරන ලද්ද නැවත කිරීමෙක් හෝ නැති. වැළි දු මේ දහම් වඩන ලද්දහු බහුල කරන ලද්දහු දිටුදැමියෙහි සුවවිහරණ පිණිස ද, සිහිනුවණ පිණිස ද පවත්නාහ යි.

## 1. 3. 2. 11.

## සුතවන්ත සූත්‍රය

**123.** බරණැස්නුවර :

එකත්පසෙක හුන් ආයුෂ්මත් මහාකොට්ඨික තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට තෙල කීහ : ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, ශ්‍රැතවත් මහණහු විසින් කවර දහම් කෙනෙක් නුවණින් මෙනෙහි කට යුත්තාහු ද යි.

ඇවැත්නි, කොට්ඨිතයෙනි, ශ්‍රැතවත් මහණහු විසින් පඤ්චෝපාදනස්කන්ධයෝ අනිය විසින් දුක් විසින් රෝග විසින් ගඩ විසින් හුල් විසින් විපත් විසින් පෙළීම් විසින් මෙරමා විසින් වැනසුම් විසින් සිස් විසින් අනාත් විසින් නුවණින් මෙනෙහි කළ යුත්තාහ.

කවර පසෙක් ද යත් : එනම්—රූපෝපාදනස්කන්ධය . . . විඥනෝපාදනස්කන්ධ යි. ඇවැත්නි, කොට්ඨිතයෙනි, ශ්‍රැතවත් මහණහු විසින් මේ පඤ්චෝපාදනස්කන්ධයෝ අනිය විසින් දුක් විසින් . . . අනාත් විසින් නුවණින් මෙනෙහි කළයුත්තාහ.

ඇවැත්නි, යම් හෙයකින් ශ්‍රැතවත් මහණ තෙමෙ මේ පඤ්චොපාදනස්කන්ධයන් අනිය විසින් දුක් විසින් . . . අනාත් විසින් නුවණින් මෙනෙහි කරන්නේ සෝවන්පල පසක් කරන්නේ යැ . . . සෙදගැමිපල පසක් කරන්නේ යැ . . . අනාගැමිපල පසක් කරන්නේ යැ . . . රහත්පල පසක් කරන්නේ යැ යන තෙල කරුණ ඇත්තේ යි.

අරහතා පනාවුසො සාරිපුත්ත, කතමෙ ධම්මා යොනිසො මනසිකාතබ්බාති. අරහතාපි ඛො ආවුසො කොට්ඨිත, ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො යොනිසො මනසිකාතබ්බා. නත්ථි ඛො ආවුසො අරහතො උත්තරිං කරණීයං, කතස්ස වා පතිචයො, අපි ච ඉමෙ ධම්මා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරාය චෙව සංවත්තන්ති සතිසම්පජඤ්ඤාය චාති.

## 1. 3. 2. 12.

### පඨම කප්ප සුත්තං

**124. සාවත්ථියං :**

අථ ඛො ආයස්මා කප්පො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා කප්පො භගවන්තං එතදවොච :

කථන්නු ඛො භන්තෙ, ජානතො කථං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහංකාරමමංකාරමානානුසයා න හොන්තීති.

යං කිඤ්චි කප්ප, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා. සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති.

එවං ඛො කප්ප, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහංකාරමමංකාරමානානුසයා න හොන්තීති.

## 1. 3. 2. 13.

### දුතිය කප්ප සුත්තං

**125. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා කප්පො භගවන්තං එතදවොච : කථන්නු ඛො භන්තෙ, ජානතො කථං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහංකාරමමංකාරමානාපගතං මානසං හොති විධා සමතික්කන්තං සන්තං සුවිමුත්තන්ති.

ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, රහත්හු විසින් කවර දහම් කෙනෙක් නුවණින් මෙනෙහි කළයුත්තාහු දැ යි. ඇවත් කොට්ඨිතයෙනි, රහත්හු විසිනුදු මේ පඤ්චෝපාදන ස්කන්ධයෝ අනිස විසින් දුක් විසින් රෝග විසින් ගඩ විසින් හුල් විසින් විපත් විසින් පෙළීම් විසින් මෙරමා විසින් වැනසුම් විසින් සිස් විසින් අනත් විසින් නුවණින් මෙනෙහි කළ යුත්තාහ. ඇවැත්නි, රහත්හට මත්තෙහි කළ යුත්තෙක් නැත. කරන ලද්ද නැවත නැවත කිරීමෙක් හෝ නැති. වැළි දු මේ දහම්හු වඩන ලද්දාහු බහුල කරන ලද්දාහු දිට්ඨදම්මයෙහි සුවවිහරණ පිණිසත් සිහිනුවණ පිණිසත් පවත්නාහ යි.

## 1. 3. 2. 12.

## පඨම කප්ප සූත්‍රය

**124. සැවැත්නුවර :**

එ කල්හි ආයුෂ්මත් කප්ප තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ යැ. එළැඹැ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ යැ. එකත්පසෙක හුන් ආයුෂ්මත් කප්ප තෙමේ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කළේ යැ:

වහන්ස, කෙසේ දන්නහුට කෙසේ දක්නහුට මේ සවිඤ්ඤාණක කයෙහිත් බැහැර සියලු නිමිත්තයන්හිත් අහඞ්කාර මමීඞ්කාර (අහඞ්කාර දෘෂ්ටිය, මාගේ යයි ගන්නා තණ්හාව හා) මානානුසයය යන කෙලෙස්හු නො වෙද්දැ යි ?

කප්පය, අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි රූපයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් රූපයෙකුත් වේ ද (ඒ) සියලු රූපය '' තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේ යයි '' තෙල මෙසේ තතු සේ මනා නුවණින් දකියි, යම් කිසි වේදනාවක් . . . යම් කිසි සංඥවක් . . . යම් කිසි සංස්කාර කෙනෙක් . . . අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ ගෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි විඥනයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් විඥනයකුත් වේ ද ඒ සියලු විඥනය '' තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි තෙල මාගේ ආත්මය නො වේ ය '' යි මෙසේ තෙල තතු සේ මනානුවණින් දකී.

කප්පය, මෙසේ දන්නහුට මෙසේ දක්නහුට මේ සවිඤ්ඤාණක කයෙහිත් බැහැර සියලු නිමිත්තයන්හිත් අහිඞ්කාර මමීඞ්කාර මානානුසයයෝ නො වෙති යි

## 1. 3. 2. 13.

## දුතිය කප්ප සූත්‍රය

**125. සැවැත්නුවර :**

එකත්පස් වැ හුන් ආයුෂ්මත් කප්ප තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, කෙසේ දන්නහුගේ කෙසේ දක්නහුගේ සිත මේ සවිඤ්ඤාණක කයෙහිත් බැහැර සියලු නිමිත්තයන්හිත් අහිඞ්කාර මමීඞ්කාර මානයෙන් පහ වූයේ මාන කොටසුත් ඉක්ම වූයේ සන්හුන් වූයේ මැනවින් මිදුණේ වේ දැ යි ?

යං කිඤ්චි කප්ප, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා. සබ්බං රූපං "නෙතං මම, නෙසොහමස්මි, න මෙ'සො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුපාදා විමුත්තො හොති. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං, අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා. සබ්බං විඤ්ඤාණං "නෙතං මම, නෙසොහමස්මි න මෙ'සො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා අනුපාදා විමුත්තො හොති.

එවං ඛො කප්ප, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහිඞ්කාරමමිඞ්කාරමානාපගතං මානසං හොති, විධා සමතික්කන්තං සන්තං සුවිමුත්තන්ති.

ධම්මකථිකවග්ගො දුතියො.

තස්සුද්දානං :

අවිජ්ජා විජ්ජා ද්වෙ කථිකා බන්ධනා පරිපුච්ඡිතා දුවෙ,
සඤ්ඤොජනං උපාදානං සීලං සුතවා ද්වෙ ච කප්පෙනාති.

කප්පය, අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි රූපයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් රූපයෙකුත් වේ ද, ඒ සියලු රූපය තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේ ය" යි මෙසේ තෙල තතු සේ මනා නුවණින් දැක උපාදාන රහිත ව මිදුණේ වෙයි. යම් කිසි වේදනාවක් . . . යම් කිසි සංඥාවක් . . . යම් කිසි සංස්කාර කෙනෙක් . . . අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි විඥානයෙක් වේ ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් විඥානයෙකුත් වේ ද, (ඒ) සියලු විඥානය "තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේ යයි මෙසේ තෙල තතු සේ මනා නුවණින් දැක උපාදාන රහිත ව මිදුණේ වෙයි.

කප්පය, මෙසේ දන්නහුගේ මෙසේ දක්නහුගේ සිත මේ සවිඤ්ඤාණක කයෙහිත් බැහැර සියලු නිමිත්තයන්හිත් අහිඞ්කාර මමිඞ්කාර මානයෙන් පහ වූයේ මානකොටසුන් ඉක්ම වූයේ සන්හුන් වූයේ මැනවින් මිදුණේ වේ ය යි.

### දෙවැනි ධම්මකථික වර්ග යි

එහි සූත්‍ර නාමාවලිය :

අවිජ්ජා විජ්ජා යන සූත්‍ර දෙක යැ, ධම්මකථික සූත්‍ර දෙක යැ, බන්ධන සූත්‍රය, පරිපුච්ඡිත සූත්‍ර දෙක යැ, සඤ්ඤෝජන උපාදාන සීල සුතවන්ත යන සූත්‍ර සතර ය කප්ප සූත්‍ර දෙක යයි සූත්‍ර තෙළෙසකි.

 www.aathaapi.org

## 3. අවිජ්ජාවග්ගො

### 1. 3. 3. 1.

### පඨම සමුදයධම්ම සුත්තං

**126. සාවත්ථියං :**

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : ''අවිජ්ජා, අවිජ්ජා''ති භන්තෙ, වුච්චති. කතමා නු ඛො භන්තෙ, අවිජ්ජා? කිත්තාවතා ච අවිජ්ජාගතො හොතීති.

ඉධ භික්ඛු, අස්සුතවා පුථුජ්ජනො සමුදයධම්මං රූපං සමුදයධම්මං රූපන්ති යථාභූතං නප්පජානාති. වයධම්මං රූපං වයධම්මං රූපන්ති යථාභූතං නප්පජානාති. සමුදයවයධම්මං රූපං සමුදයවයධම්මං රූපන්ති යථාභූතං නප්පජානාති. සමුදයධම්මං වෙදනං, 'සමුදයධම්මා වෙදනාති' යථාභූතං නප්පජානාති 'වයධම්මං වෙදනං වයධම්මා වෙදනාති' යථාභූතං නප්පජානාති. සමුදයවයධම්මං වෙදනං, සමුදයවයධම්මා වෙදනාති, යථාභූතං නප්පජානාති. සමුදයධම්මං සඤ්ඤං -පෙ- සමුදයධම්මෙ සඞ්ඛාරෙ සමුදයධම්මා, සඞ්ඛාරාති යථාභූතං නප්පජානාති. වයධම්මෙ සඞ්ඛාරෙ වයධම්මා, සඞ්ඛාරාති' යථාභූතං නප්පජානාති. සමුදයවයධම්මෙ සඞ්ඛාරෙ සමුදයවයධම්මා, සඞ්ඛාරාති, යථාභූතං නප්පජානාති සමුදයධම්මං විඤ්ඤාණං සමුදයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති. වයධම්මං විඤ්ඤාණං වයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති. සමුදයවයධම්මං විඤ්ඤාණං සමුදයවයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති. අයං වුච්චති භික්ඛු, අවිජ්ජා. එත්තාවතා ච අවිජ්ජාගතො හොතීති.

එවං වුත්තෙ සො භික්ඛු භගවන්තං එතදවොච : ''විජ්ජා විජ්ජා''ති භන්තෙ වුච්චති. කතමා නු ඛො භන්තෙ, විජ්ජා? කිත්තාවතා ච විජ්ජාගතො හොතීති?

ඉධ භික්ඛු, සුතවා අරියසාවකො සමුදයධම්මං රූපං සමුදයධම්මං රූපන්ති යථාභූතං පජානාති. වයධම්මං රූපං වයධම්මං රූපන්ති යථාභූතං පජානාති. සමුදයවයධම්මං රූපං සමුදයවයධම්මං රූපන්ති යථාභූතං පජානාති. සමුදයධම්මං වෙදනං -පෙ- සමුදයධම්මං සඤ්ඤං -පෙ- සමුදයධම්මෙ සඞ්ඛාරෙ -පෙ- සමුදයධම්මං විඤ්ඤාණං සමුදයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං පජානාති. වයධම්මං විඤ්ඤාණං, වයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං පජානාති. සමුදයවයධම්මං විඤ්ඤාණං සමුදයවයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං පජානාති. අයං වුච්චති භික්ඛු, විජ්ජා, එත්තාවතා ච විජ්ජාගතො හොතීති.



Free Distribution www.aathaapi.org

## 3. අවිජ්ජා වර්ගය

### 1. 3. 3. 1.

### පඨම සමුදය ධම්ම සූත්‍රය

**126. සැවැත්නුවර :**

එ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ යැ. එකත්පසෙක හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය : "වහන්ස, අවිද්‍යාය අවිද්‍යා යයි කියනු ලැබෙ. වහන්ස අවිද්‍යාව කවර යත් කොපමණකින් අවිද්‍යාගත (අවිද්‍යාවට ගියේ) ද වේ ද " යි.

මහණ, මෙහි අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ සමුදය (ඉපදීම) ස්වභාව ඇති රූපය සමුදය ස්වභාව ඇති රූපයකැ යි තතු සේ නො දනියි, ව්‍යය (වැනසීම) ස්වභාව ඇති රූපය ව්‍යය ස්වභාව ඇති රූපයකැ යි තතු සේ නො දනියි, " සමුදයව්‍යය ස්වභාව ඇති රූපය සමුදයව්‍යය ස්වභාව ඇති රූපයකැ යි තතු සේ නො දනියි, සමුදය සැහැවි වේදනාව සමුදය සැහැවි වේදනාවකැ යි තතුසේ ගේ නො දනියි, වැනසෙනසුලු වේදනාව වැනසෙනසුලු වේදනාවකැ යි තතුසේ නො දනියි. සමුදයව්‍යය ස්වභාව ඇති වේදනාව සමුදයව්‍යය ස්වභාව ඇති වේදනාවකැයි තතු සේ නො දනියි, හටගන්නා ස්වභාව ඇති සංඥව . . . හටගන්නා ස්වභාව ඇති සංස්කාර හටගන්නා ස්වභාව ඇති සංස්කාර යයි තතුසේ නො දනියි, වැනසෙන ස්වභාව ඇති සංස්කාර වැනසෙන ස්වභාව ඇති සංස්කාර ය යි තතු සේ නො දනියි, සමුදයව්‍යය ස්වභාව ඇති සංස්කාර සමුදයව්‍යය ස්වභාව ඇති සංස්කාර යයි තතු සේ නො දනියි, හටගන්නා ස්වභාව ඇති විඥනය හටගන්නා ස්වභාව ඇති විඥන යයි තතුසේ නො දනියි, වැනසෙන ස්වභාව ඇති විඥනය වැනසෙන ස්වභාව ඇති විඥන යයි තතුසේ නො දනියි, සමුදයව්‍යය ස්වභාව ඇති විඥනය සමුදය ව්‍යය ස්වභාව ඇති විඥන යයි තතුසේ නො දනී. මහණ, මේ අවිද්‍යා යයි කියනු ලැබේ. මෙ පමණකින් අවිද්‍යාගත ද වේ යි.

මෙසේ වදළ කල්හි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ යැ : "වහන්ස, විද්‍යා යැ විද්‍යා යයි කියනු ලැබේ. වහන්ස, විද්‍යාව නම් කවර යැ ? කොපමණෙකින් විද්‍යාගත වේ ද"යි ?

මහණ, මෙහි ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ හටගන්නා සැහැවි රූපය හටගන්නා සැහැවි රූප යයි තතුසේ දනී, වැනසෙන සැහැවි රූපය වැනසෙන සැහැවි රූප යයි තතුසේ දනියි, හටගන්නා–වැනසෙන සැහැවි රූපය හටගන්නා–වැනසෙන සැහැවි රූප යයි තතුසේ දනියි, හටගන්නා හැසැවි වේදනාව . . . හටගන්නා සැහැවි සංඥව . . . හටගන්නා සැහැවි සංස්කාර . . . හටගන්නා සැහැවි විඥනය හටගන්නා සැහැවි විඥන යයි තතු සේ දනියි. වැනසෙන සැහැවි විඥනය වැනසෙන සැහැවි විඥන යයි තතුසේ දනියි, හටගන්නා–වැනසෙන සැහැවි විඥනය හටගන්නා වැනසෙන සැහැවි විඥන ය යි තතුසේ දනී. මහණ, මේ විද්‍යාව යයි කියනු ලැබේ මෙපමණෙකින් විද්‍යා ගතත් වේ යයි.



Free Distribution www.aathaapi.org

## 1. 3. 3. 2.

## දුතිය සමුදයධම්ම සුත්තං

**127. බාරාණසියං :**

එකං සමයං ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාකොට්ඨිතො බාරාණසියං විහරන්ති ඉසිපතනෙ මිගදායෙ. අථ ඛො ආයස්මා මහාකොට්ඨිතො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා සාරිපුත්තෙන සද්ධිං සම්මෝදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච : "අවිජ්ජා අවිජ්ජා"ති ආවුසො සාරිපුත්ත, වුච්චති. කතමා නු ඛො ආවුසො, අවිජ්ජා? කිත්තාවතා ච අවිජ්ජාගතො හොතී"ති ?

ඉධාවුසො අස්සුතවා පුථුජ්ජනො සමුදයධම්මං රූපං, සමුදයධම්මං රූපන්ති යථාභූතං නප්පජානාති. වයධම්මං රූපං -පෙ- සමුදයවයධම්මං රූපං සමුදයවයධම්මං රූපන්ති යථාභූතං නප්පජානාති. "සමුදයධම්මං වෙදනං -පෙ- සමුදයධම්මං සඤ්ඤං -පෙ- සමුදය- ධම්මෙ සඞ්ඛාරෙ -පෙ- සමුදයධම්මං විඤ්ඤාණං සමුදයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති. වයධම්මං විඤ්ඤාණං -පෙ- සමුදයවයධම්මං විඤ්ඤාණං සමුදයවයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං නප්පජානාති. අයං වුච්චතාවුසො අවිජ්ජා, එත්තාවතා ච අවිජ්ජාගතො හොතීති.

## 1. 3. 3. 3.

## තතිය සමුදයධම්ම සුත්තං

**128. බාරාණසියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච : "විජ්ජා විජ්ජා"ති ඛො ආවුසො සාරිපුත්ත වුච්චති. කතමා නු ඛො ආවුසො විජ්ජා ? කිත්තාවතා ච විජ්ජාගතො හොතීති ?

ඉධාවුසො සුතවා අරියසාවකො සමුදයධම්මං රූපං සමුදයධම්මං රූපන්ති යථාභූතං පජානාති. වයධම්මං රූපං -පෙ- සමුදයවයධම්මං රූපං සමුදයවයධම්මං රූපන්ති යථාභූතං පජානාති. සමුදයධම්මං වෙදනං -පෙ- සමුදයධම්මං සඤ්ඤං -පෙ- සමුදයධම්මෙ සඞ්ඛාරෙ -පෙ- සමුදයධම්මං විඤ්ඤාණං සමුදයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං පජානාති. වයධම්මං විඤ්ඤාණං -පෙ- සමුදයවයධම්මං විඤ්ඤාණං සමුදයවයධම්මං විඤ්ඤාණන්ති යථාභූතං පජානාති. අයං වුච්චතාවුසො විජ්ජා, එත්තාවතා ච විජ්ජාගතො හොතී"ති.

## 1. 3. 3. 2.

## දුතිය සමුදය ධම්ම සූත්‍රය

**127.** සැවැත්නුවර :

එක් කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ද ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ද බරණැස සමීපයෙහි මිගදය නම් වූ ඉසිපතනාරාමයෙහි වැඩවෙසෙති. එ කල්හි ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ සවස්කල විවේකයෙන් නැඟී සිටියාහු ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළැඹියහ. එළැඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් සමඟ සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට : තෙල කීහ : ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, අවිද්‍යා අවිද්‍යා යි කියනු ලැබේ ඇවැත්නි, අවිද්‍යා නම් කවර යැ ? කොපමණෙකින් අවිද්‍යාගතත් වේ දැ''යි ? මෙය කීහ.

ඇවැත්නි, මෙහි අශ්‍රැතවත් පෘථග්ජන උපදනා ස්වභාව ඇති රූපය උපදනා ස්වභාව ඇති රූපය යි තතුසේ නො දනියි, වැනසෙන ස්වභාව ඇති රූපය . . . හටගන්නා–වැනසෙන ස්වභාව ඇති රූපය හටගන්නා–වැනසෙන ස්වභාව ඇති රූප යයි තතුසේ නො දනියි. හටගන්නාසුලු වේදනාව . . . හටගන්නාසුලු සංඥව . . . හටගන්නාසුලු, සංස්කාර . . . හටගන්නාසුලු විඥනය හටගන්නාසුලු විඥන යයි තතුසේ නො දනියි. වැන සෙනසුලු විඥනය . . . හටගන්නා–වැනසෙනසුලු විඥනයයි තතු සේ නො දනී. ඇවැත්නි, මේ අවිද්‍යා යයි කියනු ලැබේ මෙතෙකින් අවිද්‍යාගතත් වේ ය යි.

## 1. 3. 3. 3.

## තතිය සමුදය ධම්ම සූත්‍රය

**128.** බරණැස්නුවර :

එකත්පස් ව හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට තෙල කීහ : ''ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, විජ්ජා විජ්ජා යි කියනු ලැබේ. ඇවැත්නි විජ්ජා නම් කවර යැ ? කොපමණෙකින් විජ්ජාගතත් වේ දැ''යි ?

ඇවැත්නි, මෙ සස්නෙහි ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක හටගන්නාසුලු රූපය හටගන්නාසුලු රූප යයි තතු සේ දනියි, වැනසෙනසුලු රූපය . . . හටගන්නා–වැනසෙනසුලු රූපය හටගන්නා–වැනසෙනසුලු රූප යයි තතුසේ දනී. හටගන්නාසුලු වේදනාව . . . හටගන්නාසුලු සංඥව . . . හටගන්නාසුලු සංස්කාර . . . හටගන්නාසුලු විඥනය හටගන්නාසුලු විඥන ය යි තතුසේ දනී වැනසෙනසුලු විඥනය . . . හටගන්නා–වැනසෙනසුලු විඥනය හටගන්නා–වැනසෙනසුලු විඥන ය යි තතුසේ දනී. ඇවැත්නි, මේ විජ්ජා යි කියනු ලැබෙයි, මෙපමණෙකින් විජ්ජාගතත් වේ යයි.

22—ඒ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

## 1. 3. 3. 4.

### පඨම අස්සාද සුත්තං

**129. බාරාණසියං:**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: අවිජ්ජා අවිජ්ජා''ති ආවුසො සාරිපුත්ත, වුච්චති. කතමා නු ඛො ආවුසො අවිජ්ජා? කිත්තාවතා ච අවිජ්ජාගතො හොතීති?

ඉධාවුසො අස්සුතවා පුථුජ්ජනො රූපස්ස අස්සාදඤ්ච, ආදීනවඤ්ච, නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස අස්සාදඤ්ච, ආදීනවඤ්ච, නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. අයං වුච්චතාවුසො අවිජ්ජා, එත්තාවතා ච අවිජ්ජාගතො හොතීති.

## 1. 3. 3. 5.

### දුතිය අස්සාද සුත්තං

**130. බාරාණසියං:**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: ''විජ්ජා විජ්ජා''ති ආවුසො සාරිපුත්ත, වුච්චති. කතමා නු ඛො ආවුසො, විජ්ජා? කිත්තාවතා ච විජ්ජාගතො හොතීති?

ඉධාවුසො, සුතවා අරියසාවකො රූපස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති, අයං වුච්චතාවුසො විජ්ජා, එත්තාවතා ච විජ්ජාගතො හොතීති.

## 1. 3. 3. 6.

### පඨම සමුදය සුත්තං

**131. බාරාණසියං:**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: ''අවිජ්ජා අවිජ්ජා''ති ආවුසො සාරිපුත්ත, වුච්චති. කතමා නු ඛො ආවුසො අවිජ්ජා? කිත්තාවතා ච අවිජ්ජාගතො හොතීති''?

ඉධාවුසො, අස්සුතවා පුථුජ්ජනො රූපස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. අයං වුච්චතාවුසො, අවිජ්ජා, එත්තාවතා ච අවිජ්ජාගතො හොතීති.

Free Distribution www.aathaapi.org

## 1. 3. 3. 4.

## පඨම අස්සාද සූත්‍රය

**129.** බරණැස්නුවර :

එකත්පස් ව හුන්, ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීහ : ''ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, අවිජ්ජා අවිජ්ජා ය යි කියනු ලැබේ. ඇවැත්නි, අවිජ්ජා නම් කවර යැ ? කොපමණෙකින් අවිජ්ජා ගතත් වේ දැ''යි ?

ඇවැත්නි, මෙහි අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ රූපයාගේ ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ නො දනියි. වෙදනාවේ . . . සංඥාවේ . . . සංස්කාරයන් ගේ . . . විඥානයේ ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ නො දනී. ඇවැත්නි, මේ අවිජ්ජා යි කියනු ලැබේ. මෙපමණෙකින් අවිජ්ජාගතත් වේ ය යි.

## 1. 3. 3. 5.

## දුතිය අස්සාද සූත්‍රය

**130.** බරණැස්නුවර :

එකත්පසෙක හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීහ : ''ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, විජ්ජා විජ්ජා යි කියනු ලැබෙයි, ඇවැත්නි, විජ්ජා නම් කවරක් ද ? කොපමණෙකින් විජ්ජාගතත් වේ දැ''යි

ඇවැත්නි, මේ සස්නෙහි ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපයාගේ ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ දනියි, වෙදනාවේ . . . සංඥාවේ . . . සංස්කාරයන්ගේ . . . විඥානයාගේ ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ දනී. ඇවැත්නි, මේ විජ්ජායි කියනු ලැබේ. මෙපමණෙකින් විජ්ජාගතත් වේ යයි.

## 1. 3. 3. 6.

## පඨම සමුදය සූත්‍රය

131. බරණැස්නුවර :

එකත්පසෙක හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීහ : ''ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, අවිජ්ජා අවිජ්ජා යි කියනු ලැබෙයි, ඇවැත්නි, අවිජ්ජා නම් කවර යැ ? කොපමණෙකින් අවිජ්ජාගතත් වේ දැ''යි ?

ඇවැත්නි, මෙහි අශ්‍රැතවත් පෘථග්ජන රූපයාගේ සමුදයයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ නො දනියි, වෙදනාවේ . . . සංඥාවේ . . . සංස්කාරයන්ගේ . . . විඥානයාගේ සමුදයයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ නො දනී. ඇවැත්නි මේ අවිජ්ජා යි කියනු ලැබේ. මෙ පමණෙකින් අවිජ්ජාගතත් වේ යයි.

## 1. 3. 3. 7.

### දුතිය සමුදය සුත්තං

**132. බාරාණසියං:**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා මහාකොට්ඨිතො ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: "විජ්ජා විජ්ජා"ති ආවුසො සාරිපුත්ත වුච්චති. කතමා නු ඛො ආවුසො විජ්ජා? කිත්තවතා ච විජ්ජාගතො හොතීති?

"ඉධාවුසො සුතවා අරියසාවකො රූපස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. අයං වුච්චතාවුසො විජ්ජා, එත්තාවතා ච විජ්ජාගතො හොතීති.

## 1. 3. 3. 8.

### කොට්ඨිත සුත්තං

**133. බාරාණසියං:**

එකං සමයං ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාකොට්ඨිතො බාරාණසියං විහරන්ති ඉසිපතනෙ මිගදායෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා මහාකොට්ඨිතො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා මහාකොට්ඨිතෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාකොට්ඨිතං එතදවොච: "අවිජ්ජා අවිජ්ජා"ති, ආවුසො කොට්ඨිත, වුච්චති කතමා නු ඛො ආවුසො අවිජ්ජා? කිත්තාවතා ච අවිජ්ජාගතො හොතීති?

ඉධාවුසො, අස්සුතවා පුථුජ්ජනො රූපස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. අයං වුච්චතාවුසො අවිජ්ජා, එත්තාවතා ච අවිජ්ජාගතො හොතීති.

එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාකොට්ඨිතං එතදවොච: විජ්ජා විජ්ජාති ආවුසො කොට්ඨිත, වුච්චති කතමා නු ඛො ආවුසො විජ්ජා? කිත්තාවතා ච විජ්ජාගතො හොතීති?

ඉධාවුසො සුතවා අරියසාවකො රූපස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. අයං වුච්චතාවුසො විජ්ජා, එත්තාවතා ච විජ්ජාගතො හොතීති."

Free Distribution www.aathaapi.org

## 1. 3. 3. 7.

## දුතිය සමුදය සූත්‍රය

132. බරණැස්නුවර:

එකත්පස් ව හුන් ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීහ: ඇවැත්නි ශාරිපුත්‍රයෙනි, විද්‍යා විද්‍යා යි කියනු ලැබේ. ඇවැත්නි, විද්‍යාව නම් කවර යැ ? කොපමණෙකින් විද්‍යායුක්තත් වේ ද ? යි.

ඇවැත්නි, මෙහි ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපයාගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දනී. වෙදනාවගේ . . . සංඥවගේ . . . සංස්කාරයන්ගේ . . . විඥනයාගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ දනී. ඇවැත්නි, මේ විද්‍යාව යයි කියනු ලැබේ. මෙ තෙකින් විද්‍යායුක්තත් වේ ය යි.

## 1. 3. 3. 8.

## කොට්ඨිත සූත්‍රය

එක්සමයෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ද ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවෝ ද බරණැය සමීපයෙහි මිගදය නම් වූ ඉසිපතනාරාමයෙහි වැඩවෙසෙත්. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස්කල පලසමවතින් නැගී සිටියාහු ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන් කරා එළැඹියහ. එළැඹැ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන් සමඟ සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙකැ හුන්හ. එකත්පසෙකැ හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන්ට මෙල කීහ: ''ඇවැත්නි, කොට්ඨිතයෙනි, අවිද්‍යා අවිද්‍යා යි කියනු ලැබේ. ඇවැත්නි, අවිද්‍යාව නම් කවර යැ ? කොපමණෙකින් අවිද්‍යාගතත් වේ ද''යි ?

ඇවැත්නි මේ සස්නෙහි අශ්‍රැතවත් පෘථග්ජන රූපයේ ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනියි. වේදනාවගේ . . . සංඥවගේ . . . සංස්කාරයන්ගේ . . . විඥනයාගේ ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනී. ඇවැත්නි මේ අවිද්‍යා යි කියනු ලැබේ, මෙපමණෙකින් අවිද්‍යාගතත් වේ යයි.

මෙසේ පැවසූ කල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන්ට තෙල කීහ: ''ඇවැත්නි කොට්ඨිතයෙනි, විද්‍යා විද්‍යා යි කියනු ලැබේ. ඇවැත්නි, විද්‍යා නම් කවරක් ද ? කොපමණෙකින් විද්‍යාගතත් වේ ද''යි ?

ඇවැත්නි, මෙ සස්නෙහි ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපයේ ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ දනියි, වේදනායෙහි . . . සංඥයෙහි . . . සංස්කාරයන්හි . . . විඥනයේ ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දනී. ඇවැත්නි, මේ විද්‍යා යි කියනු ලැබේ. මෙ පමණෙකින් විද්‍යාගතත් වේ ය යි.

## 1. 3. 3. 9.

### දුතිය කොට්ඨිත සුත්තං

**134.** බාරාණසියං:

එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාකොට්ඨිතං එතදවොච: "අවිජ්ජා, අවිජ්ජා"ති ආවුසො කොට්ඨිත වුච්චති කතමා නු ඛො ආවුසො අවිජ්ජා? කිත්තාවතා ච අවිජ්ජාගතො හොතීති?

ඉධාවුසො අස්සුතවා පුථුජ්ජනො රූපස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානාති. අයං වුච්චතාවුසො අවිජ්ජා එත්තාවතා ච අවිජ්ජාගතො හොතීති.

එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාකොට්ඨිතං එතදවොච: 'විජ්ජා, විජ්ජා'ති ආවුසො කොට්ඨිත වුච්චති කතමා නු ඛො ආවුසො විජ්ජා කිත්තාවතා ච විජ්ජාගතො හොතී'ති.

ඉධාවුසො සුතවා අරියසාවකො රූපස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. අයං වුච්චතාවුසො විජ්ජා, එත්තාවතා ච විජ්ජාගතො හොතීති.

## 1. 3. 3. 10.

### තතිය කොට්ඨිත සුත්තං

**135.** බාරාණසියං:

එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාකොට්ඨිතං එතදවොච: "අවිජ්ජා, අවිජ්ජා"ති ඛො ආවුසො, කොට්ඨිත වුච්චති. කතමා නු ඛො ආවුසො අවිජ්ජා? කිත්තාවතා, ච අවිජ්ජාගතො හොතීති?

ඉධාවුසො අස්සුතවා පුථුජ්ජනො රූපං නප්පජානාති රූපසමුදයං නප්පජානාති. රූපනිරොධං නප්පජානාති. රූපනිරොධගාමිනිං පටිපදං නප්පජානාති.

වෙදනං නප්පජානාති -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං නප්පජානාති. විඤ්ඤාණසමුදයං නප්පජානාති. විඤ්ඤාණනිරොධං නප්පජානාති. විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං නප්පජානාති. අයං වුච්චතාවුසො අවිජ්ජා එත්තාවතා ච අවිජ්ජාගතො හොතීති.

Free Distribution www.aathaapi.org

## 1. 3. 3. 9.

## දුතිය කොට්ඨිත සූත්‍රය

**134. බරණැස්නුවර:**

එකත්පසෙකැ හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන්ට මෙසේ කීහ: "ඇවැත්නි, කොට්ඨිතයෙනි, අවිද්‍යා අවිද්‍යා යි කියනු ලැබෙයි, ඇවැත්නි, අවිද්‍යා නම් කවරක් යැ කොපමණෙකින් අවිද්‍යාගතත් වේ දැ"යි ?

ඇවැත්නි, මෙ සස්නෙහි අශ්‍රැතවත් පෘථජන රූපයේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ නො දනියි. වේදනාවෙහි . . . සංඥාවෙහි . . . සංස්කාරයන්හි . . . විඥනයෙ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනී. මේ අවිද්‍යාව යයි කියනු ලැබේ. මෙපමණෙකින් අවිද්‍යාගතත් වේ යයි".

මෙසේ පැවසූ කල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහාකොට්ඨිත, තෙරණුවන්ට මෙසේ කීහ: "ඇවැත් කොට්ඨිතයෙනි, විද්‍යා විද්‍යා යි කියනු ලැබේ. ඇවැත්නි, විද්‍යා නම් කුමක් ද ? කොපමණෙකින් විද්‍යාගතත් වේ දැ"යි ?

ඇවැත්නි, මෙහි ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ රූපයෙහි සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දනියි වේදනාවෙහි . . . සංඥාවෙහි . . . සංස්කාරයන්හි . . . විඥනයෙහි සමුදයයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දනී. ඇවැත්නි, මේ විද්‍යා"යි කියනු ලැබේ. මෙ පමණෙකින් විද්‍යාගතත් වේ ය"යි.

## 1. 3. 3. 10.

## තතිය කොට්ඨිත සූත්‍රය

**135. බරණැස්නුවර:**

එකත්පස් වැ හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන්ට මෙසේ කීහ: ඇවත්නි, කොට්ඨිතයෙනි, අවිද්‍යා අවිද්‍යා යයි කියනු ලැබේ. ඇවැත්නි, අවිද්‍යා නම් කවර යැ, කොපමණකින් අවිද්‍යාගතත් වේ ද ? " යි.

ඇවැත්නි, මෙහි අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ රූපය නො දනියි. රූපසමුදය නො දනියි. රූපනිරොධය නො දනියි. රූපනිරොධගාමිනී පටිපදව නො දනී.

වේදනාව නො දනියි . . . සංඥාව . . . සංස්කාර . . . විඥනය නො දනියි, විඥනසමුදය නො දනියි විඥනනිරෝධය නො දනියි, විඥනනිරෝධගාමිනී පටිපදව නො දනී. ඇවැත්නි, මේ අවිද්‍යා යි කියනු ලැබේ. මෙ පමණෙකින් අවිද්‍යාගතත් වේ ය"යි

එවං වුත්තෙ ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං මහාකොට්ඨිතං එතදවොච: "විජ්ජා විජ්ජා"ති ආවුසො කොට්ඨිත වුච්චති. කතමා නු ඛො ආවුසො විජ්ජා? කිත්තාවතා ච විජ්ජාගතො හොතීති?

ඉධාවුසො සුතවා අරියසාවකො රූපං පජානාති. රූපසමුදයං පජානාති. රූපනිරොධං පජානාති. රූපනිරොධගාමිනිං පටිපදං පජානාති. වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං පජානාති විඤ්ඤාණසමුදයං පජානාති විඤ්ඤාණනිරොධං පජානාති විඤ්ඤාණනිරොධගාමිනිං පටිපදං පජානාති. අයං වුච්චතාවුසො විජ්ජා, එත්තාවතා ච විජ්ජාගතො හොතීති.

අවිජ්ජාවග්ගො තතියො.

තස්සුද්දානං:

සමුදයධම්මෙන තීණි අස්සාදා අපරෙ දුවෙ
සමුදයෙන ද්වෙ වුත්තා කොට්ඨිතෙන පරෙ තයොති.

මෙසේ පැවසූ කල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් මහාකොට්ඨිත තෙරණුවන්ට මෙසේ කීහ : ඇවැත්නි, කොට්ඨිතයෙනි, විද්‍යා විද්‍යා යි කියනු ලැබෙයි, ඇවැත්නි, විද්‍යා නම් කුමක් ද ? කොපමණෙකින් විද්‍යාගතත් වේ ද''යි ?

ඇවැත්නි, මෙ සස්නෙහි ආර්යශ්‍රාවක රූපය දනියි, රූපසමුදයය දනියි, රූපනිරෝධය දනියි, රූපනිරෝධගාමිනීපටිපදාව දනී. වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය දනියි, විඥානසමුදයය දනියි, විඥානනිරෝධය දනියි, විඥාන නිරෝධගාමිනීපටිපදාව දනී. ඇවැත්නි, මේ විද්‍යා යි කියනු ලැබේ. මෙපමණෙකින් විද්‍යාගතත් වේ යයි.

**තෙවැනි අවිද්‍යා වර්ග යි**

**එහි උද්දානය :**

සමුදය ධම්ම සූත්‍ර තුන යෑ, අනෙක් අස්සාද සූත්‍ර දෙක යෑ, සමුදය සූත්‍ර දෙක යෑ අනෙක් කොට්ඨිත සූත්‍ර තුන යයි සූත්‍ර දසයෙකි.

## 4. කුක්කුළවග්ගො

### 1. 3. 4. 1.

### කුක්කුළ සුත්තං

**186. සාවත්ථියං :**

රූපං භික්ඛවෙ කුක්කුළං, වෙදනා කුක්කුළා, සඤ්ඤා කුක්කුළා, සඞ්ඛාරා කුක්කුළා, විඤ්ඤාණං කුක්කුළං. එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපස්මිං නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 1. 2. 4. 2.

### පඨම අනිච්ච සුත්තං

**187. සාවත්ථියං :**

යං හි භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො ඡන්දො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ අනිච්චං :

රූපං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො ඡන්දො පහාතබ්බො. වෙදනා අනිච්චා -පෙ- සඤ්ඤා අනිච්චා -පෙ- සඞ්ඛාරා අනිච්චා -පෙ- විඤ්ඤාණං අනිච්චං, තත්‍ර වො ඡන්දො පහාතබ්බො. යං හි භික්ඛවෙ අනිච්චං තත්‍ර වො ඡන්දො පහාතබ්බොති.

### 1. 3. 4. 3.

### දුතිය අනිච්ච සුත්තං

**188. සාවත්ථියං :**

යං හි භික්ඛවෙ අනිච්චං තත්‍ර වො රාගො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ අනිච්චං :

රූපං භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො රාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චං, තත්‍ර වො රාගො පහාතබ්බො. යං හි භික්ඛවෙ අනිච්චං, තත්‍ර වො රාගො පහාතබ්බොති.



Free Distribution www.aathaapi.org

## 4. කුක්කුළ වර්ගය

### 1. 3. 4. 1.

### කුක්කුළ සූත්‍රය

**136. සැවැත්නුවර :**

මහණෙනි රූපය ඇවිළගත් උණු අළු රැසක් වැන්න. වේදනාව ඇවිළගත් උණු අළු රැසක් වැන්න. සංඥව ඇවිළගත් උණු අළු රැසක් වැන්න. සංස්කාරයෝ ඇවිළගත් උණු අළු රැසක් වැන්න. විඥනය ඇවිළගත් උණු අළු රැසක් වැන්න. මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපයෙහි කලකිරෙයි වේදනායෙහිත් කලකිරෙයි, සංඥයෙහිත් කලකිරෙයි, සංස්කාරයන්හිත් කලකිරෙයි, විඥනයෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි . . . මේ බැව් පිණිස අන් කියෙක් නැතැ යි දනගනී යි.

### 1. 3. 4. 2.

### පඨම අනිච්ච සූත්‍රය

**137. සැවැත්නුවර :**

මහණෙනි, යමෙක් අනිත්‍ය ද එහි ලා තොප විසින් ඡන්දය (දුබලරාගය) පහකළ යුත්තේ යැ. මහණෙනි, කුමක් අනිත්‍ය ද යත් :

මහණෙනි, රූපය අනිත්‍ය යැ. එහිලා තොප විසින් ඡන්දය පහ කළයුත්තේ යැ. වේදනාව අනිත්‍ය යැ . . . සංඥව අනිත්‍ය යැ. . . . සංස්කාරයෝ අනිත්‍යයහ . . . . විඥනය අනිත්‍ය යැ, එහිලා තොප විසින් ඡන්දය පහ කළයුත්තේ ය. මහණෙනි, යමෙක් අනිත්‍ය ද එහි ලා තොප විසින් ඡන්දය පහ කළයුත්තේ යි.

### 1. 3. 4. 3.

### දුතිය අනිච්ච සූත්‍රය

**138. සැවැත්නුවර :**

මහණෙනි, යමෙක් අනිත්‍ය නම් එහි ලා තොප විසින් රාගය (බලවත් රාගය) පහකළ යුත්තේ යැ. මහණෙනි, කුමක් අනිත්‍ය ද යත් :

මහණෙනි, රූපය අනිත්‍ය යැ. එහිලා තොප විසින් රාගය පහ කළයුත්තේ යැ. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය අනිත්‍ය යැ. එහි ලා තොප විසින් රාගය පහ කළයුත්තේ යැ. මහණෙනි, යමක් අනිත්‍ය ද එහි ලා තොප විසින් රාගය පහ කළයුත්තේ යි.



Free Distribution www.aathaapi.org

## 1. 3. 4. 4.

### තතිය අනිච්ච සුත්තං

139. සාවත්ථියං :

යං හි භික්ඛවෙ, අනිච්චං, තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ, අනිච්චං :

රූපං භික්ඛවෙ, අනිච්චං. තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චං. තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. යං හි භික්ඛවෙ, අනිච්චං, තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බොති."

## 1. 3. 4. 5.

### පඨම දුක්ඛ සුත්තං

140. සාවත්ථියං :

යං හි භික්ඛවෙ, දුක්ඛං, තත්‍ර වො ඡන්දො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ, දුක්ඛං :

රූපං භික්ඛවෙ, දුක්ඛං. තත්‍ර වො ඡන්දො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං දුක්ඛං. තත්‍ර වො ඡන්දො පහාතබ්බො. යං හි භික්ඛවෙ, දුක්ඛං, තත්‍ර වො ඡන්දො පහාතබ්බොති.

## 1. 3. 4. 6.

### දුතිය දුක්ඛ සුත්තං

141. සාවත්ථියං :

යං හි භික්ඛවෙ, දුක්ඛං තත්‍ර වො රාගො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ, දුක්ඛං :

රූපං භික්ඛවෙ, දුක්ඛං තත්‍ර වො රාගො පහාතබ්බො. වෙදනා සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං දුක්ඛං, තත්‍ර වො රාගො පහාතබ්බො. යං හි භික්ඛවෙ, දුක්ඛං තත්‍ර වො රාගො පහාතබ්බොති.

## 1. 3. 4. 7.

### තතිය දුක්ඛ සුත්තං

142. සාවත්ථියං :

යං හි භික්ඛවෙ, දුක්ඛං තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. කිඤ්ච භික්ඛවෙ, දුක්ඛං :

රූපං භික්ඛවෙ, දුක්ඛං තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං දුක්ඛං, තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. යං හි භික්ඛවෙ, දුක්ඛං, තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බොති.

## 1. 3. 4. 4.

## තතිය අනිච්ච සූත්‍රය

139. සැවැත්නුවර :

මහණෙනි, යමෙක් අනිත්‍ය නම් එහි ලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ ය. මහණෙනි, කුමක් අනිත්‍ය ද යත් :

මහණෙනි, රූපය අනිත්‍ය යැ. එහි ලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ යැ. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය අනිත්‍ය යැ. එහි ලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ යැ. මහණෙනි, යමෙක් අනිත්‍ය නම් එහි ලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ යි.

## 1. 3. 4. 5.

## පඨම දුක්ඛ සූත්‍රය

140. සැවැත්නුවර :

මහණෙනි, යමෙක් දුක් නම් එහිලා තොප විසින් ඡන්දය පහ කටයුත්තේ යැ. මහණෙනි, කුමක් දුක් ද යත් :

මහණෙනි, රූපය දුක් යැ. එහි ලා තොප විසින් ඡන්දය පහ කටයුත්තේ යැ. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය දුක් යැ. එහි ලා තොප විසින් ඡන්දය පහ කටයුත්තේ යැ. මහණෙනි, යමෙක් දුක් නම් එහිලා තොප විසින් ඡන්දය පහ කටයුත්තේ යි.

## 1. 3. 4. 6.

## දුතිය දුක්ඛ සූත්‍රය

141. සැවැත්නුවර :

මහණෙනි, යමෙක් දුක් නම් එහි ලා තොප විසින් රාගය පහ කටයුත්තේ යැ. මහණෙනි, කුමක් දුක් ද යත් :

මහණෙනි, රූපය දුක් යැ. එහි ලා තොප විසින් රාගය පහ කටයුත්තේ යැ. වේදනාව . . . සංඥව . . . සංස්කාරයෝ . . . විඥනය දුක් ය. එහි ලා තොප විසින් රාගය පහ කටයුත්තේ යැ. මහණෙනි, යමෙක් දුක් නම් එහි ලා තොප විසින් රාගය පහ කටයුත්තේ යි.

## 1. 3. 4. 7.

## තතිය දුක්ඛ සූත්‍රය

142. සැවැත්නුවර :

මහණෙනි, යමෙක් දුක් නම් එහි ලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ යැ. මහණෙනි, කුමක් දුක් ද යත් :

මහණෙනි, රූපය දුක් යැ. එහි ලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ යැ. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය දුක් යැ. එහි ලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ යැ. මහණෙනි, යමෙක් දුක් නම් එහි ලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ යි.

## 1. 3. 4. 8.

### අනත්ත සුත්තං

143. සාවත්ථියං :

යො හි භික්ඛවෙ, අනත්තා තත්‍ර වො ඡන්දො පහාතබ්බො. කො ච භික්ඛවෙ, අනත්තා :

රූපං භික්ඛවෙ, අනත්තා තත්‍ර වො ඡන්දො පහාතබ්බො. වේදනා අනත්තා -පෙ- සඤ්ඤා අනත්තා -පෙ- සඞ්ඛාරා අනත්තා -පෙ- විඤ්ඤාණං අනත්තා. තත්‍ර වො ඡන්දො පහාතබ්බො. යො හි භික්ඛවෙ, අනත්තා තත්‍ර වො ඡන්දො පහාතබ්බොති.

## 1. 3. 4. 9.

### දුතිය අනත්ත සුත්තං

144. සාවත්ථියං :

යො හි භික්ඛවෙ, අනත්තා තත්‍ර වො රාගො පහාතබ්බො. කො ච භික්ඛවෙ, අනත්තා :

රූපං භික්ඛවෙ, අනත්තා තත්‍ර වො රාගො පහාතබ්බො. වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනත්තා තත්‍ර වො රාගො පහාතබ්බො. යො හි භික්ඛවෙ, අනත්තා තත්‍ර වො රාගො පහාතබ්බොති.

## 1. 3. 4. 10.

### තතිය අනත්ත සුත්තං

145. සාවත්ථියං :

යො හි භික්ඛවෙ, අනත්තා තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. කො ච භික්ඛවෙ, අනත්තා :

රූපං භික්ඛවෙ, අනත්තා තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. වේදනා අනත්තා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනත්තා. තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බො. යො හි භික්ඛවෙ, අනත්තා තත්‍ර වො ඡන්දරාගො පහාතබ්බොති.

## 1. 3. 4. 8.
## පඨම අනත්ත සූත්‍රය

143. සැවැත්නුවර :

මහණෙනි, යමෙක් අනාත්ම නම් එහි ලා තොප විසින් ඡන්දය පහ කළයුත්තේ ය. මහණෙනි, කුමක් අනාත්ම ද යත් :

මහණෙනි, රූපය අනාත්ම යැ, එහි ලා තොප විසින් ඡන්දය පහ කළයුත්තේ යැ.

වේදනාව අනාත්ම යැ. . . . සංඥාව අනාත්ම යැ . . . සංස්කාර අනාත්ම යැ . . . විඥානය අනාත්ම යැ. එහි ලා තොප විසින් ඡන්දය පහ කළ යුත්තේ යැ. මහණෙනි, යමෙක් අනාත්ම නම් එහි ලා තොප විසින් ඡන්දය පහ කළයුත්තේ යි.

## 1. 3. 4. 9.
## දුතිය අනත්ත සූත්‍රය

144. සැවැත්නුවර :

මහණෙනි, යමෙක් අනාත්ම නම් එහි ලා තොප විසින් රාගය පහ කළයුත්තේ යැ. මහණෙනි, කුමක් අනාත්ම ද යත් :

මහණෙනි, රූපය අනාත්ම යැ. එහි ලා තොප විසින් රාගය පහ කළයුත්තේ යැ. වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය අනාත්ම යැ. එහි ලා තොප විසින් රාගය පහ කළයුත්තේ යැ. මහණෙනි, යමෙක් අනාත්ම නම් එහි ලා තොප විසින් රාගය පහ කළයුත්තේ යි.

## 1. 3. 4. 10.
## තතිය අනත්ත සූත්‍රය

145. සැවැත්නුවර :

මහණෙනි, යමෙක් අනාත්ම නම් එහි ලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ යැ. මහණෙනි, කුමක් අනාත්ම ද යත් :

මහණෙනි, රූපය අනාත්ම යැ. එහි ලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ යැ. වේදනාව අනාත්ම යැ . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය අනාත්ම යැ. එහිලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ යැ. මහණෙනි, යමෙක් අනාත්ම නම් එහි ලා තොප විසින් ඡන්දරාගය පහ කළයුත්තේ යි.

## 1. 3. 4. 11.

## නිබ්බිදාබහුල සුත්තං

**146. සාවත්ථියං:**

සද්ධාපබ්බජිතස්ස භික්ඛවෙ, කුලපුත්තස්ස අයමනුධම්මො හොති: යං රූපෙ නිබ්බිදාබහුලං[1] විහරෙය්‍ය, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු නිබ්බිදාබහුලං විහරෙය්‍ය, විඤ්ඤාණෙ නිබ්බිදාබහුලං විහරෙය්‍ය.

සො රූපෙ නිබ්බිදාබහුලං විහරන්තො, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ නිබ්බිදාබහුලං විහරන්තො, රූපං පරිජානාති වෙදනං පරිජානාති සඤ්ඤං පරිජානාති සඞ්ඛාරෙ පරිජානාති විඤ්ඤාණං පරිජානාති. සො රූපං පරිජානං වෙදනං පරිජානං සඤ්ඤං පරිජානං, සඞ්ඛාරෙ පරිජානං, විඤ්ඤාණං පරිජානං, පරිමුච්චති රූපම්හා පරිමුච්චති වෙදනාය පරිමුච්චති සඤ්ඤාය පරිමුච්චති සඞ්ඛාරෙහි පරිමුච්චති විඤ්ඤාණම්හා. පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි. පරිමුච්චති දුක්ඛස්මාති වදාමීති.

## 1. 3. 4. 12.

## අනිච්චානුපස්සනා සුත්තං

**147. සාවත්ථියං:**

සද්ධාපබ්බජිතස්ස භික්ඛවෙ, කුලපුත්තස්ස අයමනුධම්මො හොති: යං රූපෙ අනිච්චානුපස්සී විහරෙය්‍ය, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ අනිච්චානුපස්සී විහරෙය්‍ය.

සො රූපෙ අනිච්චානුපස්සී විහරන්තො වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ අනිච්චානුපස්සී විහරන්තො රූපං පරිජානාති, වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං පරිජානාති. සො රූපං පරිජානං වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං පරිජානං පරිමුච්චති රූපම්හා පරිමුච්චති වෙදනාය, පරිමුච්චති සඤ්ඤාය, පරිමුච්චති සඞ්ඛාරෙහි, පරිමුච්චති විඤ්ඤාණම්හා, පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, පරිමුච්චති, දුක්ඛස්මාති වදාමීති.

## 1. 3. 4. 13.

## දුක්ඛානුපස්සී සුත්තං

**148. සාවත්ථියං:**

සද්ධාපබ්බජිතස්ස භික්ඛවෙ, කුලපුත්තස්ස අයමනුධම්මො හොති: යං රූපෙ දුක්ඛානුපස්සී විහරෙය්‍ය, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ දුක්ඛානුපස්සී විහරෙය්‍ය.

1. නිබ්බිදාබහුලො - මජසං.

## 1. 3. 4. 11.

## නිබ්බිදබහුල සූත්‍රය

**146.** සැවැත්නුවර :

මහණෙනි, යම් හෙයකින් රූපයෙහි කලකිරීම බහුල කොට වෙසෙන්නේ නම්, වේදනායෙහි . . . සංඥායෙහි . . . සංස්කාරයන්හි කලකිරීම බහුල කොට වෙසෙන්නේ නම් විඤ්ඤනයෙහි කලකිරීම බහුල කොට වෙසෙන්නේ නම් සැදැහැයෙන් පැවිදි වූ කුලපුත්හට මේ අනුදහම වෙයි.

හෙතෙම රූපයෙහි කලකිරීම බහුල කොට වෙසෙන්නේ වේදනායෙහි . . . සංඥායෙහි . . . සංස්කාරයන්හි . . . විඤ්ඤනයෙහි කලකිරීම බහුල කොට වෙසෙන්නේ රූපය පිරිසිඳ දනියි. වේදනාව පිරිසිඳ දනියි, සංඥාව පිරිසිඳ දනියි, සංස්කාර පිරිසිඳ දනියි, විඤ්ඤනය පිරිසිඳ දනී. හෙතෙම රූපය පිරිසිඳ දන්නේ වේදනාව පිරිසිඳ දන්නේ සංඥාව පිරිසිඳ දන්නේ සංස්කාර පිරිසිඳ දන්නේ විඤ්ඤනය පිරිසිඳ දන්නේ රූපයෙන් මිදෙයි, වේදනාවෙන් මිදෙයි, සංඥාවෙන් මිදෙයි, සංස්කාරයන්ගෙන් මිදෙයි, විඤ්ඤනයෙන් මිදෙයි. ජාතියෙන්, ජරාමරණයෙන්, සෝකයෙන්, පරිදේවයෙන්, දුකින්, දොම්නසින්, උපායාසයෙන් මිදෙයි, (සියලු) දුකින් මිදේ ය''යි කියමි යි.

## 1. 3. 4. 12.

## අනිච්චානුපස්සනා සූත්‍රය

**147.** සැවැත්නුවර :

මහණෙනි, යම් හෙයකින් රූපයෙහි අනිස අනුව දකිමින් වෙසන්නේ නම් වේදනායෙහි . . . සංඥායෙහි . . . සංස්කාරයන්හි . . . විඤ්ඤනයෙහි අනිස අනුව දකිමින් වෙසෙන්නේ නම් සැදැහැයෙන් පැවිදි වූ කුලපුත්හට මේ අනුදහම වෙයි.

හේ රූපයෙහි අනිස අනුව දකිමින් වෙසෙන්නේ වේදනායෙහි . . . සංඥායෙහි . . . සංස්කාරයන්හි . . . විඤ්ඤනයෙහි අනිස අනුව දකිමින් වෙසෙන්නේ රූපය පිරිසිඳ දනියි. වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඤ්ඤනය පිරිසිඳ දනී. හෙ රූපය පිරිසිඳ දන්නේ වෙදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඤ්ඤනය පිරිසිඳ දන්නේ රූපයෙන් මිදෙයි, වෙදනාවෙන් මිදෙයි, සංඥායෙන් මිදෙයි, සංස්කාරයන්ගෙන් මිදෙයි, විඤ්ඤනයෙන් මිදෙයි. ජාතියෙන්, ජරාමරණයෙන්, ශෝකයෙන්, පරිදේවයෙන්, දුකින්, දොම්නසින් උපායාසයෙන් මිදෙයි. (සියලු) දුකින් මිදේ ය'යි කියමියි.

## 1. 3. 4. 13.

## දුක්ඛානුපස්සී සූත්‍රය

**148.** සැවැත්නුවර :

මහණෙනි, යම් හෙයෙකින් රූපයෙහි දුක අනුව දකිමින් වෙසෙන්නේ නම් වේදනායෙහි . . . සංඥායෙහි . . . සංස්කාරයන්හි . . . විඤ්ඤනයෙහි දුක අනුව දකිමින් වෙසෙන්නේ නම් සැදැහැයෙන් පැවිදි වූ කුලපුතුහට මේ අනුදහම වෙයි.

23–ජ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

සො රූපෙ දුක්ඛානුපස්සී විහරන්තො වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ දුක්ඛානුපස්සී විහරන්තො රූපං පරිජානාති වෙදනං පරිජානාති සඤ්ඤං පරිජානාති සඞ්ඛාරෙ පරිජානාති විඤ්ඤාණං පරිජානාති.

සො රූපං පරිජානං වෙදනං පරිජානං සඤ්ඤං පරිජානං සඞ්ඛාරෙ පරිජානං විඤ්ඤාණං පරිජානං පරිමුච්චති රූපම්හා පරිමුච්චති වෙදනාය පරිමුච්චති සඤ්ඤාය පරිමුච්චති සඞ්ඛාරෙහි පරිමුච්චති විඤ්ඤාණම්හා, පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, පරිමුච්චති දුක්ඛස්මාති වදාමීති.

## 1. 3. 4. 14.

### අනත්තානුපස්සනා සුත්තං

**149. සාවත්ථියං:**

සද්ධාපබ්බජිතස්ස භික්ඛවෙ, කුලපුත්තස්ස අයමනුධම්මො හොති: යං රූපෙ අනත්තානුපස්සී විහරෙය්‍ය වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ අනත්තානුපස්සී විහරෙය්‍ය:

සො රූපෙ අනත්තානුපස්සී විහරන්තො වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ අනත්තානුපස්සී විහරන්තො රූපං පරිජානාති, වෙදනං පරිජානාති, සඤ්ඤං පරිජානාති, සඞ්ඛාරෙ පරිජානාති, විඤ්ඤාණං පරිජානාති. සො රූපං පරිජානං වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං පරිජානං පරිමුච්චති. රූපම්හා, පරිමුච්චති වෙදනාය, පරිමුච්චති සඤ්ඤාය, පරිමුච්චති සඞ්ඛාරෙහි, පරිමුච්චති විඤ්ඤාණම්හා, පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, පරිමුච්චති දුක්ඛස්මාති වදාමීති.

**කුක්කුලවග්ගො චතුත්ථො.**

**තත්‍රුද්දානං:**

කුක්කුලො තයො අනිච්චෙන - දුක්ඛෙන අපරෙ තයො
අනත්තෙන තයො වුත්තා - කුලපුත්තෙන ද්වෙ දුතාති.

හෙතෙම රූපයෙහි දුක අනුව දකිමින් වෙසෙන්නේ වේදනායෙහි . . . සංඥයෙහි . . . සංස්කාරයන්හි . . . විඥනයෙහි දුක අනුව දකිමින් වෙසෙන්නේ රූපය පිරිසිඳ දනියි. වේදනාව පිරිසිඳ දනියි. සංඥව පිරිසිඳ දනියි. සංස්කාරයන් පිරිසිඳ දනියි. විඥනය පිරිසිඳ දනී.

හෙතෙම රූපය පිරිසිඳ දන්නේ වේදනාව පිරිසිඳ දන්නේ සංඥව පිරිසිඳ දන්නේ සංස්කාරයන් පිරිසිඳ දන්නේ විඥනය පිරිසිඳ දන්නේ රූපයෙන් මිදෙයි, වේදනාවෙන් මිදෙයි, සංඥවෙන් මිදෙයි, සංස්කාරයන්ගෙන් මිදෙයි, විඥනයෙන් මිදෙයි, ජාතියෙන්, ජරාමරණයෙන්, ශෝකයෙන්, පරිදේවයෙන්, දුකෙන්, දොම්නසින්, උපායාසයෙන් මිදෙයි. (සියලු) දුකෙන් මිදේ ය යි කියමි යි.

## 1. 3. 4. 14.

## අනත්තානුපස්සනා සූත්‍රය

**149. සැවැත්නුවර :**

මහණෙනි, යම් හෙයෙකින් රූපයෙහි අනාත්මය අනු ව දකිමින් වෙසෙන්නේ නම් වේදනායෙහි . . . සංඥයෙහි . . . සංස්කාරයන්හි . . . විඥනයෙහි අනාත්මය අනුව දකිමින් වෙසෙන්නේ නම් සැදැහැයෙන් පැවිදි වූ කුලපුතුහට මේ අනුදහම වෙයි :

" හේ රූපයෙහි අනාත්මය අනුව දකිමින් වෙසෙන්නේ වේදනායෙහි . . . සංඥයෙහි . . . සංස්කාරයන්හි . . . විඥනයෙහි අනාත්මය අනුව දකිමින් වෙසෙන්නේ රූපය පිරිසිඳ දනියි, වේදනාව පිරිසිඳ දනියි, සංඥව පිරිසිඳ දනියි, සංස්කාරයන් පිරිසිඳ දනියි, විඥනය පිරිසිඳ දනී. හේ රූපය පිරිසිඳ දන්නේ වේදනාව . . . සංඥව . . . සංස්කාරයන් . . . විඥනය පිරිසිඳ දන්නේ රූපයෙන් මිදෙයි, වේදනාවෙන් මිදෙයි, සංඥවෙන් මිදෙයි, සංස්කාරයන්ගෙන් මිදෙයි, විඥනයෙන් මිදෙයි. ජාතියෙන් ජරාමරණයෙන් සෝකයෙන් පරිදේවයෙන් දුක්ඛයෙන් දොමනස්සයෙන් උපායාසයෙන් මිදෙයි. (සියලු) දුකින් මිදේ ය'යි කියමි යි.

**සිවුවැනි කුක්කුළ වර්ග යි**

**එහි සූත්‍රනාමාවලිය :**

කුක්කුල සූත්‍රය, අනිච්චසූත්‍ර තුන ය, අනෙක් දුක්ඛසූත්‍ර තුන ය, අනත්තසූත්‍ර තුන ය. කුලපුත්තසූත්‍ර දුක දෙක යයි සූත්‍ර තුදුසෙකි.

## 5. දිට්ඨි වග්ගො

### 1. 3. 5. 1.

### අජ්ඣත්ත සුත්තං

**150. සාවත්ථියං :**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛන්ති ?

භගවංමූලකා නො භන්තෙ, ධම්මා -පෙ-

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. වෙදනාය සති වෙදනං උපාදාය උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති සඞ්ඛාරෙ උපාදාය උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති ? අනිච්චං භන්තෙ,

යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති ? දුක්ඛං භන්තෙ,

යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, අපි නු තං අනුපාදාය උප්පජ්ජෙය්‍ය අජ්ඣත්තං සුඛදුක්ඛන්ති ? නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති ? අනිච්චං භන්තෙ,

යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති ? දුක්ඛං භන්තෙ,

යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, අපි නු තං අනුපාදාය උප්පජ්ජෙය්‍ය අජ්ඣත්තං සුඛදුක්ඛන්ති ? නො හෙතං භන්තෙ,

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති -පෙ- විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 1. 3. 5. 2.

### එතං මම සුත්තං

**151. සාවත්ථියං :**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සතීති.

භගවංමූලකා නො භන්තෙ, ධම්මා -පෙ-



Free Distribution www.aathaapi.org

# 5. දිට්ඨි වර්ගය

## 1. 3. 5. 1.

## අජ්ඣත්ත සූත්‍රය

**150. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා තමා තුළ සුවදුක් උපදනේ ද ?

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා තමා තුළ සුවදුක් උපදියි, වේදනාව ඇති කල්හි වේදනාව නිසා තමා තුළ සුවදුක් උපදියි, සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි සංස්කාර නියා තමා තුළ සුවදුක් උපදියි, විඥානය ඇති කල්හි විඥානය නිසා තමා තුළ සුවදුක් උපදී, මහණෙනි එ කිමැයි හඟිවූ ද, රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ.

යමක් අනිත්‍ය නම් එ දුක් හෝ සුව හෝ වේ ද ? වහන්ස, දුක් යැ.

යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි නම් එය ඇසිරි නොකොට තමා තුළ සුවදුක් උපදනේ ද ? වහන්ය, නෙල නො වේ මැ යැ.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥනය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ.

යමක් අනිත්‍ය නම් ඒ දුක් හෝ සුව හෝ වේ ද ? වහන්ය, දුක් යැ.

යමක් අනිත්‍ය නම දුක් නම් පෙරළෙන සැහැවි නම් එය ඇසිරි නො කොට තමා තුළ සුවදුක් උපදනේ ද ? වහන්ස, නෙල නො වේ මැ යි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්යශ්‍රාවක රූපයෙහිදු කලකිරෙයි, . . . විඥාන යෙහිදු කලකිරෙයි, කලකිරෙනුයේ නො ඇලෙයි . . . මේ බව සඳහා කටයුතු අන් කිසෙක් නැතැයි දනියි.

## 1. 3. 5. 2.

## එතං මම සූත්‍රය

**151. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමක් ප්‍රත්‍යය කොට '' නෙල මාගේ යැ, නෙල මම වෙමි, නෙල මාගේ ආත්ම ය''යි දකී ද''යි ?

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ . . .



Free Distribution www.aathaapi.org

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සති. වේදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සති.

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යම්පනානිච්චං -පෙ- විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සෙය්‍යාති? නො හෙතං භන්තෙ,

වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං -පෙ- විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති සමනුපස්සෙය්‍යාති? නො හෙතං භන්තෙ,

එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 3. 5. 3.

### සො අත්තා සුත්තං

**152.** සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "සො අත්තා, සො ලොකො, සො පෙච්ච භවිස්සාමි නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො"ති.

භගවංමූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "සො අත්තා, සො ලොකො, සො පෙච්ච භවිස්සාමි, නිච්චො, ධුවො, සස්සතො, අවිපරිණාමධම්මො"ති, වේදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "සො අත්තා, සො ලොකො, සො පෙච්ච භවිස්සාමි, නිච්චො, ධුවො, සස්සතො අවිපරිණාමධම්මො"ති.

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ, යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය "සො අත්තා, සො ලොකො, සො පෙච්ච භවිස්සාමි, නිච්චො ධුවො සස්සතො, අවිපරිණාමධම්මො"ති, නො හෙතං භන්තෙ,

මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපය ප්‍රත්‍යය කොට '' තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම ය''යි දකියි, වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානය ප්‍රත්‍යය කොට '' තෙල මාගේ ය, තෙලෙ මම වෙමි. තෙල මාගේ ආත්ම ය''යි දකී.

මහණෙනි, '' ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ '' යි ?

වහන්ස, අනිත්‍ය යැ. යමක් අනිත්‍ය නම් . . . වෙනස් වන ස්වභාව ඇත් නම් එය නො ඇසුරු කොට '' තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම ය''යි දක්නේ දූ යි ? වහන්ස, තෙල නො වේ ම යැ.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ වේ ද? අනිත්‍ය හෝ වේ දැ''යි ? වහන්ස, අනිත්‍ය යැ.

යමක් අනිත්‍ය නම් . . . වෙනස් වන ස්වභාව ඇත් නම් එය නො ඇසුරු කොට ''තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම ය ''යි දක්නේ දූ යි ? වහන්ස, තෙල නො වේ ම යැ.

මෙසේ දක්නා . . . මේ බැව් පිණිස අනෙකෙක් නැතැ යි දැනගනී යි.

## 1. 3. 5. 3.

## සො අත්තා සූත්‍රය

**152.** සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමක් ප්‍රත්‍යය කොට '' ඒ මම ආත්මයෙමි, ඒ මම ලෝකය වෙමි, නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නො පෙරළෙන සැහැවි වූ ඒ මම පරලොව වන්නෙමි''යි මෙබඳු දෘෂ්ටියක් උපදී දැයි ?

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපය ප්‍රත්‍යය කොට ''ඒ මම ආත්මයෙමි, ඒ මම ලෝකය වෙමි, නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ නො පෙරළෙන සැහැවි වූ ඒ මම, පරලොව වන්නෙමි''යි මෙබඳු දෘෂ්ටියක් උපදියි. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානය ප්‍රත්‍යය කොට ''ඒ මම ආත්මයෙමි, ඒ මම ලොකය වෙමි, ඒ මම පරලොව වන්නෙමි''යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැයි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ. යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද ? වහන්ස, දුක් යැ. යමක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි නම් එය ඇසිරි නො කොට ඒ මම ආත්මයෙමි, ඒ මම ලෝකය වෙමි, ඒ මම නිත්‍ය වූයෙමි, ධ්‍රැව වූයෙමි, ශාශ්වත වූයෙමි නො පෙරළෙන සැහැවියෙමි පරලොව වන්නෙමි''යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද ? වහන්ස, තෙල නො වේ ම යැ.

වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිනාමධම්මං, අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය "සො අත්තා, සො ලොකො, සො පෙච්ච භවිස්සාමි, නිච්චො ධුවො සස්සතො අවිපරිනාමධම්මො"ති? නො හෙතං භන්තෙ, එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති

## 1. 3. 5. 4.

## නො ච මෙ සියා සුත්තං

**153.** සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති? "නො චස්සං නො ච මෙ සියා, න භවිස්සාමි, න මෙ භවිස්සතී"ති[1].

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "නො චස්සං, නො ච මෙ සියා, න භවිස්සාමි න මෙ භවිස්සතී"ති. වේදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "නො චස්සං, නො ච මෙ සියා, න භවිස්සාමි, "න මෙ භවිස්සතීති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිනාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය "නො චස්සං, නො ච මෙ සියා, න භවිස්සාමි, න මෙ භවිස්සතී"ති? නො හෙතං භන්තෙ,

වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිනාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය "නො චස්සං, නො ච මෙ සියා, න භවිස්සාමි, න මෙ භවිස්සතීති?

නො හෙතං භන්තෙ, එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

1. න භවිස්සති - ස්‍යා.
2. න භවිස්සං න මෙ භවිස්සතීති - මජ්ඣං.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ.

යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද ? වහන්ස, දුක් යැ.

යමක් නිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි නම් එය ඇසිරි නො කොට "ඒ මම් ආත්මයෙමි, ඒ මම් ලෝකය වෙමි, ඒ මම් නිත්‍ය වූයෙමි, ධ්‍රැව වූයෙමි, ශාශ්වත වූයෙමි පෙරළෙන සැහැවියෙමි පරලොව වන්නෙමි" යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද ? වහන්ස, තෙල නො වේ ම යැ. මෙසේ දක්නේ . . . මේ සඳහා අන් කිසෙක් නැතැයි දැනගනී යි.

## 1. 3. 5. 4.

## නො ච මෙ සියා සූත්‍රය

**153. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමක් ප්‍රත්‍යය කොට "(මම්) නො වන්නෙම් නම් මට (පස්කඳෙක්) නොද වන්නේ යැ, මතු නො වන්නෙම් නම් මට (පස්කඳෙක්) මතු නොවන්නේ"යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද ?

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසිරි කොට රූපය ප්‍රත්‍යය කොට "ඉදින් (මම්) නුවූයෙම් නම් මට (පස්කඳෙක්) නො ද වන්නේ යැ, නො වන්නෙම් නම් (මතු පස්කඳෙක්) මට නො වන්නේ යි මෙබඳු දෘෂ්ටියක් උපදී. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසිරි කොට විඥානය ප්‍රත්‍යය කොට ඉදින් (මම්) නුවූයෙම් නම් මට (පස්කඳෙක්) නො ද වන්නේ යැ, නො වන්නෙම් නම් (මතු ද පස්කඳෙක්) මට නො වන්නේ"යි මෙ බඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ.

යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසිරි කොට "ඉදින් (මම්) නුවූයෙම් නම් මට (පස්කඳෙක්) නො ද වන්නේ යැ. නො වන්නෙම් නම් මතු පස් කඳෙක් මට නො වන්නේ"යි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද යි ? වහන්ස, තෙල නො වේ ම යැ.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද ? වහන්ස, අනිත්‍ය යැ.

යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය ඇසිරි කොට "ඉදින් (මම්) නුවූයෙම් නම් මට (පස්කඳෙක්) නො ද වන්නේ යැ. ඉදින් නො වන්නෙම් නම් (මතු ද පස්කඳෙක්) මට නො වන්නේ"යි මෙ බඳු දෘෂ්ටියෙක් උපදී ද"යි ?

වහන්ස, තෙල නො වේ මැයි. මෙසේ දක්නේ . . . මෙ බැව පිණිස අන් කිසෙක් නැතැ යි දැනගනී යි.

## 1. 3. 5. 5.

## මිච්ඡාදිට්ඨි සුත්තං

**154. සාවත්ථියං:**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස මිච්ඡාදිට්ඨි උප්පජ්ජතීති?

භගවංමූලකා නො භන්තෙ ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස මිච්ඡාදිට්ඨි උප්පජ්ජති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස මිච්ඡාදිට්ඨි උප්පජ්ජති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං, දුක්ඛං, විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය මිච්ඡාදිට්ඨි උප්පජ්ජෙය්‍යාති? නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං, දුක්ඛං, විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය මිච්ඡාදිට්ඨි උප්පජ්ජෙය්‍යාති? නො හෙතං භන්තෙ,

එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 3. 5. 6,

## සක්කායදිට්ඨි සුත්තං

**155. සාවත්ථියං:**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස සක්කායදිට්ඨි උප්පජ්ජතීති?

භගවංමූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස සක්කායදිට්ඨි උප්පජ්ජති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස සක්කායදිට්ඨි උප්පජ්ජති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

## 1. 3. 5. 5.
## මිච්ඡාදිට්ඨි සූත්‍රය

154. සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමක් ප්‍රත්‍යය කොට මිථ්‍යාදෘෂ්ටිය උපදනේ ද ? යි වහන්ස,

අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපය ප්‍රත්‍යය කොට මිථ්‍යාදෘෂ්ටිය උපදියි. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානය ප්‍රත්‍යය කොට මිථ්‍යා දෘෂ්ටිය උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද, රූපය නිත්‍ය හෝ වේ ද , අනිත්‍ය හෝ වේ දැ යි ? වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද ?, සුව හෝ වේ දැ යි ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට මිථ්‍යා දෘෂ්ටිය උපදනේ දැ යි ? වහන්ස, නෙල නො වේ ම යැ.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ දැ යි ? වහන්ස, අනිත්‍ය ය.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද යි ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට මිථ්‍යා දෘෂ්ටිය උපදනේ ද යි ? වහන්ස, නෙල නො වේ මැයි.

මෙසේ දක්නේ . . . මේ බැව් පිණිස අනෙකෙක් නැතැ යි දැනගනී යි.

## 1. 3. 5. 6.
## සක්කායදිට්ඨි සූත්‍රය

155. සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමක් ප්‍රත්‍යය කොට සත්කාය දෘෂ්ටිය උපදී ද යි ?

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපය ප්‍රත්‍යය කොට සක්කාය දෘෂ්ටිය උපදියි. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානය ප්‍රත්‍යය කොට සත්කායදෘෂ්ටිය උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද යි ? වහන්ස, අනිත්‍ය යැ.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය සක්කායදිට්ඨි උප්පජ්ජෙය්‍යාති? නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය සක්කායදිට්ඨි උප්පජ්ජෙය්‍යාති? නො හෙතං භන්තෙ,

එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 3. 5. 7.

## අත්තානුදිට්ඨි සුත්තං

**156.** සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස අත්තානුදිට්ඨි උප්පජ්ජතීති?

භගවංමූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස අත්තානුදිට්ඨි උප්පජ්ජති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස අත්තානුදිට්ඨි උප්පජ්ජති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය අත්තානුදිට්ඨි උප්පජ්ජෙය්‍යාති? නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය අත්තානුදිට්ඨි උප්පජ්ජෙය්‍යාති? නො හෙතං භන්තෙ,

එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

Free Distribution www.aathaapi.org

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ දැ යි ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට සත්කාය දෘෂ්ටිය උපදනේ දැ යි ? වහන්ස, නෙල නො වේ ම යැ.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද යි ? වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද යි ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට සත්කාය දෘෂ්ටිය උපදනේ දැ යි ? වහන්ස, නෙල නො වේ මැයි.

මෙසේ දක්නේ . . . මේ බැව් පිණිස අනෙකෙක් නැතැ යි දනගනී යි.

## 1. 3. 5. 7.
## අත්තානුදිට්ඨි සූත්‍රය

**156.** සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමක් ප්‍රත්‍යය කොට ආත්මානු දෘෂ්ටිය (ආත්මය අනුගතවූ දෘෂ්ටිය) උපදී දැ යි ?

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපය ප්‍රත්‍යය කොට ආත්මානු දෘෂ්ටිය උපදියි, වේදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාරයන් ඇති කල්හි . . . විඥනය ඇති කල්හි විඥනය ඇසුරු කොට විඥනය ප්‍රත්‍යය කොට ආත්මානුදෘෂ්ටිය උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ දැ යි ? වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ දැ යි ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට ආත්මානු දෘෂ්ටිය උපදනේ දැ යි ? වහන්ස, නෙල නො වේ මැ යැ.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ දැ යි ? වහන්ස, අනිත්‍ය යැ.

යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ දැ යි ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට ආත්මානු දෘෂ්ටිය උපදනේ දැ යි ? වහන්ස, නෙල නො වේ මැ යි.

මෙසේ දක්නේ . . . මේ බැව් පිණිස අනෙකෙක් නැතැයි දනගනී යි.

## 1. 3. 5. 8.

### පඨම අභිනිවෙස සුත්තං

**157. සාවත්ථියං :**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස උප්පජ්ජන්ති සඤ්ඤොජනාභිනිවෙසවිනිබන්ධාති ?[1]

භගවංමූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස උප්පජ්ජන්ති සඤ්ඤොජනාභිනිවෙසවිනිබන්ධා, වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස උප්පජ්ජන්ති සඤ්ඤොජනාභිනිවෙසවිනිබන්ධා.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති ? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති ? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය උප්පජ්ජෙය්‍යුං සඤ්ඤොජනාභිනිවෙසවිනිබන්ධාති ? නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති ? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති ? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය උප්පජ්ජෙය්‍යුං සඤ්ඤොජනාභිනිවෙසවිනිබන්ධාති. නො හෙතං භන්තෙ,

එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 3. 5. 9.

### දුතිය අභිනිවෙස සුත්තං

**158. සාවත්ථියං :**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස උප්පජ්ජන්ති සඤ්ඤොජනාභිනිවෙසවිනිබන්ධාජ්ඣොසානාති ?

භගවංමූලකා නො භන්තෙ ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස උප්පජ්ජන්ති සඤ්ඤොජනාභිනිවෙසවිනිබන්ධාජ්ඣොසානා. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස උප්පජ්ජන්ති සඤ්ඤොජනාභිනිවෙසවිනිබන්ධාජ්ඣොසානා.

---

1. සඤ්ඤොජනවිනිවෙසවිනිබද්ධාති - සීමු, සී 1, 2.

## 1. 3. 5. 8.

## පඨම අභිනිවෙස සූත්‍රය

157. සැවැත්නුවර :

''කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමක් ප්‍රත්‍යය කොට සංයෝජනඅභිනිවෙස විනිබන්ධයෝ (සංයෝජනයෝ ය අනිත්‍යාදියෙහි නිත්‍යාදි වශයෙන් දැඩිව පිවිස ගත් නෝය සිත තදින් බැඳගන්නා විනිබන්ධයෝ ය යන කෙලෙස්හු) උපදිද්ද''යි.

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපය ප්‍රත්‍යය කොට සංයෝජන අභිනිවෙසවිනිබන්ධයෝ උපදිති. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානය ප්‍රත්‍යය කොට සංයෝජන අභිනිවෙස විනිබන්ධයෝ උපදිත්.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැ යි ? වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ දැ යි ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට සංයෝජන අභිනිවෙසවිනිබන්ධයෝ උපදනාහු දැ යි ? වහන්ස, තෙල නො වේ මැ යි.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ දැ යි ? වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ දැ යි ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට සංයෝජන අභිනිවෙස විනිබන්ධයෝ උපදනාහු දැ යි ? වහන්ස, තෙල නො වේ මැ යි.

මෙසේ දක්නේ . . . මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 3. 5. 9.

## දුතිය අභිනිවෙස සූත්‍රය

.158 සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමක් ප්‍රත්‍යය කොට සංයෝජන අභිනිවේසවිනිබන්ධඅජ්ඣොසානයෝ (සංයෝජනයෝය, අභිනිවෙසයෝය, විනිබන්ධයෝ ය, ගිලගැනුම් වශයෙන් පවත්නා ක්ලේශයෝ යන මොවුහු) උපදිද් දැ යි ?

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපය ප්‍රත්‍යය කොට සංයෝජන අභිනිවේසවිනිබන්ධඅජ්ඣොසානයෝ උපදිති. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානය ප්‍රත්‍යය කොට සංයෝජනඅභිනිවේසවිනිබන්ධ අජ්ඣොසානයෝ උපදිති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය උප්පජ්ජෙය්‍යුං සංයොජනාභිනිවෙසවිනිබන්ධාජ්ඣොසානානි? නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය උප්පජ්ජෙය්‍යුං සංයොජනාභිනිවෙසවිනිබන්ධාජ්ඣොසානානි. නො හෙතං භන්තෙ.

එවං පස්සං -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 1. 3. 5. 10.

### ආනන්ද සුත්තං

**159.** සාවත්ථියං:

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍ය''න්ති.

තං කිං මඤ්ඤසි ආනන්ද, රූපං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං "එතං මම එසො හමස්මි, එසො මෙ අත්තා''ති? නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති? අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති? දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං කල්ලං නු තං සමනුපස්සිතුං "එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා''ති? නො හෙතං භන්තෙ.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ දැ යි ? වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ දැ යි ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට සංයෝජන අභිනිවේසවිනිබන්ධඅජ්ඣොසානයෝ උපදනාහු දැ යි ? වහන්ස, නෙල නො වේ ම යැ.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද යි ? වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද යි ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට සංයෝජන අභිනිවේසවිනිබන්ධඅජ්ඣොසානයෝ උපදනාහු දැ යි ? වහන්ස, නෙල නො වේ මැ යි.

මෙසේ දක්නේ . . . මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනී යි.

## 1. 3. 5. 10.

## ආනන්ද සූත්‍රය

**159.** සැවැත්නුවර :

එ කල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ, එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ, එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකළහ : ''වහන්ස, මම භාග්‍ය වතුන් වහන්සේ වෙතින් යම් දහමක් අසා එකලා ව ගණයා කෙරෙන් වෙන් වැ නො පමා වැ කෙලෙස් තවන වෙර ඇති වැ නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති වැ වාස කෙරෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක් නම් මැනවි''යි.

ආනන්දය, ඒ කිමැ යි හඟිහි ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ ? යි. වහන්ස අනිත්‍ය ය.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ දැ ? යි. වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය ''නෙල මාගේ යැ, නෙලෙ මම වෙමි, නෙල මාගේ ආත්මය''යි දක්නට සුදුසු දැ''යි ? වහන්ස, නෙල නො වේ මැ යැ.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ දැ යි ? වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ දැ යි ? වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය ''මෙය මාගේ ය, මේ මම වෙමි, මේ මාගේ ආත්ම ය''යි දක්නට සුදුසු දැ යි ? වහන්ස, නෙල නො වේ මැ යි.

තස්මාතිහ ආනන්ද, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං "නෙතං මම, නෙසොහමස්මි, න මෙ සො අත්තා"ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං. යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං "නෙතං මම -පෙ-.

එවං පස්සං ආනන්ද, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

දිට්ඨිවග්ගො පඤ්චමො.

තත්‍රුද්දානං:

අජ්ඣත්තිකං එතං මම සො අත්තා නො ච මෙ සියා,
මිච්ඡා සක්කාය අත්තානුදොභිනිවෙසා ආනන්දෙනාති.

උපරිපණ්ණාසකො සමත්තො.

තත්‍ර වග්ගුද්දානං:

අන්තො ධම්මකථිකාවිජ්ජා කුක්කුලො දිට්ඨිපඤ්චමං,
තතියො පණ්ණාසකො වුත්තො නිපාතො තෙන වුච්චතීති

ඛන්ධකවග්ගස්ස නිපාතකෙ තිපණ්ණාසකං සමත්තං.

ඛන්ධසංයුත්තං නිට්ඨිතං.

Free Distribution www.aathaapi.org

ආනන්දය, එ හෙයින් මෙහි ලා අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදාරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම් කිසි රූපයෙක් ඇත් ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් රූපයෙක් ඇත් ද, (ඒ) සියලු රූපය "තෙල මාගේ නො වෙයි, තෙලෙ මම නො වෙමි, තෙල මාගේ ආත්මය නො වේ ය"යි මෙසේ කෙල තතු සේ විවසුන්නුවණින් දක්ක යුතු. යම් කිසි වේදනාවක් . . . යම් කිසි සංඥාවක් . . . යම් කිසි සංස්කාර කෙනෙක් . . . අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ ඖදාරික වූ හෝ සූක්ෂ්ම වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ යම්කිසි විඥානයෙක් ඇත් ද, දුර වූ හෝ ළඟ වූ හෝ යම් විඥානයෙකුත් ඇත් ද (ඒ) සියලු විඥානය "තෙල මාගේ නො වෙයි, . . .

ආනන්දය, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපයෙහිදු කලකිරෙයි, වෙදනායෙහිදු කලකිරෙයි, සංඥායෙහිදු කලකිරෙයි, සංස්කාරයෙහිදු කලකිරෙයි, විඥානයෙහිදු කල කිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි නොඇල්මෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුනේ යයි දැනීම වෙයි, ජාතිය ක්ෂය විය, බඹසර වැස නිමවන ලද, කරණී කරණ ලදී. මෙබැව් පිණිස අනෙකක් නැතැ යි දැනගනි යි.

**පස්වැනි දිට්ඨි වර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය :**

අජ්ඣත්තික, එතං මම, සො අත්තා, නොච මෙ සියා, මිච්ඡාදිට්ඨි, සක්කායදිට්ඨි, අත්තානුදිට්ඨි යන සූත්‍ර සත යැ, අභිනිවෙස සූත්‍ර දෙක යැ, ආනන්ද සූත්‍ර ය යි සූත්‍ර දශයෙකි.

**උපරි පණ්ණාසකය නිමියේ යි.**

**එහි වර්ග නාමාවලිය :**

අන්ත වර්ග යැ. ධම්මකථික වර්ග යැ, අවිජ්ජා වර්ග යැ, කුක්කුල වර්ග යැ, පස්වැනි වූ දිට්ඨිවර්ග යයි තුන් වන පණ්ණාසකය කියන ලද්දේ ය. එහෙයින් නිපාත යයි කියනු ලැබෙ යි. ඛන්ධකවර්ගය පිළිබඳ නිපාතයෙහි පණ්ණාසක තුන සමාප්ත යැ.

**ඛන්ධසංයුත්තය නිමියේ යි.**

# 2. රාධසංයුත්තං

## 1. පඨම මාරවග්ගො

### 2. 1. 1.

### මාර සුත්තං

160. සාවත්ථියං :

අථ ඛො ආයස්මා රාධො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : මාරො මාරොති භන්තෙ, වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ, මාරොති[1].

රූපෙ ඛො රාධ සති මාරො වා අස්ස මාරෙතා වා යො වා පන මීයති.[2] තස්මා තිහ ත්වං රාධ රූපං මාරොති පස්ස, මාරෙතාති පස්ස, මීයතීති පස්ස, රොගොති පස්ස, ගණ්ඩොති පස්ස, සල්ලන්ති පස්ස, අඝන්ති පස්ස, අඝභූතන්ති. පස්ස, යෙ නං එවං පස්සන්ති තෙ සම්මා පස්සන්ති. වෙදනාය සති මාරො වා අස්ස මාරෙතා වා යො වා පන මීයති[2]. තස්මාතිහ ත්වං රාධ, වෙදනං මාරොති පස්ස මාරෙතාති පස්ස මීයතීති පස්ස -පෙ- යෙ නං එවං පස්සන්ති තෙ සම්මා පස්සන්ති. සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති මාරො වා අස්ස මාරෙතා වා යො වා පන මීයති. තස්මාතිහ ත්වං රාධ, සඞ්ඛාරෙ මාරො'ති පස්ස මාරෙතාති පස්ස මීයතීති පස්ස -පෙ- යෙ නං එවං පස්සන්ති තෙ සම්මා පස්සන්ති. විඤ්ඤාණෙ සති මාරො වා අස්ස මාරෙතා වා, යො වා පන මීයති. තස්මාතිහ ත්වං රාධ, විඤ්ඤාණං මාරොති. පස්ස, මාරෙතාති පස්ස, මීයතීති පස්ස, රොගොති පස්ස, ගණ්ඩොති පස්ස, සල්ලන්ති පස්ස, අඝන්ති පස්ස, අඝභූතන්ති පස්ස. යෙ නං එවං පස්සන්ති තෙ සම්මා පස්සන්තීති.

සම්මාදස්සනං පන භන්තෙ, කිමත්ථියන්ති ?

සම්මාදස්සනං ඛො රාධ, නිබ්බිදත්ථං.

නිබ්බිදා පන භන්තෙ, කිමත්ථියාති ?

නිබ්බිදා ඛො රාධ, විරාගත්ථා.

විරාගො පන භන්තෙ කිමත්ථියොති ?

විරාගො ඛො රාධ, විමුත්තත්ථො.

---

1. මාරොති වුච්චති – සීමු, සී 2.
2. මීය්‍යති - සයා.

# 2. රාධසංයුත්තය

## 1. ප්‍රථම මාර වර්ගය

### 2. 1. 1.

### මාර සූත්‍රය

**160.** සැවැත්නුවර :

එ කල්හි ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ : වහන්ස, ''මාර මාර '' යි කියනු ලැබෙයි, වහන්ස, කොපමණෙකින් මාර වෙ ද''යි ?.

රාධය, රූපය ඇති කල්හි මරු (මරණය) හෝ මැරිය යුත්තා හෝ මැරෙන්නා හෝ වන්නේ යැ. රාධය, එ හෙයින් මෙහි ලා තෙපි රූපය මරු යයි දකිවු, මැරිය යුත්තා යයි දකිවු, මැරෙන්නා යයි දකිවු, රෝග ය යි දකිවු, ගඩ යයි දකිවු, හුල යයි දකිවු, ව්‍යසන යයි දකිවු ව්‍යසනයට පැමිණියෙකැ යි දකිවු. යම් කෙනෙක් එය (රූපය) මෙ සේ දකිත් ද ඔහු මැනවින් දකිති. වේදනාව ඇති කල්හි මරු හෝ මැරිය යුත්තා හෝ මැරෙන්නා හෝ වන්නේ යැ. රාධය, එ හෙයින් මෙහි ලා තෙපි වේදනාව මරණ යයි දකිවු, මැරිය යුත්තා යයි දකිවු, මැරෙන්නා යයි දකිවු. . . . යම් කෙනෙක් එ වේදනාව මෙසේ දකිත් ද ඔහු මැනවින් දකිති. සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි මරු හෝ මැරිය යුත්තා හෝ මැරෙන්නා හෝ වන්නේ යැ. රාධය, එ හෙයින් මෙහි ලා තෙපි සංස්කාර මරු යයි දකිවු, මැරිය යුත්තා ය යි දකිවු, මැරෙන්නා ය යි දකිවු . . . යම් කෙනෙක් මෙසේ දකිත් ද ඔහු මැනැවින් දකිති. විඥානය ඇති කල්හි මරු හෝ මැරිය යුත්තා හෝ මැරෙන්නා හෝ වන්නේ යැ. රාධය, එහෙයින් මෙහි ලා තෙපි විඥානය මරු යයි දකිවු. මැරිය යුත්තා යි දකිවු. මැරෙන්නා යි දකිවු, රෝග යයි දකිවු, ගඩ යයි දකිවු, හුල යයි දකිවු, ව්‍යසනයයි දකිවු, ව්‍යසනයට පැමිණියෙකැයි දකිවු. යම් කෙනෙක් එ විඥානය මෙසේ දකිත් ද, ඔහු මොනොවට දකිත් යි.

වහන්ස, මොනොවට දක්ම කුමක් අර්ථකොට ඇත් ද ?

රාධය, මොනොවට දක්ම නිර්වෙදය අර්ථකොට ඇත.

වහන්ස, නිර්වෙදය කුමක් අර්ථකොට ඇත් ද ?

රාධය, නිර්වෙදය විරාගය අර්ථකොට ඇත.

වහන්ස, විරාගය කුමක් අර්ථකොට ඇත් ද ?

රාධය, විරාගය විමුක්තිය අර්ථකොට ඇත.



Free Distribution www.aathaapi.org

විමුත්ති පන භන්තෙ කිමත්ථියා'ති ?

විමුත්ති ඛො රාධ, නිබ්බානත්ථා.

නිබ්බානං පන භන්තෙ, කිමත්ථියන්ති ?

අච්චසරා[1] රාධ, පඤ්හං. නාසක්ඛි පඤ්හස්ස පරියන්තං ගහෙතුං. නිබ්බානොගධං හි රාධ, බ්‍රහ්මචරියං වුස්සති නිබ්බානපරායනං නිබ්බානපරියොසානන්ති.

## 2. 1. 2.

### සත්ත සුත්තං

**161.** සාවත්ථියං :

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : සත්තො සත්තොති භන්තෙ, වුච්චති කිත්තාවතා නු ඛො භන්තෙ, සත්තොති වුච්චති ?

රූපෙ ඛො රාධ, යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා, තත්‍ර සත්තො තත්‍ර විසත්තො තස්මා සත්තොති වුච්චති. වෙදනාය යො ඡන්දො යො රාගො -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා තත්‍ර සත්තො තත්‍ර විසත්තො. තස්මා සත්තොති වුච්චති.

සෙය්‍යථා'පි රාධ, කුමාරකා වා කුමාරිකායො[2] වා පංසවාගාරකෙහි කීළන්ති[3] යාවකීවඤ්ච තෙසු පංසවාගාරකෙසු අවිගත'රාගා හොන්ති අවිගත'ච්ඡන්දා අවිගත'පෙමා අවිගත'පිපාසා අවිගත'පරිළාහා අවිගත[4]-තණ්හා තාව තානි පංසවාගාරකානි අල්ලීයන්ති කෙලායන්ති ධනායන්ති[5], මමායන්ති.

යතො ච ඛො රාධ, කුමාරකා වා කුමාරිකායො වා තෙසු පංසවාගාරකෙසු විගතරාගා හොන්ති විගතච්ඡන්දා විගතපෙමා විගතපිපාසා විගතපරිළාහා විගතතණ්හා, අථ ඛො තානි පංසවාගාරකානි හත්ථෙහි ච පාදෙහි ච විකිරන්ති විධමන්ති විද්ධංසෙන්ති විකීළනිකං[6] කරොන්ති.

එවමෙව ඛො රාධ, තුම්හෙපි රූපං විකිරථ විධමථ විද්ධංසෙථ, විකීළනිකං කරොථ. තණ්හක්ඛයාය පටිපජ්ජථ. වෙදනං විකිරථ -පෙ- සඤ්ඤං විකිරථ -පෙ- සඞ්ඛාරෙ විකිරථ -පෙ- විඤ්ඤාණං විකිරථ විධමථ විද්ධංසෙථ විකීළනිකං කරොථ තණ්හක්ඛයාය පටිපජ්ජථ. තණ්හක්ඛයො හි රාධ, නිබ්බානන්ති.

1. අච්චගාරාධ - මජසං.
2. කුමාරියො වා - සිමු, සී 1.
3. පංසවාගාරකෙසු කීළන්තා - සිමු, සී 1. 2
4 අවීත - සයා.
5 මමායන්ති - සීමු. PTS.
6. විකිළනියං - මජසං.

භන්තෙ, විමුක්තිය කුමක් අර්ථකොට ඇත් ද ?

රාධය, විමුක්තිය නිවන අර්ථකොට ඇත.

භන්තෙ, නිවන කුමක් අර්ථකොට ඇත් ද ?

රාධය, ප්‍රශ්නය ඉක්මැවූයෙහි, ප්‍රශ්නයේ කෙළවර ගන්නට අසමත් වූයෙහි. නිවනට බැසගත් නිවන පිහිට කොට ඇති නිවන අවසන් කොට ඇති මහබ්බසර වෙසේ යි.

## 2. 1. 2.

## සත්ත සූත්‍රය

**161. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ : වහන්ස, ''සත්ත සත්ත''යි කියනු ලැබෙයි. වහන්ස, කොපමණෙකින් සත්ත'යි කියනු ලැබේ දැයි ?

රාධය රූපයෙහි යම් කැමැත්තෙක් යම් ඇල්මෙක් යම් සතුටෙක් යම් ආශාවක් වේ ද එහි ඇලුණේ යැ, එහි දැඩි ව ඇලුණේ යි. එ හෙයින් ''සත්ත'යි කියනු ලැබේ යි. වේදනායෙහි යම් කැමැත්තෙක් යම් ඇල්මෙක් . . . සංඥයෙහි . . . සංස්කාර යෙහි . . . විඥනයෙහි යම් කැමැත්තෙක් යම් ඇල්මෙක් යම් සතුටෙක් යම් ආශාවක් වේ ද, එහි ඇලුණේ යැ, එහි දැඩි ව ඇලුණේ යි. එහෙයින්, 'සත්ත' යි කියනු ලැබේ.

රාධය, යම්සේ කුඩාදරුවෝ හෝ කුඩාදැරියෝ හෝ වැලිගෙවලින් කෙළිද්ද, යම්තාක් ඒ වැලිගෙවල නොපහ වූ ඇලුම් ඇත්තෝ නොපහ වූ කැමැත්ත ඇත්තෝ නොපහ වූ ප්‍රේම ඇත්තෝ නොපහ වූ පවස් ඇත්තෝ නොපහ වූ පරිදහ ඇත්තෝ නොපහ වූ ආශා ඇත්තෝ වෙද්ද, ඒතාක් ඒ වැලිගෙවල ඇලුම් කෙරෙති. කෙලායන (ලොල්බව) කෙරෙති. (එය) ධනයක් මෙන් හඟිති. මමත්වය කෙරෙත්.

රාධය,යම් කලෙක කුමරුවෝ හෝ කුමරියෝ හෝ ඒ වැලිගෙවල පහ ව ගිය කැමැත්ත ඇත්තෝ පහවගිය ඇලුම් ඇත්තෝ පහවගිය පෙම් ඇත්තෝ පහවගිය පවස් ඇත්තෝ පහවගිය පරිදහ ඇත්තෝ පහවගිය ආශා ඇත්තෝ වෙද්ද, එ කල්හි ඒ වැලිගෙවල් අතින් ද පයින් ද විසුරුවති, බිඳදමති, වනසති, පහවූ ක්‍රීඩා ඇති කෙරෙත්.

රාධය, එ පරිද්දෙන් ම තොප විසින් රූපය විසුරුවවු, බිඳදමවු, වනසවු, පහ වූ ක්‍රීඩා ඇත්තක් කරවු, තෘෂ්ණාව ක්ෂය කිරීම පිණිස පිළිපදිවු. වේදනාව විසුරුවවු . . . සංඥව විසුරුවවු . . . සංස්කාරයන් විසුරුවවු . . . විඥනය විසුරුවවු, බිඳ දමවු, වනසවු, පහවගිය ක්‍රීඩා ඇත්තක් කරවු, තෘෂ්ණාව ක්ෂය කිරීම පිළිපදිවු, රාධ, තෘෂ්ණා ක්ෂය නිවන යි.

## 2. 1. 3.

## භවනෙත්ති සුත්තං

**162. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො, භගවන්තං එතදවොච: භවනෙත්ති භවනෙත්තීති[1] භන්තෙ, වුච්චති. කතමා නු ඛො භන්තෙ, භවනෙත්ති. කතමො භවනෙත්තිනිරොධොති?

රූපෙ ඛො රාධ, යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයුපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, අයං වුච්චති භවනෙත්ති. තෙසං නිරොධො[2] භවනෙත්තිනිරොධො. වෙදනාය යො ඡන්දො -පෙ- සඤ්ඤාය යො ඡන්දො -පෙ- සඞ්ඛාරෙසු යො ඡන්දො -පෙ- විඤ්ඤාණෙ යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයුපාදානා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, අයං වුච්චති භවනෙත්ති. තෙසං නිරොධො[2] භවනෙත්තිනිරොධොති.

## 2. 1. 4.

## පරිඤ්ඤෙය්‍යා සුත්තං

**163. සාවත්ථියං :**

එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාධං භගවා එතදවොච: පරිඤ්ඤෙය්‍යෙ ච රාධ ධම්මෙ දෙසෙස්සාමි පරිඤ්ඤඤ්ච පරිඤ්ඤාතාවිඤ්ච පුග්ගලං තං සුණාහි. -පෙ- භගවා එතදවොච:

කතමෙ ච රාධ, පරිඤ්ඤෙය්‍යා ධම්මා: රූපං ඛො රාධ, පරිඤ්ඤෙය්‍යො ධම්මො. වෙදනා පරිඤ්ඤෙය්‍යො ධම්මො, සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යො ධම්මො, ඉමෙ වුච්චන්ති රාධ, පරිඤ්ඤෙය්‍යා ධම්මා.

කතමා ච රාධ, පරිඤ්ඤා: යො ඛො රාධ, රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො අයං වුච්චති රාධ, පරිඤ්ඤා.

කතමො ච රාධ, පරිඤ්ඤාතාවී පුග්ගලො?

අරහාතිස්ස වචනීයං. යොයං[3] ආයස්මා එවංනාමො එවංගොත්තො. අයං වුච්චති රාධ, පරිඤ්ඤාතාවී පුග්ගලොති.

1. "භවනෙත්තිනිරොධො භවනෙත්තිනිරොධොති - මජ්සං.
"භවනෙත්ති භවනෙත්තීනිරොධොති, P.T.S
2. නිරොධො - මජ්සං.
3. ය්වායං - මජ්සං.

## 2. 1. 3.
## භවනෙත්ති සූත්‍රය

**162. සැවැත්නුවර :**

එකත්පසෙක හුන් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ : වහන්ස, "භවනෙත්ති, භවනෙත්ති"යි කියනු ලැබෙයි. වහන්ස, 'භවනෙත්තිය' නම් කවරක් ද, 'භවනෙත්තිනිරෝධය' කවරේ දැ යි ?

රාධය, රූපයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තෘෂ්ණාවෙක් යම් උපය උපාදාන කෙනෙක් සිතපිළිබඳ අධිෂ්ඨානඅභිනිවෙසඅනුසය කෙනෙක් වෙත් ද මේ 'භවනෙත්ති' යයි කියනු ලැබේ. ඔවුන්ගේ නිරෝධයෙන් භවනෙත්තිනිරෝධය වේ. වේදනාවෙහි යම් ඡන්දයෙක් . . . සංඥායෙහි යම් ඡන්දයෙක් . . . සංස්කාරයන්හි යම් ඡන්දයෙක් . . . විඥානයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තෘෂ්ණාවෙක් යම් උපයඋපාදාන කෙනෙක්, සිත පිළිබඳ අධිෂ්ඨාන, අභිනිවෙය, අනුසය කෙනෙක් වෙද්ද, මේ 'භවනෙත්ති' යි කියනු ලැබේ. ඔවුන්ගේ නිරෝධයෙන් භවනෙත්තිනිරෝධය වේ ය යි.

## 2. 1. 4.
## පරිඤ්ඤෙය්‍ය සූත්‍රය

**163. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක : "රාධ, පිරිසිඳ දතයුතු දහම් ද, පිරිසිඳ දැනුම ද, පිරිසිඳ දන්නා පුහුලා ද දෙශනා කරන්නෙමි. එය අසව . . . භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක :

රාධය, පිරිසිඳ දතයුතු දහම් කවරැ යත් : රාධය, රූපය පිරිසිඳ දතයුතු දහමෙකි. වේදනාව පිරිසිඳ දතයුතු දහමෙකි. සංඥාව . . . සංස්කාර . . . විඥානය පිරිසිඳ දතයුතු දහමෙකි. රාධය මොහු පිරිසිඳ දතයුතු දහම් ය යි කියනු ලැබෙත්.

රාධය, පිරිසිඳ දැනුම කවරැ යත් : රාධය යම් රාගක්ෂයයෙක් යම් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ ද ; රාධය, මේ පිරිසිඳ දැනුම ය යි කියනු ලැබේ.

රාධ ය, පිරිසිඳ දත් පුහුල් කවරෙ යත් :

මෙබඳු නම් ඇති මෙබඳු ගොත් ඇති යම් මේ ආයුෂ්මත් කෙනෙක් වෙත් නම් හේ අර්හත් ය යි කිය යුතු වන්නේ යි. රාධය, මේ 'පිරිසිඳ දත් පුහුල්' යි කියනු ලැබේ.

## 2. 1. 5.

### සමණ සුත්තං

**164. සාවත්ථියං :**

එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාධං භගවා එතදවොච : පඤ්චිමෙ රාධ, උපාදානක්ඛන්ධා. කතමෙ පඤ්ච, සෙය්‍යථීදං : රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො. යෙ හි කෙචි රාධ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං අස්සාදං ච ආදීනවං ච නිස්සරණං ච යථාභූතං නප්පජානන්ති න මෙ තෙ රාධ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ ච ඛො කෙචි රාධ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං අස්සාදං ච ආදීනවං ච නිස්සරණං ච යථාභූතං පජානන්ති, තෙ ඛො තෙ රාධ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව සමණසම්මතා, බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණසම්මතා, තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථං ච බ්‍රහ්මඤ්ඤත්ථං ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 2. 1. 6.

### දුතිය සමණ සුත්තං

**165. සාවත්ථියං :**

එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාධං භගවා එතදවොච : පඤ්චිමෙ රාධ, උපාදානක්ඛන්ධා. කතමෙ පඤ්ච, සෙය්‍යථීදං : රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො. යෙ හි කෙචි රාධ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයං ච අත්ථඞ්ගමඤ්ච අස්සාදං ච ආදීනවං ච නිස්සරණං ච යථාභූතං නප්පජානන්ති -පෙ- සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 2. 1. 7.

### සොතාපන්න සුත්තං

**166. සාවත්ථියං :**

එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාධං භගවා එතදවොච : පඤ්චිමෙ රාධ, උපාදානක්ඛන්ධා, කතමෙ පඤ්ච, සෙය්‍යථීදං : රූපූපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණූපාදානක්ඛන්ධො

යතො ඛො රාධ, අරියසාවකො ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයං ච අත්ථඞ්ගමං ච අස්සාදං ච ආදීනවං ච නිස්සරණං ච යථාභූතං පජානාති. අයං වුච්චති රාධ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

## 2. 1. 5.

## සමණ සූත්‍රය

**164. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක. රාධය, මේ උපාදනස්කන්ධ පසෙකි. කවර පසෙකැ යත් : එනම් රූපෝපාදනස්කන්ධය: . . . විඥනෝපාදනස්කන්ධ යි. රාධය, යම් කිසි ශ්‍රමණ කෙනෙක් වේවයි බ්‍රාහ්මණ කෙනෙක් වේවයි මේ පඤ්චෝපාදනස්කන්ධයන්ගේ ආස්වාදයත් ආදීනවයත් නිස්සරණ යත් තතු සේ නො දනිද් ද, රාධය, මේ මහණහු හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහිත් මහණහු යයි සම්මත නො වෙති. බමුණන් කෙරෙහිත් බමුණෝ යයි සම්මත නො වෙති. ඒ ආයුෂ්මත්හු මහණ බැව්හි ඵලයත් බමුණු බැව්හි ඵලයත් දිටුදැමියෙහි තෙමේ ම වෙසෙසින් දැන පසක් කොට ඊට එළඹ නො ද වෙසෙති.

රාධය යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ පඤ්චෝපාදන ස්කන්ධයන්ගේ ආස්වාදත් ආදීනවත් නිස්සරණත් තතු සේ දනිද්ද, රාධය, ඒ මහණහු හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහිත් මහණහු යයි සම්මතයහ. බමුණන් කෙරෙහිත් බමුණෝ යයි සම්මත යහ. ඒ ආයුෂ්මත්හු මහණකමෙහි ඵලත් බමුණුකමෙහි ඵලත් දිටුදැමියෙහි තෙමේ ම වෙසෙසින් දැන එයට එළඹ වෙසෙති යි.

## 2. 1. 6.

## දුතිය සමණ සූත්‍රය

**165. සැවැත්නුවර :**

එකත්පස් වැ හුන් ආයුෂ්මත් රාධ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක : ''රාධය මේ උපාදනස්කන්ධ පසෙකි. කවර පසෙකැ යත් : එනම් : රූපෝපාදනස්කන්ධය . . . විඥනෝපාදනස්කන්ධයි. රාධය යම් කිසි මහණ කෙනෙක් වේවයි බමුණු කෙනෙක් වේවයි මේ පඤ්චෝපාදනස්කන්ධයන්ගේ සමුදයයත් අස්තංගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනිද්ද . . . තෙමේ ම වෙසෙසින් දැන පසක් කොට එයට එළැඹ වෙසෙති'' යි.

## 2. 1. 7.

## සෝතාපන්න සූත්‍රය

**166. සැවැත්නුවර :**

එකත්පස් වැ හුන් ආයුෂ්මත් රාධ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදාළ සේක : ''රාධය, මේ උපාදනස්කන්ධ පසෙකි. කවර පසෙකැ යත් : එනම් : රූපෝපාදන ස්කන්ධය . . . විඥනෝපාදනස්කන්ධයි.

රාධය යම් කලෙක ආර්‍යශ්‍රාවක තෙමේ මේ පඤ්චෝපාදනස්කන්ධයන්ගේ සමුදයයත් අස්තංගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දනී ද, රාධ, මේ ආර්‍ය ශ්‍රාවක සිවු අපායෙහි නොවැටෙන සැහැවි ඇති ගතිනියත වූ සම්බෝධිය පිහිට කොට ඇති සෝතාපන්න ය යි කියනු ලැබේ'' යි.

## 2. 1. 8.

### අරහන්ත සුත්තං

**167. සාවත්ථියං :**

එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාධං භගවා එතදවොච: පඤ්චිමෙ රාධ, උපාදානක්ඛන්ධා. කතමෙ පඤ්ච, සෙය්‍යථීදං: රූපුපාදානක්ඛන්ධො -පෙ- විඤ්ඤාණුපාදානක්ඛන්ධො.

යතො ඛො රාධ, භික්ඛු ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තො හොති, අයං වුච්චති රාධ, භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තොති.

## 2. 1. 9.

### ඡන්දරාග සුත්තං

**168. සාවත්ථියං :**

එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාධං භගවා එතදවොච:

රූපෙ ඛො රාධ, යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා තං පජහථ. එවං තං රූපං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං. වෙදනාය යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා තං පජහථ. එවං සා වෙදනා පහීනා භවිස්සති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා තං පජහථ. එවං තෙ සඞ්ඛාරා පහීනා භවිස්සන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. විඤ්ඤාණෙ යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා තං පජහථ. එවං තං විඤ්ඤාණං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මන්ති.

## 2. 1. 10.

### දුතිය ඡන්දරාග සුත්තං

**169. සාවත්ථියං :**

එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාධං භගවා එතදවොච:

රූපෙ ඛො රාධ, යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයූපාදානා[1] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා තෙ පජහථ. එවං තං රූපං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං

1. උපායුපාදානා - සීමු.

## 2. 1. 8.

## අරහත්ත සූත්‍රය

**167. සැවැත්නුවර :**

එකත්පස් වැ හුන් ආයුෂ්මත් රාධ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක : ''රාධය, මේ උපාදනස්කන්ධ පසෙකි කවර පසෙකැ යත් : එනම් : රූපොපාදනස් කන්ධ ය . . . විඥනොපාදනස්කන්ධ යි.

රාධ, යම් කලෙක මහණ මේ පඤ්චොපාදනස්කන්ධයන්ගේ සමුදයයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතු සේ දන දැඩි ලෙස නො ගෙන මිදුණේ වේ ද, රාධ, මේ මහණ ක්ෂය වූ කෙලෙස් ඇති වැස නිම වූ බඹසර ඇති කළ සිවුමඟ කිස ඇති, බහා තැබූ (ස්කන්ධ) බර ඇති පිළිවෙළින් පැමිණි ස්වාර්ථ ඇති ක්ෂය කළ බවබැඳුම් ඇති මැනැවින් දන මිදුණු රහතැ යි කියනු ලැබේ''යි.

## 2. 1. 9.

## ඡන්දරාග සූත්‍රය

**168. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක :

''රාධ, රූපයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තෘෂ්ණායෙක් ඇත් ද එ දුරු කරවු. මෙසේ ඒ රූපය ප්‍රහීණ වූයේ උසුන්මුල් ඇත්තේ හිස් සුන් තල්ගසක් මෙන් (සහමුලින් උදුරා හළ තල්ගස ඇති තැන මෙන්) කරන ලද්දේ නැවත නොහටගන්නක් කරන ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තේ වන්නේ ය. වෙදනායෙහි යම්, ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තෘෂ්ණායෙක් ඇත් ද එය දුරු කරවු. මෙසේ ඒ වේදනාව ප්‍රහීණ වූවා උසුන්මුල් ඇත්තී හිස්සුන් තල්ගසක් මෙන් කරන ලද්දී නැවත නොහටගන්නක් කරන ලද්දී මතු නූපදනා ස්වභාව ඇත්තී වන්නී ය. සංඥයෙහි . . . සංස්කාරයන්හි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තෘෂ්ණාවක් වේ නම් එය දුරු කරවු. මෙසේ ඒ සංස්කාරයෝ ප්‍රහීණ වූවාහු උසුන්මුල් ඇත්තාහු හිස් සුන් තල්ගසක් මෙන් (තාලා වත්ථුවක් මෙන්) කරන ලද්දහු නැවත නොහටගන්න වුන් කරන ලද්දහු මතු නූපදනා ස්වභාව ඇත්තාහු වන්නාහ. විඥනයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තෘෂ්ණාවක් වේ නම් එය දුරු කරවු. මෙසේ ඒ විඥනය ප්‍රහීණ වූයේ උසුන්මුල් ඇත්තේ හිස් සුන් තල්ගසක් මෙන් (තාලාවත්ථුවක් මෙන්) කරන ලද්දේ නැවත නොහටගන්නක් කරන ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තේ වන්නේ ය''යි.

## 2. 1. 10.

## දුතිය ඡන්දරාග සූත්‍රය

**169. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරුනට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක :

රාධය, රූපයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තණ්හාවක් යම් උපයඋපාදන කෙනෙක් සිත පිළිබඳ අධිෂ්ඨානඅභිනිවෙසඅනුසය කෙනෙක් වෙත් නම් ඔවුන් දුරු කරවු. මෙසේ ඒ රූපය ප්‍රහීණ වූයේ උසුන්මුල් ඇත්තේ හිස් සුන් තල්ගසක්

අනභාවකතං ආයතිං අනුප්පාදධම්මං. වෙදනාය යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයුපාදනා චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා තෙ පජහථ. එවං සා වෙදනා පහීනා භවිස්සති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයුපාදනා[1] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා තෙ පජහථ. එවං තෙ සංඛාරා පහීනා භවිස්සන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. විඤ්ඤාණෙ යො ඡන්දො යො රාගො යා නන්දි යා තණ්හා යෙ උපයුපාදනා[1] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා තෙ පජහථ. එවං තං විඤ්ඤාණං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං අනභාවකතං ආයතිං අනුප්පාදධම්මන්ති.

**මාරවග්ගො පඨමො.**

තස්සුද්දානං:

මාරො සත්තො භවනෙත්ති - පරිඤ්ඤෙය්‍යා සමණා දුවෙ,
සොතාපන්නො අරහා ච - දුවෙ ච ඡන්දරාගිනාති.

1. උපායුපාදනා - සීමු.

(හෝ සහමුලින් උදුරාහළ තල් ගය ඇති තැන මෙන්) මෙන් කරන ලද්දේ නැවත නොහටගන්නක් කරන ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තේ වන්නේ ය. වේදනායෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තණ්හාවක් යම් උපයඋපාදන කෙනෙක් සිත පිළිබඳ අධිෂ්ඨානඅභිනිවෙසඅනුසය කෙනෙක් වෙත් නම් ඔවුන් දුරු කරවු. මෙසේ ඒ වෙදනාව ප්‍රහීණ වූවා උසුන්මුල් ඇත්තී හිස් සුන් තල් ගසක් මෙන් (තාලාවස්තුවක් මෙන්) කරන ලද්දී නැවත නොහටගන්නක් කරන ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තී වන්නී ය. සංඥායෙහි . . . සංස්කාරයන්හී යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තණ්හාවක් යම් උපයඋපාදන කෙනෙක් සිත පිළිබඳ අධිෂ්ඨාන අභිනිවෙස අනුසය කෙනෙක් වෙත් නම් ඔවුන් දුරු කරවු. මෙසේ ඒ සංස්කාරයෝ ප්‍රහීණ වූවාහු උසුන්මුල් ඇත්තාහු හිස් සුන් තල්ගසක් මෙන් (තාලාවස්තුවක් මෙන්) කරන ලද්දහු නැවත නොහටගන්නවුන් කරන ලද්දහු මතු නූපදනා ස්වභාව ඇත්තාහු වන්නාහ. විඥනයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තණ්හාවක් යම් උපය උපාදන කෙනෙක් සිත පිළිබඳ අධිෂ්ඨාන අභිනිවෙස අනුසය කෙනෙක් වෙත් නම් ඔවුන් දුරු කරවු. මෙසේ ඒ විඥනය ප්‍රහීණ වූයේ උසුන්මුල් ඇත්තේ හිස් සුන් තල්ගසක් මෙන් (තාලාවස්තුවක් මෙන්) කරන ලද්දේ නැවත නොහටගන්නක් කරන ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තේ වන්නේ ය''යි.

### පළමුවැනි මාර වර්ග යි

**එහි සූත්‍රනාමාවලිය :**

මාර, සත්ත, භවනෙත්ති, පරිඤ්ඤෙය යන සූත්‍ර සතර ය, සමණසූත්‍ර දෙක ය, සොතාපන්න සූත්‍ර ය අරහන්ත සූත්‍රය ඡන්දරාගසූත්‍ර දෙක ය යි සූත්‍ර දශයෙකි.

## 2. දුතිය මාරවග්ගො

### 2. 2. 1.

### මාර සුත්තං

170. සාවත්ථියං :

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : 'මාරො මාරො'ති භන්තෙ, වුච්චති, කතමො නු ඛො භන්තෙ මාරොති ?

රූපං ඛො රාධ මාරො, වෙදනා මාරො, සඤ්ඤා මාරො, සඞ්ඛාරා මාරො, විඤ්ඤාණං මාරො. එවං පස්සං රාධ සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති. නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 2. 2. 2.

### මාරධම්ම සුත්තං

171. සාවත්ථියං :

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : "මාරධම්මො මාරධම්මො"ති භන්තෙ, වුච්චති. කතමො නු ඛො භන්තෙ, මාරධම්මොති ?

රූපං ඛො රාධ, මාරධම්මො, වෙදනා මාරධම්මො, සඤ්ඤා මාරධම්මො, සඞ්ඛාරා මාරධම්මො, විඤ්ඤාණං මාරධම්මො, එවං පස්සං රාධ, සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### 2. 2. 3.

### අනිච්ච සුත්තං

172. සාවත්ථියං :

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : "අනිච්චං අනිච්චන්ති" භන්තෙ, වුච්චති. කතමන්නු ඛො භන්තෙ, අනිච්චන්ති ?

රූපං ඛො රාධ, අනිච්චං, වෙදනා අනිච්චා සඤ්ඤා අනිච්චා සඞ්ඛාරා අනිච්චා විඤ්ඤාණං අනිච්චං. එවං පස්සං රාධ, සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.



Free Distribution www.aathaapi.org

# 2. දුතිය මාර වර්ගය

## 2. 2. 1.

## මාර සූත්‍රය

**170. සැවැත්නුවර :**

එකත්පසෙකැ හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කළහ : වහන්ස, 'මාර, මාර'යි කියනු ලැබෙයි. වහන්ස, 'මාර' නම් කවරෙ යැ?

රාධය, රූපය මාර යැ, වේදනාව මාර යැ, සංඥාව මාර යැ, සංස්කාර මාර යැ, විඥානය මාර යි. රාධය, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක රූපයෙහි ද කලකිරෙයි, වේදනායෙහි ද කලකිරෙයි, සංඥායෙහි ද කලකිරෙයි, සංස්කාරයෙහි ද කලකිරෙයි, විඥානයෙහි ද කලකිරේ. කලකිරෙනුයේ නො ඇලෙයි, නො ඇලීම් හේතුයෙන් (පස්කඳින්) මිදෙයි, මිදුණු කල්හි මිදිණැ යි පස්විකුම් නැණ වෙයි, දිය ගෙවිණැ, මහබඹසර වැස නිමවන ලද, සිවුමඟ කිස කොට නිමවන ලද, මේ රහත් බව සඳහා කළ යුතු අන් කිසෙක් නැතැ යි දැනැගනී.

## 2. 2. 2.

## මාරධම්ම සූත්‍රය

**171. සැවැත්නුවර :**

එකත් පසෙකැ හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල, සැලකළහ : වහන්ස, 'මාරධම්ම, මාරධම්ම' යි කියනු ලැබෙයි. වහන්ස, 'මාර ධම්ම' නම් කවරෙ යැ ?

රාධය, රූපය මාරධම්ම යැ, වේදනාව මාරධම්ම යැ, සංඥාව මාරධම්ම යැ, සංස්කාර මාරධම්ම යැ, විඥානය මාරධම්ම යි. රාධ, මෙසේ දක්නා ආර්‍ය්‍යශ්‍රාවක . . . මේ රහත් බව පිණිස අන් කිසෙක් නැතැ යි දැනගනී.

## 2. 2. 3.

## අනිච්ච සූත්‍රය

**172. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකළහ : "වහන්ස, අනිත්‍ය යැ, අනිත්‍ය'යි කියනු ලැබෙයි, වහන්ස, අනිත්‍ය නම් කිමෙක් දෝ"යි ?

රාධය, රූපය අනිත්‍ය යැ, වේදනාව අනිත්‍ය යැ, සංඥාව අනිත්‍ය යැ, සංස්කාර අනිත්‍ය යැ. විඥානය අනිත්‍ය යි. රාධය, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍ය්‍යශ්‍රාවක . . . මේ බැව් පිණිස අනෙකෙක් නැතැ යි දැනගනී.



25—ඒ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

## 2. 2. 4.

### අනිච්චධම්ම සුත්තං

**173. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : "අනිච්චධම්මො අනිච්චධම්මොති" භන්තෙ වුච්චති, කතමො නු ඛො භන්තෙ, අනිච්චධම්මොති ?

රූපං ඛො රාධ, අනිච්චධම්මො වෙදනා අනිච්චධම්මො සඤ්ඤා අනිච්චධම්මො සඞ්ඛාරා අනිච්චධම්මො විඤ්ඤාණං අනිච්චධම්මො, එවං පස්සං රාධ, සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 2. 2. 5.

### දුක්ඛ සුත්තං

**174. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : "දුක්ඛං දුක්ඛ"න්ති භන්තෙ, වුච්චති. කතමන්නු ඛො භන්තෙ, දුක්ඛන්ති ?

රූපං ඛො රාධ, දුක්ඛං, වෙදනා දුක්ඛා සඤ්ඤා දුක්ඛා සඞ්ඛාරා දුක්ඛා විඤ්ඤාණං දුක්ඛං. එවං පස්සං රාධ සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 2. 2. 6.

### දුක්ඛධම්ම සුත්තං

**175. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : "දුක්ඛධම්මො දුක්ඛධම්මො"ති භන්තෙ, වුච්චති. කතමො නු ඛො භන්තෙ, දුක්ඛධම්මොති ?

රූපං ඛො රාධ, දුක්ඛධම්මො වෙදනා දුක්ඛධම්මො සඤ්ඤා දුක්ඛධම්මො සඞ්ඛාරා දුක්ඛධම්මො විඤ්ඤාණං දුක්ඛධම්මො, එවං පස්සං රාධ සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 2. 2. 4.

## අනිච්චධම්ම සූත්‍රය

**173. සැවැත්නුවර :**

එකත්පසෙක හුන් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළහ : ''වහන්ස, ''අනිච්චධම්ම යැ. අනිච්චධම්ම''යි කියනු ලැබෙයි, වහන්ස, අනිච්චධම්ම කිමෙක් දෝ යි ?

රාධය රූපය අනිත්‍ය ස්වභාවය ඇත්තේ යැ. වේදනාව අනිත්‍ය ස්වභාවය ඇත්තී යැ. සංඥාව අනිත්‍යස්වභාවය ඇත්තී යැ. සංස්කාරයෝ අනිත්‍ය ස්වභාවය ඇතියහ. විඥානය අනිත්‍යස්වභාවය ඇත්තේ යි. රාධය මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක . . . මේ රහත් බැව් පිණිස අනෙකෙක් නැතැ යි දැනගනී.

## 2. 2. 5.

## දුක්ඛ සූත්‍රය

**174. සැවැත්නුවර :**

එකත්පස් වැ හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කළහ. : වහන්ස, දුක්ඛ, දුක්ඛ යි කියනු ලැබෙයි, වහන්ස, දුක්ඛ නම් කිමෙක් දෝ''යි ?

රාධය රූපය දුක් යැ, වේදනාව දුක් යැ, සංඥාව දුක් යැ, සංස්කාර දුක් යැ, විඥානය දුක යි. රාධය මෙසේ දක්නා මේ ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක . . . මේ රහත් බව පිණිස අනෙකෙක් නැතැ යි දැනගනී.

## 2. 2. 6.

## දුක්ඛධම්ම සූත්‍රය

**175. සැවැත්නුවර :**

එකත් පසෙකැ හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කළහ : ''වහන්ස, ''දුක්ඛධම්ම දුක්ඛධම්ම''යි කියනු ලැබේ'' වහන්ස, දුක්ඛධම්ම කිමෙක් දෝ හෝ යි ?

රාධය, රූපය දුඃඛස්වභාවය ඇත්තේ ය. වේදනාව දුඃඛස්වභාවය ඇත්තී ය, සංඥාව දුඃඛස්වභාවය ඇත්තී ය, සංස්කාරයෝ දුඃඛස්වභාවය ඇතියහ. විඥානය දුඃඛස්වභාවය ඇත්තේ යි. මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක . . . මේ රහත් බව පිණිස අනෙකෙක් නැතැ යි දැනගනී.

## 2. 2. 7.

### අනත්ත සුත්තං

**176. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : "අනත්තා අනත්තා"ති භන්තෙ, වුච්චති. කතමො නු ඛො භන්තෙ, අනත්තාති?

රූපං ඛො රාධ, අනත්තා වෙදනා අනත්තා සඤ්ඤා අනත්තා සඞ්ඛාරා අනත්තා විඤ්ඤාණං අනත්තා. එවං පස්සං රාධ සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 2. 2. 8.

### අනත්තධම්ම සුත්තං

**177 සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : "අනත්තධම්මො, අනත්තධම්මො"ති භන්තෙ, වුච්චති. කතමො නු ඛො භන්තෙ, අනත්තධම්මොති?

රූපං ඛො රාධ, අනත්තධම්මො, වෙදනා අනත්තධම්මො, සඤ්ඤා අනත්තධම්මො, සඞ්ඛාරා අනත්තධම්මො, විඤ්ඤාණං අනත්තධම්මො. එවං පස්සං රාධ, සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 2. 2. 9.

### ඛයධම්ම සුත්තං

**178. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : "ඛයධම්මො ඛයධම්මො"ති භන්තෙ, වුච්චති. කතමො නු ඛො භන්තෙ, ඛයධම්මොති?

රූපං ඛො රාධ, ඛයධම්මො, වෙදනා ඛයධම්මො, සඤ්ඤා ඛයධම්මො සඞ්ඛාරා ඛයධම්මො, විඤ්ඤාණං ඛයධම්මො. එවං පස්සං රාධ සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

Free Distribution www.aathaapi.org

## 2. 2. 7.

## අනත්ත සූත්‍රය

176. සැවැත්නුවර :

එකත් පසෙක හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, 'අනාත්ම යැ. අනාත්ම යැ' යි කියනු ලැබේ. වහන්ස, අනාත්මය නම් කිමෙක් දෝ ? යි.

''රාධය, රූපය අනාත්ම යැ, වේදනාව අනාත්ම යැ, සංඥාව අනාත්ම යැ, සංස්කාරයෝ අනාත්මයහ, විඥානය අනාත්ම යි. රාධය, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක . . . මේ රහත් බව පිණිස අනෙකෙක් නැතැ යි දනගනී.

## 2. 2. 8.

## අනත්තධම්ම සූත්‍රය

177. සැවැත්නුවර :

එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, 'අනාත්මස්වභාව යැ, අනාත්මස්වභාව යැ'යි කියනු ලැබෙයි, වහන්ස, අනාත්මස්වභාවය ඇත්තේ කිමෙක් දෝ''යි.

''රාධය, රූපය, අනාත්මස්වභාව යැ, වේදනාව අනාත්මස්වභාව යැ, සංඥාව අනාත්ම ස්වභාව යැ. සංස්කාර අනාත්මස්වභාව යැ විඥානය අනාත්ම ස්වභාව යැ. රාධය මෙසේ දක්නා . . . ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක මේ රහත් බව පිණිස අනෙකෙක් නැතැ යි දනගනි''.

## 2. 2. 9.

## ඛයධම්ම සූත්‍රය

178. සැවැත්නුවර :

එකත්පසෙකැ හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : ''වහන්ස, 'ඛයධම්ම, ඛයධම්ම (නැසෙන සුලු)''යි කියනු ලැබේ. වහන්ස කිමෙක් ඛයධම්ම වේ දැ යි

රාධය, රූපය ඛයධම්ම යැ, වේදනාව ඛයධම්ම යැ. සංඥාව ඛයධම්ම යැ. සංස්කාර ඛයධම්ම යැ, විඥානය ඛයධම්ම යි. රාධය මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍යශ්‍රාවක . . . මේ රහත් බව පිණිස අනෙකෙක් නැතැ යි දනගනි''.

## 2. 2. 10.

### වයධම්ම සුත්තං

**179. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: "වයධම්මො වයධම්මො"ති භන්තෙ, වුච්චති. කතමො නු ඛො භන්තෙ, වයධම්මොති?

රූපං ඛො රාධ, වයධම්මො වෙදනා වයධම්මො සඤ්ඤා වයධම්මො සඞ්ඛාරා වයධම්මො, විඤ්ඤාණං වයධම්මො. එවං පස්සං රාධ, සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 2. 2. 11.

### සමුදයධම්ම සුත්තං

**180. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: "සමුදයධම්මො සමුදයධම්මො"ති භන්තෙ, වුච්චති. කතමො නු ඛො භන්තෙ, සමුදයධම්මොති?

රූපං ඛො රාධ, සමුදයධම්මො වෙදනා සමුදයධම්මො සඤ්ඤා සමුදයධම්මො සඞ්ඛාරා සමුදයධම්මො විඤ්ඤාණං සමුදයධම්මො. එවං පස්සං රාධ සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

## 2. 2. 12.

### නිරොධධම්ම සුත්තං

**181. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: "නිරොධධම්මො නිරොධධම්මො"ති භන්තෙ වුච්චති. කතමො නු ඛො භන්තෙ, නිරොධධම්මොති.

රූපං ඛො රාධ, නිරොධධම්මො වෙදනා නිරොධධම්මො සඤ්ඤා නිරොධධම්මො. සඞ්ඛාරා නිරොධධම්මො විඤ්ඤාණං නිරොධධම්මො. එවං පස්සං රාධ, සුතවා අරියසාවකො -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

### දුතිය මාරවග්ගො

**තත්‍රුද්දානං:**

මාරො ච මාරධම්මො ච අනිච්චෙන අපරෙ දුවෙ,
දුක්ඛෙන ච දුවෙ වුත්තා අනත්තෙන තථෙව ච
ඛයවයසමුදයධම්මා නිරොධධම්මෙන ආදසාති.

## 2. 2. 10.

## වයධම්ම සූත්‍රය

179. සැවැත්නුවර :

එකක්පසෙකැ හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, ''වයධම්ම, වයධම්ම (වැනසෙන සුලු) යි කියනු ලැබෙයි, 'වහන්ස කිමෙක් වයධම්ම වේ ද''යි ?

රාධය, රූපය වයධම්ම යැ. වේදනාව වයධම්ම යැ. සංඥාව වයධම්ම යැ. සංස්කාර වයධම්ම යැ විඥානය වයධම්ම යි. රාධය මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවක . . . මේ රහත් බව පිණිස අනෙකෙක් නැතැ යි දනගනී.

## 2. 2. 11.

## සමුදයධම්ම සූත්‍රය

180· සැවැත්නුවර :

එකත්පස් ව හුන් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, 'සමුදයධම්ම, සමුදයධම්ම (හටගන්නාසුලු)' යි කියනු ලැබෙයි, වහන්ස, කිමෙක් සමුදය ධම්ම වේ ද යි ?

රාධය, රූපය සමුදයධම්ම යැ. වේදනාව සමුදයධම්ම යැ. සංඥාව, සමුදයධම්ම යැ. සංස්කාර සමුදයධම්ම යැ. විඥානය සමුදයධම්ම යි. රාධය මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවක . . . මේ රහත් බව පිණිස අනෙකෙක් නැතැ යි දනගනී.

## 2. 2. 12.

## නිරොධධම්ම සූත්‍රය

181. සැවැත්නුවර :

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, 'නිරොධධම්ම, නිරොධධම්ම (නිරුද්ධ වනසුලු)' යි කියනු ලැබෙයි. වහන්ස, කිමෙක් නිරොධධම්ම වේ ද''යි.

''රාධය රූපය 'නිරොධධම්ම යැ, වේදනාව නිරොධධම්ම යැ, සංඥාව නිරොධධම්ම යැ. සංස්කාර නිරොධධම්ම යැ, විඥානය නිරොධධම්ම යි. රාධය, මෙසේ දක්නා ශ්‍රුතවත් ආර්‍යශ්‍රාවක . . . මේ රහත් බව පිණිස අනෙකෙක් නැතැ''යි දනගනීයි.

දුතිය මාරවර්ග යි

එහි සූත්‍රනාමාවලිය :

මාර සූත්‍රය ද, මාරධම්ම සූත්‍රය ද, අනිත් අනිච්ච සූත්‍ර දෙකෙක් ද, දුක්ඛ සූත්‍ර දෙකෙක් ද කියන ලද යැ. එසේ ම අනත්ත සූත්‍ර ද දෙකෙකි. ඛයධම්ම වයධම්ම සමුදයධම්ම සූත්‍රයෝ ද වෙති. නිරොධධම්ම සූත්‍රයෙන් (ඔහු) දෙළසෙක් වෙත්.

## 3. ආයාචනවග්ගො

### 2. 3. 1.

### මාරසුත්තං

**182. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.

යො ඛො රාධ, මාරො තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො[1] පහාතබ්බො, ඡන්දරාගො[2] පහාතබ්බො. කො ච රාධ, මාරො :

රූපං ඛො රාධ, මාරො තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො[1] පහාතබ්බො, ඡන්දරාගො[2] පහාතබ්බො වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං මාරො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො[1] පහාතබ්බො, ඡන්දරාගො[2] පහාතබ්බො. යො ඛො රාධ, මාරො තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො[1] පහාතබ්බො, ඡන්දරාගො[2] පහාතබ්බොති.

### 2. 3. 2.

### මාරධම්ම සුත්තං

**183. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච : සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු -පෙ- පහිතත්තො විහරෙය්‍යන්ති.

යො ඛො රාධ, මාරධම්මො තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. කො ච රාධ, මාරධම්මො : රූපං ඛො රාධ මාරධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං මාරධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, මාරධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති

1. තත්‍ර තෙ රාගො - සීමු.
2. තත්‍ර තෙ ඡන්දරාගො - සීමු.



Free Distribution www.aathaapi.org

# 3. ආයාවතා වර්ගය

## 2. 3. 1.

## මාර සූත්‍රය

**182. සැවැත්නුවර :**

**එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, මම් භාග්‍යවතුන් වහන්සේ වෙතින් යම් දහමක් අසා එකලා වැ ගණයා කෙරෙන් වෙන් වැ නොපමා වැ කෙලෙස් තවන වැර ඇති වැ නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති වැ වෙසෙම් ද, භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක් නම් මැනැවැ''යි.**

රාධය, යමෙක් මාර ද, එහි තොපගේ ඡන්දය (දුර්වල රාගය) දුරු කටයුතු යැ. රාගය (බලවත් රාගය) පහකටයුතු යැ. ඡන්දරාගය පහකටයුතු යි. රාධය මාර කවරේ ද යත් :

රාධ, රූපය මාර යැ. එහි ලා තොපගේ ඡන්දය පහ කටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය මාර යැ, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ. රාගය පහ කටයුතු යැ. ඡන්ද රාගය පහකටයුතු යි. රාධය යමෙක් මරු ද එහි ඡන්දය පහකටයුතුය, රාගය පහකට යුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි.

## 2. 3. 2.

## මාරධම්ම සූත්‍රය

**183. සැවැත්නුවර :**

**එකත්පසෙකැ හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, . . . නිවන් පිණිස යොමුකළ සිත් ඇති වැ වෙසෙන්නෙම් ද භාග්‍ය වතුන් වහන්සේ එ බඳු දහමක් මට සැකෙවින් දෙසනසේක් නම් මැනැවැ''යි.**

රාධය, යමෙක් මරණධර්ම (මැරෙනසුලු) නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය, කවරෙක් මරණධර්ම වේ ද යත්: රාධය, රූපය මරණධර්ම යැ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ. රාගය පහකටයුතුයැ, ඡන්දරාගය පහකට යුතු යි. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය මරණධර්ම ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි, රාධය, යමෙක් මරණධර්ම නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ. ඡන්දරාගය පහකටයුතු යි.

## 2. 3. 3.

## අනිච්ච සුත්තං

184. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු -පෙ- පහිතත්තො විහරෙය්‍යන්ති.

යං ඛො රාධ, අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො, කිඤ්ච රාධ, අනිච්චං? රූපං ඛො රාධ, අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො ඡන්දරාගො පහාතබ්බො වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සංඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යං ඛො රාධ, අනිච්චං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 3. 4.

## අනිච්චධම්ම සුත්තං

185. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු -පෙ- පහිතත්තො විහරෙය්‍යන්ති.

යො ඛො රාධ, අනිච්චධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො.

කො ච රාධ, අනිච්චධම්මො: රූපං ඛො රාධ, අනිච්චධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සංඛාරා -පෙ- විඤ්ඤාණං අනිච්චධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, අනිච්චධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 3. 5.

## දුක්ඛ සුත්තං

186. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු -පෙ- පහිතත්තො විහරෙය්‍යන්ති.

## 2. 3. 3.

## අනිච්ච සූත්‍රය

184. සැවැත්නුවර :

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, . . . නිවන් පිණිස යොමු කළ සිත් ඇති වැ වෙසෙන්නෙම් ද භාග්‍යවතුන් වහන්සේ එ බඳු දහමක් මට සැකෙවින් දේශනා කරන සේක් නම් මැනැවැ''යි.

රාධය, යමෙක් අනිත්‍ය නම් එහි ලා තොපගේ ඡන්දය පහකළයුතු යැ, රාගය පහකළ යුතු යැ, ඡන්දරාගය පහකළයුතු යි. රාධය, කිමෙක් අනිත්‍ය ද යත් : රාධය, රූපය අනිත්‍ය යැ, එහි ලා තොපගේ ඡන්දය පහකළයුතු යැ, රාගය පහකළයුතු යැ, ඡන්දරාගය පහකළයුතු යි. වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය අනිත්‍ය යැ. එහි ලා තොපගේ ඡන්දය පහකළයුතු යැ, රාගය පහකළයුතු යැ, ඡන්දරාගය පහකළ යුතු යි. රාධය යමෙක් අනිත්‍ය නම් එහි ලා තොපගේ ඡන්දය පහකළයුතු යැ, රාගය පහකළයුතු යැ, ඡන්දරාගය පහකළයුතු යි.

## 2. 3. 4.

## අනිච්චධම්ම සූත්‍රය

185. සැවැත්නුවර :

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, . . . නිවන් පිණිස යොමු කළ සිත් ඇති වැ වෙසෙන්නෙම් ද, භාග්‍යවතුන් වහන්සේ එ බඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක් නම් මැනැවැ''යි.

රාධය, යමෙක් අනිත්‍ය ස්වභාව ඇත්තේ නම් එහි ලා තොපගේ ඡන්දය පහකළයුතු ය, රාගය පහකළයුතු යැ. ඡන්දරාගය පහකළයුතු යි.

රාධ, කිමෙක් අනිත්‍ය ස්වභාව ඇත්තේ ද යත් : රාධය, රූපය අනිත්‍ය ස්වභාව ඇත්තේ යැ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ. රාගය පහකටයුතු යැ, ඡන්ද රාගය පහකටයුතු යි. වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය අනිත්‍ය ස්වභාව ඇත්තේ යැ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ. රාගය පහකට යුතු යැ. ඡන්දරාගය පහකටයුතු යි. රාධය, යමෙක් අනිත්‍ය ස්වභාව ඇත්තේ නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ. රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකට යුතු යි.

## 2. 3. 5.

## දුක්ඛ සූත්‍රය

186. සැවැත්නුවර :

එකත්පසෙක හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, . . . ''නිවන් පිණිස යොමු කළ සිත් ඇති වැ වෙසෙන්නෙම් ද භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක් නම් මැනැවැ''යි.

යං ඛො රාධ, දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. කිං ච රාධ, දුක්ඛං: රූපං ඛො රාධ, දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා- පෙ- විඤ්ඤාණං දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යං ඛො රාධ, දුක්ඛං, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 3. 6.

## දුක්ඛධම්ම සුත්තං

**187. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු -පෙ- විහරෙය්‍යන්ති.

යො ඛො රාධ, දුක්ඛධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. කො ච රාධ, දුක්ඛධම්මො: රූපං ඛො රාධ, දුක්ඛධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං දුක්ඛධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, දුක්ඛධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 3. 7.

## අනත්ත සුත්තං

**188. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු -පෙ- පහිතත්තො විහරෙය්‍යන්ති.

යො ඛො රාධ, අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. කො ච රාධ අනත්තා: රූපං ඛො රාධ, අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, අනත්තා, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

රාධය, යමෙක් දුක් නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යෑ, රාගය පහකට යුතු යෑ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය, කිමෙක් දුක් ද යත් : රාධය, රූපය දුක් යෑ, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යෑ, රාගය පහකටයුතු යෑ, ඡන්දරාගය පහකට යුතු යි. වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය දුක් ය, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යෑ. රාගය පහකටයුතු යෑ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය, යමෙක් දුක් නම් එහි ලා තොපගේ ඡන්දය පහකළයුතු යෑ. රාගය පහකට යුතු යෑ. ඡන්දරාගය පහකළයුතු යි.

## 2. 3. 6.

## දුක්ඛධර්ම සූත්‍රය

**187. සැවැත්නුවර :**

**එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, . . . නිවන් කරා යොමු කළ සිතැති වැ වෙසෙන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක් නම් මැනැවැ''යි**

රාධය, යමෙක් දුක්ඛ ස්වභාව ඇත්තේ නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යෑ. රාගය පහ කටයුතු යෑ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය, කිමෙක් දුඃඛස්වභාව ඇත්තේ ද යත් : රාධය, රූපය දුඃඛස්වභාව ඇත්තේ යෑ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යෑ. රාගය පහකටයුතු යෑ. ඡන්දරාගය පහකටයුතු යි. වේදනාව . . . සංඥාව . . . සංස්කාරය . . . විඥානය දුඃඛස්වභාව ඇත්තේ යෑ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යෑ, රාගය පහකටයුතු යෑ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය යමක් දුඃඛස්වභාව ඇත්තේ නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යෑ, රාගය පහකටයුතු යෑ, ඡන්දරාගය පහකටයුතු යි.

## 2. 3. 7.

## අනාත්ත සූත්‍රය

**188. සැවැත්නුවර :**

**එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ : වහන්ස, . . . ''නිවන් කරා යොමු කළ සිත් ඇති වැ වෙසෙන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක් නම් යහපතැ යි.**

රාධය, යමෙක් අනාත්ම නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යෑ. රාගය පහ කටයුතු යෑ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය, කිමෙක් අනාත්ම ද යත් : රාධය, රූපය අනාත්ම යෑ ; එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යෑ, රාගය පහකට යුතු යෑ, ඡන්දරාගය පහකටයුතු යි. වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය අනාත්ම යෑ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යෑ, රාගය පහකටයුතු යෑ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය, යමෙක් අනාත්ම නම් එහි ලා තොපගේ ඡන්දය පහකට යුතු යෑ, රාගය පහකටයුතු යෑ, ඡන්දරාගය පහකටයුතු යි.

## 2. 3. 8.

### අනත්තධම්ම සුත්තං

189. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු -පෙ- පහිතත්තො විහරෙය්‍යන්ති.

යො ඛො රාධ, අනත්තධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. කො ච රාධ, අනත්තධම්මො: රූපං ඛො රාධ, අනත්තධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං අනත්තධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, අනත්තධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 3. 9.

### ඛයධම්ම සුත්තං

190. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු -පෙ- පහිතත්තො විහරෙය්‍යන්ති.

යො ඛො රාධ, ඛයධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. කො ච රාධ, ඛයධම්මො: රූපං ඛො රාධ, ඛයධම්මො. තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං ඛයධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, ඛයධම්මො තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 3. 10.

### වයධම්ම සුත්තං

191. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු -පෙ- පහිතත්තො විහරෙය්‍යන්ති.

## 2. 3. 8.

## අනත්තධම්ම සූත්‍රය

**189. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, ". . . නිවන් පිණිස යොමු කළ සිත් ඇති වැ වෙසෙන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක් නම් මැනැවැ"යි.

රාධය, යමෙක් අනාත්ම ස්වභාව ඇත්තේ නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය, කිමෙක් අනාත්ම ස්වභාව ඇත්තේ ද යත් : රාධය, රූපය අනාත්ම ස්වභාව ඇත්තේ යැ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. වෙදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය අනාත්මස්වභාව ඇත්තේ යැ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය, යමක් අනාත්ම ස්වභාව ඇත්තේ නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ. රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි.

## 2. 3. 9.

## ඛයධම්ම සූත්‍රය

**190. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, . . . "නිවන් පිණිස යොමු කළ සිත් ඇති වැ වෙසෙන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ එ බඳු දහමක් සැකෙවින් මට දේශනා කරනසේක්වා"යි.

රාධය, යමෙක් ක්ෂය වනසුලු නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය, කිමෙක් ක්ෂය වනසුලු ද යත් : රාධය, රූපය ක්ෂය වනසුලු යැ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය ක්ෂය වනසුලු යැ, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය, යමෙක් ක්ෂය වනසුලු නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි.

## 2. 3. 10.

## වයධම්ම සූත්‍රය

**191. සැවැත්නුවර :**

එකත්පස් වැ හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, . . . "නිවන් පිණිස යොමු කළ සිත් ඇති වැ වෙසෙන්නෙම් ද, භාග්‍යවතුන් වහන්සේ එ බඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක් නම් මැනැවැ"යි.

යො ඛො රාධ, වයධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො.

කො ච රාධ, වයධම්මො:

රූපං ඛො රාධ, වයධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං වයධම්මො. තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, වයධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 3. 11.

## සමුදය ධම්ම සුත්තං

**192. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු -පෙ- පහිතත්තො විහරෙය්‍යන්ති.

යො ඛො රාධ, සමුදයධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො.

කො ච රාධ, සමුදයධම්මො: රූපං ඛො රාධ, සමුදයධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං සමුදයධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, සමුදයධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 3. 12.

## නිරොධ ධම්ම සුත්තං

**193. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො ආයස්මා රාධො භගවන්තං එතදවොච: සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු -පෙ- පහිතත්තො විහරෙය්‍යන්ති.

රාධය, යමෙක් වැය වනසුලු නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ. ඡන්දරාගය පහකටයුතු යි.

රාධය, කිමෙක් වැය වනසුලු වේ ද යත් :

රාධය, රූපය වැය වනසුලු යැ, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය වැය වනසුලු යැ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය යමක් වැය වනසුලු නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ. රාගය පහකටයුතු යැ. ඡන්දරාගය පහකටයුතු යි.

## 2. 3. 11.

## සමුදයධම්ම සූත්‍රය

**192. සැවැත්නුවර :**

එකත් පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, . . . ''නිවන් කරා යොමු කළ සිතැති වැ වෙසෙම් ද, භාග්‍යවතුන් වහන්සේ එබඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක් නම් මැනැවැ''යි

රාධය, යමක් හටගන්නාසුලු නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ ඡන්දරාගය පහකටයුතු යි.

රාධය, කිමෙක් හටගන්නාසුලු වේ ද යත් : රාධය, රූපය හටගන්නාසුලු යැ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ. රාගය පහකටයුතු යැ ඡන්දරාගය පහකටයුතු යි. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය හටගන්නාසුලු යැ, එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ. ඡන්දරාගය පහකටයුතු යි. රාධය, යමෙක් හටගන්නාසුලු නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි.

## 2. 3. 12.

## නිරොධධම්ම සූත්‍රය

**193. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ : වහන්ස, . . . ''නිවන් කරා යොමුකළ සිත් ඇති වැ වෙසෙම් ද, භාග්‍යවතුන් වහන්සේ එ බඳු දහමක් සැකෙවින් මට දේශනා කරන සේක්, නම් මැනැව''යි.

26–ඒ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

යො ඛො රාධ, නිරොධධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. කො ච රාධ, නිරොධධම්මො: රූපං ඛො රාධ, නිරොධධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිරොධධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, නිරොධධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

ආයාචනවග්ගො තතියො.

තස්සුද්දානං:

මාරො ච මාරධම්මො ච අනිච්චෙන පරෙ දුවෙ,
දුක්ඛෙන ච දුවෙ වුත්තා අනත්තෙන තථෙව ච,
ඛයවයසමුදයධම්මා නිරොධධම්මෙන ද්වාදසාති

රාධය, යමෙක් නිරුද්ධ වනසුලු නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. රාධ, කිමෙක් නිරුද්ධ වනසුලු ද යත් : රාධය, රූපය නිරුද්ධ වනසුලු ය. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය නිරුද්ධ වනසුලු යැ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ. රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය, යමෙක් නිරුද්ධ වනසුලු නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකට යුතු යි.

තෙවෙනි ආයාචනා වර්ග යි

**එහි උද්දානය :**

මාර–මාරධම්ම, අනිච්ච–අනිච්චධම්ම, දුක්ඛ–දුක්ඛධම්ම, අනත්ත–අනත්තධම්ම, ඛයධම්ම, වයධම්ම, සමුදය ධම්ම හා නිරොධධම්ම යි සූත්‍ර දෙළොසෙකි.

## 4. උපනිසින්නවග්ගො

### 2. 4. 1.

### මාර සුත්තං

194. සාවත්ථියං :

අථ ඛො ආයස්මා රාධො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාධං භගවා එතදවොච: යො ඛො රාධ, මාරො තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො.

කො ච රාධ, මාරො: රූපං ඛො රාධ, මාරො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං මාරො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, මාරො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

### 2. 4. 2.

### මාරධම්ම සුත්තං

195. සාවත්ථියං :

එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාධං භගවා එතදවොච: යො ඛො රාධ, මාරධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො.

කො ච රාධ, මාරධම්මො: රූපං ඛො රාධ මාරධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං මාරධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, මාරධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

### 2. 4. 3.

### අනිච්ච සුත්තං

196. සාවත්ථියං :

එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං රාධං භගවා එතදවොච: යං ඛො රාධ, අනිච්චං තත්‍ර -පෙ- ඡන්දරාගො පහාතබ්බො.



Free Distribution www.aathaapi.org

# 4. උපනිශ්‍රිත වර්ගය

## 2. 4. 1.

## මාර සූත්‍රය

**194. සැවැත්නුවර :**

එ කල්හි ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක : රාධය, '' යමෙක් මාර නම් එහි ලා තොපගේ ඡන්දය පහකට යුතුයැ. රාගය පහකට යුතුයැ, ඡන්දරාගය පහකට යුතුයි.

රාධය, කිමෙක් මරු ද යත් : රාධය, රූපය මාර යැ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු ය. රාගය පහකටයුතු ය. ඡන්දරාගය පහකටයුතු යි. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය මාර යැ. එහිලා තොපගේ ඡන්දය පහකටයුතු යැ රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. රාධය යමෙක් මාර නම් එහිලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු ය''යි.

## 2. 4. 2.

## මාරධම්ම සූත්‍රය

**195. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක : රාධය, යමෙක් මාරධම්ම (මරණ ස්වභාව) නම් එහි ලා තොපගේ ඡන්දය පහකට යුතු යැ, රාගය, පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි.

රාධ කිමෙක් මරණ ස්වභාව ද යත් : රාධය, රූපය මැරෙන සුලු යැ. එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි. වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය මැරෙනසුලු ය. එහි ලා තොපගේ ඡන්දය පහකට යුතු යැ, රාගය පහකට යුතු යැ, ඡන්දරාගය පහකට යුතු යි. රාධය යමෙක් මැරෙනසුලු නම් එහි ලා තොපගේ ඡන්දය පහකටයුතු යැ, රාගය පහකටයුතු යැ, ඡන්දරාගය පහකටයුතු යි.

## 2. 4. 3.

## අනිච්ච සූත්‍රය

**196. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ආයුෂ්මත් රාධ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක : රාධය යමෙක් අනිත්‍ය නම් එහි . . . ඡන්දරාගය පහකට යුත්තේ යි.

## 2. 4. 4.

### අනිච්චධම්ම සුත්තං

197. සාවත්ථියං:

යො ඛො රාධ අනිච්චධම්මො තත්‍ර -පෙ- ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 4. 5.

### දුක්ඛ සුත්තං

198. සාවත්ථියං:

යං ඛො රාධ දුක්ඛං තත්‍ර -පෙ- ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 4. 6.

### දුක්ඛධම්ම සුත්තං

199. සාවත්ථියං:

යො ඛො රාධ, දුක්ඛධම්මො තත්‍ර -පෙ- ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 4. 7.

### අනත්ත සුත්තං

200. සාවත්ථියං:

යො ඛො රාධ, අනත්තා තත්‍ර -පෙ- ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 4. 8.

### අනත්තධම්ම සුත්තං

201. සාවත්ථියං:

යො ඛො රාධ, අනත්තධම්මො තත්‍ර -පෙ- ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 4. 9.

### ඛයධම්ම සුත්තං

202. සාවත්ථියං:

යො ඛො රාධ, ඛයධම්මො තත්‍ර -පෙ- ඡන්දරාගො පහාතබ්බොති

## 2. 4. 4.

## අනිච්චධම්ම සූත්‍රය

197. සැවැත්නුවර :

රාධය යමෙක් අනිත්‍යධර්ම නම් එහි . . . ඡන්දරාගය ප්‍රහාණ කටයුත්තේ යි.

## 2. 4. 5.

## දුක්ඛ සූත්‍රය

198. සැවැත්නුවර :

රාධය යමෙක් දුක් නම් එහි . . . ඡන්දරාගය පහකට යුතු යි.

## 2. 4. 6.

## දුක්ඛධම්ම සූත්‍රය

199. සැවැත්නුවර :

රාධය යමෙක් දුක්ඛධර්ම නම් එහි . . . ඡන්දරාගය පහකට යුතු යි.

## 2. 4. 7.

## අනත්ත සූත්‍රය

200. සැවැත්නුවර :

රාධය යමෙක් අනාත්ම නම් එහි . . . ඡන්දරාගය පහකට යුතු යි.

## 2. 4. 8.

## අනත්තධම්ම සූත්‍රය

201. සැවැත්නුවර :

රාධය, යමෙක් අනාත්මධර්ම නම් එහි . . . ඡන්දරාගය පහකට යුතු යි.

## 2. 4. 9.

## ඛයධම්ම සූත්‍රය

202. සැවැත්නුවර :

රාධය, යමෙක් ක්ෂයධර්ම නම් එහි . . . ඡන්දරාගය පහකට යුතු යි.

## 2. 4. 10.

## වයධම්ම සුත්තං

203. සාවත්ථියං:

යො ඛො රාධ, වයධම්මො තත්‍ර -පෙ- ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 4. 11.

## සමුදයධම්ම සුත්තං

204. සාවත්ථියං:

යො ඛො රාධ, සමුදයධම්මො තත්‍ර -පෙ- ඡන්දරාගො පහාතබ්බොති.

## 2. 4. 12.

## නිරොධධම්ම සුත්තං

205. සාවත්ථියං:

යො ඛො රාධ, නිරොධධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො. රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො.

කො ච රාධ, නිරොධධම්මො: රූපං ඛො රාධ නිරොධධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිරොධධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. යො ඛො රාධ, නිරොධධම්මො, තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බොති.

උපනිසින්නවග්ගො චතුත්ථො

තත්‍රුද්දානං:

මාරො ච මාරධම්මො ච අනිච්චෙනාපරෙ දුවෙ,
දුක්ඛෙන ච දුවෙ වුත්තා අනත්තෙන තථෙව ච,
ඛයවයසමුදයධම්මා නිරොධධම්මෙන ද්වාදසාති.

(එවං මාරසුත්තානි විත්ථාරෙතබ්බානි, එවං නිරොධධම්මෙන ඡත්තිංසවෙය්‍යාකරණානි විත්ථාරෙතබ්බානි. එවං රාධසංයුත්තෙ පිණ්ඩිතෙ චතුනවුති වෙය්‍යාකරණානි හොන්ති.)

රාධසංයුත්තං නිට්ඨිතං.

Free Distribution www.aathaapi.org

## 2. 4. 10.

## වයධම්ම සූත්‍රය

**203.** සැවැත්නුවර :

රාධය, යමෙක් ව්‍යයධර්ම නම් එහි . . . ඡන්දරාගය පහකට යුතු යි.

## 2. 4. 11.

## සමුදයධම්ම සූත්‍රය

**204.** සැවැත්නුවර :

රාධය, යමෙක් සමුදයධර්ම නම් එහි . . . ඡන්දරාගය පහකට යුතු යි.

## 2. 4. 12.

## නිරොධධම්ම සූත්‍රය

**205.** සැවැත්නුවර :

රාධය, යමෙක් නිරුද්ධ වනසුලු නම් එහි ලා තොපගේ ඡන්දය පහකට යුතු යැ, රාගය පහකට යුතු යැ, ඡන්දරාගය පහකට යුතු යි.

රාධය කිමෙක් නිරුද්ධ වනසුලු ද යත් : රාධය, රූපය නිරුද්ධ වනසුලු යැ. එහි ලා තොපගේ ඡන්දය පහකට යුතු යැ, රාගය පහකට යුතු යැ, ඡන්දරාගය පහකට යුතු යි. වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිරුද්ධ වනසුලු ය. එහි ලා තොපගේ ඡන්දය පහකට යුතු යැ, රාගය පහකට යුතු යැ, ඡන්දරාගය පහකට යුතු යි. රාධය යමක් නිරුද්ධ වනසුලු නම් එහි ලා තොපගේ ඡන්දය පහකට යුතු යැ රාගය පහකට යුතු යැ ඡන්දරාගය පහකට යුතු ය යි.

**සිවුවැනි උපනිසින්න වර්ග යි.**

එහි සූත්‍ර නාමාවලිය :

මාර සූත්‍රය ද, මාරධම්ම සූත්‍රය ද, අනිච්ච, අනිච්චධම්ම ය යි අනෙක් සූත්‍ර දෙකෙක් ද, දුක්ඛ, දුක්ඛධම්ම ය යි සූත්‍ර දෙකෙක් ද වදරන ලදහ. එසේ ම අනත්ත, අනත්තධම්මය යි සූත්‍ර දෙකෙකි. ඛයධම්ම, වයධම්ම, සමුදය ධම්ම සූත්‍රයෝ ද වෙත්. (මෙහේ) නිරොධධම්ම සූත්‍රයෙන් සූත්‍ර දෙළසක් වේ.

(මෙසේ මාර සූත්‍ර විස්තර කටයුතු යි. මෙසේ නිරොධධම්ම සූත්‍රයෙන් සතිස් සූත්‍ර කෙනෙක් විස්තර කටයුත්තාහ. මෙසේ රාධ සංයුත්තය පිඩු කළ කල්හි සූඅනූ සූත්‍ර කෙනෙක් වෙත්.)

**රාධසංයුක්තය නිමි.**

# 3. දිට්ඨිසංයුත්තං

## 1. සොතාපත්තිවග්ගො

### 3. 1. 1.

### වාත සුත්තං

**206. සාවත්ථියං :**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : “න වාතා වායන්ති, න නජ්ජො සන්දන්ති, න ගබ්භිනියො විජායන්ති, න චන්දිමසුරියා උදෙන්ති වා අපෙන්ති වා එසිකට්ඨායිට්ඨිතා”ති ?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ- භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : ‘න වාතා වායන්ති, න නජ්ජො සන්දන්ති, න ගබ්භිනියො විජායන්ති, න චන්දිමසුරියා උදෙන්ති වා අපෙන්ති වා එසිකට්ඨායිට්ඨිතා’ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : “න වාතා වායන්ති, න නජ්ජො සන්දන්ති, න ගබ්භිනියො විජායන්ති, න චන්දිමසුරියා උදෙන්ති වා අපෙන්ති වා එසිකට්ඨායිට්ඨිතා”ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති ?

අනිච්චං භන්තෙ,

යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති ?

දුක්ඛං භන්තෙ,

යම්පනානිච්චං දුක්ඛං විපරිනාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය : “න වාතා වායන්ති, න නජ්ජො සන්දන්ති, න ගබ්භිනියො විජායන්ති, න චන්දිමසුරියා උදෙන්ති වා අපෙන්ති වා එසිකට්ඨායිට්ඨිතා”ති ?

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ,



Free Distribution www.aathaapi.org

# 3. දිට්ඨිසංයුත්තය

## 1. සෝතාපත්ති වර්ගය

### 3. 1. 1.

### වාත සූත්‍රය

**206. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පිවිස මෙබඳු දෘෂ්ටියක් උපදී ද : "වාතයෝ නො හමති, නදීහු ගලා නො බසිති, ගැබිනියෝ ප්‍රසව නො කෙරෙති, සඳහිරුහු උද නො වෙති නො ද බැසයෙති (මෙ හැම) ඉන්ද්‍රකීල සෙයින් සිටියාහු"දැයි ?

වහන්ස, දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ . . . භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා භික්ෂූහු ධරන්නාහ යි.

මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පිවිස "වාතයෝ නො හමති, නදීහු නො ගලාබසිති, ගැබිනීහු ප්‍රසව නො කෙරෙති, සඳහිරුහු නො ද උදවෙති නො ද බැසයෙති, (මෙ හැම) ඉන්ද්‍රකීල සෙයින් සිටියාහු යි මෙබඳු දෘෂ්ටියක් උපදියි. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානයට පිවිස "වාතයෝ නො හමති, නදීහු ගලා නොබසිති, ගැබිනීහු ප්‍රසව නො කෙරෙති, සඳ හිරුහු නො ද උදවෙති නො ද බැසයෙති, (මෙ හැම) ඉන්ද්‍රකීලයක් සෙයින් සිටියාහු "යි මෙ බඳු දෘෂ්ටියෙක් උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද : රූපය නිත්‍ය හෝ වෙයි ද, අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද සුව හෝ වේ ද ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි නම් එය ඇසිරි නො කොට "වාතයෝ නො හමති, නදීහු නො ගලාබසිති, ගැබිනීහු ප්‍රසව නො කෙරෙති, සඳහිරුහු නො ද උද වෙති, නො ද බැස යෙති, (මෙ හැම) ඉන්ද්‍රකීල සෙයින් සිටියාහු" යි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද ?

වහන්ස, තෙල නො වේ ම යැ.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . විඥානය නිත්‍ය හෝ වෙ යි ද, අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ.



Free Distribution www.aathaapi.org

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "න වාතා වායන්ති, න නජ්ජො සන්දන්ති, න ගබ්භිනියො විජායන්ති, න චන්දිමසූරියා උදෙන්ති වා අපෙන්ති වා එසිකට්ඨායිට්ඨිතා"ති?

නො හෙතං භන්තෙ,

යම්පිදං දිට්ඨං, සුතං, මුතං, විඤ්ඤාතං, පත්තං, පරියෙසිතං, අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "න වාතා වායන්ති, න නජ්ජො සන්දන්ති, න ගබ්භිනියො විජායන්ති, න චන්දිමසූරියා උදෙන්ති වා අපෙන්ති වා එසිකට්ඨායිට්ඨිතා"ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමෙසු[1] ඡසු ඨානෙසු කඞ්ඛා පහීනා හොති, දුක්ඛෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති, දුක්ඛසමුදයෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති, දුක්ඛනිරොධෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය'පිස්ස කඞ්ඛා පහීනා හොති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො"ති.

## 3. 1. 2.

### එතංමම සුත්තං

207. සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති.

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ- භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "එතං මම, එසො'හමස්මි, එසො මෙ අත්තා"ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා"ති.

1. "ඉමෙසුච" - මජ්ඣං.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද සුව හෝ වේ දැ යි ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි නම් එය නො ඇසුරු කොට ''වාතයෝ නො හමති ගඞ්ගාවෝ නො ගලාබසිති, ගැබිනියෝ ප්‍රසව නො කෙරෙති, සඳහිරුහු නො ද උදවෙති, නො ද පහ ව යෙත්, ඉන්ද්‍රකීලයන් මෙන් සිටියාහු ''යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද ?

වහන්ස, තෙල නො වේ මැ යි.

මේ යමෙකුත් දක්නා ලද්දේ, අසන ලද්දේ, සුඹුනා රසවිඳිනා පහස්නා ලද්දේ, දන්නා ලද්දේ, පැමිණෙන ලද්දේ, සොයන ලද්දේ, සිතින් හැසිරෙන ලද්දේ වේ නම් එයත් නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට වාතයෝ නො හමති, ගඞ්ගාවෝ නො ගලාබසිති, ගැබිනියෝ ප්‍රසව නො කෙරෙති, සඳහිරුහු නො ද උදවෙති, නො ද පහවයෙති ඉන්ද්‍රකීලයන් මෙන් නො සැලී සිටියාහු යි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද ?

වහන්ස, තෙල නො වේ මැ යි.

මහණෙනි, යම් කලෙක ආර්යශ්‍රාවකහට මේ (දිට්ඨ සුත මුත විඤ්ඤාත පත්තපරියෙසිත අනුවිචරිත යන) සතැන්හි සැක ප්‍රහීණ වූයේ වේ නම් දුක්ඛයෙහි දු ඔහට සැකය ප්‍රහීණ වූයේ වෙයි. දුක්ඛසමුදයෙහි දු ඔහට සැකය ප්‍රහීණ වූයේ වෙයි, දුක්ඛනිරොධයෙහි දු ඔහට සැකය ප්‍රහීණ වූයේ වෙයි, දුක්ඛනිරොධගාමිනී පටිපදයෙහි දු ඔහට සැකය ප්‍රහීණ වූයේ වෙයි මහණෙනි, මේ ආර්යශ්‍රාවක අපායෙහි නො වැටෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සොතාපන්න ය යි කියනු ලැබේ යි.

## 3. 1. 2.

## එතං මම සූත්‍රය

**207. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස '' මේ මාගේ ය, මේ මම වෙමි. මේ මාගේ ආත්ම ය''යි මෙ බඳු දෘෂ්ටියක් උපදී දැ ? යි.

වහන්ස, දහම්හු භාග්‍යවත්හු මුල් කොට ඇතියහ. භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා භික්ෂූහු ධරන්නාහ යි.

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස '' තෙල මාගේ යැ. තෙලෙ මම් වෙමි, තෙල මාගේ ආත්ම '' යි මෙ බඳු දෘෂ්ටියක් උපදියි, වේදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඤ්ඤානය ඇති කල්හි විඤ්ඤානය ඇසුරු කොට විඤ්ඤානයට පිවිස තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම''යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වා'ති?

අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: “එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා”ති?

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා'ති?

අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: “එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා”ති?

නො හෙතං භන්තෙ,

යම්පිදං දිට්ඨං සුතං මුතං, විඤ්ඤාතං, පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වා'ති?

අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: “එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා”ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමෙසු ඡසු ඨානෙසු කඞ්ඛා පහීනා හොති. දුක්ඛෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති, දුක්ඛසමුදයෙපිස්ස කඞ්ඛා පහීනා හොති, දුක්ඛනිරොධෙපිස්ස කඞ්ඛා පහීනා හොති, දුක්ඛනිරොධගාමිනියා පටිපදායපිස්ස කඞ්ඛා පහීනා හොති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

### 3. 1. 3.

### සොඅත්තා සුත්තං

**208. සාවත්ථියං:**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති. “සො අත්තා සො ලොකො සො පෙච්ච භවිස්සාමි, නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො”ති.

Free Distribution www.aathaapi.org

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද, රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? යි.

වහන්ස අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද ? සුව හෝ වේ ද ? යි.

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙනසුලු නම් එය නො ඇසුරු කොට තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම '' යි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස තෙල නො වේ මැ යි,

වෙදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද යි ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද ? සුව හෝ වේ ද යි ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි නම් එය නො ඇසුරු කොට '' තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම '' යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, තෙල නො වේ මැ යි.

මේ යමකුත් දක්නා ලද්දේ අසන ලද්දේ සුඹුනා රය විඳුනා පහස්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් එයත් නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද යි ?

වහන්ස අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද යි ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම යි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, තෙල නො වේ මැ යි.

මහණෙනි, යම් කලෙක මේ (දිට්ඨාදි) යතැන්හි අරිසවුහුගේ සැකය ප්‍රහීණ වූයේ නම් දුකෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි. දුක්ඛ සමුදයෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි, දුක්ඛ නිරොධයෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි, දුක්ඛනිරොධගාමිනීපටිපදයෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි. මහණෙනි, මේ ආර්යශ්‍රාවක සොතාපන්න යැ, අපායෙහි නො වැටෙනසුලු යැ, ගතිනියත යැ, සම්බොධිය පිහිට කොට ඇත්තේ ය යි කියනු ලැබේ යි.

## 3. 1. 3.

## සො අත්තා සූත්‍රය

**208. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පිවිස මෙබඳු දෘෂ්ටියක් පහළ වේ ද : '' ඒ මම් ආත්මයෙමි, ඒ මම් ලෝක වෙමි, ඒ මම් පරලොව වන්නෙමි, නිත්‍යයෙමි, ධ්‍රැවයෙමි, ශාශ්වතයෙමි, නො පෙරළෙන සැහැවියෙමි යි ?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ- භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "සො අත්තා සො ලොකො සො පෙච්ච භවිස්සාමි, නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො"ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: සො අත්තා සො ලොකො සො පෙච්ච භවිස්සාමි, නිච්චො ධුවො සස්සතො අවිපපරිණාමධම්මො"ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වා'ති?

අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "සො අත්තා සො ලොකො සො පෙච්ච භවිස්සාමි, නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො"ති?

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා'ති?

අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "සො අත්තා සො ලොකො සො පෙච්ච භවිස්සාමි, නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො"ති?

නො හෙතං භන්තෙ,

යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වා'ති?

අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "සො අත්තා සො ලොකො සො පෙච්ච භවිස්සාමි, නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො"ති

නො හෙතං භන්තෙ,

වහන්ස, දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ. . . . භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා භික්ෂූහු ධරන්නාහ යි.

මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පිවිස මෙබඳු දෘෂ්ටියක් පහළ වෙයි : '' ඒ මම ආත්මයෙමි, ඒ මම ලෝක වෙමි, ඒ මම පරලොව වන්නෙමි, නිත්‍යයෙමි ධ්‍රැවයෙමි, ශාශ්වතයෙමි, නො පෙරළෙන සැහැවි. ඇත්තෙමි'යි වේදනාව ඇති කල . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානයට පිවිස මෙබඳු දෘෂ්ටියක් පහළ වෙ යි : ඒ මම ආත්මයෙමි, ඒ මම ලෝක වෙමි, ඒ මම පරලොව වන්නෙමි, නිත්‍යයෙමි, ධ්‍රැවයෙමි, ශාශ්වතයෙමි, නො පෙරළෙන සැහැවි ඇතියෙමි''යි.

මහණෙනි, එ කුමැයි හඟිවු ද, රූපය නිත්‍ය හෝ වෙයි ද, අනිත්‍ය හෝ වේ ද ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් වූ කලී අනිත්‍ය ද එ දුක් හෝ වෙයි ද, සුව හෝ වේ ද ?

වහන්ස, දුක් යැ.

යමෙක්වූ කලී අනිත්‍යද, දුක්ද, පෙරළෙන සැහැවිද, එ ඇයිරි කොට මෙබඳු දෘෂ්ටියක් පහළ වේ ද : එ මම ආත්මයෙමි, එ මම ලෝකය වෙමි, එ මම පරලොව වන්නෙමි, නිත්‍යයෙමි, ධ්‍රැවයෙමි, ශාශ්වතයෙමි, නො පෙරළෙන සැහැවි ඇතියෙමි''යි ?

වහන්ස, තෙල නො වේ මැ යි.

වේදනාව, . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද යි ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද සුව හෝ වේ ද යි ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට '' ඒ මම් ආත්ම වෙමි, ඒ මම ලෝක වෙමි, ඒ මම පරලොව වන්නෙමි, නිත්‍යයෙමි, ධ්‍රැවයෙමි ශාශ්වතයෙමි, නොවෙනස් වනසුල්ලෙමි ''යි මෙ බඳු දෘෂ්ටියෙක් උපදී ද යි ?

වහන්ස, තෙල නො වේ මැ යි.

මෙ යමෙකුත් දක්නා ලද්දේ අසන ලද්දේ සුඹුනා රස විඳුනා පහස්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් එ ද නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද ? යි.

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද යි ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුර කොට '' ඒ මම ආත්ම වෙමි, ඒ මම ලෝක වෙමි, ඒ මම පරලොව වන්නෙමි නිත්‍යයෙමි, ධ්‍රැවයෙමි, ශාශ්වතයෙමි, නො වෙනස් වනසුල්ලෙමි '' යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි,

වහන්ස, තෙල නො වේ මැ යි.



Free Distribution www.aathaapi.org

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමෙසු ඡසු ඨානෙසු කඞ්ඛා පහීනා හොති -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදාය'පිස්ස කඞ්ඛා පහීනා හොති අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

## 3. 1. 4.

## නොචමෙසියා සුත්තං

**209. සාවත්ථියං:**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: 'නො චස්සං නො ච මෙ සියා න භවිස්සාමි න මෙ භවිස්සතී'ති.

භගවම්මූලකා නො භන්තෙ ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: නො චස්සං නො ච මෙ සියා න භවිස්සාමි න මෙ භවිස්සතීති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: නො චස්සං නො ච මෙ සියා න භවිස්සාමි න මෙ භවිස්සතීති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං වා තං සුඛං වාති

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: නො චස්සං නො ච මෙ සියා න භවිස්සාමි, න මෙ භවිස්සතීති?

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ,

යං පනානිච්චං තං දුක්ඛං වා සුඛං වාති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: නො චස්සං නො ච මෙ සියා, න භවිස්සාමි න මෙ භවිස්සතීති?

Free Distribution www.aathaapi.org

මහණෙනි, යම් කලෙක මේ සතැන්හි අරියවූහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ නම් . . . දුක නැවැත්මට යන පිළිවෙතෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ. මහණෙනි, මේ අරියවූ තෙමේ සෝතාපන්න යැ, අපායෙහි නො වැටෙනසුලු යැ, නියත යැ, සම්බෝධිය පිහිට කොට ඇතැ යි කියනු ලැබේ යි.

## 3. 1. 4.

## නො ච මෙ සියා සූත්‍රය

**209. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස ඉදින් (මම්) නො වන්නෙම් නම් මට (පස්කඳෙක්) නො ද වන්නේ යැ. (මතු ද මම්) නො වන්නෙම් නම් (මතු ද) මට (පස්කඳෙක්) නො වන්නේ ය''යි මෙ බඳු දෘෂ්ටියක් උපදී දැ යි ?

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ. . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස ඉදින් (මම්) නො වන්නෙම් නම් මට (පස්කඳෙක්) නො ද වන්නේ යැ. (මතු ද මම්) නො වන්නෙම් නම් (මතු ද) මට (පස්කඳෙක්) නො වන්නේ ය යි මෙබඳු දෘෂ්ටියක් උපදියි. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානයට පිවිස ඉදින් (මම්) නො වන්නෙම් නම් මට (පස්කඳෙක්) නො ද වන්නේ ය. (මතු ද මම්) නො වන්නෙම් නම් (මතු ද) මට (පස්කඳෙක්) නො වන්නේ ය යි මෙ බඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද ? රූපය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ දැ යි ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ දැ යි ?

වහන්ස දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට ඉදින් (මම්) නො වන්නෙම් නම් මට (පස්කඳෙක්) නො ද වන්නේ යැ. (මතු ද මම්) නො වන්නෙම් නම් (මතු ද) මට (පස්කඳෙක්) නො ද වන්නේ යයි මෙ බඳු දෘෂ්ටියක් උපදී දැ යි ?

වහන්ස, තෙල නො වේ මැ යි.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය . . . මේ යමෙකුත් දක්නා ලද්දේ අසන ලද්දේ සුඹුනා රස විඳුනා පහස්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙනා ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් එයත් නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ දැ යි ?

වහන්ස අනිත්‍ය යැ.

යමෙක් වූ කලී අනිත්‍ය නම් එ දුක් හෝ වේ ද, සුව හෝ වේ දැ යි?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි නම් එය ඇසිරි කොට : ඉදින් (මම්) නො වන්නෙම් නම් මට (පස්කඳෙක්) නො ද වන්නේ යැ, මතු නො වන්නෙම් නම මතුදු (පස්කඳෙක්) නො ද වන්නේ යි මෙබඳු දෘෂ්ටියක් උපදී දැ යි ?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමෙසු ඡසු ඨානෙසු කඞ්ඛා පහීනා හොති දුක්ඛෙපිස්ස කඞ්ඛා පහීනා හොති. -පෙ- ''දුක්ඛනිරොධගාමිනියා පටිපදායපිස්ස කඞ්ඛා පහීනා හොති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො, නියතො සම්බොධිපරායනොති.

## 3. 1. 5.

## නත්ථිදින්නසුත්තං

**210.** සාවත්ථියං :

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : ''නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරෙලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති. චාතුම්මහාභූතිකො අයං පුරිසො, යදා කාලං කරොති, පඨවි පඨවිකායං අනුපෙති, අනුපගච්ඡති, ආපො ආපොකායං අනුපෙති අනුපගච්ඡති, තෙජො තෙජොකායං අනුපෙති අනුපගච්ඡති, වායො වායොකායං අනුපෙති අනුපගච්ඡති, ආකාසං ඉන්ද්‍රියානි සඞ්කමන්ති, ආසන්දිපඤ්චමා පුරිසා මතං ආදාය ගච්ඡන්ති, යාව ආළාහනා පදානි පඤ්ඤායන්ති, කාපොතකානි අට්ඨීනි භවන්ති, භස්මන්තා[1] ආහුතියො, දත්තුපඤ්ඤත්තමිදං දානං නාම. තෙසං තුච්ඡං මුසා විලාපො, යෙ කෙචි අත්ථිකවාදං වදන්ති බාලෙ ච පණ්ඩිතෙ ච කායස්ස භෙදා උච්ඡිජ්ජන්ති විනස්සන්ති, න හොන්ති පරම්මරණා''ති.

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : ''නත්ථි දින්නං, නත්ථි යිට්ඨං -පෙ- කායස්ස භෙදා උච්ඡිජ්ජන්ති, විනස්සන්ති, න හොන්ති පරම්මරණා''ති. වෙදනාය සති -පෙ සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : ''නත්ථි දින්නං, නත්ථි යිට්ඨං -පෙ- කායස්ස භෙදා උච්ඡිජ්ජන්ති, විනස්සන්ති, න හොන්ති පරම්මරණා''ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති ?

අනිච්චං භන්තෙ, -පෙ-

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය : ''නත්ථි දින්නං නත්ථි යිට්ඨං -පෙ- කායස්ස භෙදා උච්ඡිජ්ජන්ති, විනස්සන්ති, න හොන්ති පරම්මරණා''ති.

1. භස්සන්තා ආහුතියො - මජසං. සයා.

වහන්ස, තෙල නො වේ මැ යි.

මහණෙනි, ආර්යශ්‍රාවකහට මෙ සතැන්හි සැකය ප්‍රහීණ වූයේ වේ ද, ඔහට දුකෙහි දු සැකය ප්‍රහීණ වූයේ වෙයි . . . දුක්ඛනිරොධගාමිනීපටිපදයෙහි දු ඔහට සැකය ප්‍රහීණ වූයේ වෙයි. මහණෙනි, මේ ආර්යශ්‍රාවක සෝතාපන්න යැ, අපායෙහි නො හෙනසුලු යැ, ගතිනියත යැ, සම්බෝධිය පරායණ කොට ඇත්තේ වේ ය යි කියනු ලැබේ යි.

## 3. 1. 5.
## නත්ථි දින්න සූත්‍රය

**210. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස දෙන ලද්දෙහි ඵල විපාක නැත. මහායාගයෙහි ඵල විපාක නැත. ප්‍රහෙණක සත්කාරයෙහි ඵලවිපාක නැත. කුශලාකුශලකර්මයන්ගේ ඵලයෙක් විපාකයෙක් නැත. මෙ ලොවෙක් නැත. පරලොවෙක් නැත. මවක් නැත. (මවට කළ උපකාරයෙන් ඵලවිපාක නැත) පියෙක් නැත. පියාට කළ උපකාරයෙන් ඵලවිපාක නැත) ඔපපාතික (මැරෙන උපදින) සත්ත්වයෝ නැත. යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ මැනැවින් දැන පසක් කොට ප්‍රකාශ කෙරෙත් නම් මනාව පිළිපන් මැනැවින් ගිය (අනුලොමප්‍රතිපද ප්‍රතිපන්න එ බඳු) මහණ බමුණෝ ලොව නැත. මේ පුරිස් තෙමේ චාතුර්මහාභූතයන්ගෙන් හටගත්තේ යැ. යම් කලෙක කලුරිය කෙරේ නම් (එ කල්හි) පඨවි ධාතුව පඨවිධාතුව කරා යෙයි, පැමිණෙ යි. ආපෝධාතුව ආපෝධාතුව කරා යෙයි, පැමිණෙයි, තේජෝධාතුව තේජෝ ධාතුව කරා යෙයි, පැමිණෙයි, වායෝධාතුව වායෝධාතුව කරා යෙයි, පැමිණේ. ඉඳුරෝ අහසට පැනගනිත්. මිනී ඇඳ පස් වැනි කොට ඇති පුරුෂයෝ මළ සිරුර ගෙන යෙත්. (ගුණාගුණ) පදයෝ සොහොන දක්වා පෙනෙත් ඇට පරෙවි පැහැවත් වේ. හෝමදනයෝ අළු කෙළෙවර කොට ඇත්තෝ ය. මේ දනය නම් අඥනයන් විසින් පනවන ලද්දකි. යම් කිසි කෙනෙක් ආස්තිකවාදය බෙණෙත් නම් එය ඔවුන්ගේ හිස් බොරු ප්‍රලාපයෙකි. බාලයෝත් පණ්ඩිතයෝත් කාබුන් මරණින් සිඳෙත්, වැනසෙත්, මරණින් මතු නො වෙතැ යි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ. . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස 'දෙන ලද්දෙහි විපාක නැත. මහායාගයෙහි විපාක නැත. . . . කය බිඳීමෙන් සිඳෙත්, වැනසෙත්, මරණින් මතු නො වෙති යි මෙ බඳු දෘෂ්ටියක් උපදියි. වේදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥනය ඇති කල්හි විඥනය ඇසුරු කොට විඥනයට පිවිස දෙන ලද්දෙහි විපාක නැත. මහායාගයෙහි විපාක නැත . . . කායභේදයෙන් සිඳෙත්, වැනසෙත්, මරණින් මතු නො වෙති ''යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ''යි හඟිවූ ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දූ යි ?

වහන්ස, අනිත්‍ය ය . . . .

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට ''දෙන ලද්දෙහි ඵල විපාක නැත. මහායාගයෙහි ඵල විපාක නැත. . . . කය බිඳීමෙන් සිඳෙත්, වැනසෙත්, මරණින් මතු නො වෙති''යි මෙ බඳු දෘෂ්ටියක් උපදී දූ යි ?

නො හෙතං භන්තෙ.

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා ති?

අනිච්චං භන්තෙ,

"යං පනා'නිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති?

දුක්ඛං භන්තෙ,

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය "නත්ථි දින්නං නත්ථි යිට්ඨං -පෙ- කායස්ස-භෙදා උච්ඡිජ්ජන්ති, විනස්සන්ති, න හොන්ති පරම්මරණා"ති?

නො හෙතං භන්තෙ,

යම්පිදං දිට්ඨං, සුතං, මුතං, විඤ්ඤාතං, පත්තං, පරියෙසිතං, අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වා'ති?

අනිච්චං භන්තෙ, -පෙ-

දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරො ලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති, චාතුම්මහාභූතිකො අයං පුරිසො. යදා කාලං කරොති පඨවි පඨවිකායං අනුපෙති අනුපගච්ඡති, ආපො ආපොකායං අනුපෙති අනුපගච්ඡති, තෙජො තෙජොකායං අනුපෙති අනුපගච්ඡති, වායො වායොකායං අනුපෙති අනුපගච්ඡති, ආකාසං ඉන්ද්‍රියානි සඞ්කමන්ති, ආසන්දිපඤ්චමා පුරිසා මතං ආදාය ගච්ඡන්ති, යාව ආළාහනා පදානි පඤ්ඤායන්ති, කාපොතකානි අට්ඨීනි භවන්ති, භස්මන්තා ආහුතියො, දත්තුපඤ්ඤත්තමිදං දානං නාම. තෙසං තුච්ඡං මුසා විලාපො, යෙ කෙචි අත්ථිකවාදං වදන්ති, බාලෙ ච පණ්ඩිතෙ ච කායස්ස භෙදා උච්ඡිජ්ජන්ති, විනස්සන්ති, න හොන්ති පරම්මරණා'ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමෙසු ඨානෙසු කඞ්ඛා පහීනා හොති, දුක්ඛෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති -පෙ- දුක්ඛ-නිරොධගාමිනියා පටිපදාය'පිස්ස කඞ්ඛා පහීනා හොති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො, නියතො, සම්බොධිපරායණොති.

වහන්ස, තෙල නො වේ ම යැ.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ යි ?

වහන්ස, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද ? සුව හෝ වේ දැ යි ?

වහන්ස, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට ''දෙන ලද්දෙහි විපාක නැත. මහායාගයෙහි විපාක නැත . . . කය බිඳීමෙන් සිඳෙත්, වැනසෙත්, මරණින් මතු නො වෙති'' යි මෙබඳු දෘෂ්ටියක් උපදී දැ යි ?

වහන්ස, තෙල නො වේ ම ය.

මේ යමෙකුත් දක්නා ලද්දේ අසන ලද්දේ සුඹුනා රස විඳුනා පහස්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් එයත් නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ ? යි.

වහන්ස, අනිත්‍ය ය. . . .

දුක් නම් වෙනස්වන සුලු නම් එය නො ඇසුරු කොට දෙන ලද්දෙහි ඵල විපාක නැත. මහායාගයෙහි ඵල විපාක නැත. ප්‍රහේණකසත්කාරයෙහි ඵල විපාක නැත කුශලාකුශල කර්මයන්ගේ ඵලයෙක් විපාකයෙක් නැත. මෙලොවෙක් නැත. පරලෙ වෙක් නැත. මවක් නැත. පියෙක් නැත. ඕපපාතික සත්ත්වයෝ නැත. යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ මැනැවින් දැන පසක් කොට පවසත් නම් මනාව පිළිපන් මැනැවින් ගිය එබඳු මහණ බමුණෝ ලොව නැත. මේ පුරිස් තෙමේ සතර මහාභූතයන්ගෙන් හටගත්තේ ය. යම් කලෙක කලුරිය කෙළේ නම් (එ කුල්හි) පඨවිධාතුව පඨවිධාතුව කරා යෙයි, පැමිණේ. ආපෝධාතුව ආපොධාතුව කරා යෙයි. පැමිණේ. තෙජොධාතුව තේජෝධාතුව කරා යෙයි, පැමිණේ. වායෝධාතුව වායෝධාතුව කරා යෙයි. පැමිණේ. ඉඳුරෝ අහසට පැන ගනිත්. මිනී ඇඳ පස්වැනි කොට ඇති පුරුෂයෝ මළසිරුර ගෙන යෙත්. (ගුණාගුණ) පදයෝ සොහොන දක්වා පෙනෙත්. ඇට පරෙවිපැහැ වත් වේ. හොමයෝ අළු කෙළවර කොට ඇත්තාහ. මේ දානය නම් මෝඩයන් විසින් පනවන ලද්දෙක. යම් කිසි කෙනෙක් ආස්තික වාදය බෙණෙත් නම් එය ඔවුන්ගේ හිස් නන්දෙඩවිල්ලෙකි. බාලයෝත් පණ්ඩිතයෝත් කය බිඳීමෙන් සිඳෙත් වැනසෙත්, මරණින් මතු නො වෙති'' යි මෙ බඳු දිටෙක් උපදනේ දැ යි ?

වහන්ස, තෙල නො වේ ම ය.

මහණෙනි, යම් කලෙක මේ සතැන්හි අරිසවුහුගේ සැකය ප්‍රහීණ වූයේ නම් දුකෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි . . . දුක නැවැත්මට පමුණුවන පිළිවෙතෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ. මහණෙනි, අපායෙහි නො වැටෙනසුලු නියත වූ සම්බෝධිය පිහිට කොට ඇති මේ අරිසවූ තෙමේ සෝතාපන්න ය යි කියනු ලැබේ යි.

## 3. 1. 6.

### කරතො සුත්තං

**211.** සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "කරතො කාරයතො[1] ඡින්දතො ඡෙදාපයතො[2] පචතො පාචයතො[3] සොචතො[4] සොචාපයතො කිලමතො[5] කිලමාපයතො ඵන්දතො ඵන්දාපයතො[6] පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො. පරදාරං ගච්ඡතො මුසා භණතො, කරතො න කරීයති පාපං,[7] ඛුරපරියන්තෙන චෙ'පි චක්කෙන යො ඉමිස්සා පඨවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය, නත්ථි තතො නිදානං පාපං. නත්ථි පාපස්ස ආගමො, දක්ඛිණඤ්චෙ'පි ගඞ්ගාය තීරං[8] ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො, පාචෙන්තො නත්ථි තතො නිදානං පාපං නත්ථි පාපස්ස ආගමො, උත්තරඤ්චෙ'පි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො,[9] නත්ථි තතො නිදානං පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො, දානෙන දමෙන සංයමෙන සච්චවජ්ජෙන[10] නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො"ති.

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-

"රූපං ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති, "කරතො කාරයතො -පෙ- දානෙන දමෙන සංයමෙන සච්චවජ්ජෙන[4] නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො"ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "කරතො කාරයතො -පෙ- සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො"ති.

"තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-

අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය, 'කරතො කාරයතො -පෙ- නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො"ති.

---

1. කාරෙන්තො කාරයතො – මජසං.
2. වද්ධතො වද්ධාපයතො තං සහිතං. PTS.
3. පචාපයතො – මජසං.
4. සොචයතො – සිමු.
5. කිලමයතො – සිමු.
6. බන්ධතො බන්ධාපයතො – සිමු.
7. කරතො න කරිය්‍යතිපාපං සිමු, 1-2. කාරෙන්තො නකාමීයති පාපං මජසං.
8. ගඞ්ගාතීරං – සි 1.
9. යජාපෙන්තො – මජසං, සසං.
10. සච්චවාචෙන – සිමු.

## 3. 1. 6.

## කරතො සූත්‍රය

**211.** සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පිවිස මෙබඳු දෘෂ්ටියක් උපදී ද ? (එනම් ;) තමා ම කරන්නහුට මෙරමා ලවා කරවන්නහුට අනුන්ගේ අත්පා ආදිය සිඳිනහුට සිඳුවන්නහුට දඬුමුගුරු ආදියෙන් පෙළන්නහුට පෙළවන්නහුට මෙරමා තවන්නහුට තවවන්නහුට අනුන් වෙහෙසන්නහුට මෙරමා ලවා වෙහෙස කරවන්නහුට අනුන් කම්පිත කරන්නහුට කම්පිත කරවන්නහුට පරපණ නසන්නහුට නස්වන්නහුට නොදුන් දෑ ගන්නහුට ගන්වන්නහුට ගෙවල් බිඳින්නහුට බිඳුවන්නහුට මහාවිලොප (සියල්ල පැහැර ගැනීම්) කරන්නහුට එක්ගෙයක් වටා සිට බඩු පැහැර ගන්නහුට මඟ රැක සිට යනෙනුවන් බඩු පැහැර ගන්නහුට පරඹුන් කරා යන්නහුට මුසා බණන්නහුට (පවක් කරමි යන හැඟීමෙන්) කරන්නහුට පවා පවක් නො කෙරේ. (පවෙක් නැත.) ඉදින් යමෙක් කර වැනි නිම්වළලු ඇති නොහොත් කරමුවහත් වැනි කෙළවර ඇති සකෙකින් මේ පොළවෙහි ප්‍රාණීන් එක්මස් රැසක් එක්මස් පිඩක් කරන්නේ නම් ඒ හේතුයෙන් වන පවෙක් නැත, පවෙහි ඊමෙක් නැති. ඉදින් නසමින් නස්වමින් සිඳිමින් සිඳුවමින් පෙළමින් පෙළවමින් දකුණු ගංඉවුරට ද යන්නේ නම් ඒ හේතුයෙන් පවෙක් නැත. පවෙහි ඊමෙක් නැති. ඉදින් දෙමින් දෙවමින් යාග කරමින් කරවමින් උතුරුගංතෙරට ද යන්නේ නම් ඒ හේතුයෙන් පිනෙක් නැත, පිනෙහි ඊමෙක් නැති. දනයෙන් ඉන්ද්‍රිය දමනයෙන් ශීලසංයමයෙන් සත්‍යවචනයෙන් පිනෙක් නැත. පිනෙහි ඊමෙක් නැති''යි කියා යි.

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස කරන්නහුට කරවන්නහුට . . . දනයෙන් ඉන්ද්‍රිය දමනයෙන් ශීලසංයමයෙන් සත්‍යවචනයෙන් පිනෙක් නැත. පිනෙහි ඊමෙක් නැති''යි මෙ බඳු දිටුයෙක් උපදියි, වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානයට පිවිස කරන්හුට කරවන්නහුට . . . සත්‍ය වචනයෙන් පිනෙක් නැත පිනෙහි ඊමෙක් නැති''යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ''යි හඟිවූ ද, රූපය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද යි ?

වහන්ස, අනිත්‍ය යැ. . . .

එය නොඇසුරු කොට ''කරන්නහුට කරවන්නහුට . . . පිනෙක් නැත. පිනෙහි ඊමෙක් නැතැ''යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

නො හෙතං භන්තෙ,

වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සංඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වා''ති?

අනිච්චං භන්තෙ -පෙ-

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: ''කරතො කාරයතො ඡින්දතො ඡෙදාපයතො පචතො පාචයතො සොචතො සොචයතො කිලමතො කිලමාපයතො ඵන්දතො ඵන්දාපයතො පාණමතිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡින්දතො නිල්ලොපං හරතො එකාගාරිකං කරොතො පරිපන්ථෙ තිට්ඨතො පරදාරං ගච්ඡතො මුසා භණතො, කරතො න කරීයති පාපං, ඛුරපරියන්තෙන චෙපි චක්කෙන යො ඉමිස්සා පථවියා පාණෙ එකමංසඛලං එකමංසපුඤ්ජං කරෙය්‍ය නත්ථි තතො නිදානං පාපං නත්ථි පාපස්ස ආගමො, දක්ඛිණඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචෙන්තො නත්ථි තතො නිදානං පාපං, නත්ථි පාපස්ස ආගමො. උත්තරඤ්චෙපි ගඞ්ගාය තීරං ගච්ඡෙය්‍ය දදන්තො දාපෙන්තො යජන්තො යාජෙන්තො, නත්ථි තතො නිදානං පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො, දානෙන දමෙන සංයමෙන සච්චවජ්ජෙන නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමො''ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමෙසු ඡසු ඨානෙසු කඞ්ඛා පහීනා හොති, දුක්ඛෙපිස්ස කඞ්ඛා පහීනා හොති, දුක්ඛසමුදයෙපිස්ස කඞ්ඛා පහීනා හොති දුක්ඛනිරොධෙපිස්ස කඞ්ඛා පහීනා හොති. දුක්ඛනිරොධගාමිනියා පටිපදායපිස්ස කඞ්ඛා පහීනා හොති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

## 3. 1. 7.

## හෙතු සුත්තං

**212.** සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති? ''නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය, අහෙතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති, නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං විසුද්ධියා, අහෙතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති, නත්ථි බලං නත්ථි විරියං[1] නත්ථි පුරිසථාමො නත්ථි පුරිසපරක්කමො, සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා සබ්බෙ ජීවා, අවසා අබලා අවිරියා,[2] නියති සඞ්ගතිභාවපරිණතා, ඡස්වෙවාභිජාතීසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්තී''ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-

---

1. වීරියං - මජසං.
2. අවීරියා - මජසං

වහන්ස, නෙල නො වේ මැ යි.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය . . . මේ යමෙකුත් දක්නා ලද්දේ අසන ලද්දේ සුඹුනා රස විඳුනා පහස්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් හෙ ද නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ යි ?

වහන්ස, අනිත්‍ය යැ . . .

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට කරන්නහුට කරවන්නහුට සිඳින්නහුට සිඳුවන්නහුට පෙළන්නහුට පෙළවන්නහුට මෙරමා තවන්නහුට තවවන්නහුට ක්ලාන්ත වන්නහුට ක්ලාන්ත කරවන්නහුට කම්පිත කරන්නහුට කම්පිත කරවන්නහුට පරපණ නසන්නහුට නස්වන්නහුට නුදුන් දේ ගන්නහුට ගන්වන්නහුට ගෘහසන්ධි සිඳින්නහුට ගම් පහරන්නහුට එක්ගෙයක් පහරන්නහුට මං පැහැරීමෙහි යෙදී සිටින්නහුට පරඹුන් කරා යන්නහුට මුසා බණන්නහුට (පවක් කරමි හැඟීමෙන්) කරන්නහුට පවෙක් නො කෙරෙයි. (පවෙක් නැත). ඉදින් යමෙක් කරවැනි නිම්වළලු ඇති නොහොත් කරමුවහත් වැනි කෙළවර ඇති සකෙකින් මේ පොළොවෙහි ප්‍රාණීන් එක්මස් රැසක් එක්මස් පිඬක් කරන්නේ නම් ඒ හේතුයෙන් පවෙක් නැත. පවෙහි ඊමෙක් නැති. ඉදින් නසමින් නස්වමින් සිඳිමින් සිඳුවමින් පෙළමින් පෙළවමින් දකුණු ගංතෙරට ද යන්නේ නම් එ හේතුයෙන් පවෙක් නැත. පවෙහි ඊමෙක් නැති. ඉදින් දෙමින් දෙවමින් යාග කරමින් කරවමින් උතුරු ගං තෙරට ද යන්නේ නම් ඒ හේතුයෙන් පිනෙක් නැත. පිනෙහි ඊමෙක් නැති. දනයෙන් ඉන්ද්‍රියදමනයෙන් ශීලසංයමයෙන් සත්‍යවචනයෙන් පිනෙක් නැත. පිනෙහි ඊමෙක් නැතැ''යි මෙ බඳු දෘෂ්ටියක් උපදනේ දැ ? යි.

වහන්ස, නෙල නො වේ මැ යි.

මහණෙනි, යම් කලෙක මේ සතැන්හි ආර්‍යශ්‍රාවකගේ සැකය ප්‍රහීණ වූයේ නම් දුකෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි, දුක්හටගැන්මෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි, දුක්නැවැත්මෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි, දුක නැවැත්මට යන පිළිවෙතෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ. මහණෙනි මේ ආර්‍ය ශ්‍රාවක සෝතාපන්න යැ, අපායෙහි නො වැටෙන සභාවි යැ, ගතිනියත යැ සම්බෝධිය පිහිට කොට ඇතැයි කියනු ලැබේ යි.

## 3. 1. 7.

## හේතු සූත්‍රය

**212. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස ''සත්ත්වයන්ගේ කෙලෙසීමට හේතුවෙක් නැත. ප්‍රත්‍යයෙක් නැති. හේතු රහිත ව ප්‍රත්‍යය රහිත ව සත්ත්වයෝ කෙලෙසෙත්. සත්ත්වයන්ගේ විශුද්ධියට හේතුවෙක් නැත, ප්‍රත්‍යයෙක් නැති. හේතු රහිත ව ප්‍රත්‍යය රහිත ව සත්ත්වයෝ විශුද්ධි වෙත්. (තමා සුවපත් කරනුවට) බලයෙක් නැත, වීර්‍යයෙක් නැත, පුරුෂ ශක්තියෙක් නැත, පුරුෂ පරාක්‍රමයෙක් නැති. සියලු සත්ත්වයෝ සියලු ප්‍රාණීහු සියලු භූතයෝ සියලු ජීවයෝ වශයෙහි නො පවත්නාහු බල නැත්තාහු වීර්‍ය රහිත වූවාහු නියත වශයෙන් සංක්‍රමණ වශයෙන් හා ස්වභාව වශයෙන් නන්වැදෑරුම් බවට පැමිණියාහු සවැදෑරුම් (කෘෂ්ණ නීලාදී) අභිජාතීන්හි ම සුවදුක් විඳිති''යි මෙ බඳු දෘෂ්ටියක් උපදී දැ යි ?

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . .

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය -පෙ- ඡස්වෙවාභිජාතීසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්තී"ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය -පෙ- ඡස්වෙවාභිජාතීසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්තී"ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ, -පෙ-

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය -පෙ- ඡස්වෙවාභිජාතීසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්තී"ති.

නො හෙතං භන්තෙ,

"වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- "යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වා"ති?

අනිච්චං භන්තෙ -පෙ-

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය? "නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය, අහෙතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති, නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං විසුද්ධියා, අහෙතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති, නත්ථි බලං නත්ථි විරියං නත්ථි පුරිසථාමො නත්ථි පුරිසපරක්කමො, සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා සබ්බෙ ජීවා අවසා අබලා අවිරියා, නියතිසඞ්ගතිභාවපරිණතා ඡස්වෙවාභිජාතීසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්තී"ති?

නො හෙතං භන්තෙ.

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමෙසු ඡසු ඨානෙසු කඞ්ඛා පහීනා හොති, දුක්ඛෙපිස්ස කඞ්ඛා පහීනා හොති -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදායපිස්ස කඞ්ඛා පහීනා හොති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

## 3. 1. 8.

## මහාදිට්ඨි සුත්තං

**218.** සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති? සත්තිමෙ කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා[1] වඤ්ඣා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා, තෙ න ඉඤ්ජන්ති න විපරිණමන්ති න අඤ්ඤමඤ්ඤං බ්‍යාබාධෙන්ති, නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා, සුඛදුක්ඛාය වා:

1. "අනිම්මිතවිධා" - සයා. "අනිම්මිතබ්බා තිපිපාඨො[1]" සං - අ:

මහණෙනි, රූපය ඇති කල්හි රූපය අසුරු කොට රූපයට පිවිස ''සත්ත්වයන් ගේ කෙලෙසීමට හේතුයෙක් නැත. ප්‍රත්‍යයෙක් නැති . . . සවැදෑරුම් අසිජාතීන්හි ම සුවදුක් විඳිති''යි මෙබඳු දෘෂ්ටියක් උපදියි, වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානයට පිවිස ''සත්ත්වයන්ගේ කෙලෙසීමට හේතුවෙක් නැත, ප්‍රත්‍යයෙක් නැත. . . . සවැදෑරුම් අභිජාතීන්හි ම සුවදුක් විඳිති''යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ ''කිමැ''යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැ ? යි

වහන්ස, අනිත්‍ය යැ . . .

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට සත්ත්වයන්ගේ කෙලෙසීමට ''හේතුවෙක් නැත, ප්‍රත්‍යයෙක් නැත. . . . ෂඩ භිජාතීන්හි ම සුවදුක් විඳිති''යි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද යි ?''

වහන්ස, තෙල නො වේ මැ යි.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය . . . මේ යමෙකුත් දක්නා ලද්දේ අසන ලද්දේ සුඹුනා රය විඳුනා පහස්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් හෙ ද නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ දැ යි ?

වහන්ස, අනිත්‍ය යැ . . .

යමෙක් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට සත්ත්වයන්ගේ කෙලෙසීමට හේතුවෙක් නැත, ප්‍රත්‍යයෙක් නැති. හේතු රහිත ව, ප්‍රත්‍යය රහිත ව සත්ත්වයෝ කෙලෙයෙති. සත්ත්වයන්ගේ විශුද්ධියට හේතුවෙක් නැත, ප්‍රත්‍යයෙක් නැති, හේතුරහිත ව ප්‍රත්‍යය රහිත ව සත්ත්වයෝ විශුද්ධ වෙත්. බලයෙක් නැත, වීර්‍ය්‍යයෙක් නැත, පුරුෂශක්තියෙක් නැත, පුරුෂපරාක්‍රමයෙක් නැති. සියලු සත්ත්වයෝ සියලු ප්‍රාණීහු සියලු භූතයෝ සියලු ජීවයෝ වශයෙහි නො පවත්නාහු බලරහිත වූවාහු වීර්‍ය්‍ය නැත්තාහු නියත වශයෙන් සංක්‍රමණ වශයෙන් හා ස්වභාව වශයෙන් සවැදෑරුම් බවට පැමිණියාහු ෂඩභිජාතීන්හි ම සුවදුක් විඳිති''යි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ය, තෙල නො වේ මැ යි.

මහණෙනි, යම් කලෙක මේ සතැන්හි අරිසවුහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ නම් දුක්ඛයෙහි දු ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි . . . දුක්ඛනිරෝධගාමිනීපටිපදයෙහි දු ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ. මහණෙනි, අපායෙහි නො වැටෙනසුලු නියත වූ සම්බෝධිය පිහිට කොට ඇති මේ අරිසවු තෙමේ සෝතාපන්න යි කියනු ලැබේ යි.

## 3. 1. 8.

## මහාදිට්ඨි සූත්‍රය

**213. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා මෙබඳු දෘෂ්ටියක් උපදී ද ? කිසිවකු විසින් නො කරන ලද, නො කළ විධාන ඇති, ඉදු බෙලෙනුදු නො මැවුණු, අන් කිසි ලෙසෙකිනිදු නො මවන ලද, වඳ වූ (කිසිවක් නො උපදවන), පර්වත කූටයක් සේ ස්ථිර (පරිනාම රහිත) ඉන්ද්‍රකීලයක් සෙයින් නො සැලී සිටුනා, මේ සත්කාය (සමූහ) කෙනෙක් වෙති. ඔහු නො සැලෙති, නො පෙරළෙති, උනුනට බාධක නො වෙති, උනුනට සුව පිණිස හෝ දුක් පිණිය හෝ සුව දුක් දෙක ම පිණිස හෝ නො වෙත්.

කතමෙ සත්ත: පඨවිකායො ආපොකායො තෙජොකායො වායොකායො සුඛෙ දුක්ඛෙ ජීවෙ. සත්තිමෙ කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා, තෙ න ඉඤ්ජන්ති න විපරිණමන්ති න අඤ්ඤමඤ්ඤං බ්‍යාබාධෙන්ති[1] නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. යො'පි තිණ්හෙන සත්ථෙන සීසං ඡින්දති න කොචි කඤ්චි ජීවිතා වොරොපෙති, සත්තන්නං ත්වෙව කායානමන්තරෙන සත්ථං විවරමනුපවිසති.

චුද්දස ඛො පන ඉමානි යොනිප්පමුඛසතසහස්සානි සට්ඨි ච සතානි ඡ ච සතානි පඤ්ච ච කම්මුනො සතානි පඤ්ච ච කම්මානි, තීණි ච කම්මානි, කම්මෙ ච අඩ්ඪකම්මෙ ච ද්වට්ඨිපටිපදා ද්වට්ඨන්තරකප්පා ඡළභිජාතියො අට්ඨ පුරිසභූමියො එකූනපඤ්ඤාස ආජීවකසතෙ එකූනපඤ්ඤාස පරිබ්බාජකසතෙ එකූනපඤ්ඤාස නාගාවාසසතෙ[2] වීසෙ ඉන්ද්‍රියසතෙ තිංසෙ නිරයසතෙ ඡත්තිංස රජොධාතුයො සත්ත සඤ්ඤීගබ්භා සත්ත අසඤ්ඤීගබ්භා සත්ත නිගණ්ඨිගබ්භා සත්ත දිබ්බා සත්ත මානුසා සත්ත පිසාචා[3] සත්ත සරා සත්ත පවුධා[4] සත්ත ච පවුධසතානි සත්ත පපාතා සත්ත ච පපාතසතානි සත්ත සුපිනා සත්ත ච සුපිනසතානි චුල්ලාසීති මහාකප්පුනො[5] සතසහස්සානි යානි[6] බාලෙ ච පණ්ඩිතෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති.

තත්ථ නත්ථි: "ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා අපරිපක්කං වා කම්මං පරිපාචෙස්සාමි පරිපක්කං වා කම්මං ඵුස්ස ඵුස්ස බ්‍යන්තීකරිස්සාමී"ති හෙවං නත්ථි දොණමිතෙ සුඛදුක්ඛෙ. පරියන්තකතෙ[7] සංසාරෙ. නත්ථි හායනවඩ්ඪනෙ. නත්ථි උක්කංසාවකංසෙ. සෙය්‍යථාපි නාම සුත්තගුළෙ ඛිත්තෙ නිබ්බෙඨියමානමෙව පලෙති, එවමෙව බාලෙ ච පණ්ඩිතෙ ච නිබ්බෙඨියමානා සුඛදුක්ඛං පලෙන්තීති.

භගවංමූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "සත්තිමෙ කායා අකටා අකටවිධා -පෙ- සුඛදුක්ඛං පලෙන්තී"ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "සත්තිමෙ කායා අකටා අකටවිධා -පෙ- සුඛදුක්ඛං පලෙන්තී"ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති ?

අනිච්චං භන්තෙ, -පෙ-

---

1. "බ්‍යාධෙන්ති" – සෳා.
2. "නාගවාසසතෙ" – මජසං. සෳා.
3. පෙසාචා – සීමු, මජසං.
4. පවුටා – මජසං, සෳා.
   පමුටා – සීමු. සී 1. පබුටා – දීඝනිකාය
5. "මහාකප්පිනො" – සෳා, මජසං.
6. "යානි" ඌනං – සී 1, 2.
7. "කතෙ" – සෳා, මජසං.

කවර සතෙකැ යත් : පඨවිකාය, ආපෝකාය, තේජෝකාය, වායෝකාය, සුඛ, දුක්ඛ හා සත්වන ජීව යන යත යි. මේ සප්තකායයෝ නො කරන ලදහ, නො කළ විධාන ඇතියහ. නො මැවුණාහ නො මවන ලදහ, පර්වත කූටයක් සෙයින් සිටියහ, ඉන්ද්‍රකීලයක් සෙයින් තිරව සිටුනාහ. උහු තුමූ නො සැලෙති, නොම පෙරළෙති, ඔවුනොවුන් නො පෙළෙති, උනුනට සුව පිණිස වෙවයි දුක් පිණිස වෙවයි සුව–දුක් පිණිස වෙව යි නො ද පොහොසත් වෙත්. යමෙක් තියුණු සැතින් (යමකුගේ) හිස සිඳුනේ නමුදු කිසිවෙක් කිසිවකු දිවියෙන් තොර නො කරයි. වැළිදු සප්තකාය අතරින් සැත විවරයට වැදගනී.

මේ ප්‍රමුඛ යෝනි තුදුස් සිය දහසෙක් වෙයි, අන්‍ය වූ ද යෝනි සදහසෙක් ද සසියෙක් ද වේ. කර්ම පන්සියයෙක් ද (අන්සැටියකින්) කර්මපසෙක් ද (කාය–වාග් නම් වූ) පූර්ණ කර්ම ද (මනඃකර්ම නම් වූ) අර්ධකර්ම ද වේ. ප්‍රතිපත් දෙසැටෙකැ, අතුරුකප් දෙසැටෙකැ, (කණ්හාභිජාති ආදි) අභිජාති සයෙකැ, (මන්දභූමි ආදි) පුරුෂ භූමි අටෙකැ, ආජීවවෘත්ති එකුන්පනස් සියයෙකැ, පිරිවැජි පැවිදි එකුන්පනස් සියයෙකැ, නාමඬුලු එකුන්පනස් සියයෙකැ, ඉන්ද්‍රියයෝ එක්සිය විස්සෙකැ, නිරය එක්සිය තිසෙකැ, රජෝධාතු සතිසෙකැ, සංඥීගර්භ සතෙකැ, අසංඥීගර්භ සතෙකැ, නිර්ග්‍රන්ථගර්භ සතෙකැ, දෙවගර්භ සතෙකැ, මනුෂ්‍යගර්භ සතෙකැ, පිසාචජාති සතෙකැ මහවිල් සතෙකැ, මහගැට සතෙකැ, කුඩාගැට සත්සියයෙකැ, ප්‍රපාත සතෙකැ, කුඩා ප්‍රපාත සත්සියයෙකැ, මහසිහින සතෙකැ, කුඩා සිහින සත්සියයෙකැ, බාලයෝ ද පණ්ඩිතයෝ ද (සසර) දුව හැවිද දුක් කෙළවර කෙරෙත් නම් එබඳු කල්ප සුවාසූ ලක්ෂයෙකි.

එහි '' මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බඹයරින් හෝ නො මුහුකළ කර්මය මුහුකුරු වන්නෙමි යි කියා හෝ මුහුකළ කර්මය විඳ විඳ කෙළවර කරන්නෙමි යි කියා හෝ මෙසේ කළයුත්තෙක් නැති. ද්‍රෝණයෙන් මැන ප්‍රමාණ කරන ලද සෙයින් සුව දුක් (කියන ලද කාලය තුළ) කෙළවර කරන ලද වෙයි. සසර පිරිහීමෙක් වැඩීමෙක් නැත, නැගීමෙක් බැසීමෙක් නැති. යම් සේ දමා ලූ හූ වටෙක් ලිහෙමින් දිග ඇති පමණක් ම යේ ද,එසෙයින් ම බාලයෝ ද පණ්ඩිතයෝ ද (කාල වශයෙන් යෙමින්) සුවදුක් විඳුනාහ''යි. (මෙබඳු දෘෂ්ටියක් උපදී ද ?)

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ. . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස නොකළ නොකරන ලද නොකළ විධාන ඇති මේ සප්තකායයෝ වෙති . . . සුවදුක් විඳුනාහ''යි. මෙබඳු දෘෂ්ටියක් උපදියි. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි... විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානයට පිවිස නොකළ, නොකළ විධාන ඇති මේ සත් කයෙක් වෙයි . . . සුවදුක් විඳුනාහ''යි මෙබඳු දෘෂ්ටියෙක් උපදී.

මහණෙනි, ඒ කිමැයි හඟිවු ද, රූපය නිත්‍ය ද හෝ අනිත්‍ය ද හෝ යි ?

වහන්ස, අනිත්‍ය යැ. . . .

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: ''සත්තිමෙ කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා. තෙ න ඉඤ්ජන්ති, න විපරිණමන්ති, න අඤ්ඤමඤ්ඤං බ්‍යාබාධෙන්ති, නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා, කතමෙ සත්ත: පඨවිකායො ආපොකායො තෙජොකායො වායොකායො සුඛෙ දුක්ඛෙ ජීවෙ. සත්තිමෙ කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා, තෙ න ඉඤ්ජන්ති, න විපරිණමන්ති, න අඤ්ඤමඤ්ඤං බ්‍යාබාධෙන්ති, නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. යොපි තිණ්හෙන සත්ථෙන සීසං ඡින්දති, න කොචි කඤ්චි ජීවිතා වොරොපෙති, සත්තන්නං ත්වෙව කායානමන්තරෙන සත්ථං විවරමනුපවිසති.

චුද්දස ඛො පනිමානි යොනිපමුඛසතසහස්සානි සට්ඨි ච සතානි ඡ ච සතානි පඤ්ච ච කම්මුනො සතානි පඤ්ච ච කම්මානි තීණි ච කම්මානි කම්මෙ ච අඩ්ඪකම්මෙ ච, ද්වට්ඨිපටිපදා ද්වට්ඨන්තරකප්පා ඡළාභිජාතියො. අට්ඨපුරිසභූමියො, එකූනපඤ්ඤාස ආජීවකසතෙ, එකූනපඤ්ඤාස පරිබ්බාජකසතෙ, එකූනපඤ්ඤාස නාගාවාසසතෙ, වීසෙ ඉන්ද්‍රියසතෙ, තිංසෙ නිරයසතෙ, ඡත්තිංස රජොධාතුයො, සත්ත සඤ්ඤීගබ්භා, සත්ත අසඤ්ඤීගබ්භා, සත්ත නිගණ්ඨිගබ්භා, සත්ත දිබ්බා, සත්ත මානුසා, සත්ත පිසාචා, සත්ත සරා, සත්ත පවුටා, සත්ත ච පවුටසතානි, සත්ත පපාතා, සත්ත ච පපාතසතානි සත්ත සුපිනා, සත්ත ච සුපිනසතානි චුල්ලාසීති මහාකප්පුනො සතසහස්සානි. යානි බාලෙ ච පණ්ඩිතෙ ච සන්ධාවිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති. තත්ථ නත්ථි: ''ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා අපරිපක්කං වා කම්මං පරිපාචෙස්සාමි, පරිපක්කං වා කම්මං ඵුස්ස ඵුස්ස බ්‍යන්තීකරිස්සාමී''ති. හෙවං නත්ථි: දොණමිතෙ සුඛදුක්ඛෙ පරියන්තකතෙ සංසාරෙ නත්ථි හායනවඩ්ඪනෙ නත්ථි උක්කංසාවකංසෙ, සෙය්‍යථා'පි නාම සුත්තගුළෙ ඛිත්තෙ නිබ්බෙඨියමානමෙව පලෙති, එවමෙව බාලෙ ච පණ්ඩිතෙ ච නිබ්බෙඨියමානා සුඛදුක්ඛං පලෙන්තී''ති.

තං කිං මඤ්ඤථ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: ''සත්ති'මෙ කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා, තෙ න ඉඤ්ජන්ති, න විපරිණමන්ති, න අඤ්ඤමඤ්ඤං බ්‍යාබාධෙන්ති, නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා, කතමෙ සත්ත: පඨවිකායො ආපොකායො තෙජොකායො වායොකායො සුඛෙ දුක්ඛෙ ජීවෙ. සත්ති'මෙ කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා

යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි නම් එය නො ඇසුරු කොට මෙබඳු දෘෂ්ටියක් උපදී ද ? '' නොකරන ලද නොකළ විධාන ඇති නොමැවුණ නොමවන ලද වඳ වූ පර්වත කූටයක් මෙන් සිටි ඉන්ද්‍රකීලයන් සේ නොසැලී තිර වැ සිටි මේ සප්ත කාය කෙනෙක් වෙති. ඔහු නො සැලෙති, නො පෙරළෙති, ඔවුනොවුන් නො පෙළති. ඔවුනොවුනට සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නො වැටෙත්. කවර සතෙකැ යත් : පඨවිකාය යැ, ආපො කාය යැ, තෙජොකාය යැ, වායොකාය යැ, සුඛ යැ, දුක්ඛ යැ, ජීවය''යි. මේ සත්තකායයෝ නො කරන ලදහ, නො කළ විධාන ඇතියහ, නොමැවුණහ, නොමවන ලදහ, වඳයහ, පර්වතකූටයක් සෙයින් සිටියහ. ඉන්ද්‍රකීලයන් මෙන් නො සැලී සිටියාහ. ඔහු නො සැලෙති, නො පෙරළෙති. ඔවුනොවුන් නො පෙළත්, ඔවුනොවුනට සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නො වැටෙත්. යමෙක් තියුණු සැතෙකින් හිස සිඳුනේ නමුදු කිසිවෙක් කිසිවකු දිවියෙන් නො තොර කෙරෙයි, වැලි සත් කය අතරින් ම සැත විවරයට පිවිසේ.

බාලයෝත් පණ්ඩිතයෝත් යමක් කරා දිව සැරිසරා දුක් කෙළවර කරන්නාහු නම් (එබඳු) මේ උතුම් යොනි තුදුස්ලක්ෂ සදහස්සයියයෙක් ද කර්ම පන්සියයෙක් ද, කර්ම පසෙක් ද කර්ම තුනෙක් ද, කර්මයෙක් ද, අර්ධකර්මයෙක් ද වෙයි. ප්‍රතිපද දෙසැටෙකැ. අතුරුකප් දෙසැටෙකැ, අභිජාති සයෙකැ, පුරුෂභූමි අටෙකැ, ආජීවකවෘත්ති එක්සියඑකුන් පනසෙකැ, පිරිවැජි පැවිදි එක්සිය එකුන්පනසෙකැ, නාමබුලු එක්සිය එකුන්පනසෙකැ, ඉන්ද්‍රිය එක්සියවිස්සෙකැ, නිරය එක්සිය තිසෙකැ, රජොධාතු සතිසෙකැ, සංඥිගර්භ සතෙකැ, අසංඥිගර්භ සතෙකැ, නිගණ්ඨගර්භ සතෙකැ, දෙවියෝ සත්දෙනෙකැ, මිනිස්සු සත්දෙනෙකැ, පිසාචයෝ සත්දෙනෙකැ, මහවිල් සතෙකැ, මහගැට සතෙකැ, කුඩාගැට සත්සියයෙකැ, මහාප්‍රපාත සතෙකැ, කුඩාප්‍රපාත සත්සියයෙකැ, මහසිහින සතෙකැ කුඩාසිහින සත්සියයෙකැ මහාකල්ප සුවාසූලක්ෂයෙකි. මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බඹසරින් හෝ නුමුහුකුරා ගිය කර්මයක් මුහුකුරු වන්නෙමි යි හෝ එහි නැත. මුහුකුරා ගිය කර්මයක් විඳිමින් ගෙවන්නෙමි යි හෝ මෙසේක් නැති. සුවදුක් ද්‍රොණයෙන් මනින ලද මෙනි. සසර කරන ලද කෙළවර ඇත්තේ යැ. පිරිහීම් වැඩුම් නැත. උස්පහත් වීම් නැති. (පර්වතයෙක හෝ රුක් මුදුනෙක හෝ සිට) හුගුලක් දමා ගැසූ කල්හි යම් සේ (හුයේ පමණට) ලිහෙමින් යේ ද, එයෙයින් ම බාලයෝත් පණ්ඩිතයෝත් (කාල වශයෙන්) ලිහෙමින් සුවදුක් දෙකට යෙති යි ?

වහන්ස, මෙය නො වේ මැ යැ.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය . . . මේ යමකුත් දක්නා ලද නම් අසන ලද නම් සුඹුනා විඳුනා පහස්නා ලද නම් දන්නා ලද නම් පැමිණෙන ලද නම් සොයන ලද නම් සිතින් හැසිරෙන ලද නම් හෙ ද නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද ? යි

වහන්ස, අනිත්‍ය යැ . . .

යමෙක් දුක් නම් පෙරළෙන සැහැවි නම් එය නො ඇසුරු කොට මෙබඳු දෘෂ්ටියක් උපදී ද ? ''නො කරන ලද, නො කළ විධාන ඇති නො මැවුණු නොමවන ලද වඳ වූ පවුකුළක් මෙන් සිටි, ඉන්ද්‍රකීලයන් මෙන් නො සැලී සිටි මේ සත්කයෙකි. ඔහු නො සැලෙති, නො වෙනස් වෙති. ඔවුනොවුන් නො පෙළත්. ඔවුනොවුන්ට සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නො වැටෙත්. කවර සතෙකැ යත් : පඨවිකාය යැ, ආපෝකාය යැ, තේජෝකාය යැ, වායෝකාය යැ, සුඛ යැ දුක්ඛ යැ, ජීව ය යි. මේ සත්කායයෝ නො කරන ලදහ. නොකළ විධාන ඇතියහ. නො මැවුණහ. නො මවන ලදහ. වඳයහ, පවුකුළක් සේ සිටියහ. ඉන්ද්‍රකීලයක් මෙන්

කූටට්ඨා එසිකට්ඨායිට්ඨිතා, තෙ න ඉඤ්ජන්ති, න විපරිණමන්ති, න අඤ්ඤමඤ්ඤං බ්‍යාබාධෙන්ති, නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. යො'පි තිණ්හෙන සත්ථෙන සීසං ඡින්දති, න කොචි කඤ්චි ජීවිතා වොරොපෙති. සත්තන්නංත්වෙව කායානමන්තරෙන සත්ථං විවරමනුපවිසති.

චුද්දස ඛො පන ඉමානි යොනිප්පමුඛසතසහස්සානි සට්ඨි ච සතානි ඡ ච සතානි, පඤ්ච ච කම්මුනො සතානි පඤ්ච ච කම්මානි, තීණි ච කම්මානි කම්මෙ ච අඩ්ඪකම්මෙ ච ද්වට්ඨිපටිපදා ද්වට්ඨන්තරකප්පා ඡළභිජාතියො, අට්ඨපුරිසභූමියො, එකූනපඤ්ඤාස ආජීවකසතෙ එකූනපඤ්ඤාස පරිබ්බාජකසතෙ, එකූනපඤ්ඤාස නාගාවාසසතෙ, වීසෙ ඉන්ද්‍රියසතෙ, තිංසෙ නිරයසතෙ, ඡත්තිංස රජොධාතුයො, සත්ත සඤ්ඤීගබ්භා, සත්ත අසඤ්ඤීගබ්භා, සත්ත නිගණ්ඨිගබ්භා, සත්ත දිබ්බා, සත්ත මානුසා, සත්ත පිසාචා, සත්ත සරා, සත්ත පවුධා, සත්ත ච පවුධසතානි, සත්ත පපාතා, සත්ත ච පපාතසතානි, සත්ත සුපිනා, සත්ත ච සුපිනසතානි, චූලාසීති මහාකප්පුනො සතසහස්සානි. යානි බාලෙ ච පණ්ඩිතෙ ච සන්ධාවිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති.

තත්ථ නත්ථි: "ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා අපරිපක්කං වා කම්මං පරිපාචෙස්සාමි, පරිපක්කං වා කම්මං ඵුස්ස ඵුස්ස බ්‍යන්තීකරිස්සාමී"ති හෙවං නත්ථි. දොණමිතෙ සුඛදුක්ඛෙ. පරියන්තකතෙ සංසාරෙ, නත්ථි හායනවඩ්ඪනෙ නත්ථි උක්කංසාවකංසෙ. සෙය්‍යථා'පි නාම සුත්තගුළෙ ඛිත්තෙ නිබ්බෙඨියමානමෙව පලෙති, එවමෙව බාලෙ ච පණ්ඩිතෙ ච නිබ්බෙඨියමානා සුඛදුක්ඛං පලෙන්තීති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමෙසු ඡසු ඨානෙසු කඞ්ඛා පහීනා හොති, දුක්ඛෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදායපිස්ස කඞ්ඛා පහීනා හොති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

## 3. 1. 9.

### සස්සතලොක සුත්තං

214. සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති සස්සතො ලොකොති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති, "සස්සතො ලොකො"ති වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "සස්සතො ලොකො"ති.

නො සැලී සිටියහ. ඔහු නො සැලෙති, නො වෙනස් වෙති. ඔවුනොවුන් නො පෙළති, ඔවුනොවුන්ට සුව පිණිස හෝ දුක් පිණිස හෝ සුවදුක් පිණිස හෝ නො වැටෙත්. යමෙක් තියුණු සැතෙකින් හිස සිඳුනේ නමුදු කිසිවෙක් කිසිවකු දිවියෙන් නො තොර කෙරෙයි. හුදෙක් සත්කාය අතරින් මැ සැත විවරයට පිවිසේ.

බාලයෝත්, පණ්ඩිතයෝත් යමෙක දිව සැරිසරා දුක් කෙළෙවර කරන්නාහු නම් (එබඳු) මේ උතුම් යෝනි තුදුස් ලක්ෂ සදහස් සසියයෙක් වෙයි, කර්ම පන්සියයෙක් ද, කර්ම පසෙක් ද, කර්ම තුනෙක් ද කර්මයෙක් ද, අර්ධ කර්මයෙක් ද, වේ. ප්‍රතිපද දෙසැටෙකැ, අතුරුකප් දෙසැටෙකැ, අභිජාති සයෙකැ, පුරුෂභූමි අටෙකැ, ආජීවක වෘත්ති එක්සිය එකුන්පනසෙකැ, පිරිවැජි පැවිදි එක්සිය එකුන්පනසෙකැ, නාමධුලු එක්සිය එකුන්පනසෙකැ, ඉන්ද්‍රිය එක්සියවිස්සෙකැ, නිරය එක්සියතිසෙකැ, රජෝධාතු සතිසෙකැ, සංඥීගර්භ සතෙකැ, අසංඥීගර්භ සතෙකැ, නිගණ්ඨගර්භ සතෙකැ, දෙවියෝ සත්දෙනෙකැ, මිනිස්සු සත්දෙනෙකැ, පිසාචයෝ සත්දෙනෙකැ, මහවිල් සතෙකැ, මහගැට සතෙකැ, කුඩාගැට සත්සියයෙකැ, මහාප්‍රපාත සතෙකැ, කුඩාප්‍රපාත සත්සියයෙකැ මහසිහින සතෙකැ, කුඩාසිහින සත්සියයෙකැ, මහාකල්ප සුවාසූ ලක්ෂයෙකි.

'' මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බඹසරින් හෝ නුමුහුකුරා ගිය කර්මය මුහුකුර වන්නෙමි යි හෝ එහි නැතැ, මුහුකුරා ගිය කර්මය විඳිමින් ගෙවන්නෙමි' යි මෙසේත් නැති. සුවදුක් ද්‍රෝණයෙන් මනින ලද මෙනි. සසර කරන ලද කෙළවර ඇත්තේ ය. පිරිහීම් වැඩීම් නැත. උස්පහත් බැව් නැති. නූලක් (පර්වතයෙක හෝ රුක් මුදුනෙක හෝ සිට) දමා ගැසූ කල යම්සේ (නූලේ පමණට) ලිහෙමින් යේ ද, එසෙයින් ම බාලයෝත් පණ්ඩිතයෝත් (කාල වශයෙන්) ලිහෙමින් සුවදුකට යෙත් දැ''යි ?

වහන්ස, නොල නො වේ මැ යි.

මහණෙනි, යමකලෙක මේ සතැන්හි අරිසවුහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ නම් දුකෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි . . . දුක නැවැත්මට පමුණුවන පිළිවෙතෙහි ද ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ. මහණෙනි, අපායෙහි නො වැටෙන නියත වූ සම්බෝධිය පිහිට කොට ඇති මේ අරිසවු තෙමේ සෝතාපන්න යයි කියනු ලැබේ යි.

## 3. 1. 9.

## සස්සත සූත්‍රය

214. සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස ලොකය ශාශ්වත යයි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස ලෝකය ශාශ්වත ය යි මෙබඳු දෘෂ්ටියක් උපදී. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . ., සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය, ඇසුරු කොට විඥානයට පිවිස ලෝකය ශාශ්වත ය යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: සස්සතො ලොකො'ති?

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වා'ති?

අනිච්චං භන්තෙ -පෙ-.

යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය "සස්සතො ලොකො'ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමෙසු ඡසු ඨානෙසු[1] කඞ්ඛා පහීනා හොති, දුක්ඛෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති, දුක්ඛසමුදයෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති. දුක්ඛනිරොධෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති. දුක්ඛනිරොධගාමිනියා පටිපදායපිස්ස කඞ්ඛා පහීනා හොති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

## 3. 1. 10.

### අසස්සත ලොකසුත්තං

215. සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "අසස්සතො ලොකො''ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "අසස්සතො ලොකො''ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "අසස්සතො ලොකො''ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

---

1. ඉමෙසු ච ඨානෙසු - මජසං.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද, රූපය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද යි ?

වහන්ස, අනිත්‍ය යැ, . . .

දුක්, නම් වෙනස් වනසුලු, නම් එය නො ඇසුරු කොට ලෝකය ශාශ්වත ය යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, නෙල නො වේ ම යැ.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය . . . මේ යමකුත් දක්නා ලද ද, අසන ලද ද, සුඹුනා-විඳුනා-පහස්නා ලද ද' දන්නා ලද ද පැමිණෙන ලද ද, සොයන ලද ද, සිතින් හැසිරෙන ලද ද, ගෙ ද නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද යි ?

වහන්ස, අනිත්‍ය යැ . . .

යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට 'ලෝකය ශාශ්වත ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?''

වහන්ස, නෙල නො වේ මැ යි.

මහණෙනි, යම් කලෙක මේ යතැන්හි අරියවුහුගේ සැකය ප්‍රහීණ වූයේ නම් දුකෙහිත් ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි, දුක් හටගැන්මෙහිත් ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ. දුක නැවැත්මෙහිත් ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ. දුක නැවැත්මට පමුණුවන පිළිවෙතෙහිත් ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ. මහණෙනි, අපායෙහි නො වැටෙනසුලු නියත වූ සම්බෝධිය පිහිට කොට ඇති මේ අරියවු තෙමේ සෝතාපන්න ය යි කියනු ලැබෙ යි.

## 3. 1. 10.

## අසස්සත සූත්‍රය

**215. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස ලෝකය අශාශ්වත ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, අපගේ දහම්හු හගවත්හු මුල් කොට ඇතියහ. . .

මහණෙනි, රූපය, ඇති කල්හි රූපය, ඇසුරු කොට රූපයට පිවිස ලෝකය අශාශ්වත ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදියි, වේදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥනය ඇති කල්හි විඥනය අසුරු කොට විඥනයට පිවිස 'ලෝකය අශාශ්වත ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද, රූපය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද යි ?

වහන්ස, අනිත්‍ය ය . . .

දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "අසස්සතො ලොකො"ති?

නො හෙතං භන්තෙ,

වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සංඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වා'ති?

අනිච්චං භන්තෙ, -පෙ-.

දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "අසස්සතො ලොකො"ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- අයං වුච්චති භික්ඛවෙ අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො, නියතො සම්බොධිපරායනො'ති.

## 3. 1. 11.

### අන්තවා සුත්තං

216. සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "අන්තවා ලොකො"ති.

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා, -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "අන්තවා ලොකො"ති. වේදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සංඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: අන්තවා ලොකො'ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වා'ති?

අනිච්චං භන්තෙ, -පෙ-.

දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය "අන්තවා ලොකො"ති?

නො හෙතං භන්තෙ,

වේදනා -පෙ- සඤ්ඤා -පෙ- සංඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වා'ති -පෙ- දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "අන්තවා ලොකො"ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- අයං වුච්චති භික්ඛවෙ අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො, නියතො සම්බොධිපරායනො'ති.

Free Distribution www.aathaapi.org

දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට 'ලෝකය අශාශ්වත ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, තෙල නො වේ ම යැ.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය . . . මේ යමකුත් දක්නා ලද්දේ අසන ලද්දේ සුඹුනා විඳුනා පහස්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් හෙ ද නිත්‍ය ද හෝ ? අනිත්‍ය ද හෝ යි ?

වහන්ස, අනිත්‍ය යැ . . .

දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට 'ලෝකය අශාශ්වත ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද ? යි

වහන්ස, මෙය නො වේ ම යැ.

මහණෙනි, යම් කලෙක අරිසවුහුගේ . . . මහණෙනි, අපායෙහි නොවැටෙනසුලු නියත වූ සම්බෝධිය පිහිට කොට ඇති මේ අරිසවු තෙමේ සෝතාපන්න ය යි කියනු ලැබෙයි.

## 3. 1. 11.

## අන්තවත් සූත්‍රය

216. සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස "ලෝකය අන්තවත් (කෙළවර සහිත) ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස, 'ලෝකය අන්තවත් ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී, වේදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥනය ඇති කල්හි විඥනය ඇසුරු කොට විඥනයට පිවිස 'ලෝකය අන්තවත් ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද, 'රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද යි"?

වහන්ස, අනිත්‍ය යැ . . .

දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට 'ලෝකය අන්තවත් ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, තෙල නො වේ ම යැ.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය . . . මේ යමකුත් දක්නා ලද්දේ අසන ලද්දේ මුත විසින් ගන්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් හෙ ද නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද යි ? . . . දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට 'ලෝකය අන්තවත් ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, තෙල නො වේ මැ යි.

මහණෙනි, යම් කලෙක අරිසවුහුගේ . . . මහණෙනි, අපායෙහි නො වැටෙනසුලු නියත වූ සම්බෝධිය පිහිට කොට ඇති මේ අරිසවු තෙමේ 'සෝතාපන්න ය යි කියනු ලැබෙ යි.

## 3. 1. 12.

### අනන්තවා සුත්තං

217. සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "අනන්තවා ලොකො"ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-

රූපෙ ඛො භික්ඛවෙ, සති -පෙ- වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "අනන්තවා ලොකො"ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-

දුක්ඛං විපරිණාමධම්මං, අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය "අනන්තවා ලොකො" ති?

නො හෙතං භන්තෙ,

[වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වාති? -පෙ- දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය "අනන්තවා ලොකො"ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- නියතො සම්බොධි-පරායනොති.

## 3. 1. 13.

### තං ජීවං තං සරීර සුත්තං

218. සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති "තං ජීවං තං සරීර"න්ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "තං ජීවං තං සරීර"න්ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "තං ජීවං තං සරීර"න්ති.

## 3. 1. 12.

## අනන්තවත් සූත්‍රය

217. සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස 'ලෝකය අනන්තවත් (කෙළවර රහිත) ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි . . . වේදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥනය ඇති කල්හි විඥනය ඇසුරු කොට විඥනයට පිවිස 'ලෝකය අනන්තවත් ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? 'අනිත්‍ය හෝ වේ ද ? ''යි

වහන්ස, අනිත්‍ය ය . . .

දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට 'ලෝකය අනන්තවත් ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, තෙල නො වෙ මැ යැ.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය . . . මෙ යමෙකුත් දක්නා ලද්දේ අසන ලද්දේ මුත වීසින් ගන්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් හෙ ද නිත්‍ය හෝ වේ ද? අනිත්‍ය හෝ වේ ද ? යි . . . එය නො ඇසුරු කොට ලෝකය අනන්තවත් ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදනේ ද යි ?

වහන්ස, මෙය නො වේ මැ යි.

මහණෙනි, යම් කලෙක අරිසවුහුගේ . . . නියත වූයේ සම්බෝධිය පිහිට කොට ඇත්තේ ය යි.

## 3. 1. 13.

## තත් ජීව තත් ශරීර සූත්‍රය

218. සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස 'එමැ ජීව යැ, එමැ ශරීරය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවත්හු මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස 'එමැ ජීවය ය, එමැ ශරීරය'යි මෙ බඳු දෘෂ්ටියක් උපදී. වේදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . .විඥනය ඇති කල්හි විඥනය ඇසුරු කොට විඥනයට පිවිස 'එමැ ජීව යැ, එමැ ශරීරය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති -පෙ- අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: “තං ජීවං තං සරීර”න්ති?

නො හෙතං භන්තෙ.

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වාති? -පෙ- අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: “තං ජීවං තං සරීර”න්ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- නියතො සම්බොධිපරායණොති.

## 3. 1. 14.

### අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර සුත්තං

**219. සාවත්ථියං:**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: “අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර”න්ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-

රූපෙ ඛො භික්ඛවෙ, සති -පෙ- වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: “අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර”න්ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති? -පෙ- අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: “අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර”න්ති?

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වාති. -පෙ- අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: “අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර”න්ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- නියතො සම්බොධිපරායණොති.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ යි ? . . . එය නො ඇසුරු කොට එමැ ජීව යැ, එමැ ශරීරය යි මෙබඳු දෘෂ්ටියක් උපදී දැයි ?

වහන්ස, නෙල නො වේ ම ය.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය . . . ඒ යමකුත් දක්නා ලද්දේ අසන ලද්දේ මුත විසින් ගන්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් එ ද නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ ? යි . . . එය, නොඇසුරු කොට 'එමැ ජීව යැ, එමැ ශරීරය යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, නෙල නො වේ මැ යි.

මහණෙනි, යම් කලෙක පටන් අරිසවුහුගේ . . . නියත වූයේ සම්බෝධිය පිහිට කොට ඇත්තේ යි.

## 3. 1. 14.

## අනාත් ජීව අනාත් ශරීර සූත්‍රය

**210.** සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස ජීවය අනෙකක, ශරීරය අනෙකෙකැ'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද? යි.

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවත්හු මුල් කොට ඇතියහ. . . .

මහණෙනි, රූපය ඇති කල්හි . . . වේදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාරයන් ඇති කල්හි . . . විඥනය ඇති කල්හි විඥනය ඇසුරු කොට විඥනයට පිවිස ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි මෙ බඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ යි? . . . එය නොඇසුරු කොට 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි මෙබඳු දෘෂ්ටියෙක් උපදී ද යි ?

වහන්ස, නෙල නො වේ මැ යැ.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය . . . මේ යමෙකුත් දක්නා ලද්දේ අසනලද්දේ මුත විසින් ගන්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් හෙ ද නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ ? යි. . . . එය නො ඇසුරු කොට ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි මෙබඳු දෘෂ්ටියෙක් උපදී ද යි ?

වහන්ස, මෙය නො වේ මැයි.

මහණෙනි, යම් කලෙක අරිසවුහුගේ . . . නියත වූයේ සම්බෝධිය පිහිට කොට ඇත්තේ යි.

## 3. 1. 15.

### හොති තථාගත සුත්තං

**220. සාවත්ථියං:**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "හොති තථාගතො පරම්මරණා"ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා. -පෙ-

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "හොති තථාගතො පරම්මරණා"ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "හොති තථාගතො පරම්මරණා"ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වා'ති? -පෙ- දුක්ඛං විපරිණාමධම්මං, අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "හොති තථාගතො පරම්මරණා"ති?

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වා'ති -පෙ- දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "හොති තථාගතො පරම්මරණා"ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- නියතො සම්බොධි-පරායණොති.

## 3. 1. 16.

### න හොති තථාගතසුත්තං

**221. සාවත්ථියං:**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "න හොති තථාගතො පරම්මරණා"ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "න හොති තථාගතො පරම්මරණා"ති? වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "න හොති තථාගතො පරම්මරණා"ති.

## 3. 1. 15.

## හොති තථාගත සූත්‍රය

**220. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස සත්ත්වයා මරණින් මතු වේ ය'යි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ. . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස සත්ත්වයා මරණින් මතු වේ ය 'යි මෙ බඳු දෘෂ්ටියෙක් උපදී යි, වේදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥනය ඇති කල්හි විඥනය ඇසුරු කොට විඥනයට පිවිස සත්ත්වයා මරණින් මතු වේ ය 'යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි 'ඒ කිමැ'යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද යි ? . . . දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට සත්ත්වයා මරණින් මතු වේය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, නෙල නො වේ ම යැ,

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය . . . මේ යමෙකුත් දක්නා ලද්දේ අසන ලද්දේ මුත විසින් ගන්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් හෙ ද නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? යි . . . , දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට සත්ත්වයා මරණින් මතු වේ ය'යි මෙ බඳු දෘෂ්ටියක් උපදනෝ ද ? යි

වහන්ස, නෙල නො වේ මැ යි.

මහණෙනි, යම් කලෙක අරිසවුහුගේ . . . නියත වූයේ සම්බෝධිය පිහිට කොට ඇත්තේ ය යි.

## 3. 1. 16.

## න හොති තථාගත සූත්‍රය

**221. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස සත්ත්වයා මරණින් මතු නො වේ ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද ? යි.

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ. . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස 'සත්ත්වයා මරණින් මතු නො වේ ය'යි මෙ බඳු දෘෂ්ටියක් උපදී. වේදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥනය ඇති කල්හි විඥනය ඇසුරු කොට විඥනයට පිවිස සත්ත්වයා මරණින් මතු නො වේ ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

Free Distribution www.aathaapi.org

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වා ති? -පෙ- දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: 'න හොති තථාගතො පරම්මරණා'ති?

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වාති -පෙ- දුක්ඛං විපරිණාමධම්මං, අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "න හොති තථාගතො පරම්මරණා"ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- නියතො සම්බොධි-පරායණොති.

## 3. 1. 17.

## හොති ච න ච හොති තථාගතසුත්තං

222. සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "හොති ච න ච හොති තථාගතො පරම්මරණා"ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති -පෙ- වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "හොති ච න ච හොති තථාගතො පරම්මරණා"ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

දුක්ඛං විපරිණාමධම්මං, අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: හොති ච න ච හොති තථාගතො පරම්මරණා"ති?

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වාති -පෙ- දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "හොති ච න ච හොති තථාගතො පරම්මරණා"ති.

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස -පෙ- නියතො සම්බොධි-පරායණො'ති.

මහණෙනි, ඒ කිමැ 'යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? යි . . . දුක් නම් වෙනස් වන සුලු නම් එය නො ඇසුරු කොට සත්ත්වයා මරණින් මතු නො වේ ය'යි මෙබඳු දෘෂ්ටියක් උපදනේ ද ? යි.

වහන්ස, මෙය නො වේ මැ යැ.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය . . . මේ යමෙකුත් දක්නා ලද්දේ අසන ලද්දේ මුත විසින් ගන්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් හෙ ද නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? යි . . . දුක් නම් වෙනස් වන සුලු නම් එය නො ඇසුරු කොට සත්ත්වයා මරණින් මතු නො වේ ය'යි මේ බඳු දෘෂ්ටියක් උපදනේ ද ? යි.

වහන්ස, තෙල නො වේ මැ යි.

මහණෙනි, යම කලෙක අරිසවුහුගේ . . . නියත වුයේ සම්බෝධිය පිහිට කොට ඇත්තේ ය යි.

## 3. 1. 17.

## හොති ච නච හොති තථාගත සූත්‍රය

**222. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිය සත්ත්වයා මරණින් මතු වෙයි, නො ද වෙයි යන මෙ බඳු දෘෂ්ටියක් උපදී ද ? යි.

වහන්ස, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ. . . .

මහණෙනි, රූපය ඇති කල්හි . . . වේදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥනය ඇති කල්හි විඥනය ඇසුරු කොට විඥනයට පිවිස සත්ත්වයා මරණින් මතු වෙයි, නො ද වෙයි' යන මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ'යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? යි

වහන්ස, අනිත්‍ය ය. . . .

දුක් නම් වෙනස් වනසුලු නම එය නො ඇසුරු කොට සත්ත්වයා මරණින් මතු වෙයි නො ද වෙයි ' යන මෙබඳු දෘෂ්ටියෙක් උපදී ද යි ?

වහන්ස, තෙල නො වේ මැ යැ.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය . . . මේ යමෙකුත් දක්නා ලද්දේ අසන ලද්දේ මුත විසින් ගන්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් හෙ ද නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ ද ? යි. . . . දුක් නම් වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට සත්ත්වයා මරණින් මතු වෙයි, නො ද වෙයි' යන මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, තෙල නො වේ මැ යි.

මහණෙනි, යම් කලෙක අරිසවුහුගේ . . . නියත වුයේ සම්බෝධිය පිහිට කොට ඇත්තේ යි.

## 3. 1. 18.

## නෙව හොති න නහොති තථාගතසුත්තං

223. සංවත්පියං :

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : "නෙව හොති න නහොති තථාගතො පරම්මරණා''ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : නෙව හොති න නහොති තථාගතො පරම්මරණා''ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : "නෙව හොති න නහොති තථාගතො පරම්මරණා''ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ -පෙ-.

දුක්ඛං විපරිණාමධම්මං, අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය : "නෙව හොති න නහොති. තථාගතො පරම්මරණා''ති.

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- යම්පිදං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, තම්පි නිච්චං වා අනිච්චං වාති?

අනිච්චං භන්තෙ,

යම්පනානිච්චං දුක්ඛං වා තං සුඛං වා'ති?

දුක්ඛං භන්තෙ,

යම්පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය : "නෙව හොති න නහොති තථාගතො පරම්මරණා''ති?

නො හෙතං භන්තෙ,

යතො ඛො භික්ඛවෙ, අරියසාවකස්ස ඉමෙසු ඡසු ඨානෙසු කඞ්ඛා පහීනා හොති, දුක්ඛෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති. දුක්ඛසමුදයෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති, දුක්ඛනිරොධෙ'පිස්ස කඞ්ඛා පහීනා හොති, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය'පිස්ස කඞ්ඛා පහීනා හොති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

### සොතාපත්තිවග්ගො පඨමො.

තත්‍රුද්දානං :

වාතං එතං මම සො අත්තා නො ච මෙ සියා
නත්ථි කරොතො හෙතු ච මහාදිට්ඨෙන වා'ට්ඨමං
සස්සතො ලොකො අසස්සතො ච අන්තවා
අනන්තවා ච තං ජීවං තං ජීවං තං සරීරන්ති
අඤ්ඤං ජීවම්මඤ්ඤං සරීරං හොති තථාගතාදි ච

න හොති තථාගතාදි පරම්මරණසුත්තෙන
නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති.

## 3. 1. 18.

## නෙව හොති න න හොති තථාගත සූත්‍රය

223. සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස " සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වෙයි " යන මෙ බඳු දෘෂ්ටියක් උපදී දැ යි ?

ස්වාමීනි, අපගේ දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස " සත්ත්වයා මරණින් මතු නො ම වෙයි, නො ම නො වෙයි " යන මෙ බඳු දෘෂ්ටියක් උපදියි.

වෙදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානයට පිවිස " සත්ත්වයා මරණින් මතු නො ම වෙයි, නො ම නො වෙයි " යන මෙ බඳු දෘෂ්ටියෙක් උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිහු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ යි.

ස්වාමීනි, අනිත්‍ය ය. . . .

දුක් නම් වෙනස් වන සුලු නම් එය නො ඇසුරු කොට " සත්වයා මරණින් මතු නො ම වෙයි, නො ම නො වෙයි " යන මෙබඳු දෘෂ්ටියක් උපදී දැ යි ?

ස්වාමීනි, මෙය නො වේ මැ යැ.

වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය . . . මේ යමෙකුත් දක්නා ලද්දේ අසන ලද්දේ මුත විසින් ගන්නා ලද්දේ දන්නා ලද්දේ පැමිණෙන ලද්දේ සොයන ලද්දේ සිතින් හැසිරෙන ලද්දේ වේ නම් හෙ ද නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ දැ යි ?.

ස්වාමීනි, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ වේ ද, සුව හෝ වේ ද ? යි.

ස්වාමීනි, දුක් යැ. යමෙක් අනිත්‍ය නම් දුක් නම් වෙනස් වන සුලු නම් එය නො ඇසුරු කොට සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නොම නො වෙයි යන මෙ බඳු දෘෂ්ටියක් උපදී දැ යි ?

ස්වාමීනි, තෙල නො වේ මැ යි.

මහණෙනි, යම් කලෙක මේ සතැන්හි අරිසවුහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ නම් දුකෙහිත් ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි. දුක හටගැන්මෙහිත් ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි, දුක නැවැත්මෙහිත් ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වෙයි, දුක නැවැත්මට පමුණුවන පිළිවෙතෙහිත් ඔහුගේ සැකය ප්‍රහීණ වූයේ වේ, මහණෙනි, අපායෙහි නො වැටෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති මේ අරිසවු සොතාපන්න ය යි කියනු ලැබෙ.

පළමුවැනි සෝතාපත්ති වර්ග යි.

**එහි සූත්‍ර නාමාවලිය :**

වාත, එතං මම, සො අත්තා, නො ච මෙ සියා, නත්ථිදින්න, කරතො, නත්ථිහෙතු යන සූත්‍රය, අටවැනි මහාදිට්ඨි සූත්‍රය, අනෙක් සස්සතලොක, අස්සසතලොක, අන්තවා ලොක, අනන්තවාලොක, තත්ජීව තත්සරීර, අඤ්ඤත් ජීව අඤ්ඤත් සරීර, හොති තථාගත, න හොති තථාගත, හොති ච නච හොති තථාගත, නෙව හොති න නහොති තථාගත සූත්‍රයෝ යයි සූත්‍ර අටළොසකි.



Free Distribution www.aathaapi.org

## 2. ගමනවග්ගො

### 3. 2. 1.

### වාත සුත්තං

**224. සාවත්ථියං :**

කිස්මිං නු ඛො භික්ඛවෙ සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : "න වාතා වායන්ති, න නජ්ජො සන්දන්ති, න ගබ්භිනියො විජායන්ති, න චන්දිමසුරියා උදෙන්ති වා අපෙන්ති වා එසිකට්ඨායිට්ඨිතා"ති ?

භගවම්මූලකා නො භන්තෙ ධම්මා -පෙ- භගවතො සුත්වා භික්ඛූ ධාරෙස්සන්තීති.

තෙන හි භික්ඛවෙ සුණාථ -පෙ-. රූපෙ ඛො භික්ඛවෙ සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : "න වාතා වායන්ති -පෙ- එසිකට්ඨායිට්ඨිතා"ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති. න වාතා වායන්ති -පෙ- එසිකට්ඨායිට්ඨිතා"ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති ?

අනිච්චං භන්තෙ.

යං පනානිච්චං තං දුක්ඛං වා තං සුඛං වාති ?

දුක්ඛං භන්තෙ.

යං පනානිච්චං දුක්ඛං විපරිණාමධම්මං, අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය : "න වාතා වායන්ති -පෙ- එසිකට්ඨායිට්ඨිතා"ති ?

නො හෙතං භන්තෙ.

ඉති ඛො භික්ඛවෙ, දුක්ඛෙ සති දුක්ඛං උපාදාය දුක්ඛං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : "න වාතා වායන්ති -පෙ- එසිකට්ඨායිට්ඨිතා"ති. වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති ?

අනිච්චං භන්තෙ, -පෙ-.

විපරිණාමධම්මං අපි නු තං උපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය : න වාතා වායන්ති -පෙ- එසිකට්ඨායිට්ඨිතා"ති ?

නො හෙතං භන්තෙ,

ඉති ඛො භික්ඛවෙ දුක්ඛෙ සති දුක්ඛං උපාදාය දුක්ඛං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය : "න වාතා වායන්ති, න නජ්ජො සන්දන්ති, න ගබ්භිනියො විජායන්ති, න චන්දිමසුරියා උදෙන්ති වා අපෙන්ති වා එසිකට්ඨායිට්ඨිතා"ති -පෙ-



Free Distribution www.aathaapi.org

## 2. ගමන වර්ගය

### 3. 2. 1.

### වාත සූත්‍රය

**224. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් නිසා කුමකට පිවිස මෙබඳු දෘෂ්ටියක් උපදී ද ? '' වාතයෝ නො හමති, නදීහු ගලා නො බසිති, ගැබිනීහු ප්‍රසව නො කෙරෙති, සඳ හිරුහු නො ද උදාවෙති, නො ද බැස යෙති, ඉන්ද්‍රකීල සෙයින් නො සැලී සිටියාහු'' කියා යි.

ස්වාමීනි, දහම්හු භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇතියහ . . භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසා භික්ෂූහු ධරන්නාහ යි.

එසේ වී නම් මහණෙනි අසවු . . . මහණෙනි, රූපය ඇති කල්හි රූපය නිසා රූපයට පැමිණ මෙබඳු දෘෂ්ටියක් උපදියි. '' වාතයෝ නො හමති, . . . ඉන්ද්‍රකීල සෙයින් සිටියාහු''යි. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි , . . . විඥානය ඇති කල්හි විඥානය නිසා විඥානයට පැමිණ මෙබඳු දෘෂ්ටියක් උපදියි : '' වාතයෝ නො හමති, . . . ඉන්ද්‍රකීල සෙයින් සිටියාහු''යි.

මහණෙනි, ඒ කුමකැයි හඟිවු ද, රූපය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ දැ යි ?

ස්වාමීනි, අනිත්‍ය යැ.

යමෙක් අනිත්‍ය නම් එය දුක් හෝ සුව හෝ වේ දැ යි ?

ස්වාමීනි, දුක් යැ.

යමෙක් අනිත්‍ය නම් දුක් නම් පෙරළෙන සැහැවි නම් එය ඇසිරී කොට ''වාතයෝ නො හමති . . . ඉන්ද්‍රකීල සෙයින් සිටියාහ''යි මෙබඳු දෘෂ්ටියක් උපදී දැ යි ?

ස්වාමීනි, නෙල නො වේ මැ යි.

මෙසේ වනාහි මහණෙනි, දුක ඇති කල්හි දුක නිසා දුකට පිවිස ''වාතයෝ නො හමති. . . . ඉන්ද්‍රකීල සෙයින් සිටියහ''යි මෙබඳු දෘෂ්ටියක් උපදියි. වේදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ අනිත්‍ය හෝ වේ දැ යි ?

ස්වාමීනි, අනිත්‍ය යැ . . .

පෙරළෙන සැහැවි නම් එය ඇසිරී කොට ''වාතයෝ නො හමති . . . ඉන්ද්‍රකීල සෙයින් සිටියහ''යි මෙබඳු දෘෂ්ටියක් උපදී දැ යි ?

ස්වාමීනි, නෙල නො වේ මැ යි.

මෙසේ වනාහි මහණෙනි, දුක ඇති කල්හි දුක නිසා දුකට පිවිස ''වාතයෝ නො හමති, නදීහු ගලා නො බසිති, ගැබිනීහු ප්‍රසව නො කෙරෙති, සඳහිරුහු නො ද උදාවෙති නො ද බැස යෙති, ඉන්ද්‍රකීල සෙයින් සිටියාහු''යි මෙබඳු දෘෂ්ටියක් උපදී . . .

## 3. 2. 2.

### එතං මමසුත්තං

**225. සාවත්ථියං :**

කිස්මිං නු ඛො, භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : "එතං මම, එසො හමස්මි, එසො මෙ අත්තා"ති ?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා, -පෙ- එසො මෙ අත්තාති.

(යථා පුරිමගමනසුත්තන්තං එවං විත්ථාරෙතබ්බං.)

## 3. 2. 3.

### සො අත්තාසුත්තං

**226. සාවත්ථියං :**

-පෙ- "සො අත්තා, සො ලොකො, සො පෙච්ච භවිස්සාමි, නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො"ති ? -පෙ-

භගවංමූලකා නො භන්තෙ, ධම්මා, -පෙ- අවිපරිණාමධම්මොති.

## 3. 2. 4.

### නො ච මෙ සියාසුත්තං

**227. සාවත්ථියං :**

-පෙ- "නො චස්සං, නො ච මෙ සියා, න භවිස්සාමි, න මෙ භවිස්සතී"ති -පෙ- න මෙ භවිස්සතීති.

## 3. 2. 5.

### නත්ථි දින්නාසුත්තං

**228. සාවත්ථියං :**

-පෙ- "නත්ථි දින්නං නත්ථි යිට්ඨං -පෙ- කායස්ස භෙදා උච්ඡිජ්ජන්ති, විනස්සන්ති න හොන්ති පරම්මරණා"ති -පෙ-

භගවංමූලකා නො භන්තෙ, ධම්මා, -පෙ- හොන්ති පරම්මරණාති.

## 3. 2. 6.

### කරතොසුත්තං

**229. සාවත්ථියං :**

-පෙ- "නත්ථි පුඤ්ඤං, නත්ථි පුඤ්ඤස්ස ආගමො"ති. -පෙ-
භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ- නත්ථි පුඤ්ඤස්ස ආගමොති.

## 3. 2. 2.

## එතං මම සූත්‍රය

225. සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස ''තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම''යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි ?

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . . මේ මාගේ ආත්මය යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

(පළමු සූත්‍ර දශය යම් සේ නම් එමෙන් විස්තර කටයුතු යි).

## 3. 2. 3.

## සො අත්තා සූත්‍රය

226. සැවැත්නුවර :

. . . 'ඒ මම ආත්මයෙමි, ඒ මම ලෝකයෙමි, ඒ මම පරලොව වන්නෙමි, නිත්‍යයෙමි, ධ්‍රැවයෙමි, ශාශ්වතයෙමි, නොවෙනස් වනසුල්ලෙමි''යි . . .

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . . වෙනස් වන සුල්ලෙමි'යි (මෙබඳු දෘෂ්ටියක් උපදී.)

## 3. 2. 4.

## නොච මෙ සියා සූත්‍රය

227. සැවැත්නුවර :

. . . ''ඉදින් මම නො වන්නෙම් නම් පස්කඳ මට නො ද වන්නේ ය. (මතු) ද (මම) නො වන්නෙම් නම් (මතු) ද මට පස්කඳ නො වන්නේ ය යි. . . . මතු මට පස්කඳ නොවන්නේ ය යි. (මෙබඳු දෘෂ්ටියක් උපදී.)

## 3. 2. 5.

## නත්ථි දින්න සූත්‍රය

228. සැවැත්නුවර :

. . . දෙන ලද්දෙහි විපාක නැත, හෝ මහා යාගයෙහි විපාක නැත . . . කය බිඳීමෙන් සිඳෙති, වැනසෙති, මරණින් මතු නො වෙති''යි . . .

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල්කොට ඇතියහ . . . මරණින් මතු නො වෙති යි. (මෙබඳු දිට්ඨියක් උපදී.)

## 3. 2. 6.

## කරතො සූත්‍රය

229. සැවැත්නුවර :

. . . ''පිනෙක් නැත. පිනෙහි ඊමෙක් නැතැ''යි . . . වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ. . . පිනෙහි ඊමෙක් නැතැ යි (මෙබඳු දෘෂ්ටියක් උපදී.)

## 3. 2. 7.

### නත්ථි හෙතුසුත්තං

**230. සාවත්ථියං :**

-පෙ- ''නත්ථි හෙතු නත්ථි පච්චයො සත්තානං සංකිලෙසාය. අහෙතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති. -පෙ- ඡස්වෙවාභිජාතීසු සුඛදුක්ඛං පටිසංවෙදෙන්තී''ති -පෙ- පටිසංවෙදෙන්තීති.

## 3. 2. 8.

### මහාදිට්ඨි සුත්තං

**231. සාවත්ථියං :**

-පෙ- ''සත්ති'මෙ කායා අකටා අකටවිධා -පෙ- නිබ්බෙඨියමානා සුඛදුක්ඛං පලෙන්තීති. භගවම්මූලකා -පෙ- සුඛදුක්ඛං පලෙන්තීති.

## 3. 2. 9.

### සස්සතලොකසුත්තං

**232. සාවත්ථියං :**

-පෙ- ''සස්සතො ලොකොති? භගවම්මූලකා -පෙ- සස්සතො ලොකොති.

## 3. 2. 10.

### අසස්සතලොකසුත්තං

**233. සාවත්ථියං :**

-පෙ- ''අසස්සතො ලොකො''ති? භගවම්මූලකා -පෙ- අසස්සතො ලොකොති.

## 3. 2. 11.

### අන්තවාලොක සුත්තං

**234. සාවත්ථියං :**

-පෙ- ''අන්තවා ලොකො''ති? භගවම්මූලකා -පෙ- අන්තවා ලොකොති.

## 3. 2. 12.

### අනන්තවාලොක සුත්තං

**235. සාවත්ථියං :**

-පෙ- ''අනන්තවා ලොකොති? භගවම්මූලකා -පෙ- අනන්තවා ලොකොති.

## 3. 2. 7.

## නත්ථි හේතු සූත්‍රය

**230. සැවැත්නුවර :**

. . . සත්ත්වයන්ගේ කෙලෙසීමට හේතුවෙක් නැත, ප්‍රත්‍යයෙක් නැත, හේතු රහිත ව ප්‍රත්‍යය රහිත ව සත්ත්වයෝ කෙලෙසෙත්, . . . අභිජාති සයෙහි ම සුවදුක් විඳිති''යි . . . විඳිති යි (මෙබඳු දෘෂ්ටියක් උපදී.)

## 3. 2. 8.

## මහාදිට්ඨි සූත්‍රය

**231. සැවැත්නුවර :**

. . . ''නොකරන ලද නො කළ විධාන ඇති මේ සත් කයෙකි . . . සුවදුක්, ගෙවමින් විඳිති''යි. භගවත්හු මුල් කොට ඇතියහ. . . . (මෙබඳු දෘෂ්ටියක් උපදී.)

## 3. 2. 9.

## සස්සතලෝක සූත්‍රය

**232. සැවැත්නුවර :**

. . . ''ලෝකය ශාශ්වත ය''යි. භගවත්හු මුල් කොට ඇතියහ. . . ලෝකය ශාශ්වත යයි -(මෙබඳු දෘෂ්ටියක් උපදී.)

## 3. 2. 10.

## අසස්සතලෝක සූත්‍රය

**233. සැවැත්නුවර :**

. . . ''ලෝකය අශාශ්වත ය''යි. භගවත්හු මුල් කොට ඇතියහ . . . ලෝකය අශාශ්වත යයි (මෙබඳු දෘෂ්ටියක් උපදී.)

## 3. 2. 11.

## අන්තවත්ලෝක සූත්‍රය

**234. සැවැත්නුවර :**

. . . ''ලෝකය අන්තවත් ය''යි. භගවත්හු මුල්කොට ඇතියහ. . . ලෝකය අන්තවත්ය යි. (මෙබඳු දෘෂ්ටියක් උපදී.)

## 3. 2. 12.

## අනන්තවත්ලෝක සූත්‍රය

**235. සැවැත්නුවර :**

. . . ''ලෝකය අනන්තවත් ය''යි. භගවත්හු මුල් කොට ඇතියහ . . . ලොකය අනන්තවත් යයි.

## 3. 2. 13.

### තංජීවතං සරීර සුත්තං

236. සාවත්ථියං :

-පෙ- "තං ජීවං තං සරීර"න්ති? භගවම්මූලකා -පෙ- තං ජීවං තං සරීරන්ති.

## 3. 2. 14.

### අඤ්ඤං ජීව අඤ්ඤං සරීර සුත්තං

237. සාවත්ථියං :

-පෙ- අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර"න්ති? භගවම්මූලකා -පෙ- අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති.

## 3. 2. 15.

### හොති තථාගත සුත්තං

238. සාවත්ථියං :

-පෙ- "හොති තථාගතො පරම්මරණා"ති? භගවම්මූලකා -පෙ- හොති තථාගතො පරම්මරණාති.

## 3. 2. 16.

### නහොති තථාගත සුත්තං

239. සාවත්ථියං :

-පෙ- "න හොති තථාගතො පරම්මරණා"ති? භගවම්මූලකා -පෙ- න හොති තථාගතො පරම්මරණාති.

## 3. 2. 17.

### හොති ච නචහොති තථාගත සුත්තං

240. සාවත්ථියං :

-පෙ- "හොති ච න ච හොති තථාගතො පරම්මරණා"ති? භගවම්මූලකා -පෙ- හොති ච න ච හොති තථාගතො පරම්මරණාති.

## 3. 2. 18.

### නෙව හොති න නහොති සුත්තං

241. සාවත්ථියං :

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා, -පෙ-

## 3. 2. 13.

## තං ජීවං තං සරීරං සූත්‍රය

**236. සැවැත්නුවර :**

. . . ''එමැ ජීව යැ, එමැ ශරීරය''යි ? භගවත්හු මුල් කොට ඇතියහ . . . එමැ ජීව යැ, එමැ ශරීර යයි.

## 3. 2. 14.

## අන්‍යත් ජීව අන්‍යත් ශරීර සූත්‍රය

**237. සැවැත්නුවර :**

. . . ''ජීවය අනෙකක, ශරීරය අනෙකකැ''යි ? භගවත්හු මුල් කොට ඇතියහ . . . ජීවය අනෙකක, ශරීරය අනෙකකැයි.

## 3. 2. 15.

## හොති තථාගත සූත්‍රය

**238. සැවැත්නුවර :**

. . . ''සත්ත්වයා මරණින් මතු වේ ය''යි ? භගවත්හු මුල් කොට ඇතියහ . . . සත්ත්වයා මරණින් මතු වේ.

## 3. 2. 16.

## නහොති තථාගත සූත්‍රය

**239. සැවැත්නුවර :**

. . . ''සත්ත්වයා මරණින් මතු නො වේ ය''යි ? භගවත්හු මුල් කොට ඇතියහ . . . සත්ත්වයා මරණින් මතු නො වේ යි.

## 3. 2. 17.

## හොති ච නච හොති තථාගත සූත්‍රය

**240. සැවැත්නුවර :**

. . . 'සත්ත්වයා මරණින් මතු වෙයි, නො ද වේ ය''යි ? භගවත්හු මුල් කොට ඇතියහ . . . සත්ත්වයා මරණින් මතු වෙයි, නො ද වේ.

## 3. 2. 18.

## නෙව හොති න න හොති තථාගත සූත්‍රය

**241. සැවැත්නුවර :**

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස ''සත්ත්වයා මරණින් මතු නො ම වෙයි, නො ම නොවෙයි''යන මෙබඳු දෘෂ්ටියක් උපදී ද ? යි

වහන්ස, අපගේ දහම්හූ භගවත්හු මුල් කොට ඇතියහ . . .

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "නෙව හොති න න හොති තථාගතො පරම්මරණා"ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති.

## 3. 2. 19.

### රූපී අත්තා සුත්තං

242. සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "රූපී අත්තා හොති අරොගො පරම්මරණා"ති?

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා, -පෙ-

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: රූපී අත්තා හොති අරොගො පරම්මරණා'ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "රූපී අත්තා හොති අරොගො පරම්මරණා"ති

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, "රූපං නිච්චං වා අනිච්චං වා"ති -පෙ-

දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "රූපී අත්තා හොති අරොගො පරම්මරණා"ති?

නො හෙතං භන්තෙ.

"වෙදනා -පෙ- "සඤ්ඤා -පෙ- "සඞ්ඛාරා -පෙ- "විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වා"ති -පෙ-

දුක්ඛං විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය, "රූපී අත්තා හොති අරොගො පරම්මරණා"ති?

නො හෙතං භන්තෙ,

ඉති ඛො භික්ඛවෙ දුක්ඛෙ සති දුක්ඛං උපාදාය දුක්ඛං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති; "රූපී අත්තා හොති අරොගො පරම්මරණාති.

## 3. 2. 20.

### අරූපී අත්තා සුත්තං

243. සාවත්ථියං:

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති; "අරූපී අත්තා හොති අරොගො පරම්මරණා"ති.

(සො යෙව පෙය්‍යාලො විත්ථාරෙතබ්බො.)

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස ''සත්ත්වයා මරණින් මතු නො ම වෙයි, නො ම නො වෙ යි'' යන මෙබඳු දෘෂ්ටියක් උපදී. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාරයන් ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානයට පිවිස ''සත්ත්වයා මරණින් මතු නො ම වෙයි, නො ම නො වෙයි'' යන මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද ? . . . සත්ත්වයා මරණින් මතු නොම වෙයි, නො ම නො වේ යයි.

## 3. 2. 19.

## රූපී අත්තා සූත්‍රය

**242.** සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස ''ආත්මය රූප ඇත්තේ මරණින් මතු නිරෝග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද ? යි.

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස ''ආත්මය රූප ඇත්තේ මරණින් මතු නිරෝග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාරයන් ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානයට පිවිස ''ආත්මය රූප ඇත්තේ මරණින් මතු නිරෝග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි ඒ කිමැ යි හඟිවූ ද, රූපය නිත්‍ය හෝ වේ ද, අනිත්‍ය හෝ වේ ද''යි ? . . .

දුක් නම් වෙනස් වන සුලු නම් එය නොඇසුරු කොට ''ආත්මය රූප ඇත්තේ මරණින් මතු නිරෝග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදනේ ද ? යි.

වහන්ස, මෙය නො වේ මැ යැ.

''වේදනාව . . . ''සංඥාව . . . ''සංස්කාරයෝ . . . ''විඥානය නිත්‍ය ද ? හෝ අනිත්‍ය ද ? හෝ යි . . .

දුක් නම් වෙනස් වනසුලු නම් එය නොඇසුරු කොට ''ආත්මය රූප ඇත්තේ මරණින් මතු නිරෝග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදනේ ද ? යි.

වහන්ස, මෙය නො වේ ම ය.

මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක ඇසුරු කොට දුකට පිවිස ආත්මය රූප ඇත්තේ මරණින් මතු නිරෝග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී යයි.

## 3. 2. 20.

## අරූපී අත්තා සූත්‍රය

**243.** සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස ''ආත්මය රූප නැත්තේ මරණින් මතු නිරෝග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද ?යි.

(ඒ පෙයyaාලය ම විස්තර කටයුතු යි)

3. 2. 21.

රූපීච අරූපීච අත්තා සුත්තං

244. සාවත්ථියං :

-පෙ- "රූපී ච අරූපී ච අත්තා හොති අරොගො පරම්මරණා"ති.

3. 2. 22.

නෙව රූපී නාරූපී අත්තා සුත්තං

245. සාවත්ථියං :

-පෙ- "නෙවරූපී නාරූපී අත්තා හොති අරොගො පරම්මරණා"ති

3. 2. 23.

එකන්තසුඛී අත්තා සුත්තං

246. සාවත්ථියං :

-පෙ- "එකන්තසුඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති.

3. 2. 24.

එකන්තදුක්ඛී අත්තා සුත්තං

247. සාවත්ථියං :

-පෙ- "එකන්තදුක්ඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති.

3. 2. 25.

සුඛදුක්ඛී අත්තා සුත්තං

248. සාවත්ථියං :

-පෙ- "සුඛදුක්ඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති.

3. 2. 26.

අදුක්ඛමසුඛී අත්තා සුත්තං

249. සාවත්ථියං :

-පෙ- "අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති.

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-

## 3. 2. 21.

## රූපී ච අරූපී ච අත්තා සූත්‍රය

**244.** සැවැත්නුවර :

. . . ආත්මය රූප ඇත්තේත් රූප නැත්තේත් මරණින් මතු නීරොග වේ ය''යි . . .

## 3. 2. 22.

## නෙව රූපී නාරූපී අත්තා සූත්‍රය

**245.** සැවැත්නුවර :

. . . ආත්මය නො ම රූප ඇත්තේත් නො ම රූප නැත්තේත් මරණින් මතු නීරොග වේ ය''යි.

## 3. 2. 23.

## ඒකන්තසුඛී අත්තා සූත්‍රය

**246.** සැවැත්නුවර :

. . . ''ආත්මය ඒකැතින් සුව ඇත්තේ මරණින් මතු නීරොග වේ ය''යි.

## 3. 2. 24.

## ඒකන්ත දුක්ඛී අත්තා සූත්‍රය

**247.** සැවැත්නුවර :

. . . ආත්මය ඒකැතින් දුක් ඇත්තේ මරණින් මතු නීරොග වේ ය''යි

## 3. 2. 25.

## සුඛ දුක්ඛී අත්තා සූත්‍රය

**248.** සැවැත්නුවර :

. . . ආත්මය සුවදුක් ඇත්තේ මරණින් මතු නීරොග වේ ය''යි.

## 3. 2. 26.

## අදුක්ඛමසුඛ අත්තා සූත්‍රය

**249.** සැවැත්නුවර :

. . . ''ආත්මය නොදුක් නොසුව ඇත්තේ මරණින් මතු නීරොග වේ දැ''යි.

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . .

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති -පෙ- විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති.

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති -පෙ- විපරිණාමධම්මං අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති.

නො හෙතං භන්තෙ,

ඉති ඛො භික්ඛවෙ, දුක්ඛෙ සති දුක්ඛං උපාදාය දුක්ඛං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති: "අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති -පෙ-

ගමනවග්ගො දුතියො.

තත්‍රුද්දානං:

වාතං එතං මම සො අත්තා නො ච මෙ සියා,
නත්ථි කරතො හෙතුච්ච මහාදිට්ඨෙන අට්ඨමං.

සස්සතො අසස්සතො චෙව අන්තා අනන්තා ච වුච්චති,
තං ජීවං අඤ්ඤං ජීවං ච තථාගතෙන චත්තාරෙ.

රූපී අත්තා යථා හොති අරූපී ච තථා පරං,
රූපී චාරූපී ච අත්තා නෙව රූපී නාරූපී ච,

එකන්තසුඛී ච අත්තා එකන්ත දුක්ඛී තථා.
සුඛදුක්ඛී අත්තා ච අදුක්ඛමසුඛී පරං,
ඉමෙ ඡබ්බීසසුත්තන්තා දුතියවාරෙ සුදෙසිතාති.

Free Distribution www.aathaapi.org

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස ''ආත්මය නොදුක් නොසුව ඇත්තේ මරණින් මතු නීරොග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාරයන් ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානයට පිවිස ආත්මය නොදුක් නොසුව ඇත්තේ මරණින් මතු නීරොග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ ? යි. . . . වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට ''ආත්මය නොදුක් නොසුව ඇත්තේ මරණින් මතු නීරොග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදනේ දැ ? යි.

වහන්ස, මෙය නො වේ මැ යැ.

වේදනාව . . . සංඥාව . . . සංස්කාරයෝ . . . විඥානය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ ? යි. . . . වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට ''ආත්මය නොදුක් නොසුව ඇත්තේ මරණින් මතු නීරොග වේ ය''යි මෙ බඳු දෘෂ්ටියක් උපදනේ දැ ?යි.

වහන්ස, මෙය නො වේ ම ය.

මහණෙනි, මෙසේ දුක ඇති කල්හි දුක ඇසුරු කොට දුකට පිවිස ''ආත්මය නොදුක් නොසුව ඇත්තේ මරණින් මතු නීරොග වේ'' යයි මෙ බඳු දෘෂ්ටියක් උපදී. . .

**දෙවෙනි ගමන වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය :**

වාත, එතං මම, සො අත්තා නො ච මෙ සියා, නත්ථි දින්න, කරතො, නත්ථි හෙතු සූත්‍රයෝ ය. අටවැනි මහාදිට්ඨි සූත්‍රය ය,

සස්සතලොක, අසස්සතලොක, අන්තවත් ලොක, අනන්තවත් ලොක, තං ජීවං තං ශරීර, අඤ්ඤං ජීවං අඤ්ඤං ශරීර සූත්‍රයෝ ය. හොති තථාගත, නහොති තථාගත, හොති ච නච හොති තථාගත, නෙව හොති න නහොති තථාගත, යන සූත්‍ර සතරය,

රූපී අත්තා සූත්‍රය, එසේම අරූපී අත්තා සූත්‍රය, රූපී ච අරූපී ච අත්තා, නෙව රූපී න අරූපී අත්තා යැ,,

ඒකන්තසුඛී අත්තා ඒකන්තදුක්ඛී අත්තා, සුඛදුක්ඛී අත්තා සූත්‍රයෝ ය. අනෙක් අදුක්ඛමසුඛීඅත්තා සූත්‍රය ද යි මේ සවිසි සූත්‍රයෝ දෙවෙනි වර මැනැවින් දෙසන ලදහ යි.

## 3. තතියගමන වග්ගො

### 3. 3. 1—25.

### වාත සුත්තං

**250 - 274. සාවත්ථියං :**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : “න වාතා වායන්ති, න නජ්ජො සන්දන්ති, න ගබ්භිනියො විජායන්ති, න චන්දිමසුරියා උදෙන්ති වා අපෙන්ති වා එසිකට්ඨායිට්ඨිතා”ති.

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : “න වාතා වායන්ති -පෙ- එසිකට්ඨායිට්ඨිතා”ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : “න වාතා වායන්ති -පෙ- එසිකට්ඨායිට්ඨිතා”ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති -පෙ- විපරිණාමධම්මං. අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය : “න වාතා වායන්ති -පෙ- එසිකට්ඨායිට්ඨිතා”ති.

නො හෙතං භන්තෙ,

ඉති ඛො භික්ඛවෙ, යදනිච්චං තං දුක්ඛං, තස්මිං සති තදුපාදාය එවං දිට්ඨි උප්පජ්ජති : “න වාතා වායන්ති -පෙ- එසිකට්ඨායිට්ඨිතා”ති. (පඤ්චවීසති සුත්තන්තා එවං විත්ථාරෙතබ්බා.)

### 3. 3. 26

### අදුක්ඛමසුඛී අත්තාසුත්තං

**275. සාවත්ථියං :**

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : “අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා”ති.

භගවම්මූලකා නො භන්තෙ ධම්මා -පෙ-.

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : “අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා”ති. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවංදිට්ඨි උප්පජ්ජති : “අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා”ති.



Free Distribution www.aathaapi.org

## 3. තතිය ගමන වර්ගය

### 3. 3. 1—25

### වාත සූත්‍රය

**250-274.** සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස වාතයෝ නො හමති. ගංගාවෝ නො ගලාබසිති. ගැබිනියෝ ප්‍රසව නො කෙරෙති, සඳහිරු නො ද උදවෙති, නො ද පහ ව යෙති. ඉන්ද්‍රකීලයන් මෙන් සිටියාහු ය''යි දෘෂ්ටියෙක් උපදී ද යි.

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ. . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස ''වාතයෝ නො හමත්, . . . ඉන්ද්‍රකීලයන් මෙන් සිටියාහු ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී යි. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානයට පිවිස ''වාතයෝ නො හමති . . . ඉන්ද්‍ර කීලයන් මෙන් සිටියාහු ය''යි මෙබඳු දෘෂ්ටියෙක් උපදී.

මහණෙනි, 'ඒ කිමැ'යි හඟිවු ද ? 'රූපය නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ ද යි . . . වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට ''වාතයෝ නො හමත් . . . ඉන්ද්‍රකීලයන් මෙන් සිටියාහු ය''යි මෙබඳු දෘෂ්ටියෙක් උපදී ද යි.

වහන්ස, තෙල නො වේ මැ යි.

මහණෙනි, මෙසේ යමෙක් අනිත්‍ය ද එය දුක් යැ. එය ඇති කල්හි එය ඇසිරි කොට ''වාතයෝ නො හමති . . . ඉන්ද්‍රකීලයන් මෙන් සිටියාහු ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී''යි. (සූත්‍ර 25 මෙසේ විස්තර කටයුතු යි.)

### 3. 3. 26.

### අදුක්ඛමසුඛී අත්තා සූත්‍රය

**275.** සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස ''ආත්මය නො දුක් නො සුව ඇත්තේ මරණින් මතු නීරොග වේ ය''යි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද යි.

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස ''ආත්මය නො දුක් නොසුව ඇත්තේ මරණින් මතු නීරොග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදියි. වේදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානයට පිවිස ආත්මය නොදුක් නොසුව ඇත්තේ මරණින් මතු නීරොග වේ යයි මෙබඳු දෘෂ්ටියක් උපදී.



30—ඒ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති -පෙ- විපරිණාමධම්මං. අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති.

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති -පෙ- විපරිණාමධම්මං. අපි නු තං අනුපාදාය එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති.

නො හෙතං භන්තෙ,

ඉති ඛො භික්ඛවෙ, යදනිච්චං තං දුක්ඛං, තස්මිං සති තදුපාදාය තං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජෙය්‍ය: "අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා"ති.

**තතියගමනවග්ගො තතියො.**

තත්‍රුද්දානං:

වාතං එතං මම සො අත්තා නො ච මෙ සියා,
නත්ථි කරතො හෙතු ච මහාදිට්ඨෙන අට්ඨමං.

සස්සතො අසස්සතො චෙව අත්තා නන්ත ච වුච්චති,
තං ජීවං අඤ්ඤං ජීවං ච තථාගතෙන චත්තාරො.

රූපී අත්තා යථා හොති අරූපී ච තථා පරං,
රූපී චාරූපී ච අත්තා නෙව රූපී නාරූපී ච.

එකන්තසුඛී ච අත්තා එකන්තදුක්ඛී තථා,
සුඛදුක්ඛී අත්තා ච අදුක්ඛමසුඛී පරං,
ඉමෙ ඡබ්බීස සුත්තන්තා තතියවාරෙ සුදෙසිතාති.

මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද යි. . . . වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට ''ආත්මය නොදුක් නොසුව ඇත්තේ මරණින් මතු නීරෝග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි.

වහන්ස, නෙල නො වේ මැ යැ.

වෙදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ වේ ද ?, අනිත්‍ය හෝ වේ ද ? යි . . . වෙනස් වනසුලු නම් එය නො ඇසුරු කොට ''ආත්මය නොදුක් නොසුව ඇත්තේ මරණින් මතු නීරොග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි.

වහන්ස, නෙල නො වේ මැ යි.

මහණෙනි, මෙසේ යමෙක් අනිත්‍ය ද එය දුක් යැ. එය ඇති කල්හි එයඇසුරු කොට එයට පිවිස ''ආත්මය නොදුක් නොසුව ඇත්තේ මරණින් මතු නීරොග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී යි.

**තෙවෙනි තතිය ගමන වර්ග යි.**

**එහි උද්දානය :**

වාත, එතං මම, සො අත්තා, නො ච මෙ සියා, නත්ථි දින්නං, කරතො, නත්ථි හෙතු සූත්‍රයෝ ය. අටවැනි මහාදිට්ඨි සූත්‍ර ය, සස්සත ලොක, අසස්සතලොක, අන්තවා ලොක, අනන්තවා ලොක, තං ජීව තං ශරීර, අන්‍යත් ජීව අන්‍යත් ශරීර සූත්‍රයෝ ය. හොති තථාගත, නහොති තථාගත, හොති ච න ච හොති තථාගත, නෙව හොති න න හොති තථාගත යන සූත්‍ර සතර ය, රූපී අත්තා සූත්‍රය, එසේම අනෙක් අරූපී අත්තා සූත්‍රය, රූපී ච අරූපී ච අත්තා, නෙව රූපී න අරූපී අත්තා, එකන්තසුඛී අත්තා, එකන්තදුක්ඛී අත්තා, සුඛදුක්ඛී අත්තා සූත්‍රයෝ ය, අනෙක් අදුක්ඛමසුඛී අත්තා සූත්‍රය ද යි මේ සව්සි සූත්‍රයෝ තෙවෙනි වර මැනැවින් දෙසන ලදහ යි.

# චතුත්ථගමන වග්ගො

3. 4. 1—25

වාත සුත්තං

**276-300.** සාවත්ථියං :

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති ; න වාතා වායන්ති න නජ්ජො සන්දන්ති න ගබ්භිනියො විජායන්ති න චන්දිමසුරියා උදෙන්ති වා අපෙන්ති වා එසිකට්ඨායිට්ඨිතා’’ති.

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : ‘‘න වාතා වායන්ති න නජ්ජො සන්දන්ති න ගබ්භිනියො විජායන්ති න චන්දිමසුරියා උදෙන්ති වා අපෙන්ති වා එසිකට්ඨායිට්ඨිතා’’. වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවංදිට්ඨි උප්පජ්ජති ; න වාතා වායන්ති -පෙ- එසිකට්ඨායිට්ඨිතා’’ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති -පෙ- විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං ‘‘එතං මම එසො හමස්මි එසො මෙ අත්තා’’ති.

නො හෙතං භන්තෙ.

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- ‘‘විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති. -පෙ- විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං : ‘‘එතං මම එසො ‘හමස්මි එසො මෙ අත්තා’’ති

නො හෙතං භන්තෙ,

තස්මාතිහ භික්ඛවෙ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං -පෙ- සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං, යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං -පෙ- සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ -පෙ- නාපරං ඉත්ථත්තායාති පජානාතීති.
(පඤ්චවීසතිසුත්තන්තා විත්ථාරෙතබ්බා)



Free Distribution www.aathaapi.org

## චතුත්ථ ගමන වර්ගය

### 3. 4. 1—25

### වාත සූත්‍රය

**276-300.** සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස '' වාතයෝ නො හමති ගඞ්ගාවෝ නො ගලාබසිති, ගැබිනියෝ ප්‍රසව නො කෙරෙති, සඳහිරු නො උදවෙති, නො පහ ව යෙති, ඉන්ද්‍රකීලයන් මෙන් සිටියාහ''යි මෙ බඳු දෘෂ්ටියක් උපදී ද යි.

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ. . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස ''වාතයෝ නො හමති, ගඞ්ගාවෝ නො ගලාබසිති, ගැබිනියෝ ප්‍රසව නො කෙරෙති, සඳහිරුහු නො උදවෙති, නො පහව යෙති, ඉන්ද්‍රකීලයන් මෙන් සිටියාහ''යි මෙ බඳු දෘෂ්ටියක් උපදියි. වෙදනාව ඇති කල්හි . . . සංඥව ඇති කල්හි . . . සංස්කාර ඇති කල්හි . . . විඥනය ඇති කල්හි විඥනය ඇසුරු කොට විඥනයට පිවිස '' වාතයෝ නො හමත්, . . . ඉන්ද්‍රකීලයන් මෙන් සිටියාහ '' යි.

මහණෙනි, ඒ කිමැ'යි හඟිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ ද ? යි . . . වෙනස් වනසුලු නම් තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම'' යි දකින්නට සුදුසු ද ? යි.

වහන්ස, තෙල නො වේ මැ යැ.

වේදනාව . . . සංඥව . . . සංස්කාර . . . විඥනය නිත්‍ය හෝ වේ ද? අනිත්‍ය හෝ වේ ද? වෙනස් වන සුලු නම් '' තෙල මාගේ යැ, තෙමල මම වෙමි, තෙල මාගේ ආත්ම '' යි දකින්නට සුදුසු දැ යි.

වහන්ස, තෙල නො වෙ මැ යි.

මහණෙනි, එහෙයින් මෙහි ලා අතීත වූ හෝ අනාගත වූ හෝ වර්තමාන වූ හෝ යම් කිසි රූපයක් වෙ නම්, . . . මනා නුවණින් දක්ක යුතු යි. යම් කිසි වේදනාවක් . . . යම් කිසි සංඥවක් යම් කිසි සංස්කාර කෙනෙක් . . . අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ යම් කිසි විඥනයෙක් වේ නම් . . . මනා නුවණින් දක්ක යුතු යි.

මහණෙනි, මෙසේ දක්නේ . . . මෙ බැව් පිණිස අනෙකක් නැතැ යි දනගනී යි. (සූත්‍ර පස්විස්ස විස්තර කටයුතු යි.)



Free Distribution www.aathaapi.org

## 3. 4. 26.

### අදුක්ඛමසුඛී අත්තා සුත්තං

**301.** සාවත්ථියං :

කිස්මිං නු ඛො භික්ඛවෙ, සති කිං උපාදාය කිං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : “අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා”ති.

භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-

රූපෙ ඛො භික්ඛවෙ, සති රූපං උපාදාය රූපං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : “අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා”ති.

වෙදනාය සති -පෙ- සඤ්ඤාය සති -පෙ- සඞ්ඛාරෙසු සති -පෙ- විඤ්ඤාණෙ සති විඤ්ඤාණං උපාදාය විඤ්ඤාණං අභිනිවිස්ස එවං දිට්ඨි උප්පජ්ජති : “අදුක්ඛමසුඛී අත්තා හොති අරොගො පරම්මරණා”ති.

තං කිං මඤ්ඤථ භික්ඛවෙ, රූපං නිච්චං වා අනිච්චං වාති.

අනිච්චං භන්තෙ, -පෙ- විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං “එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා”ති.

නො හෙතං භන්තෙ,

වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං නිච්චං වා අනිච්චං වාති. -පෙ- විපරිණාමධම්මං, කල්ලං නු තං සමනුපස්සිතුං “එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා”ති.

නො හෙතං භන්තෙ,

තස්මාතිහ භික්ඛවෙ, යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං -පෙ- සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං, යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං -පෙ- සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං.

එවං පස්සං භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

චතුත්ථගමනවග්ගො චතුත්ථො.

## 3. 4. 26.

## අදුක්ඛමසුඛී අත්තා සූත්‍රය

301. සැවැත්නුවර :

මහණෙනි, කුමක් ඇති කල්හි කුමක් ඇසුරු කොට කුමකට පිවිස '' ආත්මය නොදුක් නො සුව ඇත්තේ මරණින් මතු නිරොග වේ ය''යි මෙබඳු දෘෂ්ටියක් උපදී ද යි.

වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ. . . .

මහණෙනි, රූපය ඇති කල්හි රූපය ඇසුරු කොට රූපයට පිවිස '' ආත්මය නො දුක් නො සුව ඇත්තේ මරණින් මතු නිරොග වේ ය'' යි මෙබඳු දෘෂ්ටියක් උපදී. වෙදනාව ඇති කල්හි . . . සංඥාව ඇති කල්හි . . . සංස්කාරයන් ඇති කල්හි . . . විඥානය ඇති කල්හි විඥානය ඇසුරු කොට විඥානයට පිවිස '' ආත්මය නො දුක් නො සුව ඇත්තේ මරණින් මතු නිරොග වේ ය''යි මෙ බඳු දෘෂ්ටියක් උපදී.

මහණෙනි, ඒ කිමැ යි හගිවු ද ? රූපය නිත්‍ය හෝ වේ ද ? අනිත්‍ය හෝ වේ දැ යි.

වහන්ස, අනිත්‍ය ය. . . . වෙනස් වනසුලු නම් එය '' තෙල මාගේ ය, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම ය ''යි දක්නට සුදුසු දැ ? යි

වහන්ස තෙල නො වේ මැ යැ. වෙදනාව . . . සංඥාව . . . සංස්කාර . . . විඥානය නිත්‍ය හෝ වේ ද අනිත්‍ය හෝ වේ දැ යි. . . . වෙනස් වනසුලු නම් එය '' තෙල මාගේ යැ, තෙලෙ මම වෙමි, තෙල මාගේ ආත්ම '' යි දක්නට සුදුසු දැ යි.

වහන්ස, තෙල නො වේ මැ යි.

මහණෙනි, එහෙයින් මෙහිලා අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ යම් කිසි රූපයෙක් වේ නම් . . . මනා නුවණින් දක්ක යුතු යි. යම් කිසි වෙදනාවක් . . . යම් කිසි සංඥවක් . . . යම් කිසි සංස්කාර කෙනෙක් . . . අතීත වූ හෝ අනාගත වූ හෝ පච්චුප්පන්න වූ හෝ යම් කිසි විඥානයෙක් වේ නම් . . . මනා නුවණින් දක්ක යුතු යි.

මහණෙනි, මෙසේ දක්නා වූ ශ්‍රැතවත් ආර්‍යශ්‍රාවක තෙමේ රූපයෙහිත් කලකිරෙයි. වේදනාවෙහිත් කලකිරෙයි. සංඥාවෙහිත් කලකිරෙයි. සංස්කාරයන්හිත් කලකිරෙයි. විඥානයෙහිත් කලකිරෙයි. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇල්මෙන් මිදෙයි. මිදුණු කල්හි මිදුණේ යි දැනීම වෙයි. ජාතිය ක්ෂය වූවා, බඹසර වැස නිමවන ලදී. කරණී කරන ලදී. මේ බැව් පිණිය අනෙකෙක් නැතැ යි දැනගනී යි.

**සිවුවැනි චතුත්ථ ගමන වර්ග යි.**

තත්‍රුද්දානං :

වාතා එතං මම සො අත්තා නො ච මෙ සියා,
නත්ථි කරතො හෙතු ච මහාදිට්ඨෙන අට්ඨමං.
සස්සතො අසස්සතො චෙව අන්තා අනන්තා ච වුච්චති,
තං ජීවං අඤ්ඤං ජීවඤ්ච තථාගතෙන චත්තාරො,
රූපී අත්තා යථා හොති අරූපී ච තථාපරෙ.
නෙව රූපී නාරූපිතා එකන්තසුඛී අත්තා ච,
එකන්තදුක්ඛී සුඛදුක්ඛී අදුක්ඛමසුඛී චා ති.

දිට්ඨිසංයුත්තං සමත්තං.

Free Distribution www.aathaapi.org

**එහි සූත්‍ර නාමාවලිය :**

වාත, එතං මම, සො අත්තා, නො ච මෙ සියා, නත්ථි අත්තා, කරතො, නත්ථි හෙතු සූත්‍රයෝ ය. අට වැනි මහාදිට්ඨි සූත්‍ර ය, සස්සතලොක, අසස්සතලොක, අන්තවත් ලොක, අනන්තවත් ලොක, තංජීවං තංසරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං ශරීර, සූත්‍රයෝ ය, හොති තථාගත, න හොති තථාගත, හොති ච නච හොති තථාගත, නෙව හොති න නහොති තථාගත සූත්‍ර සතර ය, රූපී අත්තා, අරූපී අත්තා එසේ ම අනෙක් රූපී අරූපී අත්තා, නෙව රූපී නාරූපී අත්තා, එකන්ත සුඛී අත්තා, එකන්ත දුක්ඛී අත්තා, සුඛදුක්ඛී අත්තා, අදුක්ඛමසුඛී අත්තා සූත්‍රයෝ ය යි සව්යි සූත්‍ර කෙනෙකි.

**දිට්ඨි සංයුත්තය නිමියේ යි.**

# 4. ඔක්කන්තිසංයුත්තං

## 1. චක්ඛුවග්ගො

### 4. 1. 1

### චක්ඛු සුත්තං

**302. සාවත්ථියං :**

චක්ඛුං භික්ඛවෙ, අනිච්චං විපරිනාමි[1] අඤ්ඤථාභාවි, සොතං අනිච්චං විපරිනාමි අඤ්ඤථාභාවි, ඝානං අනිච්චං විපරිනාමි අඤ්ඤථාභාවි, ජිව්හා අනිච්චා විපරිනාමි අඤ්ඤථාභාවි, කායො අනිච්චො විපරිනාමි අඤ්ඤථාභාවි, මනො අනිච්චො විපරිනාමි අඤ්ඤථාභාවි.

යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ එවං සද්දහති අධිමුච්චති, අයං වුච්චති සද්ධානුසාරී ඔක්කන්තො සම්මත්තනියාමං සප්පුරිසභූමිං ඔක්කන්තො වීතිවත්තො පුථුජ්ජනභූමිං, අභබ්බො තං කම්මං කාතුං යං කම්මං කත්වා නිරයං වා තිරච්ඡානයොනිං වා පෙත්තිවිසයං වා උපපජ්ජෙය්‍ය. අභබ්බො ච[2] තාව කාලං කාතුං යාව න සොතාපත්තිඵලං සච්ඡිකරොති.

යස්ස ඛො භික්ඛවෙ, ඉමෙ ධම්මා එවං පඤ්ඤාය මත්තසො නිජ්ඣානං ඛමන්ති, අයං වුච්චති ධම්මානුසාරී ඔක්කන්තො සම්මත්තනියාමං සප්පුරිසභූමිං ඔක්කන්තො, වීතිවත්තො පුථුජ්ජනභූමිං. අභබ්බො තං කම්මං කාතුං යං කම්මං කත්වා නිරයං වා තිරච්ඡානයොනිං වා පෙත්තිවිසයං වා උපපජ්ජෙය්‍ය, අභබ්බො ච තාව කාලං කාතුං යාව න සොතාපත්තිඵලං සච්ඡිකරොති.

යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ එවං ජානාති[3] එවං පස්සති, අයං වුච්චති සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

### 4. 1. 2

### රූප සුත්තං

**303. සාවත්ථියං :**

රූපා භික්ඛවෙ, අනිච්චා විපරිනාමිනො අඤ්ඤථාභාවිනො, සද්දා අනිච්චා විපරිනාමිනො අඤ්ඤථාභාවිනො, ගන්ධා අනිච්චා විපරිනාමිනො අඤ්ඤථාභාවිනො, රසා අනිච්චා විපරිනාමිනො අඤ්ඤථාභාවිනො, ඵොට්ඨබ්බා අනිච්චා විපරිනාමිනො අඤ්ඤථාභාවිනො, ධම්මා අනිච්චා විපරිනාමිනො අඤ්ඤථාභාවිනො.

---

1. විපරිණාමිං - සීමු සී 2, විපරිණාමී. PTS.
2. අභබ්බො ච - මජ්සං.
3. පජානාති - මජ්සං.



Free Distribution www.aathaapi.org

# 4. ඔකකන්ති සංයුත්තය

## 1. චක්‍ඛු වර්ගය

### 4. 1. 1

### චක්‍ඛු සූත්‍රය

**302.** සැවැත්නුවර :

මහණෙනි, ඇස අනිත්‍ය යැ, පෙරළෙනසුලු යැ, අන්පරිදි වනසුලු යැ. කන අනිත්‍ය යැ, පෙරළෙනසුලුයැ, අන්පරිදි වනසුලු යැ. නැහැය අනිත්‍ය යැ, පෙරළෙනසුලු යැ, අන්පරිදි වනසුලු යැ. දිව අනිත්‍ය යැ, පෙරළෙනසුලු යැ, අන්පරිදි වනසුලු යැ. කය අනිත්‍ය යැ, පෙරළෙනසුලු යැ, අන්පරිදි වනසුලු යැ. මනස අනිත්‍ය යැ, පෙරළෙන සුලු යැ, අන්පරිදි වනසුලු යැ.

මහණෙනි, යමෙක් මේ දහමුන් මෙසෙයින් හදහයි ද, විමොක්ෂය පිළිලබයි ද, මේ පුද්ගල 'සද්ධානුසාරී'යි කියනු ලැබෙයි. (හෙ) ආර්යමාර්ගයට පිවිසියේ යැ. සත්පුරුෂ භූමියට බැස ගත්තේ යැ, පෘථග්ජන භූමිය ඉක්මැ වූයේ යැ. යම් කර්මයක් කොට නිරයට වේවයි, තිරියත් යෝනියට වේවයි ප්‍රේත විෂයට වේවයි (උපත් විසින්) එළැඹේ නම් ඒ කර්ම කරන්නට අභව්‍ය (නො නිසි) යැ, යම් තාක් සෝතාපත්තිඵලය සාක්ෂාත් නො කෙරේ ද ඒ තාක් කලුරිය කරන්නට ද අභව්‍ය වේ මැ යි.

මහණෙනි, යමකුට මේ දහම්හු විදසුන් නුවණින් පමණ විසින් ධ්‍යානක්ෂම වෙත් ද, මේ පුද්ගල 'ධම්මානුසාරී' යි කියනු ලැබෙයි. (හෙ) සම්මත්ත නියාම සඞ්ඛ්‍යාත ආර්‍ය මාර්ගයට පිවිසියේ යැ, සත්පුරුෂ භූමියට බැයගත්තේ යැ, පෘථග්ජන භූමිය ඉක්මැ වූයේ යැ. යම් කර්මයක් කොට නිරයට හෝ තිරිසන් යෝනියට හෝ ප්‍රේතවිෂයට හෝ (උත්පත්ති විසින්) එළැඹේ නම් ඒ කර්ම කරන්නට ද අභව්‍ය යැ. යම්තාක් සෝතා පත්තිඵලය සාක්ෂාත් නො කෙරේ ද, ඒතාක් කලුරිය කරන්නට ද අභව්‍ය වේ මැ යි.

මහණෙනි, යමෙක් මේ ධර්ම මෙසේ විදසුන් නුවණින් දනී නම් මෙසේ දකී නම් මේ පුද්ගල සෝතාපන්න යයි කියනු ලැබෙයි, (හෙ) සතර අපායෙහි නොවැටෙනසුලු යැ., ගතිනියත යැ, සම්බෝධිය පරායන කොට ඇත්තේ යි.

### 4. 1. 2

### රූප සූත්‍රය

**303.** සැවැත්නුවර :

මහණෙනි, රූප අනිත්‍ය යැ, පෙරළෙනසුලු යැ, අන් පරිදි වනසුලු යැ. ශබ්ද අනිත්‍ය යැ, පෙරළෙනසුලු යැ, අන්පරිදි වනසුලු යැ. ගන්ධ අනිත්‍ය යැ, පෙරළෙනසුලු යැ, අන්පරිදිවනසුලු යැ. රස අනිත්‍ය යැ, පෙරළෙනසුලු යැ, අන්පරිදි වනසුලු යැ. ස්ප්‍රෂ්ටව්‍ය අනිත්‍ය යැ, පෙරළෙනසුලු යැ. අන්පරිදිවනසුලු යැ. ධර්ම අනිත්‍ය යැ, පෙරළෙනසුලු යැ අන්පරිදි වනසුලු යි.

යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ එවං සද්දහති අධිමුච්චති, අයං වුච්චති සද්ධානුසාරී -පෙ- අයං වුච්චති ධම්මානුසාරී ඔක්කන්තො සම්මත්තනියාමං, සප්පුරිසභූමිං ඔක්කන්තො, වීතිවත්තො පුථුජ්ජනභූමිං. අභබ්බො තං කම්මං කාතුං යං කම්මං කත්වා නිරයං වා තිරච්ඡානයොනිං වා පෙත්තිවිසයං වා උපපජ්ජෙය්‍ය, අභබ්බො ච තාව කාලං කාතුං යාව න සොතාපත්තිඵලං සච්ඡිකරොති.

යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ එවං ජානාති පස්සති, අයං වුච්චති. සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

## 4. 1. 3.

### විඤ්ඤාණ සුත්තං

**304. සාවත්ථියං :**

චක්ඛුවිඤ්ඤාණං භික්ඛවෙ, අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි සොතවිඤ්ඤාණං අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි. ඝාණවිඤ්ඤාණං අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි. ජිව්හාවිඤ්ඤාණං අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි. කායවිඤ්ඤාණං අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි. මනොවිඤ්ඤාණං අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි.

යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ එවං සද්දහති අධිමුච්චති අයං වුච්චති සද්ධානුසාරී -පෙ- සම්බොධිපරායණොති.

## 4. 1. 4.

### ඵස්ස සුත්තං

**305. සාවත්ථියං :**

චක්ඛුසම්ඵස්සො භික්ඛවෙ, අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී. සොතසම්ඵස්සො -පෙ- ඝානසම්ඵස්සො -පෙ- ජිව්හාසම්ඵස්සො -පෙ- කායසම්ඵස්සො -පෙ- මනොසම්ඵස්සො අනිච්චො විපරිණාමී අඤ්ඤථාභාවී. යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ එවං සද්දහති -පෙ- සම්බොධිපරායණොති.

## 4. 1. 5.

### වෙදනා සුත්තං

**306. සාවත්ථියං :**

චක්ඛුසම්ඵස්සජා වෙදනා භික්ඛවෙ, අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. සොතසම්ඵස්සජා වෙදනා -පෙ- ඝානසම්ඵස්සජා වෙදනා -පෙ- ජිව්හාසම්ඵස්සජා වෙදනා -පෙ- කායසම්ඵස්සජා වෙදනා -පෙ- මනොසම්ඵස්සජා වෙදනා අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ -පෙ- සම්බොධිපරායණොති.

මහණෙනි, යමෙක් මේ දහමුන් මෙසෙයින් හදහයි ද, (හැදහීමෙන්) විමොක්ෂය පිළිලබයි ද මේ පුද්ගල 'සද්ධානුසාරී' යි කියනු ලැබෙයි . . . ආයර්‍ය මාර්ගයට බැසගත් සත්පුරුෂ භූමියට පිවිසි පෘථග්ජන භූමිය ඉක්මැ වූ මේ පුද්ගල 'ධම්මානුසාරී' යි කියනු ලැබෙයි. යම් කර්මයක් කොට නිරයට හෝ තිරිසන් යෝනියට හෝ ප්‍රේතවිෂයට හෝ (උත්පත්ති වියින්) නො එළැඹේ ද ඒ කර්ම කරන්නට නො නිසි යැ. යම්තාක් සෝතාපත්තිඵලය පසක් නො කෙරේ ද, ඒතාක් කලුරිය කරන්නට ද නො නිසි මැ යි.

මහණෙනි, යමෙක් මේ දහම් වෙසෙසින් දනියි ද, දකියි ද, මේ පුහුල් සෝතාපන්න යැ. අවාහි නොහෙන සුලු යැ, ගතිනියත යැ, සම්බෝධිය පිහිට කොට ඇතැයි කියනු ලැබේ.

## 4. 1. 3.

## විඤ්ඤාණ සූත්‍රය

**304.** සැවැත්නුවර :

මහණෙනි, චක්ඛුවිඤ්ඤාණය අනිසයැ. වෙනස් වනසුලු යැ 'අන් පරිදි වනසුලු යැ. සෝතවිඤ්ඤාණය අනිස යැ. වෙනස් වනසුලු යැ. අන්පරිදි වනසුලු යැ. ඝාන විඤ්ඤාණය අනිස යැ. වෙනස් වනසුලු යැ. අන්පරිදි වනසුලු යැ. ජිව්හාවිඤ්ඤාණය අනිස යැ. වෙනස් වනසුලු යැ. අන්පරිදි වනසුලු යැ. කායවිඤ්ඤාණය අනිස යැ. වෙනස් වනසුලු යැ. අන්පරිදි වනසුලු යැ. මනෝවිඤ්ඤාණය අනිස යැ. වෙනස් වනසුලුයැ. අන්පරිදි වනසුලු යි.

මහණෙනි, යමෙක් මේ දහම් මෙසේ අදහා නම් විමොක්ෂය පිළිලබා නම් 'සද්ධානුසාරී' මේ පුද්ගල . . . සම්බෝධිය පිහිට කොට ඇත්තේ ය යි කියනු ලැබේ.

## 4. 1. 4.

## ඵස්ස සූත්‍රය

**305.** සැවැත්නුවර :

මහණෙනි, චක්ඛුසම්ඵස්සය අනිස යැ. වෙනස් වනසුලු යැ. අන්පරිදි වනසුලු යැ සෝතසම්ඵස්සය . . . ඝානසම්ඵස්සය . . . ජිව්හාසම්ඵස්සය . . . කායසම්ඵස්සය . . . මනෝසම්ඵස්සය අනිස යැ. වෙනස් වනසුලු යැ. අන්පරිදි වනසුලු යැ. මහණෙනි, යමෙක් මේ දහම් මෙසේ හදහා නම් . . . සම්බෝධිය පිහිට කොට ඇත්තේ යයි කියනු ලැබේ.

## 4. 1. 5.

## වේදනා සූත්‍රය

**306.** සැවැත්නුවර :

මහණෙනි, චක්ඛුසම්ඵස්සයෙන් හටගත් වේදනාව අනිස යැ. වෙනස් වනසුලු යැ. අන්පරිදි වනසුලු යැ. සොතසම්ඵස්සයෙන් හටගත් වේදනාව . . . ඝානසම්ඵස්සයෙන් හටගත් වේදනාව . . . ජිව්හාසම්ඵස්සයෙන් හටගත් වේදනාව . . . කායසම්ඵස්ස යෙන් හටගත් වේදනාව . . . මනොසම්ඵස්සයෙන් හටගත් වේදනාව අනිස යැ, වෙනස් වනසුලු යැ. අන්පරිදි වනසුලු යි. මහණෙනි, යමෙක් මේ දහම් . . . සම්බෝධිය පිහිට කොට ඇත්තේ ය යි කියනු ලැබේ.

## 4. 1. 6.

### සඤ්ඤා සුත්තං

**307. සාවත්ථියං:**

රූපසඤ්ඤා භික්ඛවෙ, අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. සද්දසඤ්ඤා -පෙ- ගන්ධසඤ්ඤා -පෙ- රසසඤ්ඤා -පෙ- ඵොට්ඨබ්බසඤ්ඤා -පෙ- ධම්මසඤ්ඤා අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ -පෙ- සම්බොධිපරායණොති.

## 4. 1. 7.

### චෙතනා සුත්තං

**308. සාවත්ථියං:**

රූපසඤ්චෙතනා භික්ඛවෙ, අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. සද්දසඤ්චෙතනා -පෙ- ගන්ධසඤ්චෙතනා -පෙ- රසසඤ්චෙතනා -පෙ- ඵොට්ඨබ්බසඤ්චෙතනා -පෙ- ධම්මසඤ්චෙතනා අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ -පෙ- සම්බොධිපරායණොති.

## 4. 1. 8.

### තණ්හා සුත්තං

**309. සාවත්ථියං:**

රූපතණ්හා භික්ඛවෙ, අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. සද්දතණ්හා -පෙ- ගන්ධතණ්හා -පෙ- රසතණ්හා -පෙ- ඵොට්ඨබ්බතණ්හා -පෙ- ධම්මතණ්හා අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ -පෙ- සම්බොධිපරායණොති.

## 4. 1. 9.

### ධාතු සුත්තං

**310. සාවත්ථියං:**

පඨවිධාතු භික්ඛවෙ, අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. ආපොධාතු -පෙ- තෙජොධාතු -පෙ- වායොධාතු -පෙ- ආකාසධාතු -පෙ- විඤ්ඤාණධාතු අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ -පෙ- සම්බොධිපරායණොති.

## 4. 1. 6.

## සඤ්ඤා සූත්‍රය

307. සැවැත්නුවර :

මහණෙනි, රූපසඤ්ඤාව අනිය ය. වෙනස් වනසුලු ය. 'අන්පරිදි වනසුලු ය සද්දසඤ්ඤාව . . . ගන්ධසඤ්ඤාව. . . රසසඤ්ඤාව . . . ඵොට්ඨබ්බසඤ්ඤාව . . . ධම්මසඤ්ඤාව අනිය යැ. වෙනස් වනසුලුයැ. අන්පරිදි වනසුලු යැ. මහණෙනි යමෙක් මේ දහම් . . . සම්බෝධිය පිහිට කොට ඇත්තේ ය යි කියනු ලැබේ යි.

## 4. 1. 7.

## චෙතනා සූත්‍රය

308. සැවැත්නුවර :

මහණෙනි, රූපසඤ්චෙතනාව අනිය යැ. වෙනස් වනසුලු යැ. අන්පරිදි වනසුලු යැ සද්දසඤ්චෙතනාව . . . ගන්ධසඤ්චෙතනාව . . . රසසඤ්චෙතනාව . . . ඵොට්ඨබ්බසඤ්චෙතනාව . . . ධම්මසඤ්චෙතනාව අනිස යැ. වෙනස් වනසුලු ය අන්පරිදි වනසුලුයි. මහණෙනි, යමෙක් මේ දහම් . . . සම්බොධිය පිහිට කොට ඇත්තේ වේ යයි.

## 4. 1. 8.

## තණ්හා සූත්‍රය

309. සැවැත්නුවර :

මහණෙනි, රූපතණ්හාව අනිය යැ, වෙනස් වනසුලු යැ, අන්පරිදි වනසුලු යැ, සද්ද තණ්හාව . . . ගන්ධතණ්හාව . . . රසතණ්හාව . . . ඵොට්ඨබ්බතණ්හාව . . . ධම්මතණ්හාව අනිස යැ, වෙනස් වනසුලු යැ, අන්පරිදි වනසුලු ය. මහණෙනි, යමෙක් මේ දහම් . . . සම්බොධිය පිහිට කොට ඇත්තේ වේ ය යි.

## 4. 1. 9.

## ධාතු සූත්‍රය

310. සැවැත්නුවර :

මහණෙනි, පඨවිධාතුව අනිස යැ, වෙනස් වනසුලු යැ, අන්පරිදි වනසුලු යැ, ආපෝ ධාතුව . . . තේජෝ ධාතුව . . . වායෝධාතුව . . . ආකාසධාතුව . . . විඤ්ඤාණධාතුව අනිය යැ, වෙනස් වනසුලුයැ. අන්පරිදි වනසුලු යි. මහණෙනි, යමෙක් මේ දහම් . . . සම්බොධිය පිහිට කොට ඇත්තේ වේ ය යි.

## 4. 1. 10.

### ඛන්ධ සුත්තං

**311. සාවත්ථියං :**

රූපං භික්ඛවෙ, අනිච්චං විපරිණාමි අඤ්ඤථාභාවි.

වේදනා අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. සඤ්ඤා අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. සඞ්ඛාරා අනිච්චා විපරිණාමී අඤ්ඤථාභාවී. විඤ්ඤාණං අනිච්චං විපරිණාමී අඤ්ඤථාභාවී.

යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ එවං සද්දහති අධිමුච්චති අයං වුච්චති සද්ධානුසාරී ඔක්කන්තො සම්මත්තනියාමං, සප්පුරිසභූමිං ඔක්කන්තො, වීතිවත්තො පුථුජ්ජනභූමිං, අභබ්බො තං කම්මං කාතුං යං කම්මං කත්වා නිරයං වා තිරච්ඡානයොනිං[1] වා පෙත්තිවිසයං වා උපපජ්ජෙය්‍ය, අභබ්බො ච තාව කාලං කාතුං යාව න සොතාපත්තිඵලං සච්ඡිකරොති.

යස්ස ඛො භික්ඛවෙ, ඉමෙ ධම්මා එවං පඤ්ඤාය මත්තසො නිජ්ඣානං ඛමන්ති, අයං වුච්චති ධම්මානුසාරී ඔක්කන්තො සම්මත්තනියාමං, සප්පුරිසභූමිං ඔක්කන්තො, වීතිවත්තො පුථුජ්ජනභූමිං, අභබ්බො තං කම්මං කාතුං යං කම්මං කත්වා නිරයං වා තිරච්ඡානයොනිං වා පෙත්තිවිසයං වා උපපජ්ජෙය්‍ය, අභබ්බො ච තාව කාලං කාතුං යාව න සොතාපත්තිඵලං සච්ඡිකරොති.

යො භික්ඛවෙ, ඉමෙ ධම්මෙ එවං ජානාති, එවං පස්සති, අයං වුච්චති සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනොති.

චක්ඛුවග්ගො පඨමො.

තස්සුද්දානං :

චක්ඛු රූපඤ්ච විඤ්ඤාණං ඵස්සො ච වෙදනාය ච,
සඤ්ඤා ච චෙතනා තණ්හා ධාතුක්ඛන්ධෙන තෙ දසාති.

ඔක්කන්තිසංයුත්තං නිට්ඨිතං.

---

1. තිරච්ඡානයොනියං - සී 1, 2.

Free Distribution www.aathaapi.org

## 4. 1. 10.

## ඛන්ධ සූත්‍රය

**311. සැවැත්නුවර :**

මහණෙනි, රූපය අනිස යැ, වෙනස් වනසුලු යැ, අන්පරිදි වනසුලු ය.

වේදනාව අනිය යැ, වෙනස්වන සුලු යැ, අන්පරිදි වනසුලු යැ. සංඥව අනිස යැ. වෙනස් වනසුලු යැ, අන්පරිදි වනසුලුයැ. සංස්කාර අනිය යැ, වෙනස් වනසුලු යැ. අන්පරිදි වනසුලු යැ, විඥනය අනිස යැ, වෙනස් වනසුලු යැ, අන් පරිදි වනසුලුයි.

මහණෙනි, යමෙක් මේ දහම් මෙසේ හදහා ද, (හැදැහීමෙන්) විමොක්ෂය පිළිලබා ද, මේ පුද්ගල සද්ධානුසාරි යැ, ආර්‍යමාර්ගයට පිවිසියේ යැ, සත්පුරුෂභූමියට බටුයේ යැ, පෘථග්ජන භූමිය ඉක්මවාලී යැ, යම් කර්මයක් කොට නිරයට වේවයි තිරිසන් යොනියට වේවයි ප්‍රෙතවිෂයට වේවයි (උපත් විසින්) එළැඹේ නම් ඒ කර්ම කරන්නට අභව්‍ය යැ, යම්තාක් සොතාපත්තිඵලය පසක් නො කෙරේ ද ඒ තාක් කලුරිය කරන්නට අභව්‍ය යි කියනු ලැබේ.

මහණෙනි, යමකුහට මේ දහම්හු මෙසේ විවසුත් නුවණින් පමණ විසින් ධ්‍යානක්‍ෂම වෙත් ද, මේ පුහුල් ධම්මානුසාරි යැ, අරිමඟට පිවිසියේ යැ, සපුරිස් බිමට බටුයේ යැ, පුහුදුන් බිම ඉක්මවාලී යැ, යම් කර්මයක් කොට නිරැහි වේවයි තිරිසන්යොන්හි වේවයි පෙව්සාහි වේවයි (උපත්විසින්) එළැඹෙනුයේ නම්, ඒ කර්ම කරන්නට නො තිසි යැ, සොතාපත්තිඵලය පසක් කරන තාක් කලුරිය කරන්නට ද නො තිසි මැ යි.

මහණෙනි, යමෙක් මේ දහමුන් මෙසේ දනියි ද, මෙසේ දකියි ද, මේ පුද්ගල සෝතාපන්න යැ, සතර අපායෙහි නො වෙනසුලු යැ, ගතිනියත යැ, සම්බෝධිය පරායන කොට ඇත්තේ යයි කියනු ලැබේ.

**පළමුවැනි චක්ඛු වර්ග යි.**

**එහි උද්දානය :**

චක්ඛු, රූප, විඤ්ඤාණ, ඵස්ස, වෙදනා, සඤ්ඤා, චෙතනා, තණ්හා, ධාතු, ඛන්ධ යි සූත්‍ර දශයෙකි.

**ඔක්කන්ති සංයුත්තය නිමියේ යි.**

31—ඒ 50066 (80/06)

# 5. උප්පාදසංයුත්තං

## 1. උප්පාදවග්ගො

### 5. 1. 1.

### චක්ඛු සුත්තං

**312.** සාවත්ථියං:

යො භික්ඛවෙ, චක්ඛුස්ස උප්පාදො ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො රොගානං ඨිති ජරාමරණස්ස පාතුභාවො. යො සොතස්ස -පෙ- යො ඝානස්ස -පෙ- යො ජිව්හාය -පෙ- යො කායස්ස -පෙ- යො මනස්ස උප්පාදො ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො, රොගානං ඨිති, ජරාමරණස්ස පාතුභාවො.

යො ච භික්ඛවෙ, චක්ඛුස්ස නිරොධො වූපසමො අත්ථඞ්ගමො, දුක්ඛස්සෙසො නිරොධො, රොගානං වූපසමො, ජරාමරණස්ස අත්ථඞ්ගමො, යො සොතස්ස නිරොධො -පෙ- යො ඝානස්ස නිරොධො -පෙ- යො ජිව්හාය නිරොධො -පෙ- යො කායස්ස නිරොධො -පෙ- යො මනස්ස නිරොධො වූපසමො අත්ථඞ්ගමො, දුක්ඛස්සෙසො නිරොධො, රොගානං වූපසමො ජරාමරණස්ස අත්ථඞ්ගමොති.

### 5. 1. 2.

### රූප සුත්තං

**313.** සාවත්ථියං:

යො භික්ඛවෙ, රූපානං උප්පාදො ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො, රොගානං ඨිති ජරාමරණස්ස පාතුභාවො. යො සද්දානං -පෙ- යො ගන්ධානං -පෙ- යො රසානං -පෙ- යො ඵොට්ඨබ්බානං -පෙ- යො ධම්මානං උප්පාදො ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො, රොගානං ඨිති, ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ, රූපානං නිරොධො වූපසමො අත්ථඞ්ගමො දුක්ඛස්සෙසො නිරොධො, රොගානං වූපසමො, ජරාමරණස්ස අත්ථඞ්ගමොති.

යො සද්දානං -පෙ- යො ගන්ධානං -පෙ- යො රසානං -පෙ- යො ඵොට්ඨබ්බානං -පෙ- යො ධම්මානං නිරොධො වූපසමො අත්ථඞ්ගමො, දුක්ඛස්සෙසො නිරොධො, රොගානං වූපසමො, ජරාමරණස්ස අත්ථඞ්ගමොති.



Free Distribution www.aathaapi.org

# 5. උපපාද සංයුත්තය

## 1. උපපාද වර්ගය

### 5. 1. 1.

### චක්ඛු සූත්‍රය

**312. සැවැත්නුවර :**

මහණෙනි, ඇස පිළිබඳ යම් ඉපැදීමෙක් පැවැත්මෙක් බිහිවීමෙක් පහළවීමෙක් වේ නම් මේ දුක්හි ඉපැද්ම යැ. රෝගයන්ගේ පැවැත්ම යැ. ජරාමරණයෙහි පහළවීම යි. කන පිළිබඳ යම් . . . නැහැය පිළිබඳ යම් . . . දිව පිළිබඳ යම් . . . කය පිළිබඳ යම් . . . සිත පිළිබඳ යම් ඉපැද්මෙක් පැවැත්මෙක් බිහි වීමෙක් පහළවීමෙක් වේ නම් මේ දුකෙහි ඉපැද්ම යැ. රෝගයන්ගේ පැවැත්ම යැ. ජරාමරණයෙහි පහළවීම යි.

මහණෙනි, ඇස පිළිබඳ යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් අස්තඞ්ගමයෙක් වේ නම් මේ දුකෙහි නිරෝධ යැ, රෝගයන්ගේ ව්‍යුපශම යැ, ජරාමරණයෙහි අස්තඞ්ගමය යි. කන පිළිබඳ යම් නිරෝධයෙක් . . . නැහැය පිළිබඳ යම් යම් නිරෝධයෙක් . . . දිව පිළිබඳ යම් නිරෝධයෙක් . . . කය පිළිබඳ යම් නිරෝධයෙක් . . . සිත පිළිබඳ යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් අස්තඞ්ගමයෙක් වේ නම් මේ දුකෙහි නිරෝධ යැ, රෝගයන්ගේ ව්‍යුපශම යැ, ජරාමරණයෙහි අස්තඞ්ගම යි.

### 5. 1. 2.

### රූප සූත්‍රය

**313. සැවැත්නුවර :**

මහණෙනි, රූපයන්ගේ යම් ඉපැද්මෙක් පැවැත්මෙක් බිහිවීමෙක් පහළවීමෙක් වේ නම් මේ දුකෙහි ඉපැත්ම යැ, රෝගයන්ගේ පැවැත්ම යැ, ජරාමරණයෙහි පහළවීම යි. ශබ්ද යන්ගේ යම් . . . ගන්ධයන්ගේ යම් . . . රසයන්ගේ යම් . . . ස්ප්‍රෂ්ටව්‍යයන්ගේ යම් . . . ධර්මයන්ගේ යම් ඉපැත්මෙක් පැවැත්මෙක් බිහිවීමෙක් පහළවීමෙක් වේ නම් මේ දුකෙහි ඉපැත්ම යැ, රෝගයන්ගේ පැවැත්ම යැ, ජරාමරණයෙහි පහළවීම යි.

මහණෙනි, රූපයන්ගේ යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් අස්තඞ්ගමයෙක් වේ නම් මේ දුකෙහි නිරෝධ යැ, රෝගයන්ගේ ව්‍යුපශම යැ. ජරාමරණයෙහි අස්තඞ්ගම යි.

ශබ්දයන්ගේ යම් . . . ගන්ධයන්ගේ යම් . . . රසයන්ගේ යම් . . . ස්ප්‍රෂ්ටව්‍ය යන්ගේ යම් . . . ධර්මයන්ගේ යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් අස්තඞ්ගමයෙක් වේ නම් මේ දුකෙහි නිරෝධ යැ. රෝගයන්ගේ ව්‍යුපශම යැ. ජරා මරණයෙහි අස්තඞ්ගමය යි.



Free Distribution www.aathaapi.org

## 5. 1. 3.

### විඤ්ඤාණ සුත්තං

**314. සාවත්ථියං :**

යො භික්ඛවෙ, චක්ඛුවිඤ්ඤාණස්ස උප්පාදො ඨිති -පෙ- මනොවිඤ්ඤාණස්ස උප්පාදො ඨිති -පෙ- ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ, චක්ඛුවිඤ්ඤාණස්ස නිරොධො -පෙ- යො මනොවිඤ්ඤාණස්ස නිරොධො -පෙ- ජරාමරණස්ස අත්ථඞ්ගමොති.

## 5. 1. 4.

### ඵස්ස සුත්තං

**315. සාවත්ථියං :**

යො භික්ඛවෙ, චක්ඛුසම්ඵස්සස්ස උප්පාදො ඨිති -පෙ- යො මනොසම්ඵස්සස්ස උප්පාදො ඨිති -පෙ- ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ, චක්ඛුසම්ඵස්සස්ස නිරොධො වූපසමො -පෙ- මනොසම්ඵස්සස්ස නිරොධො වූපසමො ජරාමරණස්ස අත්ථඞ්ගමොති

## 5. 1. 5.

### වෙදනා සුත්තං

**316. සාවත්ථියං :**

යො භික්ඛවෙ, චක්ඛුසම්ඵස්සජාය වෙදනාය උප්පාදො ඨිති -පෙ- යො මනොසම්ඵස්සජාය වෙදනාය උප්පාදො ඨිති -පෙ- ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ, චක්ඛුසම්ඵස්සජාය වෙදනාය නිරොධො වූපසමො -පෙ- යො මනොසම්ඵස්සජාය වෙදනාය නිරොධො වූපසමො -පෙ- ජරාමරණස්ස අත්ථඞ්ගමොති.

## 5. 1. 6.

### සඤ්ඤා සුත්තං

**317. සාවත්ථියං :**

යො භික්ඛවෙ, රූපසඤ්ඤාය උප්පාදො ඨිති -පෙ- යො ධම්මසඤ්ඤාය උප්පාදො ඨිති -පෙ- ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ, රූපසඤ්ඤාය නිරොධො වූපසමො -පෙ- යො ධම්මසඤ්ඤාය නිරොධො වූපසමො -පෙ- ජරාමරණස්ස අත්ථඞ්ගමොති.

## 5. 1. 3.

## විඤ්ඤාණ සූත්‍රය

314. සැවැත්නුවර :

මහණෙනි, චක්ඛුවිඤ්ඤාණයෙහි යම් ඉපැද්මෙක් පැවැත්මෙක් . . . මනෝවිඤ්ඤාණයෙහි ඉපැද්මෙක් පැවැත්මෙක් . . . ජරාමරණයෙහි පහළවීම ය.

මහණෙනි, චක්ඛුවිඤ්ඤාණයෙහි යම් නිරෝධයෙක් . . . මනෝවිඤ්ඤාණයෙහි යම් නිරෝධයෙක් . . . ජරාමරණයෙහි අස්තඞ්ගම යි.

## 5. 1. 4.

## ඵස්ස සූත්‍රය

315. සැවැත්නුවර :

මහණෙනි, චක්ඛුසම්ඵස්සයෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් . . . මනෝසම්ඵස්සයෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් . . . ජරාමරණයෙහි පහළවීම යි.

මහණෙනි, චක්ඛුසම්ඵස්සයෙහි යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් . . . මනෝසම්ඵස්සයෙහි නිරෝධයෙක් ව්‍යුපශමයෙක් . . . ජරාමරණයෙහි අස්තඞ්ගම යි.

## 5. 1. 5.

## වේදනා සූත්‍රය

316. සැවැත්නුවර :

මහණෙනි, චක්ඛුසම්ඵස්සයෙන් හටගත් වේදනායෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් . . . මනොසම්ඵස්සයෙන් හටගත් වේදනායෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් . . . ජරාමරණයෙහි පහළවීම යි.

මහණෙනි, චක්ඛුසම්ඵස්සයෙන් හටගත් වේදනායෙහි යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් . . . මනෝසම්ඵස්සයෙන් හටගත් වේදනායෙහි යම් නිරෝධයෙක්ව්‍යුපශමයෙක් වෙතාම් . . . ජරාමරණයෙහි අස්තඞ්ගම යි.

## 5. 1. 6.

## සඤ්ඤා සූත්‍රය

317. සැවැත්නුවර :

මහණෙනි, රූපසංඥායෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් . . . ධර්මසංඥායෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් . . . ජරාමරණයෙහි පහළවීම ය.

මහණෙනි, රූපසංඥායෙහි යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් . . . ධර්මසංඥායෙහි යම් නිරෝදයක් ව්‍යුපශමයෙක් . . . ජරාමරණයෙහි අස්තඞ්ගම යි.

## 5. 1. 7.

### චෙතනා සුත්තං

318. සාවත්ථියං :

යො භික්ඛවෙ, රූපසඤ්චෙතනාය උප්පාදො ඨිති -පෙ- යො ධම්මසඤ්චෙතනාය උප්පාදො ඨිති -පෙ- ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ, රූපසඤ්චෙතනාය නිරොධො වූපසමො -පෙ- යො ධම්මසඤ්චෙතනාය නිරොධො වූපසමො -පෙ- ජරාමරණස්ස අත්ථංගමොති.

## 5. 1. 8.

### තණ්හා සුත්තං

319. සාවත්ථියං :

යො භික්ඛවෙ, රූපතණ්හාය උප්පාදො ඨිති -පෙ- යො ධම්මතණ්හාය උප්පාදො ඨිති -පෙ- ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ, රූපතණ්හාය නිරොධො වූපසමො -පෙ- යො ධම්මතණ්හාය නිරොධො වූපසමො -පෙ- ජරාමරණස්ස අත්ථංගමොති.

## 5. 1. 9.

### ධාතු සුත්තං

320. සාවත්ථියං :

යො භික්ඛවෙ, පඨවිධාතුයා උප්පාදො ඨිති -පෙ- යො විඤ්ඤාණධාතුයා උප්පාදො ඨිති -පෙ- ජරාමරණස්ස පාතුභාවො.

යො ච ඛො භික්ඛවෙ, පඨවිධාතුයා නිරොධො වූපසමො -පෙ- යො විඤ්ඤාණධාතුයා නිරොධො වූපසමො -පෙ- ජරාමරණස්ස අත්ථංගමොති.

## 5. 1. 10.

### ඛන්ධසුත්තං

321. සාවත්ථියං :

යො භික්ඛවෙ, රූපස්ස උප්පාදො ඨිති අභිනිබ්බත්ති පාතුභාවො, දුක්ඛස්සෙසො උප්පාදො, රොගානං ඨිති, ජරාමරණස්ස පාතුභාවො. යො වෙදනාය -පෙ- යො සඤ්ඤාය -පෙ- යො සංඛාරානං -පෙ- යො විඤ්ඤාණස්ස උප්පාදො ඨිති -පෙ- ජරාමරණස්ස පාතුභාවො.

## 5. 1. 7.

## චේතනා සූත්‍රය

**318.** සැවැත්නුවර :

මහණෙනි, රූපසඤ්චේතනායෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් . . . ධර්ම සඤ්චේතනායෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් . . . ජරාමරණයෙහි පහළවීම යි.

මහණෙනි, රූප සඤ්චෙතනායෙහි යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් . . . ධර්ම සඤ්චෙතනායෙහි යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් . . . ජරාමරණයෙහි අස්තඞ්ගම යි.

## 5. 1. 8.

## තණ්හා සූත්‍රය

**319.** සැවැත්නුවර :

මහණෙනි, රූපතණ්හායෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් . . . ධම්මතණ්හායෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් . . . ජරාමරණයෙහි පහළවීම යි.

මහණෙනි, රූපතණ්හායෙහි යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් . . . ධම්මතණ්හායෙහි යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් . . . ජරාමරණයෙහි අස්තඞ්ගම යි. ....

## 5. 1. 9.

## ධාතු සූත්‍රය

**320.** සැවැත්නුවර :

මහණෙනි, පඨවිධාතුයෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් . . . විඤ්ඤාණධාතුයෙහි යම් ඉපැත්මෙක්, පැවැත්මෙක් . . . ජරාමරණයෙහි පහළවීම යි.

මහණෙනි, පඨවිධාතුයෙහි යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් . . . විඤ්ඤාණධාතුයෙහි යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් . . . ජරාමරණයෙහි අස්තඞ්ගම යි.

## 5. 1. 10.

## ඛන්ධ සූත්‍රය

**321.** සැවැත්නුවර :

මහණෙනි, රූපයෙහි යම් ඉපැත්මෙක්, පැවැත්මෙක්, බිහිවීමෙක්, පහළවීමෙක් වේ නම් මේ දුකෙහි ඉපැත්ම ය, රෝගයන්ගේ පැවැත්ම ය, ජරාමරණයෙහි පහළවීම ය. වේදනායෙහි යම් . . . සංඥායෙහි යම් . . . සංස්කාරයන්ගේ යම් . . . විඥානයෙහි යම් ඉපැත්මෙක් පැවැත්මෙක් වේ නම් . . . ජරාමරණයෙහි පහළවීම යි.

යො ච ඛො භික්ඛවෙ, රූපස්ස නිරොධො වූපසමො අත්ථඞ්ගමො, දුක්ඛස්සෙසො නිරොධො, රොගානං වූපසමො, ජරාමරණස්ස අත්ථඞ්ගමො. යො වෙදනාය -පෙ- යො සඤ්ඤාය -පෙ- යො සඞ්ඛාරානං -පෙ- යො විඤ්ඤාණස්ස නිරොධො වූපසමො අත්ථඞ්ගමො, දුක්ඛස්සෙසො නිරොධො, රොගානං වූපසමො, ජරාමරණස්ස අත්ථඞ්ගමොති.

උප්පාදවග්ගො පඨමො.

තස්සුද්දානං :

චක්ඛු රූපඤ්ච විඤ්ඤාණං ඵස්සො ච වෙදනාය ච,
සඤ්ඤා ච චෙතනා තණ්හා ධාතුක්ඛන්ධෙන තෙ දසාති

උප්පාදසංයුත්තං සමත්තං.

Free Distribution www.aathaapi.org

මහණෙනි, රූපයෙහි යම් නිරෝධයෙක් ව්‍යුපශමයෙක් අස්තඞ්ගමයෙක් වේ නම් මේ දුකෙහි නිරෝධ ය, රෝගයන්ගේ ව්‍යුපශම ය, ජරාමරණයෙහි අස්තඞ්ගම යි වේදනායෙහි යම් . . . සංඥායෙහි යම් . . . සංස්කාරයන්ගේ යම් . . . විඥානයෙහි යම් . . . නිරෝධයෙක් ව්‍යුපශමයෙක් අස්තඞ්ගමයෙක් වේ නම් මේ දුකෙහි නිරෝධ ය, රෝගයන්ගේ ව්‍යුපශම ය, ජරාමරණයෙහි අස්තඞ්ගම යි.

**පළමුවැනි උත්පාද වර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය :**

චක්ඛු, රූප, විඤ්ඤාණ, ඵස්ස, වෙදනා, සඤ්ඤා, චෙතනා, තණ්හා යන ඒ සූත්‍රයෝ ධාතු ඛන්ධ සූත්‍ර දෙකින් දශයෙක් වෙති.

**උත්පාද සංයුක්තය නිමියේ යි.**

# 6. කිලෙසසංයුත්තං

## 1. කිලෙසවග්ගො

### 6. 1. 1.

### චක්ඛු සුත්තං

**322. සාවත්ථියං :**

යො භික්ඛවෙ, චක්ඛුස්මිං ඡන්දරාගො, චිත්තස්සෙ'සො උපක්කිලෙසො. යො සොතස්මිං ඡන්දරාගො -පෙ- යො ඝාණස්මිං ඡන්දරාගො -පෙ- යො ජිව්හාය ඡන්දරාගො -පෙ- යො කායස්මිං ඡන්දරාගො -පෙ- යො මනස්මිං ඡන්දරාගො, චිත්තස්සෙ'සො උපක්කිලෙසො.

යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො ඉමෙසු ඡසු ඨානෙසු චෙතසො උපක්කිලෙසො පහීනො හොති, නෙක්ඛම්මනින්නං චස්ස චිත්තං හොති. නෙක්ඛම්මපරිභාවිතං චිත්තං කම්මනියං ඛායති අභිඤ්ඤා සච්ඡිකරණීයෙසු ධම්මෙසූති.

### 6. 1. 2.

### රූප සුත්තං

**323. සාවත්ථියං :**

යො භික්ඛවෙ, රූපෙසු ඡන්දරාගො, චිත්තස්සෙ'සො උපක්කිලෙසො. යො සද්දෙසු ඡන්දරාගො -පෙ- යො ගන්ධෙසු ඡන්දරාගො -පෙ- යො රසෙසු ඡන්දරාගො -පෙ- යො ඵොට්ඨබ්බෙසු ඡන්දරාගො -පෙ- යො ධම්මෙසු ඡන්දරාගො, චිත්තස්සෙ'සො උපක්කිලෙසො.

යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො ඉමෙසු ඡසු ඨානෙසු චෙතසො උපක්කිලෙසො පහීනො හොති. නෙක්ඛම්මනින්නං චස්ස චිත්තං හොති. නෙක්ඛම්මපරිභාවිතං චිත්තං කම්මනියං ඛායති අභිඤ්ඤා සච්ඡිකරණීයෙසු ධම්මෙසූති.

### 6. 1. 3.

### විඤ්ඤාණ සුත්තං

**324. සාවත්ථියං :**

යො භික්ඛවෙ, චක්ඛුවිඤ්ඤාණස්මිං ඡන්දරාගො, චිත්තස්සෙ'සො උපක්කිලෙසො, යො සොතවිඤ්ඤාණස්මිං ඡන්දරාගො -පෙ- යො ඝාණවිඤ්ඤාණස්මිං ඡන්දරාගො -පෙ- යො ජිව්හාවිඤ්ඤාණස්මිං ඡන්දරාගො -පෙ- යො කායවිඤ්ඤාණස්මිං ඡන්දරාගො -පෙ- යො මනොවිඤ්ඤාණස්මිං ඡන්දරාගො, චිත්තස්සෙ'සො උපක්කිලෙසො.



Free Distribution www.aathaapi.org

# 6. කිලෙස සංයුත්තය

## 1. කිලෙස වර්ගය

### 6. 1. 1.

### චක්ඛු සූත්‍රය

**322. සැවැත්නුවර :**

මහණෙනි, ඇසෙහි යම් ඡන්දරාගයෙක් (දුර්වල රාගය හා බලවත් රාගයෙක්) වේ නම් මෙය සිතෙහි කෙලෙසීමෙකි. කනෙහි යම් ඡන්ද රාගයෙක් වේ නම් . . . නැහැයෙහි යම් ඡන්ද රාගයෙක් වේ නම . . . දිවෙහි යම් ඡන්ද රාගයෙක් වේ නම් . . . කයෙහි යම් ඡන්ද රාගයෙක් වෙ නම් . . . සිතෙහි යම් ඡන්ද රාගයෙක් වේ නම් මේ සිතෙහි කෙලෙසීමෙකි.

මහණෙනි, යම් කලෙක මේ සතැන්හි මහණහුගේ සිතෙහි කෙලෙසීම ප්‍රහීණ වේ නම් ඔහුගේ සිත නවලොවුතුරු දහමට නැමුණේ ද වේ. නව ලොවුතුරු දහමින් වඩනා ලද ශමථවිදර්ශනා සිත පස්විකුම් නුවණින් දූන පසක් කළ යුතු දහමුන් විෂයෙහි ක්‍රියාවට සුදුසු ය යි වැටහේ .

### 6. 1. 2.

### රූප සූත්‍රය

**323. සැවැත්නුවර :**

මහණෙනි, රූපයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිත්හි කෙලෙසීමෙකි. ශබ්දයෙහි යම් ඡන්ද රාගයෙක් වේ නම් . . . ගන්ධයෙහි යම් ඡන්ද රාගයෙක් වේ නම් . . . රසයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ස්ප්‍රෂ්ටව්‍යයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ධර්මයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි.

මහණෙනි, යම් කලෙක මේ සතැන්හි මහණහුගේ සිතෙහි කෙලෙසීම ප්‍රහීණ වේ නම් ඔහුගේ සිත නව ලොවුතුරු දහමට නැමුණේ ද වේ. නවලොවුතුරු දහමින් වඩනා ලද සිත පස්විකුම් නුවණින් දූන පසක් කළයුතු දහමුන් විෂයෙහි ක්‍රියාවට සුදුසු ය යි හැගේ.

### 6. 1. 3.

### විඤ්ඤාණ සූත්‍රය

**324. සැවැත්නුවර :**

මහණෙනි, චක්ඛුවිඤ්ඤාණයෙහි යම් ඡන්ද රාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි. සෝතවිඤ්ඤාණයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ඝානවිඤ්ඤාණයෙහි යම් ඡන්ද රාගයෙක් වේ නම් . . . ජිව්හාවිඤ්ඤාණයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . කායවිඤ්ඤාණයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . මනොවිඤ්ඤාණයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි.

යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො ඉමෙසු ඡසු ඨානෙසු චෙතසො උපක්කිලෙසො පහීනො හොති, නෙක්ඛම්මනින්නං චස්ස චිත්තං හොති. නෙක්ඛම්මපරිභාවිතං චිත්තං කම්මනියං ඛායති අභිඤ්ඤා සච්ඡිකරණීයෙසු ධම්මෙසූති.

## 6. 1. 7.

## ඵස්ස සුත්තං

**325.** සාවත්ථියං :

යො භික්ඛවෙ, චක්ඛුසම්ඵස්සස්මිං ඡන්දරාගො, චිත්තස්සෙ'සො උපක්කිලෙසො, යො සොතසම්ඵස්සස්මිං ඡන්දරාගො -පෙ- යො ඝානසම්ඵස්සස්මිං ඡන්දරාගො -පෙ- යො ජිව්හාසම්ඵස්සස්මිං ඡන්දරාගො -පෙ- යො කායසම්ඵස්සස්මිං ඡන්දරාගො -පෙ- යො මනොසම්ඵස්සස්මිං ඡන්දරාගො චිත්තස්සෙ'සො උපක්කිලෙසො. යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො -පෙ- කම්මනියං ඛායති අභිඤ්ඤා සච්ඡිකරණීයෙසු ධම්මෙසූති.

## 6. 1. 5.

## වෙදනා සුත්තං

**326.** සාවත්ථියං :

යො භික්ඛවෙ චක්ඛුසම්ඵස්සජාය වෙදනාය ඡන්දරාගො, චිත්තස්සෙ'සො උපක්කිලෙසො. යො සොතසම්ඵස්සජාය වෙදනාය ඡන්දරාගො -පෙ- යො ඝානසම්ඵස්සජාය වෙදනාය ඡන්දරාගො -පෙ- යො ජිව්හාසම්ඵස්සජාය වෙදනාය ඡන්දරාගො -පෙ- යො කායසම්ඵස්සජාය වෙදනාය ඡන්දරාගො -පෙ- යො මනොසම්ඵස්සජාය වෙදනාය ඡන්දරාගො, චිත්තස්සෙ'සො උපක්කිලෙසො.

යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො -පෙ- කම්මනියං ඛායති අභිඤ්ඤා සච්ඡිකරණීයෙසු ධම්මෙසූති

## 6. 1. 6.

## සඤ්ඤා සුත්තං

**327.** සාවත්ථියං :

යො භික්ඛවෙ, රූපසඤ්ඤාය ඡන්දරාගො, චිත්තස්සෙ'සො උපක්කිලෙසො. යො සද්දසඤ්ඤාය ඡන්දරාගො -පෙ- යො ගන්ධසඤ්ඤාය ඡන්දරාගො -පෙ-. යො රසසඤ්ඤාය ඡන්දරාගො -පෙ- යො ඵොට්ඨබ්බසඤ්ඤාය ඡන්දරාගො -පෙ- යො ධම්මසඤ්ඤාය ඡන්දරාගො චිත්තස්සෙ'සො උපක්කිලෙසො.

යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො -පෙ- කම්මනියං ඛායති අභිඤ්ඤා සච්ඡිකරණීයෙසු ධම්මෙසූති.

මහණෙනි, යම් කලෙක මෙ සතැන්හි මහණහුගේ සිතෙහි කෙලෙසීම ප්‍රහීණ වේ නම් ඔහුගේ සිත නවලොවුතුරු දහමට නැමුණේ ද වේ. නවලොවුතුරු දහමින් වඩනා ලද සිත පස්විකුම් නුවණින් දැන පසක් කළයුතු දහම්හි කරණීය යයි වැටහේ.

## 6. 1. 4.

## ඵස්ස සූත්‍රය

**325. සැවැත්නුවර :**

මහණෙනි, චක්ඛුසම්ඵස්සයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි. සෝතසම්ඵස්සයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ඝානසම්ඵස්සයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ජිව්හාසම්ඵස්සයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . කායසම්ඵස්සයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . මනෝසම්ඵස්සයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි.

මහණෙනි, යම් කලෙක මහණහුගේ . . . පස්විකුම් නුවණින් දැන පසක් කළයුතු දහම්හි කර්මාර්හයයි හැඟේ.

## 6. 1. 5.

## වෙදනා සූත්‍රය

**326. සැවැත්නුවර :**

මහණෙනි, චක්ඛුසම්ඵස්සජවේදනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි. සෝතසම්ඵස්සජවේදනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ඝානසම්ඵස්සජවේදනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ජිව්හාසම්ඵස්සජවේදනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . කායසම්ඵස්සජ වේදනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . මනෝසම්ඵස්සජවෙදනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි.

මහණෙනි, යම් කලෙක මහණහුගේ . . . පස්විකුම් නුවණින් දැන පසක් කළයුතු දහම්හි කර්මණ්‍යය යි හැඟේ.

## 6. 1. 6.

## සඤ්ඤා සූත්‍රය

**327. සැවැත්නුවර :**

මහණෙනි, රූපසඤ්ඤායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි. සද්දසඤ්ඤායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ගන්ධසඤ්ඤායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . රසසඤ්ඤායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ඵොට්ඨබ්බ සඤ්ඤායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ධම්මසඤ්ඤායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි.

මහණෙනි, යම් කලෙක මහණහුගේ . . . පස්විකුම් නුවණින් දැන පසක් කළයුතු දහම්හි ක්‍රියාවට සුදුසු ය යි හැඟේ.

## 6. 1. 7.

### චෙතනා සුත්තං

328. සාවත්ථියං :

යො භික්ඛවෙ, රූපසඤ්චෙතනාය ඡන්දරාගො, චිත්තස්සෙ’සො උපක්කිලෙසො. යො සද්දසඤ්චෙතනාය ඡන්දරාගො -පෙ- යො ගන්ධසඤ්චෙතනාය ඡන්දරාගො -පෙ- යො රසසඤ්චෙතනාය ඡන්දරාගො -පෙ- යො ඵොට්ඨබ්බසඤ්චෙතනාය ඡන්දරාගො -පෙ- යො ධම්මසඤ්චෙතනාය ඡන්දරාගො, චිත්තස්සෙ’සො උපක්කිලෙසො.

යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො -පෙ- කම්මනියං ඛායති අභිඤ්ඤා සච්ඡිකරණීයෙසු ධම්මෙසූති.

## 6. 1. 8.

### තණ්හා සුත්තං

329. සාවත්ථියං :

යො භික්ඛවෙ, රූපතණ්හාය ඡන්දරාගො, චිත්තස්සෙ’සො උපක්කිලෙසො. යො සද්දතණ්හාය ඡන්දරාගො -පෙ- යො ගන්ධතණ්හාය ඡන්දරාගො -පෙ- යො රසතණ්හාය ඡන්දරාගො -පෙ- යො ඵොට්ඨබ්බතණ්හාය ඡන්දරාගො -පෙ- යො ධම්මතණ්හාය ඡන්දරාගො, චිත්තස්සෙ’සො උපක්කිලෙසො.

යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො -පෙ- අභිඤ්ඤා සච්ඡිකරණීයෙසු ධම්මෙසූති.

## 6. 1. 9.

### ධාතු සුත්තං

330. සාවත්ථියං :

යො භික්ඛවෙ, පථවිධාතුයා ඡන්දරාගො, චිත්තස්සෙ’සො උපක්කිලෙසො. යො ආපොධාතුයා ඡන්දරාගො -පෙ- යො තෙජොධාතුයා ඡන්දරාගො -පෙ- යො වායොධාතුයා ඡන්දරාගො -පෙ- යො ආකාසධාතුයා ඡන්දරාගො -පෙ- යො විඤ්ඤාණධාතුයා ඡන්දරාගො, චිත්තස්සෙ’සො උපක්කිලෙසො.

යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො ඉමේසු ඡසු ඨානෙසු චෙතසො උපක්කිලෙසො පහීනො හොති, නෙක්ඛම්මනින්නං චස්ස චිත්තං හොති නෙක්ඛම්මපරිභාවිතං චිත්තං කම්මනියං ඛායති අභිඤ්ඤා සච්ඡිකරණීයෙසු ධම්මෙසූති.

## 6. 1. 7.

## චෙතනා සූත්‍රය

328. සැවැත්නුවර :

මහණෙනි, රූපසඤ්චෙතනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි. සද්දසඤ්චෙතනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ගන්ධසඤ්චෙතනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . රසසඤ්චෙතනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ඵොට්ඨබ්බසඤ්චෙතනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම . . . ධම්මසඤ්චෙතනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි.

මහණෙනි, යම් කලෙක මහණහුගේ . . . පස්විකුම් නුවණින් දත පසක් කළයුතු දහම්හි ක්‍රියාවට සුදුසු ය යි හැගේ යි.

## 6. 1. 8.

## තණ්හා සූත්‍රය

329. සැවැත්නුවර :

මහණෙනි, රූපතණ්හායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් සිතෙහි කෙලෙසීමෙකි. සද්දතණ්හායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ගන්ධතණ්හායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . රසතණ්හායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ඵොට්ඨබ්බතණ්හායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් , . . ධම්මතණ්හායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි.

මහණෙනි, යම් කලෙක මහණහුගේ . . . පස්විකුම් නුවණින් දත පසක් කළයුතු දහම්හි ක්‍රියාවට සුදුසු ය යි හැගේ.

## 6. 1. 9.

## ධාතු සූත්‍රය

330. සැවැත්නුවර :

මහණෙනි පඨවිධාතුයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි. ආපෝධාතුයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . තේජෝධාතුයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . වායෝධාතුයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . ආකාශධාතුයෙහි යම් ඡන්ද රාගයෙක් වේ නම් . . . විඤ්ඤාණධාතුයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි.

මහණෙනි, යම් කලෙක මේ සතැන්හි මහණහුගේ සිතෙහි කෙලෙසීම ප්‍රහීණ වේ නම් ඔහුගේ සිත ද නවලොවුතුරු දහමට නැමුණේ වේ. නවලොවුතුරුදහමින් වඩනා ලද සිත පස්විකුම් නුවණින් දත පසක් කළයුතු දහම්හි කර්මක්ෂම යයි වැටහේ.

## 6. 1. 10.

## ඛන්ධ සුත්තං

**331. සාවත්ථියං :**

යො භික්ඛවෙ, රූපස්මිං ඡන්දරාගො, චිත්තස්සෙ’සො උපක්කිලෙසො. යො වෙදනාය ඡන්දරාගො -පෙ- යො සඤ්ඤාය ඡන්දරාගො -පෙ- යො සඞ්ඛාරෙසු ඡන්දරාගො -පෙ- යො විඤ්ඤාණස්මිං ඡන්දරාගො, චිත්තස්සෙ’සො උපක්කිලෙසො.

යතො ඛො භික්ඛවෙ, භික්ඛුනො ඉමෙසු පඤ්චසු ඨානෙසු චෙතසො උපක්කිලෙසො පහීනො හොති, නෙක්ඛම්මනින්නං චස්ස චිත්තං හොති නෙක්ඛම්මපරිභාවිතං චිත්තං කම්මනියං ඛායති අභිඤ්ඤා සච්ඡිකරණීයෙසු ධම්මෙසූති.

කිලෙසවග්ගො පඨමො.

**තස්සුද්දානං :**

චක්ඛු රූපඤ්ච විඤ්ඤාණං සම්ඵස්සො වෙදනාය ච,
සඤ්ඤා සඤ්චෙතනා තණ්හා ධාතුක්ඛන්ධෙන තෙ දසාති.

කිලෙස සංයුත්තං නිට්ඨිතං.

## 6. 1. 10.

## ඛන්ධ සූත්‍රය

**331. සැවැත්නුවර :**

මහණෙනි රූපයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි. වේදනායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . සංඥායෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . සංස්කාරයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් . . . විඥානයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම් තෙල සිතෙහි කෙලෙසීමෙකි.

මහණෙනි, යම් කලෙක මේ පස්තන්හි මහණහුගේ සිතෙහි කෙලෙසීම ප්‍රහීණ වේ නම් ඕහුගේ සිත ද නවලොවුතුරුදහමට නැමුණේ වේ. නවලොවුතුරු දහමින් වඩනා ලද සිත පස්විකුම් නුවණින් දත පයක් කළයුතු දහම්හි කර්මක්ෂම ය යි වැටහේ.

**පළමුවැනි කිලෙස වර්ග යි.**

**එහි සූත්‍ර නාම වලිය :**

චක්ඛු, රූප, විඤ්ඤාණ, වෙදනා, සඤ්ඤා, සඤ්චෙතනා, තණ්හා යන ඒ සූත්‍ර ධාතු ඛන්ධ සූත්‍ර දෙකින් දශයෙක් වේ.

**කිලෙස සංයුත්තය නිමියේ යි.**



Free Distribution www.aathaapi.org

# 7. සාරිපුත්ත සංයුත්තං

## 1. සාරිපුත්තවග්ගො

### 7. 1. 1.

### විවෙකජ සුත්තං

332. සාවත්ථියං :

එකං සමයං ආයස්මා සාරිපුත්තො සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං[1] පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන අන්ධවනං තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන ජෙතවනං අනාථපිණ්ඩිකස්ස ආරාමො තෙනුපසඞ්කමි.

අද්දසා ඛො ආයස්මා ආනන්දො, ආයස්මන්තං සාරිපුත්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන ආයස්මන්තං සාරිපුත්තං එතදවොච : විප්පසන්නානි ඛො තෙ ආවුසො සාරිපුත්ත, ඉන්ද්‍රියානි පරිසුද්ධො මුඛවණ්ණො පරියොදාතො, කතමෙනායස්මා සාරිපුත්තො අජ්ජ විහාරෙන විහාසීති.

ඉධා'හං ආවුසො, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[2] උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආවුසො න එවං හොති : "අහං පඨමං ඣානං සමාපජ්ජාමීති වා අහං පඨමං ඣානං සමාපන්නොති වා අහං පඨමා ඣානා වුට්ඨිතොති වා"ති.

තථා හි පනායස්මතො සාරිපුත්තස්ස දීඝරත්තං අහිඞ්කාරමමිඞ්කාර-මානානුසයා සුසමූහතා. තස්මා ආයස්මතො සාරිපුත්තස්ස න එවං හොති : "අහං පඨමං ඣානං සමාපජ්ජාමීති වා අහං පඨමං ඣානං සමාපන්නොති වා අහං පඨමජ්ඣානා වුට්ඨිතොති වා"ති.

---

1. සාවත්ථියං - සී. 2.
2. පඨමජ්ඣානං - සීමු.



Free Distribution www.aathaapi.org

# 7. සාරිපුත්තසංයුත්තය

## 1. සාරිපුත්ත වර්ගය

### 7. 1. 1.

### විවේකජ සූත්‍රය

**332. සැවැත්නුවර :**

එක් කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සැවැත් නුවර සමීපයෙහි වූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ පෙරවරු හැඳපෙරව පාසිවුරු ගෙන සැවතට පිඬු පිණිස පිවිසියහ. සැවතෙහි පිඬු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණාහු දිවාවිහරණය පිණිස අන්ධවනය වෙත එළඹියහ. අන්ධවනයට වැදගෙන එක්තරා රුක්මුලෙක දිවාවිහරණය පිණිස වැඩහුන්හ. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස් කල විවේකයෙන් නැගී සිටියාහු ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම වෙත එළඹියහ.

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ එන ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් දුර දී ම දුටහ. දැක ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මෙය කීහ : ''ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, මුඹ වහන්සේගේ ඉඳුරෝ වෙසෙසින් පහන්හ. මුඛවර්ණය පිරිසිදු යැ, පැහැපත් යැ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අද කිනම් විහරණයෙකින් යුතු වැ වුසූහු දැ''යි.

ඇවැත්නි, මෙහි මම කාමයන්ගෙන් වෙන් වැ අකුශලධර්මයන්ගෙන් වෙන් වැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථම ධ්‍යානයට එළැඹ වෙසෙමි. ඇවැත්නි, ඒ මට ''මම ප්‍රථමධ්‍යානයට සමවදිමි යි හෝ මම ප්‍රථම ධ්‍යානයට සමවන්මි යි හෝ මම ප්‍රථමධ්‍යානයෙන් නැගී සිටියෙමි''යි හෝ මෙබඳු සිතෙක් නො වේ'.

එ එසේ මැ යි. ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් විසින් දීර්ඝ රාත්‍රියෙහි අහිඞ්කාර මමිඞ්කාර මානානුසයයෝ මොනොවට නසන ලදහ. එහෙයින් ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට ''මම ප්‍රථම ධ්‍යානයට සමවදිමි යි හෝ මම ප්‍රථමධ්‍යානයට සමවන්මි යි හෝ මම ප්‍රථමධ්‍යානයෙන් නැගී සිටියෙමි'' යි හෝ මෙ බඳු සිතෙක් නො වේ.



Free Distribution www.aathaapi.org

## 7. 1. 2.

### අවිතක්ක සුත්තං

**333. සාවත්ථියං :**

අද්දසා ඛො ආයස්මා ආනන්දො, ආයස්මන්තං සාරිපුත්තං දූරතොව ආගච්ඡන්තං දිස්වාන ආයස්මන්තං සාරිපුත්තං එතදවොච : විප්පසන්නානි ඛො තෙ ආවුසො සාරිපුත්ත, ඉන්ද්‍රියානි, පරිසුද්ධො මුඛවණ්ණො පරියොදාතො, කතමෙනායස්මා සාරිපුත්තො අජ්ජ විහාරෙන විහාසීති.

ඉධා'හං ආවුසො, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං[1] උපසම්පජ්ජ විහරාමි.

තස්ස මය්හං ආවුසො, න එවං හොති, "අහං දුතියං ඣානං සමාපජ්ජාමීති වා අහං දුතියං ඣානං සමාපන්නොති වා අහං දුතියජ්ඣානා වුට්ඨිතොති වා"ති.

තථා හි පනායස්මතො සාරිපුත්තස්ස දීඝරත්තං අහිඞ්කාරමමිඞ්කාර-මානානුසයා සුසමූහතා, තස්මා ආයස්මතො සාරිපුත්තස්ස න එවං හොති ; "අහං දුතියං ඣානං සමාපජ්ජාමීති වා, අහං දුතියං ඣානං සමාපන්නොති වා අහං දුතියජ්ඣානා වුට්ඨිතොති වා"ති.

## 7. 1. 3.

### පීති සුත්තං

**334. සාවත්ථියං :**

අද්දසා ඛො ආයස්මා ආනන්දො, -පෙ- විප්පසන්නානි ඛො තෙ ආවුසො සාරිපුත්ත, ඉන්ද්‍රියානි, පරිසුද්ධො මුඛවණ්ණො, පරියොදාතො, කතමේනායස්මා[2] සාරිපුත්තො අජ්ජ විහාරෙන විහාසීති.

ඉධාහං ආවුසො, පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරාමි,[3] සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙමි, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරාමි -පෙ- වුට්ඨිතොති වා"ති.

## 7. 1. 4.

### උපෙක්ඛා සුත්තං

**335. සාවත්ථියං :**

අද්දසා ඛො ආයස්මා ආනන්දො, -පෙ- විප්පසන්නානි ඛො තෙ ආවුසො සාරිපුත්ත, ඉන්ද්‍රියානි, පරිසුද්ධො මුඛවණ්ණො, පරියොදාතො, කතමෙනායස්මා සාරිපුත්තො අජ්ජ විහාරෙන විහාසීති.

---

1. දුතියජ්ඣානං - සීමු
2. කතමෙනපනායස්මා - සී. 2.
3. විහාසිං – මජ්ඣං.

## 7. 1. 2.

## අවිතක්ක සූත්‍රය

**333. සැවැත්නුවර :**

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ එන ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් දුර දී දුටහ. දුක ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීහ : ''ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, ඹබවහන්සේගේ ඉඳුරෝ වෙසෙයින් පහන්හ. මුඛවර්ණය පිරිසිදු යැ, පැහැපත් යැ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අද කිනම් විහරණයෙකින් යුතු වැ වුසූහු දැ''යි.

ඇවැත්නි, මෙහි මම විතර්කවිචාරයන්ගේ ව්‍යුපශමයෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකඟබැව් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීය ධ්‍යානයට එළැඹ වෙසෙමි.

ඇවැත්නි. ඒ මට ''මම ද්විතීයධ්‍යානයට සමවදිමි''යි හෝ ''මම ද්විතීයධ්‍යානයට සමවන්මි''යි හෝ ''මම ද්විතීයධ්‍යානයෙන් නැඟී සිටියෙමි වෙමි''යි හෝ මෙබඳු සිතෙක් නො වෙයි.

එ එසේ මැ යි, ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙරණුවන් විසින් දීර්ඝ රාත්‍රියෙහි අහිඞ්කාර මමිඞ්කාරමානානුසයයෝ මැනැවින් නසන ලදහ. එහෙයින් ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට : ''මම ද්විතීයධ්‍යානයට සමවදිමි''යි හෝ ''මම ද්විතීයධ්‍යානයට සමවන්මි''යි හෝ ''මම ද්විතීයධ්‍යානයෙන් නැඟී සිටියෙමි වෙමි''යි හෝ මෙබඳු සිතෙක් නො වේ.

## 7. 1. 3.

## පීති සූත්‍රය

**334. සැවැත්නුවර :**

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ දුටහ. . . ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, ඹබවහන්සේගේ ඉඳුරෝ වෙසෙයින් පහන්හ. මුඛවර්ණය පිරිසිදු යැ, පැහැපත් යැ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අද කිනම් විහරණයෙකින් යුතු වැ වුසූහු ද යි.

ඇවැත්නි, මෙහි මම ප්‍රීතියෙහි ද නො ඇල්මෙන් උපේක්ෂා ඇත්තෙම් ද වෙසෙමි. සිහි ඇත්තෙම් ද මනා නුවණ ඇත්තෙම් ද කයින් සුවත් විඳිමි. ආර්‍ය්‍යයෝ ''උපේක්ෂා ඇත්තේ යැ, සිහි ඇත්තේ යැ, සුවවිහරණ ඇත්තේ''යයි ඒ යමකට කියත් නම් ඒ තෘතීය ධ්‍යානයට එළැඹ වෙසෙමි . . . නැඟී සිටියෙම වෙමි''යි හෝ යි.

## 7. 1. 4.

## උපෙක්ඛා සූත්‍රය

**335. සැවැත්නුවර :**

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ දුටහ . . . ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, ඹබවහන්සේගේ ඉඳුරෝ වෙසෙයින් පහන්හ. මුඛවර්ණය පිරිසිදු ය, පැහැපත් ය. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අද කිනම් විහරණයෙකින් යුතු වැ වුසූහු දැ''යි.

Free Distribution www.aathaapi.org

ඉධාහං ආවුසො සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරාමි -පෙ- වුට්ඨිතොති වාති.

## 7. 1. 5.

### ආකාසානඤ්චායතන සුත්තං

**336. සාවත්ථියං :**

අද්දසා ඛො ආයස්මා ආනන්දො -පෙ- ආයස්මන්තං සාරිපුත්තං එතදවොච : විප්පසන්නානි -පෙ- ඉධාහං ආවුසො සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්ත-සඤ්ඤානං අමනසිකාරා "අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරාමි -පෙ- වුට්ඨිතොති වා"ති.

## 7. 1. 6.

### විඤ්ඤාණඤ්චායතන සුත්තං

**337. සාවත්ථියං :**

අද්දසා ඛො ආයස්මා ආනන්දො -පෙ- ආයස්මන්තං සාරිපුත්තං එතදවොච : විප්පසන්නානි -පෙ- ඉධාහං ආවුසො සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම "අනන්තං විඤ්ඤාණ"න්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරාමි -පෙ- වුට්ඨිතොති වා"ති.

## 7. 1. 7.

### ආකිඤ්චඤ්ඤායතන සුත්තං

**338. සාවත්ථියං :**

අථ ඛො ආයස්මා සාරිපුත්තො -පෙ- ඉධාහං ආවුසො සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම "නත්ථි කිඤ්චී"ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරාමි -පෙ- වුට්ඨිතොති වා"ති.

## 7. 1. 8.

### නෙවසඤ්ඤානාසඤ්ඤායතන සුත්තං

**339. සාවත්ථියං :**

අථ ඛො ආයස්මා සාරිපුත්තො -පෙ-.

ඉධාහං ආවුසො සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරාමි -පෙ- වුට්ඨිතොති වා"ති.

ඇවැත්නි, මෙහි මම සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුක්ඛයාගේ ද ප්‍රහාණයෙන් කැලු ම සොම්නස් දොම්නසුන්ගේ අස්තඞ්ගමයෙන් මැදහත් බැවින් හා සිහියෙන් හටගත් පිරිසිදු බැව් ඇති නො දුක් නොසුව වූ චතුර්ථධ්‍යානයට එළැඹ වෙසෙමි . . . නැඟී සිටියෙමි යි හෝ යි.

## 7. 1. 5.

## ආකාසානඤ්චායතන සූත්‍රය

**336.** සැවැත්නුවර :

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ දුටහ. . . . ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීහ : . . . "වෙසෙසින් පහන්හ . . . ඇවැත්නි, මෙහි මම රූපසංඥාවන් සර්වප්‍රකාරයෙන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්ම සංඥාවන්ගේ නො මෙනෙහි කිරීමෙන් ආකාශය අනන්ත ය"යි ආකාසානඤ්චායතනයට එළැඹැ වෙසෙමි . . . නැඟී සිටියෙමි යි හෝ යි.

## 7. 1. 6.

## විඤ්ඤාණඤ්චායතන සූත්‍රය

**337.** සැවැත්නුවර :

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ දුටහ. . . . ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීහ : . . . "වෙසෙසින් පහන්හ . . . ඇවැත්නි, මෙහි මම සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා "විඤ්ඤාණය අනන්ත ය"යි විඤ්ඤාණඤ්චායතනයට එළැඹ වෙසෙමි . . . නැඟී සිටියෙමි යි හෝ "යි.

## 7. 1. 7.

## ආකිඤ්චඤ්ඤායතන සූත්‍රය

**338.** සැවැත්නුවර :

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ . . . ඇවැත්නි, මෙහි මම සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා "කිසිවක් නැතැ"යි ආකිඤ්චඤ්ඤායතනයට එළැඹැ වෙසෙමි . . . නැඟී සිටියෙමි යි හෝ යි.

## 7. 1. 8.

## නේවසඤ්ඤා නාසඤ්ඤායතන සූත්‍රය

**339.** සැවැත්නුවර :

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ . . .

ඇවැත්නි, මෙහි මම සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤා නාසඤ්ඤායතනයට එළැඹ වෙසෙමි . . . නැඟී සිටියෙමි යි හෝ යි.

## 7. 1. 9.

## නිරොධ සමාපත්ති සුත්තං

340.

එකං සමයං ආයස්මා සාරිපුත්තො සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන අන්ධවනං තෙනුපසඞ්කමි දිවාවිහාරාය. අන්ධවනං අජ්ඣොගාහෙත්වා අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ දිවාවිහාරං නිසීදි. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන ජෙතවනං අනාථපිණ්ඩිකස්ස ආරාමො තෙනුපසඞ්කමි.

අද්දසා ඛො ආයස්මා ආනන්දො, ආයස්මන්තං සාරිපුත්තං දූරතොව ආගච්ඡන්තං දිස්වාන ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: “විප්පසන්නානි ඛො තෙ ආවුසො සාරිපුත්ත, ඉන්ද්‍රියානි පරිසුද්ධො මුඛවණ්ණො පරියොදාතො කතමෙනායස්මා සාරිපුත්තො අජ්ජ විහාරෙන විහාසීති.

ඉධා’හං ආවුසො සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරාමි. තස්ස මය්හං ආවුසො න එවං හොති: “අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජාමී”ති වා අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නො”ති වා “අහං සඤ්ඤාවෙදයිතනිරොධා වුට්ඨිතොති වා”ති.

තථා පනායස්මතො සාරිපුත්තස්ස දීඝරත්තං අහඞ්කාරමමඞ්කාරමානානුසයා සුසමූහතා. තස්මා ආයස්මතො සාරිපුත්තස්ස න එවං හොති: “අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජාමීති වා අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නොති වා අහං සඤ්ඤාවෙදයිතනිරොධා වුට්ඨිතොති වා”ති

## 7. 1. 10.

## සූචිමුඛී සුත්තං

341.

එකං සමයං ආයස්මා සාරිපුත්තො රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය රාජගහං පිණ්ඩාය පාවිසි. රාජගහෙ සපදානං පිණ්ඩාය චරිත්වා තං පිණ්ඩපාතං අඤ්ඤතරං කුඩ්ඩමූලං[1] නිස්සාය භුඤ්ජති. අථ ඛො සූචිමුඛී පරිබ්බාජිකා යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාරිපුත්තං එතදවොච: කිං නු ඛො සමණ, අධොමුඛො භුඤ්ජසීති.

1 කුඩ්ඩං, සී 1, 2 කුට්ටමූලං - මජසං.

## 7. 1. 9.

## නිරොධ සමාපත්ති සූත්‍රය

**340.**

එක්කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ පෙරවරු හැඳපෙරව පාසිවුරු ගෙන සැවතට පිඩු පිණිස පිවිසියහ. සැවතෙහි පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළැකුණාහු දිවාවිහරණය පිණිස අන්ධවනය වෙත එළඹියහ. අන්ධවනයට වැදගෙන එක්තරා රුක්මුලෙක දිවාවිහරණයට හුන්හ. ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස්කල විවෙකයෙන් නැඟී සිටියාහු ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම වෙත එළඹියහ.

ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ එන ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් දුර දීම දුටහ. දැක ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීහ : ඇවැත්නි, ශාරීපුත්‍රයෙනි, ඔබවහන්සේගේ ඉඳුරෝ වෙසෙසින් පහන්හ. මුඛවර්ණය පිරිසිදු ය, පැහැපත් ය. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අද කිනම් විහරණයෙකින් යුතු වැ වුසූහු දැ යි.

ඇවැත්නි, මෙහි මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය සර්වප්‍රකාරයෙන් ඉක්මවා සඤ්ඤාවේදයිතනිරෝධයට එළඹ වෙසෙමි. ඇවැත්නි, ඒ මට ''මම සඤ්ඤාවෙදයිත නිරොධයට සමවදිමි යි හෝ, මම සඤ්ඤාවෙදයිතනිරොධයට සමවන්මි යි හෝ මම සඤ්ඤාවේදයිතනිරෝධයෙන් නැඟී සිටියෙමි යි හෝ මෙ බඳු සිතෙක් නො වේ''.

'එය එසේ මැ'යි. ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් විසින් දීර්ඝ රාත්‍රියෙහි අහිඞ්කාරමමිඞ්කාරමානානුසයයෝ මොනවට නසන ලදහ. එහෙයින් ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට ''මම සඤ්ඤාවේදයිතනිරොධයට සමවදිමි යි හෝ, මම සඤ්ඤාවෙදයිත නිරොධයට සමවන්මි යි හෝ, මම සඤ්ඤාවේදයිත නිරොධයෙන් නැඟී සිටියෙමි යි හෝ මෙ බඳු සිතෙක් නො වේ.

## 7. 1. 10.

## සූචිමුඛී සූත්‍රය

**341.**

එක්කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ රජගහ නුවර සමීපයෙහි කලන්දක නිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන රජගහනුවරට පිඩු පිණිය පිවිසියහ. රජගහනුවර ගෙපිළිවෙළින් පිඩු පිණිය හැසිර ඒ පිණ්ඩපාතය එක්තරා බිත්තිමුලක් ඇසුරු කොට වළඳිති. එකල්හි සූචිමුඛී නම් පරිව්‍රාජිකාව ආයුෂ්මත් සැරියුත් තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට මෙය කීවු ය : ''මහණ, කිමෙක් ද ? යටිමුව ව වළඳහි දැ ''යි.

න ඛ්වාහං භගිනි, අධොමුඛො භුඤ්ජාමීති. තෙන හි සමණ, උද්ධංමුඛො භුඤ්ජසීති

න ඛ්වාහං භගිනි, උද්ධං මුඛො භුඤ්ජාමීති.

තෙන හි සමණ, දිසාමුඛො භුඤ්ජසීති.

න ඛ්වාහං භගිනි, දිසාමුඛො භුඤ්ජාමීති.

තෙන හි සමණ, විදිසාමුඛො භුඤ්ජසීති.

න ඛ්වාහං භගිනි, විදිසාමුඛො භුඤ්ජාමීති.

කිං නු සමණ, අධොමුඛො භුඤ්ජසීති ඉති පුට්ඨො සමානො න ඛ්වාහං භගිනි, අධොමුඛො භුඤ්ජාමීති වදෙසි. තෙන හි සමණ, උද්ධං මුඛො භුඤ්ජසීති ඉති පුට්ඨො සමානො, න ඛ්වාහං භගිනි, උද්ධංමුඛො භුඤ්ජාමීති වදෙසි. තෙන හි සමණ, දිසාමුඛො භුඤ්ජසීති ඉති පුට්ඨො සමානො න ඛ්වාහං භගිනි, දිසාමුඛො භුඤ්ජාමීති වදෙසි. තෙන හි සමණ, විදිසාමුඛො භුඤ්ජසීති ඉති පුට්ඨො සමානො න ඛ්වාහං භගිනි, විදිසාමුඛො භුඤ්ජාමීති වදෙසි. කථංචරහි සමණ, භුඤ්ජසීති.

යෙ හි කෙචි භගිනි, සමණබ්‍රාහ්මණා වත්ථුවිජ්ජාතිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, ඉමෙ වුච්චන්ති භගිනි, සමණබ්‍රාහ්මණා "අධොමුඛා භුඤ්ජන්තී"ති.

යෙ හි කෙචි භගිනි, සමණබ්‍රාහ්මණා නක්ඛත්තවිජ්ජාතිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, ඉමෙ වුච්චන්ති භගිනි, සමණබ්‍රාහ්මණා "උද්ධංමුඛා භුඤ්ජන්තී"ති.

යෙ හි කෙචි භගිනි, සමණබ්‍රාහ්මණා දූතෙය්‍යපහිණගමනානුයොගා මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, ඉමෙ වුච්චන්ති භගිනි, සමණබ්‍රාහ්මණා "දිසාමුඛා භුඤ්ජන්තී"ති.

යෙ හි කෙචි භගිනි, සමණබ්‍රාහ්මණා අඞ්ගවිජ්ජාතිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, ඉමෙ වුච්චන්ති භගිනි, සමණබ්‍රාහ්මණා "විදිසාමුඛා භුඤ්ජන්තී"ති.

සො ඛ්වාහං භගිනි, න වත්ථුවිජ්ජාතිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙමි. න නක්ඛත්තවිජ්ජාතිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙමි, න දූතෙය්‍යපහිණගමනානුයොගා මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙමි, න අඞ්ගවිජ්ජාතිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙමි. ධම්මෙන භික්ඛං පරියෙසාමි, ධම්මෙන භික්ඛං පරියෙසිත්වා භුඤ්ජාමීති.

නැඟැණියනි, මම යටිමුව ව නො ම වළඳමි යි.

''මහණ, එසේ නම් උඩුමුව ව වළඳහි දැ ''යි

''නැඟැණියනි, මම උඩුමුව ව නො ම වළඳමි.

මහණ, එසේ නම් සිවුදිගට ලූ මුව ඇති ව වළඳහි ද යි. නැඟැණියනි, මම සිවුදිගට ලූ මුව ඇති ව නො ම වළඳමි යි.

මහණ, එසේ නම් සිවුඅනුදිගට ලූ මුව ඇති ව වළඳහි ද යි.

නැඟැණියනි, මම සිවුඅනුදිගට ලූ මුව ඇති ව නො ම වළඳමි යි.

මහණ, කිමෙක් ද? යටිමුව ව වළඳහි ද යි මෙසේ පුළුවුස්නා ලද්දේ නැඟැණියනි, ''මම යටිමුව ව නො ම වළඳමි''යි කියහි. මහණ, එසේ නම් උඩු මුව ව වළඳහි ද යි මෙසේ පුළුවුස්නා ලද්දේ නැඟැණියනි ''මම උඩුමුව ව නො ම වළඳමි''යි කියහි. මහණ, එසේ නම් සිවුදිගට ලූ මුව ඇති ව වළඳහි ද යි මෙසේ පුළුවුස්නා ලද්දේ නැඟැණියනි, ''මම සිවුදිගට ලූ මුව ඇතිව නො ම වළඳමි''යි කියහි. මහණ එසේ නම් සිවු අනුදිගට ලූ මුව ඇති ව වළඳහි ද යි මෙසේ පුළුවුස්නා ලද්දේ නැඟැණියනි ''මම සිවු අනුදිගට ලූ මුව ඇති ව නො ම වළඳමි''යි කියහි. මහණ, එසේ නම් දැන් කෙසේ වළඳහි ද යි.

නැඟැණියනි, යම් කිසි මහණබමුණු කෙනෙක් වාස්තුවිද්‍යා නම් තිරශ්චීන විද්‍යාව වූ මිථ්‍යාජීවනෝපායයෙන් ජීවිකාව කෙරෙත් නම් නැඟැණියනි, මේ මහණබමුණෝ යටිමුව ව වළඳති යි කියනු ලැබෙති.

නැඟැණියනි, යම්කිසි මහණබමුණු කෙනෙක් නක්ෂත්‍රවිද්‍යා නම් තිරශ්චීනවිද්‍යාව වූ මිථ්‍යාජීවනෝපායයෙන් ජීවිකාව කෙරෙත් නම් නැඟැණියනි. මේ මහණබමුණෝ උඩුමුව ව වළඳති යි කියනු ලැබෙති.

නැඟැණියනි, යම් කිසි මහණබමුණු කෙනෙක් පහිනිපත් ගෙන යාමෙහි යෙදීමෙන් (වූ) මිථ්‍යාජීවනෝපායයෙන් ජීවිකාව කෙරෙත් නම් නැඟැණියනි, මේ මහණබමුණෝ සිවුදිගට ලූ මුව ඇති ව වළඳති යි කියනු ලැබෙත්.

නැඟැණියනි, යම්කිසි මහණබමුණු කෙනෙක් අංගවිද්‍යා නම් තිරශ්චීනවිද්‍යාව වූ මිථ්‍යා ජීවනෝපායයෙන් ජීවිකාව කෙරෙත් නම් නැඟැණියනි, මේ මහණබමුණෝ සිවුඅනුදිගට ලූ මුව ඇති ව වළඳති යි කියනු ලැබෙත්.

නැඟැණියනි, ඒ මම වාස්තුවිද්‍යා නම් තිරශ්චීනවිද්‍යාව වූ මිථ්‍යාජීවනෝපායයෙන් ජීවිකාව නො කරමි. නක්ෂත්‍රවිද්‍යා නම් තිරශ්චීනවිද්‍යාව වූ මිථ්‍යාජීවනෝපායයෙන් ජීවිකාව නො කරමි. පහිනිපත් ගෙන යාමෙහි යෙදීමෙන් වූ මිථ්‍යාජීවනෝපායයෙන් ජීවිකාව නො කරමි. අංගවිද්‍යා නම් තිරශ්චීනවිද්‍යාව වූ මිථ්‍යාජීවනෝපායයෙන් ජීවිකාව නො කරමි. දැහැමින් භික්ෂාව සොයමි. දැහැමින් භික්ෂාව සොයා වළඳමි යි.

අථ ඛො සූචිමුඛී පරිබ්බාජිකා රාජගහෙ රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාරොචෙසි: "ධම්මිකං සමණා සක්‍යපුත්තියා ආහාරං ආහාරෙන්ති, අනවජ්ජං සමණා සක්‍යපුත්තියා ආහාරං ආහාරෙන්ති, දෙථ සමණානං සක්‍යපුත්තියානං පිණ්ඩ"න්ති.

සාරිපුත්තවග්ගො පඨමො.

තස්සුද්දානං:

විවෙකජං අවිතක්කං පීතිවිරාගුපෙක්ඛාහි
ආකාසානඤ්ච විඤ්ඤාණං ආකිඤ්චඤ්ඤෙන තීණි ච
නෙවසඤ්ඤා ච නිරොධො සූචිමුඛී දස සුත්තානි.

සාරිපුත්තසංයුත්තං නිට්ඨිතං.

ඉක්බිති සුචිමුඛී පරිබ්‍රාජිකාව රජගහ නුවර වීදියෙන් වීදියට සිව්මංසලින් සිව්මංසලට එළඹ මෙසේ පැවසුවා ය. '' ශ්‍රමණශාක්‍යපුත්‍රීයයෝ දැහැමි යේ ආහාර වළඳත්. ශ්‍රමණශාක්‍යපුත්‍රීයයෝ නිවැරදි යේ ආහාර වළඳත්. ශ්‍රමණශාක්‍යපුත්‍රීයයන්ට පිඬු දෙව ''යි.

**පළමුවැනි සාරිපුත්ත වර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය :**

විවේකජ, අවිතක්ක, පීති, උපෙක්ඛා යුක්ත සතර ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන සූත්‍ර තුන ද, නේවසඤ්ඤානාසඤ්ඤායතන, නිරොධසමාපත්ති සුචිමුඛී සූත්‍ර ද යි දශ සූත්‍ර කෙනෙකි.

**සාරිපුත්තසංයුත්තය නිමියේ යි.**

# 8. නාගසංයුත්තං

## 1. නාගවග්ගො

### 8. 1. 1.

### සුද්ධික සුත්තං

342. සාවත්ථියං :

චතස්සො ඉමා භික්ඛවෙ, නාගයොනියො. කතමා චතස්සො? අණ්ඩජා නාගා ජලාබුජා නාගා සංසෙදජා නාගා ඔපපාතිකා නාගා, ඉමා ඛො භික්ඛවෙ, චතස්සො නාගයොනියොති.

### 8. 1. 2.

### පණීතතර සුත්තං

343. සාවත්ථියං :

චතස්සො ඉමා භික්ඛවෙ, නාගයොනියො. කතමා චතස්සො? අණ්ඩජා නාගා ජලාබුජා නාගා සංසෙදජා නාගා ඔපපාතිකා නාගා. තත්‍ර භික්ඛවෙ, අණ්ඩජෙහි නාගෙහි ජලාබුජා ච සංසෙදජා ච ඔපපාතිකා ච නාගා පණීතතරා.

තත්‍ර භික්ඛවෙ, අණ්ඩජෙහි ච ජලාබුජෙහි ච නාගෙහි සංසෙදජා ච ඔපපාතිකා ච නාගා පණීතතරා.

තත්‍ර භික්ඛවෙ, අණ්ඩජෙහි ච ජලාබුජෙහි ච සංසෙදජෙහි ච නාගෙහි ඔපපාතිකා නාගා පණීතතරා, ඉමා ඛො භික්ඛවෙ, චතස්සො නාගයොනියොති.

### 8. 1. 3.

### උපොසථ සුත්තං

344 සාවත්ථියං :

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු, කො පච්චයො, යෙනමිධෙකච්චෙ අණ්ඩජා නාගා උපොසථං උපවසන්ති, වොස්සට්ඨකායා ච භවන්තීති.

# 8. නාග සංයුත්තය

## 1. නාග වර්ගය

### 8. 1. 1.

### සුද්ධික සූත්‍රය

**342. සැවැත්නුවර :**

මහණෙනි, මේ නාගයෝනි සතරෙකි. කවර සතරෙක් ද යත් : අණ්ඩජ (බිජුවටින් උපන්) නාගයෝ ය, ජලාබුජ (ගර්භාශයෙන් උපන්) නාගයෝ ය, සංසෙදජ (තෙතමනෙහි උපන්) නාගයෝ ය, ඕපපාතික (උපපාදුක ව එකවර ම උපන්) නාගයෝ ය යි. . . . මහණෙනි, මේ නාගයෝනි සතර යි.

### 8. 1. 2.

### පණීතතර සූත්‍රය

**343. සැවැත්නුවර :**

මහණෙනි, මේ නාගයෝනි සතරෙකි, කවර සතරෙක් ද යත් : අණ්ඩජ නාගයෝ ය. ජලාබුජ නාගයෝ ය, සංසෙදජ නාගයෝ ය, ඕපපාතික නාගයෝ යි.

මහණෙනි, එහි අණ්ඩජ නාගයන්ට වඩා ජලාබුජ නාගයෝත් සංසෙදජ නාගයෝත් ඕපපාතික නාගයෝත් ඉතා ප්‍රණීතයහ.

මහණෙනි, එහි අණ්ඩජ නාගයන්ටත් ජලාබුජ නාගයන්ටත් වඩා සංසෙදජ නාගයෝත් ඕපපාතික නාගයෝත් ඉතා ප්‍රණීතයහ.

මහණෙනි, එහි අණ්ඩජ නාගයන්ටත් ජලාබුජ නාගයන්ටත් සංසෙදජ නාගයන්ටත් වඩා ඕපපාතික නාගයෝ ඉතා ප්‍රණීතයහ. මහණෙනි, මොහු සිවු නාගයෝනීහු යි.

### 8. 1. 3.

### උපෝසථ සූත්‍රය

**344. සැවැත්නුවර :**

එ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ යැ. එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ යැ : ''වහන්ස මෙහි, ඇතැම් අණ්ඩජ, නාගයෝ යම් හෙයෙකින් පෙහෙවස් වෙසෙත් නම් බැහැර ලූ කය ඇත්තෝත් වෙත් නම් එයට හේතු කිමෙක් ද ? ප්‍රත්‍යය කිමෙක් දැ යි ?

ඉධ භික්ඛු එකච්චානං අණ්ඩජානං නාගානං එවං හොති: “මයං ඛො පුබ්බෙ කායෙන ද්වයකාරිනො අහුම්හ වාචාය ද්වයකාරිනො මනසා ද්වයකාරිනො, තෙ මයං කායෙන ද්වයකාරිනො වාචාය ද්වයකාරිනො මනසා ද්වයකාරිනො කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං නාගානං සහබ්‍යතං උපපන්නා.

සචජ්ජ මයං කායෙන සුචරිතං චරෙය්‍යාම වාචාය සුචරිතං චරෙය්‍යාම මනසා සුචරිතං චරෙය්‍යාම. එවං මයං කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යාම, හන්ද මයං එතරහි කායෙන සුචරිතං චරාම වාචාය සුචරිතං චරාම මනසා සුචරිතං චරාමා”ති.

අයං ඛො භික්ඛු හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ අණ්ඩජා නාගා උපොසථං උපවසන්ති වොස්සට්ඨකායා ච භවන්තීති.

## 8. 1. 4.

## දුතිය උපොසථ සුත්තං

**345. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො, යෙනමිධෙකච්චෙ ජලාබුජා නාගා උපොසථං උපවසන්ති වොස්සට්ඨකායා ච භවන්තීති -පෙ-.

අයං ඛො භික්ඛු හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ ජලාබුජා නාගා උපොසථං උපවසන්ති වොස්සට්ඨකායා ච භවන්තීති.

## 8. 1. 5.

## තතිය උපොසථ සුත්තං

**346. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච:

කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ සංසෙදජා නාගා උපොසථං උපවසන්ති වොස්සට්ඨකායා ච භවන්තීති -පෙ-.

අයං ඛො භික්ඛු හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ සංසෙදජා නාගා උපොසථං උපවසන්ති වොස්සට්ඨකායා ච භවන්තීති.

## 8. 1. 6.

## චතුත්ථ උපොසථ සුත්තං

**347. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො, යෙනමිධෙකච්චෙ ඕපපාතිකා නාගා උපොසථං උපවසන්ති වොස්සට්ඨකායා ච භවන්තීති.

Free Distribution www.aathaapi.org

මහණ, මෙහි ඇතැම් අණ්ඩජ නාගයන්ට මෙ බඳු අදහසෙක් වෙයි : පෙර අපි කයින් දෙකක් (කුසල් අකුසල්) කරන්නමෝ වූම්හ, වචනයෙන් දෙකක් කරන්නමෝ වූම්හ, සිතින් දෙකක් කරන්නමෝ වූම්හ. ඒ අපි කයින් දෙකක් කරන්නමෝ වදනින් දෙකක් කරන්නමෝ සිතින් දෙකක් කරන්නමෝ කාබුන් මරණින් මතු අණ්ඩජ නාගයන්ගේ සහභාවයට පැමිණියම්හ. ඉදින් අද අපි කයින් සුසිරිත් කරන්නමෝ වදනින් සුසිරිත් කරන්නමෝ සිතින් සුසිරිත් කරන්නමෝ නම් මෙසේ අපි කාබුන් මරණින් මතු මනා ගති ඇති සගලොවට පැමිණෙන්නෙමු. එහෙයින් අපි දැන් කයින් සුසිරිත් කරම්හ වදනින් සුසිරිත් කරම්හ සිතින් සුසිරිත් කරම්හ''යි.

මහණ, මෙහි ඇතැම් අණ්ඩජ නාගයෝ යම් හෙයෙකින් පෙහෙවස් වෙසෙත් නම් බැහැර ලූ කය ඇත්තෝත් වෙත් නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

## 8. 1. 4.

## දුතිය උපෝසථ සූත්‍රය

**345.** සැවැත්නුවර :

එකත්පසෙක හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය : වහන්ස, මෙහි ඇතැම් ජලාබුජ නාගයෝ යම් හෙයෙකින් පෙහෙවස් වෙසෙත් නම් බැහැර ලූ කය ඇත්තෝ ත් වෙත් නම් එයට හේතු කිමෙක් ද, ප්‍රත්‍යය කිමෙක් ද යි . . .

මහණ, මෙහි ඇතැම් ජලාබුජ නාගයෝ යම් හෙයෙකින් පෙහෙවස් වෙසෙත් නම් බැහැර ලූ කය ඇත්තෝත් වෙත් නම් එයට මේ හේතුව යි, මේ ප්‍රත්‍යය යි.

## 8. 1. 5.

## තතිය උපොසථ සූත්‍රය

**346.** සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ ය : ''වහන්ස, මෙහි ඇතැම් සංසෙදජ නාගයෝ යම් හෙයෙකින් පෙහෙවස් වෙසෙත් නම් බැහැර ලූ කය ඇත්තෝත් වෙත් නම් එයට හෙතු කිමෙක් ද, ප්‍රත්‍යය කිමෙක් ද''යි . . .

මහණ, මෙහි ඇතැම් සංසෙදජ නාගයෝ යම් හෙයෙකින් පෙහෙවස් වෙසෙත් නම් බැහැර ලූ කය ඇත්තෝත් වෙත් නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

## 8. 1. 6.

## චතුත්ථ උපෝසථ සූත්‍රය

**347.** සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ යැ : ''වහන්ස, මෙහි ඇතැම් ඕපපාතික නාගයෝ යම් හෙයෙකින් පෙහෙවස් වෙසෙත් නම් බැහැර ලූ කය ඇත්තෝත් වෙත් නම් එයට හේතු කිමෙක් ද, ප්‍රත්‍යය කිමෙක් ද''යි.

33—ඒ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

ඉධ භික්ඛු එකච්චානං ඔපපාතිකානං නාගානං එවං හොති: "මයං ඛො පුබ්බෙ කායෙන ද්වයකාරිනො අහුම්හ, වාචාය ද්වයකාරිනො මනසා ද්වයකාරිනො. තෙ මයං කායෙන ද්වයකාරිනො වාචාය ද්වයකාරිනො මනසා ද්වයකාරිනො කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං නාගානං සහබ්‍යතං උපපන්නා. සචජ්ජ මයං කායෙන සුචරිතං චරෙය්‍යාම වාචාය සුචරිතං චරෙය්‍යාම මනසා සුචරිතං චරෙය්‍යාම. එවං මයං කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යාම. හන්ද මයං එතරහි කායෙන සුචරිතං චරාම වාචාය සුචරිතං චරාම මනසා සුචරිතං චරාමා"ති.

අයං ඛො භික්ඛු හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චෙ ඔපපාතිකා නාගා උපොසථං උපවසන්ති වොස්සට්ඨකායා ච භවන්තීති.

## 8. 1. 7.

### සුත සුත්තං

348. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො, යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු, එකච්චො කායෙන ද්වයකාරී හොති, වාචාය ද්වයකාරී මනසා ද්වයකාරී, තස්ස සුතං හොති: "අණ්ඩජා නාගා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා"ති. තස්ස එවං හොති: "අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං නාගානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය"න්ති. සො කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං නාගානං සහබ්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති.

## 8. 1. 8.

### දුතිය සුත සුත්තං

349. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො, යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා ජලාබුජානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති. ඉධ භික්ඛු, එකච්චො කායෙන ද්වයකාරී හොති -පෙ-.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා ජලාබුජානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති.

Free Distribution www.aathaapi.org

මහණ, මෙහි ඇතැම් ඕපපාතික නාගයන්ට මෙබඳු සිතෙක් වෙයි : ''පෙර අපි කයින් (කුසල් අකුසල් විසින්) දෙකක් කරන්නමෝ වූම්හ. වදනින් දෙකක් කරන්නමෝ වූම්හ, සිතින් දෙකක් කරන්නමෝ වූම්හ. ඒ අපි කයින් දෙකක් කරන්නමෝ වදනින් දෙකක් කරන්නමෝ සිතින් දෙකක් කරන්නමෝ කාබුන් මරණින් මතු ඕපපාතික නාගයන්ගේ සහභාවයට පැමිණියම්හ. ඉදින් අපි අද කයින් සුසිරිත් කරන්නමෝ වදනින් සුසිරිත් කරන්නමෝ සිතින් සුසිරිත් කරන්නමෝ නම් මෙසේ අපි කාබුන් මරණින් මතු මනාගති ඇති සගලොවට පැමිණෙන්නෙමු. එයින් අපි දැන් කයින් සුසිරිත් කරම්හ වදනින් සුසිරිත් කරම්හ සිතින් සුසිරිත් කරම්හ''යි.

මහණ, මෙහි ඇතැම් ඕපපාතික නාගයෝ යම් හෙයෙකින් පෙහෙවස් වෙසෙත් නම් බැහැර ලූ කය ඇත්තෝත් වෙත් නම් එයට මේ හෙතු යි, මේ ප්‍රත්‍යය යි.

## 8. 1. 7

## සුත සූත්‍රය

348. සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේ යැ : ''වහන්ස, මෙහි ඇතැමෙක් යම් හෙයෙකින් කාබුන් මරණින් මතු අණ්ඩජ නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට හේතු කිමෙක් ද, ප්‍රත්‍යය කිමෙක් ද''යි.

මහණ, මෙහි ඇතැමෙක් කයින් දෙකක් කරන සුලු වදනින් දෙකක් කරනසුලු සිතින් දෙකක් කරන සුලු වෙයි. ''අණ්ඩජ නාගයෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ යි ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි : ''මම කාබුන් මරණින් මතු අණ්ඩජ නාගයන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනැවැ'' යි කාබුන් මරණින් මතු අණ්ඩජ නාගයන්ගේ සහභාවයට පැමිණේ.

මහණ, මෙහි ඇතැමෙක් යම් හෙයෙකින් කාබුන් මරණින් මතු අණ්ඩජ නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යි මේ ප්‍රත්‍යය යි.

## 8. 1. 8

## දුතිය සුත සූත්‍රය

349. සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ යැ : ''වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැමෙක් කාබුන් මරණින් මතු ජලාබුජ නාගයන් ගේ සහභාවයට පැමිණේ නම් එයට හේතු කිමෙක් ද, ප්‍රත්‍යය කිමෙක් ද'' යි.

මහණ, මෙහි ඇතැමෙක් කයින් දෙකක් කරනසුලු වෙයි . . .

මහණ යම් හෙයෙකින් මෙහි ඇතැමෙක් කාබුන් මරණින් මතු ජලාබුජ නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යි. මේ ප්‍රත්‍යය යි.

## 8. 1. 9.

### තතිය සුත සුත්තං

350. සාවත්ථියං :

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ, හෙතු, කො පච්චයො, යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා සංසෙදජානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු, එකච්චො කායෙන ද්වයකාරී හොති -පෙ- අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො, කායස්ස භෙදා පරම්මරණා සංසෙදජානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති.

## 8. 1. 10.

### චතුත්ථ සුත සුත්තං

351. සාවත්ථියං :

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු, භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ, හෙතු, කො පච්චයො, යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං නාගානං සහබ්‍යතං උපපජ්ජති''ති.

ඉධ භික්ඛු, එකච්චො කායෙන ද්වයකාරී. තස්ස සුතං හොති : ''ඔපපාතිකා නාගා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා''ති. තස්ස එවං හොති : ''අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං නාගානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය''න්ති. සො කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං නාගානං සහබ්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති.

## 8. 1. 11.

### අන්නාදයක අණ්ඩජ සුත්තං

352. සාවත්ථියං :

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ, හෙතු, කො පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු, එකච්චො කායෙන ද්වයකාරී හොති වාචාය ද්වයකාරී මනසා ද්වයකාරී. තස්ස සුතං හොති : ''අණ්ඩජා නාගා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා''ති. තස්ස එවං හොති : ''අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං නාගානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය''න්ති. සො අන්නං දෙති -පෙ උපපජ්ජතීති.

## 8. 1. 9.

## තතිය සුත සූත්‍රය

**350. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් මේ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ යැ : "වහන්ස යම් හෙයෙකින් මෙහි ඇතැමෙක් කාබුන් මරණින් මතු සංසේදජ නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට හේතු කිමෙක් ද, ප්‍රත්‍යය කිමෙක් ද''යි.

මහණ, මෙහි ඇතැමෙක් කයින් දෙකක් කරනසුලු වෙයි . . . "මහණ, යම් හෙයෙකින් මෙහි ඇතැමෙක් කාබුන් මරණින් මතු සංසේදජ නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යි මේ ප්‍රත්‍යය යි.

## 8. 1. 10.

## චතුත්ථ සුත සූත්‍රය

**351. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ යැ : "වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැමෙක් කාබුන් මරණින් මතු ඕපපාතික නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට හේතු කිමෙක් ද, ප්‍රත්‍යය කිමෙක් ද''යි.

"මහණ, මෙහි ඇතැමෙක් කයින් දෙකක් කරනසුලු වදනින් දෙකක් කරන සුලු සිතින් දෙකක් කරනසුලු වෙයි. ඕපපාතික නාගයෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ'යි ඔහු විසින් අසන ලද්දේ වෙයි. ඔහුට මෙ බඳු සිතෙක් වෙයි : "මම කාබුන් මරණින් මතු ඕපපාතික නාගයන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනවැ''යි. . . . හෙ කාබුන් මරණින් මතු ඕපපාතික නාගයන්ගේ සහභාවයට පැමිණේ.

මහණ, යම් හෙයෙකින් මෙහි ඇතැමෙක් කාබුන් මරණින් මතු ඕපපාතික නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හෙතු යි, මේ ප්‍රත්‍යය යි.

## 8. 1. 11.

## අන්නදායක අණ්ඩජ සූත්‍රය

**352. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ යැ : වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැමෙක් කාබුන් මරණින් මතු අණ්ඩජ නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට කිමෙක් හේතු ද, කිමෙක් ප්‍රත්‍යය ද ''යි.

මහණ, මෙහි ඇතැමෙක් කයින් දෙකක් කරනසුලු වදනින් දෙකක් කරනසුලු සිතින් දෙකක් කරනසුලු වෙයි. ඔහු විසින් අණ්ඩජ නාගයෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ'යි අසන ලද්දේත් වෙයි. (එහෙයින්) ඔහුට මෙ බඳු සිතෙක් වෙයි : '' මම කාබුන් මරණින් මතු අණ්ඩජ නාගයන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනැවැ යි. හෙතෙමේ අහර දෙයි. . . . පැමිණේ.

8. 11. 12.

පානදයකඅණ්ඩජසුත්තං

353. පානං දෙති -පෙ- උපපජ්ජන්තීති.

8. 1. 13.

වත්ථදයක අණ්ඩජසුත්තං

354. වත්ථං දෙති -පෙ- උපපජ්ජන්තීති.

8. 1. 14.

යානදයක අණ්ඩජ සුත්තං

355. යානං දෙති -පෙ- උපපජ්ජන්තීති.

8. 1. 15.

මාලාදයක අණ්ඩජ සුත්තං

356. මාලං දෙති -පෙ- උපපජ්ජන්තීති.

8. 1. 16.

ගන්ධදයක අණ්ඩජ සුත්තං

357. ගන්ධං දෙති -පෙ- උපපජ්ජන්තීති.

8. 1. 17.

විලෙපනදයක අණ්ඩජ සුත්තං

358. විලෙපනං දෙති -පෙ- උපපජ්ජන්තීති.

8. 1. 18.

සෙය්‍යාදයක අණ්ඩජ සුත්තං

359. සෙය්‍යං දෙති -පෙ- උපපජ්ජන්තීති.

8. 1. 19.

ආවසථදයක අණ්ඩජ සුත්තං

360. ආවසථං දෙති -පෙ- උපපජ්ජන්තීති.

Free Distribution www.aathaapi.org

## 8. 1. 12.

## පානදායක අණ්ඩජ සූත්‍රය

353. . . . බොන දෑ දෙයි . . . පැමිණේ.

## 8. 1. 13.

## වත්ථදායක අණ්ඩජ සූත්‍රය

354. . . වත් දෙයි. . . . පැමිණේ.

## 8. 1. 14.

## යානදායක අණ්ඩජ සූත්‍රය

355. . . . වහන් දෙයි. . . . පැමිණේ.

## 8. 1. 15.

## මාලාදායක අණ්ඩජ සූත්‍රය

356. . . . මල් දෙයි. . . . පැමිණේ.

## 8. 1. 16.

## ගන්ධදායක අණ්ඩජ සූත්‍රය

357. . . . ගඳ දෙයි. . . . පැමිණේ.

## 8. 1. 17.

## විලේපන දායක අණ්ඩජ සූත්‍රය

358. . . විලවුන් දෙයි. . . . පැමිණේ.

## 8. 1. 18.

## සෙය්‍යාදායක අණ්ඩජ සූත්‍රය

359. . . , සෙනසුන් දෙයි. . . . පැමිණේ.

## 8. 1. 19.

## ආවසථදායක අණ්ඩජ සූත්‍රය

360. වෙසෙන තැන් දෙයි. . . . පැමිණේ.

## 8. 1. 20.

### පදීපෙය්‍යදායක අණ්ඩජ සුත්තං

361. පදීපෙය්‍යං දෙති. සො කායස්ස භෙදා අණ්ඩජානං නාගානං සහබ්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති.

## 8. 1. 21.

### අන්නදායකාදි ජලාබුජ සංසෙදජ සුත්තානි

362 - 381. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා ජලාබුජානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති.

"ඉධ භික්ඛු, එකච්චො -පෙ- සංසෙදජානං නාගානං -පෙ- සහබ්‍යතං උපපජ්ජතීති.

## 8. 1. 41.

### අන්නදායක ඔපපාතික සුත්තං

382. -පෙ- ඔපපාතිකානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති. ඉධ භික්ඛු, එකච්චො කායෙන ද්වයකාරී හොති වාචාය ද්වයකාරී මනසා ද්වයකාරී, තස්ස සුතං හොති: "ඔපපාතිකා නාගා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා"ති. තස්ස එවං හොති: "අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං නාගානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය"න්ති. සො අන්නං දෙති -පෙ- උපපජ්ජතීති.

## 8. 1. 42.

### පානදායක ඔපපාතික සුත්තං

383. පානං දෙති -පෙ- උපපජ්ජතීති.

## 8. 1. 43.

### වත්ථදායක ඔපපාතික සුත්තං

384. වත්ථං දෙති -පෙ- උපපජ්ජතීති.

## 8. 1. 44.

### යානදායක ඔපපාතික සුත්තං

385. යානං දෙති -පෙ- උපපජ්ජතීති.

Free Distribution www.aathaapi.org

## 8. 1. 20.

## පදීපෙය්‍යාදයක අණ්ඩජ සූත්‍රය

**361.** . . . පහන් උපකරණ දෙයි. හේ කාබුන් මරණින් මතු අණ්ඩජ නාගයන්ගේ සහභාවයට පැමිණේ.

මහණ, යම් හෙයෙකින් මෙහි ඇතැමෙක් කාබුන් මරණින් මතු අණ්ඩජ නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

## 8. 1. 21—40

## අන්නදයකාදි ජලාබුජ සංසෙදජ සූත්‍ර

**362-381.** සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය : වහන්ස, යම් හෙයෙකින් මෙහි ඇතැමෙක් කාබුන් මරණින් මතු ජලාබුජ නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට කිමෙක් හේතු ද, කිමෙක් ප්‍රත්‍යය දැ යි.

මහණ, මෙහි ඇතැමෙක් . . . සංසෙදජ නාගයන්ගේ සහභාවයට පැමිණේ.

## 8 1 41.

## අන්නදයක ඔපපාතික සූත්‍රය

**382.** . . . ඔපපාතික නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් . . . මහණ, මෙහි ඇතැමෙක් කයින් දෙකක් කරනසුලු, වදනින් දෙකක් කරනසුලු, සිතින් දෙකක් කරනසුලු වෙයි. ඔහු විසින් ඔපපාතික නාගයෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ'යි අසන ලද්දේත් වෙයි. (එහෙයින්) ඔහුට මෙ බඳු සිතෙක් වෙයි : මම කාබුන් මරණින් මතු ඔපපාතික නාගයන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනැවැ '' යි. හේ අහර දෙයි. . . . පැමිණේ.

## 8. 1. 42

## පානදයක ඔපපාතික සූත්‍රය

**383.** . . . බොන දෑ දෙයි. . . . පැමිණේ.

## 8. 1. 43.

## වත්ථදයක ඔපපාතික සූත්‍රය

**384.** . . . වස්ත්‍ර දෙයි. . . . පැමිණේ.

## 8. 1. 44.

## යානදයක ඔපපාතික සූත්‍රය

**385.** . . . වහන් දෙයි. . . . පැමිණේ.

## 8. 1. 45.

### මාලාදයක ඔපපාතික සුත්තං

**886.** මාලං දෙති -පෙ- උපපජ්ජන්තීති.

## 8. 1. 46.

### ගන්ධදයක ඔපපාතික සුත්තං

**887.** ගන්ධං දෙති -පෙ- උපපජ්ජන්තීති.

## 8. 1. 47.

### විලෙපන දයක ඔපපාතික සුත්තං

**888.** විලෙපනං දෙති -පෙ- උපපජ්ජන්තීති.

## 8. 1. 48.

### සෙය්‍යාදයක ඔපපාතික සුත්තං

**889.** සෙය්‍යං දෙති -පෙ- උපපජ්ජන්තීති.

## 8. 1. 49.

### ආවසථදයක ඔපපාතික සුත්තං

**890.** ආවසථං දෙති -පෙ- උපපජ්ජන්තීති.

## 8. 1. 50.

### පදීපෙය්‍යදයක ඔපපාතික සුත්තං

**891.** පදීපෙය්‍යං දෙති. සො කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං නාගානං සහබ්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං නාගානං සහබ්‍යතං උපපජ්ජතීති.

(ඉමිනා පෙය්‍යාලෙන සහ දස සුත්තන්තා විත්ථාරා. චතු චත්තාලීසං වෙය්‍යාකරණා කාතබ්බා, දානූපකාරසුත්තන්තා දස, සබ්බෙ පඤ්ඤාසං සුත්තන්තා හොන්ති )

නාගවග්ගො පඨමො.

## 8. 1. 45.

### මාලාදයක ඖපපාතික සූත්‍රය

**386.** . . . මල් දෙයි. . . . පැමිණේ.

## 8. 1. 46.

### ගන්ධදයක ඖපපාතික සූත්‍රය

**387.** . . . ගඳ දෙයි. . . . පැමිණේ.

## 8. 1. 47.

### විලේපනදයක ඖපපාතික සූත්‍රය

**388.** . . . විලවුන් දෙයි. . . . පැමිණේ.

## 8. 1. 48.

### සෙය්‍යාදයක ඖපපාතික සූත්‍රය

**389.** . . සෙනසුන් දෙයි. . . . පැමිණේ.

## 8. 1. 49.

### ආවසථදයක ඖපපාතික සූත්‍රය

**390.** . . වෙසෙන තැන් දෙයි. . . . පැමිණේ.

## 8. 1. 50.

### පදීපෙය්‍යාදයක ඖපපාතික සූත්‍රය

**391.** . . . පහන් උපකරණ දෙයි . . . කාබුන් මරණින් මතු ඖපපාතික නාගයන්ගේ සහභාවයට පැමිණේ.

මහණෙනි, යම් හෙයෙකින් මෙහි ඇතැමෙක් කාබුන් මරණින් මතු ඖපපාතික නාගයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යි මේ ප්‍රත්‍යය යි.

(මේ පෙය්‍යාලය සම්බන්ධ විස්තර වශයෙන් දශසූත්‍ර කෙනෙකි. සිවු යොනීන්හි සූත්‍ර සතලිසක් විස්තර කටයුතු යි. සුද්ධික සූත්‍ර දශයෙකි. මුළුල්ල සූත්‍ර පනසෙක් වේ.)

පළමුවැනි නාග වර්ග යි.

තස්සුද්දානං:

> සුද්ධිකං පණීතතරං චතුරෝ ච උපෝසථා
> තස්ස සුතෙන චත්තාරො චතුරො සුචරිතෙන ච
> දානුපකාර චත්තාරො නාගෙ පඤ්ඤාසසුත්තානීති.

නාගසංයුත්තං සමත්තං.

එහි සූත්‍රනාමාවලිය :

සුද්ධික සූත්‍රය, පණීතතර සූත්‍රය, උපෝසථ සූත්‍ර සතර ය, සුචරිතයෙන් යුත් සූත්‍ර සූත්‍ර සතර ය යන සූත්‍ර දශක ය, දානෝපකාර සූත්‍ර දශක සතර ය, හෙවත් අන්න, පාන, වත්ථ, යාන, මාලා, ගන්ධ, විලෙපන, සෙය්‍යා, ආවසථ, පදීපෙය්‍යාදයක, අණ්ඩජසූත්‍ර දශක ය.

අන්න, පාන, වත්ථ, යාන, මාලා, ගන්ධ, විලෙපන, සෙය්‍යා, ආවසථ, පදීපෙය්‍යාදයක ජලාබුජ සූත්‍ර දශක ය,

අන්න, පාන, වත්ථ, යාන, මාලා, ගන්ධ, විලෙපන, සෙය්‍යා, ආවස්ථ, පදීපෙය්‍යාදයක සංසෙදජ සූත්‍ර දශක ය,

අන්න, පාන, වත්ථ, යාන, මාලා, ගන්ධ, විලෙපන, සෙය්‍යා, ආවසථ, පදීපෙය්‍යාදයක ඕපපාතික සූත්‍ර දශක යයි නාග වර්ගයෙහි සූත්‍ර පනසෙකි.

නාග සංයුත්තය නිමියේ යි.

# 9. සුපණ්ණ සංයුත්තං

## 1. සුපණ්ණවග්ගො

### 9. 1. 1.

### සුද්ධික සුත්තං

392. සාවත්ථියං :

චතස්සො ඉමා භික්ඛවෙ, සුපණ්ණයොනියො, කතමා චතස්සො : අණ්ඩජා සුපණ්ණා ජලාබුජා සුපණ්ණා සංසෙදජා සුපණ්ණා ඔපපාතිකා සුපණ්ණා. ඉමා ඛො භික්ඛවෙ, චතස්සො සුපණ්ණයොනියොති.

### 9. 1. 2.

### හරන්ති සුත්තං

393. සාවත්ථියං :

චතස්සො ඉමා භික්ඛවෙ, සුපණ්ණයොනියො. කතමා චතස්සො : අණ්ඩජා සුපණ්ණා ජලාබුජා සුපණ්ණා සංසෙදජා සුපණ්ණා ඔපපාතිකා සුපණ්ණා.

තත්‍ර භික්ඛවෙ, අණ්ඩජා සුපණ්ණා අණ්ඩජෙ නාගෙ හරන්ති. න ජලාබුජෙ න සංසෙදජෙ න ඔපපාතිකෙ.

තත්‍ර භික්ඛවෙ, ජලාබුජා සුපණ්ණා අණ්ඩජෙ ච ජලාබුජෙ ච නාගෙ හරන්ති. න සංසෙදජෙ, න ඔපපාතිකෙ.

තත්‍ර භික්ඛවෙ, සංසෙදජා සුපණ්ණා අණ්ඩජෙ ච ජලාබුජෙ ච සංසෙදජෙ ච නාගෙ හරන්ති. න ඔපපාතිකෙ.

තත්‍ර භික්ඛවෙ, ඔපපාතිකා සුපණ්ණා අණ්ඩජෙ ච ජලාබුජෙ ච සංසෙදජෙ ච ඔපපාතිකෙ ච නාගෙ හරන්ති. ඉමා ඛො භික්ඛවෙ, චතස්සො සුපණ්ණයොනියොති.

### 9. 1. 3.

### ද්වයකාරී සුත්තං

394. සාවත්ථියං :

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච, කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙනමිධෙකච්චෙ කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජන්තීති.



Free Distribution www.aathaapi.org

# 9. සුපණ්ණ සංයුත්තය

## 1. සුපණ්ණ වර්ගය

### 9. 1. 1.

### සුද්ධික සූත්‍රය

**392. සැවැත්නුවර :**

මහණෙනි, මේ ගුරුළු යෝනි සතරෙකි. කවර සතරෙකැ යත් : අණ්ඩජ ගුරුළෝ යැ, ජලාබුජ ගුරුළෝ යැ, සංසේදජ ගුරුළෝ යැ, ඔපපාතික ගුරුළෝ ය යි. මහණෙනි, මොහු සිවු ගුරුළු යෝනීහු යි.

### 9. 1. 2.

### හරන්ති සූත්‍රය

**393. සැවැත්නුවර :**

මහණෙනි, මේ ගුරුළු යොනි සතරෙකි. කවර සතරෙකැ යත් : අණ්ඩජ ගුරුළෝ යැ, ජලාබුජ ගුරුළෝ යැ, සංසේදජ ගුරුළෝ යැ, ඔපපාතික ගුරුළෝ යයි.

මහණෙනි, ඔවුනතුරෙහි අණ්ඩජ ගුරුළෝ අණ්ඩජ නාගයන් හැරගනිත්. ජලාබුජ නාගයන් නො හැරගනිති. සංසේදජ නාගයන් නො හැර ගනිති. ඕපපාතික නාගයන් නො හැර ගනිත්.

මහණෙනි, ඔවුනතුරෙහි ජලාබුජ ගුරුළෝ අණ්ඩජ නාගයන් ද, ජලාබුජ නාගයන් ද හැරගනිත්. සංසේදජ නාගයන් නො හැරගනිති ඔපපාතික නාගයන් නො හැර ගනිත්.

මහණෙනි, ඔවුනතුරෙහි සංසේදජ ගුරුළෝ අණ්ඩජ නාගයන් ද, ජලාබුජ නාගයන් ද, සංසේදජ නාගයන් ද හැරගනිති. ඔපපාතික නාගයන් නො හැරගනිත්.

මහණෙනි, ඔවුනතුරෙහි ඔපපාතික ගුරුළෝ අණ්ඩජ නාගයන් ද, ජලාබුජ නාගයන් ද, සංසේදජ නාගයන් ද ඔපපාතික නාගයන් ද හැරගනිත්, මහණෙනි, මොහු සිවු ගුරුළු යෝනීහු යි.

### 9. 1. 3.

### ද්වයකාරී සූත්‍රය

**394. සැවැත්නුවර :**

එ කල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ යැ. එළැඹැ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් වැ හුන්නේ යැ. එකත්පස් වැ හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කෙලෙ යැ. වහන්ස, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු අණ්ඩජ ගුරුළුන්ගේ සහභාවයට පැමිණේ නම් එ කවර හෙයිනැ, කවර ප්‍රත්‍යයෙනැ යත් :



Free Distribution www.aathaapi.org

ඉධ භික්ඛු, එකච්චො කායෙන ද්වයකාරී හොති, වාචාය ද්වයකාරී මනසා ද්වයකාරී. තස්ස සුතං හොති: "අණ්ඩජා සුපණ්ණා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා"ති. තස්ස එවං හොති: "අහො වතාහං කායස්සභෙදා පරම්මරණා අණ්ඩජානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය"න්ති. සො කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජතීති.

## 9. 1. 4—6.

### දුතිය, තතිය, චතුත්ථ ද්වයකාරී සුත්තානි

**395 - 397. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙනමිධෙකච්චො කායස්සභෙදා පරම්මරණා ජලාබුජානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජති -පෙ- සංසෙදජානං සුපණ්ණානං -පෙ- ඔපපාතිකානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු, එකච්චො කායෙන ද්වයකාරී හොති වාචාය ද්වයකාරී මනසා ද්වයකාරී. තස්ස සුතං හොති "ඔපපාතිකා සුපණ්ණා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා"ති. තස්ස එවං හොති: "අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය"න්ති. සො කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජති. අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජතීති.

## 9. 1. 7.

### අන්නදායක අණ්ඩජ සුත්තං

**398. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො, යෙනමිධෙකච්චො, කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු එකච්චො කායෙන ද්වයකාරී හොති වාචාය ද්වයකාරී මනසා ද්වයකාරී, තස්ස සුතං හොති: "අණ්ඩජා සුපණ්ණා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා"ති තස්ස එවං හොති: "අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය"න්ති. සො අන්නං දෙති -පෙ- උපපජ්ජතීති.

Free Distribution www.aathaapi.org

මහණෙ, මෙලොවැ එකෙක් කයින් දෙකක් කරනසුලු වදනින් දෙකක් කරනසුලු, සිතින් දෙකක් කරනසුලු වෙයි. ඔහු විසින් '' අණ්ඩජ ගුරුළෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුවබහුලහ''යි අසන ලද්දේත් වෙයි, (එහෙයින්) ඔහුට මෙ බඳු සිතෙක් වේ : '' මම කාබුන් මරණින් මතු අණ්ඩජ ගුරුළුන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනැවැ''යි. හෙ කාබුන් මරණින් මතු අණ්ඩජ ගුරුළුන්ගේ සහභාවයට පැමිණේ.

මහණෙ, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු අණ්ඩජ ගුරුළුන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හෙතු යැ, මේ ප්‍රත්‍යයැ යි වදළ සේක.

## 9. 1. 4—6.

## දුතිය, තතිය, චතුත්ථ ද්වයකාරි සූත්‍ර

**395-397. සැවැත්නුවර :**

එකත්පස් වැ හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ යැ, වහන්ස, යම් හෙයෙකින් මෙලොව එකෙක් කාබුන් මරණින් මතු ජලාබුජ සුපර්ණයන්ගේ සහභාවයට පැමිණේ නම්. . . . සංසේදජ සුපර්ණයන්ගේ. . . . ඕපපාතික සුපර්ණයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට හේතු කවරැ, ප්‍රත්‍යය කවරැ යත් :

මහණෙ, මෙලොව එකෙක් කයින් දෙකක් කරනසුලු, වදනින් දෙකක් කරනසුලු, සිතින් දෙකක් කරනසුලු වෙයි. ඔහු විසින් '' ඕපපාතික සුපර්ණයෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුවබහුලහ '' යි අසන ලද්දේත් වෙයි, (එහෙයින්) ඔහුට මෙ බඳු සිතෙක් වේ, '' මම කාබුන් මරණින් මතු ඕපපාතික සුපර්ණයන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනැවැ '' යි. හේ කාබුන් මරණින් මතු ඕපපාතික සුපර්ණයන්ගේ සහභාවයට පැමිණේ.

මහණෙ, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු ඕපපාතික සුපර්ණයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යැ මෙ ප්‍රත්‍යය යි වදළ සේකි.

## 9. 1. 7.

## අන්නදායක අණ්ඩජ සූත්‍රය

**398. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ඒ මහණ, භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ යැ ; වහන්ස, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු අණ්ඩජ සුපර්ණයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට හේතු කවරැ, ප්‍රත්‍යය කවරැ යත් :

මහණෙ, මෙහි එකෙක් කයින් දෙකක් කරනසුලු, වදනින් දෙකක් කරනසුලු, සිතින් දෙකක් කරන සුලු වෙයි. ඔහු විසින් '' අණ්ඩජ සුපර්ණයෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුවබහුලහ '' යි අසන ලද්දේත් වෙයි, (එහෙයින්) ඔහුට මෙ බඳු සිතෙක් වෙයි; '' මම කාබුන් මරණින් මතු අණ්ඩජ සුපර්ණයන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනැවැ''යි. හේ අහර දෙයි . . . .

9. 1. 8.

පානදයක අණ්ඩජ සුත්තං

399. -පෙ- පානං දෙති -පෙ- උපපජ්ජන්තීති

9. 1. 9.

වත්ථදයක අණ්ඩජ සුත්තං

400. -පෙ- වත්ථං දෙති -පෙ- උපපජ්ජන්තීති.

9. 1. 10.

යානදයක අණ්ඩජ සුත්තං

401. -පෙ- යානං දෙති -පෙ- උපපජ්ජන්තීති.

9. 1. 11.

මාලාදයක අණ්ඩජ සුත්තං

402. -පෙ- මාලං දෙති -පෙ- උපපජ්ජන්තීති.

9. 1. 12.

ගන්ධදයක අණ්ඩජ සුත්තං

403. -පෙ- ගන්ධං දෙති -පෙ- උපපජ්ජන්තීති.

9. 1. 13.

විලෙපනදයක අණ්ඩජ සුත්තං

404. -පෙ- විලෙපනං දෙති -පෙ- උපපජ්ජන්තීති.

9. 1. 14.

සෙය්‍යාදයක අණ්ඩජ සුත්තං

405. -පෙ- සෙය්‍යං දෙති -පෙ- උපපජ්ජන්තීති.

9. 1. 15.

ආවසථදයක අණ්ඩජ සුත්තං

406. -පෙ- ආවසථං දෙති -පෙ- උපපජ්ජන්තීති.

Free Distribution www.aathaapi.org

## 9. 1. 8.

### පානදයක අණ්ඩජ සූත්‍රය

399. ... බොන දෑ දෙයි ... පැමිණේ.

## 9. 1. 9.

### වත්ථදයක අණ්ඩජ සූත්‍රය

400. ... වස්ත්‍ර දෙයි ... පැමිණේ.

## 9. 1. 10.

### යානදයක අණ්ඩජ සූත්‍රය

401. ... වහන් දෙයි ... පැමිණේ.

## 9. 1. 11.

### මාලාදයක අණ්ඩජ සූත්‍රය

402. ... මල් දෙයි. ... පැමිණේ.

## 9. 1. 12.

### ගන්ධදයක අණ්ඩජ සූත්‍රය

403. ... ගඳ දෙයි ... පැමිණේ.

## 9. 1. 13.

### විලේපනදයක අණ්ඩජ සූත්‍රය

404. ... විලෙවුන් දෙයි ... පැමිණේ.

## 9. 1. 14.

### සෙය්‍යාදයක අණ්ඩජ සූත්‍රය

405. ... සයනසුන් දෙයි ... පැමිණේ.

## 9. 1. 15.

### ආවසථදයක අණ්ඩජ සූත්‍රය

406. ... වෙසෙන තැන් දෙයි ... පැමිණේ.

## 9. 1. 16.

### පදීපෙය්‍යදායක අණ්ඩජ සුත්තං

**407.** -පෙ- පදීපෙය්‍යං දෙති. සො කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා අණ්ඩජානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජතීති.

## 9. 1. 17—36.

### අන්නදායකාදිජලාබුජ සංසෙදජ සුත්තානි

**408 – 427.** සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා ජලාබුජානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජතීති -පෙ- සංසෙදජානං සුපණ්ණානං -පෙ- උපපජ්ජති.

## 9. 1. 37.

### අන්නදායක ඔපපාතික සුත්තං

**428.** -පෙ- ඔපපාතිකානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජතී''ති.

ඉධ භික්ඛු එකච්චො කායෙන ද්වයකාරී හොති වාචාය ද්වයකාරී මනසා ද්වයකාරී, තස්ස සුතං හොති: ''ඔපපාතිකා සුපණ්ණා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා''ති. තස්ස එවං හොති: ''අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය''න්ති. සො අන්නං දෙති -පෙ- උපපජ්ජතීති.

## 9. 1. 38.

### පානදායක ඔපපාතික සුත්තං

**429.** -පෙ- පානං දෙති -පෙ- උපපජ්ජතීති.

## 9. 1. 39.

### වත්ථදායක ඔපපාතික සුත්තං

**430.** -පෙ- වත්ථං දෙති -පෙ- උපපජ්ජතීති.

## 9. 1. 40.

### යානදායක ඔපපාතික සුත්තං

**431.** -පෙ- යානං දෙති -පෙ- උපපජ්ජතීති

## 9. 1. 16.

### පදීපෙය්‍යාදයක අණ්ඩජ සූත්‍රය

407. . . . පහන් උපකරණ දෙයි. හෙ කාබුන් මරණින් මතු අණ්ඩජ සුපර්ණයන්ගේ සහභාවයට පැමිණේ.

මහණ, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු අණ්ඩජ සුපර්ණයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

## 9. 1. 17—36.

### අන්නදයකාදි ජලාබුජ සංසේදජ සූත්‍ර

408–427. සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ යැ. වහන්ස, යම් හෙයකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු ජලාබුජ සුපර්ණයන්ගේ සහභාවයට පැමිණේ නම් එයට කිමෙක් හේතු ද කිමෙක් ප්‍රත්‍යය දැ යි. . . . සංසේදජ සුපර්ණයන්ගේ . . . පැමිණේ.

## 9. 1. 37.

### අන්නදයක ඖපපාතික සූත්‍රය

428. . . . ඖපපාතික සුපර්ණයන්ගේ සහභාවයට පැමිණේ නම් . . .

මහණ මෙහි එකෙක් කයින් දෙකක් කරනසුලු, වදනින් දෙකක් කරනසුලු, සිතින් දෙකක් කරන සුලු වෙයි. ඔහු විසින් '' ඖපපාතික සුපර්ණයෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුවබහුලහ '' යි අසන ලද්දේත් වෙයි, (එහෙයින්) ඔහුට මෙ බඳු සිතෙක් වෙයි : '' මම කාබුන් මරණින් මතු ඖපපාතික සුපර්ණයන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනවැ''යි. හෙ අහර දෙයි . . .

## 9. 1. 38.

### පානදයක ඖපපාතික සූත්‍රය

429. . . . බොන දැ දෙයි . . .

## 9. 1. 39.

### වත්ථදයක ඖපපාතික සූත්‍රය

430. . . . වස්ත්‍ර දෙයි . . .

## 9. 1. 40.

### යානදයක ඖපපාතික සූත්‍රය

431. . . . වහන් දෙයි . . .

### 9. 1. 41.

### මාලාදායක ඔපපාතික සුත්තං

432. -පෙ- මාලං දෙති -පෙ- උපපජ්ජන්තීති.

### 9. 1. 42.

### ගන්ධදායක ඔපපාතික සුත්තං

433. ගන්ධං දෙති -පෙ- උපපජ්ජන්තීති.

### 9. 1. 43.

### විලෙපනදායක ඔපපාතික සුත්තං

434. -පෙ- විලෙපනං දෙති -පෙ- උපපජ්ජන්තීති.

### 9. 1. 44.

### සෙය්‍යාදායක ඔපපාතික සුත්තං

435. සෙය්‍යං දෙති -පෙ- උපපජ්ජන්තීති.

### 9. 1. 45.

### ආවසථදායක ඔපපාතික සුත්තං

436. -පෙ- ආවසථං දෙති -පෙ- උපපජ්ජන්තීති.

### 9. 1. 46.

### පදීපෙය්‍යදායක ඔපපාතික සුත්තං

437. පදීපෙය්‍යං දෙති, සො කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා ඔපපාතිකානං සුපණ්ණානං සහබ්‍යතං උපපජ්ජතී''ති.

(එවං පිණ්ඩකෙන ඡචත්තාලීසං සුත්තන්තා හොන්ති.)

සුපණ්ණවග්ගො පඨමො.

තත්‍රුද්දානං :

සුද්ධකං හරන්ති චෙව ද්වයකාරි චතුරො ච,
දානූපකාරා චත්තාරි සුපණ්ණෙ ඡ චත්තාලීසාති.

සුපණ්ණසංයුත්තං සමත්තං.

## 9. 1. 41

### මාලාදයක ඕපපාතික සූත්‍රය

432. ... මල් දෙයි ...

## 9. 1. 42

### ගන්ධදයක ඕපපාතික සූත්‍රය

433. ... ගඳ දෙයි ...

## 9. 1. 43

### විලේපනදයක ඕපපාතික සූත්‍රය

434. ... විලෙවුන් දෙයි ...

## 9. 1. 44

### සෙය්‍යාදයක ඕපපාතික සූත්‍රය

435. ... සෙනසුන් දෙයි ...

## 9. 1. 45

### ආවසථදයක ඕපපාතික සූත්‍රය

436. ... වෙසෙන තැන් දෙයි ...

## 9. 1. 46

### පදීපෙය්‍යාදයක ඕපපාතික සූත්‍රය

437. ... පහන් උපකරණ දෙයි, හෙ කාබුන් මරණින් මතු ඕපපාතික සුපර්ණයන්ගේ සභාවයට පැමිණේ.

මහණ, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු ඕපපාතික සුපර්ණයන්ගේ සභාවයට පැමිණේ නම් එයට මේ හෙතු යි, මේ ප්‍රත්‍යය යි, (මෙයේ පිඩු කිරීමෙන් සසාළිස් සූත්‍ර කෙතෙක් වෙත්.)

පළමුවැනි සුපර්ණවර්ග යි.

**එහි සූත්‍රනාම මාලාව :**

සුද්ධික සූත්‍රය ද, හරන්ති සූත්‍රය ද, ද්වයකාරී සූත්‍ර සතර ද දානූපකාර සූත්‍ර දසක සතර දැයි සුපණ්ණ වර්ගයෙහි සූත්‍ර සසාළිසෙකි.

සුපණ්ණ සංයුත්තය නිමියේ යි.

# 10. ගන්ධබ්බකාය සංයුත්තං

## 1. ගන්ධබ්බවග්ගො

### 10. 1. 1.

### සුද්ධික සුත්තං

**438. සාවත්ථියං :**

ගන්ධබ්බකායිකෙ වො භික්ඛවෙ, දෙවෙ දෙසිස්සාමි, තං සුණාථ.

කතමෙ ච භික්ඛවෙ, ගන්ධබ්බකායිකා දෙවා? සන්ති භික්ඛවෙ, මූලගන්ධෙ අධිවත්ථා දෙවා, සන්ති භික්ඛවෙ, සාරගන්ධෙ අධිවත්ථා දෙවා, සන්ති භික්ඛවෙ, ඵෙග්ගුගන්ධෙ අධිවත්ථා දෙවා, සන්ති භික්ඛවෙ තචගන්ධෙ අධිවත්ථා දෙවා, සන්ති භික්ඛවෙ, පපටිකාගන්ධෙ[1] අධිවත්ථා දෙවා, සන්ති භික්ඛවෙ, පත්තගන්ධෙ අධිවත්ථා දෙවා, සන්ති භික්ඛවෙ, පුප්ඵගන්ධෙ අධිවත්ථා දෙවා, සන්ති භික්ඛවෙ, ඵලගන්ධෙ අධිවත්ථා දෙවා, සන්ති භික්ඛවෙ, රසගන්ධෙ අධිවත්ථා දෙවා, සන්ති භික්ඛවෙ, ගන්ධගන්ධෙ අධිවත්ථා දෙවා. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, ගන්ධබ්බකායිකා දෙවාති.

### 10. 1. 2.

### සුචරිත සුත්තං

**439. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ, හෙතු, කො පච්චයො, යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා ගන්ධබ්බකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු, එකච්චො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති, තස්ස සුතං හොති : ''ගන්ධබ්බකායිකා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා''ති. තස්ස එවං හොති : ''අහො වතාහං කායස්සභෙදා පරම්මරණා ගන්ධබ්බකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය''න්ති. සො කායස්ස භෙදා පරම්මරණා ගන්ධබ්බකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙන මිධෙකච්චො කායස්සභෙදා පරම්මරණා ගන්ධබ්බකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති.

---

1. පපටිකගන්ධෙ - මජසං සයා, PTS.



Free Distribution www.aathaapi.org

# 10. ගන්ධබ්බකාය සංයුත්තය

## ගන්ධබ්බ වර්ගය

### 10. 1. 1

### සුද්ධික සූත්‍රය

**438.** සැවැත්නුවර :

මහණෙනි, තොපට ගන්ධබ්බකායික (ගඳට අරක් ගත්) දෙවියන් දේශනා කරන්නෙමි. එය අසවු,

මහණෙනි, ගන්ධබ්බකායික දෙවියෝ කවරහු ද යත් : මහණෙනි මුල්ගඳෙහි අරක්ගත් දෙවියෝ ඇතියහ, හරගඳෙහි අරක්ගත් දෙවියෝ ඇතියහ, ඵලගඳෙහි අරග්ගත් දෙවියෝ ඇතියහ, සිවිගඳෙහි අරග්ගත් දෙවියෝ ඇතියහ, පොතුගඳෙහි අරග්ගත් දෙවියෝ ඇතියහ, පත්ගඳෙහි අරග්ගත් දෙවියෝ ඇතියහ, මල්ගඳෙහි අරග්ගත් දෙවියෝ ඇතියහ, පලගඳෙහි අරග්ගත් දෙවියෝ ඇතියහ, රසගඳෙහි අරග්ගත් දෙවියෝ ඇකියහ, ගඳ ගඳෙහි අරග්ගත් දෙවියෝ ඇතියහ. මහණෙනි, මොහු ගන්ධබ්බකායික දෙවියෝ ය යි කියනු ලැබෙත්.

### 10. 1. 2

### සුචරිත සූත්‍රය

**439.** සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ යැ : වහන්ස, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු ගන්ධබ්බකායික දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට කිමෙක් හෙතු ද, කිමෙක් ප්‍රත්‍යය දූ යි.

මහණ, මෙහි එකෙක් කයින් සුසිරිත් කෙරෙයි, වදනින් සුසිරිත් කෙරෙයි, මනසින් සුසිරිත් කෙරෙයි. ඔහු විසින් '' ගන්ධබ්බකායික දෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ ''යි අසන ලද්දේත් වෙයි. (එහෙයින්) ඔහුට මෙ බඳු සිතෙක් වෙයි ; '' මම කාබුන් මරණින් මතු ගන්ධබ්බකායික දෙවියන්ගේ සහභාවයට පැමිණෙන්නෙම නම් ඉතා මැනැවැ '' යි, හේ කාබුන් මරණින් මතු ගන්ධබ්බකායික දෙවියන්ගේ සහභාවයට පැමිණේ.

මහණ, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු ගන්ධබ්බකායික දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යි, මෙ ප්‍රත්‍යය යි.



Free Distribution www.aathaapi.org

## 10. 1. 3.

### මූලගන්ධ සුත්තං

**440. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ, හෙතු, කො පච්චයො, යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා මූලගන්ධෙ අධිවත්ථානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු, එකච්චො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති, තස්ස සුතං හොති : "මූලගන්ධෙ අධිවත්ථා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා"ති. තස්ස එවං හොති : "අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා මූලගන්ධෙ අධිවත්ථානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය"න්ති. සො දත්වා හොති මූලගන්ධානං. සො කායස්ස භෙදා පරම්මරණා මූලගන්ධෙ අධිවත්ථානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා මූලගන්ධෙ අධිවත්ථානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති.

## 10. 1. 4—12

### සාරගන්ධාදි සුත්තානි

**441 – 449. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො, යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා සාරගන්ධෙ අධිවත්ථානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු එකච්චො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති, තස්ස සුතං හොති : "සාරගන්ධෙ අධිවත්ථා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා"ති. තස්ස එවං හොති : "අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා සාරගන්ධෙ අධිවත්ථානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය"න්ති. සො දත්වා හොති සාරගන්ධානං -පෙ- සො දත්වා හොති ඵෙග්ගුගන්ධානං -පෙ- සො දත්වා හොති තචගන්ධානං -පෙ- සො දත්වා හොති පපටිකගන්ධානං -පෙ- සො දත්වා හොති පත්තගන්ධානං -පෙ- සො දත්වා හොති පුප්ඵගන්ධානං -පෙ- සො දත්වා හොති ඵලගන්ධානං -පෙ- සො දත්වා හොති රසගන්ධානං -පෙ- සො දත්වා හොති ගන්ධගන්ධානං. සො කායස්ස භෙදා පරම්මරණා ගන්ධගන්ධෙ අධිවත්ථානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු, අයං පච්චයො යෙනමිධෙකච්චො, කායස්ස භෙදා පරම්මරණා ගන්ධගන්ධෙ අධිවත්ථානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති.

## 10. 1. 3
## මූලගන්ධ සූත්‍රය

**440.** සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල සැල කෙළේ යැ : වහන්ස, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු මුල්ගඳෙහි අරග්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට කිමෙක් හේතු ද, කිමෙක් ප්‍රත්‍යය ද යි.

මහණ, මෙහි එකෙක් කයින් සුසිරිත් කෙරෙයි, වදනින් සුසිරිත් කෙරෙයි, මනයින් සුසිරිත් කෙරෙයි, "මුල්ගඳෙහි අරග්ගත් දෙවියෝ" දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ" යි ඔහු විසින් අසන ලද්දේත් වෙයි, (එහෙයින්) ඔහුට මෙ බඳු සිතෙක් වේ; "මම කාබුන් මරණින් මතු මුල්ගඳෙහි අරග්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනවැ" යි. හෙ මුල්ගඳ (පරිත්‍යාග වශයෙන්) දෙන්නේ වේ. හෙ කාබුන් මරණින් මතු මුල්ගඳෙහි අරග්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණේ.

මහණ, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු මුල්ගඳෙහි අරග්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

## 10. 1. 4-12
## සාරගන්ධාදි සූත්‍ර

**441-449.** සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙතෙල සැල කෙළේ යැ : වහන්ස, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු හරගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට කිමෙක් හෙතු ද, කිමෙක් ප්‍රත්‍යය ද යි.

මහණ, මෙහි එකෙක් කයින් සුසිරිත් කෙරෙයි, වදනින් සුසිරිත් කෙරෙයි, සිතින් සුසිරිත් කෙරෙයි. "හරගඳෙහි අරක්ගත් දෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ" යි ඔහු විසින් අසන ලද්දේත් වෙයි. (එහෙයින්) ඔහුට "මම කාබුන් මරණින් මතු හරගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනවැ"යි මෙ බඳු සිතෙක් වෙයි. හේ හරගඳ දෙන්නේ වේ. . . . හේ එලගඳ දෙන්නේ වේ . . . හේ සිවිගඳ දෙන්නේ වේ. . . .හේ පොතුගඳ දෙන්නේ වේ. . . . හේ පත්ගඳ දෙන්නේ වේ. . . . හේ මල් දෙන්නේ වේ. . . . හේ පලගඳ දෙන්නේ වේ. . . . හේ රසගඳ දෙන්නේ වේ . . . හේ ගඳගඳ දෙන්නේ වේ. හේ කාබුන් මරණින් මතු ගඳගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි.

මහණ, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු ගඳගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යි මේ ප්‍රත්‍යය යි.

## 10. 1. 13—22

### අන්නදනාදි මූලගන්ධ සුත්තානි

**450 - 459. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ හෙතු, කො පච්චයො, යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා මූලගන්ධෙ අධිවත්ථානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු එකච්චො කායෙන සුචරිතං චරති. වාචාය සුචරිතං චරති. මනසා සුචරිතං චරති. තස්ස සුතං හොති : “මූලගන්ධෙ අධිවත්ථා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා”ති’.

තස්ස එවං හොති : “අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා මූලගන්ධෙ අධිවත්ථානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය”න්ති. සො අන්නං දෙති. -පෙ- සො පානං දෙති. -පෙ- සො වත්ථං දෙති. -පෙ- සො යානං දෙති. -පෙ- සො මාලං දෙති. -පෙ- සො ගන්ධං දෙති. -පෙ-. සො විලෙපනං දෙති. -පෙ-, සො සෙය්‍යං දෙති. -පෙ- සො ආවසථං දෙති. -පෙ- සො පදීපෙය්‍යං දෙති. සො කායස්ස භෙදා පරම්මරණා මූලගන්ධෙ අධිවත්ථානං දෙවානං සහව්‍යතං උපපජ්ජති

අයං ඛො භික්ඛු හෙතු, අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා මූලගන්ධෙ අධිවත්ථානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති.

## 10. 1. 23—112.

### අන්නදනාදි සාරගන්ධාදි සුත්තානි

**460 - 549. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ, හෙතු, කො පච්චයො, යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා සාරගන්ධෙ අධිවත්ථානං දෙවානං සහව්‍යතං උපපජ්ජති. -පෙ- ඵෙග්ගුගන්ධෙ අධිවත්ථානං දෙවානං -පෙ- තචගන්ධෙ අධිවත්ථානං දෙවානං -පෙ- පපටිකාගන්ධෙ අධිවත්ථානං දෙවානං -පෙ- පත්තගන්ධෙ අධිවත්ථානං දෙවානං -පෙ- පුප්ඵගන්ධෙ අධිවත්ථානං දෙවානං -පෙ- ඵලගන්ධෙ අධිවත්ථානං දෙවානං -පෙ- රසගන්ධෙ අධිවත්ථානං දෙවානං -පෙ- ගන්ධගන්ධෙ අධිවත්ථානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු, එකච්චො කායෙන සුචරිතං චරති වාචාය සුචරිතං චරති මනසා සුචරිතං චරති, තස්ස සුතං හොති : “ගන්ධගන්ධෙ අධිවත්ථා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා”ති. තස්ස එවං හොති. “අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ගන්ධගන්ධෙ

## 10. 1. 13–22
## අන්නදනාදි මූලගන්ධ සූත්‍ර

**450–459.** සැවැත්නුවර :

එකත්පස් වැ හුන් ඒ මහණ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ යැ: ''වහන්ස, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු මුල්ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට කිමෙක් හේතු ද, කිමෙක් ප්‍රත්‍යය ද '' යි.

මහණ, මෙහි එකෙක් කයින් සුසිරිත් කෙරෙයි, වදනින් සුසිරිත් කෙරෙයි, මනසින් සුසිරිත් කෙරෙයි. මුල්ගඳෙහි අරක්ගත් දෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛ බහුලහ යි ඔහු විසින් අසන ලද්දේත් වේ'යි.

ඔහුට '' මම කාබුන් මරණින් මතු මුල්ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනවැ''යි මෙබඳු සිතෙක් වෙයි. හේ අහර දෙයි . . . හේ බොන දෑ දෙයි. . . . හේ වස්ත්‍ර දෙයි. . . . හේ වහන් (යාන) දෙයි. . . . හේ මල් දෙයි. . . . හේ ගඳ දෙයි. . . . හේ විලවුන් දෙයි. . . . හෙ සෙනසුන් දෙයි. . . . හේ වෙසෙන තැන් දෙයි. . . . හේ පහන් උපකරණ දෙයි. හේ කාබුන් මරණින් මතු මුල්ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි.

මහණ, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු මුල්ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතුව යි, මේ ප්‍රත්‍යය යි.

## 10. 1. 23–112
## අන්නදනාදි මූලගන්ධ සූත්‍ර

**460–549.** සැවැත්නුවර :

එකත්පස් ව හුන් මහණ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ යැ : '' වහන්ස, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු හරගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් . . . එල ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ . . . සිවි ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ . . . පොතු ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ . . . පත් ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ . . . මල් ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ . . . පල ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ . . . රස ගඳෙහි අරක් ගත් දෙවියන්ගේ . . . ගඳ ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට කිමෙක් හේතු ද කිමෙක් ප්‍රත්‍යය දැ යි.

මහණ, මෙහි එකෙක් කයින් සුසිරිත් කෙරෙයි, වදනින් සුසිරිත් කෙරෙයි, මනසින් සුසිරිත් කෙරෙයි, ඔහු විසින් '' ගඳ අරක්ගත් දෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ යි අසන ලද්දේත් වෙයි.

අධිවත්ථානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය''න්ති. සො අන්නං දෙති -පෙ- සො පානං දෙති -පෙ- සො වත්ථං දෙති -පෙ- සො යානං දෙති -පෙ- සො මාලං දෙති -පෙ- සො ගන්ධං දෙති -පෙ- සො විලෙපනං දෙති -පෙ- සො සෙය්‍යං දෙති -පෙ- සො ආවසථං දෙති -පෙ- සො පදීපෙය්‍යං දෙති සො කායස්ස භෙදා පරම්මරණා ගන්ධගන්ධෙ අධිවත්ථානං දෙවානං සහව්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු, අයං පච්චයො, යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා ගන්ධගන්ධෙ අධිවත්ථානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති.

(එවං පිණ්ඩකෙන එකසතඤ්ච බාරස ච සුත්තන්තා භවන්ති.)

ගන්ධබ්බවග්ගො පඨමො.

තස්සුද්දානං :

සුද්ධිකඤ්ච සුචරිතං දාතා හි අපරෙ දස,
දසුපකාරා දසධා ගන්ධබ්බෙකසතං ආවාදකාති.

ගන්ධබ්බකායසංයුත්තං සමත්තං.

(එහෙයින්) ඔහුට "මම කාබුන් මරණින් මතු ගඳ ගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණෙන්නෙම් නම් ඉතා මැනැව"යි මෙබඳු සිතෙක් වෙයි. හේ අහර දෙයි. . . . හේ බොන දැ දෙයි. . . . හේ වස්ත්‍ර දෙයි. . . . හේ වහන් (වාහන) දෙයි. . . . හේ මල් දෙයි . . . හේ ගඳ දෙයි . . . හේ විලවුන් දෙයි . . . හේ සෙනසුන් දෙයි. . . . හේ වාසස්ථාන දෙයි. . . . හේ පහන් උපකරණ දෙයි. හේ කාබුන් මරණින් මතු ගඳගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණෙයි.

මහණ, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු ගඳගඳෙහි අරක්ගත් දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

(මෙසේ පිඩුවශයෙන් එක්සිය දෙළසෙක් සූත්‍ර වෙයි.)

**පළමුවැනි ගන්ධබ්බ වර්ගයි.**

**එහි සූත්‍ර නාමාවලිය :**

සුද්ධික සූත්‍රය ද, සුචරිත සූත්‍රය ද, අනෙක් අන්නදයකාදි සූත්‍ර දශය ද, දශූපකාර සූත්‍ර දශක දශය ද යි ගන්ධබ්බ වර්ගයෙහි සූත්‍ර එක්සිය දෙළසෙකි.

**ගන්ධබ්බකාය සංයුක්තය නිමියේ ය.**

# 11. වලාහකසංයුත්තං

## 1. වලාහකවග්ගො

### 11. 1. 1.

### සුද්ධික සුත්තං

**550. සාවත්ථියං:**

වලාහකකායිකෙ වො භික්ඛවෙ, දෙවෙ දෙසිස්සාමි. තං සුණාථ.

කතමෙ ච භික්ඛවෙ, වලාහකකායිකා දෙවා: සන්ති භික්ඛවෙ, සීතවලාහකා දෙවා. සන්ති භික්ඛවෙ, උණ්හවලාහකා දෙවා. සන්ති භික්ඛවෙ, අබ්භවලාහකා දෙවා. සන්ති භික්ඛවෙ, වාතවලාහකා දෙවා. සන්ති භික්ඛවෙ, වස්සවලාහකා දෙවා. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, වලාහකකායිකා දෙවා.

### 11. 1. 2.

### සුචරිත සුත්තං

**551. සාවත්ථියං:**

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා වලාහකකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු, එකච්චො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති, තස්ස සුතං හොති: වලාහකකායිකා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා''ති. තස්ස එවං හොති: ''අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා වලාහකකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජෙය්‍ය''න්ති. සො කායස්ස භෙදා පරම්මරණා වලාහකකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා වලාහකකායිකානං දෙවානං සහබ්‍යතං උපපජ්ජතීති.



Free Distribution www.aathaapi.org

# 11. වලාහක සංයුත්තය

## 1. වලාහක වර්ගය

### 11. 1. 1
### සුද්ධික සූත්‍රය

**550.** සැවැත්නුවර :

මහණෙනි, තොපට වලාහක කායික (වලාහක නම් දේවනිකායෙහි උපන්) දෙවියන් දේශනා කරන්නෙමි. එය අසවු.

මහණෙනි, වලාහක කායික දෙවියෝ කවරහ යත් : මහණෙනි, ශීතවලාහක දෙවියෝ ඇතියහ, මහණෙනි, උෂ්ණවලාහක දෙවියෝ ඇතියහ, මහණෙනි, අබ්භවලාහක දෙවියෝ ඇතියහ, මහණෙනි, වාතවලාහක දෙවියෝ ඇතියහ, මහණෙනි, වස්සවලාහක දෙවියෝ ඇතියහ. මහණෙනි, මොහු වලාහකකායික දෙවියෝ යි කියනු ලැබෙති යි.

### 11. 1. 2
### සුචරිත සූත්‍රය

**551.** සැවැත්නුවර :

එ කල්හි එක්තරා මහණෙක්, භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. ... එකත් පස් ව හුන් ඒ මහණ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ යැ : '' වහන්ස, යම් හෙයෙකින් මෙලො වැ එකෙක් කාබුන් මරණින් මතු වලාහකකායික දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට කිමෙක් හේතු ද, කිමෙක් ප්‍රත්‍යය දැ යි.

මහණ, මෙලොවැ එකෙක් කයින් සුසිරිත් කෙරෙයි, වදනින් සුසිරිත් කෙරෙයි, මනසින් සුසිරිත් කෙරෙයි. වලාහක කායික දෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ යි ඔහු විසින් අසන ලද්දේත් වෙයි. (එහෙයින්) ඔහුට මම් කාබුන් මරණින් මතු වලාහක කායික දෙවියන්ගේ සහභාවයට පැමිණෙම් නම් යෙහෙකැ '' යි මෙ බඳු සිතෙක් වෙයි. හෙ කාබුන් මරණින් මතු වලාහකකායික දෙවියන්ගේ සහභාවයට පැමිණේ.

මහණ, යම් හෙයෙකින් මෙලොවැ එකෙක් කාබුන් මරණින් මතු වලාහකකායික දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මෙ හේතු යි, මෙ ප්‍රත්‍යය යි.



35—ඒ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

## 11. 1. 3—12

## අන්නදායකාදි සීතවලාහක සුත්තානි

**552 - 561. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා සීතවලාහකානං[1] දෙවානං සහව්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු එකච්චො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති, තස්ස සුතං හොති සීතවලාහකා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා''ති. තස්ස එවං හොති : ''අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා සීතවලාහකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය''න්ති. සො අන්නං දෙති -පෙ- සො පානං දෙති -පෙ- සො වත්ථං දෙති -පෙ- සො යානං දෙති -පෙ- සො මාලං දෙති -පෙ- සො ගන්ධං දෙති -පෙ- සො විලෙපනං දෙති -පෙ- සො සෙය්‍යං දෙති -පෙ- සො ආවසථං දෙති -පෙ- සො පදීපෙය්‍යං දෙති. සො කායස්ස භෙදා පරම්මරණා සීතවලාහකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා සීතවලාහකානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති.

## 11. 1. 13—52

## අන්නදායකාදි උණ්හවලාහකාදි සුත්තානි

**562 - 601. සාවත්ථියං :**

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : ''කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො, යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා උණ්හවලාහකානං දෙවානං -පෙ- අබ්භවලාහකානං දෙවානං -පෙ- වාතවලාහකානං දෙවානං -පෙ- වස්සවලාහකානං දෙවානං -පෙ- සහව්‍යතං උපපජ්ජතීති.

ඉධ භික්ඛු, එකච්චො කායෙන සුචරිතං චරති. වාචාය සුචරිතං චරති. මනසා සුචරිතං චරති, තස්ස සුතං හොති, වස්සවලාහකා දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලාති. තස්ස එවං හොති : ''අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා වස්සවලාහකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය''න්ති. සො අන්නං දෙති -පෙ- සො පානං දෙති -පෙ- සො වත්ථං දෙති -පෙ- සො යානං දෙති -පෙ- සො මාලං දෙති -පෙ- සො ගන්ධං දෙති -පෙ- සො විලෙපනං දෙති -පෙ- සො සෙය්‍යං දෙති -පෙ- සො ආවසථං දෙති -පෙ- සො පදීපෙය්‍යං දෙති, සො කායස්ස භෙදා පරම්මරණා වස්සවලාහකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති.

---

1. සීතවලාහකකායිකානං - සීමු.

## 11. 1. 3-12
## අන්නදයකාදි සීතවලාහක සූත්‍ර

**552-561.** සැවැත්නුවර :

එකත්පසෙක හුන් ඒ මහණ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ යැ : වහන්ස : යම් හෙයෙකින් මෙලොවැ එකෙක් කාබුන් මරණින් මතු සීතවලාහක දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට හේතු කිමෙක් ද, ප්‍රත්‍යය කිමෙක් දැ යි.

මහණ, මෙලොවැ එකෙක් කයින් සුසිරිත් කෙරෙයි, වචසින් සුසිරිත් කෙරෙයි, මනසින් සුසිරිත් කෙරෙයි. " සීතවලාහක දෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛබහුලහ යි. ඔහු විසින් අසන ලද්දේත් වෙයි. (එහෙයින්) ඔහුට මම් කාබුන් මරණින් මතු සීතවලාහක දෙවියන්ගේ සහභාවයට පැමිණෙම් නම් මැනැවැ"යි මෙ බඳු සිතෙක් වෙයි. හේ අහර දෙයි. . . . හේ බොන දැ දෙයි . . . හේ වස්ත්‍ර දෙයි. . . . හේ වහන් දෙයි. . . . හේ මල් දෙයි. . . . හේ ගඳ දෙයි. . . . හේ විලවුන් දෙයි. . . . හේ සෙනසුන් දෙයි. . . . හේ වෙසෙනතැන් දෙයි. . . . හේ පහන් උපකරණ දෙයි. හේ කාබුන් මරණින් මතු සීතවලාහක දෙවියන්ගේ සහභාවයට පැමිණේ.

මහණ, යම් හෙයෙකින් මෙලොවැ එකෙක් කාබුන් මරණින් මතු සීතවලාහක දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හේතු යි. මේ ප්‍රත්‍යය යි.

## 11. 1. 13-52
## අන්නදයකාදි උණ්හවලාහකාදි සූත්‍ර

**562-601.** සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේ යැ : වහන්ස, යම් හෙයෙකින් මෙහි එකෙක් කාබුන් මරණින් මතු උණ්හවලාහක දෙවියන්ගේ . . . අබ්භවලාහක දෙවියන්ගේ . . . වාතවලාහක දෙවියන්ගේ . . . වස්සවලාහක දෙවියන්ගේ . . . සහභාවයට පැමිණේ නම් එයට හේතු කිමෙක් ද, ප්‍රත්‍යය කිමෙක් දැ යි.

මහණ, මෙලොවැ එකෙක් කයින් සුසිරිත් කෙරෙයි, වචසින් සුසිරිත් කෙරෙයි, මනසින් සුසිරිත් කෙරෙයි. ඔහු විසින් " වස්සවලාහක දෙවියෝ දීර්ඝායුෂ්කයහ, වර්ණවත්හ, සුඛ බහුලහ"යි අසන ලද්දේත් වෙයි. ඔහුට : "මම් කාබුන් මරණින් මතු වස්සවලාහක දෙවියන්ගේ සහභාවයට පැමිණෙම් නම් යෙහෙකැ"යි මෙ බඳු සිතෙක් වෙයි. හේ අහර දෙයි. . . . හේ බොන දැ දෙයි. . . . හේ වස්ත්‍ර දෙයි. . . . හේ වහන් දෙයි. . . . හේ මල් දෙයි. . . . හේ ගඳ දෙයි. . . . හේ විලවුන් දෙයි. . . . හේ සෙනසුන් දෙයි. . . . හේ වෙසෙනතැන් දෙයි. . . . හේ පහන් උපකරණ දෙයි. හේ කාබුන් මරණින් මතු වස්සවලාහක දෙවියන්ගේ සහභාවයට පැමිණේ.

අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනමිධෙකච්චො කායස්ස භෙදා පරම්මරණා වස්සවලාහකානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති.

## 11. 1. 53.

### සීතවලාහක සුත්තං

**602.** සාවත්ථියං :

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ, , හෙතු කො පච්චයො යෙනෙකදා සීතං හොතීති.

සන්ති භික්ඛු, සීතවලාහකා නාම දෙවා. තෙසං යදා එවං හොති : 'යන්නූන මයං සකාය රතියා රමෙය්‍යාමා'ති'. තෙසං තං චෙතො-පණිධිමන්වාය සීතං හොති. අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනෙකදා සීතං හොතීති.

## 11. 1. 54.

### උණ්හවලාහක සුත්තං

**603.** සාවත්ථියං :

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො : යෙනෙකදා උණ්හං හොතීති.

සන්ති භික්ඛු, උණ්හවලාහකා නාම දෙවා. තෙසං එවං හොති : "යන්නූන මයං සකාය රතියා රමෙය්‍යාමා'ති." තෙසං තං චෙතො-පණිධිමන්වාය උණ්හං හොති. අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනෙකදා උණ්හං හොතීති.

## 11. 1. 55.

### අබ්භවලාහක සුත්තං

**604.** සාවත්ථියං :

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච : කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙනෙකදා අබ්භං හොතීති.

සන්ති භික්ඛු. අබ්භවලාහකා නාම දෙවා. තෙසං යදා එවං හොති ; යන්නූන මයං සකාය රතියා රමෙය්‍යාමා'ති." තෙසං තං චෙතො පණිධිමන්වාය අබ්භං හොති. අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනෙකදා අබ්භං හොතී''ති.

මහණෙ, යම් හෙයෙකින් මෙලොවැ එකෙක් කාබුත් මරණින් මතු වස්සවලාහක දෙවියන්ගේ සහභාවයට පැමිණේ නම් එයට මේ හෙතු යි, මේ ප්‍රත්‍යය යි.

## 11. 1. 53

## සීතවලාහක සූත්‍රය

**602.** සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කෙළේ යැ : වහන්ස, යම් හෙයෙකින් (සිහිල් කාලයෙහි හෝ ග්‍රීෂ්ම කාලයෙහි වූ) එක් කලෙක සිහිලක් වේ නම් එයට කිමෙක් හේතු ද කිමෙක් ප්‍රත්‍යය ද යි.

මහණ, ශීතවලාහක නම් දෙවියෝ ඇතියහ. ඔවුන්ට යම් කලෙක "අපි සිහිල් කම්සුවෙන් කෙළනමෝ නම් මැනැව"යි මෙබඳු සිතෙක් වේ ද, ඔවුන්ගේ ඒ සිත පිහිටුවීම අනු ව සිහිල වෙයි. මහණ, යම් හෙයෙකින් එක් කලෙක සිහිලෙක් වේ නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

## 11. 1. 54

## උණ්හවලාහක සූත්‍රය

**603.** සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කෙළේ යැ : වහන්ස, "යම් හෙයෙකින් එක් කලෙක (නියමකල්හි වන උණුසුමට වෙනස්) උණුසුමෙක් වේ නම් එයට කිමෙක් හේතු ද කිමෙක් ප්‍රත්‍යය ද"යි.

මහණ, උණ්හවලාහක නම් දෙව් කෙනෙක් ඇතියහ. ඔවුන්ට යම් කලෙක "අපි සිය කම්සුවෙන් කෙළනමෝ නම් මැනවැ යි මෙබඳු සිතෙක් වේ ද, ඔවුන්ගේ ඒ සිත පිහිටුවීම අනුව උණුසුම වේ. මහණ, යම් හෙයෙකින් එක් කලෙක උණුසුම වේ නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍ය ය"යි.

## 11. 1. 55

## අබ්භවලාහක සූත්‍රය

**604.** සැවැත්නුවර :

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කෙළේ යැ : වහන්ස, "යම් හෙයෙකින් එක්කලෙක (අනියම් වසයෙන්) වලාකුළු වේ නම් එයට කිමෙක් හෙතු ද කිමෙක් ප්‍රත්‍යය දැ"යි.

මහණ, අබ්භවලාහක නම් දෙව් කෙනෙක් ඇතියහ. ඔවුන්ට යම් කලෙක අපි සිය කම් සුවෙන් කෙළනමෝ නම් මැනවැ"යි මෙබඳු සිතෙක් වේ ද, ඔවුන්ගේ ඒ සිත් පිහිටුවීම අනුව වලාකුළු වෙයි. මහණ, යම් හෙයෙකින් (අනියම් වසයෙන් වලාකුළු වේ නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය'යි.

## 11. 1. 56.

### වාතවලාහක සුත්තං

605. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: "කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙනෙකදා වාතො හොතී"ති.

සන්ති භික්ඛු, වාතවලාහකා නාම දෙවා. තෙසං යදා එවං හොති: "යන්නූන මයං සකාය රතියා රමෙය්‍යාමා"ති. තෙසං තං චෙතො-පණිධිමන්වාය වාතො හොති. අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො යෙනෙකදා වාතො හොතීති.

## 11. 1. 57.

### වස්සවලාහක සුත්තං

606. සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: කො නු ඛො භන්තෙ, හෙතු කො පච්චයො යෙනෙකදා දෙවො වස්සතීති.

සන්ති භික්ඛු, වස්සවලාහකා නාම දෙවා. තෙසං යදා එවං හොති. 'යන්නූන මයං සකාය රතියා රමෙය්‍යාමාති.' තෙසං තං චෙතො-පණිධිමන්වාය දෙවො වස්සති. අයං ඛො භික්ඛු, හෙතු අයං පච්චයො, යෙනෙකදා දෙවො වස්සතීති.

වලාහකවග්ගො පඨමො.

(විත්ථාරෙන සත්තපඤ්ඤාස සුත්තන්තා භවන්ති.)

තස්සුද්දානං:

සුද්ධිකං සුචරිතඤ්ච දායකා දස පඤ්චකං,
සීතං උණ්හඤ්ච අබ්භඤ්ච වාත වස්සවලාහකාති.

වලාහකසංයුත්තං සමත්තං.

## 11. 1. 56

## වාතවලාහක සූත්‍රය

**605. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ යැ : වහන්ස, ''යම් හෙයෙකින් එක්කලෙක (විකෘති වශයෙන්) දැඩි සුළඟ වේ නම් එයට කිමෙක් හේතු ද, කිමෙක් ප්‍රත්‍යය දැ''යි.

මහණ, වාතවලාහක නම් දෙවි කෙනෙක් ඇතියහ. ඔවුන්ට යම් කලෙක ''අපි සිය කම්සුවෙන් කෙළනමෝ නම් මැනවැ''යි මෙබඳු සිතෙක් වෙයි. ඔවුන්ගේ ඒ සිත පිහිටුවීම අනුව දැඩි සුළං වේ. මහණ යම් හෙයෙකින් එක්කලෙක දැඩි සුළඟ වේ නම් එයට මේ හේතු යි. මේ ප්‍රත්‍යය යි.

## 11. 1. 57

## වස්සවලාහක සූත්‍රය

**606. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ යැ : වහන්ස, ''යම් හෙයෙකින් එක්කලෙක (නොකල්හි වන) වැසි වසී නම් එයට හේතු කිමෙක් ද ප්‍රත්‍යය කිමෙක් ''දැයි.

මහණ, වස්සවලාහක නම් දෙවි කෙනෙක් ඇතියක. ඔවුන්ට යම් කලෙක ''අපි සිය කම්සුවෙන් කෙළනමෝ නම් මැනවැ''යි මෙබඳු සිතෙක් වෙයි. ඔවුන්ගේ ඒ සිත පිහිටුවීම අනු ව නොකල් වැසි වසී. මහණ, යම් හෙයෙකින් එක්කලෙක නොකල් වැසි වසී නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

**පළමුවැනි වලාහක වර්ග යි.**

(විතර විසින් සූත්‍රාන්තයෝ සත්පනසෙක් වෙති.)

**එහි සූත්‍රනාමාවලිය :**

සුද්ධික සූත්‍රය ද, සුචරිත සූත්‍රය ද, අන්නදායකා දි දසක පස ද, සීතවලාහක, උණ්හ වලාහක, අබ්භවලාහක, වාතවලාහක, වස්සවලාහක සූත්‍රයෝ ද යි' සූත්‍ර සත්පනසෙකි.

**වලාහක සංයුක්තය නිමියේ යි.**

# 12. වච්ඡගොත්තසංයුත්තං

## වච්ඡගොත්තවග්ගො

### 12. 1. 1.

### රූප අඤ්ඤාණ සුත්තං

**607. සාවත්ථියං:**

අථ ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච:

කො නු ඛො භො ගොතම, හෙතු කො පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති. සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා, අන්තවා ලොකොති වා, අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

රූපෙ ඛො වච්ඡ, අඤ්ඤාණා රූපසමුදයෙ අඤ්ඤාණා රූපනිරොධෙ අඤ්ඤාණා රූපනිරොධගාමිනියා පටිපදය අඤ්ඤාණා එවිමානි[1] අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති. 'සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති. අයං ඛො වච්ඡ, හෙතු අයං පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති. 'සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා'ති

### 12. 1. 2.

### වෙදනා අඤ්ඤාණ සුත්තං

**608. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: කො නු ඛො භො ගොතම හෙතු කො පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති, සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

---

1. එවමානි - සීමු.



Free Distribution www.aathaapi.org

# 12. වච්ඡගොත්ත සංයුත්තය

## වච්ඡගොත්ත වර්ගය

### 12. 1. 1.

### රූප අඤ්ඤාණ සූත්‍රය

**607. සැවැත්නුවර :**

එකල්හි වච්ඡගොත්ත පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු වියැ. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත් පස් ව හුන්නේ යැ. එකත්පස් වැ හුන් වච්ඡගොත්ත පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කෙළේ යැ :

භවත් ගෞතමයන් වහන්ස, ''ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ, ලෝකය අන්තවත් ය යි හෝ, ලෝකය අනන්තවත් යයි හෝ, ජීවයත් එය යැ ශරීරයත් එය ය යි හෝ, ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැයි හෝ, සත්ත්වයා මරණින් මතු වේ ය යි හෝ, සත්ත්වයා මරණින් මතු නො වේ ය යි හෝ, සත්ත්වයා මරණින් මතු වෙයි නො ද වේ ය යි හෝ, සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නන් වැදෑරුම් වූ යම් මේ මිසදිටු කෙනෙක් ලොව උපදිත් නම් (එයට) හේතු කවරැ ප්‍රත්‍යය කවරැ''යි.

වච්ඡය, රූපයෙහි නො දැනීමෙන්, රූපසමුදයයෙහි නො දැනීමෙන් රූපනිරොධයෙහි නොදැනීමෙන්, රූපනිරොධගාමිනීපටිපදවෙහි නො දැනීමෙන් ''ලෝකය ශාශ්වත ය යි හෝ, ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ ''නන් වැදෑරුම් වූ මේ මිසදිටුහු මෙසේ ලොවැ උපදිත්. වච්ඡ, ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය'යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නන් වැදෑරුම් වූ යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

### 12. 1. 2

### වෙදනා අඤ්ඤාණ සූත්‍රය

**607. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් වච්ඡගොත්ත පිරිවැජිතෙමේ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ යැ : ''භවත් ගෞතමයන් වහන්ස ''ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නන් වැදෑරුම් වූ යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට කිමෙක් හේතු ද කිමෙක් ප්‍රත්‍යය ද''යි.



Free Distribution www.aathaapi.org

වේදනාය ඛො, වච්ඡ, අඤ්ඤාණා වේදනාසමුදයෙ අඤ්ඤාණා වේදනා-නිරොධෙ අඤ්ඤාණා වේදනානිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණා එවිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති

අයං ඛො, වච්ඡ, හෙතු, අයං පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

## 12. 1. 3.

### සඤ්ඤා අඤ්ඤාණ සුත්තං

**609.** සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: කො නු ඛො භො ගොතම, හෙතු කො පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකො'ති වා, අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

සඤ්ඤාය ඛො, වච්ඡ, අඤ්ඤාණා සඤ්ඤාසමුදයෙ අඤ්ඤාණා සඤ්ඤානිරොධෙ අඤ්ඤාණා සඤ්ඤානිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණා එවිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති. අයං ඛො, වච්ඡ, හෙතු, අයං පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

## 12. 1. 4.

### සඞ්ඛාර අඤ්ඤාණ සුත්තං

**610.** සාවත්ථියං:

එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: කො නු ඛො භො ගොතම හෙතු කො පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා, -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

සඞ්ඛාරෙසු ඛො වච්ඡ, අඤ්ඤාණා සඞ්ඛාරසමුදයෙ අඤ්ඤාණා සඞ්ඛාරනිරොධෙ අඤ්ඤාණා සඞ්ඛාරනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණා එවිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: "සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා -පෙ- නෙව

වච්ඡය, වේදනාව නො දැනීමෙන් වෙදනාසමුදය නො දැනීමෙන් වෙදනානිරොධය නො දැනීමෙන් වෙදනානිරොධගාමිනීපටිපදව නො දැනීමෙන් ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ යි හෝ නාන් වැදැරුම් වූ මෙසේ මේ මිසදිටුහු ලොව උපදිත්. වච්ඡය, ''ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය'යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වෙයි හෝ නාන් වැදැරුම් වූ යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට මේ හේතු යැ, මේ ප්‍රත්‍යය යි.

## 12. 1. 3

## සඤ්ඤ අඤ්ඤාණ සූත්‍රය

**609. සැවැත්නුවර :**

එකත්පස් වැ හුන් වච්ඡගොත්ත පිරිවැජි භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ යැ : භවත් ගෞතමයන් වහන්ස ''ලෝකය ශාශ්වත ය''යි හෝ ''ලෝකය අශාශ්වත ය''යි . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නාන් වැදැරුම් වූ යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට කිමෙක් හේතු ද කිමෙක් ප්‍රත්‍යය ද''යි.

වච්ඡය, සඤ්ඤාවෙහි නො දැනීමෙන්, සඤ්ඤාසමුදයෙහි නො දැනීමෙන් සඤ්ඤා නිරෝධයෙහි නො දැනීමෙන්, සඤ්ඤානිරෝධගාමිනීපටිපදවෙහි නො දැනීමෙන් ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නාන් වැදැරුම් මේ මිසදිටුහු මෙසේ ලොව උපදිත්.

වච්ඡ, ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නාන් වැදැරුම් යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට මේ හේතු යැ මේ ප්‍රත්‍යය යි.

## 12. 1. 4

## සංඛාර අඤ්ඤාණ සූත්‍රය

**610. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් වච්ඡගොත්ත පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙල සැල කෙළේ ය. භවත් ගෞතමයන් වහන්ස, ''ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නාන්වැදැරුම් යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට කිමෙක් හේතු ද කිමෙක් ප්‍රත්‍යය ද ''යි.

වච්ඡය, සඞ්ඛාරයන්හි නො දැනීමෙන්, සඞ්ඛාරසමුදයෙහි නො දැනීමෙන් සඞ්ඛාර නිරෝධයෙහි නොදැනීමෙන්, සඞ්ඛාරනිරොධගාමිනීපටිපදවෙහි නො දැනීමෙන් ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම

හොති න න හොති තථාගතො පරම්මරණාති වා'ති. අයං ඛො වච්ඡ, හෙතු අයං පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා'ති.

## 12. 1. 5.

### විඤ්ඤාණ අඤ්ඤාණ සුත්තං

**611. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: කො නු ඛො භො ගොතම, හෙතු කො පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා'ති.

විඤ්ඤාණෙ ඛො වච්ඡ, අඤ්ඤාණා විඤ්ඤාණසමුදයෙ අඤ්ඤාණා විඤ්ඤාණනිරොධෙ අඤ්ඤාණා විඤ්ඤාණනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණා එවිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා'ති. අයං ඛො වච්ඡ, හෙතු අයං පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා, -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා'ති.

## 12. 1. 6.

### රූප අදස්සන සුත්තං

**612. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: කො නු ඛො භො ගොතම, හෙතු කො පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා'ති.

රූපෙ ඛො වච්ඡ, අදස්සනා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා''ති -පෙ-

## 12. 1. 7.

### වෙදනා අදස්සන සුත්තං

**613. සාවත්ථියං:**

-පෙ- වෙදනාය ඛො වච්ඡ, අදස්සනා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා'ති.

වෙයි නො ම නො වේ ය යි හෝ නන්වැදෑරුම් මේ මිසදිටුහු මෙසේ ලොව උපදිත්, වච්ඡ, ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නන් වැදෑරුම් යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට මේ හේතු ය, මේ ප්‍රත්‍යය යි.

## 12. 1. 5

## විඤ්ඤාණ අඤ්ඤාණ සූත්‍රය

**611. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් වච්ඡගොත්ත පිරිවැජි තෙමෙ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය :

භගවත් ගෞතමයන් වහන්ස, ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත යයි හෝ නන් වැදෑරුම් යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට කිමෙක් හේතු ද කිමෙක් ප්‍රත්‍යය ද '' යි.

වච්ඡය, විඤ්ඤාණයෙහි නො දත්මෙන් විඤ්ඤාණ සමුදයෙහි නො දත්මෙන්, විඤ්ඤාණනිරෝධයෙහි නො දත්මෙන්, විඤ්ඤාණනිරොධගාමිනී පටිපදවෙහි නො දත්මෙන් ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි, නො ම නො වේ ය යි හෝ නන්වැදෑරුම් මේ මිසදිටුහු මෙසේ ලොව උපදිත්. වච්ඡ, ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ සත්ත්වයා මරණින් මතු නො ම වෙයි, නො ම නො වේ ය යි හෝ නන් වැදෑරුම් යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට මේ හෙතු යැ, මේ ප්‍රත්‍යය යි.

## 12. 1. 6

## රූප අදස්සන සූත්‍රය

**612. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් වච්ඡගොත්ත පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට තෙල සැල කෙළේ යැ : භවත් ගෞතමයන් වහන්ස, ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි, නොමැ නොවේ ය යි හෝ නන්වැදෑරුම් යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට හේතු කවරේ ද, ප්‍රත්‍යය කවරේ ද යි.

වච්ඡය, රූපයෙහි නො දක්මෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි, නො ම නො වේ යි හෝ . . .

## 12. 1. 7

## වෙදනා අදස්සන සූත්‍රය

**613. සැවැත්නුවර :**

. . . වච්ඡය, වෙදනාවෙහි නො දක්මෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි' නො ම නො වේ යි හෝ . . . යි.

## 12. 1. 8.

### සඤ්ඤා අදස්සන සුත්තං

**614. සාවත්ථියං:**

සඤ්ඤාය ඛො වච්ඡ, අදස්සනා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති -පෙ-.

## 12. 1. 9.

### සඞ්ඛාර අදස්සන සුත්තං

**615. සාවත්ථියං:**

සඞ්ඛාරෙසු ඛො වච්ඡ, අදස්සනා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති -පෙ-.

## 12. 1. 10.

### විඤ්ඤාණ අදස්සන සුත්තං

**616. සාවත්ථියං:**

විඤ්ඤාණෙ ඛො වච්ඡ, අදස්සනා විඤ්ඤාණසමුදයෙ අදස්සනා විඤ්ඤාණනිරොධෙ අදස්සනා විඤ්ඤාණනිරොධගාමිනියා පටිපදාය අදස්සනා -පෙ- නෙව හොති (යථා පුරිමගමකං පඤ්චපි ඛන්ධා පඤ්චහි ගමකෙහි විත්ථාරෙතබ්බා.)

## 12. 1. 11

### රූප අනභිසමය සුත්තං

**617. සාවත්ථියං:**

එකමන්තං නිසින්නො ඛො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: කො නු ඛො භො ගොතම හෙතු කො පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: “සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා’’ති.

රූපෙ ඛො වච්ඡ, අනභිසමයා -පෙ-.

## 12. 1. 12

### වෙදනා අනභිසමය සුත්තං

**618. සාවත්ථියං:**

වෙදනාය ඛො වච්ඡ, අනභිසමයා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

---

1. ම. ඡ. ඉ. පොත්ථකෙසු නයිදං දිස්සති.

## 12. 1. 8

## සඤ්ඤා අදස්සන සූත්‍රය

**614. සැවැත්නුවර :**

. . . වච්ඡය, සඤ්ඤාවෙහි නො දක්මෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි, නො ම නො වේ යි හෝ . . .

## 12. 1. 9

## සංඛාර අදස්සන සූත්‍රය

**615. සැවැත්නුවර :**

. . . වච්ඡය, සඞ්ඛාරයන්හි නො දක්මෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වේ, නො ම නො වේ යි හෝ . . .

## 12. 1. 10

## විඤ්ඤාණ අදස්සන සූත්‍රය

**616. සැවැත්නුවර :**

. . . වච්ඡය, විඤ්ඤාණයෙහි නො දක්මෙන්, විඤ්ඤාණසමුදයෙහි නො දක්මෙන් විඤ්ඤාණනිරොධයෙහි නො දක්මෙන්, විඤ්ඤාණනිරොධගාමිනීපටිපදවෙහි නො දක්මෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වේ, නො ම නො වේ යි හෝ . . .

(පළමු ගමන මෙන් පස්කඳ ම පස් ගමනින් විතර කටයුතු යි)

## 12. 1. 11.

## රූප අනභිසමය සූත්‍රය

**617. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් වච්ඡගොත්ත පිරිවැජිතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ යැ ; භවත් ගෞතමයන් වහන්ස, " ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නන්වැදෑරුම් යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට හේතු කිමෙක් ද, ප්‍රත්‍යය කිමෙක් ද යි.

වච්ඡ, රූපයෙහි අනවබොධයෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි හෝ . ,

## 12. 1. 12.

## වේදනා අනභිසමය සූත්‍රය

**618. සැවැත්නුවර :**

. . . වච්ඡය, වේදනාවෙහි අනවබෝධයෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි හෝ . . .

## 12. 1. 13

### සඤ්ඤා අනභිසමය සුත්තං

**619. සාවත්ථියං :**

සඤ්ඤාය ඛො වච්ඡ, අනභිසමයා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

## 12. 1. 14

### සංඛාර අනභිසමය සුත්තං

**620. සාවත්ථියං :**

සඞ්ඛාරෙසු ඛො වච්ඡ, අනභිසමයා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

## 12. 1. 15

### විඤ්ඤාණ අනභිසමය සුත්තං

**621. සාවත්ථියං :**

විඤ්ඤාණෙ ඛො වච්ඡ, අනභිසමයා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

## 12. 1. 16

### රූප අනනුබොධ සුත්තං

**622. සාවත්ථියං :**

රූපෙ ඛො වච්ඡ, අනනුබොධා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

## 12 .1. 17

### වෙදනා අනනුබොධ සුත්තං

**623. සාවත්ථියං :**

වෙදනාය ඛො වච්ඡ, අනනුබොධා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

## 12. 1. 18

### සඤ්ඤා අනනුබොධ සුත්තං

**624. සාවත්ථියං :**

සඤ්ඤාය ඛො වච්ඡ, අනනුබොධා -පෙ- නෙව හොති න න හොති තථාතො පරම්මරණාති වාති.

## 12. 1. 13.

## සඤ්ඤා අනභිසමය සූත්‍රය

619 සැවැත්නුවර :

. . . වච්ඡය, සඤ්ඤාවෙහි අනවබෝධයෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි හෝ , . .

## 12. 1. 14.

## සංඛාර අනභිසමය සූත්‍රය

620. සැවැත්නුවර :

. . . වච්ඡය, සඞ්ඛාරයන්හි අනවබෝධයෙන් . . . සත්ත්වයා මරණින් මතු නො වේ නො ම නො වේ යි හෝ , . .

## 12. 1. 15.

## විඤ්ඤාණ අනභිසමය සූත්‍රය

621. සැවැත්නුවර :

. . . වච්ඡය, විඤ්ඤාණයෙහි අනවබෝධයෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි හෝ , . .

## 12. 1. 16.

## රූප අනනුබොධ සූත්‍රය

622. සැවැත්නුවර :

. . . වච්ඡය, රූපයෙහි අනනුබෝධයෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි හෝ . . .

## 12. 1. 17.

## වෙදනා අනනුබොධ සූත්‍රය

623. සැවැත්නුවර :

. . . වච්ඡය, වේදනාවෙහි අනනුබෝධයෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි හෝ . . .

## 12. 1. 18.

## සඤ්ඤා අනනුබොධ සූත්‍රය

624. සැවැත්නුවර :

. . . වච්ඡය, සඤ්ඤාවෙහි අනනුබෝධයෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි හෝ . . .

36—ඒ 50066 (80/06)

## 12. 1. 19

### සඞ්ඛාර අනනුබොධ සුත්තං

625. සාවත්ථියං :

සඞ්ඛාරෙසු ඛො වච්ඡ, අනනුබොධා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

## 12. 1. 20

### විඤ්ඤාණ අනනුබොධ සුත්තං

626. සාවත්ථියං :

විඤ්ඤාණෙ ඛො වච්ඡ, අනනුබොධා -පෙ-.

## 12. 1. 21

### රූප අප්පටිවෙධ සුත්තං

627. සාවත්ථියං :

රූපෙ ඛො වච්ඡ, අප්පටිවෙධා -පෙ-.

## 12. 1. 22

### වෙදනා අප්පටිවෙධ සුත්තං

628. සාවත්ථියං :

වෙදනාය ඛො වච්ඡ, අප්පටිවෙධා -පෙ-.

## 12. 1. 23

### සඤ්ඤා අප්පටිවෙධ සුත්තං

629. සාවත්ථියං :

සඤ්ඤාය ඛො වච්ඡ, අප්පටිවෙධා -පෙ-.

## 12. 1. 24

### සඞ්ඛාර අප්පටිවෙධ සුත්තං

630. සාවත්ථියං :

සඞ්ඛාරෙසු ඛො වච්ඡ, අප්පටිවෙධා -පෙ-.

## 12. 1. 25

### විඤ්ඤාණ අප්පටිවෙධ සුත්තං

631. සාවත්ථියං :

විඤ්ඤාණෙ ඛො වච්ඡ, අප්පටිවෙධා -පෙ-.

## 12. 1. 19.

## සංඛාර අනනුබොධ සූත්‍රය

625. සැවැත්නුවර :

. . . වච්ඡය, සඞ්ඛාරයන්හි අනනුබෝධයෙන් . . . සත්ත්වයා මරණින් මතු නො ම වේ නො ම නො වේ යි හෝ . .

## 12. 1. 20.

## විඤ්ඤාණ අනනුබොධ සූත්‍රය

626. සැවැත්නුවර :

. . . වච්ඡය, විඤ්ඤාණයෙහි අනනුබෝධයෙන් . . .

## 12. 1. 21.

## රූප අප්පටිවෙධ සූත්‍රය

627. සැවැත්නුවර :

. . . වච්ඡය, රූපයෙහි අප්‍රතිවේධයෙන් . . .

## 12. 1. 22.

## වෙදනා අප්පටිවෙධ සූත්‍රය

628. සැවැත්නුවර :

. . . වච්ඡය, වේදනාවෙහි අප්‍රතිවේධයෙන් . . .

## 12. 1. 23.

## සඤ්ඤා අප්පටිවෙධ සූත්‍රය

629. සැවැත්නුවර :

. . . වච්ඡය, සංඥාවෙහි අප්‍රතිවේධයෙන් . . .

## 12. 1. 24.

## සංඛාර අප්පටිවෙධ සූත්‍රය

630. සැවැත්නුවර :

. . . වච්ඡය සංස්කාරයන්හි අප්‍රතිවේධයෙන් . . .

## 12. 1. 25.

## විඤ්ඤාණ අප්පටිවෙධ සූත්‍රය

631. සැවැත්නුවර :

. . . වච්ඡය, විඥානයෙහි අප්‍රතිවේධයෙන් . . .

## 12. 1. 26–29

### රූපාදි අසල්ලක්ඛණ සුත්තානි

**632 - 635.** සාවත්ථියං :
රූපෙ ඛො වජ්ජ, අසල්ලක්ඛණා -පෙ-.

## 12. 1. 30

### විඤ්ඤාණ අසල්ලක්ඛණ සුත්තං

**636.** සාවත්ථියං :
-පෙ- විඤ්ඤාණෙ ඛො වජ්ජ, අසල්ලක්ඛණා -පෙ-.

## 12. 1. 31–34

### රූපාදි අනුපලක්ඛණ සුත්තානි

**637 - 640.** සාවත්ථියං :
-පෙ- රූපෙ ඛො වජ්ජ, අනුපලක්ඛණා -පෙ-.

## 12. 1. 35

### විඤ්ඤාණ අනුපලක්ඛණ සුත්තං

**641.** සාවත්ථියං :
-පෙ- විඤ්ඤාණෙ ඛො වජ්ජ, අනුපලක්ඛණා -පෙ-.

## 12. 1. 36–40

### රූපාදි අපච්චුපලක්ඛණ සුත්තානි

**642 - 646.** සාවත්ථියං :
-පෙ- රූපෙ ඛො වජ්ජ, අපච්චුපලක්ඛණා -පෙ-.

## 12. 1. 41–45

### රූපාදි අසමපෙක්ඛණ සුත්තානි

**647 - 651.** සාවත්ථියං :
-පෙ- රූපෙ ඛො වජ්ජ, අසමපෙක්ඛණා -පෙ-.

## 12. 1. 46–50

### රූපාදි අපච්චුපෙක්ඛණ සුත්තානි

**652 - 656.** සාවත්ථියං :
-පෙ- රූපෙ ඛො වජ්ජ, අපච්චුපෙක්ඛණා -පෙ-.

## 12. 1. 26—29.

## රූපාදි අසල්ලක්ඛණ සූත්‍ර

**632-635.** සැවැත්නුවර :

... වච්ඡය, රූපයෙහි නො සැලකීමෙන් ...

## 12. 1. 30.

## විඤ්ඤාණ අසල්ලක්ඛණ සූත්‍රය

**636.** සැවැත්නුවර :

... වච්ඡය, විඤ්ඤානයෙහි නො සැලකීමෙන් ...

## 12. 1. 31—34.

## රූපාදි අනුපලක්ඛණ සූත්‍ර

**637-640** සැවැත්නුවර :

... වච්ඡය, රූපයෙහි පුනපුනා සලකා නො බැලීමෙන් ...

## 12. 1. 35.

## විඤ්ඤාණ අනුපලක්ඛණ සූත්‍රය

**641.** සැවැත්නුවර :

... වච්ඡය, විඤ්ඤානයෙහි පුනපුනා සලකා නො බැලීමෙන් ...

## 12. 1. 36—40.

## රූපාදි අපච්චුපලක්ඛණ සූත්‍ර

**642-646.** සැවැත්නුවර :

... වච්ඡය, රූපයෙහි පුනපුනා ලකුණු නො බැලීමෙන් ...

## 12. 1. 41—45.

## රූපාදි අසමපෙක්ඛණ සූත්‍ර

**647-651.** සැවැත්නුවර :

... වච්ඡය, රූපයෙහි පුනපුනා මැනවින් නො බැලීමෙන් ...

## 12. 1. 46—50.

## රූපාදි අපච්චුපෙක්ඛණ සූත්‍ර

**652-656.** සැවැත්නුවර :

... වච්ඡය, රූපයෙහි පුන පුනා නො බැලීමෙන් ...

## 12. 1. 51

### රූප අපච්චක්ඛකම්ම සුත්තං

657. සාවත්ථියං:

-පෙ- රූපෙ බො වච්ඡ, අපච්චක්ඛකම්මා, රූපසමුදයෙ අපච්චක්ඛකම්මා, රූපනිරොධෙ අපච්චක්ඛකම්මා, රූපනිරොධගාමිනියා පටිපදාය අපච්චක්ඛකම්මා, යානිමානි -පෙ-.

## 12. 1. 52

### වෙදනා අපච්චක්ඛකම්ම සුත්තං

658. සාවත්ථියං:

ඒකමන්තං නිසින්නො බො වච්ඡගොත්තො පරිබ්බාජකො භගවන්තං එතදවොච: "කො නු බො භො ගොතම, හෙතු කො පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: 'සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා, -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

වෙදනාය බො වච්ඡ, අපච්චක්ඛකම්මා -පෙ-.

## 12. 1. 53

### සඤ්ඤා අපච්චක්ඛකම්ම සුත්තං

659. සාවත්ථියං:

-පෙ- සඤ්ඤාය බො වච්ඡ, අපච්චක්ඛකම්මා -පෙ-.

## 12. 1. 54

### සංඛාර අපච්චක්ඛකම්ම සුත්තං

660. සාවත්ථියං:

-පෙ- සඞ්ඛාරෙසු බො වච්ඡ, අපච්චක්ඛකම්මා, -පෙ-.

## 12. 1. 55

### විඤ්ඤාණ අපච්චක්ඛකම්ම සුත්තං

661. සාවත්ථියං:

-පෙ- විඤ්ඤාණෙ බො වච්ඡ, අපච්චක්ඛකම්මා, විඤ්ඤාණසමුදයෙ අපච්චක්ඛකම්මා, විඤ්ඤාණනිරොධෙ අපච්චක්ඛකම්මා, විඤ්ඤාණනිරොධගාමිනියා පටිපදාය අපච්චක්ඛකම්මා, එවිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා, -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

---

1. අප්පච්චක්ඛකම්මා - මජසං, සතා.

## 12. 1. 51.

## රූප අපච්චක්ඛ කම්ම සූත්‍රය

**657. සැවැත්නුවර :**

. . . වච්ඡය, රූපයෙහි නො පසක් කිරීමෙන්, රූපසමුදයයෙහි නො පසක් කිරීමෙන්, රූපනිරොධයෙහි නො පසක් කිරීමෙන්, රූපනිරොධගාමිනීපටිපදාවෙහි නො පසක් කිරීමෙන් යම් මේ . . .

## 12. 1. 52.

## වේදනා අපච්චක්ඛකම්ම සූත්‍රය

**658. සැවැත්නුවර :**

එකත්පස් ව හුන් වච්ඡගොත්ත පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේ ය : භවත් ගෞතමයන් වහන්ස, ''ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නන්වැදැරුම් යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට කිමෙක් හේතු ද කිමෙක් ප්‍රත්‍යය ද''යි.

වච්ඡය, වේදනාවෙහි නො පසක් කිරීමෙන් . . .

## 12. 1. 53.

## සඤ්ඤා අපච්චක්ඛකම්ම සූත්‍රය

**659. සැවැත්නුවර :**

. . . වච්ඡය, සංඥාවෙහි නො පසක් කිරීමෙන් . . .

## 12. 1. 54.

## සංඛාර අපච්චක්ඛකම්ම සූත්‍රය

**660. සැවැත්නුවර :**

. . . වච්ඡය, සංස්කාරයන්හි නො පසක් කිරීමෙන් . . .

## 12. 1 55.

## විඤ්ඤාණ අපච්චක්ඛකම්ම සූත්‍රය

**661. සැවැත්නුවර :**

වච්ඡය, විඥානයෙහි නො පසක් කිරීමෙන්, විඥානසමුදයෙහි නො පසක් කිරීමෙන්, විඥානනිරෝධයෙහි නො පසක් කිරීමෙන්, විඥානනිරොධගාමිනීප්‍රතිපදාවෙහි නො පසක් කිරීමෙන් ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ . . . සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නන් වැදැරුම් මේ මිසදිටුහු මෙසේ ලොව උපදිත්.

අයං ඛො වච්ඡ, හෙතු, අයං පච්චයො යානිමානි අනෙකවිහිතානි දිට්ඨිගතානි ලොකෙ උප්පජ්ජන්ති: සස්සතො ලොකොති වා, අසස්සතො ලොකොති වා, අන්තවා ලොකොති වා, අනන්තවා ලොකොති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හොති තථාගතො පරම්මරණාති වා, න හොති තථාගතො පරම්මරණාති වා, හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.

වච්ඡගොත්තවග්ගො පඨමො.

(එකපිණ්ඩනෙන පඤ්චපඤ්ඤාසං සුත්තන්තා භවන්ති.)

තස්සුද්දානං:

අඤ්ඤාණා අදස්සනා චෙව අනභිසමයා අනනුබොධා අප්පටිවෙධා අසල්ලක්ඛණා අනුපලක්ඛණා අපච්චුපලක්ඛණා අසමපෙක්ඛනා අපච්චුපෙක්ඛණා අපච්චක්ඛකම්මාති.

වච්ඡගොත්තසංයුත්තං සමත්තං.

වච්ඡය, ලෝකය ශාශ්වත ය යි හෝ ලෝකය අශාශ්වත ය යි හෝ ලෝකය අන්තවත් ය යි හෝ ලෝකය අනන්තවත් ය යි හෝ ජීවයත් එය ය ශරීරයත් එය ය යි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ යි හෝ සත්ත්වයා මරණින් මතු වේ ය යි හෝ සත්ත්වයා මරණින් මතු නො වේ ය යි හෝ සත්ත්වයා මරණින් මතු වෙයි නො ද වේ ය යි හෝ සත්ත්වයා මරණින් මතු නො ම වෙයි නො ම නො වේ ය යි හෝ නන් වැදෑරුම් යම් මේ මිසදිටුහු ලොව උපදිත් නම් එයට මේ හේතු යි, මේ ප්‍රත්‍යය යි.

**පළමුවැනි වච්ඡගොත්ත වර්ග යි.**

**(එකට පිඩු කිරීමෙන් පස්පනස් සූත්‍ර කෙනෙක් වෙත්.)**

**එහි උද්දානය :**

අඤ්ඤාණයෙන් ද, අදස්සනයෙන් ද, අනභිසමයෙන් ද, අනනුබොධයෙන් ද, අප්පටිවෙධයෙන් ද, අසල්ලක්ඛණයෙන් ද, අනුපලක්ඛණයෙන් ද, අපච්චුපලක්ඛණයෙන් ද, අසමපෙක්ඛණයෙන් ද, අපච්චුපෙක්ඛණයෙන්ද, අපච්චක්ඛකම්මයෙන් ද යි එක් එක් පඤ්චකය බැගින් පඤ්චක එකොළොසෙකි. සූත්‍ර මුළුල්ල පස්පනසෙකි.

**වච්ඡගොත්ත සංයුත්තය නිමියේ යි.**

# 13. ඣානසංයුත්තං

## ඣානවග්ගො

### 13. 1. 1

### සමාපත්තිකුසල සුත්තං

**662. සාවත්ථියං :**

-පෙ- චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො හොති න සමාධිස්මිං සමාපත්තිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං සමාධිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාධිකුසලො හොති න සමාධිස්මිං සමාපත්තිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති සමාධිස්මිං සමාපත්තිකුසලො ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච සමාධිස්මිං සමාපත්තිකුසලො ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච.

සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා නවනීතං, නවනීතම්හා සප්පි, සප්පිම්හා සප්පිමණ්ඩො තත්‍ර අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච සමාධිස්මිං සමාපත්තිකුසලො ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො චාති.

### 13. 1. 1

### ඨිති කුසල සුත්තං

**663. සාවත්ථියං :**

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී. කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො හොති. න සමාධිස්මිං ඨිතිකුසලො, ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ඨිතිකුසලො හොති. න සමාධිස්මිං සමාධිකුසලො, ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාධිකුසලො හොති. න සමාධිස්මිං ඨිතිකුසලො, ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති. සමාධිස්මිං ඨිතිකුසලො ච.



Free Distribution www.aathaapi.org

# 13. ඣාන සංයුත්තය

## ඣාන වර්ගය

### 13. 1. 1.

### සමාපත්ති කුසල සූත්‍රය

**662. සැවැත්නුවර :**

මහණෙනි, මේ ධ්‍යානලාභී පුද්ගලයෝ සතර දෙනෙකි. කවර සතර දෙනෙකැ යත් :

මහණෙනි, මෙලොවැ කිසියම් ධ්‍යායී පුද්ගලයෙක් (ධ්‍යානාඞ්ග ව්‍යවස්ථාන විසින්) සමාධිකුසල වෙයි, සමාධියෙහි (ධ්‍යානයට සමවැදීම් විසින්) සමාපත්තිකුසල නො වේ.

මහණෙනි, මෙලොවැ කිසියම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාපත්තිකුසල වෙයි, සමාධියෙහි සමාධි කුසල නො වේ.

මහණෙනි, මෙලොවැ කිසියම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි නො ද සමාධිකුසල වෙයි, සමාධියෙහි නො ද සමාපත්තිකුසල වේ.

මහණෙනි, මෙලොවැ කිසියම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසල ද වෙයි, සමාධියෙහි සමාපත්තිකුසල ද වේ.

මහණෙනි, ඔවුන් කෙරෙහි යම් මේ ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසලත් වේ ද, සමාධියෙහි සමාපත්ති කුසලත් වේ ද, මේ පුද්ගල මේ සිවුවැදෑරුම් ධ්‍යායී පුද්ගලයන් අතුරෙන් අග්‍ර ද වෙයි, ශ්‍රේෂ්ඨ ද වෙයි, ප්‍රමුඛ ද වෙයි, උත්තම ද වෙයි, ප්‍රවර ද වේ.

මහණෙනි, යම්සේ දෙනට වඩා කිරි, කිරට වඩා දිහි, දිහියට වඩා වෙඬරු, වෙඬරුවට වඩා ගිතෙල්, ගිතෙලට වඩා ගිතෙල් මණ්ඩය එහි ලා අග්‍රයයි කියනු ලැබේ ද, මහණෙනි එසෙයින් ම යම් මේ ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසලත් වේ ද, සමාධියෙහි සමාපත්තිකුසලත් වේ ද, මේ පුද්ගල මේ සිවුවැදෑරුම් ධ්‍යායී පුද්ගලයන් අතුරෙන් අග්‍ර ද වෙයි. ශ්‍රේෂ්ඨ ද වෙයි, ප්‍රමුඛ ද වෙයි, උත්තම ද වෙයි, ප්‍රවරද වේ යි.

### 13. 1. 2.

### ඨිති කුසල සූත්‍රය

**663. සැවැත්නුවර :**

මහණෙනි, මේ ධ්‍යායීහු සතර දෙනෙකි. කවර සතර දෙනෙකැ යත් :

මහණෙනි, මෙලොවැ එක් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසල වෙයි, සමාධියෙහි ඨිතිකුසල (සමාධිය කලක් පවත්වා ගැන්මට දක්ෂ) නො වෙයි. මහණෙනි, මෙලොවැ එක් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි ඨිතිකුසල වෙයි, සමාධියෙහි සමාධිකුසල නො වෙයි. මහණෙනි, මෙලොවැ එක් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසල නො ම වෙයි. සමාධියෙහි ඨිතිකුසල නො ද වෙයි. මහණෙනි, මෙලොවැ එක් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසල ද වෙයි, සමාධියෙහි ඨිති කුසල ද වේ.



Free Distribution www.aathaapi.org

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති, සමාධිස්මිං ඨිතිකුසලො ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච, සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච.

සෙය්‍යථාපි භික්ඛවෙ ගවා ඛීරං ඛීරම්හා දධි, දධිම්හා නොනීතං, නොනීතම්හා සප්පි, සප්පිම්හා සප්පිමණ්ඩො තත්‍ර අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච -පෙ පවරො චාති.

## 13. 1. 3

## වුට්ඨාන කුසල සුත්තං

**664.** සාවත්ථියං:

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී. කතමෙ චත්තාරො:

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො හොති න සමාධිස්මිං වුට්ඨානකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං සමාධිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාධිකුසලො හොති න සමාධිස්මිං වුට්ඨානකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති සමාධිස්මිං වුට්ඨානකුසලො ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති සමාධිස්මිං වුට්ඨානකුසලො ච. අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච. සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං -පෙ- පවරො චාති.

## 13. 1. 4

## කල්ලිත කුසල සුත්තං

**665.** සාවත්ථියං:

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී. කතමෙ චත්තාරො:

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො හොති, න සමාධිස්මිං කල්ලිතකුසලො.[1]

ඉධ පන භික්ඛවෙ. එකච්චො ඣායී සමාධිස්මිං කල්ලිතකුසලො හොති, න සමාධිස්මිං සමාධිකුසලො.

1. කල්ලකුසලො ; PTS සී 2. කල්ලත - සී 1.

මහණෙනි එහි යම් මේ ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසලත් වේ ද, සමාධියෙහි ඨිතිකුසලත් වේ ද, මේ පුද්ගල මේ සිවුවැදෑරුම් ධ්‍යායීන් අතර අග්‍ර ද වෙයි, ශ්‍රේෂ්ඨ ද වෙයි, ප්‍රමුඛ ද වෙයි. උත්තම ද වෙයි, ප්‍රවර ද වේ.

මහණෙනි යම්සේ දෙනට වඩා කිරි ද, කිරට වඩා දීහි, දීහියට වඩා වෙඬරු, වෙඬරුවට වඩා ගිතෙල්, ගිතෙලට වඩා ගිතෙල්මණ්ඩය එහි ලා අග්‍ර වෙයි. මහණෙනි එසෙයින් ම යම් ඒ ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසල වේ ද . . . ප්‍රවර ද වේ යි.

## 13. 1. 3.

## වුට්ඨාන කුසල සූත්‍රය

**664.** සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සතර දෙනෙකි. කවර සතර දෙනෙකැ යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිය පිළිබඳ (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ වෙයි, සමාධියෙහි සමාධියෙන් නැඟී සිටීමෙහි දක්ෂ නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධියෙන් නැඟී සිටීමෙහි දක්ෂ වෙයි, සමාධියෙහි සමාධිය පිළිබඳ (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි පිළිබඳවත් (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහිත්) නො ම දක්ෂ වෙයි, සමාධියෙහි සමාධියෙන් නැඟී සිටීමෙහිත් නො ම දක්ෂ වේ.

මහණෙනි මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ වූයේත් සමාධියෙහි සමාධියෙන් නැඟී සිටීමෙහි දක්ෂ වූයේත් වේ.

මහණෙනි, එහි යම් මේ ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි පිළිබඳ ව (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ වූයේත්, සමාධියෙහි සමාධියෙන් නැඟී සිටීමෙහි දක්ෂ වූයේත් වේ නම් මේ තෙමේ මේ සිවු ධ්‍යාන කරන පුද්ගලයන්ගෙන් අග්‍ර ද ශ්‍රේෂ්ඨ ද ප්‍රමුඛ ද උතුම් ද උසස් ද වේ. මහණෙනි, යම්සේ දෙනට වඩා කිරි . . . උසස් ද වේ යි.

## 13. 1. 4.

## කල්ලිත කුසල සූත්‍රය

**665.** සැවැත්නුවර :

මහණෙනි මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි පිළිබඳ (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ වෙයි, සමාධියෙහි ලා සමාධියට යෝග්‍ය කරන්නට දක්ෂ නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධියට යෝග්‍ය කරන්නට දක්ෂ වෙයි, සමාධියෙහි සමාධිය පිළිබඳ (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ නො වේ.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාධිකුසලො හොති, න සමාධිස්මිං කල්ලිතකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති, සමාධිස්මිං කල්ලිතකුසලො ච.

තත්‍ර භික්ඛවෙ; ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති, සමාධිස්මිං කල්ලිතකුසලො ච අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච. සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා නවනීතං, නවනීතම්හා සප්පි, සප්පිම්හා සප්පිමණ්ඩො තත්‍ර අග්ගමක්ඛායති -පෙ- පවරො චාති.

## 13. 1. 5

## ආරම්මණ කුසල සුත්තං

**666.** සාවත්ථියං:

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී. කතමෙ චත්තාරො:

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො හොති, න සමාධිස්මිං ආරම්මණකුසලො, ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ආරම්මණකුසලො හොති, න සමාධිස්මිං සමාධිකුසලො, ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාධිකුසලො හොති න සමාධිස්මිං ආරම්මණකුසලො. ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති, සමාධිස්මිං ආරම්මණකුසලො ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච සමාධිස්මිං ආරම්මණකුසලො ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච.

සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා -පෙ- පවරො චාති.

## 13. 1. 6

## ගොචර කුසල සුත්තං

**667.** සාවත්ථියං:

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො:

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො හොති, න සමාධිස්මිං ගොචරකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ගොචරකුසලො හොති, න සමාධිස්මිං සමාධිකුසලො.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි පිළිබඳ ව (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි)ත් නො ම දක්ෂ වෙයි, සමාධියෙහි සමාධියට යෝග්‍ය කිරීමෙහිත් නො ම දක්ෂ වේ.

මහණෙනි මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිය පිළිබඳ ව (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ වූයේත්, සමාධියෙහි සමාධියට යෝග්‍ය කිරීමෙහි දක්ෂ වූයේත් වේ.

මහණෙනි, එහි යම් මේ ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි පිළිබඳ ව (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ වූයේත්, සමාධියෙහි සමාධියට යෝග්‍ය කිරීමෙහි දක්ෂ වූයේත් වේ නම් මේ තෙමේ මේ සතර ධ්‍යායී පුද්ගලයන් ගෙන් අග්‍ර ද ශ්‍රේෂ්ඨ ද ප්‍රධාන ද උතුම් ද උසස් ද වේ.

මහණෙනි, යම්සේ දෙනට වඩා කිරි, කිරට වඩා දී, දීයට වඩා වෙඬරු, වෙඬරුවට වඩා ගිතෙල්, ගිතෙලට වඩා ගිතෙල්මඬත් එහි ලා අග්‍ර ය යි කියනු ලැබේ ද, . . . උසස් ද වේ යි.

## 13. 1. 5.
## ආරම්මණ කුසල සූත්‍රය

**666.** සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවු දෙනෙක් ද යත් :

මහණෙනි මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි පිළිබඳ (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ වෙයි, සමාධියෙහි කිසුණු අරමුණු කෙරෙහි දක්ෂ නො වේ.

මහණෙනි මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි කිසුණු අරමුණු කෙරෙහි දක්ෂ වෙයි, සමාධියෙහි සමාධි පිළිබඳ (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ නො වේ.

මහණෙනි මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි පිළිබඳවත් (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහිත්) නො ම දක්ෂ වෙයි. සමාධියෙහි කිසුණු අරමුණු කෙරෙහිත් නො ම දක්ෂ වේ.

මහණෙනි මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි පිළිබඳ ව (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ වූයේත්, සමාධියෙහි කිසුණු අරමුණු කෙරෙහි දක්ෂ වූයේත් වේ.

මහණෙනි, එහි යම් මේ ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි පිළිබඳ ව (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහි) දක්ෂ වූයේත් සමාධියෙහි කිසුණු අරමුණු කෙරෙහි දක්ෂ වූයේත් වේ නම් මේ තෙමේ මේ සිවු වැදෑරුම් ධ්‍යායී පුද්ගලයන් අතුරෙන් අග්‍ර ද ශ්‍රේෂ්ඨ ද ප්‍රධාන ද උතුම් ද උසස් ද වේ.

මහණෙනි, යම්සේ දෙනට වඩා කිරි, කිරට වඩා දී, දීයට වඩා . . . උසස් ද වේ යි.

## 13. 1. 6.
## ගෝචර කුසල සූත්‍රය

**667.** සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි පිළිබඳ (ධ්‍යානාංග වෙන් කිරීමෙහි සමත්) දක්ෂ වෙයි, සමාධියෙහි ගෝචර දක්ෂ නො වේ. (කමටහන් අරමුණෙහි හා පිණ්ඩපාත ගෝචරයෙහි දක්ෂ නො වේ.)

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි ගෝචර පිළිබඳ (කමටහන් ගොචරයෙහි හා පිණ්ඩපාත ගොචරයෙහි) දක්ෂ වෙයි, සමාධියෙහි සමාධි පිළිබඳ (ධ්‍යානාංග වෙන් කිරීමෙහි) දක්ෂ නො වේ.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාධිකුසලො හොති, න සමාධිස්මිං ගොචරකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති, සමාධිස්මිං ගොචරකුසලො ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච සමාධිස්මිං ගොචරකුසලො ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච. සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං -පෙ- පවරො චාති.

## 13. 1. 7

## අභිනීහාර කුසල සුත්තං

668. සාවත්ථියං :

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො හොති, න සමාධිස්මිං අභිනීහාරකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං අභිනීහාරකුසලො හොති, න සමාධිස්මිං සමාධිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාධිකුසලො හොති, න සමාධිස්මිං අභිනීහාරකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති. සමාධිස්මිං අභිනීහාරකුසලො ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච සමාධිස්මිං අභිනීහාරකුසලො ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච. සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං -පෙ- පවරො චාති.

## 13. 1. 8

## සක්කච්චකාරී සුත්තං

669. සාවත්ථියං :

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො හොති, න සමාධිස්මිං සක්කච්චකාරී.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සක්කච්චකාරී හොති, න සමාධිස්මිං සමාධිකුසලො.

මහණෙනි මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි පිළිබඳවත් (ධ්‍යානාඞ්ග වෙන් කිරීමෙහිත්) නො ම දක්ෂ වෙයි, සමාධියෙහි ගොචරයෙහිත් නො ම දක්ෂ වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරන පුල්ලෙක් සමාධියෙහි සමාධි දක්ෂ වූයේත් සමාධියෙහි ගෝචරයෙහි දක්ෂ වූයේත් වේ.

මහණෙනි, එහි යම් ඒ ධ්‍යාන කරනසුලු පුද්ගල සමාධියෙහි සමාධි දක්ෂ වූයේත් සමාධියෙහි ගොදුරෙහි දක්ෂ වූයේත් වේ නම් මේ තෙමේ මේ සිවු ධ්‍යායීන් අතුරෙන් අග්‍ර ද ශ්‍රේෂ්ඨ ද ප්‍රධාන ද උතුම් ද උසස් ද වේ. මහණෙනි, යම්සේ දෙනට වඩා කිරි . . . උසස් ද වේ යි.

## 13. 1. 7.

## අභිනීහාර කුසල සූත්‍රය

668. සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි, කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධි කුසල වෙයි. සමාධියෙහි අභිනීහාරයෙහි (කමටහන් එළවා ගැනීමෙහි දක්ෂ) නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි අභිනීහාරකුසල වෙයි. සමාධියෙහි සමාධිකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි නො ම සමාධිකුසලත් සමාධියෙහි නො ම අභිනීහාරකුසලත් වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි සමාධිකුසලත් සමාධියෙහි අභිනීහාරකුසලත් වේ.

මහණෙනි, එහි යම් ඒ ධ්‍යායී පුද්ගල සමාධියෙහි සමාධි කුසලත් සමාධියෙහි අභිනීහාරකුසලත් වේ නම් මේ තෙමේ මේ සිවුවැදෑරුම් ධ්‍යායී පුද්ගලයන් ගෙන් අග්‍ර ද ශ්‍රේෂ්ඨ ද ප්‍රමුඛ ද උතුම් ද උසස් ද වේ. මහණෙනි යම්සේ දෙනට වඩා කිරි . . . උසස් ද වේ යි.

## 13. 1. 8.

## සක්කච්චකාරී සූත්‍රය

669. සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙක් වෙත්. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසල වෙයි. සමාධියෙහි සකස් කොට කරනසුලු නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සකස් කොට කරනසුලු වෙයි, සමාධියෙහි සමාධිකුසල නො වේ.



Free Distribution www.aathaapi.org

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාධිකුසලො හොති, න සමාධිස්මිං සක්කච්චකාරී.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති, සමාධිස්මිං සක්කච්චකාරී ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච සමාධිස්මිං සක්කච්චකාරී ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච. සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං -පෙ- පවරො චාති.

## 13. 1. 9

## සාතච්චකාරී සුත්තං

**670. සාවත්ථියං :**

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො හොති න සමාධිස්මිං සාතච්චකාරී.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සාතච්චකාරී හොති න සමාධිස්මිං සමාධිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාධිකුසලො හොති න සමාධිස්මිං සාතච්චකාරී.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති සමාධිස්මිං සාතච්චකාරී ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච සමාධිස්මිං සාතච්චකාරී ච අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච.

සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං -පෙ- පවරො චාති.

## 13. 1. 10

## සප්පායකාරී සුත්තං

**671. සාවත්ථියං :**

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො හොති න සමාධිස්මිං සප්පායකාරී.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සප්පායකාරී හොති න සමාධිස්මිං සමාධිකුසලො.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි නො මැ සමාධිකුසලත් සමාධියෙහි නො මැ සකස් කොට කරනසුලුත් වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසලත් සමාධියෙහි සකස් කොට කරනසුලුත් වේ.

මහණෙනි, එහි ලා යම් මේ ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසලත් සමාධියෙහි සකස් කොට කරනසුලුත් වේ නම් මේ තෙමේ මේ සිවු වැදෑරුම් ධ්‍යායී පුද්ගලයන් අතුරෙන් අග්‍ර ද ශ්‍රේෂ්ඨ ප්‍රමුඛ ද උතුම් ද උසස් ද වේ. මහණෙනි, යම්සේ දෙනට වඩා කිරි . . . උසස් ද වේ යි.

## 13. 1. 9.

## සාතච්චකාරී සූත්‍රය

**670.** සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුලු පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසල වෙයි, සමාධියෙහි සාතච්චකාරී (නිතර කරනසුලු) නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සාතච්චකාරී වෙයි. සමාධියෙහි සමාධිකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි නො මැ සමාධිකුසලත් සමාධියෙහි නො මැ සාතච්චකාරීත් වෙයි.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසලත් සමාධියෙහි සාතච්චකාරීත් වෙයි.

මහණෙනි, එහි යම් මේ ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසලත් සමාධියෙහි සාතච්චකාරීත් වේ නම් මේ තෙමේ මේ සිවු වැදෑරුම් ධ්‍යායී පුද්ගලයන් අතුරෙන් අග්‍ර ද ශ්‍රේෂ්ඨ ද මුඛ්‍ය ද උතුම් ද උසස් ද වේ.

මහණෙනි, යම්සේ දෙනට වඩා කිරි . . . උසස් ද වේ යි

## 13. 1. 10.

## සප්පායකාරී සූත්‍රය

**671.** සැවැත්නුවර ;

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසල වෙයි, සමාධියෙහි සප්පායකාරී (උපකාරකධර්මයන් වඩනසුලු) නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සප්පායකාරී වෙයි. සමාධියෙහි සමාධිකුසල නො වේ.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාධිකුසලො හොති න සමාධිස්මිං සප්පායකාරී.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති සමාධිස්මිං සප්පායකාරී ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති සමාධිස්මිං සප්පායකාරී ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච.

සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං -පෙ- එවමෙව ඛො භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාධිකුසලො ච හොති සමාධිස්මිං සප්පායකාරී ච අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො චාති.

## 13. I. 11

### සමාපත්තිඨිතිකුසල සුත්තං

672. සාවත්ථියං :

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං ඨිතිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ඨිතිකුසලො හොති න සමාධිස්මිං සමාපත්තිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං ඨිතිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො ච හොති සමාධිස්මිං ඨිතිකුසලො ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො ච හොති සමාධිස්මිං ඨිතිකුසලො ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච. සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං ඛීරම්හා දධි -පෙ- පවරො චාති.

## 13. I. 12

### සමාපත්තිවුට්ඨානකුසල සුත්තං

673. සාවත්ථියං :

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං වුට්ඨානකුසලො.

---

1. න ච සමාධිස්මිං - මජසං.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි නො මැ සමාධිකුසලත් සමාධියෙහි නො මැ සප්පායකාරීත් වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසලත් සමාධියෙහි සප්පායකාරීත් වෙයි.

මහණෙනි, එහි යම් මේ ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාධිකුසලත් සමාධියෙහි සප්පායකාරීත් වේ නම් මේ තෙමේ මේ සිවු වැදෑරුම් ධ්‍යායී පුද්ගලයන් අතුරෙන් අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රධාන ද උතුම් ද උසස් ද වේ.

මහණෙනි, යම්සේ දෙනට වඩා කිරි . . . මහණෙනි, එසෙයින් ම යම් මේ ධ්‍යායී පුද්ගල සමාධියෙහි සමාධිකුසලත් සමාධියෙහි සප්පායකාරීත් වේ නම් මේ තෙමේ මේ සිවු ධ්‍යායී පුද්ගලයන්ගෙන් අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රධාන ද උතුම් ද උසස් ද වේ යි.

## 13. 1. 11.

## සමාපත්ති ඨිති කුසල සූත්‍රය

672. සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමවතට සමවැදීමෙහි දක්ෂ වෙයි, සමාධියෙහි සමවත කලක් තබා ගැන්මෙහි දක්ෂ නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද් ගලයෙක් සමාධියෙහි ඨිතිකුසල වෙයි. සමාධියෙහි සමාපත්ති කුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි නො මැ සමාපත්තිකුසලත් සමාධියෙහි නො මැ ඨිතිකුසලත් වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාපත්තිකුසලත් සමාධියෙහි ඨිතිකුසලත් වේ.

මහණෙනි, එහි යම් මේ ධ්‍යායී පුද්ගල සමාධියෙහි සමාපත්තිකුසලත් සමාධියෙහි ඨිතිකුසලත් වේ නම් මේ තෙමේ මේ සිවුවැදෑරුම් ධ්‍යායී පුද්ගලයන් ගෙන් අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද මුඛ්‍ය ද උතුම් ද උසස් ද වේ. මහණෙනි යම්සේ දෙනට වඩා කිරිත් කිරට වඩා දීත් . . . උසස් ද වේ යි.

## 13. 1. 12.

## සමාපත්ති වුට්ඨාන කුසල සූත්‍රය

673. සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමවතට සමවැදීමෙහි දක්ෂ වෙයි. සමාධියෙහි සමවතින් වහා නැඟී සිටීමෙහි දක්ෂ නො වේ.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං සමාපත්තිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං වුට්ඨානකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො ච හොති සමාධිස්මිං වුට්ඨානකුසලො ච.

තත්‍ර භික්ඛවෙ යවායං ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො ච හොති සමාධිස්මිං වුට්ඨානකුසලො ච අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච -පෙ- පවරො චාති.

## 13. 1. 13

## සමාපත්තිකල්ලිතකුසල සුත්තං

674. සාවත්ථියං :

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී, කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං කල්ලිතකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං කල්ලිතකුසලො හොති න සමාධිස්මිං සමාපත්තිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං කල්ලිතකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො ච හොති සමාධිස්මිං කල්ලිතකුසලො ච.

තත්‍ර භික්ඛවෙ යවායං ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො ච හොති සමාධිස්මිං කල්ලිතකුසලො ච අයං ඉමෙසං චතුන්නං ඣායීනං -පෙ- පවරො චාති.

## 13. 1. 14

## සමාපත්ති ආරම්මණ කුසල සුත්තං

675. සාවත්ථියං :

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං ආරම්මණකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ආරම්මණකුසලො හොති න සමාධිස්මිං සමාපත්තිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාපත්තිකුසලො හොති. න සමාධිස්මිං ආරම්මණකුසලො.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි ව්‍යුත්ථානකුසල වෙයි, සමාධියෙහි සමාපත්තිකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි නො මැ සමාපත්තිකුසලත් සමාධියෙහි නො මැ ව්‍යුත්ථාන කුසලත් වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාපත්තිකුසලත් සමාධියෙහි ව්‍යුත්ථානකුසලත් වේ.

මහණෙනි, එහි ලා යම් මේ ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාපත්තිකුසලත් (සමවතට සමවැදීමෙහි දක්ෂත්) සමාධියෙහි ව්‍යුත්ථානකුසලත් (ධ්‍යානයෙන් නැඟී සිටීමේ දක්ෂත්) වේ නම් මේ තෙමේ මේ සිවු ධ්‍යාන කරනසුල්ලන්ගෙන් අග්‍ර ද . . . උසස් ද වේ යි.

## 13. 1. 13.

## සමාපත්ති කල්ලිත කුසල සූත්‍රය

674. සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාපත්ති කුසල වෙයි, සමාධියෙහි සමවතට යෝග්‍ය කිරීමෙහි දක්ෂ නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි කල්ලිතකුසල (සමවතට යොග්‍ය කිරීමෙහි දක්ෂ) වෙයි. සමාධියෙහි සමාපත්තිකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි නො මැ සමාපත්තිකුසලත් සමාධියෙහි නො මැ කල්ලිත කුසලත් වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාපත්තිකුසලත් සමාධියෙහි කල්ලිතකුසලත් වෙයි.

මහණෙනි, එහි ලා යම් මේ ධ්‍යායී පුද්ගල සමාධියෙහි සමාපත්තිකුසලත් සමාධියෙහි කල්ලිතකුසලත් වෙයි නම් මේ තෙමේ මේ සිවු වැදෑරුම් ධ්‍යායී පුද්ගලයන් ගෙන් . . . උතුම් ද වෙ යයි.

## 13. 1. 14.

## සමාපත්ති ආරම්මණ කුසල සූත්‍රය

675. සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාපත්තිකුසල වෙයි. සමාධියෙහි සමවත පිළිබඳ ආරම්මණකුසල (කිසුණු අරමුණු කෙරෙහි දක්ෂ) නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි 'ආරම්මණකුසල වෙයි. සමාධියෙහි සමාපත්තිකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි නො මැ සමාපත්තිකුසලත් සමාධියෙහි නො මැ ආරම්මණකුසලත් වේ.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො ච හොති. සමාධිස්මිං ආරම්මණකුසලො ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො ච හොති සමාධිස්මිං ආරම්මණකුසලො ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං -පෙ- පවරො චාති.

## 13. 1. 15

### සමාපත්ති ගොචර කුසල සුත්තං

**676. සාවත්ථියං :**

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී. කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො හොති. න සමාධිස්මිං ගොචරකුසලො -පෙ- පවරො චාති.

(චතුක්කොට්ඨකං විත්ථාරෙතබ්බං)

## 13. 1. 16

### සමාපත්ති අභිනීහාර කුසල සුත්තං

**677. සාවත්ථියං :**

-පෙ- සමාධිස්මිං සමාපත්තිකුසලො හොති. න සමාධිස්මිං අභිනීහාරකුසලො -පෙ-

## 13. 1. 17

### සමාපත්ති සක්කච්චකාරී සුත්තං

**678. සාවත්ථියං :**

-පෙ- සමාධිස්මිං සමාපත්තිකුසලො හොති. න සමාධිස්මිං සක්කච්චකාරී -පෙ-

## 13. 1. 18

### සමාපත්ති සාතච්චකාරී සුත්තං

**679. සාවත්ථියං :**

-පෙ- සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං සාතච්චකාරී -පෙ-

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාපත්තිකුසලත් සමාධියෙහි ආරම්මණකුසලත් වේ.

මහණෙනි, එහි ලා යම් මේ ධ්‍යායී පුද්ගල සමාධියෙහි සමාපත්තිකුසලත් සමාධියෙහි ආරම්මණකුසලත් වේ නම් මෙ තෙමේ මේ සිව් වැදෑරුම් ධ්‍යායී පුද්ගලයන්ගෙන් . . . උතුම් ද වේ යි.

## 13. 1. 15.

## සමාපත්ති ගෝචර කුසල සූත්‍රය

676. සැවැත්නුවර ;

මහණෙනි, මේ ධ්‍යායීහු සිව් දෙනෙකි. කවර සිව්දෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාපත්තිකුසල වෙයි, සමාධියෙහි ගෝචර කුසල (සමථය පිළිබඳ කමටහන් ගොචරයෙහි හා පිණ්ඩපාත ගොචරයෙහි දක්ෂ) නො වේ. . . . උතුම් ද වේ යි.

(චතුකොටිකය විස්තර කටයුතු යි)

## 13. 1. 16.

## සමාපත්ති අභිනීහාර කුසල සූත්‍රය

677. සැවැත්නුවර ;

. . . සමාධියෙහි සමාපත්තිකුසල වෙයි. සමාධියෙහි අභිනීහාරකුසල (සමථය පිළිබඳ අරමුණු එළවා ගැන්මෙහි දක්ෂ) නො වේ. . . .

## 13. 1. 17.

## සමාපත්ති සක්කච්චකාරී සූත්‍රය

678. සැවැත්නුවර :

. . . සමාධියෙහි සමාපත්තිකුසල වෙයි. සමාධියෙහි සමථය සකසා කරනසුලු නො වේ. . . .

## 13. 1. 18.

## සමාපත්ති සාතච්චකාරී සූත්‍රය

679. සැවැත්නුවර :

. . . සමාධියෙහි සමාපත්තිකුසල වෙයි. සමාධියෙහි සමථය නිතර කරනසුලු නො වේ. . . .

## 13. 1. 19

### සමාපත්ති සප්පායකාරී සුත්තං

**680.** සාවත්ථියං :

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං සප්පායකාරී.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සප්පායකාරී හොති න සමාධිස්මිං සමාපත්තිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සමාපත්තිකුසලො හොති න සමාධිස්මිං සප්පායකාරී.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො ච හොති සමාධිස්මිං සප්පායකාරී ච.

තත්‍ර භික්ඛවෙ, යවායං ඣායී සමාධිස්මිං සමාපත්තිකුසලො ච හොති සමාධිස්මිං සප්පායකාරී ච. අයං ඉමෙසං චතුන්නං ඣායීනං -පෙ- පවරො චාති.

## 13. 1. 20

### ඨිතිවුට්ඨාන සුත්තං

**681** සාවත්ථියං :

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ඨිතිකුසලො හොති න සමාධිස්මිං වුට්ඨානකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං ඨිතිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං ඨිතිකුසලො හොති න සමාධිස්මිං වුට්ඨානකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ඨිතිකුසලො ච හොති සමාධිස්මිං වුට්ඨානකුසලො ච.

තත්‍ර භික්ඛවෙ, යවායං ඣායී සමාධිස්මිං ඨිතිකුසලො ච හොති සමාධිස්මිං වුට්ඨානකුසලො ච අයං ඉමෙසං චතුන්නං ඣායීනං -පෙ- පවරො චාති.

## 13. 1. 21

### ඨිති කල්ලිත සුත්තං

**682.** සාවත්ථියං :

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායිනො කතමෙ චත්තාරො :

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ඨිතිකුසලො හොති න සමාධිස්මිං කල්ලිතකුසලො.- පෙ- පවරො චාති.

## 13. 1. 19.

## සමාපත්ති සප්පායකාරී සූත්‍රය

680. සැවැත්නුවර :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාපත්තිකුසල වෙයි සමාධියෙහි සමවත පිළිබඳ උපකාරකධර්ම වඩනසුලු නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සප්පායකාරී වෙයි. සමාධියෙහි සමාපත්තිකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි නො මැ සමාපත්ති කුසලත් සමාධියෙහි නො මැ සප්පායකාරීත් වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි සමාපත්තිකුසලත් සමාධියෙහි සප්පායකාරීත් වේ.

මහණෙනි, එහි ලා යම් මේ ධ්‍යායී පුද්ගල සමාධියෙහි සමාපත්තිකුසලත් සමාධියෙහි සප්පායකාරීත් වේ නම් මේ තෙමේ මේ සිවු ධ්‍යාන කරනසුල්ලන්ගෙන් . . . උතුම් ද වේ යි.

## 13. 1. 20.

## ඨිතිවුට්ඨාන සූත්‍රය

681. සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි ඨිතිකුසල (සමාධිය කලක් තබා ගැනීමෙහි දක්ෂ) වෙයි. සමාධියෙහි වුට්ඨානකුසල (සමාධියෙන් වහා නැගී සිටීමෙහි දක්ෂ) නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි වුට්ඨානකුසල වේ, සමාධියෙහි ඨිතිකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි නො මැ ඨිතිකුසලත් සමාධියෙහි නො මැ වුට්ඨානකුසලත් වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි ඨිතිකුලසත් සමාධියෙහි වුට්ඨානකුසලත් වේ.

මහණෙනි, එහි ලා මේ යම් ධ්‍යායී පුද්ගල සමාධියෙහි ඨිතිකුසලත් සමාධියෙහි වුට්ඨාන කුසලත් වේ නම් මේ තෙමේ මේ සිවු වැදෑරුම් ධ්‍යායී පුද්ගලයන්ගෙන් . . . උතුම් ද වේ යි.

## 13. 1. 21.

## ඨිති කල්ලිත සූත්‍රය

682. සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි : කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යායී පුද්ගලයෙක් සමාධියෙහි ඨිතිකුසල වේ. සමාධියෙහි කල්ලිතකුසල නො වේ. . . . උතුම් ද වේ යි.

## 13. 1. 22

### ඨිති ආරම්මණ සුත්තං

**683. සාවත්ථියං:**

-පෙ- සමාධිස්මිං ඨිතිකුසලො හොති න සමාධිස්මිං ආරම්මණකුසලො -පෙ-.

## 13. 1. 23

### ඨිති ගොචර සුත්තං

**684. සාවත්ථියං:**

-පෙ- සමාධිස්මිං ඨිතිකුසලො හොති න සමාධිස්මිං ගොචරකුසලො -පෙ-.

## 13. 1. 24

### ඨිති අභිනීහාර සුත්තං

**685. සාවත්ථියං:**

-පෙ- සමාධිස්මිං ඨිතිකුසලො හොති න සමාධිස්මිං අභිනීහාරකුසලො -පෙ-

## 13. 1. 25

### ඨිති සක්කච්චකාරී සුත්තං

**686. සාවත්ථියං:**

-පෙ- සමාධිස්මිං ඨිතිකුසලො හොති න සමාධිස්මිං සක්කච්චකාරී -පෙ-.

## 13. 1. 26

### ඨිති සාතච්චකාරී සුත්තං

**687. සාවත්ථියං:**

-පෙ- සමාධිස්මිං ඨිතිකුසලො හොති න සමාධිස්මිං සාතච්චකාරී -පෙ-.

## 13. 1. 27

### ඨිති සප්පායකාරී සුත්තං

**688. සාවත්ථියං:**

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ඨිතිකුසලො හොති න සමාධිස්මිං සප්පායකාරී.

## 13. 1. 22.

## ඨිති ආරම්මණ සූත්‍රය

**683.** සැවැත්නුවර :

. . . සමාධියෙහි ඨිතිකුසල වේ. සමාධියෙහි ආරම්මණකුසල නො වේ . . .

## 13. 1. 23.

## ඨිති ගොචර සූත්‍රය

**684.** සැවැත්නුවර :

. . . සමාධියෙහි ඨිතිකුසල වේ. සමාධියෙහි ගොචරකුසල නො වේ . . .

## 13. 1 24.

## ඨිති අභිනීහාර සූත්‍රය

**685.** සැවැත්නුවර :

. . . සමාධියෙහි ඨිතිකුසල වේ. සමාධියෙහි අභිනීහාරකුසල නො වේ . .

## 13. 1. 25.

## ඨිති සක්කච්චකාරී සූත්‍රය

**686.** සැවැත්නුවර :

. . . සමාධියෙහි ඨිතිකුසල වේ. සමාධියෙහි සක්කච්චකාරී නො වේ . . .

## 13. 1. 26.

## ඨිති සාතච්චකාරී සූත්‍රය

**687.** සැවැත්නුවර :

. . . සමාධියෙහි ඨිතිකුසල වේ. සමාධියෙහි සාතච්චකාරී නො වේ . . .

## 13. 1. 27.

## ඨිති සප්පායකාරී සූත්‍රය

**688.** සැවැත්නුවර :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි ඨිතිකුසල වේ. සමාධියෙහි සප්පායකාරී නො වේ.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සප්පායකාරී හොති න සමාධිස්මිං ඨිතිකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං ඨිතිකුසලො හොති න සමාධිස්මිං සප්පායකාරී.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ඨිතිකුසලො ච හොති සමාධිස්මිං සප්පායකාරී ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං ඨිතිකුසලො ච හොති සමාධිස්මිං සප්පායකාරී ච අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච -පෙ- පවරො චාති.

## 13. 1. 28

## වුට්ඨාන කල්ලිත සුත්තං

689. සංඛිත්තං ;

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං කල්ලිතකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං කල්ලිතකුසලො හොති න සමාධිස්මිං වුට්ඨානකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං කල්ලිතකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං වුට්ඨානකුසලො ච හොති සමාධිස්මිං කල්ලිතකුසලො ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං වුට්ඨානකුසලො ච හොති සමාධිස්මිං කල්ලිතකුසලො ච අයං ඉමෙසං චතුන්නං ඣායීනං -පෙ- පවරො චාති.

## 13. 1. 29

## වුට්ඨාන ආරම්මණ සුත්තං

690. සංඛිත්තං :

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං ආරම්මණකුසලො -පෙ- පවරො චාති.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරන පුල්ලෙක් සමාධියෙහි සප්පායකාරී වේ. සමාධියෙහි ගීතිකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනපුල්ලෙක් සමාධියෙහි නො ම ගීතිකුසලත් සමාධියෙහි නො මැ සප්පායකාරිත් වෙයි.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරන පුල්ලෙක් සමාධියෙහි ගීතිකුසලත් සමාධියෙහි සප්පායකාරිත් වෙයි.

මහණෙනි, එහි ලා යම් මේ ධ්‍යාන කරනපුල්ලෙක් සමාධියෙහි ගීතිකුසලත් සමාධියෙහි සප්පායකාරිත් වේ නම් මේ තෙමේ මේ සිවු ධ්‍යාන කරනපුල්ලන්ගෙන් අග්‍ර ද . . . උසස් ද වේ යි.

## 13. 1. 28.

## වුට්ඨාන කල්ලිත සූත්‍රය

**689.** සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනපුල්ලෙක් සමාධියෙහි වුට්ඨානකුසල වේ, සමාධියෙහි කල්ලිතකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනපුල්ලෙක් සමාධියෙහි කල්ලිතකුසල වේ, සමාධියෙහි වුට්ඨානකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනපුල්ලෙක් සමාධියෙහි නො මැ වුට්ඨානකුසලත් සමාධියෙහි නො මැ කල්ලිතකුසලක් වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනපුල්ලෙක් සමාධියෙහි වුට්ඨානකුසලත් සමාධියෙහි කල්ලිතකුසලත් වේ.

මහණෙනි, එහි ලා යම් මේ ධ්‍යාන කරනපුල්ලෙක් සමාධියෙහි වුට්ඨානකුසලත් සමාධියෙහි කල්ලිතකුසලත් වේ නම් මේ තෙමේ මේ සිවු ධ්‍යාන කරනපුල්ලන්ගෙන් . . . උසස් ද වේ යි.

## 13. 1. 29.

## වුට්ඨාන ආරම්මණ සූත්‍රය

**690.** සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවු දෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනපුල්ලෙක් සමාධියෙහි වුට්ඨානකුසල වේ. සමාධියෙහි ආරම්මණකුසල නො වේ . . . උසස් ද වේ.

## 13. 1. 30

### වුට්ඨාන ගොචර සුත්තං

691. සාවත්ථියං :

-පෙ- සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං ගොචරකුසලො -පෙ-.

## 13. 1. 31

### වුට්ඨාන අභිනීහාර සුත්තං

692. සාවත්ථියං :

-පෙ- සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං අභිනීහාරකුසලො -පෙ-.

## 13. 1. 32

### වුට්ඨාන සක්කච්චකාරී සුත්තං

693. සාවත්ථියං :

-පෙ- සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං සක්කච්චකාරී -පෙ-.

## 13. 1. 33

### වුට්ඨාන සාතච්චකාරී සුත්තං

694. සාවත්ථියං :

-පෙ- සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං සාතච්චකාරී -පෙ-.

## 13. 1. 34

### වුට්ඨාන සප්පායකාරී සුත්තං

695. සාවත්ථියං :

-පෙ- ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං සප්පායකාරී.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සප්පායකාරී හොති න සමාධිස්මිං වුට්ඨානකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං වුට්ඨානකුසලො හොති න සමාධිස්මිං සප්පායකාරී.

Free Distribution www.aathaapi.org

## 13. 1. 30.

## වුට්ඨාන ගොචර සූත්‍රය

**691.** සැවැත්නුවර :

. . . සමාධියෙහි වුට්ඨානකුසල වේ. සමාධියෙහි ගොචරකුසල නො වේ. . .

## 13. 1. 31.

## වුට්ඨාන අභිනීහාර සූත්‍රය

**692.** සැවැත්නුවර :

. . . සමාධියෙහි වුට්ඨානකුසල වේ. සමාධියෙහි අභිනීහාරකුසල නො වේ. . .

## 13. 1. 32.

## වුට්ඨාන සක්කච්චකාරී සූත්‍රය

**693.** සැවැත්නුවර :

. . සමාධියෙහි වුට්ඨානකුසල වේ. සමාධියෙහි සක්කච්චකාරී නො වේ . . .

## 13. 1. 33.

## වුට්ඨාන සාතච්චකාරී සූත්‍රය

**694.** සැවැත්නුවර :

. . . සමාධියෙහි වුට්ඨානකුසල වේ. සමාධියෙහි සාතච්චකාරී නො වේ. . .

## 13. 1. 34.

## වුට්ඨාන සප්පායකාරී සූත්‍රය

**695.** සැවැත්නුවර :

. . . මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි වුට්ඨානකුසල වේ, සමාධියෙහි සප්පායකාරී නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි සප්පායකාරී වේ, සමාධියෙහි වුට්ඨානකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි නො ම වුට්ඨානකුසලත් සමාධියෙහි නො ම සප්පායකාරීත් වේ.

38—ඒ 50006 (80/06)

Free Distribution www.aathaapi.org

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං වුට්ඨානකුසලො ච හොති සමාධිස්මිං සප්පායකාරී ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං වුට්ඨානකුසලො ච හොති සමාධිස්මිං සප්පායකාරී ච. අයං ඉමෙසං චතුන්නං ඣායීනං -පෙ- පවරො චාති.

## 13. 1. 35
## කල්ලිත ආරම්මණ සුත්තං

**696. සාවත්ථියං:**

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො:

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං කල්ලිතකුසලො හොති න සමාධිස්මිං ආරම්මණකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ආරම්මණකුසලො හොති න සමාධිස්මිං කල්ලිතකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං කල්ලිතකුසලො හොති න සමාධිස්මිං ආරම්මණකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං කල්ලිතකුසලො ච හොති සමාධිස්මිං ආරම්මණකුසලො ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං කල්ලිතකුසලො ච හොති සමාධිස්මිං ආරම්මණකුසලො ච. අයං ඉමෙසං චතුන්නං ඣායීනං -පෙ- පවරො චාති.

## 13. 1. 36
## කල්ලිත ගොචර සුත්තං

**697. සාවත්ථියං:**

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො:

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං කල්ලිතකුසලො හොති න සමාධිස්මිං ගොචරකුසලො -පෙ- පවරො චාති.

## 13. 1. 37
## කල්ලිත අභිනීහාර සුත්තං

**698. සාවත්ථියං:**

-පෙ- සමාධිස්මිං කල්ලිතකුසලො හොති න සමාධිස්මිං අභිනීහාරකුසලො -පෙ-.

## 13. 1. 38
## කල්ලිත සක්කච්චකාරී සුත්තං

**699. සාවත්ථියං:**

-පෙ- සමාධිස්මිං කල්ලිතකුසලො හොති න සමාධිස්මිං සක්කච්චකාරී -පෙ-.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි වුට්ඨානකුසලත් සමාධියෙහි සප්පායකාරීත් වේ.

මහණෙනි, එහි ලා යම් මේ ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි වුට්ඨානකුසලත් සමාධියෙහි සප්පායකාරීත් වේ නම් මෙ තෙමේ මේ සිවුධ්‍යාන කරන්නවුන්ගෙන් . . . උසස් ද වේ යි.

## 13. 1. 35.

## කල්ලිත ආරම්මණ සූත්‍රය

**696.** සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි කල්ලිතකුසල වේ, සමාධියෙහි ආරම්මණකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි ආරම්මණකුසල වේ, සමාධියෙහි කල්ලිතකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි නො ම කල්ලිතකුසලත් සමාධියෙහි නො ම ආරම්මණකුසලත් වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි කල්ලිතකුසලත් සමාධියෙහි ආරම්මණකුසලත් වේ.

මහණෙනි, එහි ලා යම් මේ ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි කල්ලිත කුසලත් සමාධියෙහි ආරම්මණකුසලත් වේ නම් මෙ තෙමේ මේ සිවුධ්‍යාන කරනසුල්ලන්ගෙන් . . . උසස් ද වේ යි.

## 13. 1. 36.

## කල්ලිත ගොචර සූත්‍රය

**697.** සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි කල්ලිතකුසල වේ, සමාධියෙහි ගොචරකුසල නො වේ. . . . උසස් ද වේ යි.

## 13. 1. 37.

## කල්ලිත අභිනීහාර සූත්‍රය

**698.** සැවැත්නුවර :

. . . සමාධියෙහි කල්ලිතකුසල වේ. සමාධියෙහි අභිනීහාරකුසල නො වේ . . .

## 13. 1. 38.

## කල්ලිත සක්කච්චකාරී සූත්‍රය

**699.** සැවැත්නුවර :

. . . සමාධියෙහි කල්ලිතකුසල වේ. සමාධියෙහි සක්කච්චකාරී නො වේ

## 13. 1. 39

## කල්ලිත සාතච්චකාරී සුත්තං

**700. සාවත්ථියං :**

-පෙ- සමාධිස්මිං කල්ලිතකුසලො හොති න සමාධිස්මිං සාතච්චකාරී -පෙ-.

## 13. 1. 40

## කල්ලිත සප්පායකාරී සුත්තං

**701. සාවත්ථියං :**

-පෙ- සමාධිස්මිං කල්ලිතකුසලො හොති න සමාධිස්මිං සප්පායකාරී -පෙ-.

## 13. 1. 41

## ආරම්මණ ගොචර සුත්තං

**702. සාවත්ථියං :**

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො :

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ආරම්මණකුසලො හොති න සමාධිස්මිං ගොචරකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ගොචරකුසලො හොති න සමාධිස්මිං ආරම්මණකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං ආරම්මණකුසලො න සමාධිස්මිං ගොචරකුසලො.

ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං ආරම්මණකුසලො ච හොති සමාධිස්මිං ගොචරකුසලො ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී -පෙ- පවරො චාති.

## 13. 1. 42

## ආරම්මණ අභිනීහාර සුත්තං

**703. සාවත්ථියං :**

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො -පෙ- සමාධිස්මිං ආරම්මණකුසලො හොති න සමාධිස්මිං අභිනීහාරකුසලො -පෙ- පවරො චාති.

## 13. 1. 39.

## කල්ලිත සාතච්චකාරී සූත්‍රය

**700.** සැවැත්නුවර :

. . . සමාධියෙහි කල්ලිතකුසල වේ, සමාධියෙහි සාතච්චකාරී නො වේ . . .

## 13. 1. 40.

## කල්ලිත සප්පායකාරී සූත්‍රය

**701.** සැවැත්නුවර :

. . . සමාධියෙහි කල්ලිතකුසල වේ, සමාධියෙහි සප්පායකාරී නො වේ . . .

## 13. 1. 41.

## ආරම්මණ ගොචර සූත්‍රය

**702.** සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවු දෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි ආරම්මණකුසල වේ, සමාධියෙහි ගොචරකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි ගොචරකුසල වේ, සමාධියෙහි ආරම්මණකුසල නො වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි නො ම ආරම්මණකුසලත් සමාධියෙහි නො ම ගොචරකුසලත් වේ.

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි ආරම්මණකුසලත් සමාධියෙහි ගොචරකුසලත් වේ.

මහණෙනි, එහි ලා යම් මේ ධ්‍යාන කරනසුල්ලෙක් . . . උසස් ද වේ යි.

## 13. 1. 42.

## ආරම්මණ අභිනීහාර සූත්‍රය

**703.** සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවුදෙනෙකි. කවර සිවුදෙනෙක් ද යත් : . . . සමාධියෙහි ආරම්මණ කුසල වේ, සමාධියෙහි අභිනීහාරකුසල නො වේ. . . . උසස් ද වේ යි.

## 13. 1. 43

### ආරම්මණ සක්කච්චකාරී සුත්තං

**704.** සාවත්ථියං :

-පෙ- සමාධිස්මිං ආරම්මණකුසලො හොති න සමාධිස්මිං සක්කච්චකාරී -පෙ-.

## 13. 1. 44

### ආරම්මණ සාතච්චකාරී සුත්තං

**705.** සාවත්ථියං :

-පෙ- සමාධිස්මිං ආරම්මණකුසලො හොති න සමාධිස්මිං සාතච්චකාරී -පෙ-.

## 13. 1. 45

### ආරම්මණ සප්පායකාරී සුත්තං

**706.** සාවත්ථියං :

-පෙ- සමාධිස්මිං ආරම්මණකුසලො හොති න සමාධිස්මිං සප්පායකාරී -පෙ-

## 13. 1. 46

### ගොචර අභිනීහාර සුත්තං

**707.** සාවත්ථියං :

-පෙ- සමාධිස්මිං ගොචරකුසලො හොති, න සමාධිස්මිං අභිනීහාරකුසලො. -පෙ- සමාධිස්මිං අභිනීහාරකුසලො හොති, න සමාධිස්මිං ගොචරකුසලො. -පෙ- නෙව සමාධිස්මිං ගොචරකුසලො හොති, න සමාධිස්මිං අභිනීහාරකුසලො. -පෙ- සමාධිස්මිං ගොචරකුසලො ච හොති, සමාධිස්මිං අභිනීහාරකුසලො ච -පෙ- පවරො චාති.

## 13. 1. 47

### ගොචර සක්කච්චකාරී සුත්තං

**708.** සාවත්ථියං :

-පෙ- සමාධිස්මිං ගොචරකුසලො හොති, න සමාධිස්මිං සක්කච්චකාරී -පෙ-

Free Distribution www.aathaapi.org

## 13. 1. 43.

## ආරම්මණ සක්කච්චකාරී සූත්‍රය

**704.** සැවැත්නුවර :

. . . . සමාධියෙහි ආරම්මණකුසල වේ, සමාධියෙහි සක්කච්චකාරී නො වේ . . . .

## 13. 1. 44.

## ආරම්මණ සාතච්චකාරී සූත්‍රය

**705.** සැවැත්නුවර :

. . . . සමාධියෙහි ආරම්මණකුසල වේ, සමාධියෙහි සාතච්චකාරී නො වේ . . . .

## 13. 1. 45.

## ආරම්මණ සප්පායකාරී සූත්‍රය

**706.** සැවැත්නුවර :

. . . . සමාධියෙහි ආරම්මණකුසල වේ, සමාධියෙහි සප්පායකාරී නො වේ . . . .

## 13. 1. 46.

## ගොචර අභිනීහාර සූත්‍රය

**707.** සැවැත්නුවර :

. . . සමාධියෙහි ගොචරකුසල වේ, සමාධියෙහි අභිනීහාරකුසල නො වේ. . . . සමාධියෙහි අභිනීහාර කුසල වේ, සමාධියෙහි ගොචරකුසල නො වේ. . . . සමාධියෙහි නො මැ ගොචරකුසලත් සමාධියෙහි නො මැ අභිනීහාර කුසලත් වේ. . . . සමාධියෙහි ගොචර කුසලත් සමාධියෙහි අභිනීහාර කුසලත් වේ . . . උසස් ද වේ යි.

## 13. 1. 47.

## ගොචර සක්කච්චකාරී සූත්‍රය

**708.** සැවැත්නුවර :

. . . සමාධියෙහි ගොචරකුසල වේ. සමාධියෙහි සක්කච්චකාරී නො වේ. . . .

## 13. 1. 48

## ගොචර සාතච්චකාරී සුත්තං

**709. සාවත්ථියං :**

-පෙ- සමාධිස්මිං ගොචරකුසලො හොති, න සමාධිස්මිං සාතච්චකාරී -පෙ-

## 13. 1. 49

## ගොචර සප්පායකාරී සුත්තං

**710. සාවත්ථියං :**

-පෙ- සමාධිස්මිං ගොචරකුසලො හොති, සමාධිස්මිං සප්පායකාරී -පෙ-

## 13. 1. -50

## අභිනීහාර සක්කච්චකාරී සුත්තං

**711. සාවත්ථියං :**

-පෙ- සමාධිස්මිං අභිනීහාරකුසලො හොති, න සමාධිස්මිං සක්කච්චකාරී -පෙ-

## 13. 1. -50

## අභිනීහාර සාතච්චකාරී සුත්තං

**712. සාවත්ථියං :**

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී කතමෙ චත්තාරො : ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං අභිනීහාරකුසලො හොති, න සමාධිස්මිං සාතච්චකාරී. -පෙ- පවරො චාති.

## 13. 1. 51

## අභිනීහාරසප්පායකාරී සුත්තං

**713. සාවත්ථියං :**

-පෙ- ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං අභිනීහාරකුසලො හොති, න සමාධිස්මිං සප්පායකාරී -පෙ-

Free Distribution www.aathaapi.org

## 13. 1. 48.

## ගෝචර සාතච්චකාරී සූත්‍රය

**709.** සැවැත්නුවර :

. . . සමාධියෙහි ගෝචරකුසල වේ, සමාධියෙහි සාතච්චකාරී නො වේ. . . .

## 13. 1. 49.

## ගෝචර සප්පායකාරී සූත්‍රය

**710.** සැවැත්නුවර :

. . . සමාධියෙහි ගෝචරකුසල වේ, සමාධියෙහි සප්පායකාරී නො වේ. . . .

## 13. 1. 50.

## අභිනීහාර සක්කච්චකාරී සූත්‍රය

**711.** සැවැත්නුවර :

. . . සමාධියෙහි අභිනීහාරකුසල වේ, සමාධියෙහි සක්කච්චකාරී නො වේ. . . .

## 13. 1. 51.

## අභිනීහාර සාතච්චකාරී සූත්‍රය

**712.** සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිව්දෙනෙකි. කවර සිව්දෙනෙක් ද යත් : මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි අභිනීහාරකුසල වේ, සමාධියෙහි සාතච්චකාරී නො වේ. . . . උසස් ද වේ යි.

## 13. 1. 52.

## අභිනීහාර සප්පායකාරී සූත්‍රය

**713.** සැවැත්නුවර :

. . . මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි අභිනීහාරකුසල වේ, සමාධියෙහි සප්පායකාරී නො වේ . . .

## 13. 1. 53

### සක්කච්චසාතච්චකාරී සුත්තං

714. සාවත්ථියං:

-පෙ- ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සක්කච්චකාරී හොති, න සමාධිස්මිං සාතච්චකාරී. ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සාතච්චකාරී. -පෙ- නෙව සමාධිස්මිං සක්කච්චකාරී හොති, න සමාධිස්මිං සාතච්චකාරී. -පෙ- සමාධිස්මිං සක්කච්චකාරී ච හොති, සමාධිස්මිං සාතච්චකාරී ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං -පෙ- උත්තමො ච, පවරො චාති.

## 13. 1. 54

### සක්කච්චසප්පායකාරී සුත්තං

715. සාවත්ථියං:

-පෙ- සමාධිස්මිං සක්කච්චකාරී හොති, න සමාධිස්මිං සප්පායකාරී -පෙ-

## 13. 1. 55

### සාතච්චසප්පායකාරී සුත්තං

716. සාවත්ථියං:

චත්තාරොමෙ භික්ඛවෙ, ඣායී. කතමෙ චත්තාරො:

ඉධ භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සාතච්චකාරී හොති, න සමාධිස්මිං සප්පායකාරී. ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සප්පායකාරී හොති, න සමාධිස්මිං සාතච්චකාරී. ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී නෙව සමාධිස්මිං සාතච්චකාරී හොති, න සප්පායකාරී. ඉධ පන භික්ඛවෙ, එකච්චො ඣායී සමාධිස්මිං සාතච්චකාරී ච හොති, සමාධිස්මිං සප්පායකාරී ච.

තත්‍ර භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සාතච්චකාරී ච හොති, සමාධිස්මිං සප්පායකාරී ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච. සෙය්‍යථාපි භික්ඛවෙ, ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා නොනීතං, නොනීතම්හා සප්පි, සප්පිම්හා සප්පිමණ්ඩො තත්‍ර අග්ගමක්ඛායති, එවමෙව ඛො භික්ඛවෙ, ය්වායං ඣායී සමාධිස්මිං සාතච්චකාරී ච හොති, සමාධිස්මිං සප්පායකාරී ච, අයං ඉමෙසං චතුන්නං ඣායීනං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො චාති.

## 13. 1. 53.

## සක්කච්ච සාතච්චකාරී සූත්‍රය

714. සැවැත්නුවර :

. . . මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි සක්කච්චකාරී වේ, සමාධියෙහි සාතච්චකාරී නො වේ. මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි සාතච්චකාරී වේ, සමාධියෙහි සක්කච්චකාරී නො වේ. . . . සමාධියෙහි නො මැ සක්කච්චකාරීත් සමාධියෙහි නො වැ සාතච්චකාරීත් වේ. . . . සමාධියෙහි සක්කච්චකාරීත් සමාධියෙහි සාතච්චකාරීත් වේ.

මහණෙනි, මෙහි යම් මේ . . . උතුම් ද උසස් ද වේ යි.

## 13. 1. 54.

## සක්කච්ච සප්පායකාරී සූත්‍රය

715. සැවැත්නුවර :

. . . සමාධියෙහි සක්කච්චකාරී වේ, සමාධියෙහි සප්පායකාරී නො වේ . . .

## 13. 1. 55.

## සාතච්ච සප්පායකාරී සූත්‍රය

716. සැවැත්නුවර :

මහණෙනි, මේ ධ්‍යායීහු සිවු දෙනෙකි. කවර සිවු දෙනෙක් ද යත් :

මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි සාතච්චකාරී වේ, සමාධියෙහි සප්පායකාරී නො වේ, මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි සප්පායකාරී වේ, සමාධියෙහි සාතච්චකාරී නො වේ. මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි නො ම සාතච්චකාරීත් සමාධියෙහි නො ම සප්පායකාරීත් වේ. මහණෙනි, මෙහි ඇතැම් ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි සාතච්චකාරීත් සමාධියෙහි සප්පායකාරීත් වේ.

මහණෙනි, එහි ලා යම් මේ ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි සාතච්චකාරීත් සමාධියෙහි සප්පායකාරීත් වේ නම්, මේ තෙමේ මේ සිවු ධ්‍යාන කරනසුල්ලන්ගෙන් අග්‍ර ද, ශ්‍රේෂ්ඨ ද, ප්‍රධාන ද, උතුම් ද, උසස් ද වේ. මහණෙනි, යම්සේ දෙනට වඩා කිරිත්, කිරට වඩා දීත්, දීයට වඩා වෙඩරුත්, වෙඩරුවට වඩා, ගිතෙලුත්, ගිතෙලට වඩා ගිතෙල්මඬත් එහි ලා අග්‍ර ය යි කියනු ලැබේ ද, මහණෙනි, එසෙයින් ම යම් මේ ධ්‍යාන කරනසුල්ලෙක් සමාධියෙහි සාතච්චකාරීත් සමාධියෙහි සප්පායකාරීත් වේ නම්, මේ තෙමේ මේ සිවු ධ්‍යාන කරනසුල්ලන්ගෙන් අග්‍ර ද, ශ්‍රේෂ්ඨ ද, ප්‍රමුඛ ද, උතුම් ද, උසස් ද වේ යි.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

(එවං තානි පෙය්‍යාලමුඛානි පඤ්චපඤ්ඤාසං වෙය්‍යාකරණානි විත්ථාරෙතබ්බානි.)

ඣානවග්ගො පඨමො.

තස්සුද්දානං :

සමාධි සමාපත්ති ඨිති ච - වුට්ඨානං කල්ලිතාරම්මණෙන ච,
ගොචර අභිනීහාර සක්කච්ච - සාතච්ච අථොපි සප්පායා ති.

ඣානසංයුත්තං සමත්තං.

තස්සුද්දානං :

සකුලපිතා අනිච්චඤ්ච භාරං න තුම්හාකෙන ච
අත්තදීපෙන පඤ්ඤාසො පඨමොති පවුච්චති.

උපයො'රහං බජ්ජනීයො ථෙරං පුණ්ණෙන පඤ්චමං
මජ්ඣෙ පණ්ණාසකො එසො සම්බුද්ධෙන පකාසිතො.

අන්තං ධම්මකථිකා විජ්ජා කුක්කුළං දිට්ඨි පඤ්චමං
තතියො පණ්ණාසකො වුත්තො නිපාතොති පවුච්චති.

ගන්ධ දිට්ඨි ච ඔක්කන්ති උප්පාදො කිලෙසෙන ච
සාරිපුත්තො ච නාගො ච සුපණ්ණ ගන්ධබ්බකායිකා
වලාහො වච්ඡගොත්තො ච ඣානෙන භවති අට්ඨාරසාති.

Free Distribution www.aathaapi.org

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගත්හ යි.

(මෙමයේ පෙයයාලමුඛ ඇති ඒ පය්පනය් සූත්‍රයෝ විස්තර කටයුත්තා හ.)

**පළමුවැනි ධ්‍යාන වර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය :**

සමාධි සූත්‍ර දශයෙක, සමාපත්ති සූත්‍ර නවයෙක, ඨිති සූත්‍ර අටෙක, වුට්ඨාන සූත්‍ර සතෙක, කල්ලිත සූත්‍ර සයෙක, ආරම්මණ සූත්‍ර පසෙක ගෝචර සූත්‍ර සතරෙක. අභිනීහාර සූත්‍ර තුනෙක, සක්කච්ච සූත්‍ර දෙකෙක, සප්පාය සූත්‍ර එකෙකැ යි සූත්‍ර පස් පනසෙකි.

**ඣාන සංයුත්තය නිමියේ ය.**

**ඛන්ධක වර්ග නිමියේ යි.**

**එහි වර්ග නාමාවලිය :**

නකුලපිතු, අනිච්ච, භාර, නකුම්භාක, අත්තදීප යන වර්ග පසින් පඨම පණ්ණාසක ය යි කියනු ලැබේ.

උපය, අරහත්ත ඛජ්ජනීය, ථෙර, පුප්ඵ යන වර්ග පසින් මේ මජ්ඣිම පණ්ණාසකය බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ ය.

අන්ත, ධම්මකථික, අවිජ්ජා, කුක්කුළ, දිට්ඨි යන වර්ග පසින් තතිය පණ්ණාසකය වදරන ලද්දේ ය. නිපාත ය යි ද කියනු ලැබේ.

පඨම රාධ, දුතිය රාධ, වර්ග දෙක ය, ආයාචන, උපනිසින්න, පඨමගමන, දුතියගමන, තතියගමන යන දිට්ඨි වර්ගය සය ය, ඔක්කන්තික, උප්පාද කිලෙස, සාරිපුත්ත, නාග, සුපණ්ණ, ගන්ධබ්බ, වලාහක, වච්ඡගොත්ත, ඣාන යන වර්ග දශ ය යි, වර්ග අටළොසෙකි. වර්ග මුළුල්ල තෙතිසෙකි.

## සංයුත්තනිකායෙ - ඛන්ධකවග්ගො

# ගාථාදිපාද සූචි


| | | පිට්ඨඞ්කං |
|---|---|---|
| අනොජං තෙ අනුප්පත්තා | — | 144 |
| අවිතිවත්තා සක්කායං | — | 148 |
| අසෙඛඤාණං උප්පන්නං | — | 144 |
| ආයු උස්මා ච විඤ්ඤාණං | — | 246 |
| උද්ධං තිරියං අපාචීනං | — | 144 |
| එතාදිසොයං සන්තානො | — | 246 |
| එවං ඛන්ධෙ අවෙක්ඛෙය්‍ය | — | 246 |
| ඔකං පහාය අනිකෙතසාරී | — | 14, 20 |
| දසඞ්ගෙහි සම්පන්නා | — | 144 |
| නමො තෙ පුරිසාජඤ්ඤ | — | 94 |
| නික්ඛිපිත්වා ගරුං භාරං | — | 46 |
| පජහෙ සබ්බසංයොගං | — | 246 |
| පඤ්චක්ඛන්ධෙ පරිඤ්ඤාය | — | 144 |
| ඵෙණපිණ්ඩූපමං රූපං | — | 244 |
| භාරා හවෙ පඤ්චක්ඛන්ධා | — | 46 |
| යථා යථා නං නිජ්ඣායති | — | 246 |
| යදා බුද්ධා අභිඤ්ඤාය | — | 148 |
| යෙපි දීඝායුකා දෙවා | — | 148 |
| යො ඉමං කායං ධාරයං | — | 246 |
| විධාසු න විකම්පන්ති | — | 144 |
| සක්කායං ච නිරොධං ච | — | 148 |
| සත්තරතනසම්පන්නා | — | 144 |
| සුඛිනො වත අරහන්තො | — | 144 |




39—ඒ 50066 (80/06)

Free Distribution www.aathaapi.org

# සඤ්ඤනාමානුක්කමණිකා


පිට්ඨඞ්කං

අ

අචිරවතගඞ්ගාය 14
අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා 200
අනුරුද්ධො 200
අයුජ්ඣායං 214
අවන්තීසු 214
අස්සජි 214

ආ

ආනන්දො 42, 66, 68, 162, 180, 228, 336
ආළාරො කාලාමො 398

ඉ

ඉසිගිලිපස්සං 210
ඉසිපතනෙ මිගදායෙ 114, 226, 304, 308

උ

උක්කලාචෙලෙ 124

එ

එළගලගුම්බෙ 10

ක

කච්චානගොත්තං 230
කපිලවත්ථු 156
කප්පො 298
කලන්දකනිවාපෙ 206
කස්සපකාරාමෙ 214
කුරරඝරෙ 14, 20
කුසාවතී රාජධානී 248
කූටාගාරසාලා 20, 118
කොසම්බියං 160, 218, 228
ඛෙමකො 218

ග

ගග්ගරාසු 2
ගන්ධාරාදී 242
ගිජ්ඣකූටො පබ්බතො 210
ඝොසිතාරාමෙ 108, 218, 228

පිට්ඨඞ්කා

ච

චන්දිමසූරියා 378
ඡන්නො 226

ජ

ජෙතවනෙ 22, 180, 188

ති

තිස්සො 182

න

නකුලපිතා 2, 4

ද

දසකො 218
දෙවදහ

නි

නිග්‍රොධාරාමෙ 156, 158

ප

පච්ඡාභූම 8, 10
පාරිලෙය්‍යකං 162
පුණ්ණො මන්තානිපුත්තො 180
පුබ්බාරාමෙ 118, 170
පූරණො කස්සපො 118

බ

බදරිකාරාමෙ 218
බාරාණසියං 114, 226, 304
බෙලුවලට්ඨිකා 156
භද්දසාලමූලෙ 162
භෙසකලා වනෙ 2

ම

මහාකච්චානො 14, 20
මහාකොට්ඨිතො 294, 296, 304, 306, 308
මහාලි ලිච්ඡවි 118
මාරො පාපිමා 214

පිට්ඨඞ්කා

ය

යමකො 188, 190

ර

රාජගහෙ 86, 206, 214
රාධො 138, 340, 342, 344, 352, 368, 372
රාහුලො 232, 234

ව

වක්කලි 206
වෙසාලියං 118, 200
වේළුවනෙ කලන්දකනිවාපෙ 86, 206, 214

පිට්ඨඞ්කා

ස

සක්කෙසු 8, 156
සහම්පති 156, 158
සාරිපුත්තො 4, 10, 118, 294, 296, 304, 306
සාවත්ථියං 22, 170, 180, 188
සුමෙරු පබ්බතරාජා 256
සුරාධො 140
සුංසුමාරගිරි 2
සොණො ගහපතිපුත්තො 86

හ

හාලිද්දිකානි ගහපති 14, 20

# විසෙසපදනුක්කමණිකා


| | පිට්ඨඞ්කො |
|---|---|
| **අ** | |
| අකටා අකටවිධා | 398, 400 |
| අකුක්කුකජාතං | 244 |
| අකුප්පා | 50 |
| අග්ගබීජං | 94 |
| අඞ්ගමූලං | 56 |
| අඞ්ගං | 56 |
| අඞ්ගුලිපදානි | 266 |
| අච්චන්තනිට්ඨා | 20 |
| අච්චසරා | 342 |
| අණ්ඩභූතො | 2, 4 |
| අතසිතායෙ | 100 |
| අත්තදීපා | 76 |
| අත්තසරණා | 76 |
| අත්තානුදිට්ඨි | 332 |
| අත්ථගමො | 24, 28 |
| අත්ථවසිකා | 158 |
| අත්ථිකවාද | 390 |
| අත්ථිසම්මතං | 2, 4 |
| අද්ධගතො | 2, 4 |
| අධිසයිතානි | 258 |
| අනත්තධම්මො | 366, 372 |
| අනත්තනියං | 136 |
| අනත්තා | 116 |
| අනමතග්ගො | 256, 258 |
| අනිකෙතසාරී | 16 |
| අනිච්චදස්සාවී | 2 |
| අනිච්චධම්මො | 354, 362 |
| අනිච්චං | 144 |
| අනිමිත්තො සමාධි | 158 |
| අනුධම්මො | 70, 72, 74 |
| අනුජයො | 94 |
| අනුවිචරිතං | 380, 390 |
| අනෙජං | 144 |
| අනොකසාරී | 16 |
| අන්තා | 272 |
| අපරිමුත්තො | 64 |
| අපලොකිතො | 10 |
| අපුරෙක්ඛරානො | 18 |
| අභිණ්හාතුබෙකා | 2 |
| අභිනන්දමානො | 130 |
| අභිනීහාරකුසලො | 544 |
| අභිසම්බුද්ධො | 50 |
| අභිසාපො | 158 |
| අභිසිත්තො | 4 |
| අම්බපිණ්ඩියා | 268 |
| අම්බිලං | 150 |
| අරහතා | 296 |
| අරහන්තො | 144 |
| අරහා | 344 |
| අරිත්තො | 18 |
| අවාපුරණං | 226 |
| අවීතරාගස්ස | 12 |
| අවිජ්ජාගතො | 176, 284, 502 |
| අවිභාතො | 14 |
| අවිනිපාතධම්මො | 380 |
| අවිපරිණාමධම්මො | 382, 384 |
| අසඞ්ඛ්‍යදීහවො | 398 |
| අසස්සතො ලොකො | 422 |
| අසහිතං | 18, 20 |
| අස්සාදො | 50, 52 |
| අහංකාරමමංකාරමානානුසය | 140 |
| **ආ** | |
| ආජීවසතෙ | 398 |
| ආතාපී | 62, 64 |
| ආතුරකායො | 2, 4, 6 |
| ආදිත්තං | 120 |
| ආදීනවො | 50, 52, 54 |
| ආපොකායං | 100, 388, 400 |
| ආරක්ඛකුසලො | 542 |
| ආරක්ඛසම්පන්නො | 194 |
| ආරොග්‍යං | 2 |
| ආසන්දිපඤ්චමා | 388 |
| ආළාහනා | 388 |
| ආහුතිගෙයො | 388 |




Free Distribution www.aathaapi.org

| | පිට්ඨඞ්කං |
|---|---|
| **ඉ** | |
| ඉන්ද්‍රියසතෙ | 398 |
| **උ** | |
| උක්කාසතාවකංසෙ | 398 |
| උත්තමපුරිසො | 200 |
| උත්තාසවා | 28 |
| උච්ඡින්නමූල | 16, 48, 280 |
| උච්ඡෙදදිට්ඨි | 168 |
| උදකබුබ්බුලං | 242 |
| උපපුපාදකා | 16, 20, 280, 350 |
| උපයො | 94 |
| උපාදනක්ඛන්ධා | 102, 278, 280, 346 |
| උපාදනියා | 292 |
| උපාද පරිතස්සනා | 28, 32 |
| උපාදියමානො | 126 |
| උස්සිනෙති | 154 |
| **ඌ** | |
| ඌනගන්ධා | 226 |
| **එ** | |
| එකන්තදුක්ඛං | 118 |
| එවං රූපො | 18 |
| එසිකාට්ඨායිට්ඨිතා | 378, 398, 400 |
| **ඔ** | |
| ඔකතාරී | 16 |
| ඔඝො | 16 |
| ඔදනං | 150 |
| ඔපපාතිකා | 388 |
| ඔරම්භාගියානි | 98 |
| **ක** | |
| කබ්බි | 170 |
| කට්ඨකං | 150 |
| කථංකථා | 18, 20 |
| කරතො කාරයතො | 392 |
| කලලිතකුසලො | 538 |
| කස්සකො | 268 |
| කාපොතකානි | 388 |
| කාලානුසාරී | 268 |
| කිමක්ඛාසි | 10 |
| කිංවාදී | 10 |
| කුක්කුටපොතකා | 262 |
| කුක්කුලං | 314 |
| කුඨාරිං | 244 |
| කුඩ්ඩරාජානො | 268 |
| කුසං | 236 |
| කූටට්ඨා | 398, 400 |
| කෙවලසස | 22 |
| කෙවලිනො | 106, 108, 112 |
| කෙවලී | 108 |
| **ඛ** | |
| ඛත්තිය පණ්ඩිතා | 10 |
| ඛන්ධබීජං | 94 |
| ඛොමසුඛුමානි | 250 |
| **ග** | |
| ගද්දූලබද්ධො | 256, 258 |
| ගොනකත්ථතානි | 248 |
| ගොපානසියො | 268 |
| ගොමයපිණ්ඩං | 248 |
| **ච** | |
| චක්කවත්ති | 268 |
| චතුපරිවත්තං | 102, 104 |
| චන්දප්පභා | 268 |
| චාතුම්මහාභූතිකො | 358 |
| චිත්තසංකිලෙසා | 258 |
| චෙතනාකායා | 106, 112 |
| චෙතොවිමුත්ති | 50 |
| **ඡ** | |
| ඡන්දමූලකා | 170 |
| ඡන්දරාගො | 48 |
| ඡළාභිජාතියො | 398, 402 |
| ජිණ්ණො | 2, 4 |
| ඣායී | 585 |
| **ත** | |
| තණ්හාසඞ්ඛයවිමුත්තො | 20, 22 |
| තථාගතො | 192, 412 |
| තදභිනිබ්බුතො | 78 |
| තාරකරූපානං | 268 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| තිණකට්ඨසාඛාපලාසං | 60 |
| තිත්තකං | 150 |
| තිබ්බවනසණ්ඩං | 188 |
| තිරච්ඡානගතා | 146 |
| තිවිධූපපරික්ඛී | 108, 112 |
| ථාමසා | 190 |
| ථාලිපාකො | 252 |
| **ද** | |
| දකාසයා | 146 |
| දත්තුපඤ්ඤත්තං | 388 |
| දිට්ඨධම්මනිබ්බාණප්පත්තා | 286 |
| දිට්ඨං | 386 |
| දිට්ඨිගතං | 190 |
| දුක්ඛධම්මො | 354, 364 |
| ද්වට්ඨානතරකප්පා | 398 |
| ද්වයං නිස්සිතො | 230 |
| **ධ** | |
| ධම්මකථිකො | 284, 286 |
| ධම්මදීපා | 76 |
| ධම්මවාදී | 238 |
| ධම්මසරණා | 76 |
| ධම්මානුධම්මපටිපන්නා | 286 |
| ධුවො | 382, 384 |
| ධූමායිතත්තං | 214 |
| **න** | |
| නඛසිඛායං | 252 |
| නච්චදස්සනං | 388 |
| නන්දික්ඛයො | 90, 92 |
| නත්ථුපසෙවනං | 102 |
| නවවෙදන | 202 |
| නාගාවාසන්තකෙ | 398 |
| නානාවෙරජ්ජ | 10 |
| නිකෙතචාරී | 16 |
| නිච්චො | 382 |
| නිබ්බිදා | 340 |
| නිබ්බිදාබහුලං | 70 |
| නිරුත්තිපථ | 122 |
| නිරොධො | 24, 26, 42, 46 |
| නීලං | 150 |
| නොනීතං | 538 |
| **ප** | |
| පච්ඡාභූමගමිකා | 8 |
| පඤ්චබන්ධා | 84 |
| පඤ්චවග්ගියා | 114, 118 |
| පඤ්චුපාදානක්ඛන්ධෙ | 84, 258 |
| පඤ්ඤාවිමුත්තා | 114 |
| පටිභානවන්තානි | 248 |
| පඨවීකායො | 398 |
| පත්තචීවරං | 244 |
| පබ්බතෙය්‍යා | 236 |
| පභඞ්ගුං | 58 |
| පරමපත්තිපත්තා | 200 |
| පරිසුද්ධ | 48, 276, 344 |
| පරිසුද්ධතාවී | 344 |
| පරිසොද්ධය්‍ය | 48 |
| පරිතස්සනා | 28, 230 |
| පරිපුණ්ණවස්සාසී | 6, 8 |
| පරියෙසිතං | 380 |
| පරිසුද්ධො මුඛවණ්ණො | 4 |
| පරියොනද්ධො | 2 |
| පලගණ්ඩස්ස | 266 |
| පල්ලලං | 188 |
| පවාළො | 156 |
| පවුට්ඨා | 398 |
| පංසවාගාරකානි | 342 |
| පාරදස්සී | 288 |
| පිණ්ඩාලයං | 158 |
| පුථුජ්ජනො | 142 |
| පුනබ්භවො | 50 |
| පුබ්බෙනිවාසං | 148 |
| පුරෙක්ඛරානො | 18 |
| පොනොබ්භවිකා | 272, 276 |
| ඵලුබීජං | 04 |
| ඵෙණපිණ්ඩං | 242 |

| | පිට්ඨඞ්කං |
|---|---|
| **බ** | |
| බබ්බජ | 236, 268 |
| බාලවාදෙන | 202 |
| බාල්‍යං | 2, 4 |
| බිලාසයා | 146 |
| බීජජාතානි | 94 |
| බීජබීජං | 94 |
| බ්‍රහ්මචරියවාසො | 248, 254 |
| බ්‍රහ්මඤ්ඤත්ථං | 90 |
| භගවංමූලකා | 324, 378 |
| භාරහාරො | 46 |
| භාරාදානං | 46 |
| භාරො | 46 |
| භාවනානුයොගං | 258 |
| **ම** | |
| මග්ගකුසලො | 186 |
| මඤ්ඤෙවන සමණෙඤ්ඤාසි | 208, 216 |
| මඤ්ඤමානො | 128 |
| මණ්ඩනජාතිකො | 180 |
| මධුරකජාතො | 182 |
| මනොභාවනීයානං | 2, 4 |
| මරීචි | 242 |
| මහාබ්‍යූහං | 250 |
| මහාභූතා | 104 |
| මහාසමුද්දෙ | 256 |
| මායාකාරො | 244 |
| මාරධම්මො | 360 |
| මාරො | 340 |
| මිච්ඡාදිට්ඨි | 330 |
| මිච්ඡාපටිපන්නා | 18 |
| මුඛනිමිත්තං | 180 |
| මුට්ඨස්සති | 158 |
| මූතං | 380 |
| මුද්ධාවසිත්තා | 248 |
| මූලබීජං | 94 |
| මූලසන්තානකානි | 268 |
| මොක්ඛො | 538 |
| **යො** | |
| යොනිප්පමුඛසතසහස්සානි | 398 |



| | පිට්ඨඞ්කං |
|---|---|
| **ර** | |
| රජනීයසණ්ඨිතං | 136 |
| රාගක්ඛයො | 90, 92 |
| රිත්තකං | 242 |
| රූපවන්තං | 6 |
| රූපසමුද්දයො | 104 |
| රූප්පපයං | 102 |
| **ලො** | |
| ලොකධම්මා | 240 |
| ලොහිතකං | 150 |
| ලොහිතචන්දනං | 268 |
| **ව** | |
| වච්ඡස්ස | 156 |
| වනාසයා | 146 |
| වස්සිකං | 268 |
| වාදප්පමොක්ඛාය | 18 |
| වාදානුවාදො | 10 |
| වාසිජටං | 266 |
| වීකීලනිකං | 342 |
| විගතරාගො | 18 |
| විචයතො | 162 |
| විජ්ජාගතො | 284 |
| විඤ්ඤාණකායා | 106, 112 |
| විඤ්ඤාතං | 380 |
| විධූපෙති | 154 |
| විපරිණාමධම්මං | 382 |
| විප්පලාපො | 388 |
| විභවා | 100 |
| විමුච්චමානො | 98 |
| විමුත්ති | 342 |
| විරාගො | 340 |
| විසිනෙති | 154 |
| විසුද්ධියා | 120 |
| වීමංසකා | 10, 12 |
| වුත්තවාදිනො | 10 |
| වුසිතං බ්‍රහ්මචරියං | 144 |
| වූපකට්ඨො | 62 |
| වෙවිච්ඡි | 170 |
| වෙය්‍යාකරණස්මිං | 118 |
| වොයොගං | 18 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ස** | |
| සක්කච්චකාරී | 544 |
| සක්කායදිට්ඨි | 330 |
| සක්කාසගෙතා | 272 |
| සඞ්ඛායං | 274 |
| සඞ්ඛතං | 98 |
| සඞ්කප්පගිතිවෙසමිනිබන්ධා | 334 |
| සඞ්කප්පජාතියා | 292 |
| සත්තට්ඨාන කුසලො | 108 |
| සත්තාවාසා | 144 |
| සඤ්චජාතො | 18 |
| සද්ධාවනිකාය | 222 |
| සද්ධුපෙත | 154 |
| සප්පිමණ්ඩො | 538 |
| සමාධිකුසලො | 538 |
| සමග්ගතා | 338 |
| සමාහිතො | 22 |
| සමුද්දයො | 22, 26 |
| සම්මාදස්සනං | 340 |
| සම්මාපටිපන්නා | 388 |
| සම්මාසම්බුද්ධො | 114 |
| සරදසමයෙ | 242, 268, 270 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| සස්සතදිට්ඨි | 168 |
| සස්සතිසමං | 246, 252 |
| සස්සතො ලොකො | 422 |
| සහධම්මිකො | 10 |
| සහනන්දී | 18 |
| සහිතං | 18, 20 |
| සංඛතං | 150 |
| සා | 256, 258 |
| සාතච්චකාරී | 544 |
| සාමඤ්ඤඵලං | 90 |
| සාරජ්ජමානරූපා | 158 |
| සාරඞ්ගා | 118 |
| සීහො මිගරාජා | 146 |
| සුඛානුපතිතං | 118 |
| සුත්තං | 380 |
| සුපටිපන්නා | 106 |
| සුපිනසත්ථානි | 398 |
| සුස්සූසා | 10 |
| සෙසෙට්ඨා | 538 |
| සොතාපන්නා | 278, 294, 380 |
| සොබ්භං | 188 |